බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 17 (2)

## සූත්‍රාන්ත පිටකයෙහි

11 වන ග්‍රන්ථය

# සංයුත්තනිකාය

පඤ්චමභාගය (2)

---

## මහාවග්ගය

---

ත්‍රිපිටකපරිවර්තන සභාවෙහි
සංයුත්තනිකාය ශෝධක මණ්ඩලය විසින් සිංහලභාෂාවෙන් පරිවර්තිත වැ

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින් පාඨශෝධන පූර්වක වැ සංස්කරණය කරන ලදි.

---

ශ්‍රී බු. ව. 2550
රාජ්‍ය වර්ෂ. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 17 (ii)

The Eleventh Book in the

**Suttanta-Pitaka**

**11**

# SAMYUTTANIKĀYA(V-2)

## MAHĀVAGGA

With the Sinhala translation by

**The Samyuttanikāya Editorial Board of**
**The Tripitaka Translation Committee**

Edited by

**The Tripitaka Editorial Board**

Free Distribution www.aathaapi.org

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## <u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
## <u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
## <u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**“අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”**

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධීධ වින්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

පඤ්චමො භාගො

## මහාවග්ගො

(2)

සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

පඤ්චම භාගය

## මහාවර්ගය

(2)

Free Distribution www.aathaapi.org

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 15 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:15 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන
# CONTENTS


| | පිටුව |
|---|---|
| සංස්කාරක නිවේදනය ... .. ... | xiii |
| සංඥාපනය ... ... ... | xv – xvii |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... | xix |
| සංකේත නිරූපණය .. ... ... | xxi |
| පාළි හෝඩිය ... ... ... | xxiii |
| මහාවග්ග (පූර්වභාග) විෂය සූචි ... ... | xxv – xxxiii |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2 – 361 |
| ගාථාදිපාද – සූචි ... ... | 363 |
| සඤ්ඤානාම අනුක්කමණිකා ... ... | 365 |
| විසෙසපදනුක්කමණිකා ... ... ... | 367 |
| ශුද්ධාශුද්ධතා නිරූපණය ... .. ... | 375 |
| බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා .. ... | 377 |




Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි සතළොස්වැනි ග්‍රන්ථය වූයේ සංයුත්තනිකායෙහි සංයුත්ත දෙළොසකින් සමන්විත වූ මහාවග්ගයයි. මහාවග්ගය එක් මැ ග්‍රන්ථයක් ලෙස මුද්‍රණය කැරැවීමට සලකන ලද නමුදු මුද්‍රණ අවස්ථාවට පැමිණි කල්හි එය පරිහරණයට සුකර නො වන සේ මහත් වැ යන බව පෙනුණු හෙයින් බොහෝ දෙනකුන්ගේ අදහසට එකඟව කාණ්ඩ දෙකක් වශයෙන් මුද්‍රණය කැරැවීමට සිදුවිය. එහෙයින් මග්ගසංයුත්තයෙහි පටන් බල සංයුත්තය අවසාන කොට ඇති සංයුත්ත සය සංයුත්තනිකායේ පඤ්චම භාගයෙහි පළමුවන කාණ්ඩය ලෙස පළකරවන ලද්දේය.

සංයුත්ත මහාවග්ගයෙහි අවසානයෙහි සිටි, ඉද්ධිපාද, අනුරුද්ධ, ඣාන, ආනාපාන, සොතාපත්ති, සච්ච, යන සංයුත්ත සය එමැ පඤ්චම භාගයෙහි දෙවැනි කාණ්ඩය ලෙස මුද්‍රණය කරවන්නට සිදුවූ බව පවසම්හ. මෙ මැ ග්‍රන්ථ භාගය ද ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන් ප්‍රථම කාණ්ඩයෙහි පරිවර්තකයන් විසින් මැ සිය බසට නඟන ලදුයේ විය. මුද්‍රණ අවස්ථාවට පැමිණ වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ධම්ධර මහතෙරවරුන් විසින් මහදුත්සාහයෙන් පාඨශෝධන පූර්වක වැ සිංහල පරිවර්තනය ද යථා විධීන් සකස් කරන ලද්දේ විය. එසේ මැ ගාථාදිපාද සූචි, සංඥානාමසූචි, විසෙසපදනුක්කමණිකා ආදිය ද මැනවින් සම්පාදනය කොට ඇත.

ලංකා බෞද්ධමණ්ඩලය මගින් බුද්ධජයන්ති උත්සවය අනුස්මරණය කරනු සඳහා සමාරබ්ධ වූ ත්‍රිපිටක බුද්ධ වචනය සිය බසින් තබාලීමේ සත්ක්‍රියාව සපුරාලීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්තමාන ජනාධිපති **ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන** උතුමාණන්ගෙන් ලැබෙන ආශිර්වාදය ද ගරු ආග්‍රාමාත්‍ය **ආර්. ප්‍රේමදාස** මැතිතුමාගේ උපස්තම්භය ද ගරු සංස්කෘතික අමාත්‍ය **ඊ. ඇල්. බී. හුරුල්ලේ** මැතිතුමාගේ සංවිධානය ද අතිරේක ආදායම් ලබන රාජ්‍ය සංස්ථා භාර ඒ ඒ ගරු ඇමතිවරුන්ගේ අනුග්‍රහය ද හේතු කොට ගෙන යථොක්ත ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය නිමහම් කිරීමට පිටුවහල් වන බව ද කියැ යුතු ය. විශෙෂයෙන් සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් **සෝමපාල ජයවර්ධන** මහතාණන්ගේ ක්‍රියා සංවිධානය මෙහි ලා ප්‍රශංසනීය බව ප්‍රකාශ කරම්හ. ශාසනායු වර්ධනයට හේතුවන පරිදි මෙ මැ සත් ක්‍රියායෙහි සහාය වන හැම කෙනෙක් ම සුඛභාගී වෙත්වා'යි ආශංසනය කරම්හ.

මෙ වගට, ශාස්තෘශාසනොදයකාරී,

**ලබුගම ලඞ්කානන්ද**

මහානායක ස්ථවිර

ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

2525/1982 අගෝස්තු 20

මහානායක චාරිකාරාමය

115, විජේරාම මාවත

කොළඹ 7.



Free Distribution www.aathaapi.org

# සංඥපනය

අප බුදුන් සාරාසැකිකප් සුවහසෙකින් මතුයෙහි සුමෙධ නම් මහතවුසක් වැ අෂ්ටාඞ්ග සමවධානයෙන් යෙදී දිවකුරු බුදුන් පාමුලැ වැඳහෙව සංසාර ව්‍යසනාපන්න සත්ත්ව වර්ගයා කෙරෙහි කළ කරුණායෙන් අත්පත් නිවන් සුව හැරපියා ගොරබිරම් සසරට වැද දස පැරුම් කුළුගන්වා තුසී පුරෙහි ඉපද එහි ආයු පමණින් වැසැ දෙව්බඹුන් කළ අයදමින් මිනිස් ලොවැ ඉපද පස්මරුන් දිනා බුදු වැ දම්සක් පවත්වා පන්සාළිස් හවුරුද්දක් වැඩසිටැ සදහම් අමාවැසි වස්වමින් සූවිසි අසංඛ්‍යයක් සත්ත්වයන් අමාමහනිවනින් සනසා අනුපාදිසෙස පරිනිර්වාණ ධාතුයෙන් පිරිනිවි කල්හි–

බුදුරදුන්ගේ පරිනිර්වාණසමයෙහි රැස්වූ සත් ලක්‍ෂයක් භික්ෂූන් කෙරෙහි සඞ්ඝස්ථවිර වූ මහසුප් මහරහතුන් වහන්සේ ප්‍රමුඛ ත්‍රිවිද්‍යා ප්‍රතිසංවිදදිප්‍රාප්ත පඤ්චසත මහාක්ෂීණාශ්‍රවයන් විසින් දෙස කාල නිදනාදි විසින් විසිරැසිටි සුත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වෙදල්ල යන නවාඞ්ග ශාස්තෘශාසන සඞ්ඛ්‍යාත ධර්මවිනය, විනය සුත්තන්ත අභිධම්ම යන පිටක වශයෙන් ද දීඝ මජ්ඣිම සංයුත්ත අඞ්ගුත්තර ඛුද්දක යයි ආගම හෙවත් නිකාය වශයෙන් ද විභාග කොට සඞ්ගායනා කරන ලද්දේය. ඒ ප්‍රථම සඞ්ගීතිකාරක මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ වශීගණයා විසින් මැ මෙ මෙ ධර්ම යැ, මේ විනය යැ, මේ ප්‍රථමාදි ත්‍රිවිධ බුද්ධවචන යැ, මේ විනයාදි තුන් පිටක යැ, මේ දීඝනිකායාදි පඤ්ච නිකාය යැ, මේ සුත්ත ගෙය්‍යාදි නවාඞ්ගයෝ යැ, මේ චතුරාසීති සහස්‍රප්‍රභෙද වූ ධර්මස්කන්ධයෝ යැ' යි ප්‍රභෙද තාක් ව්‍යවස්ථා කොට සඞ්ගීත වූයේ යි. එම තු ද ඔවුන් වහන්සේ විසින් මැ අන්‍ය වූත් උද්දාන සංග්‍රහ, වර්ග සංග්‍රහ, පෙය්‍යාල සංග්‍රහ, එකකනිපාත දුකනිපාතාදි නිපාත සංග්‍රහ, සංයුත්ත සංග්‍රහ, පණ්ණාසක සංග්‍රහාදි ත්‍රිපිටකයෙහි දක්නා ලැබෙන අනේකවිධ වූ සංග්‍රහ ප්‍රභේද ව්‍යවස්ථා කරන ලද්දේ ය. සංගීති කථායෙහි ලා දත මනා හැම විස්තරයෙක් මැ තෙවළායෙහි විශාරද වූ ආචාර්ය පරවාහැර සිරි වජිරඤාණ නාහිමිපාණන් විසින් මහාවග්ගපාළියට ලියන ලද ප්‍රස්තාවනායෙන් ද, නිකායග්‍රන්ථයන් පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීම අහංගමැ විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති දක්ෂිණ ලංකායෙහි ප්‍රධාන සංඝනායක මහතෙර-පාණන් විසින් සංයුත්තනිකාය ප්‍රථම භාගයෙහි ලියූ සංක්ෂිප්ත සංඥපනයෙන් ද දතයුත්තේ යි. මෙහි ලා සංයුත්තනිකාය පිළිබඳ අල්පමාත්‍ර විවරණයෙක් දක්වනු ලැබේ.

දේවතාදීන් අරභයා ඔවුන් පුළුවුත් පැන විසඳීමාදි විසින් වදළ ඕඝතරණාදි සූත්‍රයන්ගේ ද නළවර්ගාදි වර්ගයන්ගේ ද සංයුක්තිය – සංයෝගය ඇති සංගීතිය සංයුත්තාගම නම් වෙයි. මේ සංයුත්තාගමවරය සගාථකවග්ග යැ, නිදනවග්ග යැ, ඛන්ධකවග්ග යැ, සළායතනවග්ග යැ. මහාවග්ග යැ යි වර්ග පඤ්චකයෙක් වෙයි. ඒ වර්ගයන්හි බැසගෙන සිටුනා සංයුත්තයෝ සූපනස් දෙනෙක් වෙති. සංයුත්තයන්හි පිවිසැගත්



Free Distribution www.aathaapi.org

අනන්තර වර්ගයෝ දෙසිය අටවිසි දෙනෙක් පමණ වෙති. සංයුත්ත නිකායෙහි ලා සත්දහස්සත්සියදෙසැට සූත්‍ර කෙනෙක් වෙත්. තවද සංයුක්තසඟියෙහි ගණිත කුශලයන් විසින් ගණනා ලද බණවර සියයෙක් ඇත. අෂ්ටාක්ෂරපාද අනුෂ්ටුප් ඡන්දසින් බැඳුණු ගාථා දෙසියසපනසෙක් බණවරෙකි. එහෙයින් විසිපන්දහස්සසිය ගාථා කෙනෙක් සංයුක්තසඟියෙහි ඇත ඒ අක්ෂර විසින් අටලක්ෂ එකුන් විසිදහස් දෙසියයෙකි.

සංයුත්ත වශයෙන් සගාථක වග්ගයෙහි දෙවතාසංයුත්ත දෙවපුත්ත – කොසල– මාර– භික්ඛුනී– බ්‍රහ්ම– බ්‍රාහ්මණ– වඞ්ගීස– වන– යක්ඛ– සක්ක සංයුත්ත' යයි එකොළොස් සංයුත්ත කෙනෙක් වෙති. එහි අන්තර වර්ගයෝ විසි අට දෙනෙක් වෙත්.

නිදානවග්ගයෙහි අභිසමය සංයුත්ත ධාතු– අනමතග්ග– කස්සප– ලාභසක්කාර– රාහුල– ලක්ඛණ– ඕපම්ම– භික්ඛු සංයුත්ත' යයි නව සංයුත්ත කෙනෙකි. එහි අනන්තර වර්ග අටතිසෙකි.

ඛන්ධක වග්ගයෙහි 'ඛන්ධසංයුත්ත රාධ– දිට්ඨි– ඔක්කන්තික– උප්පාද– කිලෙස– සාරිපුත්ත– නාග– සුපණ්ණ– ගන්ධබ්බ– වලාහක– වච්ඡගොත්ත– ඣානසංයුත්ත' යයි තෙළෙස් සංයුත්ත කෙනෙක් වෙති, එහි අනන්තර වර්ග තිසක් වෙත්.

සළායතනවග්ගයෙහි වෙදනා සංයුත්ත මාතුගාම– ජම්බුඛාදක– සාමණ්ඩකානී– මොග්ගල්ලාන– චිත්ත– ගාමණී– අසඞ්ඛත– අබ්‍යාකත සංයුත්ත' යයි නව සංයුත්ත කෙනෙක් වෙති. එහි අනන්තර වර්ගයෝ අටතිස් දෙනෙකි.

මහාවග්ගයෙහි 'මග්ගසංයුත්ත බොජ්ඣඞ්ග– සතිපට්ඨාන– ඉන්ද්‍රිය– සම්මප්පධාන– බල– ඉද්ධිපාද– අනුරුද්ධ– ඣාන– ආනාපාන– සොතාපත්ති– සච්ච සංයුත්ත' යයි සංයුත්තයෝ දොළොස් දෙනෙකි. එහි අනන්තර වර්ගයෝ සූපැත්තෑවක් වෙත්. (පෙය්‍යාල හෙතුයෙන් වර්ගසංඛ්‍යා දක්වීමෙහි දී ග්‍රන්ථසංස්කාරකයන්ගේ අසමාන සටහන් ඇති බව පෙනේ.)

නිකාය ග්‍රන්ථයන්ගේ ගුණස්තව විසින් අසාධාරණ විශිෂ්ටතා දක්වන බුද්ධඝොසාචාර්යන් වහන්සේ–

"සංයුත්තවග්ගපතිමණ්ඩිතස්ස– සංයුත්ත ආගමවරස්ස

බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස– ඤාණප්පභෙදජනනස්ස" යී

දේවතා සංයුත්තා දි සංයුත්තයන්ගෙන් ද නළවර්ගා දි වර්ගයන්ගෙන් ද ප්‍රතිමණ්ඩිත වූ සංයුත්තාගමවරය අග්‍රශ්‍රාවකාදී ආර්‍යයන් විසින් අර්ථ සංවර්ණනා ගුණසංවර්ණනා වශයෙන් සංවර්ණිත යැ, නොහොත් සම්‍යක් සම්බුද්ධයන් විසින් හා සංගායනාදි වශයෙන් අනුබුද්ධ වූ ශ්‍රාවකයන් විසිනුදු සංවර්ණිත යැ, පටිච්චසමුප්පාදඛන්ධායතනාදී කථා



Free Distribution www.aathaapi.org

බහුල වැ පවත්නා හෙයින් ගම්භීරඥානචරියා විභාවන කරනුයෙන් ඥානප්‍රභෙද ජනනය කරනු වේ යයි වදළහ. එසේ මැ අට්ඨකථා නිගමනයෙහි– "බහුකාරස්ස යතීනං විපස්සනා වාර නිපුණ බුද්ධි-නං" යී රූපා රූප සම්මර්ශනයෙන් විදර්ශනාවාරයෙහි නිපුණ බුද්ධි ඇති යතීන්ට බොහෝ උපකාර ඇති සේ සංයුත්සඟියට ථොමනා කළාහ.

ඒ එසේ මැයි: ස්කන්ධ ධාතු ආයතන සත්‍ය ඉන්ද්‍රිය ප්‍රතීත්‍ය-සමුත්පාද භෙද වූ පරමාර්ථධර්මයන් නානානයින් විභාග කළ නොයෙක් සියගණන් සූත්‍රයන්ගෙන් සංයුක්තාගමය සැදී සිටියේය. එහෙයින් ඥානප්‍රභෙදජනනයෙන් කල ප්‍රශංසා යෙදේ මැ යි.

ත්‍රිපිටක සද්ධර්මය හෙළබසින් තබාලීම හුදු සිංහල ජනතාවගේ මැ වැඩ සඳහා වෙයි. ශ්‍රීමත් ජෝන් කොතලාවල අගමැතිඳුන්ගේ පාලන යුගයෙහි (1954) ප්‍රාරබ්ධ වූ ඒ මැ සත්කාර්‍ය්‍ය අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති උතුමාණන්ගේ පාලනයුගයෙහි නිමහම්වනු දක්ම සතුටු දනවනු වෙයි. මේ ධර්මව්‍යාඛ්‍යානයන් ඉගෙන උභය ලොකාර්ථ සිද්ධිය සඳහා උත්සුක වෙත්වා' යි අපගේ ආශංසනය වේ.

ලබුගම ලඞ්කානන්ද
මහානායක ස්ථවිර

2525
1982. සැප්තැම්බර්මස, 5 වැනි දින
මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙණේදීය.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝ සභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී-කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ — මාකඩවර, රෙවත පරිවෙණාධිපති රාජකීයපණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීයපණ්ඩිත, කරඳන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි, ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීයපණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය උඩුවේ ඥානානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ.



Free Distribution www.aathaapi.org

# සංකේත නිරූපණය

සී 1. - පැල්මඩුල්ල මහාවිහාරයෙහි පුස්කොළ පොත

සී 2. - ගාල්ල පරමානන්ද විහාරයෙහි පුස්කොළ පොත

සීමු. - සිංහලාක්ෂර මුද්‍රිත සංයුත්තනිකාය

ස්‍යා. - ස්‍යාමාක්ෂර මුද්‍රිත සංයුත්තනිකාය

මජසං. - බුරුමරට ඡට්ඨසංගීතිශොධිත සංයුත්තනිකාය

PTS. - Pali Text Society Edition



Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ ē | ඔ ō |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | ව්හ vha |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ ē | ො ō |



Free Distribution www.aathaapi.org

# සංයුත්තනිකායො

## පඤ්චමභාගෙ — දුතියො ඛණ්ඩො

# මහාවග්ග (2) — විෂය සූචි

## 7. ඉද්ධිපාදසංයුත්තං 2 – 61

### 1. චාපාලවග්ගො 2 – 19


| | | | |
|---|---|---|---|
| 1. | අපාර | සුත්තං | 2 – 3 |
| 2. | විරද්ධ | ,, | 2 – 5 |
| 3. | අරිය | ,, | 4 – 5 |
| 4. | නිබ්බිද | ,, | 4 – 5 |
| 5. | පදෙස | ,, | 6 – 7 |
| 6. | සමත්ත | ,, | 6 – 7 |
| 7. | භික්ඛු | ,, | 8 – 9 |
| 8. | අරහන්ත | ,, | 8 – 9 |
| 9. | ඤාණ | ,, | 10 – 11 |
| 10. | චෙතිය | ,, | 10 – 17 |


### 2. පාසාදකම්පනවග්ගො 18 – 45


| | | | |
|---|---|---|---|
| 1. | හෙතු | සුත්තං | 18 – 23 |
| 2. | මහප්ඵල | ,, | 22 – 25 |
| 3. | ඡන්ද | ,, | 24 – 27 |
| 4. | මොග්ගල්ලාන | ,, | 26 – 29 |
| 5. | බ්‍රාහ්මණ | ,, | 30 – 33 |
| 6. | මහිද්ධික | ,, | 32 – 33 |
| 7. | ඉද්ධිවිධ | ,, | 34 – 35 |
| 8. | භික්ඛු | ,, | 36 – 37 |
| 9. | භාවනා | ,, | 36 – 37 |
| 10. | විභඞ්ග | ,, | 38 – 45 |


### 3. අයොගුළවග්ගො 46 – 57


| | | | |
|---|---|---|---|
| 1. | මග්ග | සුත්තං | 46 – 47 |
| 2. | අයොගුළ | ,, | 46 – 49 |
| 3. | භික්ඛු | ,, | 48 – 49 |
| 4. | සුද්ධක | ,, | 50 – 51 |
| 5. | ඵල | ,, | 50 – 51 |
| 6. | දුතියඵල | ,, | 50 – 51 |
| 7. | ආනන්ද | ,, | 52 – 53 |
| 8. | දුතියආනන්ද | ,, | 52 – 53 |
| 9. | සම්බහුලභික්ඛු | ,, | 52 – 53 |
| 10. | දුතියසම්බහුලභික්ඛු | ,, | 54 – 55 |
| 11. | මොග්ගල්ලාන | ,, | 54 – 57 |
| 12. | තථාගත | ,, | 56 – 57 |

## විසය සූචි


### 4. ගඞ්ගාපෙය්‍යාලවග්ගො 58 – 59

| | |
|---|---|
| පාචීනනින්නාදිසුත්තානි | 58 – 59 |

### 5. අප්පමාදවග්ගො 58 – 59

| | |
|---|---|
| තථාගතාදි සුත්තානි | 58 – 59 |

### 6. බලකරණීයවග්ගො 58 – 59

| | |
|---|---|
| බලාදි සුත්තානි | 58 – 59 |

### 7. එසනාවග්ගො 60 – 61

| | |
|---|---|
| එසනාදි සුත්තානි | 60 – 61 |

### 8. ඔඝවග්ගො 60 – 61

| | |
|---|---|
| ඔඝාදි සුත්තානි | 60 – 61 |
| උද්ධම්භාගිය සුත්තං | 60 – 61 |

## 8. අනුරුද්ධ සංයුත්තං 62 – 83

### 1. රහොගතවග්ගො 62 – 77

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | රහොගත | සුත්තං | .. | .. | 62 – 67 |
| 2. | දුතියරහොගත | ,, | .. | .. | 66 – 69 |
| 3. | සුතනු | ,, | .. | .. | 68 – 69 |
| 4. | කණ්ඩකී | ,, | .. | .. | 70 – 71 |
| 5. | දුතියකණ්ඩකී | ,, | .. | .. | 70 – 71 |
| 6. | තතියකණ්ඩකී | ,, | .. | .. | 72 – 73 |
| 7. | තණ්හක්ඛය | ,, | .. | .. | 72 – 73 |
| 8. | සලලාගාර | ,, | .. | .. | 72 – 75 |
| 9. | අම්බපාලි | ,, | .. | .. | 74 – 75 |
| 10. | ගිලාන | ,, | .. | .. | 76 – 77 |

### 2. සහස්සවග්ගො 78 – 83

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සහස්ස | සුත්තං | .. | .. | 78 – 79 |
| 2. | ඉද්ධිවිධ | ,, | .. | .. | 78 – 79 |
| 3. | දිබ්බසොත | ,, | .. | .. | 78 – 79 |
| 4. | චෙතොපරිය | ,, | .. | .. | 80 – 81 |
| 5. | ඨාන | ,, | .. | .. | 80 – 81 |
| 6. | කම්ම | ,, | .. | .. | 80 – 81 |
| 7. | සබ්බත්ථගාමිනී | ,, | .. | .. | 80 – 81 |
| 8. | අනෙකධාතු | ,, | .. | .. | 80 – 81 |
| 9. | නානාධිමුත්තික | ,, | .. | .. | 80 – 81 |
| 10. | ඉන්ද්‍රිය | ,, | .. | .. | 82 – 83 |
| 11. | ඣාන | ,, | .. | .. | 82 – 83 |
| 12. | පුබ්බෙනිවාස | ,, | .. | .. | 82 – 83 |
| 13. | දිබ්බචක්ඛු | ,, | .. | .. | 82 – 83 |
| 14. | ආසවක්ඛය | ,, | .. | .. | 82 – 83 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි


### 9. ඣානසංයුත්තං 84 – 89

#### 1. ගඞ්ගාපෙය්‍යාලවග්ගො 84 – 85

පාචීනනින්නාදි සුත්තානි 84 – 85

#### 2. අප්පමාදවග්ගො 86 – 87

තථාගතාදි සුත්තානි 86 – 87

#### 3. බලකරණීයවග්ගො 86 – 87

බලාදි සුත්තානි 86 – 87

#### 4. එසනාවග්ගො 86 – 87

එසනාදි සුත්තානි 86 – 87

#### 5. ඔඝවග්ගො 88 – 89

ඔඝාදි සුත්තානි 88 – 89

උද්ධම්භාගිය සුත්තං 88 – 89

### 10. ආනාපානසංයුත්තං 90 – 137

#### 1. එකධම්මවග්ගො 90 – 111

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | එකධම්ම | සුත්තං | .. | .. | 90 – 93 |
| 2. | බොජ්ඣඞ්ග | ,, | .. | .. | 92 – 93 |
| 3. | සුද්ධක | ,, | .. | .. | 92 – 93 |
| 4. | ඵල | ,, | .. | .. | 94 – 95 |
| 5. | දුතියඵල | ,, | .. | .. | 94 – 95 |
| 6. | අරිට්ඨ | ,, | .. | .. | 96 – 97 |
| 7. | කප්පින | ,, | .. | .. | 96 – 99 |
| 8. | දීප | ,, | .. | .. | 98 – 103 |
| 9. | අසුභ | ,, | .. | .. | 104 – 107 |
| 10. | කිම්බිල | ,, | .. | .. | 106 – 111 |

#### 2. ආනන්දවග්ගො 112 – 137

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ඉච්ඡානඞ්ගල | සුත්තං | .. | .. | 112–113 |
| 2. | කඞ්ඛෙය්‍ය | ,, | .. | .. | 114–119 |
| 3. | ආනන්ද | ,, | .. | .. | 118–125 |
| 4. | දුතියආනන්ද | ,, | .. | .. | 126–127 |
| 5. | භික්ඛු | ,, | .. | .. | 126–129 |
| 6. | දුතියභික්ඛු | ,, | .. | .. | 128–135 |
| 7. | සංයොජන | ,, | .. | .. | 136–137 |
| 8. | අනුසය | ,, | .. | .. | 136–137 |
| 9. | අද්ධාන | ,, | .. | .. | 136–137 |
| 10. | ආසවක්ඛය | ,, | .. | .. | 136–137 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

## 11. සොතාපත්තිසංයුත්තං 138 – 259

### 1. වෙළුද්වාරවග්ගො 138 – 167


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | රාජ | සුත්තං | .. | .. | 138–139 |
| 2. | බ්‍රහ්මචරියොගධ | ,, | .. | .. | 140–141 |
| 3. | දීඝාවුඋපාසක | ,, | .. | .. | 140–145 |
| 4. | සාරිපුත්ත | ,, | .. | .. | 144–145 |
| 5. | දුතියසාරිපුත්ත | ,, | .. | .. | 146–147 |
| 6. | ථපති | ,, | .. | .. | 146–153 |
| 7. | වෙළුද්වාරෙය්‍ය | ,, | .. | .. | 154–161 |
| 8. | ගිඤ්ජකාවසථ | ,, | .. | .. | 160–163 |
| 9. | දුතියගිඤ්ජකාවසථ | ,, | .. | .. | 162–163 |
| 10. | තතියගිඤ්ජකාවසථ | ,, | .. | .. | 164–167 |


### 2. රාජකාරාමවග්ගො 168 – 181


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සහස්ස | සුත්තං | .. | .. | 168–169 |
| 2. | බ්‍රාහ්මණ | ,, | .. | .. | 168–169 |
| 3. | ආනන්ද | ,, | .. | .. | 170–173 |
| 4. | දුග්ගති | ,, | .. | .. | 172–173 |
| 5. | විනිපාත | ,, | .. | .. | 172–173 |
| 6. | මිත්තාමච්ච | ,, | .. | .. | 172–175 |
| 7. | දුතියමිත්තාමච්ච | ,, | .. | .. | 174–175 |
| 8. | දෙවචාරික | ,, | .. | .. | 176–177 |
| 9. | දුතියදෙවචාරික | ,, | .. | .. | 178–177 |
| 10. | තතියදෙවචාරික | ,, | .. | .. | 178–181 |


### 3. සරකානිවග්ගො 182 – 217


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මහානාම | සුත්තං | .. | .. | 182–185 |
| 2. | දුතියමහානාම | ,, | .. | .. | 184–187 |
| 3. | තතියමහානාම | ,, | .. | .. | 186–191 |
| 4. | සරකානි | ,, | .. | .. | 190–195 |
| 5. | දුතියසරකානි | ,, | .. | .. | 196–201 |
| 6. | අනාථපිණ්ඩික | ,, | .. | .. | 200–207 |
| 7. | දුතියඅනාථපිණ්ඩික | ,, | .. | .. | 208–211 |
| 8. | තතියඅනාථපිණ්ඩික | ,, | .. | .. | 201–215 |
| 9. | භික්ඛු | ,, | .. | .. | 214–215 |
| 10. | නන්දක | ,, | .. | .. | 214–217 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 4. පුඤ්ඤාභිසන්දවග්ගො 218 – 231


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අභිසන්ද | සුත්තං | .. | .. | 218–219 |
| 2. | දුතියාභිසන්ද | ,, | .. | .. | 218–219 |
| 3. | තතියාභිසන්ද | ,, | .. | .. | 220–221 |
| 4. | දෙවපද | ,, | .. | .. | 220–221 |
| 5. | දුතියදෙවපද | ,, | .. | .. | 222–223 |
| 6. | සභාගත | ,, | .. | .. | 222–225 |
| 7. | මහානාම | ,, | .. | .. | 224–227 |
| 8. | වස්ස | ,, | .. | .. | 226–227 |
| 9. | කාළිගොධා | ,, | .. | .. | 226–229 |
| 10. | නන්දිය | ,, | .. | .. | 228–231 |


### 5. සගාථපුඤ්ඤාභිසන්දවග්ගො 232 – 241


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අසඞ්ඛෙය්‍ය | සුත්තං | .. | .. | 232 – 233 |
| 2. | දුතියඅසඞ්ඛෙය්‍ය | ,, | .. | .. | 234 – 235 |
| 3. | තතියඅසඞ්ඛෙය්‍ය | ,, | .. | .. | 236 – 237 |
| 4. | අඩ්ඪ | ,, | .. | .. | 236 – 237 |
| 5. | දුතියඅඩ්ඪ | ,, | .. | .. | 238 – 239 |
| 6. | සුද්ධක | ,, | .. | .. | 238 – 239 |
| 7. | නන්දිය | ,, | .. | .. | 238 – 239 |
| 8. | භද්දිය | ,, | .. | .. | 240 – 241 |
| 9. | මහානාම | ,, | .. | .. | 240 – 241 |
| 10. | අඞ්ග | ,, | .. | .. | 240 – 241 |


### 6. සප්පඤ්ඤවග්ගො 242 – 255


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සගාථක | සුත්තං | .. | .. | 242 – 243 |
| 2. | වස්සංවුත්ථ | ,, | .. | .. | 242 – 245 |
| 3. | ධම්මදින්න | ,, | .. | .. | 244 – 247 |
| 4. | ගිලාන | ,, | .. | .. | 246 – 253 |
| 5. | ඵල | ,, | .. | .. | 252 – 253 |
| 6. | දුතියඵල | ,, | .. | .. | 252 – 253 |
| 7. | තතියඵල | ,, | .. | .. | 252 – 253 |
| 8. | චතුත්ථඵල | ,, | .. | .. | 254 – 255 |
| 9. | පටිලාභ | ,, | .. | .. | 254 – 255 |
| 10. | වඩ්ඪි | ,, | .. | .. | 254 – 255 |
| 11. | වෙපුල්ල | ,, | .. | .. | 254 – 255 |




Free Distribution www.aathaapi.org

## 7. මහාපඤ්ඤවග්ගො 256 – 259


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මහාපඤ්ඤ | සුත්තං | .. | .. | 256–257 |
| 2. | පුථුපඤ්ඤ | ,, | .. | .. | 256–257 |
| 3. | විපුලපඤ්ඤ | ,, | .. | .. | 256–257 |
| 4. | ගම්භීරපඤ්ඤ | ,, | .. | .. | 256–257 |
| 5. | අසාමන්තපඤ්ඤ | ,, | .. | .. | 256–257 |
| 6. | භූරිපඤ්ඤ | ,, | .. | .. | 256–257 |
| 7. | පඤ්ඤාබාහුල්ල | ,, | .. | .. | 256–257 |
| 8. | සීඝපඤ්ඤ | ,, | .. | .. | 258–259 |
| 9. | ලහුපඤ්ඤ | ,, | .. | .. | 258–259 |
| 10. | හාසුපඤ්ඤ | ,, | .. | .. | 258–259 |
| 11. | ජවනපඤ්ඤ | ,, | .. | .. | 258–259 |
| 12. | තික්ඛපඤ්ඤ | ,, | .. | .. | 258–259 |
| 13. | නිබ්බෙධිකපඤ්ඤ | ,, | .. | .. | 258–259 |


## 12. සච්චසංයුත්තං 260 – 361

### 1. සමාධිවග්ගො 260 – 269


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සමාධි | සුත්තං | .. | | 260–261 |
| 2. | පටිසල්ලාන | ,, | .. | .. | 260–261 |
| 3. | කුලපුත්ත | ,, | .. | .. | 260–263 |
| 4. | දුතියකුලපුත්ත | ,, | .. | .. | 262–263 |
| 5. | සමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 262–263 |
| 6. | දුතියසමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 264–265 |
| 7. | විතක්ක | ,, | .. | .. | 264–265 |
| 8. | චින්තා | ,, | .. | .. | 266–267 |
| 9. | විග්ගාහිකකථා | ,, | .. | .. | 266–267 |
| 10. | තිරච්ඡානකථා | ,, | .. | .. | 268–269 |


### 3. ධම්මචක්කප්පවත්තනවග්ගො 270–285


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ධම්මචක්කප්පවත්තන | සුත්තං | .. | .. | 270–275 |
| 2. | තථාගත | ,, | .. | .. | 274–277 |
| 3. | ඛන්ධ | ,, | .. | .. | 276–279 |
| 4. | ආයතන | ,, | .. | .. | 278–279 |
| 5. | ධාරණ | ,, | .. | .. | 278–281 |
| 6. | දුතියධාරණ | ,, | .. | .. | 280–283 |
| 7. | අවිජ්ජා | ,, | .. | .. | 282–283 |
| 8. | විජ්ජා | ,, | .. | .. | 284–285 |
| 9. | සඞ්කාසන | ,, | .. | .. | 284–285 |
| 10. | තථ | ,, | .. | .. | 284–285 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 3. කොටිගාමවග්ගෝ 286 – 293


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කොටිගාම | සුත්තං | .. | .. | 286–287 |
| 2. | දුතියකොටිගාම | ,, | .. | .. | 286–289 |
| 3. | අභිසම්බුද්ධ | ,, | .. | .. | 288–289 |
| 4. | අරහන්ත | ,, | .. | .. | 288–289 |
| 5. | ආසවක්ඛය | ,, | .. | .. | 290–291 |
| 6. | මිත්ත | ,, | .. | .. | 290–291 |
| 7. | තථ | ,, | .. | .. | 290–291 |
| 8. | ලොක | ,, | .. | .. | 290–291 |
| 9. | පරිඤ්ඤෙය්‍ය | ,, | .. | .. | 292–293 |
| 10. | ගවම්පති | ,, | .. | .. | 292–295 |


### 4. සිංසපාවග්ගෝ 294 – 305


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සිංසපා | සුත්තං | .. | .. | 294–293 |
| 2. | ඛදිර | ,, | .. | .. | 294–297 |
| 3. | දණ්ඩ | ,, | .. | .. | 296–297 |
| 4. | චෙල | ,, | .. | .. | 296–297 |
| 5. | සත්තිසත | ,, | .. | .. | 298–299 |
| 6. | පාණ | ,, | .. | .. | 298–299 |
| 7. | සුරියූපම | ,, | .. | .. | 300–301 |
| 8. | දුතියසුරියූපම | ,, | .. | .. | 300–301 |
| 9. | ඉන්දඛීල | ,, | .. | .. | 302–303 |
| 10. | වාද | ,, | .. | .. | 304–305 |


### 5. පපාතවග්ගෝ 306–323


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | චින්තා | සුත්තං | .. | .. | 306–309 |
| 2. | පපාත | ,, | .. | .. | 308–311 |
| 3. | පරිළාහ | ,, | .. | .. | 312–313 |
| 4. | කූටාගාර | ,, | .. | .. | 314–315 |
| 5. | වාල | ,, | .. | .. | 314–317 |
| 6. | අන්ධකාර | ,, | .. | .. | 316–319 |
| 7. | ඡිග්ගල | ,, | .. | .. | 318–319 |
| 8. | දුතියඡිග්ගල | ,, | .. | .. | 320–321 |
| 9. | සිනෙරු | ,, | .. | .. | 320–323 |
| 10. | දුතියසිනෙරු | ,, | .. | .. | 322–323 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 6. අභිසමයවග්ගො 324 – 331


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නඛසිඛා | සුත්තං | .. | .. | 324–325 |
| 2. | පොක්ඛරණී | ,, | .. | .. | 324–325 |
| 3. | සම්භෙජ්ජ | ,, | .. | .. | 324–325 |
| 4. | දුතියසම්භෙජ්ජ | ,, | .. | .. | 326–327 |
| 5. | පඨවී | ,, | .. | .. | 326–327 |
| 6. | දුතියපඨවී | ,, | .. | .. | 326–327 |
| 7. | සමුද්ද | ,, | .. | .. | 328–329 |
| 8. | දුතියසමුද්ද | ,, | .. | .. | 328–329 |
| 9. | පබ්බතූපම | ,, | .. | .. | 328–329 |
| 10. | දුතියපබ්බතූපම | ,, | .. | .. | 330–331 |


### 7. ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො 332 – 337


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අඤ්ඤත්‍ර | සුත්තං | .. | .. | 332–333 |
| 2. | පච්චන්ත | ,, | .. | .. | 332–333 |
| 3. | පඤ්ඤා | ,, | .. | .. | 332–333 |
| 4. | සුරාමෙරය | ,, | .. | .. | 334–335 |
| 5. | ඔදකජ | ,, | .. | .. | 334–335 |
| 6. | මත්තෙය්‍ය | ,, | .. | .. | 334–335 |
| 7. | පෙත්තෙය්‍ය | ,, | .. | .. | 334–335 |
| 8. | සාමඤ්ඤ | ,, | .. | .. | 334–335 |
| 9. | බ්‍රහ්මඤ්ඤ | ,, | .. | .. | 336–337 |
| 10. | අපචායි | ,, | .. | .. | 336–337 |


### 8. දුතියආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො 338 – 341


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාණාතිපාත | සුත්තං | .. | .. | 338–339 |
| 2. | අදින්නාදාන | ,, | .. | .. | 338–339 |
| 3. | කාමෙසුමිච්ඡාචාර | ,, | .. | .. | 338–339 |
| 4. | මුසාවාද | ,, | .. | .. | 338–339 |
| 5. | පිසුනවාචා | ,, | .. | .. | 338–339 |
| 6. | ඵරුසවාචා | ,, | .. | .. | 338–339 |
| 7. | සම්ඵප්පලාප | ,, | .. | .. | 340–341 |
| 8. | බීජගාම | ,, | .. | .. | 340–341 |
| 9. | විකාලභොජන | ,, | .. | .. | 340–341 |
| 10. | විලෙපන | ,, | .. | .. | 340–341 |


### 9. තතියආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො 342 – 345


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නච්චගීත | සුත්තං | .. | .. | 342 – 343 |
| 2. | උච්චාසයන | ,, | .. | .. | 342 – 343 |
| 3. | ජාතරූප | ,, | .. | .. | 342 – 343 |
| 4. | ආමකධඤ්ඤ | ,, | .. | .. | 342 – 343 |
| 5. | ආමකමංස | ,, | .. | .. | 342 – 343 |
| 6. | කුමාරික | ,, | .. | .. | 344 – 345 |
| 7. | දාසිදාස | ,, | .. | .. | 344 – 345 |
| 8. | අජෙළක | ,, | .. | .. | 344 – 345 |
| 9. | කුක්කුටසූකර | ,, | .. | .. | 344 – 345 |
| 10. | වළවා | ,, | .. | .. | 344 – 345 |




Free Distribution www.aathaapi.org

## 10. චතුත්ථආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො 346 – 349


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ඛෙත්තවත්ථු | සුත්තං | .. | .. | 346–347 |
| 2. | කයවික්කය | ,, | .. | .. | 346–347 |
| 3. | දූතෙය්‍ය | ,, | .. | .. | 346–347 |
| 4– 6. | තුලාකූටාදි | සුත්තානි | .. | .. | 346–347 |
| 7– 9. | උක්කොටනාදි | ,, | .. | .. | 346–347 |
| 10–15. | ඡෙදනාදි | ,, | .. | .. | 348–349 |


## 11. පඤ්චගතිපෙය්‍යාලවග්ගො 350 – 361


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මනුස්සචුති | සුත්තං | .. | .. | 350 – 351 |
| 2. | දුතියමනුස්සචුති | ,, | .. | .. | 350 – 351 |
| 3. | තතියමනුස්සචුති | ,, | .. | .. | 350 – 351 |
| 4. | චතුත්ථමනුස්සචුති | ,, | .. | .. | 350 – 351 |
| 5. | පඤ්චමමනුස්සචුති | ,, | .. | .. | 352 – 353 |
| 6. | ඡට්ඨමමනුස්සචුති | ,, | .. | .. | 352 – 353 |
| 7. | දෙවචුති | ,, | .. | .. | 352 – 353 |
| 8. | දුතියදෙවචුති | ,, | .. | .. | 352 – 353 |
| 9. | තතියදෙවචුති | ,, | .. | .. | 352 – 353 |
| 10. | චතුත්ථදෙවචුති | ,, | .. | .. | 352 – 353 |
| 11. | පඤ්චමදෙවචුති | ,, | .. | .. | 354 – 355 |
| 12. | ඡට්ඨමදෙවචුති | ,, | .. | .. | 354 – 355 |
| 13. | නිරයචුති | ,, | .. | .. | 354 – 355 |
| 14. | දුතියනිරයචුති | ,, | .. | .. | 354 – 355 |
| 15. | තතියනිරයචුති | ,, | .. | .. | 354 – 355 |
| 16. | චතුත්ථනිරයචුති | ,, | .. | .. | 354 – 355 |
| 17. | පඤ්චමනිරයචුති | ,, | .. | .. | 356 – 357 |
| 18. | ඡට්ඨමනිරයචුති | ,, | .. | .. | 356 – 357 |
| 19. | තිරච්ඡානචුති | ,, | .. | .. | 356 – 357 |
| 20. | දුතියතිරච්ඡානචුති | ,, | .. | .. | 356 – 357 |
| 21. | තතියතිරච්ඡානචුති | ,, | .. | .. | 356 – 357 |
| 22. | චතුත්ථතිරච්ඡානචුති | ,, | .. | .. | 356 – 357 |
| 23. | පඤ්චමතිරච්ඡානචුති | ,, | .. | .. | 358 – 359 |
| 24. | ඡට්ඨමතිරච්ඡානචුති | ,, | .. | .. | 358 – 359 |
| 25. | පෙත්තිචුති | ,, | .. | .. | 358 – 359 |
| 26. | දුතියපෙත්තිචුති | ,, | .. | .. | 358 – 359 |
| 27. | තතියපෙත්තිචුති | ,, | .. | .. | 358 – 359 |
| 28. | චතුත්ථපෙත්තිචුති | ,, | .. | .. | 358 – 359 |
| 29. | පඤ්චමපෙත්තිචුති | ,, | .. | .. | 360 – 361 |
| 30. | ඡට්ඨමපෙත්තිචුති | ,, | .. | .. | 360 – 361 |


සමත්තං.



Free Distribution www.aathaapi.org

## සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

### පඤ්චමො භාගො—දුතියො කණ්ඩො

## මහාවග්ගො

Free Distribution www.aathaapi.org

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

## පඤ්චමභාගෙ – දුතියො කණ්ඩො

---

# මහාවග්ගො

---

# 7. ඉද්ධිපාදසංයුත්තං

## 1. චාපාලවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

### 7. 1. 1

### අපාර සුත්තං

**3123. සාවත්ථියං:**

චත්තාරොමෙ භික්ඛවෙ, ඉද්ධිපාද භාවිතා බහුලීකතා අපාරා පාරං[1] ගමනාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද. භාවිතා බහුලීකතා අපාරා පාරං ගමනාය සංවත්තන්ති.

### 7. 1. 2

### විරද්ධ සුත්තං

3124. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද විරද්ධා, විරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. කතමෙ චත්තාරො:

---

1. අපරාපරං – සී 1, 2.

සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

## පඤ්චමභාගයෙහි – දෙවන කාණ්ඩය

---

# මහාවර්ගය

---

# 7. ඉද්ධිපාදසංයුත්තය

## 1. චාපාලවර්ගය

**ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

### 7. 1. 1

### අපාර සූත්‍රය

3123. සැවැත්නුවර:

මහණෙනි, මේ සතර ඉද්ධිපාද කෙනෙක් වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු මෙතෙරින් එතෙරට යනු පිණිස පවත්නාහ. කවර සතරදෙනෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන් සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීය්‍ර්‍යය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ ඉද්ධිපාද සතර වඩනා ලද්දාහු බහුල කරනා ලද්දාහු මෙතෙරින් එතෙර යනු පිණිස පවත්නාහ යි.

### 7. 1. 2

### විරද්ධ සූත්‍රය

3124. මහණෙනි, යම් කෙනකුන් විසින් සිවු ඉද්ධිපා වරදවන ලදහු නම් ඔවුන් විසින් මැනැවින් දුක් ගෙවීමට යන අරිමඟ වරදවන ලද්දේ ය. මහණෙනි, යම්කිසි කෙනකුන් විසින් සිවු ඉද්ධිපා අරඹන ලදහු නම් ඔවුන් විසින් මැනැවින් දුක් ගෙවීමට යන අරිමඟ අරඹන ලද්දේ ය. කවර සතරෙක් ද යත්:

ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධාන සඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ චත්තාරො ඉද්ධිපාද විරද්ධා, විරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ චත්තාරො ඉද්ධිපාද ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛය-ගාමීති.

## 7. 1. 3

## අරිය සුත්තං

3125. චත්තාරො'මෙ භික්ඛවෙ, ඉද්ධිපාද භාවිතා බහුලීකතා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නා-ගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසා-සමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයායාති.

## 7. 1. 4

## නිබ්බිද සුත්තං

3126. චත්තාරො'මෙ භික්ඛවෙ, ඉද්ධිපාද භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති -පෙ- විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තීති.

මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීය්‍ය්‍ය නිසා පැවැති සමාධියෙන් හා ... චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, යම් කෙනකුන් විසින් මේ සතර සෘද්ධිපාදයෝ වරදවන ලදහු නම් ඔවුන් විසින් මැනැවින් දුක් ගෙවීමට යන අරිමඟ වරදවන ලද්දේ ය. මහණෙනි යම් කෙනකුන් විසින් මේ සතර සෘද්ධිපාදයෝ අරඹන ලදහු නම් ඔවුන් විසින් මැනැවින් දුක් ගෙවීමට යන අරිමඟ අරඹන ලද්දේ යි.

## 7. 1. 3

## අරිය සූත්‍රය

3125. මහණෙනි, ආය්‍ය්‍ය වූ නෛය්‍ය්‍යාණික වූ මේ සෘද්ධිපාදයෝ සතරදෙන වඩන ලද්දහු බහුල කරන ලද්දහු ඒ අනුව පිළිපන්නහු මැනැවින් දුක් ගෙවීමට පමුණුවත්. කවර සතරදෙනෙක යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීය්‍ය්‍ය නිසා පැවැති සමාධියෙන් හා ... චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, ආය්‍ය්‍ය වූ නෛය්‍ය්‍යාණික වූ මේ සිවු ඉදුපා වඩන ලද්දේ බහුල කරන ලද්දේ ඒ අනුව පිළිපන්නහු මැනැවින් දුක් ගෙවීමට පමුණුවා යි.

## 7. 1. 4

## නිබ්බිද සූත්‍රය

3126. මහණෙනි, මේ චතුරිද්ධිපාද වඩන ලද්දේ බහුල කරන ලද්දේ ඒකාන්ත නිර්වේදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥනය සම්බොධිය නිර්වාණය පිණිස පවතී. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීය්‍ය්‍ය නිසා පැවැති සමාධියෙන් හා ... චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ සිවු ඉදුපා වඩන ලද්දේ බහුල කරන ලද්දේ ඒකාන්තනිර්වේදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥනය සම්බොධිය නිර්වාණය පිණිස පවතී යි.

## 7. 1. 5

### පදෙස සුත්තං

3127. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඉද්ධිප්පදෙසං අභිනිප්ඵාදෙසුං, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඉද්ධිප්පදෙසං අභිනිප්ඵාදෙස්සන්ති, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා ඉද්ධිප්පදෙසං අභිනිප්ඵාදෙන්ති, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඉද්ධිප්පදෙසං අභිනිප්ඵාදෙසුං -පෙ- අභිනිප්ඵාදෙස්සන්ති -පෙ- අභිනිප්ඵාදෙන්ති සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තාති.

## 7. 1. 6

### සමත්ත සුත්තං

3128. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා සමත්තං ඉද්ධිං අභිනිප්ඵාදෙසුං, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා සමත්තං ඉද්ධිං අභිනිප්ඵාදෙස්සන්ති සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා සමත්තං ඉද්ධිං අභිනිප්ඵාදෙන්ති, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා සමත්තං ඉද්ධිං අභිනිප්ඵාදෙසුං -පෙ- අභිනිප්ඵාදෙස්සන්ති -පෙ- අභිනිප්ඵාදෙන්ති සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තාති.

## 7. 1. 5

## පදෙස සූත්‍රය

3127. මහණෙනි, අතීතයෙහි යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධි පෙදෙසක් නිපදවූහු නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවින් එසේ වූහ. බහුල කළ බැවින් එසේ වූහ. මහණෙනි, මතු කල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධි පෙදෙසක් නිපදවන්නාහු නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. මහණෙනි, දැන් යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධි පෙදෙසක් නිපදවත් නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. කවර සිව් ඉද්ධිපා ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය නිසා පැවැති සමාධියෙන් හා ... චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, ඉකුත් කල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධිපෙදෙසක් නිපදවූහු නම් ... නිපදවන්නාහු නම් ... නිපදවත් නම් ඒ සියල්ලෝ මේ සිව් ඉද්ධිපා ම වැඩූ බැවින් බහුල කළ බැවින් එසේ වෙත් යි.

## 7. 1. 6

## සමත්ත සූත්‍රය

3128. මහණෙනි, ඉකුත් කල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධිමුළුල්ල නිපදවූහු නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. මහණෙනි, මතු කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධිමුළුල්ල නිපදවන්නාහු නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. මහණෙනි, දැන් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධි මුළුල්ල නිපදවත් නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. කවර සිව් ඉද්ධිපා ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය නිසා පැවැති සමාධියෙන් හා .. චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, ඉකුත් කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඉද්ධිමුළුල්ල නිපදවූහු නම් ... නිපදවන්නාහු නම් .. නිපදවත් නම් ඒ සියල්ලෝ මේ සිව් ඉද්ධිපා ම වැඩූ බැවිනි, බහුල කළ බැවිනි යි.

## 7. 1. 7

## භික්ඛු සුත්තං

3129. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං භික්ඛූ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිංසු. සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං භික්ඛූ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සන්ති සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි භික්ඛූ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං භික්ඛූ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිංසු -පෙ- විහරිස්සන්ති -පෙ- විහරන්ති සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තාති.

## 7. 1. 8

## අරහන්ත සුත්තං

3130. චත්තාරො මෙ භික්ඛවෙ, ඉද්ධිපාද. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතො අරහං සම්මා සම්බුද්ධොති වුච්චතීති.

## 7. 1. 7

## භික්ඛු සූත්‍රය

3129. මහණෙනි, ඉකුත් කල යම්කිසි මහණ කෙනෙක් ආස්‍රවක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිට්ඨධර්මයෙහි ම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වුසූහු නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. මහණෙනි, මතු කල යම් කිසි මහණ කෙනෙක් ආස්‍රවක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵල සමාධියත් ඵලප්‍රඥාවත් දිට්ඨධර්මයෙහි ම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙන්නාහු නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. මහණෙනි, දැන් යම් කිසි මහණ කෙනෙක් ආස්‍රවක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිට්ඨධර්මයෙහි ම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙත් නම් ඒ සියල්ලෝ සිව් ඉද්ධිපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. කවර සිව් ඉද්ධිපා ද යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය නිසා පැවැති සමාධියෙන් හා ... චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, ඉකුත් කල යම් කිසි මහණ කෙනෙක් ආස්‍රවක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිට්ඨධර්මයෙහි ම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වුසූහු නම් ... වෙසෙන්නාහු නම් ... වෙසෙත් නම් ඒ සියල්ලෝ මේ සිව් ඉද්ධිපා ම වැඩූ බැවිනි, බහුල කළ බැවිනි යි.

## 7. 1. 8

## අරහන්ත සූත්‍රය

3130. මහණෙනි, මේ ඉද්ධිපා සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය නිසා පැවැති සමාධියෙන් හා ... චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ... වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මොහු සිව් ඉද්ධිපා යි. මහණෙනි, මේ සිව් ඉද්ධිපා වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙමේ අර්හත් සම්‍යක් සම්බුද්ධ ය යි කියනු ලැබේ යි.

## 7. 1. 9

### ඤාණ සුත්තං

3131. අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදොති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බොති මෙ භික්ඛවෙ -පෙ- භාවිතොති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

අයං විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදොති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සො ඛො පනායං විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බොති මෙ භික්ඛවෙ -පෙ- භාවිතොති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

අයං චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදොති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සො ඛො පනායං චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බොති මෙ භික්ඛවෙ -පෙ- භාවිතොති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

අයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදොති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සො ඛො පනායං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බොති මෙ භික්ඛවෙ -පෙ- භාවිතො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදීති.

## 7. 1. 10

### චෙතිය සුත්තං

3132. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "ගණ්හාහි ආනන්ද, නිසීදනං යෙන චාපාලං චෙතියං[1] තෙනුපසඞ්කමිස්සාම[2] දිවාවිහාරායා"ති. "එවං භන්තෙ"ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා නිසීදනං ආදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි. අථ ඛො භගවා යෙන චාපාලං චෙතියං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ආයස්මාපි ඛො ආනන්දො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

1. චාපාලචෙතියං - සයා.
2. තෙනුපසංකමිස්සාමි - සීමු.

## 7. 1. 9

### ඤාණ සූත්‍රය

3131. මහණෙනි, මේ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාද ය යි පෙර නොඇසූවිරූ දහම්හි මට ඇස පහල විය. නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි, ඒ මේ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වැඩියයුතු යි මට ... මහණෙනි ... වඩන ලදූ යි පෙර නොඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය.

මහණෙනි, මේ විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වැඩියයුතු යි මට ... මහණෙනි ... වඩන ලදූයි පෙර නොඇසූ-විරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය.

මහණෙනි, මේ චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය යි පෙර නොඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වැඩියයුතු යි මට ... මහණෙනි ... වඩන ලදූයි පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ ... එළිය පහළ විය.

මහණෙනි, මේ වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නා-ගත ඉද්ධිපාදය වැඩියයුතු ය යි මට ... මහණෙනි, වඩන ලදූයි පෙර නො ඇසූ විරූ දහම්හි ඇස පහළ විය. නැණ පහළ විය. මට පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ වී ය යි.

## 7. 1. 10

### චෛත්‍ය සූත්‍රය

3132. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්නුවර** සමීපයෙහි **මහවෙනෙහි කූටාගාරශාලායෙහි** වැඩ වසන සේක. එකල්හි භාග්‍ය-වතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන පිඬු පිණිස විසල්පුර පිවිසි සේක. විසල්පුර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකී සේක්: "ආනන්දය, නිසීදනය ගනු. **චාපාල** සෑය කරා දිවාවිහරණය පිණිස යම්හ"යි ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූ සේක. "වහන්ස එසේ ය":යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා නිසීදනය රැගෙන පසුපස භාග්‍යවතුන් වහන්සේට අනුගමන් කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාල සෑය වෙත එළඹී සේක. එළඹ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ද භාග්‍ය-වතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් අනඳ තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක:

රමණීයා ආනන්ද, වෙසාලී, රමණීයං උදෙනං චෙතියං, රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බං චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං. යස්ස කස්සචි ආනන්ද, ඉමෙ චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. ආකඞ්ඛමානො ආනන්ද, තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වාති. එවම්පි ඛො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි ''තිට්ඨතු භන්තෙ, භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං, බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සාන''න්ති. යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.

[දුතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං එතදවොච: ''රමණීයා ආනන්ද, වෙසාලී -පෙ- තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං එතදවොච: ''රමණීයා ආනන්ද වෙසාලී, රමණීයං උදෙනං චෙතියං, රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බං චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං. යස්ස කස්සචි ආනන්ද, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද, කප්පං වා තිට්ඨෙය්‍ය, කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, ආකඞ්ඛමානො ආනන්ද, තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වාති.

එවම්පි ඛො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි: ''තිට්ඨතු භන්තෙ භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සාන''න්ති. යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.[1]]

1. න දිස්සතෙ'යං පාඨො සී 1 2 පොත්ථකෙසු

ආනන්දය, විසල්පුර සිත්කලු ය. උදෙන සෑය සිත්කලු ය. ගොතමක සෑය සිත්කලු ය. සත්තම්බ සෑය සිත්කලු ය. බහුපුත්ත සෑය සිත්කලු ය. සාරන්දද සෑය සිත්කලු ය. චාපාල සෑය සිත්කලු ය. ආනන්දය, යම් කිසිවකු විසින් මේ සිව් සෘද්ධිපාදයෝ වඩන ලද්දාහු පුනපුනා කරන ලද්දාහු යානයක් මෙන් කරන ලද්දාහු වාස්තුවක් මෙන් කරන ලද්දාහු අනුෂ්ඨිත වූවාහු පුරුදු කරන ලද්දාහු මැනැවින් අරඹන ලද්දාහු වෙද්ද, හෙතෙමේ කැමති වන්නේ නම් ආයුෂ්කල්පයක් (සියවසක්) හෝ එයට මඳක් වැඩි කලක් හෝ සිටුනේ ය. ආනන්දය, තථාගතයන් විසින් සිවු සෘද්ධිපාදයෝ වඩන ලදහ, බහුල කරන ලදහ, යානයක් මෙන් කරන ලදහ, වාස්තුවක් මෙන් කරන ලදහ, අනුෂ්ඨිතයහ, පරිචිතයහ, සුසමාරබ්ධයහ. ආනන්දය, කැමති වන්නේ නම් තථාගත තෙමේ කපක් හෝ එයට මඳක් වැඩි කලක් හෝ සිටුනේ යි. මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් ඖදරික නිමිති කරන කල්හි පැහැදිලි හෙළිකිරීම් කරන කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මරු විසින් මැඩ ගන්නා ලද අන් පුහුදුන් කෙනකු මෙන් තුමූත් පිළිවිදිනට නො හැකි වූහ. "වහන්ස, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිතසුව පිණිස භාග්‍යවතුන් වහන්සේ කපක් වැඩ සිටුනා සේක්වා, සුගතයන් වහන්සේ කපක් වැඩ සිටුනා සේක්වා"යි භාග්‍යවතුන් වහන්සේ නො යැද්දහ.

දෙවන වට දු භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනද තෙරුන්ට මෙය වදළ සේක: "ආනන්දය, විසල්පුර සිත්කලු ය ..." තෙවන වට දු භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මෙය වදළ සේක: "ආනන්දය, විසල්පුර සිත්කලු ය. උදෙන සෑය සිත්කලු ය. ගොතමක සෑය සිත්කලු ය. සත්තම්බ සෑය සිත්කලු ය. බහුපුත්ත සෑය සිත්කලු ය. සාරන්දද සෑය සිත්කලු ය: චාපාල සෑය සිත්කලු ය. ආනන්දය, යම් කිසිවකු විසින් සිවු ඉදුපා භාවිත බහුලීකෘත යානීකෘත වාස්තුකෘත අනුෂ්ඨිත පරිචිත සුසමාරබ්ධ වේ ද, ආනන්ද හෙතෙමේ කැමති වන්නේ නම් කපක් හෝ කපට මඳක් වැඩි කලක් සිටුනේ ය. ආනන්දය, තථාගතයන් විසින් සිවු ඉදුපා භාවිත ය, බහුලීකෘත ය, යානීකෘත ය, වාස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය. ආනන්ද, තථාගත තෙමේ කැමති වන්නේ නම් කපක් හෝ මඳකින් වැඩි කපක් හෝ සිටුනේ යි.

මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් ඖදරික නිමිති කරන කල්හි පැහැදිලි හෙළි කිරීම් කරන කල්හි ආයුෂ්මත් අනද තෙරණුවෝ මරු විසින් මැඩ ගන්නා ලද සිත් ඇති අන් පුහුදුන් කෙනකු මෙන් තුමූත් පිළිවිදිනට නො හැකි වූහ. "වහන්ස, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස වැඩ පිණිස දෙව්මිනිසුන්ට හිතසුව පිණිස භාග්‍යවතුන් වහන්සේ කපක් වැඩ සිටිත සේක්වා, සුගතයන් වහන්සේ කපක් වැඩ සිටින සේක්වා"යි භාග්‍යවතුන් වහන්සේ නො යැද්දහ.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ගච්ඡ ඛො ත්වං ආනන්ද, යස්සදානි කාලං මඤ්ඤසීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

අථ ඛො මාරො පාපිමා[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසංකමිත්වා භගවන්තං එතදවොච: ''පරිනිබ්බාතු'දානි භන්තෙ, භගවා, පරිනිබ්බාතු සුගතො[2], පරිනිබ්බානකාලො'දානි භන්තෙ, භගවතො, භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා[3] ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසිස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසිස්සන්ති''ති.

සන්ති ඛො පන භන්තෙ, එතරහි භික්ඛූ භගවතො සාවකා වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු 'දානි භන්තෙ, භගවා, පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බානකාලො'දානි භන්තෙ, භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ, භගවතා වාචා: "න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති -පෙ- යාව මෙ උපාසකා න සාවකා භවිස්සන්ති -පෙ- යාව මෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසිස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසිස්සන්ති'' ති.

---

1. අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ ඉති අධිකපාඨො මජසං පොත්ථකෙ දිස්සති
2. පරිනිබ්බාතු'දානි සුගතො - මජසං
3. විසාරද බහුස්සුතා - මජසං, ස්‍යා

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූ සේක: ආනන්ද, යමකට කල් දනිවූ නම් තෙපි දැන් යවු යි. වහන්ස, එසේ ය යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නුදුරෙහි එක්තරා රුක්මුලෙක වැඩහුන්හ.

එකල්හි පවිටු මරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන කාලය යි. වහන්ස, ‘‘පවිට යම් තාක් මාගේ සවුමහණුහු ව්‍යක්තයෝ විනීතයෝ විශාරදයෝ පැමිණි රහත් බැව් ඇත්තෝ බහුශ්‍රුතයෝ ධර්මධරයෝ ධර්මානුධර්මප්‍රතිපන්නයෝ සාමීචිප්‍රතිපන්නයෝ අනුධර්මචාරීහු නො වන්නාහු ද, සිය ඇදුරුදහම ඉගෙන නො කියන්නාහු ද, නො දෙසන්නාහු ද, නො පනවන්නාහු ද, නො පිහිටුවන්නාහු ද, විවරණය නො කරන්නාහු ද, නො බෙදන්නාහු ද, උඩුහුරු නො කරන්නාහු ද, උපන් පරවාද කරුණු සහිතව මැනවින් නිග්‍රහ කොට මැඩ නෛර්‍යාණික කොට දහම් නො දෙසන්නාහු ද ඒ තාක් මම නො පිරිනිවෙන්නෙමි’’ යි තෙල වදන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ම ය.

වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂූහු ව්‍යක්ත විනීත විශාරද ප්‍රාප්තයොගක්ෂෙම බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්මප්‍රතිපන්න සාමීචිප්‍රතිපන්න අනුධර්මචාරී වෙත් ම ය. (ඔහු) සිය ඇදුරුවාදය ඉගෙන කියත් දේශනා කෙරෙත්, පනවත්, පිහිටුවත්, විවරණය කෙරෙත්, බෙදත්, උඩුහුරු කෙරෙත්, උපන් පරවාද කරුණු සහිත ව මැනැවින් නිගහන ලද්දක් කොට නිගහා නෛර්‍යාණික කොට දහම් දෙසත්. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන කාලය යි. වහන්ස, ‘‘පවිට, යම් තාක් මාගේ සවුමෙහෙණුහු ... නො වන්නාහු ද, යම් තාක් මාගේ සවු උවසුවෝ .. නො වන්නාහු ද, යම් තාක් මාගේ සවු උවැසියෝ ව්‍යක්ත විනීත විශාරද ප්‍රාප්තයොගක්ෂෙම බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්මප්‍රතිපන්න සාමීචිප්‍රතිපන්න අනුධර්මචාරී නො වන්නාහු ද, සිය ඇදුරුවාදය ඉගෙන නො කියන්නාහු ද, නො දෙසන්නාහු ද, නො පනවන්නාහු ද, නො පිහිටුවන්නාහු ද, විවරණය නො කරන්නාහු ද, නො බෙදන්නාහු ද නො උඩුහුරු කරන්නාහු ද උපන් පරවාද සකාරණ කොට මැනැවින් නිගහන ලද්දක් කොට නිගහා නෛර්‍යාණික කොට දහම් නො දෙසන්නාහු ද, ඒ තාක් මම නො පිරිනිවෙන්නෙමි’’යි තෙල වදන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ම ය.

සන්ති ඛො පන භන්තෙ, එතරහි උපාසිකා භගවතො සාවිකා වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති, පරිනිබ්බාතු'දනි භන්තෙ, භගවා, පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බානකාලො'දනි භන්තෙ, භගවතො, භාසිතා ඛො පනෙසා භන්තෙ, භගවතා වාචා න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි: යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති''. තනිදං[1] භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං. පරිනිබ්බාතු'දනි භන්තෙ, භගවා පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බානකාලො'දනි භන්තෙ, භගවතොති.

එවං වුත්තෙ භගවා මාරං පාපිමන්තං එතදවොච: ''අප්පොස්සුක්කො ත්වං පාපිම හොහි, න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී''ති. අථ ඛො භගවා චාපාලෙ චෙතියෙ සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජි.[2] ඔස්සට්ඨෙ ච භගවතා ආයුසඞ්ඛාරෙ මහාභූමිචාලො අහොසි භිංසනකො ලොමහංසො, දෙවදුන්දුභියො ච ඵලිංසු[3] අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

''තුලමතුලඤ්ච සම්භවං භවසඞ්ඛාරමවස්සජි මුනි
අජ්ඣත්තරතො සමාහිතො අභිද[4] කවචමිවත්තසම්භවන්ති.

## චාපාලවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

අපාරො ච විරද්ධා චාරියො නිබ්බිද පදෙසං,
සමත්තො ච භික්ඛු ච අරහං ඤාණචෙතියාති.

1. තයිදං - මජසං, සයා
2. ඔස්සජ්ජි - සයා
3. චලිංසු - සීමු
4. අභින්දි - මජසං, සයා

වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ සවු උවැසියෝ ව්‍යක්ත විනීත විශාරද ප්‍රාප්තයොගක්ෂෙම බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්මප්‍රතිපන්න සාමීචිප්‍රතිපන්න අනුධර්මචාරී වෙත් ම ය. (ඔහු) සිය ඇදුරු වාදය ඉගෙන කියත්, දෙසත්, පනවත්, පිහිටුවත්, විවරණය කෙරෙත්, බෙදත්, උඩුහුරු කෙරෙත්, උපන් පරවාද සකාරණ කොට මැනැවින් නිගහන ලද්දක් කොට නිගහා නෛර්‍යාණික කොට දහම් දෙසත්. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක්වා සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන කාලය යි. වහන්ස, ''පවිට, යම් තාක් මේ සසුන් බඹසර සමෘද්ධ නො වන්නේ ද, සමෘද්ධ වූයේ වැඩීමට පැමිණියේ පතළේ බොහෝ දෙනා විසින් දන්නා ලද්දේ පුළුල් බවට පැමිණියේ නො වන්නේ ද, ඇති තාක් දෙව්මිනිසුන් විසින් නො පවසන ලද්දේ ද, ඒ තාක් මම නො පිරිනිවෙන්නෙමි'' යි මෙවදන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ මේ සසුන් බඹසර සමෘද්ධ වූයේත් වැඩීමට පැමිණියේත් පතළේත් බොහෝ දෙනා විසින් දන්නා ලද්දේත් පුළුල් බවට පැමිණියේත් ඇති තාක් දෙව්මිනිසුන් විසින් පවසන ලද්දේත් නො වේ ද, වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක්වා සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන කාලය යි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ පවිටු මරුහට මෙය වදාළ සේක: ''පවිට, තෝ හළ වෑයම් ඇත්තෙක් වෙව. නොබෝ කලෙකින් තථාගතයන් වහන්සේගේ පිරිනිවීම වන්නේ ය. මෙයින් තෙමසක් ඇවෑමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ'' යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාල සෑයෙහි දී සිහි ඇති ව මනා දැනුම් ඇති ව ආයුස්සංස්කාර හළ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් ආයුස්සංස්කාර හළ කල්හි බිහිසුනු ලොමුදහගන්වන මහාභූමිකම්පාවක් විය. දෙව්බෙර ද පැලුණහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙකරුණ දැන එවේලායෙහි මේ උදානය පහළකළ සේක:

පුනර්භවය සකස් කරන උප්පත්ති ජනක කාමාවචර රූපාවචර අරූපාවචර නොහොත් අල්පවිපාක බහුවිපාක කර්ම බුද්ධමුනි තෙමේ හළේ ය. නිජඅධ්‍යාත්මයෙහි ඇලුණේ උපාචාර අර්පණා වශයෙන් සමාහිත වූයේ තමා කෙරෙහි හටගත් කෙලෙස් ද භවගාමී කර්ම ද (යුදබිමෙහි සෙබළෙක්) කවචයක් මෙන් බිඳ දැම්මේ ය. නොහොත් නිවනත් භවයත් භවගාමී කර්මත් තීරණය කරමින් බුද්ධමුනි තෙමේ ආර්‍ය්‍යමාර්ගයෙන් හළේ ය. විදර්ශනා වශයෙන් අධ්‍යාත්මයෙහි ඇලුණේ සමථ වශයෙන් සමාහිත වූයේ කවචයක් මෙන් සිය අත්බැව වැළඳගෙන සිටි කෙලෙස් දැල සිඳ දැම්මේ ය.

## පළමුවැනි චාපාලවර්ග යි.

**එහි සූත්‍ර නාමමාලාව:**

අපාර, විරද්ධ, අරිය, නිබ්බිද, පදෙස, සමත්ත, භික්ඛු, අරහන්ත, ඤාණ, චෙතිය යි සූත්‍ර දශයෙකි යි.



Free Distribution www.aathaapi.org

# 2. පාසාදකම්පනවග්ගො

## 7. 2. 1

### හෙතුසුත්තං

3133. සාවත්ථියං:

පුබ්බෙව මෙ භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: "කො නු ඛො හෙතු කො පච්චයො ඉද්ධිපාදභාවනායා"ති? තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "ඉධ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, ඉති මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති, න ච අතිපග්ගහිතො භවිස්සති, න ච අජ්ඣත්තං සඞ්ඛිත්තො භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තො භවිස්සති, පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති,

යථා පුරෙ තථා පච්ඡා, යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ විරියං න ච අතිලීනං භවිස්සති, න ච අතිපග්ගහිතං භවිස්සති, න ච අජ්ඣත්තං සඞ්ඛිත්තං භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තං භවිස්සති, පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති.

යථා පුරෙ තථා පච්ඡා, යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං, යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ චිත්තං න ච අතිලීනං භවිස්සති. න ච අතිපග්ගහිතං භවිස්සති. න ච අජ්ඣත්තං සඞ්ඛිත්තං භවිස්සති. න ච බහිද්ධා වික්ඛිත්තං භවිස්සති. පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති.

යථා පුරෙ තථා පච්ඡා, යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති. න ච අතිපග්ගහිතා භවිස්සති. න ච අජ්ඣත්තං සඞ්ඛිත්තා භවිස්සති. න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති. පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති.

යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

# 2. ප්‍රාසාදකම්පනවර්ගය

## 7. 2. 1

### හෙතු සූත්‍රය

3133. සැවැත්නුවර:

මහණෙනි, සම්බොධියෙන් පෙර බුදුබවට නො පැමිණි බෝසත් වූ ම මට මේ සිත විය: "ඉද්ධිපා වැඩුම පිණිස කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය දැ"යි. මහණෙනි, ඒ මට මෙබඳු සිතෙක් විය; "මෙහි මහණ තෙමේ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. පෙර යම්සේ නම් පසුත් එසේ ය, පසු යම්සේ නම් පෙරත් එසේ ය. යට යම්සේ නම් උඩත් එසේ ය. උඩ යම්සේ නම් යටත් එසේ ය. දහවල යම්සේ නම් රෑත් එසේ ය. රෑ යම්සේ නම් දහවලුත් එසේ ය යි. පසුපෙර හැඟීම් ඇත්තේ ද වෙසෙයි. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

වීර්‍ය්‍යය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීර්‍ය්‍යය ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. පෙර යම් බඳු නම් පසුත් එබඳු ය. පසු යම් බඳු නම් පෙරත් එබඳු ය. යට යම් බඳු නම් උඩත් එබඳු ය. උඩ යම් බඳු නම් යටත් එබඳු ය. දහවල් යම් බඳු නම් රෑත් එබඳු ය. රෑ යම් බඳු නම් දහවලුත් එබඳු ය යි පසුපෙර හැඟීම් ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩ යි.

චිත්තය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩ යි. මෙසේ මාගේ සිත ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. පෙර යම්සේ නම් පසුත් එබඳු ය. පසු යම්සේ නම් පෙරත් එබඳු ය. යට යම්සේ නම් උඩත් එබඳු ය. උඩ යම්සේ නම් යටත් එබඳු ය. දහවල් යම්සේ නම් රෑත් එබඳු ය. රෑ යම්සේ නම් දහවලුත් එබඳු ය යි පසුපෙර හැඟීම් ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

වීමංසාව නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධන්සංස්කාරයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසාව ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩිකොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. පෙර යම් බඳු නම් පසුත් එසේ ය. පසු යම් බඳු නම් පෙරත් එසේ ය. යට යම් බඳු නම් උඩත් එසේ ය. උඩ යම් බඳු නම් යටත් එසේ ය. දහවල් යම් බඳු නම් රෑත් එසේ ය. රෑ යම් බඳු නම් දහවලුත් එසේ ය යි පසු පෙර හැඟීම් ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති. එකොපි හුත්වා බහුධා හොති. බහුධාපි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛිසකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය. උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චාති.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතොපරිච්ච පජානාති. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: "එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[1] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ. අමුත්‍රාසිං: එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං: එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛ-පටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නො"ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. වීසතිම්පි - සීමු, සී 1, 2.

මහණෙනි, මහණ මෙසේ සතර ඍද්ධිපාද වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි නන් වැදෑරුම් ඍද්ධිවිධ අනුභව කරයි. එකෙක් ව ද බොහෝ අයුරු වේ. බොහෝ ඇයුරු ව ද එකෙක් වේ. පළට බව සැඟවුණු බව (විඳියි.) බිතෙන් පිටට පවුරෙන් පිටට පර්වතෙන් පිටට අහසෙහි මෙන් නො ගැටෙමින් යේ. පොළොවෙහි ද දියෙහි මෙන් මතුවීම කිමිදීම කෙරේ. පොළොවෙහි මෙන් නොබිඳෙන දියෙහි ද යේ. පියාපත් ඇති ලිහිණියකු මෙන් අහසෙහි ද පලඟින් යුතු ව ගමන් කෙරේ, මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ද අතින් පහස්යි. පිරිමදියි. බඹලොව තෙක් ද කයින් වසයෙහි පවත්වයි.

මහණෙනි, මහණ මෙසේ සතර ඍද්ධිපාද වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි ශුද්ධ වූ මිනිස්බැව් ඉක්ම පැවැති දිව්‍යමය ශ්‍රොත්‍ර-ධාතුවෙන් දුර වූ ද ළඟ වූ ද මානුෂික දෙසද අසයි. මහණෙනි, මහණ සතර ඍද්ධිපාද මෙසේ වැඩූ කල්හි අන්සතුන්ගේ අන්පුඟුලන්ගේ සිත තමසිතින් පිරිසිඳ දනී. සරාග සිතත් සරාග සිතැ යි දනී. වීතරාග සිතත් වීතරාග සිතැ යි දනි. සදෙස සිතත් සදෙස සිතැ යි දනි. වීතදෙස සිතත් වීතදෙස සිතැ යි දනී. සමොහ සිතත් සමොහ සිතැ යි දනී. වීතමොහ සිතත් වීතමොහ සිතැ යි දනී. සඞ්ඛිත්ත සිතත් සඞ්ඛිත්ත සිතැ යි දනී. වික්ඛිත්ත සිතත් වික්ඛිත්ත සිතැ යි දනී. අමහග්ගත සිතත් අමහග්ගත සිතැ යි දනී, මහග්ගත සිතත් මහග්ගත සිතැයි දනී. සඋත්තර සිතත් සඋත්තර සිතැ යි දනී. අනුත්තර සිතත් අනුත්තර සිතැ යි දනී. අසමාහිත සිතත් අසමාහිත සිතැ යි දනී. සමාහිත සිතත් සමාහිත සිතැ යි දනී. අවිමුත්ත සිතත් අවිමුත්ත සිතැ යි දනී. විමුත්ත සිතත් විමුත්ත සිතැ යි දනී.

මහණෙනි, මහණ සතර ඍද්ධිපාද මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි නන් වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. ඒ මෙසේ යි: එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පහක් ද ජාති දශයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතලිසක් ද ජාති පනසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති සියදහසක් ද නොයෙක් නැසෙන කල්ප ද නොයෙක් වැඩෙන කල්ප ද නොයෙක් නැසෙන වැඩෙන කල්ප ද (සිහි කෙරේ.) අසුවල් තැන මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත් ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු අහර ඇත්තෙම් මෙසේ සුවදුක් විඳින සුල්ලෙම් මෙබඳු ආයු කෙළවර ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත ව අසවල්තැන උපන්මි. එහි දු මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත් ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු අහර ඇත්තෙම් මෙසේ සුවදුක් විඳින සුල්ලෙම් මෙබඳු ආයු කෙළවර ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත ව මෙහි පැමිණියෙමි යි මෙසේ අයුරු සහිත උදෙසුම් සහිත නන්වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරේ.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: ''චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා''ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: ''චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති''ති.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

## 7. 2. 2

## මහප්ඵලසුත්තං

3134. චත්තාරො'මෙ භික්ඛවෙ, ඉද්ධිපාද භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා. කථං භාවිතා ච ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද කථං බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති: ''ඉති ඛො මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති, න ච අතිප්පග්ගහිතො භවිස්සති, න ච අජ්ඣත්තං සඞ්ඛිත්තො, භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තො භවිස්සති, පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති:

''යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා'',

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

මහණෙනි, මහණ සිවු ඉද්ධිපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි විශුද්ධ වූ මිනිස් ඇස ඉක්ම පැවැති දිව්‍යැසින් සතුන් දකී. ච්‍යුත වන උපදින හීන ප්‍රණීත මනාවර්ණ ඇති නපුරුවර්ණ ඇති මනාගති ඇති නපුරුගති ඇති කම් වූ පරිදි පැමිණි සතුන් දනගනී. මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්-දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට උපවාද කරන්නාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවශ ව පතිත වන නිරයට පැමිණියහ. මේ භවත් සත්ත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුතුවහ, වාක්සුචරිතයෙන් යුතුවහ. මනඃසුචරිතයෙන් යුතුවහ. ආර්‍ය්‍යයෝපවාද නො කරන්නාහ. සම්‍යග්දෘෂ්ටි ඇතියහ, සම්‍යග්දෘෂ්ටි කර්ම සමාදන් වූවහ. ඔහු කාබුන් මරණින් මතු සෝභනගති ඇති සගලොවට පැමිණියහ''යි, මෙසේ විශුද්ධ මිනිසැස ඉක්ම පැවති දිව්‍යැසින් සතුන් දකී. ච්‍යුත වන උපදින හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත යථාකර්මොපග සතුන් දනගනී.

මහණෙනි, මහණ සිවු ඉද්ධිපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 7. 2. 2

## මහප්ඵල සූත්‍රය

3134. මහණෙනි, මේ සිවු ඉද්ධිපා වඩන ලදුයේ බහුල කරන ලදුයේ මහත්ඵල මහානිසංස වේ. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සිවු ඉද්ධිපා මහත්ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය සැඟවුණේ නො ද වන්නේ ය, ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. පෙර යම්සේ නම් පසුත් එසේ ය, පසු යම්සේ නම් පෙරත් එසේ ය. යට යම්සේ නම් උඩත් එසේ ය. උඩ යම්සේ නම් යටත් එසේ ය, දහවල් යම්සේ නම් රැයත් එසේ ය. රැ යම්සේ නම් දහවලුත් එසේ'' ය යි පසු පෙර හැඟීම් ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති ඛො මෙ වීමංසා න’ච අතිලීනා භවිස්සති. න ච අතිපග්ගහිතා භවිස්සති, න ච අජ්ඣත්තං සඞ්ඛිත්තා භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති, පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති:

“යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.”

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. එවං භාවිතා ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද එවං බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: “එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති” -පෙ- එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

## 7. 2. 3

## ඡන්දසුත්තං

3135. ඡන්දං චෙ භික්ඛවෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්සෙකග්ගතං. අයං වුච්චති ඡන්දසමාධි. සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙ වුච්චන්ති පධානසඞ්ඛාරා. ඉති අයඤ්ච ඡන්දො අයඤ්ච ඡන්දසමාධි ඉමෙ ච පධානසඞ්ඛාරා. අයං වුච්චති භික්ඛවෙ, ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදෙ.

විරියඤ්චෙ භික්ඛවෙ, භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්සෙකග්ගතං. අයං වුච්චති විරියසමාධි. සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙ වුච්චන්ති පධානසඞ්ඛාරා. ඉති ඉදඤ්ච විරියං අයඤ්ච විරියසමාධි ඉමෙ ච පධානසඞ්ඛාරා, අයං වුච්චති භික්ඛවෙ, විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදෙ.

විරියසමාධි ... චිත්තසමාධි ... විමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසාව ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය, පෙර යම්බඳු නම් පසුත් එබඳු ය. පසු යම් බඳු නම් පෙරත් එබඳු ය. යට යම්බඳු නම් උඩත් එබඳු ය. උඩ යම්බඳු නම් යටත් එබඳු ය. දහවල් යම්බඳු නම් රෑත් එබඳු ය. රෑ යම්බඳු නම් දහවලුත් එබඳු ය''යි පසුපෙර හැඟීම් ඇත්තේ ද වෙසෙ යි. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩ යි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සිවු ඉදුපා මහත්ඵල මහානිසංස වේ.

මහණෙනි, මහණ සිවු ඉදුපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි නන්වැදෑරුම් ඉදු කොටස් විඳී යි. එකක් ව ද බොහෝ අයුරු වේ. ... බඹලොව තෙක් ද කයින් වසයෙහි පවත්ව යි ... මහණෙනි මහණ සිවු ඉදුපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි සිවු ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාශ්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැම්යෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 7. 2. 3

## ඡන්ද සූත්‍රය

3135. මහණෙනි, ඉදින් මහණ ඡන්දය නිසා සමාධියක් ලබා නම් සිතේ එකඟ බවක් ලබා නම් මේ ඡන්දසමාධිය යි කියනු ලැබේ. හෙතෙමේ නූපන් ලාමක අකුසල් දහම් නොඉපදවීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීර්‍ය කෙරෙයි. උපන් ලාමක අකුසල් දහම් ප්‍රහාණ කරනු පිණිස ඡන්දය උපදවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි, සිත දැඩි කොට ගනී. ප්‍රධන්වීර්‍යය කෙරෙයි. නූපන් කුසල් දහම් ඉපදවීම පිණිස ඡන්දය දනවයි, වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩිකොට ගනී. ප්‍රධන්වීර්‍යය කෙරෙයි. උපන්කුසල් දහම් පැවැත්ම පිණිස අවිනාසය පිණිස බොහෝ බැව් පිණිස විපුල බැව් පිණිස වැඩීම පිණිස පිරීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩිකොට ගනී. ප්‍රධන්වීර්‍යය කෙරෙයි. මොහු පදහන්සංස්කාරයෝ ය යි කියනු ලැබෙත්. මෙසේ මේ ඡන්දයත් මේ ඡන්දසමාධියත් මේ ප්‍රධන්සංස්කාරයොත් වෙද් ද, මහණෙනි මේ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය යි කියනු ලැබේ.

මහණෙනි, ඉදින් මහණ වීර්‍යය නිසා සමාධියක් ලබා ද සිතේ එකඟකමක් ලබා ද, මේ වීර්‍යසමාධිය යි කියනු ලැබේ. හෙතෙමේ නූපන් ලාමක අකුසල් දහම් නොඉපදවීම පිණිස...උපන් කුසල් දහමුන්ගේ පැවැත්ම අවිනාශය බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස ඡන්දය දනවයි, වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනී. ප්‍රධන්වීර්‍යය කෙරෙයි. මොහු ප්‍රධන්සංස්කාරයෝ ය යි කියනු ලැබෙත්. මෙසේ මේ වීර්‍යයත් මේ විරියසමාධියත් මේ ප්‍රධන්සංස්කාරයෝත් වෙද්ද, මහණෙනි, මේ විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය යි කියනු ලැබේ.

චිත්තඤ්චෙ භික්ඛවෙ, භික්ඛු නිස්සාය ලභති සමාධිං. ලභති චිත්තස්සෙකග්ගතං, අයං වුච්චති චිත්තසමාධි. සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙ වුච්චන්ති පධානසඞ්ඛාරා, ඉති ඉදඤ්ච චිත්තං අයඤ්ච චිත්තසමාධි ඉමෙ ච පධානසඞ්ඛාරා. අයං වුච්චති භික්ඛවෙ, චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො.

වීමංසඤ්චෙ භික්ඛවෙ, භික්ඛු නිස්සාය ලභති සමාධිං. ලභති චිත්තස්සෙකග්ගතං, අයං වුච්චති වීමංසාසමාධි. සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙ වුච්චන්ති පධානසඞ්ඛාරා ඉති අයඤ්ච වීමංසා අයඤ්ච වීමංසාසමාධි ඉමෙ ච පධානසඞ්ඛාරා. අයං වුච්චති භික්ඛවෙ, වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදොති.

## 7. 2. 4

## මොග්ගල්ලානසුත්තං

3136. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ.** තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ හෙට්ඨාමිගාරමාතුපාසාදෙ විහරන්ති, උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා.

අථ ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං ආමන්තෙසි: "එතෙ තෙ[1] මොග්ගල්ලාන සබ්‍රහ්මචාරයො[2] හෙට්ඨාමිගාරමාතුපාසාදෙ විහරන්ති උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා. ගච්ඡ මොග්ගල්ලාන, තෙ භික්ඛූ සංවෙජෙහීති[3]. එවං භන්තෙති ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො පටිස්සුත්වා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි.[4] යථා පාදඞ්ගුට්ඨකෙන මිගාරමාතුපාසාදං සඞ්කම්පෙසි. සම්පකම්පෙසි. සම්පචාලෙසි. අථ ඛො තෙ භික්ඛූ සංවිග්ගා ලොමහට්ඨජාතා එකමන්තං අට්ඨංසු. අච්ඡරියං වත භො අබ්භුතං වත භො නිවාතඤ්ච වත අයඤ්ච මිගාරමාතුපාසාදෙ ගම්භීරනෙමො සුනිඛාතො අචලො අසම්පකම්පී. අථ ච පන සඞ්කම්පිතො සම්පකම්පිතො සම්පචාලිතොති.

1. එතෙ ඛො - මජ්ඣං, ස්‍යා.
2. සබ්‍රහ්මචාරිනො - මජ්ඣං, ස්‍යා.
3. සංවෙජෙහීති - සී 1, 2.
4. අභිසඞ්ඛාරෙසි - ස්‍යා.

මහණෙනි, ඉදින් මහණ සිත නිසා සමාධියක් ලබා ද සිතේ එකඟකමක් ලබා ද, මේ චිත්තසමාධිය යි කියනු ලැබේ. හෙතෙමේ නූපන් ලාමක අකුසල් දහම් නොඉපදවීම පිණිස...උපන් කුසල් දහමුන්ගේ පැවැත්ම අවිනාශය බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස ඡන්දය දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනී. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. මොහු ප්‍රධන්සංස්කාරයෝ යයි කියනු ලැබෙත්. මෙසේ මේ සිතත් මේ චිත්තසමාධියත් මේ ප්‍රධන්සංස්කාරයෝත් වෙද්ද, මහණෙනි, මේ චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදයයි කියනු ලැබේ.

මහණෙනි, ඉදින් මහණ වීමංසාව නිසා සමාධියක් ලබා ද, සිතේ එකඟ බවක් ලබා ද, මේ වීමංසා සමාධිය යි කියනු ලැබේ. හෙතෙමේ නූපන් ලාමක අකුසල් දහම් නොඉපදවීම පිණිස ... උපන් කුසල් දහමුන්ගේ පැවැත්ම අවිනාශය බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස ඡන්දය දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. මොහු ප්‍රධන්සංස්කාරයෝ යයි කියනු ලැබෙත්. මෙසේ මේ වීමංසාවත් මේ වීමංසා සමාධියත් මේ ප්‍රධන්සංස්කාරයෝත් වෙද්ද, මහණෙනි, මේ වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය යි කියනු ලැබේ යි.

## 7. 2. 4

## මොග්ගල්ලාන සූත්‍රය

3136. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවත සමීපයෙහි **මිගාරමාතුපාසාද** නම් **පූර්වාරාමයෙහි** වැඩවසන සේක. එසමයෙහි උඩඟු වූ නගාගත් මානනළ ඇති පාසිවුරු සැරසීම් ආදී චපල බැවින් යුත් රළුවදන් ඇති දෙඩමලු වූ මුළා සිහි ඇති මනා නුවණ නැති නො එකඟ සිත් ඇති වෙසෙසින් තැතිගත් සිත් ඇති පියවි (—අසංවෘත) ඉඳුරන් ඇති බොහෝ භික්ෂූහු මුවරමාපා යටමහලෙහි වෙසෙත්.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහමුගලන් තෙරුන් ඇමතූ සේක: මුගලන. උඩඟු වූ නගාගත් මානනළ ඇති චපල වූ රළුවදන් ඇති දෙඩමලු වූ මුළාසිහි ඇති මනානුවණ නැති නොඑකඟ සිත් ඇති වෙසෙසින් තැතිගත් සිත් ඇති පියවි ඉඳුරන් ඇති තොපගේ මේ සබ්‍රම්සරහු මුවරමාපා යටමහලෙහි වෙසෙති. ''මුගලන, යවු ඒ මහණුන් සංවේගයට පමුණුවාලව'යි. එසේ ය වහන්සැයි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා යම්සේ පයමහපටැඟිල්ලෙන් මුවරමාපාය කම්පිත කළෝ ද වැඩියක් කම්පිත කළෝ ද, වෙසෙසින් සැලූහු ද, එබඳු සෘද්ධිවිධියක් කළහ. එකල්හි ඒ භික්ෂූහු සංවේගයට පැමිණියාහු හටගත් ලොමුදහගැනුම් ඇත්තාහු භවත්නි, අසිරියි, භවත්නි, පුදුමයි. මේ මුවරමාපාය ඒකාන්තයෙන් වාතාවරණසම්පන්න ය. ගැඹුරට ගිය පදනම් ඇත්තේ ය. මැනැවින් පිහිටුවන ලද්දේ ය. නිසල ය. නො සැලෙනසුලු ය. එනෙකුදු වුව කම්පිත වූයේ ය. බෙහෙවින් කම්පිත වූයේ ය. වෙසෙසින් සැලුණේ ය යි පසෙකට වී සිටියහ.

අථ ඛො භගවා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කින්නු තුම්හෙ භික්ඛවෙ, සංවිග්ගා ලොමහට්ඨජාතා එකමන්තං ඨිතා'ති? අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, නිවාතඤ්ච වත, අයඤ්ච මිගාරමාතුපාසාදො ගම්භීරනෙමො සුනිඛාතො අචලො අසම්පකම්පි. අථ ච පන සඞ්කම්පිතො සම්පකම්පිතො සම්පචාලිතො'ති. තුම්හෙව ඛො භික්ඛවෙ, සංවෙජෙතුකාමෙන මොග්ගල්ලානෙන[1] භික්ඛුනා පාදඞ්ගුට්ඨෙන[2] මිගාරමාතුපාසාදො සඞ්කම්පිතො සම්පකම්පිතො සම්පචාලිතො. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමෙසං ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං මහිද්ධිකො එවං මහානුභාවො'ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- චතුන්නං ඛො භික්ඛවෙ, ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං මහිද්ධිකො එවං මහානුභාවො. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, මොග්ගල්ලානො භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති -පෙ- ඉති විවටෙන චෙතසා පරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති. න ච අතිප්පග්ගහිතා භවිස්සති. න ච අජ්ඣත්තං සඞ්ඛිත්තා භවිස්සති. න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති. පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති:

යථා පුරෙ තථා පච්ඡා යථාපච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථාඋද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං මහිද්ධිකො එවං මහානුභාවො. ඉමෙසං ච පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- කායෙන වසං වත්තෙති. ඉමෙසං ච පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති.

1. මහාමොග්ගල්ලානෙන - සී 1, 2.
2. පාදඞ්ගුට්ඨකෙන - මජසං, ස්‍යා

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුන් වෙත එළඹි සේක. එළඹ ඒ මහණුන්ට මේ වදාළ සේක. මහණෙනි, කුමක් හෙයින් තෙපි සංවේගයට පැමිණියාහු හටගත් ලොමුදැහගැනුම් ඇත්තාහු පසෙකට වී සිටිහු ද යි. වහන්ස, අසිරි යි. වහන්ස, පුදුම යි. මේ මුවරමාපායත් ඒකාන්තයෙන් වාතාවරණ සම්පන්න ය. ගැඹුරට ගිය පදනම් ඇත්තේ ය. මැනවින් පිහිටුවන ලද්දේ ය. නිසල ය. නොසැලෙනසුලු ය. එතෙකුදු වුව කම්පිත වූයේ ය. බෙහෙවින් කම්පිත වූයේ ය. වෙසෙසින් සැලුණේ ය යි. මහණෙනි, තොප ම සංවේගයට පමුණුවන කැමැති මුගලන් මහණහු විසින් පයැ මාපටැඟිල්ලෙන් මුවරමාපාය කම්පිත කරන ලද්දේ ය. බෙහෙවින් කම්පිත කරන ලද්දේ ය. වෙසෙසින් සලන ලද්දේ ය. මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කවර දහම් කෙනෙකුන් වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙසේ මහත් සෘද්ධි ඇත්තේ මෙසේ මහත් අනුභාව ඇත්තේ වේ ද යි.

වහන්ස, අපගේ දහම්හු හගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, සිවු ඉදුපා වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙසේ මහත් සෘද්ධි ඇත්තේ මෙසේ මහත් අනුභාව ඇත්තේ වේ. කවර සිවු ඉදුපා ද යත්: මහණෙනි, මෙහි මුගලන් මහණ ඡන්දසමාධිපධානසංඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය ඉතා සැහවුණේ නො ද වන්නේ ය ... මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි. විරිය සමාධි ... චිත්ත සමාධි ... වීමංසාසමාධිපධානසංඛාර-සමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසාව ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. පෙර යම් බඳු නම් පසුත් එසේ ය. පසු යම් බඳු නම් පෙරත් එසේ ය. යට යම් බඳු නම් උඩත් එසේ ය. උඩ යම් බඳු නම් යටත් එසේ ය. දහවල් යම් බඳු නම් රෑත් එසේ ය. රෑ යම් බඳු නම් දහවලුත් එසේ ය'' යි පසු පෙර හැඟීම් ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නොබැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, මේ සිවු ඉදුපා වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙසේ මහත් සෘද්ධි ඇත්තේ මෙසේ මහත් අනුභාව ඇත්තේ වේ. මහණෙනි, මේ සිවු ඉදුපා වැඩූ බැවින් ම බහුල කළ බැවින් ම මුගලන් මහණ නන්වැදෑරුම් ඉදු-කොටස් විඳී ... කයින් වසයෙහි පවත්වයි. මහණෙනි, මේ සිවු ඉදුපා වැඩූ බැවින් ම බහුල කළ බැවින් ම මුගලන් මහණ ආස්‍රවක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ චිත්තසමාධියත් ප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 7. 2. 5

## බ්‍රාහ්මණසුත්තං

3137. එකං සමයං ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො උණ්ණාභො බ්‍රාහ්මණො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උණ්ණාභො බ්‍රාහ්මණො ආයස්මන්තං ආනන්දං එතදවොච: කිමත්ථියං නු ඛො භො ආනන්ද, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති. ඡන්දප්පහානත්ථං ඛො බ්‍රාහ්මණ, භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. අත්ථි පන භො ආනන්ද, මග්ගො අත්ථි පටිපද එතස්ස ඡන්දස්ස පහානායාති? අත්ථි ඛො බ්‍රාහ්මණ, මග්ගො අත්ථි පටිපද එතස්ස ඡන්දස්ස පහානායාති. කතමො පන භො ආනන්ද, මග්ගො කතමා පටිපද එතස්ස ඡන්දස්ස පහානායාති? ඉධ බ්‍රාහ්මණ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානං සඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. අයං ඛො බ්‍රාහ්මණ මග්ගො අයං පටිපද එතස්ස ඡන්දස්ස පහානායාති.

එවං සන්තෙ භො ආනන්ද සන්තකං හොති නො අසන්තකං, ඡන්දෙනෙව ඡන්දං පජහිස්සතීති නෙතං ඨානං විජ්ජතීති. තෙනහි බ්‍රාහ්මණ, තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, අහොසි තෙ පුබ්බෙ ඡන්දො ආරාමං ගමිස්සාමීති. තස්ස තෙ ආරාමගතස්ස යො තජ්ජො ඡන්දො සො පටිප්පස්සද්ධොති. එවං භො. අහොසි තෙ පුබ්බෙ විරියං ආරාමං ගමිස්සාමීති තස්ස තෙ ආරාමගතස්ස යං තජ්ජං විරියං තං පටිප්පස්සද්ධන්ති. එවං භො. අහොසි තෙ පුබ්බෙ චිත්තං ආරාමං ගමිස්සාමීති. තස්ස තෙ ආරාමගතස්ස යං තජ්ජං චිත්තං තං පටිප්පස්සද්ධන්ති. එවං භො. අහොසි තෙ පුබ්බෙ වීමංසා ආරාමං ගමිස්සාමීති. තස්ස තෙ ආරාමගතස්ස යා තජ්ජා වීමංසා සා පටිප්පස්සද්ධාති. එවං භො.

## 7. 2. 5

## බ්‍රාහ්මණ සූත්‍රය

3137. එක්කලෙක ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කොසඹෑනුවර සමීපයෙහි ඝෝෂිතාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි උන්නාභ බමුණු තෙමේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් උන්නාභ බමුණු තෙමේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීය: ''භවත් ආනන්දයෙනි, කුමක් පිණිස මහණගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද''යි. බමුණ, තෘෂ්ණා-ඡන්දය පහනු පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ යි. භවත් ආනන්දයෙනි, තෙල ඡන්දය ප්‍රහාණය පිණිස මඟෙක් ඇද්ද? පිළිවෙතෙක් ඇද්දැයි? බමුණ, තෙල ඡන්දය පහනු පිණිස මඟෙක් ඇත පිළිවෙතෙක් ඇතැ යි. භවත් ආනන්දයෙනි, තෙල ඡන්දය පහනු පිණිස මඟ කවරේ ද? පිළිවෙත කවරේ දැ යි? බමුණ, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. බමුණ, තෙල ඡන්දය පහනු පිණිස මේ මඟ ය, මේ පිළිවෙත යි.

භවත් ආනන්දයෙනි, එසේ ඇති කල්හි ශාන්ත වූවෙක් ම වෙයි. ශාන්ත නො වූවෙක් නො වෙයි. ඡන්දයෙන් ම ඡන්දය දුරලන්නේ ය යන මෙකරුණ නැතැ යි. බමුණ, එසේ වී නම් මෙහි ලා තොප ම පිළිවිසින්නෙමි. යම්සේ තොපට රුස්නේ නම් එසේ එය විසඳන්නහු. බමුණ, ඒ කිමැ යි හඟිවු ද? පෙර තොපට අරමට යන්නෙමි යි ඡන්දයෙක් වී ය. අරමට ගිය ඒ තොපගේ ඒ පිණිස වූ ඡන්දයෙක් වී නම් එය සන්හුන්නේ දැ යි? භවත්නි, එසේ ය. පෙර තොපට අරමට යන්නෙමි යි වීර්‍ය්‍යයෙක් වී ය. අරමට ගිය ඒ තොපට ඒ පිණිස වූ යම් වීර්‍ය්‍යයෙක් වී නම් එය සන්හුන්නේ දැ යි? භවත්නි, එසේ ය. පෙර තොපට අරමට යන්නෙමි යි සිතෙක් වී ය. අරමට ගිය ඒ තොපට ඒ පිණිස වූ යම් සිතෙක් වී නම් එය සන්හුන්නේ දැ යි? භවත්නි, එසේ ය. පෙර තොපට අරමට යන්නෙමි යි වීමංසාවක් වූ ය. අරමට ගිය ඒ තොපට ඒ පිණිස වූ යම් වීමංසාවක් වූ නම් එය සන්හුන්නේ දැ යි? භවත්නි, එසේ ය.

එවමෙව ඛො බ්‍රාහ්මණ, යො සො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තො. තස්ස යො පුබ්බෙ ඡන්දො අහොසි අරහත්තප්පත්තියා අරහත්තෙ පත්තෙ[1] යො තජ්ජො ඡන්දො සො පටිප්පස්සද්ධො. යං පුබ්බෙ විරියං අහොසි අරහත්තප්පත්තියා අරහත්තෙ පත්තෙ යං තජ්ජං විරියං තං පටිප්පස්සද්ධං. යං පුබ්බෙ චිත්තං අහොසි අරහත්තප්පත්තියා, අරහත්තෙ පත්තෙ යං තජ්ජං චිත්තං තං පටිප්පස්සද්ධං. යා පුබ්බෙ වීමංසා අහොසි අරහත්තප්පත්තියා, අරහත්තෙ පත්තෙ යා තජ්ජා වීමංසා සා පටිප්පස්සද්ධා. තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, ඉති එවං සන්තෙ සන්තකං වා හොති නො අසන්තකං වාති? අද්ධා භො ආනන්ද, එවං සන්තෙ සන්තකං හොති නො අසන්තකං. අභික්කන්තං භො ආනන්ද, -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 7. 2. 6

## මහිද්ධිකසුත්තං

3138. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා මහිද්ධිකා අහෙසුං මහානුභාවා, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හිපි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා මහිද්ධිකා භවිස්සන්ති මහානුභාවා. සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා මහිද්ධිකා මහානුභාවා. සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධි පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා මහිද්ධිකා අහෙසුං මහානුභාවා -පෙ- මහිද්ධිකා භවිස්සන්ති මහානුභාවා -පෙ- එතරහි මහිද්ධිකා මහානුභාවා සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තාති.

1. අරහත්තප්පත්තෙ - මජසං.

බමුණ, එසෙයින් ම රහත් වූ ක්ෂය කළ ආසුව ඇති වැස නිම වූ බඹසර ඇති කළ සිවුමඟ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇති සහමුලින් ගෙවූ භවසංයෝජන ඇති යම් ඒ මහණෙක් වේ ද, ඔහුට පෙර රහත් බවට පැමිණෙනු පිණිස යම් ඡන්දයෙක් වී ද, රහත් බවට පැමිණි කල්හි ඒ පිණිස වූ යම් ඡන්දයෙක් වී නම් එය සන්හුන්නේ ය. පෙර රහත් බවට පැමිණෙනු පිණිස යම වීය්‍ර්‍යයෙක් වී ද, රහත් බවට පැමිණි කල්හි ඒ පිණිස වූ යම් වීය්‍ර්‍යයෙක් වී නම් එය සන්හුන්නේ ය. පෙර රහත් බවට පැමිණෙනු පිණිස යම් සිතෙක් වී ද රහත් බවට පැමිණි කල්හි ඒ පිණිස වූ යම් සිතෙක් වී නම් එය සන්හුන්නේ ය. පෙර රහත් බවට පැමිණෙනු පිණිස යම් වීමංසාවක් වූ ද, රහත් බවට පැමිණි කල්හි ඒ පිණිස වූ යම් වීමංසාවක් වී නම් එය සන්හුන්නේ ය. මෙසේ ඇති කල්හි ශාන්ත වූවෙක් හෝ ශාන්ත නො වූවෙක් හෝ වේ දැ යි? භවත් ආනන්දයෙනි, එසේ ඇති කල්හි ඒකාන්තයෙන් ශාන්ත වූවෙක් වේ. ශාන්ත නො වූවෙක් නො වේ. භවත් ආනන්දයෙනි, ඉතා මැනවි ... අද පටන් දිවිහිම් කොට සරණ ගිය (මා උවසු කොට දරන සේක්වා) යි.

## 7. 2. 6

## මහිද්ධික සූත්‍රය

3138. මහණෙනි, ඉකුත්කල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මහත් සෘද්ධි ඇත්තෝ මහත් අනුභාව ඇත්තෝ වූහු නම් ඒ සියල්ලෝ සිවු ඉදුපා වැඩූ බැවින්, බහුල කළ බැවින් (එසේ වූහ.) මහණෙනි, මතු යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මහත් සෘද්ධි ඇත්තෝ මහත් අනුභාව ඇත්තෝ වන්නාහු නම් ඒ සියල්ලෝ සිවු ඉදුපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. මහණෙනි, දැන් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මහත් සෘද්ධි ඇත්තෝ මහත් අනුභාව ඇත්තෝ නම් ඒ සියල්ලෝ සිවු ඉදුපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි. කවර සිවු ඉදුපා ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසංඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි .. වීමංසාසමාධිපධානසංඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, ඉකුත් කල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මහත් සෘද්ධි ඇත්තෝ මහත් අනුභාව ඇත්තෝ වූහු නම් ... මහත් සෘද්ධි ඇත්තෝ මහත් අනුභාව ඇත්තෝ වන්නාහු නම් ... දැන් මහත් සෘද්ධි ඇත්තෝ මහත් අනුභාව ඇත්තෝ නම් ඒ සියල්ලෝ මේ සිවු ඉපාදු ම වැඩූ බැවිනි, බහුල කළ බැවිනි යි.

# 7. 2. 7

## ඉද්ධිවිධසුත්තං

3139. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොසුං, එකොපි හුත්වා බහුධා අහෙසුං, බහුධාපි හුත්වා එකො අහෙසුං ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානා අගමංසු සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං අකංසු සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ අගමංසු සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමිංසු සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසිංසු[1] පරිමජ්ජිංසු, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසෙ වත්තෙසුං, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා.

යෙ හිපි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොස්සන්ති: "එකොපි හුත්වා බහුධා භවිස්සන්ති, බහුධාපි හුත්වා එකො භවිස්සන්ති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානා ගමිස්සන්ති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරිස්සන්ති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ ගමිස්සන්ති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමිස්සන්ති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසිස්සන්ති පරිමජ්ජිස්සන්ති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙස්සන්ති[2] සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා.

යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්ති: එකොපි හුත්වා බහුධා හොන්ති. බහුධාපි හුත්වා එකො හොන්ති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානා ගච්ඡන්ති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොන්ති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡන්ති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමන්ති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසන්ති පරිමජ්ජන්ති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්ති, සබ්බෙ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා.

කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, යෙ හි කෙචි භික්ඛවෙ අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොසුං -පෙ- පච්චනුභොස්සන්ති -පෙ- පච්චනුභොන්ති -පෙ- සබ්බෙ තෙ ඉමෙසංයෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තාති.

1. පරිමසිංසු - සී 1, 2, මජ්සං.
2. වත්තියස්සන්ති - මජ්සං.

## 7. 2. 7

## ඉද්ධිවිධ සූත්‍රය

3139. මහණෙනි, ඉකුත්කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ නන් වැදෑරුම් ඉදුකොටස් වින්දහු ද, එකෙක් ව ද බොහෝ අයුරු වූහු ද, බොහෝ අයුරු ව ද එකෙක් වූහු ද, පළට බව මුවහ බව (වින්දහු ද,) බිතෙන් පිටට පවුරෙන් පිටට පව්වෙන් පිටට අහස්හි මෙන් නො ගැටෙමින් ගියාහු ද, පොළොවෙහින් දියෙහි මෙන් මතුවීම කිමිදීම කළාහු ද, පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහින් ගියාහු ද, පියාපත් ඇති ලිහිණියකු මෙන් අහස්හින් පළඟින් යුතු ව ගමන් කළාහු ද, මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනත් ස්පර්ශකළාහු ද, පිරිමැද්දහු ද, බඹලොව තෙක් දු කයින් වසයෙහි පැවැත් වූහු ද, ඒ සියල්ලෝ සිවු ඉදුපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි.

මහණෙනි, මතුත් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ නන්වැදෑරුම් ඉදු කොටස් විඳින්නාහු ද, එකෙක් ව ද බොහෝ අයුරු වන්නාහු ද, බොහෝ අයුරු ව ද එකෙක් වන්නාහු ද, පළට බව මුවහ බව (විඳින්නාහු ද,) බිතෙන් පිටට පවුරෙන් පිටට පව්වෙන් පිටට අහස්හි මෙන් නො ගැටෙමින් යන්නාහු ද, පොළොවෙහින් දියෙහි මෙන් මතු වීම කිමිදීම කරන්නාහු ද, පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහින් යන්නාහු ද, පියාපත් ඇති ලිහිණියකු මෙන් අහස්හින් පළඟින් යුතු ව ගමන් කරන්නාහු ද, මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනත් අතින් පහස්නාහු ද පිරිමදනාහු ද, බඹලොව තෙක් දු කයින් වසයෙහි පවත්වන්නා හු ද, ඒ සියල්ලෝ සිවු ඉදුපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි.

මහණෙනි, දැන් යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ නන් වැදෑරුම් ඉදු කොටස් විඳිද්ද, එකෙක් ව ද බොහෝ අයුරු වෙද්ද, බොහෝ අයුරු ව ද එකෙක් වෙද්ද, පළට බව මුවහ බව (විඳිද්ද,) බිතෙන් පිටට පවුරෙන් පිටට පව්වෙන් පිටට අහස්හි මෙන් නො ගැටෙමින් යෙද්ද, පොළොවෙහින් දියෙහි මෙන් මතුවීම කිමිදීම කෙරෙද්ද, නො බිඳෙන දියෙහින් පොළොවෙහි මෙන් යෙද්ද, පියාපත් ඇති ලිහිණියකු මෙන් අහස්හින් පළඟින් යුතු ව ගමන් කෙරෙද්ද, මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනත් අතින් පහයිද්ද පිරිමදිද්ද, බඹලොව තෙක් දු කයින් වෙසෙහි පවත්වද්ද, ඒ සියල්ලෝ සිවු ඉදුපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි.

කවර සිවු ඉදුපා ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි .. වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, ඉකුත්කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ නන් වැදෑරුම් ඉදු කොටස් වින්දහු ද ... විඳින්නාහු ද ... විඳිද්ද ... ඒ සියල්ලෝ මේ සිවු ඉදුපා වැඩූ බැවිනි, බහුල කළ බැවිනි යි.

## 7. 2. 8

### භික්ඛුසුත්තං

3140. චතුන්නං භික්ඛවෙ, ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

## 7. 2. 9

### භාවනාසුත්තං

3141. ඉද්ධිඤ්ච[1] වො භික්ඛවෙ, දෙසෙස්සාමි ඉද්ධිපාදඤ්ච ඉද්ධිපාදභාවනඤ්ච ඉද්ධිපාදභාවනාගාමිනිඤ්ච පටිපදං. තං සුණාථ. කතමා ච භික්ඛවෙ, ඉද්ධි: ඉධ භික්ඛවෙ, භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. අයං වුච්චති භික්ඛවෙ ඉද්ධි. කතමො ච භික්ඛවෙ, ඉද්ධිපාදො; යො භික්ඛවෙ, මග්ගො යා පටිපද ඉද්ධිපටිලාභාය[2] සංවත්තති. අයං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාදො. කතමා ච භික්ඛවෙ, ඉද්ධිපාදභාවනා: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති අයං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාදභාවනා. කතමා ච භික්ඛවෙ, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපද: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදාති.

1. ඉද්ධිං - මජ්ඣං.
2. ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය - මජ්ඣං, ස්‍යා.

## 7. 2. 8

## භික්ඛු සූත්‍රය

3140. මහණෙනි, ඉදුපා සතරක් වැඩූ බැවින් බහුල කළ බැවින් මහණතෙමේ ආස්‍රව ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ. කවර සතරක් ද යත්: මහණෙනි, මෙහි මහණතෙමේ ඡන්දසමාධිප්‍රධානසංස්කාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි .. චිත්තසමාධි ... වීමංසාසමාධිප්‍රධානසංස්කාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ සිවු ඉදුපා වැඩූ බැවින් බහුල කළ බැවින් මහණ ආස්‍රව ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටු දැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 7. 2. 9

## භාවනා සූත්‍රය

3141. මහණෙනි, සෘද්ධිය හා සෘද්ධිපාද හා සෘද්ධිපාදභාවනා හා සෘද්ධිපාදභාවනාගාමිනීප්‍රතිපද හා තොපට දෙසන්නෙමි. එය අසවු. මහණෙනි, සෘද්ධි කවර යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නන් වැදැරුම් සෘද්ධිවිධ අනුභව කෙරෙයි. එකෙක් ව ද බහු ප්‍රකාර වේ ... බඹලොව හිමි කොට ද කයින් වශයෙහි පවත්වයි. මහණෙනි, මේ සෘද්ධි යයි කියනු ලැබේ. මහණෙනි, සෘද්ධිපාද කවරෙ යත්: මහණෙනි, යම් මඟෙක් යම් පිළිවෙතෙක් සෘද්ධි ප්‍රතිලාභ පිණිස පවතී ද, මහණෙනි, මේ සෘද්ධිපාද යයි කියනු ලැබේ. මහණෙනි, සෘද්ධිපාදභාවනා කවර යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසංස්කාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරිය-සමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසංස්කාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ සෘද්ධිපාදභාවනා යයි කියනු ලැබේ. මහණෙනි, සෘද්ධිපාදභාවනාගාමිනිප්‍රතිපත් කවර යත්: මේ අරිඅටඟිමඟ මැ යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ සෘද්ධිපාද-භාවනාගාමිනීප්‍රතිපද යයි කියනු ලැබේ යි.

## 7. 2. 10

## විභඞ්ගසුත්තං

3142. චත්තාරො මෙ භික්ඛවෙ, ඉද්ධිපාද භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද කථං බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති; ඉති මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති, න ච අතිපග්ගහිතො භවිස්සති. න ච අජ්ඣත්තං සඞ්ඛිත්තො භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තො භවිස්සති පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති -පෙ- ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති: ‘‘ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති, න ච අතිපග්ගහිතා භවිස්සති, න ච අජ්ඣත්තං සඞ්ඛිත්තා භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති, පච්ඡා පුරෙ සඤ්ඤී ච විහරති:

‘‘යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.’’

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

කතමො ච භික්ඛවෙ, අතිලීනො ඡන්දො: යො භික්ඛවෙ, ඡන්දො කොසජ්ජසහගතො කොසජ්ජසම්පයුත්තො, අයං වුච්චති භික්ඛවෙ අතිලීනො ඡන්දො. කතමො ච භික්ඛවෙ, අතිපග්ගහිතො ඡන්දො: යො හි භික්ඛවෙ, ඡන්දො උද්ධච්චසහගතො උද්ධච්චසම්පයුත්තො, අයං වුච්චති භික්ඛවෙ, අතිපග්ගහිතො ඡන්දො. කතමො ච භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තො ඡන්දො: යො හි භික්ඛවෙ, ඡන්දො ථීනමිද්ධසහගතො ථීනමිද්ධසම්පයුත්තො, අයං වුච්චති භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තො ඡන්දො. කතමො ච භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තො ඡන්දො: යො හි භික්ඛවෙ, ඡන්දො බහිද්ධා පඤ්ච කාමගුණෙ ආරබ්භ අනුවික්ඛිත්තො අනුවිසටො. අයං වුච්චති භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තො ඡන්දො.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු පච්ඡාපුරෙ සඤ්ඤී ච විහරති: ‘‘යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ: ඉධ භික්ඛවෙ, භික්ඛුනො පච්ඡා පුරෙ සඤ්ඤා සුග්ගහිතා හොති සුමනසිකතා සූපධාරිතා සුප්පටිවිද්ධා පඤ්ඤාය, එවං ඛො භික්ඛවෙ, භික්ඛු පච්ඡා පුරෙ සඤ්ඤී විහරති: ‘‘යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ.’’

## 7. 2. 10

## විභඞ්ග සූත්‍රය

3142. මහණෙනි, මේ සතර ඍද්ධිපාද වඩන ලද්දේ බහුල කරන ලද්දේ මහත්ඵල මහානිසංස වේ. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සතර ඍද්ධිපාද මහත්ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය ... පච්ඡාපුරෙ සඤ්ඤ ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසාව ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. ''පෙර යම්සේ නම් පසුත් එසේ ය. පසු යම්සේ නම් පෙරත් එසේ ය. යට යම් සේ නම් උඩත් එසේ ය. උඩ යම්සේ නම් යටත් එසේ ය. දහවල යම් සේ නම් රෑත් එසේ ය. රෑ යම්සේ නම් දහවලුත් එසේ ය''යි පච්ඡා පුරෙසඤ්ඤ ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, ඉතා සැහවුණු ඡන්දය කවරේ ද යත්: මහණෙනි, යම් ඡන්දයෙක් කුසීතබව සහගියේ කුසීතබව සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා සැහවුණු ඡන්දය යි කියනු ලැබේ. මහණෙනි, ඉතා දැඩි කොට ගන්නා ලද ඡන්දය කවරේ ද යත්: මහණෙනි, යම් ඡන්දයෙක් උද්ධච්චය සහගියේ උද්ධච්චය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා දැඩි කොට ගන්නා ලද ඡන්ද යයි කියනු ලැබේ. මහණෙනි, ඇතුළත හැකුළුණු ඡන්දය කවරේ ද යත්: මහණෙනි, යම් ඡන්දයෙක් ථීනමිද්ධය සහගියේ ථීනමිද්ධය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඇතුළත හැකුළුණු ඡන්ද යයි කියනු ලැබේ. මහණෙනි, පිටත විසුරුණු ඡන්දය කවරේ ද යත්: මහණෙනි, යම් ඡන්දයෙක් පිටත පස්කම්ගුණ ඇරබ අනු ව විසුරුණේ අනු ව විසළේ වේ ද, මහණෙනි, මේ පිටත විසුරුණු ඡන්ද යයි කියනු ලැබේ.

මහණෙනි, මහණ කෙසේ නම් ''පෙර යම්සේ නම් පසුත් එසේ ය. පසු යම්සේ නම් පෙරත් එසේ යයි පච්ඡාපුරෙසඤ්ඤ ඇති ව වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණහු විසින් පච්ඡාපුරෙසඤ්ඤව මැනවින් ගන්නා ලද්දී මොනවට මෙනෙහි කරන ලද්දී මැනවින් දරන ලද්දී නුවණින් මොනවට පිළිවිදුනා ලද්දී වේ ද, මහණෙනි, මෙසේ මහණ තෙමේ ''පෙර යම්සේ නම් පසුත් එසේ ය. පසු යම්සේ නම් පෙරත් එසේ ය''යි පච්ඡාපුරෙ සඤ්ඤ ඇති ව වෙසේ.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යථං අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො විහරති: ඉධ භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: ''අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා[1] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො විහරති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු ''යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා විහරති: ඉධ භික්ඛවෙ, භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි දිවා ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි රත්තිං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙහි වා පන ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි රත්තිං ඡන්දසමාධි-පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි දිවා ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා විහරති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති: ඉධ භික්ඛවෙ, භික්ඛුනො ආලොකසඤ්ඤා සුග්ගහිතා හොති දිවාසඤ්ඤා ස්වාධිට්ඨිතා. එවං ඛො භික්ඛවෙ භික්ඛු විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

කතමඤ්ච භික්ඛවෙ අතිලීනං වීරියං: යං භික්ඛවෙ, විරියං කොසජ්ජසහගතං කොසජ්ජසම්පයුත්තං, ඉදං වුච්චති භික්ඛවෙ, අතිලීනං විරියං. කතමඤ්ච භික්ඛවෙ, අතිපග්ගහිතං විරියං: යං භික්ඛවෙ, විරියං උද්ධච්චසහගතං උද්ධච්චසම්පයුත්තං, ඉදං වුච්චති භික්ඛවෙ, අතිපග්ගහිතං විරියං. කතමඤ්ච භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තං විරියං: යං භික්ඛවෙ, විරියං ථිනමිද්ධසහගතං ථිනමිද්ධසම්පයුත්තං. ඉදං වුච්චති භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තං විරියං. කතමඤ්ච භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තං විරියං: යං භික්ඛවෙ, විරියං බහිද්ධා පඤ්චකාමගුණෙ ආරබ්භ අනුවික්ඛිත්තං අනුවිසටං. ඉදං වුච්චති භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තං විරියං -පෙ- සප්පභාසං චිත්තං භාවෙති.

1. අට්ඨිමිඤ්ජං - මජ්ඣං, ස්‍යා.

මහණෙනි, කෙසේ නම් මහණ යට යම්සේ නම් උඩත් එසේ ම උඩ යම් සේ නම් යටත් එසේ ම වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණ පාදතලයෙන් උඩ කෙස්මතුයෙන් යට සිවිය කෙළවර කොට ඇති නන් වැදෑරුම් අසුචියෙන් පිරුණු මේ කය ම ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි. මේ කයෙහි කෙස් ලොම් නිය දත් සිවි මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හදවත අක්මා දලබුව බඩදිව පපුමස අතුනු අතුනුබහන් නොපැසුණු අහර පැසුණු අහර පිත් සෙම් පූයා ලේ ඩහ මේදතෙල කඳුළු වුරුණුතෙල කෙළ මුකුනු සඳමිදුලු මූ ඇතැ''යි. මහණෙනි, මෙසේ මහණ තෙමේ යට යම් බඳු නම් උඩත් එසේ ම උඩ යම් බඳු නම් යටත් එසේ ම වෙසේ.

මහණෙනි, කෙසේ නම් මහණ දහවල් යම් බඳු නම් රෑත් එසේ ම රෑ යම් බඳු නම් දහවලුත් එසේ ම වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණ යම් කොටස්වලින් යම් සටහන්වලින් යම් වැටහීම්වලින් දහවල් ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩා ද, හෙතෙමේ ඒ කොටස්වලින් ඒ සටහන්වලින් ඒ වැටහීම් වලින් රෑත් ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. යම් කොටස්වලින් හෝ යම් සටහන්වලින් හෝ යම් වැටහීම්වලින් හෝ රෑ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩා ද, හෙතෙමේ ඒ කොටස්වලින් ඒ සටහන්වලින් ඒ වැටහීම්වලින් දහවලුත් ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මෙසේ මහණතෙමේ දහවල් යම් බඳු නම් රෑත් එසේ ම රෑ යම් බඳු නම් දහවලුත් එසේ ම වෙසේ.

මහණෙනි, කෙසේ නම් මහණ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩා ද යත්: මහණෙනි, මෙහි මහණහු විසින් ආලෝකසඤ්ඤාව මැනවින් ගන්නා ලද්දී දිවාසඤ්ඤාව මැනවින් තබන ලද්දී වේ ද, මහණෙනි, මෙසේ මහණ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, ඉතා සැඟවුණු වීර්‍ය්‍යය කවරේ ද යත්: මහණෙනි, යම් වීර්‍ය්‍යයෙක් කෞසජ්ජය සහගියේ කෞසජ්ජය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා සැඟැවුණු වීර්‍ය්‍යය යි කියනු ලැබේ. මහණෙනි, ඉතා දැඩි කොට ගන්නා ලද වීර්‍ය්‍යය කවරේ ද යත්: මහණෙනි, යම් වීර්‍ය්‍යයෙක් උද්ධච්චය සහගියේ උද්ධච්චය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා දැඩි කොට ගන්නා ලද වීර්‍ය්‍යය යි කියනු ලැබේ. මහණෙනි, ඇතුළත හැකුළුණු වීර්‍ය්‍යය කවරේ ද යත්: මහණෙනි, යම් වීර්‍ය්‍යයෙක් ථීනමිද්ධය සහගියේ ථීනමිද්ධය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඇතුළත හැකුළුණු වීර්‍ය්‍යය යි කියනු ලැබේ. මහණෙනි, පිටත විසුරුණු වීර්‍ය්‍යය කවරේ ද යත්: මහණෙනි, යම් වීර්‍ය්‍යයෙක් පිටත පස්කම් ගුණ ඇරබ අනු ව විසුරුණේ අනු ව විසළේ වේ ද, මහණෙනි, මේ පිටත විසුරුණු වීර්‍ය්‍යය යි කියනු ලැබේ ... බැබළුම් සහිත සිත වඩයි.

කතමඤ්ච භික්ඛවෙ, අතිලීනං චිත්තං: යං භික්ඛවෙ, චිත්තං කොසජ්ජසහගතං කොසජ්ජසම්පයුත්තං, ඉදං වුච්චති භික්ඛවෙ, අතිලීනං චිත්තං. කතමඤ්ච භික්ඛවෙ, අතිපග්ගහිතං චිත්තං: යං භික්ඛවෙ, චිත්තං උද්ධච්චසහගතං උද්ධච්චසම්පයුත්තං. ඉදං වුච්චති භික්ඛවෙ, අතිපග්ගහිතං චිත්තං. කතමඤ්ච භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තං චිත්තං: යං භික්ඛවෙ, චිත්තං ථීනමිද්ධසහගතං ථීනමිද්ධසම්පයුත්තං, ඉදං වුච්චති භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තං චිත්තං. කතමඤ්ච භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තං චිත්තං: යං භික්ඛවෙ, චිත්තං බහිද්ධා පඤ්චකාමගුණෙ ආරබ්භ අනුවික්ඛිත්තං අනුවිසටං. ඉදං වුච්චති භික්ඛවෙ බහිද්ධා වික්ඛිත්තං චිත්තං -පෙ- සප්පභාසං චිත්තං භාවෙති.

කතමා ච භික්ඛවෙ, අතිලීනා වීමංසා: යා භික්ඛවෙ, වීමංසා කොසජ්ජසහගතා කොසජ්ජසම්පයුත්තා. අයං වුච්චති භික්ඛවෙ, අතිලීනා වීමංසා. කතමා ච භික්ඛවෙ, අතිපග්ගහිතා වීමංසා: යා භික්ඛවෙ, වීමංසා උද්ධච්චසහගතා උද්ධච්චසම්පයුත්තා. අයං වුච්චති භික්ඛවෙ, අතිපග්ගහිතා වීමංසා. කතමා ච භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තා වීමංසා: යා භික්ඛවෙ, වීමංසා ථීනමිද්ධසහගතා ථීනමිද්ධසම්පයුත්තා, අයං වුච්චති භික්ඛවෙ, අජ්ඣත්තං සඞ්ඛිත්තා වීමංසා. කතමා ච භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තා වීමංසා: යා භික්ඛවෙ, වීමංසා බහිද්ධා පඤ්චකාමගුණෙ ආරබ්භ අනුවික්ඛිත්තා අනුවිසටා. අයං වුච්චති භික්ඛවෙ, බහිද්ධා වික්ඛිත්තා වීමංසා.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු පච්ඡාපුරෙසඤ්ඤී විහරති ''යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ:'' ඉධ භික්ඛවෙ, භික්ඛුනො පච්ඡාපුරෙ සඤ්ඤා සුග්ගහිතා හොති සුමනසිකතා සූපධාරිතා සුප්පටිවිද්ධා පඤ්ඤාය. එවං ඛො භික්ඛවෙ, භික්ඛු පච්ඡාපුරෙසඤ්ඤී විහරති. ''යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ.''

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො විහරති: ඉධ භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: ''අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා -පෙ- ලසිකා මුත්තන්ති.'' එවං ඛො භික්ඛවෙ, භික්ඛු යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො විහරතීති.

මහණෙනි, ඉතා සැහවුණු සිත කවරේ ද යත්: මහණෙනි, යම් සිතෙක් කොසජ්ජය සහගියේ කොසජ්ජය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා සැහවුණු සිතැයි කියනු ලැබේ. මහණෙනි, ඉතා දැඩි කොට ගන්නා ලද සිත කවරේ ද යත්: මහණෙනි, යම් සිතෙක් උද්ධච්චය සහගියේ උද්ධච්චය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා දැඩි කොට ගන්නා ලද සිතැයි කියනු ලැබේ. මහණෙනි, ඇතුළත හැකුළුණු සිත කවරේ ද යත්: මහණෙනි, යම් සිතෙක් ථීනමිද්ධය සහගියේ ථීනමිද්ධය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඇතුළත හැකුළුණු සිතැයි කියනු ලැබේ. මහණෙනි, පිටත විසුරුණු සිත කවරේ ද යත්: මහණෙනි, යම් සිතෙක් පිටත පස්කම්ගුණ ඇරබ අනු ව විසුරුණේ අනු ව විසළේ වේ ද, මහණෙනි, මේ පිටත විසුරුණු සිතැ යි කියනු ලැබේ ... බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, ඉතා සැහවුණු වීමංසාව කවරේ ද යත්: මහණෙනි, යම් වීමංසාවක් කොසජ්ජය සහගියේ කොසජ්ජය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා සැහවුණු වීමංසා යි කියනු ලැබේ. මහණෙනි, ඉතා දැඩි කොට ගන්නා ලද වීමංසාව කවරේ ද යත්: මහණෙනි, යම් වීමංසාවෙක් උද්ධච්චය සහගියේ උද්ධච්චය සමග යෙදුණේ වේ ද, මහණෙනි, මේ ඉතා දැඩි කොට ගන්නා ලද වීමංසා යි කියනු ලැබේ. මහණෙනි, ඇතුළත හැකුළුණු වීමංසාව කවරේ ද යත්: මහණෙනි, යම් වීමංසාවෙක් ථීනමිද්ධය සහගියේ ථීනමිද්ධය සමග යෙදුණේ වේ ද මහණෙනි, මේ ඇතුළත හැකුළුණු වීමංසා යි කියනු ලැබේ. මහණෙනි, පිටත විසුරුණු වීමංසාව කවරේ ද යත්: මහණෙනි, යම් වීමංසාවෙක් පිටත පස්කම්ගුණ ඇරබ අනු ව විසුරුණේ අනු ව විසළේ වේ ද, මහණෙනි, මේ පිටත විසුරුණු වීමංසා යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් මහණ ''පෙර යම්සේ නම් පසුත් එසේ ය. පසු යම්සේ නම් පෙරත් එසේ ය''යි පච්ඡාපුරෙසඤ්ඤ ඇති ව වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණහු විසින් පච්ඡා-පුරෙසඤ්ඤව මැනවින් ගන්නා ලද්දී මැනවින් මෙනෙහි කරන ලද්දී මැනවින් දරන ලද්දී නුවණින් මොනවට පිළිවිදිනා ලද්දී වේ ද මහණෙනි, මෙසේ මහණ ''පෙර යම්සේ නම් පසුත් එසේ ය. පසු යම්සේ නම් පෙරත් එසේ ය''යි පච්ඡාපුරෙසඤ්ඤ ඇති ව වෙසේ.

මහණෙනි, කෙසේ නම් මහණ යට යම්සේ නම් උඩත් එසේ ව උඩ යම්සේ නම් යටත් එසේ ව වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණතෙමේ පාදතලයෙන් උඩ කෙස්මතුවෙන් යට සිවිය කෙළවර කොට ඇති නන් වැදෑරුම් අසුචියෙන් පිරුණු මේ කය ම පස්වීකයි. ''මේ කයෙහි කෙස් ලොම් ... සඳමිදුලු මූ ඇතැ''යි. මහණෙනි, මෙසේ මහණ යට යම්සේ නම් උඩත් එබඳු ව උඩ යම්සේ නම් යටත් එබඳු ව වෙසේ.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා විහරති: ඉධ භික්ඛවෙ, භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි දිවා වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි රත්තිං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. යෙහි වා පන ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි රත්තිං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි දිවා වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා විහරති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති: ඉධ භික්ඛවෙ, භික්ඛුනො ආලොකසඤ්ඤා සුග්ගහිතා හොති දිවාසඤ්ඤා ස්වාධිට්ඨිතා. එවං ඛො භික්ඛවෙ, භික්ඛු විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

එවං භාවිතා ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාදා එවං බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා. එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතුසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති. "එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.." එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතුසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

## පාසාදකම්පනවග්ගො දුතියො.

**තත්‍රුද්දානං:**

හෙතුමහප්ඵලො ඡන්දො මොග්ගල්ලානො ච බ්‍රාහ්මණො,
මහිද්ධියිද්ධිවිධා භික්ඛු භාවනා විභඞ්ගෙහි චාති.

මහණෙනි, කෙසේ නම් මහණ දහවල් යම්සේ නම් රෑත් එබඳු ව රෑ යම්සේ නම් දහවලුත් එබඳු ව වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණ යම් කොටස්වලින් යම් සටහන්වලින් යම් වැටහීම්වලින් දහවල් වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩා ද, හෙතෙමේ ඒ කොටස්වලින් ඒ සටහන්වලින් ඒ වැටහීම්වලින් රෑත් වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. යම් කොටස්වලින් හෝ යම් සටහන්වලින් හෝ යම් වැටහීම්වලින් හෝ රැයෙහි වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩා ද, හෙතෙමේ ඒ කොටස්වලින් ඒ සටහන්වලින් ඒ වැටහීම්වලින් දහවලුත් වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මෙසේ මහණ දහවල් යම්බඳු නම් රෑත් එසේ ව රෑ යම්බඳු නම් දහවලුත් එසේ ව වෙසේ.

මහණෙනි, කෙසේ නම් මහණ විවෘත වූ හාත්පසින් නොබැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩා ද යත්; මහණෙනි, මෙහි මහණහු විසින් ආලොකසඤ්ඤාව මැනවින් ගන්නා ලද්දී දිවාසඤ්ඤාව මැනවින් පිහිටුවන ලද්දී වෙ ද, මහණෙනි, මෙසේ මහණ විවෘත වූ හාත්පසින් බැබළුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සිවු ඉදුපා මහත්ඵල මහානිසංස වේ. මහණෙනි, මහණ සිවු ඉදුපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි නන් වැදෑරුම් ඉදුකොටස් විඳී: එකෙක් ව ද බොහෝ අයුරු වේ ... බඹලොව තෙක් දු කයින් වසඟයෙහි පවත්වයි. මහණෙනි, මහණ සිවු ඉදුපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි ආස්‍රව ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

**දෙවැනි පාසාදකම්පනවග්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

හෙතු, මහප්ඵල, ඡන්ද, මොග්ගල්ලාන, බ්‍රාහ්මණ, මහිද්ධික, ඉද්ධිවිධ, භික්ඛු, භාවනා, විභඞ්ග යි දශසූත්‍රාන්ත කෙනෙකි.

# 3. අයොගුළවග්ගො

## 7. 3. 1

### මග්ගසුත්තං

3143. සාවත්ථියං:

පුබ්බෙව මෙ භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි. "කො නු ඛො මග්ගො කා පටිපදා ඉද්ධිපාදභාවනායා'ති: තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "ඉධ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, ඉති මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති -පෙ- සප්පභාසං චිත්තං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති. න ච අතිපග්ගහිතා භවිස්සති. න ච අජ්ඣත්තං සඞ්ඛිත්තා භවිස්සති. න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති. පච්ඡාපුරෙසඤ්ඤී ච විහරති:

"යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා."

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, භික්ඛු චතූසු ඉද්ධිපාදෙසු එවං බහුලීකතෙසු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

(ඡළභිඤ්ඤා විත්ථාරෙතබ්බා.)

## 7. 3. 2

### අයොගුළසුත්තං

3144. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "අභිජානාති නු ඛො භන්තෙ, භගවා ඉද්ධියා මනොමයෙන කායෙන බ්‍රහ්මලොකං උපසඞ්කමිතා"ති. අභිජානාමි ඛ්වාහං ආනන්ද ඉද්ධියා මනොමයෙන කායෙන බ්‍රහ්මලොකං උපසඞ්කමිතාති. අභිජානාති ඛො පන භන්තෙ, භගවා ඉමිනා චාතුම්මහාභූතිකෙන කායෙන ඉද්ධියා බ්‍රහ්මලොකං උපසඞ්කමිතාති. අභිජානාමි ඛ්වාහං ආනන්ද, ඉමිනා චාතුම්මහාභූතිකෙන[1] කායෙන ඉද්ධියා බ්‍රහ්මලොකං උපසඞ්කමිතාති.[2] ඔපාතිහ[3] භන්තෙ, භගවා ඉද්ධියා මනොමයෙන කායෙන බ්‍රහ්මලොකං උපසඞ්කමිතුං. සමත්ථො[4] ඛො භන්තෙ, භගවා ඉමිනා චාතුම්මහාභූතිකෙන කායෙන ඉද්ධියා බ්‍රහ්මලොකං උපසඞ්කමිති.[5] තයිදං භන්තෙ, භගවතො අච්ඡරියං චෙව අබ්භුතං චාති.

1. චාතුම්මහාභූතිකෙන - මජ්ඣං.
2. උපසඞ්කමිතාති - සී 1, 2.
3. යඤ්ච ඛො ඔපාති - මජ්ඣං, සයා, ඔපපාති - සී 2.
4. අභිජානාති - මජ්ඣං, සයා.
5. උපසඞ්කමිතා - මජ්ඣං, සයා.

## 3. අයොගුලවර්ගය

## 7. 3. 1

### මග්ග සූත්‍රය

**3143. සැවැත්නුවර:**

**මහණෙනි,** සම්බොධියෙන් පළමු ම බුද්ධබවට නො පැමිණි බෝසත් වූ ම මට මේ සිත විය: "ඍද්ධිපා වැඩුමට මඟ කවරේ ද, පිළිවෙත කවරේ ද"යි. මහණෙනි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඍද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය ඉතා සැහවුණේ නො ද වන්නේ ය ... බැඹළුම් සහිත සිත වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසා-සමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඍද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසාව ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. "පෙර යම්සේ නම් පසුත් එසේ ය. පසු යම්සේ නම් පෙරත් එසේ ය. යට යම්සේ නම් උඩත් එසේ ය. උඩ යම්සේ නම් යටත් එසේ ය. දහවල් යම්සේ නම් රැත් එසේ ය. රෑ යම්සේ නම් දහවලුත් එසේ ය"යි පච්ඡාපුරෙසඤ්ඤ ඇත්තේ ද වෙසෙයි. මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, මහණ සිව් ඍද්ධිපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි නන් වැදෑරුම් ඍද්ධිකොටස් විඳී: එකෙක් ව ද බොහෝ අයුරු වේ. ... බඹලොව තෙක් ද කයින් වසයෙහි පවත්වයි. මහණෙනි, මහණ සිව් ඍද්ධිපා මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාශ්‍රව වූ චිත්තසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

(ෂඩභිඥා විතර කටයුතු.)

## 7. 3. 2

### අයොගුළ සූත්‍රය

3144. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෘද්ධියෙන් මනොමයකයින් බඹලොවට එළඹීසේක් දැන වදරන සේක් ද"යි. ආනන්ද, මම සෘද්ධියෙන් මනොමයකයින් බඹලොවට එළඹීයෙමි දනිමි යි. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මේ චාතුම්මහාභූතික කයින් සෘද්ධියෙන් බඹලොවට එළඹෙන්නට හැකිසේක් ද"යි. ආනන්ද, මම මේ චාතුම්මහාභූතික කයින් සෘද්ධියෙන් බඹලොවට එළඹෙන්නට හැකි වෙමි යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෘද්ධියෙන් මනොමයකයින් බඹලොවට එළඹෙන්නට හැකි සේක: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මේ චාතුම්මහාභූතික කයින් සෘද්ධියෙන් බඹලොවට එළඹීසේක් දනිමි යි. වහන්ස, ඒ මෙය භාග්‍යවතුන් වහන්සේගේ ඇසිරියෙක් ද පුදුමයෙක් ද වේ යි.

අච්ඡරියා චෙව ආනන්ද තථාගතා, අච්ඡරියධම්මසමන්නාගතා ච, අබ්භුතා චෙව ආනන්ද තථාගතා, අබ්භුතධම්මසමන්නාගතා ච. යස්මිං ආනන්ද, සමයෙ තථාගතො කායම්පි චිත්තෙ සමාදහති[1] චිත්තම්පි ච කායෙ සමාදහති[1] සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ[2] ඔක්කමිත්වා විහරති තස්මිං ආනන්ද, සමයෙ තථාගතස්ස කායො ලහුතරො චෙව හොති මුදුතරො ච කම්මනියතරො ච පභස්සරතරො ච. සෙය්‍යථාපි ආනන්ද අයොගුළො දිවසසන්තත්තො[3] ලහුතරො චෙව හොති මුදුතරො ච කම්මනියතරො ච පභස්සරතරො ච. එවමෙව ඛො ආනන්ද, යස්මිං සමයෙ තථාගතො කායම්පි චිත්තෙ සමාදහති, චිත්තම්පි කායෙ සමාදහති. සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ[4] ඔක්කමිත්වා විහරති, තස්මිං සමයෙ ආනන්ද, තථාගතස්ස කායො ලහුතරො චෙව හොති මුදුතරො ච කම්මනියතරො ච පභස්සරතරො ච.

යස්මිං ආනන්ද සමයෙ තථාගතො කායම්පි චිත්තෙ සමාදහති, චිත්තම්පි කායෙ සමාදහති, සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ ඔක්කමිත්වා විහරති. තස්මිං ආනන්ද, සමයෙ තථාගතස්ස කායො අප්පකසිරෙනෙව පථවියා වෙහාසං අබ්භුග්ගච්ඡති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: ''එකොපි හුත්වා බහුධා හොති –පෙ– යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති, සෙය්‍යථාපි ආනන්ද, තූලපිචු වා කප්පාසපිචු වා ලහුකො වාතුපාදානො අප්පකසිරෙනෙව පථවියා වෙහාසං අබ්භුග්ගච්ඡති. එවමෙව ඛො ආනන්ද, යස්මිං සමයෙ තථාගතො කායම්පි චිත්තෙ සමාදහති, චිත්තම්පි කායෙ සමාදහති සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ ඔක්කමිත්වා විහරති. තස්මිං ආනන්ද, සමයෙ තථාගතස්ස කායො අප්පකසිරෙනෙව පථවියා වෙහාසං අබ්භුග්ගච්ඡති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති –පෙ– යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති.

## 7. 3. 3

## භික්ඛුසුත්තං

3145. චත්තාරො මෙ භික්ඛවෙ, ඉද්ධිපාදා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි –පෙ– චිත්තසමාධි –පෙ– වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාදා. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

1. සමොදහති – මජ්ඣං,
2. කායෙන – සී 1, 2.
3. දිවසං සන්තත්තො – මජ්ඣං, සතා.
4. කායෙන – සී 1, 2.

Free Distribution www.aathaapi.org

ආනන්ද තථාගතයෝ අසිරි වූවාහුත් අසිරි දහමින් යුතු වූවාහුත් වෙති. ආනන්ද, තථාගතයෝ පුදුම වූවාහුත් පුදුම දහමින් යුතු වූවාහුත් වෙති. ආනන්ද, යම් සමයක තථාගත තෙමේ කයත් සිතෙහි නඟා ද, සිතත් කයෙහි නඟා ද, සුඛසංඥාවත් ලඝුසංඥාවත් කයෙහි බහා වෙසේ ද, ආනන්ද, එසමයෙහි තථාගතයන්ගේ කය ඉතා සැහැල්ලුත් ඉතා මෘදුත් ඉතා කර්මණ්‍යත් ඉතා බබළනසුලුත් වෙයි. ආනන්ද, දවසක් මුළුල්ලෙහි තැවුණු යවටෙක් යම්සේ ඉතා සැහැල්ලුත් ඉතා මෘදුත් ඉතා කර්මණ්‍යත් ඉතා ප්‍රභාස්වරත් වේ ද, ආනන්ද, එසෙයින් ම තථාගතතෙමේ යම් සමයක කයත් සිතෙහි නඟා ද, සිතත් කයෙහි නඟා ද, සුඛසංඥාවත් ලඝුසංඥාවත් කයෙහි බහා වෙසේ ද, ආනන්ද, එසමයෙහි තථාගතයන්ගේ කය ඉතා ලඝුත් ඉතා මෘදුත් ඉතා කර්මණ්‍යත් ඉතා ප්‍රභාස්වරත් වේ.

ආනන්ද, යම් කලෙක තථාගත තෙමේ කයත් සිතෙහි නඟා ද, සිතත් කයෙහි නඟා ද, සුඛසංඥාවත් ලඝුසංඥාවත් කයෙහි බහා වෙසේ ද, ආනන්ද, එකල්හි තථාගතයන්ගේ කය නිතැතින් ම පොළොවෙන් අහසට නඟී. හේ නන් වැදෑරුම් ඉද්ධි කොටස් විඳී. එකෙක් ව ද බොහෝ අයුරු වේ. ... බඹලොව තෙක් ද්‍ කයෙන් වසයෙහි පවත්වයි. ආනන්ද, යම්සේ හිඹුල්පුලුන් හෝ කපුපුලුන් හෝ සැහැල්ලු වූයේ වාතය විසින් ගන්නා ලද්දේ නිතැතින් ම පොළොවෙන් අහසට නඟී යි. ආනන්ද, එසෙයින් ම යම් සමයෙක තථාගත තෙමේ කයත් සිතෙහි නඟා ද, සිතත් කයෙහි නඟා ද, සුඛසංඥාවත් ලඝුසංඥාවත් කයෙහි බහා වෙසේ ද, ආනන්ද, එසමයෙහි තථාගතයන්ගේ කය නිතැතින් ම පොළොවෙන් අහසට නඟී. හේ නන්වැදෑරුම් ඉද්ධිකොටස් විඳී. එකෙක් ව ද බොහෝ අයුරු වේ ... බඹලොව තෙක්ද්‍ කයෙන් වසයෙහි පවත්වා යි.

## 7. 3. 3

## භික්ඛු සූත්‍රය

3145. මහණෙනි, මේ ඉද්ධිපාද සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ ඉද්ධිපාද සතර යි. මහණෙනි, මේ සිවු ඉද්ධිපා වැඩූ බැවින් බහුල කළ බැවින් මහණ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදම්යෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 7. 3. 4

### සුද්ධකසුත්තං [1]

3146. චත්තාරො'මෙ භික්ඛවෙ, ඉද්ධිපාද. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාදති.

## 7. 3. 5

### ඵලසුත්තං

3147. චත්තාරො'මෙ භික්ඛවෙ, ඉද්ධිපාද. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: ''දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා''ති.

## 7. 3. 6

### දුතියඵලසුත්තං

3148. චත්තාරො'මෙ භික්ඛවෙ, ඉද්ධිපාද. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඉද්ධිපාද.

ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛා. කතමෙ සත්තඵලා සත්තානිසංසා: දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, අථ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති. නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායී හොති, උපහච්ච පරිනිබ්බායී හොති,. අසඞ්ඛාරපරිනිබ්බායී හොති, සසඞ්ඛාරපරිනිබ්බායී හොති, උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා ඉමෙ සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛාති.

---

1. න දිස්සතෙදං සුත්තං ස්‍යාමපොත්ථකෙ.

## 7. 3. 4

## සුද්ධක සූත්‍රය

3146. මහණෙනි, මේ ඉද්ධිපාද සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ සිවු ඉදුපා යි.

## 7. 3. 5

## ඵලසූත්‍රය

3147. මහණෙනි, මේ ඉදුපා සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ සිවු ඉදුපා යි. මහණෙනි, මේ සතර ඉද්ධිපාද වැඩූ බැවින් බහුල කළ බැවින් ඵලද්වය අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතු. දිටුදැමියෙහි ම රහත් බව හෝ උපාදනසෙස ව ඇති කල්හි අනගැමි බව හෝ යි.

## 7. 3. 6

## දුතියඵල සූත්‍රය

3148. මහණෙනි, මේ ඉදුපා සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය . වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ සතර ඉද්ධිපාද යි.

මහණෙනි, මේ සතර ඉද්ධිපාද වැඩූ බැවින් බහුල කළ බැවින් සත් ඵල කෙනෙක් සත් අනුසස් කෙනෙක් කැමති විය යුතු. කවර සත් ඵල කෙනෙක් සත් අනුසස් කෙනෙක් ද යත්: දිටුදැමියෙහි ම පෙරාතු ව රහත් බව ලබයි. ඉදින් දිටුදැමියෙහි ම පෙරාතු ව රහත් බව නො ලබා නම් එකල්හි මරණසමයෙහි රහත් බව ලබයි. ඉදින් දිටුදැමියෙහි ම පෙරාතු ව රහත් බව නො ලබා නම් ඉදින් මැරෙන කල්හි රහත් බව නො ලබා නම් එකල්හි පස් ඔරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් අතර කෙලෙස් පිරිනිවෙනින් පිරිනිවෙනසුලු වේ. (ආයුමැද ඉක්මවා) ආයුකෙළවරට ළං ව කෙලෙස්පිරිනිවෙනින් පිරිනිවෙනසුලු වෙයි. පියෝ නැති ව කෙලෙස්පිරිනිවෙනින් පිරිනිවෙනසුලු වෙයි. පියෝ ඇති ව කෙලෙස් පිරිනිවෙනින් පිරිනිවෙනසුලු වෙයි. අකනිට්ඨගාමී උද්ධංසොත වෙයි. මහණෙනි, මේ සිවු ඉදුපා වැඩූ බැවින් බහුල කළ බැවින් මේ සත්පල සත් අනුසස් කැමති විය යුතු යි.

## 7. 3. 7

### ආනන්දසුත්තං

3149. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "කතමා නු ඛො භන්තෙ, ඉද්ධි, කතමො ඉද්ධිපාදො, කතමා ඉද්ධිපාදභාවනා, කතමා ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදා"ති.

ඉධානන්ද, භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: "එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති". අයං වුච්චතානන්ද, ඉද්ධි. කතමො චානන්ද, ඉද්ධිපාදො: යො ආනන්ද, මග්ගො යා පටිපදා ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය සංවත්තති. අයං වුච්චතානන්ද, ඉද්ධිපාදො. කතමා චානන්ද, ඉද්ධිපාදභාවනා: ඉධානන්ද, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. අයං වුච්චතානන්ද, ඉද්ධිපාදභාවනා. කතමා චානන්ද, ඉද්ධිපාද-භාවනාගාමිනී පටිපදා: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චතානන්ද, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදාති.

## 7. 3. 8

### දුතියආනන්දසුත්තං

3150. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච: "කතමා නු ඛො ආනන්ද, ඉද්ධි, කතමො ඉද්ධිපාදො, කතමා ඉද්ධිපාදභාවනා, කතමා ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදා"ති. භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ- ඉධානන්ද, භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- අයං වුච්චතානන්ද, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදාති.

## 7. 3. 9

### සම්බහුලභික්ඛුසුත්තං

3151. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "කතමා නු ඛො භන්තෙ ඉද්ධි; කතමො ඉද්ධිපාදො, කතමා ඉද්ධි-පාදභාවනා, කතමා ඉද්ධිපාදභාවනාගාමිනි පටිපදා"ති. ඉධ භික්ඛවෙ, භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: "එකොපි හුත්වා බහුධා හොති -පෙ- අයං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදාති.

## 7. 3. 7

## ආනන්ද සූත්‍රය

3149. එකල්හි ආයුෂ්මත් **ආනන්ද තෙරණුවෝ** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ ... එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, ඉද්ධි කවරේ ද ඉද්ධිපාද කවරේ ද ඉද්ධිපාදභාවනා කවරේ ද ඉද්ධිපාදභාවනාගාමිනීපටිපදා කවරේ දැ"යි.

ආනන්ද, මෙහි මහණ නන් වැදෑරුම් ඉදුකොටස් විඳියි: "එකෙක් ව ද බොහෝ අයුරු වේ ... බඹලොව තෙක් ද කයින් වසයෙහි පවත්වයි". ආනන්ද, මේ ඉදු යි කියනු ලැබේ. ආනන්ද, ඉදුපා කවරේ ද යත්: ආනන්ද, යම් මගෙක් යම් පිළිවෙතෙක් ඉදු ලැබුම ඉදු පිළිලැබුම පිණිස පවතී නම් ආනන්ද, මේ ඉදුපා යි කියනු ලැබේ. ආනන්ද, ඉදුපා වැඩුම කවරේ ද යත්: ආනන්ද, මෙහි මහණ ඡන්‍දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. ආනන්ද, මේ ඉදුපා වැඩුමැ යි කියනු ලැබේ. ආනන්ද, ඉදුපා වැඩුමට පමුණුවන පිළිවෙත කවරේ ද යත්: මේ අරිඅටඟි මඟ මැ යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. ආනන්ද, මේ ඉදුපා වැඩුමට පමුණුවන පිළිවෙතැ යි කියනු ලැබේ යි.

## 7. 3. 8

## දුතිය ආනන්ද සූත්‍රය

3150. එකත්පස් ව හුන් ආයුෂ්මත් **ආනන්ද තෙරණුවන්ට** භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: "ආනන්ද, ඉදු කවරේ ද, ඉදුපා කවරේ ද, ඉදුපා වැඩුම කවරේ ද, ඉදුපා වැඩුමට පමුණුවන පිළිවෙත කවරේ දැ"යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... ආනන්ද, මෙහි මහණ නන් වැදෑරුම් ඉදුකොටස් විඳියි ... ආනන්ද, මේ ඉදුපා වැඩුමට පමුණුවන පිළිවෙතැ යි කියනු ලැබේ යි.

## 7. 3. 9

## සම්බහුලභික්ඛු සූත්‍රය

3151. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹියහ ... එකත් පස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, ඉදු කවරේ ද, ඉදුපා කවරේ ද, ඉදුපා වැඩුම කවරේ ද, ඉදුපා වැඩුමට පමුණුවන පිළිවෙත කවරේ දැ"යි. මහණෙනි, මෙහි මහණ නන් වැදෑරුම් ඉදුකොටස් විඳී: එකෙක් ව ද බොහෝ අයුරු වේ ... මහණෙනි, මේ ඉදුපා වැඩුමට පමුණුවන පිළිවෙතැ යි කියනු ලැබේ යි.

## 7. 3. 10

## දුතියසම්බහුලභික්ඛුසුත්තං

3152. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු: -පෙ- එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: කතමා නු ඛො භික්ඛවෙ ඉද්ධි, කතමො ඉද්ධිපාදො, කතමා ඉද්ධිපාදභාවනා, කතමා ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදති, භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

කතමා ච භික්ඛවෙ ඉද්ධි: ඉධ භික්ඛවෙ, භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. අයං වුච්චති භික්ඛවෙ ඉද්ධි. කතමො ච භික්ඛවෙ, ඉද්ධිපාදො: යො භික්ඛවෙ, මග්ගො යා පටිපද ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය සංවත්තති. අයං වුච්චති භික්ඛවෙ ඉද්ධිපාදො. කතමා ච භික්ඛවෙ, ඉද්ධිපාදභාවනා: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධි-පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. අයං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාදභාවනා. කතමා ච භික්ඛවෙ, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදා: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාදභාවනාගාමිනී පටිපදති.

## 7. 3. 11

## මොග්ගල්ලානසුත්තං

3153. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමෙසං ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං මහිද්ධිකො එවං මහානුභාවොති. භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ- චතුන්නං ඛො භික්ඛවෙ, ඉද්ධි-පාදානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං මහිද්ධිකො එවං මහානුභාවො. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, මොග්ගල්ලානො භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති -පෙ- සප්පභාසං චිත්තං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති, න ච අතිප්පග්ගහිතා භවිස්සති -පෙ- ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං මහිද්ධිකො එවං මහානුභාවො.

## 7. 3. 10

## දුතියසම්බහුලභික්ඛු සූත්‍රය

3152. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: “මහණෙනි, ඉද්ධි කවරේ ද, ඉද්ධිපා කවරේ ද, ඉද්ධිපා වැඩුම කවරේ ද, ඉද්ධිපා වැඩුමට පමුණුවන පිළිවෙත කවරේ දැ”යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ...

මහණෙනි, ඉද්ධි කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ නන්වැදෑරුම් ඉද්ධි කොටස් විඳී. එකෙක් ව ද බොහෝ අයුරු වේ... බඹලොව තෙක් ද කයෙන් වසයෙහි පවත්වයි. මහණෙනි, මේ ඉද්ධි යි කියනු ලැබේ. මහණෙනි, ඉද්ධිපා කවරේ ද යත්: මහණෙනි, යම් මඟෙක් යම් පිළිවෙතෙක් ඉද්ධි ලැබුම ඉද්ධි පිළිලැබුම පිණිස පවතී ද, මහණෙනි, මේ ඉද්ධිපා යි කියනු ලැබේ. මහණෙනි, ඉද්ධිපා වැඩුම කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දසමාධි-පධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ ඉද්ධිපා වැඩුමැ යි කියනු ලැබේ. මහණෙනි, ඉද්ධිපා වැඩුමට පමුණුවන පිළිවෙත කවරේ ද යත්: මේ අරිඅටඟිමඟමැ යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ ඉද්ධිපා වැඩුමට පමුණුවන පිළිවෙතැ යි කියනු ලැබේ යි.

## 7. 3. 11

## මොග්ගල්ලාන සූත්‍රය

3153. මහණෙනි, ඒ කිමැයි හඟිවු ද? කවර දහම් වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙබඳු මහත් සෘද්ධි ඇත්තේ මෙබඳු අනුභාව ඇත්තේ දැ යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. ... මහණෙනි, සිවු ඉද්ධිපා වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙබඳු මහත් සෘද්ධි ඇත්තේ මෙබඳු මහත් අනුභාව ඇත්තේ ය. කවර සිවු ඉද්ධිපා ද යත්: මහණෙනි, මෙහි මුගලන් මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය ඉතා සැඟවුණේ නො ද වන්නේය ... බැබළුම් සහිත සිත වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසාව ඉතා සැඟවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ... මෙසේ විවෘත වූ හාත්පසින් නො බැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි. මහණෙනි, මේ සිවු ඉද්ධිපා වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙබඳු මහත් සෘද්ධි ඇත්තේ ය. මෙබඳු මහත් අනුභාව ඇත්තේ ය

ඉමෙසං ච පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු එවං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: "එකොපි හුත්වා බහුධා හොති. -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතී". ඉමෙසං ච පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා මොග්ගල්ලානො භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී ති.

## 7. 3. 12

### තථාගතසුත්තං

3154. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමෙසං ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතො එවංමහිද්ධිකො එවංමහානුභාවොති. භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ- චතුන්නං ඛො භික්ඛවෙ, ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා තථාගතො එවංමහිද්ධිකො එවංමහානුභාවො. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, තථාගතො ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ ඡන්දො න ච අතිලීනො භවිස්සති. න ච අතිප්පග්ගහිතො භවිස්සති. -පෙ- ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි-පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉති මෙ වීමංසා න ච අතිලීනා භවිස්සති, න ච අතිප්පග්ගහිතා භවිස්සති. න ච අජ්ඣත්තං සඞ්ඛිත්තා භවිස්සති, න ච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති. පච්ඡාපුරෙ සඤ්ඤී ච විහරති.

'යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.'

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

ඉමෙසං ච ඛො පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා, බහුලීකතත්තා තථාගතො එවංමහිද්ධිකො එවංමහානුභාවො. ඉමෙසඤ්ච පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා තථාගතො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. ඉමෙසඤ්ච පන භික්ඛවෙ, චතුන්නං ඉද්ධිපාදනං භාවිතත්තා බහුලීකතත්තා තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

(ඡළභිඤ්ඤා විත්ථාරෙතබ්බා)

### අයොගුළවග්ගො තතියො.

තත්‍රුද්දානං:

මග්ගො අයොගුළො භික්ඛු සුද්ධකඤ්ච ද්වෙ ඵලා
ආනන්දෙන ද්වෙ වුත්තා භික්ඛුසම්බහුලෙ ද්වෙ,
එකාදසො මොග්ගල්ලානො ද්වාදසමො තථාගතොති.

මහණෙනි, මේ සිවු ඉද්ධිපාද ම වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ මෙසේ නන් වැදෑරුම් ඉද්ධි කොටස් විඳී: "එකෙක් ව ද බොහෝ අයුරු වේ ... බඹලොව තෙක් ද කයින් වසයෙහි පවත්වා"යි. මහණෙනි, මේ සිවු ඉද්ධිපාද ම වැඩූ බැවින් බහුල කළ බැවින් මුගලන් මහණ ආස්‍රව ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 7. 3. 12

## තථාගත සූත්‍රය

3154. මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කවර දහම් වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙමේ මෙබඳු මහත් සෘද්ධි ඇත්තේ මෙබඳු මහත් අනුභාව ඇත්තේ ද යි. වහන්ස, අපගේ දහම් භගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, සිවු ඉද්ධිපාද වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙමේ මෙබඳු මහත් සෘද්ධි ඇත්තේ මෙබඳු මහත් අනුභාව ඇත්තේ ය. කවර සිවු ඉද්ධිපාද ද යත්: මහණෙනි, මෙහි තථාගත තෙමේ ඡන්දසමාධිපධානසඞ්ඛාර-සමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ ඡන්දය ඉතා හැකුළුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය ... මෙසේ විවෘත වූ හාත්පසින් නොබැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි. විරියසමාධි .. චිත්තසමාධි ... වීමංසා-සමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මෙසේ මාගේ වීමංසා ඉතා සැහවුණේ නො ද වන්නේ ය. ඉතා දැඩි කොට ගන්නා ලද්දේ නො ද වන්නේ ය. ඇතුළත හැකුළුණේ නො ද වන්නේ ය. පිටත විසුරුණේ නො ද වන්නේ ය. "පෙර යම්සේ නම් පසුත් එබඳු ය. පසු යම්සේ නම් පෙරත් එබඳු ය. යට යම්සේ නම් උඩත් එබඳු ය. උඩ යම්සේ නම් යටත් එබඳු ය. දහවල් යම්සේ නම් රෑත් එබඳු ය. රෑ යම්සේ නම් දහවලුත් එබඳු ය"යි පසු පෙර හැඟීම් ඇත්තේ ද වෙසේ. මෙසේ විවෘත වූ හාත්පසින් නොබැඳුණු සිතින් බැබළුම් සහිත සිත වඩයි.

මහණෙනි, මේ සිවු ඉද්ධිපාද වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙමේ මෙබඳු මහත් සෘද්ධි ඇත්තේ මෙබඳු මහත් අනුභාව ඇත්තේ ය. මහණෙනි, මේ සිවු ඉද්ධිපාද ම වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙමේ නන් වැදෑරුම් ඉද්ධි කොටස් විඳී: එකෙක් ව ද බොහෝ අයුරු වේ ... බඹලොව තෙක් ද කයින් වසයෙහි පවත්වයි. මහණෙනි, මේ සිවු ඉද්ධිපාද ම වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙමේ ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් ඉහාත්මයෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

(ෂඩභිඥා විතර කටයුතු.)

## තෙවැනි අයොගුළවර්ග යි.

එහි සූත්‍රනාමාවලිය :

මග්ග, අයොගුළ, භික්ඛු, සුද්ධක යි සූත්‍ර සතරෙකි. ඵලසූත්‍ර දෙකෙකි. ආනන්ද නමින් ද දෙකෙක් කියන ලදි. සම්බහුලභික්ඛු සූත්‍ර ද දෙකෙකි. එකොළොස්වැන්න මොග්ගල්ලාන ය, දොළොස් වැන්න තථාගත ය යි සූත්‍ර මුළුල්ල දොළොසෙකි.

## 4. ගඞ්ගාපෙය්‍යාලවග්ගො

### 7. 4. 1–48

### පාචීනනින්නාදිසුත්තානි

3155–3202 සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. –පෙ– නිබ්බානපබ්භාරොති.

(ඉද්ධිපාදවසෙන විත්ථාරෙතබ්බානි.)

**ගඞ්ගාපෙය්‍යාලවග්ගො චතුත්ථො.**

**තත්‍රුද්දානං:**

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 5. අප්පමාදවග්ගො

### 7. 5. 1–40

### තථාගතාදිසුත්තානි

3203–3242. යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා –පෙ– බහුලීකරොතීති.

**අප්පමාදවග්ගො පඤ්චමො.**

**තත්‍රුද්දානං:**

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 6. බලකරණීයවග්ගො

### 7. 6. 1–48

### බලාදි සුත්තානි

3243–3290. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කයිරන්ති –පෙ– බහුලීකරොතීති:

**බලකරණීයවග්ගො ඡට්ඨො.**

**තත්‍රුද්දානං:**

බලං බීජං ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිනා
ආකාසෙන ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදී ති.

# 4. ගඞ්ගාපෙය්‍යාලවර්ගය

## 7. 4. 1–48

### පාචීනනින්නාදි සූත්‍ර

3155–3202. මහණෙනි, යම්සේ ගඞ්ගා නදී තොමෝ පැදුන්දිගට නැමුණී පැදුන්දිගට නැඹුරු වූවා පැදුන්දිගට බර වූවා වේ ද ... නිවනට බර වූයේ වේ යි.

(ඉද්ධිපාද විසින් විතර කටයුතු)

**සිවුවැනි ගඞ්ගාපෙය්‍යාලවර්ග යි.**

**එහි සූත්‍රනාමමාලාව :**

පාචීනනින්නචතුෂ්ක සයෙකි. සමුද්‍රනින්න චතුෂ්ක ද සයෙකි. මේ ෂට්කදෙක දෙළසෙක් වේ. එයින් වර්ග යි කියනු ලැබේ. සූත්‍ර මුළුල්ල අටසාළිසෙකි.

# 5. අප්පමාද වර්ගය

## 7. 5. 1–40

### තථාගතාදි සූත්‍ර

3203 – 3242. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද සිවුපා වූ ද බහුපා වූ ද යම් තාක් සත්ත්වයෝ වෙත් ද ... බහුල කෙරේ යි.

**පස්වැනි අප්පමාදවර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

තථාගත, පද, කූට, මූල. සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්‍ථ යි චතුෂ්කද්වයෙකි, සාළිස්සූත්‍රයෙකි.

# 6. බලකරණීයවර්ගය

## 7. 6. 1–48

### බලාදි සූත්‍ර

3243 – 3290. මහණෙනි, යම්සේ යම් කිසි බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත් ද ... බහුල කෙරෙයි.

**සවැනි බලකරණීය වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යි චතුෂ්ක සයෙකි. මේඝචතුෂ්ක දෙකෙකි. නාවා. ආගන්තුක, නදී යි චතුෂ්ක තුනෙකි. මුළුල්ල දෙළොසෙකි. සූත්‍රරු අටසාළිසෙකි.

# 7. එසනාවග්ගො

## 7. 7. 1–160

### එසනාදි සුත්තානි

3291–3450. තිස්සො ඉමා භික්ඛවෙ එසනා. කතමා තිස්සො: -පෙ- භාවෙතබ්බාති.

(විවෙකනිස්සිතාදි වසෙන අභිඤ්ඤා පරිඤ්ඤා පරික්ඛය පහාන වසෙන ච එකෙකස්මිං සොළස සොළස කත්වා එකසතසට්ඨිසුත්තන්තා විත්ථාරෙතබ්බා)

**එසනාවග්ගො සත්තමො**

**තස්සුද්දානං:**

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො,
ඛිලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාති චාති.

# 8. ඔඝවග්ගො

## 7. 8. 1–159

### ඔඝාදි සුත්තානි

3451–3609. චත්තාරො'මෙ භික්ඛවෙ ඔඝා. කතමෙ චත්තාරො: කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො -පෙ- භාවෙතබ්බාති.

(වුත්තනයෙනෙව විත්ථාරෙතබ්බානි.)

## 7. 8. 160

### උද්ධම්භාගියසුත්තං

3610. පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය චත්තාරො ඉද්ධිපාදා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරිය සමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය ඉමෙ චත්තාරො ඉද්ධිපාදා භාවෙතබ්බාති.

**ඔඝවග්ගො අට්ඨමො.**

**තස්සුද්දානං:**

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියාති.

**ඉද්ධිපාදසංයුත්තං සමත්තං.**

**තත්‍ර වග්ගුද්දානං:**

ඉද්ධිපාදෙ චාපාල පාසාදකම්පනයොගුළා
ගඞ්ගාපෙය්‍යාල ආදීහි පඤ්චහි වග්ගා හොන්තට්ඨාති.

# 7. එසනාවර්ගය

## 7. 7. 1–160

## එසනාදි සූත්‍ර

3291 – 3450. මහණෙනි, මේ එසනා තුනෙකි, කවර තුනෙක් ද යත්: ... වැඩිය යුතු යි.

(විවෙක නිස්සිතාදි විසිනුදු පරිඤ්ඤා අභිඤ්ඤා පරික්ඛය පහාන විසිනුදු එකෙක සොළොස සොළොස කොට එක්සිය සැට සූත්‍රාන්ත කෙනෙක් විතර කටයුතු.)

### සත්වැනි එසනාවග්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛිල, මල, නීඝ, වේදනා තණ්හා යි ෂොඩශක දශයෙකි. එක්සිය සැටසූතුරෙකි.

# 8. ඔඝවර්ගය

## 7. 8. 1–159

## ඔඝාදි සූත්‍ර

3451 – 3609. මහණෙනි, මේ ඔඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: කාමෞඝ භවෞඝ දිට්ඨෞඝ අවිජ්ජෞඝ යි ... වැඩිය යුතු යි.

(කී නයින් ම විතර කටයුතු.)

## 7. 8. 160

## උද්ධම්භාගිය සූත්‍ර

3610. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසෙකි, කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යි. මහණෙනි, මොහු පස් උද්ධම්භාගිය සංයොජනයෝ යි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් ප්‍රහාණය පිණිස සිවු ඉද්ධිපා වැඩියයුතු. කවර සිවු ඉද්ධිපාද යත්: මහණෙනි, මෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් පහනු පිණිස මේ සිවු ඉද්ධිපා වැඩියයුතු යි.

### අටවැනි ඔඝවග්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

ඔඝ, යොග, උපාදන ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යි ෂොඩශක දශයෙකි. සූතුරු එක්සියසැටෙකි.

### ඉද්ධිපාදසංයුත්තය නිමියේය.

**එහි වර්ගනාමාවලිය:**

චාපාල, පාසාදකම්පන, අයොගුළ යන මොහු ගඞ්ගාපෙය්‍යාල ආදි පස සමග ඉද්ධිපාද සංයුත්තයෙහි වර්ග අටෙක් වේ.

# 8. අනුරුද්ධසංයුත්තං

## 1. රහොගතවග්ගො

### 8. 1. 1

### රහොගතසුත්තං

3611. එකං සමයං ආයස්මා අනුරුද්ධො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මතො අනුරුද්ධස්ස රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ‘‘යෙසං කෙසඤ්චි චත්තාරො සතිපට්ඨානා විරද්ධා, විරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි චත්තාරො සතිපට්ඨානා ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී’’ති.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මතො අනුරුද්ධස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං ආයස්මතො අනුරුද්ධස්ස පමුඛෙ පාතුරහොසි. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: ‘‘කිත්තාවතා නු ඛො ආවුසො අනුරුද්ධ භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා ආරද්ධා හොන්ති’’ති ඉධාවුසො භික්ඛු අජ්ඣත්තං කායෙ සමුදයධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අජ්ඣත්තං කායෙ වයධම්මානු-පස්සී විහරති, –පෙ– අජ්ඣත්තං කායෙ සමුදයවයධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. බහිද්ධා කායෙ සමුදයධම්මානුපස්සී විහරති –පෙ– බහිද්ධා කායෙ වයධම්මානුපස්සී විහරති –පෙ– බහිද්ධා කායෙ සමුදයවයධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා-දොමනස්සං. අජ්ඣත්තබහිද්ධා කායෙ සමුදයධම්මානුපස්සී විහරති –පෙ– අජ්ඣත්තබහිද්ධා කායෙ වයධම්මානුපස්සී විහරති –පෙ– අජ්ඣත්තබහිද්ධා කායෙ සමුදයවයධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

Free Distribution www.aathaapi.org

# 8. අනුරුද්ධ සංයුත්තය

## 1. රහොගතවර්ගය

### 8. 1. 1

### රහොගත සූත්‍රය

3611. එක්කලෙක ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ සැවත සමීපයෙහි අනේපිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩවෙසෙති. එකල්හි රහොගතව එකලාව සිටි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය: ''යම් කෙනකුන් විසින් සිවු සිව්වටන් වරදවන ලද්ද, මැනවින් දුක් ගෙවීමට පමුණුවන අරිමග ඔවුන් විසින් වරදවන ලදී. යම් කෙනෙකුන් විසින් සිවු සිවටන් අරඹන ලද්ද මැනවින් දුක් ගෙවීමට පමුණුවන අරිමග ඔවුන් විසින් අරඹන ලදී''යි.

එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ගේ චිත්තපරිවිතර්කය සිය සිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් ඉදිරියෙහි පහළවූහ. එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙය වදළහ: ''ඇවැත්නි අනුරුද්ධයෙනි, කෙතෙකින් මහණහුගේ සිවු සිවටන් පිරිපුන් වේ දැ''යි. ඇවැත්නි, මෙසසුන්හි මහණ සිය කයෙහිත් හටගැනුම් ස්වභාව අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කායලොකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. සිය කයෙහි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සිය කයෙහි හටගැනුම් වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව කායලොකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මෙරමා කයෙහි හටගැනුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා කයෙහි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා කයෙහි හටගැනුම් වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කායලොකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. තමාගේ හා මෙරමාගේ කයෙහි හටගැනුම් ස්වභාව අනු ව දක්නාසුලු ව .. වෙසේ. තමාගේ හා මෙරමාගේ කයෙහි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. තමාගේ හා මෙරමාගේ කයෙහි හටගැනුම් වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කායලොකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

සො සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ පටිකූල[1]සඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලඤ්ච පටිකූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති, උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො.

අජ්ඣත්තං වෙදනාසු සමුදයධම්මානුපස්සී විහරති. -පෙ- අජ්ඣත්තං වෙදනාසු වයධම්මානුපස්සී විහරති. -පෙ- අජ්ඣත්තං වෙදනාසු සමුදයවයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා වෙදනාසු සමුදයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා වෙදනාසු වයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා වෙදනාසු සමුදයවයධම්මානුපස්සී විහරති. -පෙ- අජ්ඣත්තබහිද්ධා වෙදනාසු සමුදයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා වෙදනාසු වයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා වෙදනාසු සමුදයවයධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සො සචෙ ආකඞ්ඛති -පෙ- උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො.

අජ්ඣත්තං චිත්තෙ සමුදයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තං චිත්තෙ වයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තං චිත්තෙ සමුදයවයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා චිත්තෙ සමුදයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා චිත්තෙ වයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා චිත්තෙ සමුදයවයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා චිත්තෙ සමුදයධම්මානුපස්සී විහරති. -පෙ- අජ්ඣත්තබහිද්ධා චිත්තෙ වයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා චිත්තෙ සමුදයවයධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සො සචෙ ආකඞ්ඛති -පෙ- උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො.

1. අප්පටිකූලෙ පටිකූල - මජසං, සයා.

ඉදින් හේ නොපිළිකුල් අරමුණෙහි පිළිකුල් හැඟීම් ඇති ව වසන්නෙමි යි කැමති වේ නම් එහි පිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් පිළිකුල් අරමුණෙහි නොපිළිකුල් හැඟීම් ඇති ව වසන්නෙමි යි කැමති වේ නම් එහි නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් නොපිළිකුලෙහි ද පිළිකුලෙහි ද පිළිකුල් හැඟීම් ඇති ව වසන්නෙමි යි කැමති වේ නම් එහි පිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් පිළිකුලෙහි ද නොපිළිකුලෙහි ද නොපිළිකුල් හැඟීම් ඇති ව වසන්නෙමි යි කැමති වේ නම් එහි නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් පිළිකුලත් නොපිළිකුලත් යන දෙක දුරු කොට මැදහත් ව සිහි ඇති ව මනාදැනුම් ඇති ව වසන්නෙමියි කැමති වේ නම් එහි මැදහත් ව සිහි ඇති ව මනාදැනුම් ඇති ව වෙසේ.

සිය විඳුම්හි හටගැනුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සිය විඳුම්හි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සිය විඳුම්හි හටගැනුම් වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා විඳුම්හි හටගැනුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා විඳුම්හි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා විඳුම්හි හටගැනුම් වැනසුම ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සියමෙරමා විඳුම්හි හටගැනුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සියමෙරමා විඳුම්හි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සිය මෙරමා විඳුම්හි හටගැනුම් වැනසුම් සවභාව අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව විඳුම්ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඉදින් හෙතෙමේ ... කැමති වේ නම් එහි මැදහත් ව සිහි ඇති ව මනාදැනුම් ඇති ව වෙසේ.

සියසිත්හි හටගැනුම සවභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. සිය සිත්හි වැනසුම ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සියසිත්හි හටගැනුම් වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා සිත්හි හටගැනුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. මෙරමා සිත්හි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ මෙරමා සිත්හි හටගැනුම් වැනසුම් සවභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සියමෙරමා සිත්හි හටගැනුම් සවභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සිය මෙරමා සිත්හි වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව ... වෙසේ. සිය මෙරමා සිත්හි හටගැනුම් වැනසුම් ස්වභාව අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව සිත් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. හේ ඉදින් ... කැමති වේ නම් එහි මැදහත් ව සිහි ඇති ව මනාදැනුම් ඇති ව වෙසේ.

අජ්ඣත්තං ධම්මෙසු සමුදයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තං ධම්මෙසු වයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තං ධම්මෙසු සමුදයවයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා ධම්මෙසු සමුදයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා ධම්මෙසු වයධම්මානුපස්සී විහරති -පෙ- බහිද්ධා ධම්මෙසු සමුදයවයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු සමුදයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු වයධම්මානුපස්සී විහරති -පෙ- අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු සමුදයවයධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

සො සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලඤ්ච පටිකූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති උපෙක්ඛකො තත්‍ථ විහරති සතො සම්පජානො. එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා ආරද්ධා හොන්තීති.

## 8. 1. 2

## දුතිය රහොගතසුත්තං

3612. එකං සමයං ආයස්මා අනුරුද්ධො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මතො අනුරුද්ධස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යෙසං කෙසඤ්චි චත්තාරො සතිපට්ඨානා විරද්ධා, විරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි චත්තාරො සතිපට්ඨානා ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී"ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මතො අනුරුද්ධස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො -පෙ- එවමෙවං ආයස්මතො අනුරුද්ධස්ස සම්මුඛෙ පාතුරහොසි. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: "කිත්තාවතා නු ඛො ආවුසො අනුරුද්ධ, භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා ආරද්ධා හොන්තී"ති.

සිය නීවරණාදි දහම්හි හටගැනුම් ස්වභාව අනුව දක්නාසුලු ව වෙසේ. සියදහම්හි වැනසුම් ස්වභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. සිය දහම්හි හටගැනුම් වැනසුම් ස්වභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. මෙරමාගේ (නීවරණාදි) දහම්හි හටගැනුම් ස්වභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. මෙරමාදහම්හි වැනසුම් ස්වභාව අනුව දක්නාසුලු ව... වෙසේ. මෙරමා දහම්හි හටගැනුම් වැනසුම් ස්වභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. සියමෙරමා දහම්හි හටගැනුම් ස්වභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. සිය මෙරමා දහම්හි වැනසුම් ස්වභාව අනුව දක්නාසුලු ව ... වෙසේ. සියමෙරමා දහම්හි හටගැනුම් වැනසුම් ස්වභාව අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

හෙතෙමේ ඉදින් නොපිළිකුලෙහි පිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙමි යි කැමති වේ නම් එහි පිළිකුල් හැඟීම් ඇති ව වෙසේ, ඉදින් පිළිකුලෙහි නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහි නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් නොපිළිකුලෙහිත් පිළිකුලෙහිත් පිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහි පිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් පිළිකුලෙහිත් නොපිළිකුලෙහිත් නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහි නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසේ. ඉදින් නොපිළිකුලත් පිළිකුලත් යන එදෙක දුරු කොට මැදහත් ව සිහි ඇති ව මනා දැනුම් ඇති ව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහි මැදහත් ව සිහි ඇති ව වෙසේ. ඇවැත්නි, මහණහුගේ සිවු සිවටන්හු මෙතෙකින් පිරිපුන් වෙති යි.

## 8. 1. 2

## දුතිය රහොගත සූත්‍රය

3612. එක්කලෙක ආයුෂ්මත් **අනුරුද්ධතෙරණුවෝ** සැවත සමීපයෙහි **අනේපිඩුසිටුහුගේ දෙව්රම්හි** වැඩවෙසෙත්. එකල්හි එකලා වූ විවෙකයෙන් යුත් ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන්ට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය: "යම් කෙනකුන්ට සිවු සිවටන්හු වැරදුණාහු ද, මැනවින් දුක් ගෙවීමට පමුණුවන අරිමඟ ඔවුනට වැරදුණේ ය. යම් කිසි කෙනකුන්ට සිවු සිවටන්හු පිරිපුන් වෙද්ද, මැනවින් දුක් ගෙවීමට පමුණුවන අරිමඟ ඔවුනට පිරිපුන් වෙයි". එකල ආයුෂ්මත් **මහමුගලන්තෙරණුවෝ** ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන්ගේ චිත්තවිතර්කය සියසිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් ... එසෙයින් ම ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් ඉදිරියෙහි පහළ වූහ. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන්තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන්ට මෙය වදළහ: "ඇවැත්නි, අනුරුද්ධයෙනි, මහණහුගේ සිවු සිවටන්හු කෙතෙකින් පිරිපුන් වෙද්ද"යි.

ඉධාවුසො භික්ඛු අජ්ඣත්තං කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. බහිද්ධා කායෙ කායානුපස්සී විහරති ආතාපී -පෙ- අජ්ඣත්තබහිද්ධා කායෙ කායානුපස්සී විහරති ආතාපී -පෙ- අජ්ඣත්තං වෙදනාසු -පෙ- බහිද්ධා වෙදනාසු -පෙ- අජ්ඣත්තබහිද්ධා වෙදනාසු -පෙ- අජ්ඣත්තං චිත්තෙ -පෙ- බහිද්ධා චිත්තෙ -පෙ- අජ්ඣත්තබහිද්ධා චිත්තෙ -පෙ- අජ්ඣත්තං ධම්මෙසු -පෙ- බහිද්ධා ධම්මෙසු -පෙ- අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එත්තාවතා ඛො ආවුසො, භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා ආරද්ධා හොන්ති ති.

## 8. 1. 3

## සුතනුසුත්තං

3613. එකං සමයං ආයස්මා අනුරුද්ධො සාවත්ථියං විහරති සුතනුතීරෙ. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා අනුරුද්ධෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං: 'කතමෙසං ආයස්මා අනුරුද්ධො ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං[1] පත්තො'ති.

චතුන්නං ඛො අහං ආවුසො, සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. කතමෙසං චතුන්නං: ඉධාහං ආවුසො කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො අහං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. ඉමෙසඤ්ච පනාහං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා හීනං ධම්මං හීනතො අබ්භඤ්ඤාසිං, මජ්ඣිමං ධම්මං මජ්ඣිමතො අබ්භඤ්ඤාසිං; පණීතං ධම්මං පණීතතො අබ්භඤ්ඤාසින්ති.

1. මහාභිඤ්ඤත්තං - ස්‍යා, අට්ඨකථා.

ඇවැත්නි, මෙසස්නෙහි මහණ සියකයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනාදැනුම් ඇතිව සිහි ඇතිව කාය සම්ඛ්‍යාත ලොකයෙහි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මෙරමාකයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව ... වෙසේ. සියමෙරමාකයෙහි කය අනුව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇතිව ... වෙසේ. සියවිඳුම්හි ... මෙරමාවිඳුම්හි ... සිය මෙරමාවිඳුම්හි ... සියසිත්හි ... මෙරමාසිත්හි ... සියමෙරමාසිත්හි ... සියදහම්හි ... මෙරමාදහම්හි ... සියමෙරමාදහම්හි දහම් අනුව දක්නා-සුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි, මහණහුගේ සිවුසිවටන්හු මෙතෙකින් පිරිපුන් වෙති යි.

## 8. 1. 3

## සුතනු සූත්‍රය

3613. **එක්සමයෙක ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ සැවත සමීපයෙහි සුතනු ඉවුරෙහි** වැඩවෙසෙති. එකල බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කතාව කොට නිමවා එකත්පස්ව හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන්ට මෙය කීහ: ''කවර දහම් වැඩූ බැවින් බහුල කළ බැවින් ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ මහාභිඥ බවට පැමිණියාහු ද''යි.

ඇවැත්නි, මම සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෙමි. කවර සිවු සිවටන් ද යත්: ඇවැත්නි, මෙහි මම කායෙහි කය අනුව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙමි. වෙදනාවන්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව දහම් ලෙව් හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙමි. ඇවැත්නි, මේ සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම මහාභිඥ බවට පැමිණියෙමි. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් ම බහුල කළ බැවින් ම හීනදහම් හීන වීසින් දතිමි, මැදුම්දහම් මැදුම් වීසින් දතිමි, ප්‍රණීතදහම් ප්‍රණීත වීසින් දතිමි යි.

## 8. 1. 4

## කණ්ටකීසුත්තං

3614. එකං සමයං ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාමොග්ගල්ලානො සාකෙතෙ විහරන්ති කණ්ටකීවනෙ.[1] අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාමොග්ගල්ලානො සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතා යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා අනුරුද්ධෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: "සෙඛෙන[2] ආවුසො, අනුරුද්ධ, භික්ඛුනා කතමෙ ධම්මා උපසම්පජ්ජ විහාතබ්බා"ති.

සෙඛෙන ආවුසො සාරිපුත්ත, භික්ඛුනා චත්තාරො සතිපට්ඨානා උපසම්පජ්ජ විහාතබ්බා. කතමෙ චත්තාරො: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සෙඛෙන ආවුසො සාරිපුත්ත, භික්ඛුනා ඉමෙ චත්තාරො සතිපට්ඨානා උපසම්පජ්ජ විහාතබ්බා'ති.

## 8. 1. 5

## දුතිය කණ්ටකීසුත්තං

3615. අසෙඛෙන ආවුසො අනුරුද්ධ භික්ඛුනා කතමෙ ධම්මා උපසම්පජ්ජ විහාතබ්බා'ති. අසෙඛෙන ආවුසො සාරිපුත්ත, භික්ඛුනා චත්තාරො සතිපට්ඨානා උපසම්පජ්ජ විහාතබ්බා. කතමෙ චත්තාරො: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අසෙඛෙන ආවුසො සාරිපුත්ත, භික්ඛුනා ඉමෙ චත්තාරො සතිපට්ඨානා උපසම්පජ්ජ විහාතබ්බා'ති.

---

1. තිකණ්ටකීවනෙ - සීමු, සී 1, 2.
2. සෙක්ඛෙන - සයා.

## 8. 1. 4

## කණ්ටකී සූත්‍රය

3614. එක්කලෙක ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝත් ආයුෂ්මත් සැරියුත්තෙරණුවෝත් ආයුෂ්මත් මහමුගලන්තෙරණුවෝත් සාකෙතනුවර සමීපයෙහි කණ්ටකීවෙනෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත්තෙරණුවෝත් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝත් සවස්කල විවේකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කතාව කොට නිමවා එකත්පස් ව වැඩහුන්හ. එකත්පස් ව වැඩහුන් ආයුෂ්මත් සැරියුත්තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන්ට මෙය වදාළහ: ''ඇවැත්නි අනුරුද්ධයෙනි, සෙඛමහණ විසින් කවර දහම් උපයා ගෙන විසිය යුතුද''යි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, සෙඛමහණ විසින් සිවු සීවටන් උපයා ගෙන විසිය යුතුය. කවර සිවුසීවටන්හු ද යත්: ඇවැත්නි, මෙසස්නෙහි මහණ කයෙහි කය අනු ව දක්නා සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, සෙඛමහණ විසින් මේ සිවුසීවටන් උපයා ගෙන විසිය යුතු යි.

## 8. 1. 5

## දුතිය කණ්ටකී සූත්‍රය

3615. ඇවැත්නි අනුරුද්ධයෙනි, අසෙඛ (රහත්) මහණ විසින් කවර දහම් උපයා ගෙන විසිය යුතු දැයි? ඇවැත්නි සාරිපුත්තයෙනි, අසෙඛමහණ විසින් සිවු සීවටන් උපයා ගෙන විසිය යුතුය. කවර සිවු සීවටන්හු ද යත්: ඇවැත්නි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි සාරිපුත්ත-යෙනි, අසෙඛමහණ විසින් මේ සිවු සීවටන් උපයා ගෙන විසිය යුතු යි.

## 8. 1. 6

## තතිය කණ්ඩකීසුත්තං

**3616.** කතමෙසං ආයස්මා **අනුරුද්ධො** ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තොති? චතුන්නං ඛ්වාහං ආවුසො, සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. කතමෙසං චතුන්නං: ඉධාහං ආවුසො, කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛ්වාහං ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. ඉමෙසඤ්ච පනාහං ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා සහස්සං ලොකං අභිජානාමීති.

## 8. 1. 7

## තණ්හක්ඛයසුත්තං

**3617.** එකං සමයං ආයස්මා **අනුරුද්ධො** **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.** තත්‍ර ඛො ආයස්මා අනුරුද්ධො භික්ඛූ ආමන්තෙසි -පෙ- චත්තාරොමෙ ආවුසො සතිපට්ඨානා භාවිතා බහුලීකතා තණ්හක්ඛයාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: ඉධාවුසො, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ ඛො ආවුසො, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා තණ්හක්ඛයාය සංවත්තන්තීති.

## 8. 1. 8

## සලලාගාරසුත්තං

**3618.** එකං සමයං ආයස්මා **අනුරුද්ධො** **සාවත්ථියං** විහරති **සලලාගාරෙ.** තත්‍ර ඛො ආයස්මා අනුරුද්ධො -පෙ- එතදවොච: සෙය්‍යථාපි ආවුසො, ගඞ්ගානදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. අථ මහාජනකායො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය "මයං ඉමං ගඞ්ගානදිං පච්ඡානින්නං කරිස්සාම පච්ඡාපොණං පච්ඡාපබ්භාරන්ති. තං කිං මඤ්ඤථාවුසො, අපි නු සො මහාජනකායො ගඞ්ගානදිං පච්ඡානින්නං කරෙය්‍ය පච්ඡාපොණං පච්ඡාපබ්භාරන්ති. නො හෙතං ආවුසො. තං කිස්ස හෙතු: ගඞ්ගාවුසො නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. සා න සුකරා පච්ඡානින්නං කාතුං පච්ඡාපොණං පච්ඡාපබ්භාරං. යාවදෙව ච පන සො මහාජනකායො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සාති.

## 8. 1. 6

## කන්‍ටකී සූත්‍රය

3616. ආයුෂ්මත් අනුරුද්ධයෝ කවර දහම් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෝ ද යි. ඇවැත්නි, මම සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෙමි. කවර සිවු සිවටන් ද යත්: ඇවැත්නි, මෙහි මම කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙමි. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනාදැනුම් ඇතිව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙමි. ඇවැත්නි, මම මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෙමි. ඇවැත්නි, මම මේ සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් දහසක් ලොව වෙසෙසින් දනිමි යි.

## 8. 1. 7

## තණ්හක්ඛය සූත්‍රය

3617. එක්කලෙක ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ සැවත සමීපයෙහි අනේපිඩුසිටුහුගේ දෙව්රමෙහි වැඩවෙසෙති. එහිදී ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ භික්ෂූන් ඇමතූහ ... ඇවැත්නි, මේ සිවු සිවටන් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු තෘෂ්ණාක්‍ෂය පිණිස පවතිත්. කවර සිවු සිවටන් කෙනෙක් ද යත්: ඇවැත්නි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි, මේ සිවු සිවටන්හු වඩන ලදහු බහුල කරන ලදහු තෘෂ්ණාක්‍ෂය පිණිස පවතිත් යි.

## 8. 1. 8

## සලලාගාර සූත්‍රය

3618. එක්කලෙක ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ සැවත සමීපයෙහි සලලාගාරයෙහි වැඩවෙසෙති. එහිදී ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ ... මෙය වදාළහ: "ඇවැත්නි, යම් සේ ගඞ්ගානදී තොමෝ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, එකල්හි 'අපි මේ ගඞ්ගානදිය පැළදිගට නැමුණක් පැළදිගට නැඹුරු වූවක් පැළදිගට බර වූවක් කරන්නෙමු'යි උදලු පැසි ගෙන මහජනසමූහයා එන්නේ ය. ඇවැත්නි, ඒ කිමැයි හඟිවු ද? ඒ මහජනසමූහයා ගඞ්ගානදිය පැළදිගට නැමුණක් පැළදිගට නැඹුරු වූවක් පැළදිගට බර වූවක් කරන්නේ දැයි. ඇවැත්නි, මෙය නො වේ ම ය. ඒ කවර හෙයින යත්: ඇවැත්නි, ගඞ්ගානදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වෙයි. එය පැළදිගට නැමුණක් පැළදිගට නැඹුරු වූවක් පැළදිගට බර වූවක් කරන්නට සුකර නො වෙයි. හුදෙක් ඒ මහාජනසමූහයා වෙහෙසට විඩාවට බඳුන් වන්නේ යි.

එවමෙව ඛො ආවුසො, භික්ඛුං චත්තාරො සතිපට්ඨානෙ භාවෙන්තං චත්තාරො සතිපට්ඨානෙ බහුලීකරොන්තං රාජා[1] වා රාජමහාමත්තා[2] වා මිත්තා වා අමච්චා වා ඤාතිසාලොහිතා වා භොගෙහි අභිහට්ඨුං පවාරෙය්‍යුං: ''හම්භො පුරිස, කිං තෙ ඉමෙ කාසාවා අනුදහන්ති. කිං මුණ්ඩො කපාලමනුසංචරසි. එහි හීනායාවත්තිත්වා භොගෙ භුඤ්ජස්සු පුඤ්ඤානි ච කරොහී''ති. සො වතාවුසො භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ භාවෙන්තො චත්තාරො සතිපට්ඨානෙ බහුලීකරොන්තො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සතීති[3], නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: ''යං හි[4] ආවුසො චිත්තං දීඝරත්තං විවෙකනින්නං විවෙකපොණං විවෙකපබ්භාරං. තං වත[5] හීනායාවත්තිස්සතී''ති නෙතං ඨානං විජ්ජති.

කථඤ්චාවුසො, භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ භාවෙති චත්තාරො සතිපට්ඨානෙ බහුලීකරොති: ඉධාවුසො, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො ආවුසො, භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ භාවෙති, චත්තාරො සතිපට්ඨානෙ බහුලීකරොතීති.

## 8. 1. 9

## අම්බපාලිසුත්තං

3619. එකං සමයං ආයස්මා ච අනුරුද්ධො, ආයස්මා ච සාරිපුත්තො වෙසාලියං විහරන්ති අම්බපාලිවනෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා අනුරුද්ධෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: ''විප්පසන්නානි ඛො තෙ ආවුසො අනුරුද්ධ ඉන්ද්‍රියානි, පරිසුද්ධො මුඛවණ්ණො පරියොදතො. කතමෙනායස්මා අනුරුද්ධො විහාරෙන එතරහි බහුලං විහරතී''ති.

---

1. රාජානො - මජ්සං.
2. මහාමත්තා - මජ්සං.
3. හීනාය සංවත්තිස්සති - සීමු, සී 2.
4. යං හි තං - මජ්සං.
5. තං වත - මජ්සං.

ඇවැත්නි, එසෙයින් ම සිවු සීවටන් වඩන සිවු සීවටන් බහුල කරන මහණහු රජෙක් හෝ රජු සම වූවෙක් හෝ මිතුරු කෙනෙක් හෝ ඇමති කෙනෙක් හෝ නෑ සහලේනෑ කෙනෙක් හෝ ''එම්බා පුරුෂය, කුමක් හෙයින් මේ කසාවත්හු තොපගේ (සිරුර) දවද්ද? කුමක් හෙයින් මුඩු ව කබලක් ගෙන හැසිරෙවු ද? එව ගිහි බවට පෙරළී භොගත් වළඳ ව පිනුත් කරව''යි භොගයන් එළවා පවරන්නාහු නම් ඇවැත්නි, සිවු සීවටන් වඩන සිවු සීවටන් බහුල කරන ඒ මහණ සික පිළිකෙවු කොට ගිහි බවට පෙරළෙන්නේය යන මෙකරුණ නැත. ඒ කවර හෙයින යත්: ''ඇවැත්නි, යම් සිතක් දිගුකලක් මුළුල්ලෙහි නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ නම් එය එසේ ලාමක බවට පෙරළෙන්නේ ය'' යන මෙකරුණ නැත.

ඇවැත්නි, කෙසේ නම් මහණ සිවු සීවටන් වඩා ද, සිවු සීවටන් බහුල කෙරේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව සිහි ඇති ව කාලෙව්හි දූඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දූඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි, මෙසේ මහණ සිවු සීවටන් වඩයි· සිවු සීවටන් බහුල කෙරේ යි.

## 8. 1. 9

## අම්බපාලි සූත්‍රය

3619. එක් සමයෙක ආයුෂ්මත් **අනුරුද්ධතෙරණුවෝත්** ආයුෂ්මත් **සැරියුත්තෙරණුවෝත් විසල්පුර** සමීපයෙහි වූ **අම්බපාලිවෙනෙහි** වැඩ-වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස් කල විවෙකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් අනුරුදුතෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරුදුතෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කතාව කොට නිමවා එකත්පසෙක වැඩහුන්හ. එකත්පසෙක වැඩහුන් ආයුෂ්මත් සැරියුත්තෙරණුවෝ ආයුෂ්මත් අනුරුදුතෙරණුවන්ට මෙය වදළහ: ''ඇවැත්නි, අනුරුද්ධයෙනි, ඔබගේ ඉඳුරෝ වෙසෙසින් පහන්හ. මුවපැහැය පිරිසුදු ය. හාත්පසින් බබළන්නේ ය. ආයුෂ්මත් අනුරුද්ධයෝ දැන් කවර විහරණයකින් යුතුව බහුල කොට වෙසෙද්ද''යි?

චතුසු ඛ්වාහං ආවුසො සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො[1] එතරහි බහුලං විහරාමි. කතමෙසු චතුසු: ඉධාහං ආවුසො, කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසු ඛ්වාහං ආවුසො චතුසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො එතරහි බහුලං විහරාමි. යො සො ආවුසො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තො, සො ඉමෙසු චතුසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො බහුලං විහරතීති. ලාභා වත නො ආවුසො, සුලද්ධං වත නො ආවුසො, යෙ මයං ආයස්මතො අනුරුද්ධස්ස සම්මුඛාව අස්සුම්හ ආසභිං වාචං භාසමානස්සාති.

## 8. 1. 10

## ගිලානසුත්තං

3620. එකං සමයං ආයස්මා අනුරුද්ධො සාවත්ථියං විහරති අන්ධවනස්මිං ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං: "කතමෙනායස්මතො අනුරුද්ධස්ස විහාරෙන විහරතො උප්පන්නා සාරීරිකා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨන්තී"ති.

චතුසු ඛො මෙ ආවුසො, සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තස්ස විහරතො උප්පන්නා සාරීරිකා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨන්ති. කතමෙසු චතුසු: ඉධාහං ආවුසො, කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසු ඛො මෙ ආවුසො, චතුසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තස්ස විහරතො උප්පන්නා සාරීරිකා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨන්තීති.

**රහොගතවග්ගො පඨමො.**

තස්සුද්දානං:

රහොගතෙනෙව ද්වෙ සුත්තනුකණ්ඩකී තයො,
තණ්හක්ඛයසලලාගාරෙ අම්බපාලිගිලානෙහීති.

1. සුපතිට්ඨිතචිත්තො - මජ්ඣං.

ඇවැත්නි, මම දූන් සිවු සීවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇතියෙම් බහුල කොට වෙසෙමි. කවර සිවු සීවටන්හි ද යත්: ඇවැත්නි, මෙහි මම කයෙහි කය අනු ව දක්නාසුල්ලෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනා දැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුල්ලෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් දහම්ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. ඇවැත්නි, මම දූන් මේ සිවු සීවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇතියෙම් බහුල කොට වෙසෙමි. ඇවැත්නි, ක්ෂය කළ ආශ්‍රව ඇති වැස නිම වූ බඹසර ඇති කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථ ඇති මුළුමනින් ගෙවූ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු යම් ඒ රහත්මහණෙක් වේ නම් හෙතෙමේ මේ සිවු සීවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව බහුල කොට වෙසේ යි. ඇවැත්නි, යම්බඳු අපි ආයුෂ්මත් අනුරුද්ධයන් සෙට වදන් බෙණෙද්දී ඉදිරියෙහි ම ඇසුමෝ ද ඇවැත්නි, ඒ අපට ලාභයෙකි. ඒ අපට මනා ලැබීමෙකි යි.

## 8. 1. 10

## ගිලාන සූත්‍රය

3620. එක්කලෙක ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ හටගත් ආබාධ ඇතියෝ දුකට පැමිණියෝ දැඩිසේ ගිලන් වූවෝ සැවත සමීපයෙහි අඳවෙනෙහි වැඩවෙසෙති. එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙය කීහ: ''කවර විහරණයකින් වෙසෙන ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන්ගේ හටගත් ශාරීරික දුක්වෙදනාවෝ සිත හාත්පසින් අල්ලා ගෙන නො සිටිද්ද''යි.

ඇවැත්නි, සිවු සීවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසෙන මාගේ උපන් ශාරීරික දුක්වෙදනාවෝ සිත හාත්පසින් අල්ලා ගෙන නො සිටිත්. කවර සිවු සීවටන්හි ද යත්: ඇවැත්නි, මෙහි මම කයෙහි කය අනු ව දක්නාසුල්ලෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුල්ලෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. ඇවැත්නි, මේ සිවු සීවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසෙන මාගේ හටගත් ශාරීරික දුක් වේදනාවෝ සිත හාත්පසින් අල්ලා ගෙන නො සිටිති යි.

**පළමුවැනි රහොගතවර්ගය යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

රහොගත නමින් ම දෙකෙකි. සුතනු නමින් එකෙකි. කණ්ටකී නමින් තුනෙකි. තණ්හක්ඛය, සලලාගාර, අම්බපාලි ගිලාන යි සතරෙකි යි. මුළුල්ල දශයෙකි යි.

# 2. සහස්සවග්ගො

## 8. 2. 1

### සහස්සසුත්තං

3621. එකං සමයං ආයස්මා අනුරුද්ධො සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා අනුරුද්ධෙන සද්ධිං සම්මොදිංසු -පෙ- ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං: ''කතමෙසං ආයස්මා අනුරුද්ධො ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො''ති. චතුන්නං ඛ්වාහං ආවුසො, සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. කතමෙසං චතුන්නං: ඉධා'හං ආවුසො කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛ්වාහං ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. ඉමෙසඤ්ච පනාහං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා කප්පසහස්සං අනුස්සරාමීති.

## 8. 2. 2

### ඉද්ධිවිධසුත්තං

3622. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොමි: ''එකො'පි හුත්වා බහුධා හොමි, බහුධා'පි හුත්වා එකො හොමි, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡාමි සෙය්‍යථාපි ආකාසෙ. පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොමි සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභෙජ්ජමානෙ ගච්ඡාමි සෙය්‍යථාපි පථවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමාමි සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවම්මහිද්ධිකෙ එවම්මහානුභාවෙ පාණිනා පරාමසාමි පරිමජ්ජාමි. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙමී''ති.

## 8. 2. 3

### දිබ්බසොතසුත්තං

3623. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාමි දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චාති.

# 2. සහස්ස වර්ගය

## 8. 2. 1

## සහස්ස සූත්‍රය

3621. එක්කලෙක ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ සැවත සමීපයෙහි අනේපිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩවෙසෙති. එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවන් සමග සතුටු වූහ ... ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙය කීහ: ''ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ කවර දහම් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෝ දැ''යි. ඇවැත්නි, සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෙමි. කවර සිවු සීවටන් ද යත්: ඇවැත්නි, මෙහි මම කයෙහි කය අනුව දක්නාසුල්ලෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුල්ලෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. ඇවැත්නි, මම මේ සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ බවට පැමිණියෙමි. තව ද ඇවැත්නි, මේ සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම කප් දහසක් සිහි කෙරෙමි යි.

## 8. 2. 2

## ඉද්ධිවිධ සූත්‍රය

3622. තව ද ඇවැත්නි. මේ සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම නන් වැදෑරුම් ඉදු කොටස් විඳිමි. ''එකෙක්ව ද බොහෝ අයුරු වෙමි. බොහෝ අයුරුව ද එකෙක් වෙමි. පළට බව මුවහ බව විඳිමි. බිතෙන් පිටට පව්රෙන් පිටට පව්වෙන් පිටට අහසෙහි මෙන් නොගැටෙමින් යෙමි. දියෙහි මෙන් පොළොවෙහිත් මතුවීම කිමිදීම කෙරෙමි. පොළොවෙහි මෙන් නොබිඳෙන දියෙහිත් යෙමි. පියාපත් ඇති ලිහිණියකු මෙන් අහසෙහිත් පළඟින් යුතුව ගමන් කෙරෙමි. මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනා ද අතින් පහස්මි. පිරිමදිමි. බඹලොව තෙක්දු කයින් වෙසඟි පවත්වමි''යි.

## 8. 2. 3

## දිබ්බසොත සූත්‍රය

3623. ඇවැත්නි, මේ සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම මිනිස්බැව් ඉක්මවා පැවති විශුද්ධ වූ දිව්‍යමය ශ්‍රොත්‍රධාතු-වෙන් දුර වූද ළඟ වූද දෙව් මිනිස් දෙ සද අසමි යි.

## 8. 2. 4

### චෙතොපරියසුත්තං

3624. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාමි. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාමි -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාමි. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාමී''ති.

## 8. 2. 5

### ඨානසුත්තං

3625. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාමීති.

## 8. 2. 6

### කම්මසුත්තං

3626. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාමීති.

## 8. 2. 7

### සබ්බත්ථගාමිනීසුත්තං

3627. ඉමෙසඤ්ච පනා'හං ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාමීති.

## 8. 2. 8

### අනෙකධාතුසුත්තං

3628. ඉමෙසඤ්ච පනා'හං ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාමීති.

## 8. 2. 9

### නානාධිමුත්තිකසුත්තං

3629. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාමීති.

## 8. 2. 4

## වෙනොපරිය සූත්‍රය

3624. ඇවැත්නි, මේ සිවු සිවටන්ම වැඩූ බැවින් බහුල කළ බැවින් මම පරසතුන්ගේ පරපුහුලන්ගේ සිත තමසිතින් පිරිසිඳ දනිමි. සරාග සිත හෝ සරාග සිතැයි දනිමි. වීතරාග සිත හෝ වීතරාග සිතැයි දනිමි....අවිමුත්ත සිත හෝ අවිමුත්ත සිතැ යි දනිමි. විමුක්ත සිත හෝ විමුක්ත සිතැ යි දනිමි යි.

## 8. 2. 5

## ඨාන සූත්‍රය

3625. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම කරුණ කරුණුවිසිනුත් නොකරුණ නොකරුණුවිසිනුත් තතු සේ දනිමි යි.

## 8. 2. 6

## කම්ම සූත්‍රය

3626. ඇවැත්නි, මේ සිවු සිවටන්ම වැඩූ බැවින් බහුල කළ බැවින් මම අතීතානාගතවර්තමානකර්‍මසමාදනයන්ගේ විපාකය කරුණු විසින් හෙතු විසින් තතු සේ දනිමි යි.

## 8. 2. 7

## සබ්බත්‍ථ සූත්‍රය

3627. ඇවැත්නි, මේ සිවු සිවටන්ම වැඩූ බැවින් බහුල කළ බැවින් මම සියලුගතිවලට පමුණුවන මඟ තතු සේ දනිමි යි.

## 8. 2. 8

## අනෙකධාතු සූත්‍රය

3628. ඇවැත්නි, මේ සිවු සිවටන්ම වැඩූ බැවින් බහුල කළ බැවින මේ නොයෙක් ධාතු නන් වැදෑරුම් ධාතුලොකය තතු සේ දනිමි යි.

## 8. 2. 9

## නානාධිමුත්තික සූත්‍රය

3629. ඇවැත්නි, මේ සිවු සිවටන්ම වැඩූ බැවින් බහුල කළ බැවින් මම සත්ත්වයන්ගේ හීනාදි නානාධිමුත්ති ඇති බව තතු සේ දනිමි යි.



Free Distribution www.aathaapi.org

## 8. 2. 10

### ඉන්ද්‍රියසුත්තං

3630. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාමීති.

## 8. 2. 11

### ඣානසුත්තං

3631. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං[1] වුට්ඨානං යථාභූතං පජානාමීති.

## 8. 2. 12

### පුබ්බෙනිවාසසුත්තං

3632. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: "එකම්පි ජාතිං -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමීති.

## 8. 2. 13

### දිබ්බචක්ඛුසුත්තං

3633. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාමීති

## 8. 2. 14

### ආසවක්ඛයසුත්තං

3634. ඉමෙසඤ්ච පනා'හං ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤාය සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති.

**සහස්සවග්ගො දුතියො.**

**තත්‍රුද්දානං:**

සහස්සං ඉද්ධිවිධං දිබ්බං චෙතොපරිය ඨානකම්මා,
සබ්බත්ථ නානාධධත්ථ මුත්තින්ද්‍රියං ඣානං තිස්සො විජ්ජාති.

**අනුරුද්ධසංයුත්තං සමත්තං.**

**තත්‍ර වග්ගුද්දානං:**

රහොගතො සහස්සාති ද්වෙව වග්ගා භවන්තිහි
අනුරුද්ධස්ස සංයුත්තෙ දෙසිතාදිච්චබන්ධුනාති.

---

1. ඔදනං - සීමු, සයා.

## 8. 2. 10

### ඉන්ද්‍රිය සූත්‍රය

3630. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් අන් සතුන්ගේ හා අන් පුහුලන්ගේ ඉඳුරන් පිළිබඳ වැඩීමත් පිරිහීමත් මම තතු සේ දනිමි යි.

## 8. 2. 11

### ඣාන සූත්‍රය

3631. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් ධ්‍යානවිමොක්ෂසමාධිසමාපත්තීන්ගේ කෙලෙසීමත් පිරිසිදුවීමත් නැගීසිටීමත් මම තතු සේ දනිමි යි.

## 8. 2. 12

### පුබ්බෙනිවාස සූත්‍රය

3632. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම නන් වැදෑරුම් පෙරවිසූ කඳපිළිවෙළ සිහි කෙරෙමි. එනම්: "ජාති එකක් ද ... මෙසේ අයුරු සහිත උදෙසුම් සහිත නන් වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙමි" යි.

## 8. 2. 13

### දිබ්බචක්ඛු සූත්‍රය

3633. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම මිනිසැස ඉක්ම පැවති වෙසෙසින් පිරිසුදු වූ දිවැසින් ... කම් වූ පරිදි පැමිණි සතුන් දනිමි යි.

## 8. 2. 14

### ආසවක්ඛය සූත්‍රය

3634. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම ආස්‍රව ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදම්යෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙමි යි.

**දෙවැනි සහස්සවර්ගය යි.**

**එහි සූත්‍රනාමමාලාව:**

සහස්ස, ඉද්ධිවිධ, දිබ්බසොත, චෙතොපරිය, ඨාන, කම්ම, සබ්බඤ්ඤ, නානාධාතු, නානාධිමුත්තික, ඉන්ද්‍රිය, ඣාන, පුබ්බෙනිවාස, දිබ්බචක්ඛු, ආසවක්ඛය යි තුදුස් සුතුරෙකි යි.

**අනුරුද්ධසංයුත්තය නිමියේ ය.**

**එහි වර්ගනාමාවලිය:**

රහොගත සහස්ස යි අනුරුද්ධ සංයුත්තයෙහි බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරන ලද වර්ග දෙකෙක් ම වේ යි.

# 9. ඣානසංයුත්තං

## 1. ගඞ්ගාපෙය්‍යාලවග්ගො

### 9. 1. 1–12

### පාචීනනින්නාදිසුත්තානි

**3635–3646. සාවත්ථියං:**

චත්තාරො'මෙ භික්ඛවෙ, ඣානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති, සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඣානා.

සෙය්‍යථා'පි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු චත්තාරො ඣානෙ භාවෙන්තො චත්තාරො ඣානෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු චත්තාරො ඣානෙ භාවෙන්තො චත්තාරො ඣානෙ බහුලීකරොන්තො නිබ්බාණනින්නො හොති නිබ්බාණපොණො නිබ්බාණපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි –පෙ– පඨමජ්ඣානං –පෙ– දුතියජ්ඣානං –පෙ– තතියජ්ඣානං –පෙ– චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු චත්තාරො ඣානෙ භාවෙන්තො චත්තාරො ඣානෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති –පෙ– නිබ්බානපබ්භාරොති.

(දුතියපාචීනනින්නාදයො'පි එවං විත්ථාරෙතබ්බා.)

**ගඞ්ගාපෙය්‍යාලවග්ගො පඨමො.**

**තත්‍රුද්දානං:**

ඡ පාචීනතො නින්නා–ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති–වග්ගො තෙන පවුච්චතීති.

# 9. ඣාන සංයුක්තය

## 1. ගඞ්ගාපෙය්‍යාල වර්ගය

### 9. 1. 1–12

### පාචීනනින්නාදි සූත්‍ර

3635–3646. සැවැත්නුවර–

මහණෙනි, මේ ධ්‍යාන සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කාමයෙන් වෙන්ව ම අකුසල්දහමින් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන ධ්‍යානයට එළඹ වෙසේ. විතර්ක විචාරයන් සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟ බැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන ධ්‍යානයට එළඹ වෙසේ. (යම් ධ්‍යානයකින්) ප්‍රීතිය දුරු කිරීමෙන් මැදහත් ව වෙසේද, සිහි ඇත්තේත් මනා නුවණ ඇත්තේත් කයින් සුවත් විඳීද, "මැදහත් ය, සිහි ඇත්තේ ය, සුව විහරණ ඇත්තේ ය" යි ආර්‍යයෝ ඒ යමකු ගැන කියත් නම් ඒ තෙවන ධ්‍යානයට එළඹ වෙසේ. සුවත් පැහීමෙන් දුකත් පැහීමෙන් පළමු ම සොම්නස්දොම්නසුන්ගේ අස්තගමයෙන් නොදුක් වූ නොසුව වූ උපෙක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසිදුබැව් ඇති සිවුවන ධ්‍යානයට එළඹ වෙසේ. මහණෙනි, මොහු සිවු ධ්‍යාන්හු යි.

මහණෙනි, යම්සේ ගඞ්ගානදී තොමෝ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ සිවු ධ්‍යාන් වඩන්නේ සිවු ධ්‍යාන් බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ. මහණෙනි, කෙසේ නම් මහණ සිවු ධ්‍යාන් වඩන්නේ සිවු ධ්‍යාන් බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ කාමයෙන් වෙන් ව ම ... පළමුවන ධ්‍යානට ... දෙවන ධ්‍යානට ... තෙවන ධ්‍යානට ... සිවුවන ධ්‍යානට පැමිණ වෙසේ. මහණෙනි, මෙසේ මහණ සිවු ධ්‍යාන් වඩනුයේ සිවු ධ්‍යාන් බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යි ... නිවනට බර වූයේ වේ යි.

(ද්‍විතීය පාචීනනින්නාදි සූත්‍ර ද මෙසේ විතර කට යුතු)

**පළමුවැනි ගඞ්ගාපෙයාලවර්ගය යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

පාචීනනින්නාසූත්‍ර සයෙකි. සමුද්දනින්නාසූත්‍ර ද සයෙකි. මේ ෂට්ක දෙක දොළොසෙක් වේ. එයින් වර්ගය යි කියනු ලැබේ යි.

## 2. අප්පමාදවග්ගො

### 9. 2. 1–10

### තථාගතාදිසුත්තානි

3647–3656. යාවතා භික්ඛවෙ, සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා –පෙ– බහුලීකරොතීති.

අප්පමාදවග්ගො දුතියො.

**තත්‍රුද්දානං:**

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසුරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 3. බලකරණීයවග්ගො

### 9. 3. 1–12

### බලාදිසුත්තානි

3657–3668. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කයිරන්ති –පෙ– බහුලීකරොතීති.

(විත්ථාරෙතබ්බං)

බලකරණීයවග්ගො තතියො.

**තත්‍රුද්දානං:**

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිනං
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

## 4. එසනාවග්ගො

### 9. 4. 1–40

### එසනාදිසුත්තානි

3669–3708. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො? කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා –පෙ– භාවෙතබ්බාති.

එසනාවග්ගො චතුත්ථො.

**තත්‍රුද්දානං:**

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො
ඛීලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාහි චාති.

# 2. අප්‍රමාදවර්ගය

## 9. 2. 1–10

## තථාගතාදි සූත්‍ර

3647–3656. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද සිවුපා වූ ද බහුපා වූ ද යම්තාක් සත්ත්වයෝ වෙද්ද ... බහුල කෙරේ යි.

**දෙවැනි අප්‍රමාදවර්ගය යි.**

**එහි සූත්‍රනාමමාලාව :**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්‍ථ යී දස සූතුරෙකි යි.

# 3. බලකරණීය වර්ගය

## 9. 3. 1–12

## බලාදි සූත්‍ර

3657–3668. මහණෙනි, යම් සේ යම් කිසි බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙද්ද ... බහුල කෙරේ යි.

(විතර කට යුතු)

**තෙවැනි බලකරණීයවර්ගය යි.**

**එහි සූත්‍රනාමමාලාව :**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යී සතෙකි. මෙස සූත්‍ර දෙකෙකි. නාවා, ආගන්තුක, නදී යී තුනෙකැ යි මුළුල්ල දෙළොසෙකියි.

# 4. එසනා වර්ගය

## 9. 4. 1–40

## එසනාදි සූත්‍ර

3669–3708. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක් ද යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි ... වැඩිය යුතුභ යි.

**සිවුවැනි එසනාවර්ගය යි.**

**එහි සූත්‍රනාමමාලාව:**

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛිල, මල, නීඝ, වේදනා, තණ්හා යී චතුෂ්ක දශයෙකි යි.

# 5. ඔඝවග්ගො

## 9. 5. 1–39

## ඔඝාදිසුත්තානි

3709–3747. චත්තාරො'මෙ භික්ඛවෙ, ඔඝා. කතමෙ චත්තාරො? කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො –පෙ– භාවෙතබ්බා'ති.

(විත්ථාරෙතබ්බං.)

## 9. 5. 40

## උද්ධම්භාගියසුත්තං

3748. පඤ්චිමානි භික්ඛවෙ උද්ධම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය චත්තාරො ඣානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි –පෙ– පඨමං ඣානං –පෙ– දුතියං ඣානං –පෙ– තතියං ඣානං –පෙ– චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය ඉමෙ චත්තාරො ඣානා භාවෙතබ්බා'ති.

ඔඝවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියා'ති.

ඣානසංයුත්තං සමත්තං.

තත්‍රවග්ගුද්දානං:

ගඞ්ගාපෙය්‍යාලොප්පමාදෙ බලකරණීයෙසනා
ඔඝොති පඤ්චව වග්ගා ඣානසංයුත්තකා සියුන්ති.

# 5. ඔඝ වර්ගය

## 9. 5. 1–39

## ඔඝාදි සූත්‍ර

3709–3747. මහණෙනි, මේ ඔඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: කාමෞඝ භවෞඝ දිට්ඨෞඝ අවිජ්ජෞඝ යි ... වැඩිය යුතුහ යි.

(විතර කට යුතු.)

## 9. 5. 40

## උද්ධම්භාගිය සූත්‍ර

3748. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසෙකි. කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යි. මහණෙනි, මොහු පස්වැ උද්ධම්භාගිය සංයොජනයෝ යි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් ප්‍රහාණය පිණිස සිවු ධ්‍යාන් වැඩිය යුතු. කවර සිවු ධ්‍යාන් ද යත්: මහණෙනි, මෙහි මහණ කාමයෙන් වෙන්ව ම ... පළමුවන ධ්‍යානට ... දෙවන ධ්‍යානට ... තෙවන ධ්‍යානට ... සිවුවන ධ්‍යානට පැමිණ වෙසෙයි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් පහ කරනු පිණිස මේ සිවු ධ්‍යාන් වැඩිය යුතු යි.

**ඔඝවර්ගය පස්වැනි යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

ඔඝ, යොග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යි චතුෂ්ක දශයෙකි යි.

**ධ්‍යාන සංයුක්තය නිමියේ ය.**

**එහි වර්ගනාමාවලිය :**

ගඞ්ගාපෙය්‍යාල, අප්පමාද, බලකරණීය, එසනා, ඔඝ යි ධ්‍යාන සංයුක්තයට අයත් වර්ග පසෙක් ම වන්නේ යි.

# 10. ආනාපානසංයුත්තං

## 1. ඒකධම්මවග්ගො

### 10. 1. 1

### ඒකධම්මසුත්තං

3749. සාවත්ථියං:

ඒකධම්මො භික්ඛවෙ, භාවිතො බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො. කතමො ඒකධම්මො: ආනාපානසති.[1] කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති, මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතො'ව අස්සසති. සතො පස්සසති. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති. රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති. සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.

1. ආනාපානස්සති - සයා.

# 10. ආනාපානසංයුත්තය

## 1. එකධම්මවර්ගය

### 10. 1. 1

### එකධම්ම සූත්‍රය

3749. සැවැත්නුවර:

මහණෙනි, එක් දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ මහත් ඵල මහානිසංස වේ. කවර එක් දහමෙක් ද යත්: ආනාපානසතිය යි. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ අරණකට ගියේ හෝ රැක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ පලක් බැඳ උඩුකය ඉදි කොට පිහිටුවා සිහිය අභිමුඛ කොට එළවා හිඳියි. හේ සිහි ඇතියේ ම ආශ්වාස කෙරෙයි. සිහි ඇතියේ ම ප්‍රශ්වාස කෙරෙයි. දිගු කොට හෝ ආශ්වාස කරනුයේ දිගු කොට ආශ්වාස කෙරෙමි යි දැනගනී. දිගු කොට හෝ ප්‍රශ්වාස කරනුයේ දිගු කොට ප්‍රශ්වාස කෙරෙමි යි දැනගනී. කෙටි කොට හෝ ආශ්වාස කරනුයේ කෙටි කොට ආශ්වාස කෙරෙමි යි දැනගනී. කෙටි කොට හෝ ප්‍රශ්වාස කරනුයේ කෙටි කොට ප්‍රශ්වාස කෙරෙමි යි දැනගනී. සියලු ආශ්වාසප්‍රශ්වාස කය මැනවින් දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ. සියලු ආශ්වාස-ප්‍රශ්වාස කය මැනවින් දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. කායසංස්කාර (ආශ්වාසප්‍රශ්වාස) සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මේ. කායසංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. ප්‍රීතිය මැනවින් දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. ප්‍රීතිය මැනවින් දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. සුවය මැනවින් දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. සුවය මැනවින් දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. චිත්තසංස්කාර (ප්‍රීතිසුඛ) මැනවින් දන්නාසුලු ව ආශ්වාස කරන්-නෙමියි හික්මේ. චිත්තසංස්කාර මැනවින් දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. චිත්තසංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මේ. චිත්තසංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. සිත මැනවින් දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. සිත මැනවින් දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. සිත වෙසෙසින් සතුටු කරවමින් ආශ්වාස කරන්නෙමියි හික්මේ. සිත වෙසෙසින් සතුටු කරවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. සිත අරමුණෙහි පිහිටුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මේ. සිත අරමුණෙහි පිහිටු-වමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. සිත මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මේ. සිත මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. අනිස අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. අනිස අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ.

විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

## 10. 1. 2

## බොජ්ඣඞ්ගසුත්තං

3750. සාවත්ථියං:

ආනාපානසති භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. ඉධ භික්ඛවෙ, භික්ඛු ආනාපානසතිසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං –පෙ– ආනාපානසතිසහගතං උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

## 10. 1. 3

## සුද්ධකසුත්තං

3751. සාවත්ථියං:

ආනාපානසති භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා –පෙ– පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

විරාගය අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. විරාගය අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. නිරොධය අනුව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. නිරොධය අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. නිවන අනුව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ යි.

## 10. 1. 2

## බොජ්ඣඞ්ග සූත්‍රය

3750. සැවැත්නුවර :

මහණෙනි, වඩන ලද බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙහි මහණ ආනාපානසිහිය සහගිය සතිසම්බොජ්ඣඞ්ගය විවෙකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරොධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට වඩයි ... ආනාපානසිහිය සහගිය උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය විවෙකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරොධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ යි.

## 10. 1. 3

## සුද්ධක සූත්‍රය

3751. සැවැත්නුවර :

මහණෙනි, වඩන ලද බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙහි මහණ අරණ්‍යකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ ... නිවන අනුව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ. නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද ආනාපානසතිය මහත් ඵල මහානිසංස වේ යි.

## 10. 1. 4

## ඵලසුත්තං

3752. ආනාපානසති භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. එවං භාවිතාය ඛො භික්ඛවෙ, ආනාපානසතියා එවං බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතර ඵලං පාටිකඞ්ඛං, දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති.

## 10. 1. 5

## දුතිය ඵලසුත්තං

3753. ආනාපානසති භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. එවං භාවිතාය ඛො භික්ඛවෙ, ආනාපානසතියා එවං බහුලීකතාය සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛා.

කතමෙ සත්තඵලා සත්තානිසංසා: දිට්ඨෙවධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙවධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, අථ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙවධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති. උපහච්ච පරිනිබ්බායී හොති. අසඞ්ඛාරපරිනිබ්බායී හොති. සසඞ්ඛාරපරිනිබ්බායී හොති. උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. එවං භාවිතාය ඛො භික්ඛවෙ, ආනාපානසතියා එවං බහුලීකතාය ඉමෙ සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛාති.

## 10. 1. 4

## ඵල සූත්‍රය

3752. මහණෙනි, ආනාපානසතිය වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙහි මහණ අරණකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. මහණෙනි, ආනාපානසතිය මෙසේ වඩන ලද්දී මෙසේ බහුල කරන ලද්දී මහත් ඵල මහානිසංස වේ. මහණෙනි, ආනාපානසතිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි ඵල දෙකින් එක්තරා ඵලයත් කැමති විය යුතු. දිටුදම්යෙහි ම රහත් බව හෝ උපාදාන ශෙෂ ව ඇති කල්හි අනාගැමි බව හෝ යි.

## 10. 1. 5

## දුතිය ඵල සූත්‍රය

3753. මහණෙනි, ආනාපානසතිය වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් ඵල මහානිසංස වේ. මහණෙනි, ආනාපානසතිය කෙසේ වඩන ලද්දී කෙසේ බහුල කරන ලද්දී මහත් ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ අරණකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ ... නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. මහණෙනි, ආනාපානසතිය මෙසේ වඩන ලද්දී මෙසේ බහුල කරන ලද්දී මහත් ඵල මහානිසංස වේ. මහණෙනි, ආනාපානසතිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි සත් පල කෙනෙක් සත් අනුසයෙ කෙනෙක් කැමති විය යුතුහ.

කවර සත්පල කෙනෙක් සත් අනුසස් කෙනෙක් ද යත්: දිටුදම්යෙහි ම පෙරාතුව රහත් බව ලබයි. ඉදින් දිටුදම්යෙහි ම පෙරාතුව රහත් බව නොලබා නම් එකල්හි මරණසමයෙහි රහත් බව ලබයි. ඉදින් දිටුදම්යෙහි ම පෙරාතුව රහත් බව නො ලබා නම් ඉදින් මරණසමයෙහි රහත් බව නො ලබා නම් එකල්හි පස් ඔරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් අන්තරාපරිනිබ්බායී වේ. උපහච්චපරිනිබ්බායී වේ. අසඞ්ඛාරපරිනිබ්බායී වේ. සසඞ්ඛාරපරිනිබ්බායී වේ. අකනිට්ඨගාමී උද්ධංසොත වේ. මහණෙනි, ආනාපානසතිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි මේ සත්පලයෝ මේ සත් අනුසස්හු කැමති විය යුතුහ යි.

## 10. 1. 6

## අරිට්ඨසුත්තං

3754. සාවත්ථියං:

භාවෙථ නො තුම්හෙ භික්ඛවෙ, ආනාපානසතින්ති. එවං වුත්තෙ ආයස්මා අරිට්ඨො භගවන්තං එතදවොච: "අහං ඛො භන්තෙ, භාවෙමි ආනාපානසතින්ති". යථා කථං පන ත්වං අරිට්ඨ, භාවෙසි ආනාපානසතින්ති. අතීතෙසු මෙ භන්තෙ, කාමෙසු කාමච්ඡන්දො පහීනො. අනාගතෙසු මෙ කාමෙසු කාමච්ඡන්දො විගතො. අජ්ඣත්තබහිද්ධා[1] ච මෙ ධම්මෙසු පටිඝසඤ්ඤා සුප්පටිවිනීතා. සො සතොව අස්සසාමි[2] සතො පස්සසාමි[3] එවං ඛො'හං භන්තෙ, භාවෙමි ආනාපානසතින්ති.

අත්ථෙසා අරිට්ඨ, ආනාපානසති, නෙසා නත්ථීති වදාමි. අපි ච අරිට්ඨ, යථා ආනාපානසති විත්ථාරෙන පරිපුණ්ණා හොති තං සුණාහි -පෙ- කථඤ්ච අරිට්ඨ, ආනාපානසති විත්ථාරතො පරිපුණ්ණා හොති: ඉධ අරිට්ඨ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං ඛො අරිට්ඨ, ආනාපානසති විත්ථාරෙන පරිපුණ්ණා හොතීති.

## 10. 1. 7

## කප්පිනසුත්තං

3755. සාවත්ථියං:

තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකප්පිනො භගවතො අවිදූරෙ නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අද්දසා ඛො භගවා ආයස්මා මහාකප්පිනං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: "පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතස්ස භික්ඛුනො කායස්ස ඉඤ්ජිතත්තං වා ඵන්දිතත්තං වා"ති. යද'පි මයං භන්තෙ, තං ආයස්මන්තං පස්සාම සඞ්ඝමජ්ඣෙ වා නිසින්නං එකං වා රහො නිසින්නං තද'පි මයං තස්ස ආයස්මතො න පස්සාම කායස්ස ඉඤ්ජිතත්තං වා ඵන්දිතත්තං වාති.

1. අජ්ඣත්තං බහිද්ධා - සතා.
2. අස්සසිස්සාමි - මජ්ඣං, සතා, සිමු, අට්ඨකථා.
3. පස්සසිස්සාමි - මජ්ඣං, සතා, සිමු.

## 10. 1. 6

## අරිට්ඨ සූත්‍රය

3754. සැවැත්නුවර:

මහණෙනි, තෙපි ආනාපානසතිය වඩවු දැයි මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් අරිට්ඨ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, මම ආනාපානසතිය වඩමි''යි මෙය සැලකළහ. අරිට්ඨ, තෙපි කෙසේ නම් ආනාපානසතිය වඩවු දැයි. වහන්ස, ඉකුත් කාමයන්හි මාගේ කාමච්ඡන්දය ප්‍රහීණ වූයේ ය. මතු කාමයන්හි මාගේ කාමච්ඡන්දය පහ ව ගියේ ය. ආධ්‍යාත්මිකබාහිර ධර්‍මායතනයන්හි මාගේ ප්‍රතිඝසංඥාව ද සහමුලින් සිඳින ලද්දී ය. ඒ මම සිහි ඇති ව ම ආශ්වාස කරමි. සිහි ඇති ව ම ප්‍රශ්වාස කරමි. වහන්ස, මෙසේ මම ආනාපානසතිය වඩමි යි.

අරිට්ඨ, මෙබඳු ආනාපානසතියක් ඇත. මෙය නැතැයි නො කියමි. අරිට්ඨ, යම්සේ ආනාපානසතිය විතරවිසින් පිරිපුන් වේ නම් එය අසවු ... අරිට්ඨ, ආනාපානසතිය කෙසේ නම් විතර විසින් පිරිපුන් වේ ද යත්: අරිට්ඨ, මෙහි මහණ අරණකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ. අරිට්ඨ, මෙසේ ආනාපානසතිය විතර විසින් පිරිපුන් වේ යි.

## 10. 1. 7

## කප්පිනසූත්‍රය

3755. සැවැත්නුවර:

එසමයෙහි ආයුෂ්මත් මහාකප්පින තෙරණුවෝ පලක් බැඳ උඩුකය සෘජු කොට තබා සිහිය අභිමුඛ කොට එළවා ගෙන භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි වැඩහුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ උඩුකය සෘජු කොට තබා සිහිය අභිමුඛ කොට එළවා ගෙන නුදුරෙහි වැඩ හුන් ආයුෂ්මත් මහාකප්පින තෙරුන් දුටුසේකි. දැක භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, තෙපි මේ මහණහුගේ කයෙහි කම්පනයක් හෝ සැලීමක් හෝ දකිවු දැ''යි. වහන්ස, අපි යම් කලෙක සඟමැද හුන්නාවූ හෝ එකලා ව විවෙකී ව හුන්නා වූ හෝ ඒ ආයුෂ්මතුන් දක්නමෝ නම් එකලදු අපි ඒ ආයුෂ්මතුන්ගේ කයෙහි කම්පනයක් හෝ සැලීමක් හෝ නො දක්නමෝ යි.



Free Distribution www.aathaapi.org

යස්ස භික්ඛවෙ, සමාධිස්ස භාවිතත්තා බහුලීකතත්තා නෙව කායස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා, න චිත්තස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා තස්ස සො භික්ඛවෙ, භික්ඛු සමාධිස්ස නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. කතමස්ස ච භික්ඛවෙ, සමාධිස්ස භාවිතත්තා බහුලීකතත්තා නෙව කායස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා, න චිත්තස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා: ආනාපානසතිසමාධිස්ස භික්ඛවෙ, භාවිතත්තා බහුලීකතත්තා නෙව කායස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා. න චිත්තස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා.

කථං භාවිතෙ ච භික්ඛවෙ, ආනාපානසතිසමාධිම්හි කථං බහුලීකතෙ නෙව කායස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා න චිත්තස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතෙ ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධිම්හි එවං බහුලීකතෙ නෙව කායස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වා න චිත්තස්ස ඉඤ්ජිතත්තං වා හොති ඵන්දිතත්තං වාති.

## 10. 1. 8

## දීපසුත්තං

**3756.** සාවත්ථියං :

ආනාපානසතිසමාධි භික්ඛවෙ, භාවිතො බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො. කථං භාවිතො ච භික්ඛවෙ, ආනාපානසතිසමාධි කථං බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතො ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධි එවං බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො. අහම්පි සුදං භික්ඛවෙ, පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො ඉමිනා විහාරෙන බහුලං[1] විහරාමි. තස්ස මය්හං භික්ඛවෙ, ඉමිනා විහාරෙන බහුලං විහරතො නෙව කායො කිලමි[2]. න චක්ඛූනි, අනුපාදාය ච මෙ ආසවෙහි චිත්තං විමුච්චි.

1. බහුං - සී2.
2. කිලමති - මජ්ඣං - ස්‍යා.

මහණෙනි, යම් සමාධියක් වැඩූ බැවින් බහුල කළ බැවින් කයෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො වේ ද, සිතෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො වේ ද, මහණෙනි, ඒ මහණ ඒ සමාධිය කැමැති සේ ලබනසුල්ලෙක් නිදුකින් ලබනසුල්ලෙක් මහත් සේ ලබනසුල්ලෙක් වෙයි. මහණෙනි, කවර සමාධියක් වැඩූ බැවින් බහුල කළ බැවින් කයෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ ද යත්: සිතෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ ද යත්: මහණෙනි, ආනාපානසතිසමාධිය වැඩූ බැවින් බහුල කළ බැවින් කයෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වෙයි. සිතෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ.

මහණෙනි, ආනාපානසතිසමාධිය කෙසේ වැඩූ කල්හි කෙසේ බහුල කළ කල්හි කයෙහි කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ ද යත්: සිතේ කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ ද යත්: මහණෙනි, මෙහි මහණ අරනකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙයි. මහණෙනි, ආනාපානසතිසමාධිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි කයේ කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ. සිතේ කම්පනයෙක් හෝ සැලීමෙක් හෝ නො ම වේ යි.

## 10. 1. 8

## දීපසූත්‍රය

3756. සැවැත්නුවර:

මහණෙනි, ආනාපානසතිසමාධිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ මහත්ඵල මහානිසංස වේ. මහණෙනි, ආනාපානසති සමාධිය කෙසේ වඩන ලද්දේ කෙසේ බහුල කරන ලද්දේ මහත් ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙහි මහණ අරනකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. මහණෙනි, ආනාපානසති සමාධිය මෙසේ වඩන ලද්දේ මෙසේ බහුල කරන ලද්දේ මහත්ඵල මහානිසංස වේ. මහණෙනි, මම ද සම්බෝධියෙන් පෙර බුදුබවට නොපැමිණියෙම් බෝසත් වූයෙම් ම මේ විහරණයෙන් යුතු ව බහුලකොට විසුයෙමි. මහණෙනි, මේ විහරණයෙන් යුතු ව බහුල කොට වසෙන ඒ මාගේ කය නො ම ක්ලාන්ත විය. ඇස් නො ම ක්ලාන්ත විය. මාගේ සිත ද උපාදන රහිත ව ආස්‍රවයන්ගෙන් මිදුණේ ය.

තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි[1] ආකඞ්ඛෙය්‍ය: "නෙව මෙ කායො[2] කිලමෙය්‍ය න චක්ඛූනි, අනුපාදාය ච මෙ ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා"ති අයමෙව ආනාපානසතිසමාධි සාධුකං මනසිකාතබ්බො. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය: "යෙ මෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයෙය්‍යුන්ති". අයමෙව ආනාපානසති-සමාධි සාධුකං මනසිකාතබ්බො. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය: "අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති" අයමෙව ආනාපානසතිසමාධි සාධුකං මනසිකාතබ්බො. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය "පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති" අයමෙව ආනාපානසතිසමාධි සාධුකං මනසිකාතබ්බො. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය "අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති" අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය "පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූල-සඤ්ඤී විහරෙය්‍යන්ති" අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය: "අප්පටිකූලඤ්ච පටිකූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති" අයමෙව -පෙ-

තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය, "විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති" අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය: "විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති" අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය, "පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරෙය්‍යං සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙය්‍යං යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති" අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය, "සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති" අයමෙව -පෙ-

1. භික්ඛු චෙපි - මජසං, සහා.
2. කායොපි - සහා.

මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ "මාගේ කය නො ම ක්ලාන්ත වන්නේ නම් ඇස් නො ම ක්ලාන්ත වන්නේ නම් මාගේ සිත ද උපාදාන රහිත ව ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ආනාපානසති සමාධිය ම මැනවින් මෙනෙහි කළයුතු. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ, "මාගේ යම් පඤ්චකාමනිශ්‍රිත විතර්කයෝ වෙද්ද ඔහු ප්‍රහීණ වන්නාහු නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ආනාපානසති සමාධිය ම මැනවින් මෙනෙහි කළයුතු. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "නොපිළිකුලෙහි පිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ආනාපානසති සමාධිය ම මැනවින් මෙනෙහි කටයුතු. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "පිළිකුලෙහි නො පිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ආනාපානසති සමාධිය ම මැනවින් මෙනෙහි කටයුතු. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "නොපිළිකුලෙහි ද පිළිකුලෙහි ද පිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "පිළිකුලෙහි ද නොපිළිකුලෙහි ද නොපිළිකුල් හැඟීම් ඇති ව වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ-තෙමේත් "නොපිළිකුල ද පිළිකුල ද යන එදෙක දුරු කොට මැදහත් ව සිහි ඇති ව මනාදැනුම් ඇති ව වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ...

මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ "කාමයෙන් වෙන් ව ම අකුසල්දහමින් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දැහැනට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟ බැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දැහැනට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ"යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "ප්‍රීතියෙහි ද නොඇල්මෙන් මැදහත් ව සිහි ඇති ව මනාදැනුම් ඇති ව කයින් සුවත් විඳින්නෙම් නම් ආර්‍ය්‍යයෝ යමක් ගැන උපෙක්ෂා ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුවවිහරණ ඇත්තේ ය යි කියද්ද ඒ තෙවන දැහැනට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ" යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "සුවත් දුරු කිරීමෙන් දුකත් දුරුකිරීමෙන් පළමු ම සොම්නස්දොම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් නොදුක් වූ නොසුව වූ මැදහත් බැවින් හා සිහියෙන් හටගත් පිරිසුදු බැව් ඇති සිවුවන දැහැනට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ" යි කැමති වන්නේ නම් මේ ...

තස්මා තිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය: සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති අයමෙව -පෙ- තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති අයමෙව ආනාපානසතිසමාධි සාධුකං මනසිකාතබ්බො. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුපි ආකඞ්ඛෙය්‍ය: "සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති අයමෙව ආනාපානසතිසමාධි සාධුකං මනසිකාතබ්බො.

එවං භාවිතෙ ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධිම්හි එවං බහුලීකතෙ සුඛඤ්චෙ වෙදනං වෙදෙති සො අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති. දුක්ඛං චෙ වෙදනං වෙදෙති සො අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති. අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදෙති සො අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති. සො සුඛඤ්චෙ වෙදනං වෙදියති විසංයුත්තො නං වෙදියති. දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති විසංයුත්තො නං වෙදියති. අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති විසංයුත්තො නං වෙදියති. සො කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදනා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති පජානාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, තෙලඤ්ච පටිච්ච වට්ටිඤ්ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය, තස්සෙව තෙලස්ස ච වට්ටියා ච පරියාදනා අනාහාරො නිබ්බායෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදනා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති පජානාතීති.

මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් "රූපසංඥාවන් සර්වප්‍රකාරයෙන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥාවන් නොමෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත ය යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ-තෙමේත් ආකාසානඤ්චායතනය සර්වප්‍රකාරයෙන් ඉක්මවා විඥ්ඥාණය අනන්තය යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණතෙමේත් විඤ්ඤාණඤ්චායතනය සර්වප්‍රකාරයෙන් ඉක්මවා කිසිවක් නැතැ යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ යි කැමති වන්නේ නම් මේ ... මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් ආකිඤ්චඤ්ඤායතනය සර්ව ප්‍රකාරයෙන් ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙන්-නෙම් නම් මැනවැ යි කැමති වන්නේ නම් මේ ආනාපානසති සමාධිය ම මැනවින් මෙනෙහි කටයුතු. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ තෙමේත් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සර්වප්‍රකාර-යෙන් ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වෙසෙන්නෙම් නම් මැනවැ යි කැමතිවන්නේ නම් මේ ආනාපානසතිසමාධිය ම මැනවින් මෙනෙහි කටයුතු.

මහණෙනි, ආනාපානසතිසමාධිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි ඉදින් සුවවේදනාවක් විඳී නම් එය අනිසැ යි දනී. නො බැස ගන්නා ලද්ද යි දනී. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් පිළිගන්නට නොයුතු ය යි දනී. ඉදින් දුක්වෙදනාවක් විඳී නම් එය අනිසැ යි දනී. නො බැස ගන්නා ලද තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් පිළිගන්නට නොයුතු ය යි දනී. ඉදින් නොදුක්නොසුව වෙදනාවක් විඳී නම් එය අනිසැ යි දනී. නො බැස ගන්නා ලද්ද යි දනී. පිළිගන්නට නොයුතු ය යි දනී. ඉදින් හෙතෙමේ සුවවෙදනාවක් විඳී නම් (රාගානුසයාදියෙන්) වෙන් ව එය විඳී. ඉදින් දුක්වෙදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. ඉදින් නොදුක්නොසුවවෙදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. හෙතෙමේ කය කෙළවර කොට ඇති වෙදනාවක් විඳින්නේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දනී. දිවි කෙළවර කොට ඇති වෙදනාවක් විඳින්නේ දිවි කෙළවර කොට ඇති වෙදනාවක් විඳිමි යි දනී. කය බිඳීමෙන් දිවි ගෙවීමෙන් මතු සියලු වෙදනාවෝ නොපිළිගන්නා ලද්දහු මෙහි ම ලිහිල් වූවෝ වන්නාහ යි දනී. මහණෙනි, යම්සේ තෙලත් නිසා වැටියත් නිසා තෙල්පහන දල්වෙන්නේ ද, එ ම තෙලත් වැටියත් ගෙවීමෙන් ප්‍රත්‍යය රහිත ව නිවෙන්නේ ද මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ කය කෙළවර කොට ඇති වෙදනාවක් විඳින්නේ කය කෙළවර කොට ඇති වෙදනාවක් විඳිමියි දනී. දිවි කෙළවර කොට ඇති වෙදනාවක් විඳින්නේ දිවි කෙළවර කොට ඇති වෙදනාවක් විඳිමි යි දනී. කය බිඳීමෙන් දිවි ගෙවීමෙන් මතු සියලු වෙදනාවෝ නො පිළිගන්නා ලද්දහු මෙහි ම ලිහිල් වූවෝ වන්නාහ යි දනී-යි.

## 10. 1. 9

### අසුභසුත්තං

3757. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූනං අනෙකපරියායෙන අසුභකථං කථෙති. අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසති. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ‘‘ඉච්ඡාමහං භික්ඛවෙ, අඩ්ඪමාසං පතිසල්ලීයිතුං. නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනා’’ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සුධ කොචි භගවන්තං උපසඞ්කමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන.

අථ ඛො තෙ භික්ඛූ, භගවා අනෙකපරියායෙන අසුභකථං කථෙති. අසුභාය වණ්ණං භාසති. අසුභභාවනාය වණ්ණං භාසතීති අනෙකාකාරවොකාරං අසුභභාවනානුයොගමනුයුත්තා විහරන්ති. තෙ ඉමිනා කායෙන අට්ටීයමානා[1] හරායමානා ජිගුච්ඡමානා සත්ථහාරකං පරියෙසන්ති. දස'පි භික්ඛූ එකාහෙන සත්ථං ආහරන්ති. වීසතිම්පි භික්ඛූ එකාහෙන සත්ථං ආහරන්ති. තිංසම්පි භික්ඛූ එකාහෙන සත්ථං ආහරන්ති.

අථ ඛො භගවා තස්ස අඩ්ඪමාසස්ස අච්චයෙන පටිසල්ලානා වුට්ඨිතො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ‘‘කින්නු ඛො ආනන්ද, තනුභූතො විය භික්ඛුසඞ්ඝො’’ති. තථාහි පන භන්තෙ, භගවා භික්ඛූනං අනෙකපරියායෙන අසුභකථං කථෙති, අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසති. තෙ ච භන්තෙ, භික්ඛූ: ‘‘ ‘භගවා ඛො අනෙකපරියායෙන අසුභකථං කථෙති, අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසතී’ති අනෙකාකාරවොකාරං අසුභභාවනානුයොගමනුයුත්තා විහරන්ති. තෙ ඉමිනා කායෙන අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා සත්ථහාරකං පරියෙසන්ති. දස'පි භික්ඛූ එකාහෙන සත්ථං ආහරන්ති. වීසතිම්පි භික්ඛූ එකාහෙන සත්ථං ආහරන්ති. තිංසම්පි භික්ඛූ එකාහෙන සත්ථං ආහරන්ති. සාධු භන්තෙ, භගවා පරියායං[2] ආචික්ඛතු යථා'යං භික්ඛුසඞ්ඝො අඤ්ඤාය සණ්ඨහෙය්‍යා’’ති.

1. අට්ටීයමානා – සිමු, ස්‍යා.
2. අඤ්ඤං පරියායං – මජ්ඣං.

# 10. 1. 9

## අසුභ සූත්‍රය

3757. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීපයෙහි මහවෙනෙහි කූළාගේහල්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නන් අයුරෙන් භික්ෂූන්ට අසුභකථා වදරන සේක, අසුභයෙහි ගුණ කියන සේක, අසුභභාවනාවෙහි ගුණ කියන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, මම අඩමසක් එකලා ව වෙසෙන්නට කැමැති වෙමි. පිණ්ඩපාතය රැගෙන එන එකකු හැර අන් කිසිවකු විසින් නො එළඹිය යුත්තෙම් වෙමි"යි. එසේ ය වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී පිණ්ඩපාතය රැගෙන එන එක් මහණකු හැර අන් කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නො එළඹීණ.

එකල්හි ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේ නන් අයුරෙන් අසුභකථා වදරන සේක, අසුභයෙහි ගුණ කියන සේක, අසුභ භාවනාවෙහි ගුණ කියන සේකැ යි නොයෙක් කරුණෙන් ගැවසී ගත් අසුභභාවනාවෙහි යෙදුණාහු වෙසෙත්. ඔහු මෙකයින් පීඩිත-වන්නාහු ලජ්ජිත වන්නාහු පිළිකුල් උපදවන්නාහු දිවි ගැලවීමෙහි සමත් අවි සොයත්. දස මහණ කෙනෙක් ද එක්දවසින් දිවි ගලවත්. විසි මහණ කෙනෙක් ද එක්දවසින් දිවි ගලවත්. තිස් මහණ කෙනෙක් ද එක්දවසින් අවි ගනිත්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ අඩමස ඇවෑමෙන් විවෙක-යෙන් නැඟීසිටී සේක් ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූසේක: "ආනන්ද, කුමක් හෙයින් භික්සඝන තුනී වූවාක් මෙන් වේ ද"යි. වහන්ස, ඒ එසේ ම ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට නන් අයුරින් අශුභකථා වදරන සේක, අශුභයෙහි ගුණ වණන සේක, අශුභභාවනාවෙහි ගුණ වණන සේක. වහන්ස, ඒ භික්ෂූහු ද 'භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් අශුභකථා වදරන සේක, අශුභයෙහි ගුණ වණන සේක, අශුභභාවනාවෙහි ගුණ වණන සේකැ'යි නොයෙක් කරුණෙන් ගැවසුණු අශුභභාවනාවෙහි යෙදුණාහු වෙසෙත්. ඔහු මෙකයින් පීඩිත වන්නාහු ලජ්ජිත වන්නාහු පිළිකුල උපදවන්නාහු දිවි ගැලවීමෙහි සමත් අවි සොයත්. දස මහණ කෙනෙක් දු එක්දවසින් අවි ගනිත්. විසි මහණ කෙනෙක් දු එක් දවසින් අවි ගනිත්. තිස් මහණ කෙනෙක් දු එක් දවසින් දිවි ගලවත්. වහන්ස, යම්සේ මේ භික්ෂු සඞ්ඝයා රහත් බැව්හි පිහිටන්නේ නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු නයක් වදරන සේක් නම් මැනවි"යි.

තෙනහානන්ද යාවතිකා භික්ඛූ වෙසාලිං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙහීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යාවතිකා භික්ඛූ වෙසාලිං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "සන්නිපතිතො[1] භන්තෙ භික්ඛුසඞ්ඝො යස්සදානි භන්තෙ, භගවා කාලං මඤ්ඤසී"ති.

අථ ඛො භගවා යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "අයම්පි ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ ච පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති, වූපසමෙති, සෙය්‍යථාපි භික්ඛවෙ, ගිම්හානං පච්ඡිමෙ මාසෙ ඌහතං රජොජල්ලං, තමෙනං මහාඅකාලමෙඝො ඨානසො අන්තරධාපෙති, වූපසමෙති, එවමෙව ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ ච පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති, වූපසමෙති.

කථං භාවිතො භික්ඛවෙ, ආනාපානසතිසමාධි කථං බහුලීකතො, සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො, උප්පන්නුප්පන්නෙ ච පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො ච සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතො ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධි එවං බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ ච පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති, වූපසමෙතීති.

## 10. 1. 10

## කිම්බිලසුත්තං

3758. එකං සමයං භගවා කිම්බිලායං[2] විහරති වෙළුවනෙ. තත්‍ර ඛො භගවා ආයස්මන්තං කිම්බිලං ආමන්තෙසි: "කථං භාවිතො ඛො කිම්බිල, ආනාපානසතිසමාධි කථං බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසොති. එවං වුත්තෙ ආයස්මා කිම්බිලො තුණ්හී අහොසි. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං කිම්බිලං ආමන්තෙසි -පෙ- තතියතා ඛො භගවා ආයස්මන්තං කිම්බිලං ආමන්තෙසි: "කථං භාවිමෙපී ඛො කිම්බිල, ආනාපානසතිසමාධි කථං බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො"ති. තතියම්පි ඛො ආයස්මා කිම්බිලො තුණ්හී අහොසි.

1. සන්නිපාතිතො - සීමු.
2. කිම්මිලායං - මජ්ඣං, ස්‍යා.

Free Distribution www.aathaapi.org

ආනන්ද, එසේ වී නම් යම් තාක් භික්ෂූහු විසල්පුර ඇසුරු කොට වෙසෙත් ද ඒ සියල්ලන් උවටැන්හලෙහි රැස්කරව යි. එසේය වහන්සැ යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී යම් තාක් භික්ෂූහු විසල්පුර ඇසුරු කොට වෙසෙත් නම් ඒ සියල්ලන් උවටැන්හලෙහි රැස් කරවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ; ''වහන්ස, බික් සඟන තෙමේ රැස් වූයේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් යමකට කල් දන්නා සේක් නම් මැනවැ''යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උවටැන් හල වෙත එළඹි සේක. එළඹ පැන වූ අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, මේ ආනාපානසති සමාධිය ද වඩන ලද්දේ ශාන්ත ද ප්‍රණීත ද පියවින් මිහිරි ද සුවවිහරණයෙක් ද වේ. උපනුපන් ලාමක අකුසල්දහම් ද සැණෙකින් අතුරුදන් කෙරෙයි, සන්හිඳුවයි. මහණෙනි, යම්සේ ගිමන් සෙමෙහි පැසුළු (=ඇසළ) මස උඩ නැඟි රජස්දූලි වේ ද එය මහා අකල් වැස්ස සැණෙකින් අතුරුදන් කෙරෙයි, සන්හිඳුවයි. මහණෙනි, එසෙයින් ම ආනාපානසති සමාධිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ ශාන්ත ද ප්‍රණීත ද පියවින් මිහිරි ද සුව විහරණයෙක් ද වේ. උපනුපන් ලාමක අකුසල් දහමුදු සැණෙකින් අතුරුදන් කෙරෙයි සන්හිඳුවයි.

මහණෙනි, ආනාපානසති සමාධිය කෙසේ වඩන ලද්දේ කෙසේ බහුල කරන ලද්දේ ශාන්ත ද ප්‍රණීත ද පියවින් මිහිරි ද සුවවිහරණයෙක් ද වී උපනුපන් ලාමක අකුසල්දහමුදු සැණෙකින් අතුරුදන් කෙරේ ද, සන්හිඳුවා ද යත්: ''මහණෙනි, මෙසස්නෙහි මහණ අරනකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙ''මී යි හික්මෙයි. මහණෙනි, ආනාපානසති සමාධිය මෙසේ වඩන ලද්දේ මෙසේ පුනපුනා කරන ලද්දේ ශාන්තත් ප්‍රණීතත් පියවින් මිහිරිත් සුවවිහරණත් වෙයි. උපනුපන් ලාමක අකුසල්දහමුදු සැණෙකින් අතුරුදන් කෙරෙයි, සන්හිඳුවා යි.

## 10. 1. 10

## කිම්බිල සූත්‍රය

3758. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ කිම්බිලානුවර සමීපයෙහි වෙළුවනයෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් කිම්බිල තෙරුන් ඇමතූ සේක: ''කිම්බිල, කෙසේ වඩන ලද කෙසේ පුනපුනා කරන ලද ආනාපානසතිසමාධිය මහත්ඵල මහානිසංස වේ දැ''යි, මෙසේ වදළ කල්හි ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ නිහඬ වූහ. දෙවන වට දු භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් කිම්බිල තෙරුන් ඇමතූ සේක ... දෙවන වට දු ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ නිහඬ වූහ. තෙවන වට දු. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් කිම්බිල තෙරුන් ඇමතූ සේක: ''කිම්බිල, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසති සමාධිය මහත්ඵල මහානිසංස වේ දැ''යි. තෙවන වට දු ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ නිහඬ වූහ.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "එතස්ස භගවා කාලො, එතස්ස සුගත, කාලො, යං භගවා ආනාපානසති-සමාධිං භාසෙය්‍ය. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්ති''ති. තෙනහානන්ද, සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච: "කථං භාවිතො ච ආනන්ද, ආනාපානසතිසමාධි කථං බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො: ඉධානන්ද, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා –පෙ– පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතො ඛො ආනන්ද, ආනාපානසතිසමාධි එවං බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, කායෙ කායානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: කාය අඤ්ඤතරාහං ආනන්ද, එතං වදාමි යදිදං අස්සාසපස්සාසං. තස්මාතිහානන්ද, කායෙ කායානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී අස්ස-සිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, චිත්ත-සඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, වෙදනාසු වෙදනානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: වෙදනා අඤ්ඤතරාහං ආනන්ද, එතං වදාමි යදිදං අස්සාසපස්සා-සානං සාධුකං මනසිකාරං. තස්මාතිහානන්ද, වෙදනාසු වෙදනානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ: "යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ආනාපානසතිසමාධිය වදරන සේක් නම් භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහු නම් භාග්‍යවතුන් වහන්ස, එයට කාලය යි, සුගතයන් වහන්ස, එයට කාලය" යි. ආනන්ද, එසේ නම් අසව, මැනවින් මෙනෙහි කරව, කියන්නෙමි යි. වහන්ස, එසේ ය යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: "ආනන්ද, කෙසේ වඩන ලද කෙසේ පුනපුනා කරන ලද ආනාපානසතිසමාධිය මහත්ඵල මහානිසංස වේ ද යත්: ආනන්ද මෙසස්නෙහි මහණ අරනකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ ... නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙයි. ආනන්ද, මෙසේ වඩන ලද මෙසේ පුනපුනා කරන ලද ආනාපානසතියමාධිය මහත්ඵල මහානිසංස වේ.

ආනන්ද, යම් කලෙක මහණ දිගු කොට ආශ්වාස කරනුයේ දිගු කොට ආශ්වාස කෙරෙමි යි දනී ද, දිගු කොට ප්‍රශ්වාස කරනුයේ දිගු කොට ප්‍රශ්වාස කෙරෙමියි දනී ද, ලුහුඩු කොට ආශ්වාස කරනුයේ ලුහුඩු කොට ආශ්වාස කෙරෙමි යි දනී ද, ලුහුඩු කොට ප්‍රශ්වාස කරනුයේ ලුහුඩු කොට ප්‍රශ්වාස කෙරෙමි යි දනී ද, සියලු ආශ්වාසප්‍රශ්වාස කය දන්නාසුලු ව ආශ්වාස කරන්-නෙමි යි හික්මේ ද, සියලු ආශ්වාසප්‍රශ්වාස කය දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, කායසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, කායසංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද, මහණ තෙමේ එසමයෙහි කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: ආනන්ද, යම් ඒ අස්සාස පස්සාස වේ නම් මෙය (වායොකාය නම් වූ) එක්තරා කයෙකැ යි මම කියමි. ආනන්ද, එහෙයින් මෙහි ලා එසමයෙහි මහණ කයෙහි කය අනු ව, දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ.

ආනන්ද, යම් සමයෙක මහණ ප්‍රීතිය දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ප්‍රීතිය දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සුවය දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සුවය දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, චිත්තසංස්කාර දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, චිත්තසංස්කාර දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, චිත්තසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, චිත්තසංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද ආනන්ද, එසමයෙහි මහණ වෙදනාවන්හි වෙදනා අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව විඳුම් ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: ආනන්ද, ආශ්වාසප්‍රශ්වාසයන්ගේ යම් ඒ මැනවින් මෙනෙහි කිරීමෙක් වේ ද, මෙය සුව වෙදනා නම් වූ එක්තරා වෙදනාවකැ යි මම කියමි. ආනන්ද, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි වෙදනාවන්හි වෙදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව විඳුම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, චිත්තෙ චිත්තානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. තං කිස්ස හෙතු: නාහං ආනන්ද, මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපානසතිසමාධිභාවනං වදමි. තස්මාතිහානන්ද, චිත්තෙ චිත්තානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, ධම්මෙසු ධම්මානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. සො යං තං හොති අභිජ්ඣාදෙමනස්සානං පහානං, තං පඤ්ඤාය දිස්වා දිස්වා සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. තස්මාතිහානන්ද, ධම්මෙසු ධම්මානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං.

සෙය්‍යථාපි ආනන්ද; චාතුම්මහාපථෙ[1] මහාපංසුපුඤ්ජො. පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය සකටං වා රථො වා උපහනතෙව තං පංසුපුඤ්ජං. පච්ඡිමාය චෙ'පි දිසාය -පෙ- උත්තරාය චෙ'පි දිසාය -පෙ- දක්ඛිණාය චෙ'පි දිසාය ආගච්ඡෙය්‍ය සකටං වා රථො වා උපහනතෙව තං පංසුපුඤ්ජං. එවමෙව ඛො ආනන්ද, භික්ඛු කායෙ කායානුපස්සී විහරන්තො'පි උපහනතෙව පාපකෙ අකුසලෙ ධම්මෙ. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරන්තො'පි උපහනතෙව පාපකෙ අකුසලෙ ධම්මෙති.

## එකධම්මවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

එකධම්මො ච බොජ්ඣඞ්ගා සුද්ධකඤ්ච ද්වෙ ඵලා,
අරිට්ඨො කප්පිනො දීපො අසුභං කිම්බිලෙන චාති.

1. චතුමහාපථෙ - මජසං - සතා.

Free Distribution www.aathaapi.org

ආනන්ද, යම් සමයෙක මහණ සිත දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත දන්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත සතුටු කරවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත සතුටු කරවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත එකඟ කරමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත මුදවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද සිත මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද, එසමයෙහි මහණ සිත්හි සිත අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: ආනන්ද, මුළා සිහි ඇති මනාදැනුම් නැත්තහුට ආනාපානසතිසමාධිභාවනාවක් මම නො කියමි. ආනන්ද, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි සිත්හි සිත අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

ආනන්ද, යම් සමයෙක මහණ අනිස අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, අනිස අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, විරාගය අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද විරාගය අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, නිරොධය අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, නිරොධය අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, නිවන අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද, එසමයෙහි මහණ දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. දැඩිලොබ හා දොම්නස පිළිබඳ යම් ඒ ප්‍රහාණයෙක් වේ නම් හෙතෙමේ එය නුවණින් දැක දැක මැනවින් මැදහත් ව දක්නාසුලු වෙයි. ආනන්ද, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

ආනන්ද, යම්සේ සිවුමංසලක මහපස්පිඩෙක් වේ ද, ඉදින් පෙරදිගිනුදු ගැලෙක් හෝ රියෙක් හෝ එන්නේ නම් ඒ පස්පිඩ නසා ම ය. ඉදින් පැළදිගිනුදු ... ඉදින් උතුරුදිගිනුදු ... ඉදින් දකුණුදිගිනුදු ගැලෙක් හෝ රියෙක් හෝ එන්නේ නම් ඒ පස්පිඩ නසා ම ය. ආනන්ද, එසෙයින් ම මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව වෙසෙන්නේ ද ලාමක අකුසල් දහම් නසා ම ය. විඳුම්හි .. සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව වෙසෙන්නේ ද, ලාමක අකුසල් දහම් නසා මැ යි.

## පළමුවැනි එකධම්මවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය :**

එකධම්ම, බොජ්ඣඞ්ග, සුද්ධක යී සූත්‍ර තුනෙක් ද ඵලසූත්‍ර දෙකෙක් ද අරිට්ඨ, කප්පින, දීප, අසුභ, කිම්බිල යී පසෙක් ද යි මුළුල්ල දශයෙකි යි.

# 2. ආනන්ද වග්ගො

## 10. 2. 1

### ඉච්ඡානඞ්ගලසුත්තං

3759. එකං සමයං භගවා ඉච්ඡානඞ්ගලෙ[1] විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "ඉච්ඡාමහං භික්ඛවෙ, තෙමාසං පතිසල්ලීයිතුං. නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනා"ති. 'එවම්භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සුධ කොචි භගවන්තං උපසඞ්කමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන.

අථ ඛො භගවා තස්ස තෙමාසස්ස අච්චයෙන පටිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි: "සචෙ වො[2] භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං 'කතමෙන ආවුසො විහාරෙන සමණො ගොතමො වස්සාවාසං බහුලං විහාසී'ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ: 'ආනාපානසතිසමාධිනා ඛො ආවුසො, භගවා වස්සාවාසං බහුලං විහාසී'ති.

ඉධාහං භික්ඛවෙ, සතො අස්සසාමි, සතො පස්සසාමි. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාමි, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාමි -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති පජානාමි, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති පජානාමි. යං හි තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි බ්‍රහ්මවිහාරො ඉතිපි තථාගතවිහාරො ඉතිපි ආනාපානසතිසමාධිං සම්මාවදමානො වදෙය්‍ය, අරියවිහාරො ඉතිපි බ්‍රහ්මවිහාරො ඉතිපි තථාගතවිහාරො ඉතිපි.

යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති, තෙසං ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො ආසවානං ඛයාය සංවත්තති. යෙ ච ඛො තෙ භික්ඛවෙ, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤාවිමුත්තා, තෙසං ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො දිට්ඨධම්මසුඛවිහාරාය[3] චෙව සංවත්තති සතිසම්පජඤ්ඤාය ච. යං හි තං භික්ඛවෙ, සම්මාවදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි බ්‍රහ්මවිහාරො ඉතිපි තථාගතවිහාරො ඉතිපි ආනාපානසතිසමාධිං සම්මාවදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි බ්‍රහ්මවිහාරො ඉතිපි ථාගතවිහගාරො ඉතිපීති.

---

1. ඉච්ඡානඞ්කලෙ - සී 2.
2. ඛො - මජසං.
3. දිට්ඨෙව ධම්මෙ සුඛ විහාරාය - සීමු, සී 2.

# 2. ආනන්දවර්ගය

## 10. 2. 1

## ඉච්ඡානඞ්ගල සූත්‍රය

3759. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **ඉච්ඡානඞ්ගලනුවර** සමීපයෙහි **ඉච්ඡානඞ්ගලවනලැහැබෙහි** වැඩවසන සේක. එහි දී භාග්‍ය-වතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, මම තෙමසක් එකලා ව වෙසෙන්නට කැමැත්තෙමි. පිණ්ඩපාතය රැගෙන එන එකකු හැර අන් කිසිවකු විසින් නො එළඹිය යුත්තෙම් වෙමි''යි. එසේ ය වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී පිණ්ඩපාතය රැගෙන එන එක් මහණකු හැර අන් කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නො එළඹීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ තෙමස අයාමෙන් විවෙකයෙන් නැඟීසිටි සේක් භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජ්ජෝ: ''ඇවැත්නි, මහණ ගොයුම්හු ඇතුළුවස කවර විහරණයෙකින් යුතු ව බහුල කොට වුසූ දැ''යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජන්ට ''ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ආනාපානසතිසමාධියෙන් යුතු ව ඇතුළුවස බහුල කොට වුසූ සේකැ''යි මෙසේ පවසන්නාහු ය.

මහණෙනි, මෙහි මම සිහි ඇතියෙම් ආශ්වාස කරමි. සිහි ඇතියෙම් ප්‍රශ්වාස කරමි. දිගු කොට හෝ ආශ්වාස කරන්නෙම් දිගු කොට ආශ්වාස කරමි යි දනිමි දිගු කොට හෝ ප්‍රශ්වාස කරන්නෙම් දිගු කොට ප්‍රශ්වාස කරමි යි දනිමි ... නිවන අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි දනිමි. නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි දනිමි. මහණෙනි, මැනවින් කියන්නෙක් අරියවිහාර ය යි දු බ්‍රහ්මවිහාර ය යි දු තථාගතවිහාර ය යි දු ඒ යමකට කියන්නේ නම් මැනවින් කියන්නා ආනාපාන-සතිසමාධියට අරියවිහාර ය යි දු බ්‍රහ්මවිහාර ය යි දු තථාගතවිහාර ය යි දු කියන්නේ ය.

මහණෙනි, යම් ඒ මහණ කෙනෙක් ශෛක්‍ෂ්‍ය වූවාහු නො පැමිණි රහත් බැව් ඇත්තාහු අනුත්තර රහත් බව පතන්නාහු වෙසෙද් ද, ආනාපානසතිසමාධිය වඩනු ලද්දේ පුනපුනා කරන ලද්දේ ඔවුන්ගේ ආස්‍රවක්ෂය පිණිස පවතී. මහණෙනි, ක්‍ෂය කළ ආස්‍රව ඇති වැස නිම වූ බඹසර ඇති කළ සිවුමග කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇති ගෙවූ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු යම් ඒ රහත් මහණහු වෙද්ද, ආනාපානසතිසමාධිය වඩන ලද්දේ පුනපුනා කරන ලද්දේ ඔවුන්ට දිටුදැමියෙහි සුවවිහරණ පිණිසත් සිහි-නුවණ පිණිසත් පවතී. මහණෙනි, මැනවින් කියන්නෙක් අරියවිහාර ය යි දු බ්‍රහ්මවිහාරය යි දු තථාගත විහාරය යි දු ඒ යමකට කියන්නේ නම් මැනවින් කියන්නා ආනාපානසතිසමාධියට අරියවිහාර ය යි දු බ්‍රහ්මවිහාර ය යි දු තථාගතවිහාර ය යි දු කියන්නේ යි.



Free Distribution www.aathaapi.org

## 10. 2. 2

### කඞ්ඛෙය්‍යසුත්තං

3760. එකං සමයං ආයස්මා ලොමසවඞ්ගීසො[1] සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහානාමො සක්කො යෙනායස්මා ලොමසවඞ්ගීසො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ලොමසවඞ්ගීසං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො ආයස්මන්තං ලොමසවඞ්ගීසං එතදවොච. සො එව නු ඛො භන්තෙ, සෙඛො විහාරො සො තථාගතවිහාරො, උදාහු අඤ්ඤොව[2] සෙඛො විහාරො, අඤ්ඤො තථාගතවිහාරොති.

න ඛො ආවුසො මහානාම, ස්වෙව සෙඛො විහාරො, සො තථාගතවිහාරො. අඤ්ඤො ඛො ආවුසො මහානාම, සෙඛො විහාරො අඤ්ඤො තථාගතවිහාරො. යෙ තෙ ආවුසො මහානාම භික්ඛූ සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති, තෙ පඤ්ච නීවරණෙ පහාය විහරන්ති. කතමෙ පඤ්ච: කාමච්ඡන්දනීවරණං පහාය විහරන්ති. ව්‍යාපාදනීවරණං -පෙ- ථීනමිද්ධනීවරණං -පෙ- උද්ධච්චකුක්කුච්චනීවරණං -පෙ- විචිකිච්ඡානීවරණං පහාය විහරන්ති. යෙ තෙ ආවුසො මහානාම, භික්ඛූ සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති. තෙ ඉමෙ පඤ්ච නීවරණෙ පහාය විහරන්ති.

යෙ ච ඛො තෙ ආවුසො මහානාම, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤාවිමුත්තා, තෙසං පඤ්ච නීවරණා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, කතමෙ පඤ්ච: කාමච්ඡන්දනීවරණං පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං, ව්‍යාපාදනීවරණං -පෙ- ථීනමිද්ධනීවරණං -පෙ- උද්ධච්චකුක්කුච්චනීවරණං -පෙ- විචිකිච්ඡානීවරණං පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං.

1. ලොමසකඞ්ගියො - මජසං, ස්‍යා.
2. අඤ්ඤො - ස්‍යා.

## 10. 2. 2

## කඩ්ඪයා සූත්‍රය

3760. එක් සමයෙක ආයුෂ්මත් **ලොමසවඩ්ගීස තෙරණුවෝ** ශාක්‍ය දනව්වෙහි **කපිලවාස්තුපුර** සමීපයෙහි **නිග්‍රොධාරාමයෙහි** වැඩ-වෙසෙති. එකල **මහානාමශාක්‍ය** තෙමේ ආයුෂ්මත් **ලොමසවඩ්ගීස තෙරණුවන්** වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ලොමසවඩ්ගීස තෙරණුවන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් මහානාම ශාක්‍ය තෙමේ ආයුෂ්මත් ලොමසවඩ්ගීස තෙරණුවන්ට මෙය කීය: ''වහන්ස, සෙඛ විහාරයත් එය ම ද? තථාගතවිහාරයත් එය ම ද? නොහොත් සෙඛවිහාරය අනෙකෙක් ද? තථාගත විහාරය අනෙකෙක් දැ''යි.

ඇවැත්නි, මහානාම, එය ම සෙඛවිහාරයත් එය ම තථාගත-විහාරයත් නො ම වේ. ඇවැත්නි මහානාම, සෙඛවිහාරය අනෙකෙකි. තථාගතවිහාරය අනෙකෙකි. ඇවැත්නි, මහානාම, යම් ඒ ශෛක්‍ෂ භික්‍ෂූහු නො පැමිණි රහත්බැව් ඇත්තාහු අනුත්තර රහත්බව පතමින් වෙසෙද්ද, ඔහු පස් නිවරණ දුරු කොට වෙසෙත්. කවර පසක් ද යත්: කාමච්ඡන්ද නිවරණය දුරු කොට වෙසෙත්. ව්‍යාපාද නිවරණය ... ථිනමිද්ධ නිවරණය ... උද්ධච්චකුක්කුච්ච නිවරණය ... විචිකිච්ඡා නිවරණය දුරු කොට වෙසෙත්. ඇවැත්නි මහානාම, යම් ඒ ශෛක්‍ෂභික්‍ෂූහු නො පැමිණි රහත්බැව් ඇත්තාහු අනුත්තර වූ අර්හත්ත්වය පතමින් වෙසෙද්ද, ඔහු මේ පස් නිවරණ දුරු කොට වෙසෙති.

ඇවැත්නි මහානාම, ක්‍ෂය කළ ආශ්‍රව ඇති වැස නිම වූ බඹසර ඇති කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇති ගෙවූ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු යම් ඒ රහත් භික්‍ෂූහු වෙද්ද, ඔවුන් විසින් පස් නිවරණයෝ ප්‍රහීණයහ. උදුන්මුල්හ. හිස්සුන් තල්ගසක් මෙන් කරනලදහ. නැවත නොහටගන්නා බවට පමුණුවනලදහ. මතු නූපදනා ස්වභාව ඇතියහ. කවර පසෙක් ද යත්: කාමච්ඡන්දනිවරණය ප්‍රහීණ ය. උදුන්මුල් ය. හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දේ ය. නැවත නොහටගන්නා බවට පමුණුවන ලද්දේ ය. මතු නූපදනා ස්වභාව ඇත්තේ ය. ව්‍යාපාදනිවරණය ... ථිනමිද්ධ-නිවරණය ... උද්ධච්චකුක්කුච්චනිවරණය ... විචිකිච්ඡානිවරණය ප්‍රහීණ ය. උදුන්මුල් ය. හිස්සුන් තල්රුකක් මෙන් කරන ලද්දේ ය. නැවත නොහටගන්නා බවට පමුණුවන ලද්දේ ය. මතු නූපදනා ස්වභාව ඇත්තේ ය.

යෙ තෙ ආවුසො මහානාම, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤාවිමුත්තා. තෙසං ඉමෙ පඤ්ච නීවරණා පහීනා. උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තදමිනාපෙතං ආවුසො මහානාම, පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤොව සෙඛො විහාරො, අඤ්ඤො තථාගතවිහාරො.

එකමිදං[1] ආවුසො මහානාම, සමයං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තත්‍ර ඛො ආවුසො, භගවා[2] භික්ඛූ ආමන්තෙසි: ''ඉච්ඡාමහං භික්ඛවෙ, තෙමාසං පටිසල්ලීයිතුං, නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනා''ති. ''එවං භන්තෙ''ති ඛො ආවුසො, තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සු කොචි භගවන්තං උපසඞ්කමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන.

අථ ඛො ආවුසො, භගවා තස්ස තෙමාසස්ස අච්චයෙන පටිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි: සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: ''කතමෙනාවුසො, විහාරෙන සමණො ගොතමො වස්සාවාසං බහුලං විහාසී''ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ, ''ආනාපානසතිසමාධිනා ඛො ආවුසො, භගවා වස්සාවාසං බහුලං විහාසී''ති. ඉධාහං භික්ඛවෙ, සතො අස්සසාමි, සතො පස්සසාමි. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාමි. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාමි. -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති පජානාමි, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති පජානාමි. යං හි තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි, බ්‍රහ්මවිහාරො ඉතිපි, තථාගතවිහාරො ඉතිපි. ආනාපානසතිසමාධිං සම්මා වදමානො වදෙය්‍ය, අරියවිහාරො ඉතිපි, බ්‍රහ්මවිහාරො ඉතිපි, තථාගතවිහාරො ඉතිපි.

යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති. තෙසං ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො ආසවානං ඛයාය සංවත්තති. යෙ ච ඛො තෙ භික්ඛවෙ, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤාවිමුත්තා, තෙසං ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො දිට්ඨධම්මසුඛවිහාරාය චෙව සංවත්තති සතිසම්පජඤ්ඤාය ච.

1. එකමිදහං - සී 2.
2. ආවුසො මහානාම භගවා - මජසං.

ඇවැත්නි මහානාම, ක්ෂය කළ ආශ්‍රව ඇති, වැස නිම වූ බඹසර ඇති, කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති, පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇති, ක්ෂය වූ භවසංයෝජන ඇති, මැනවින් දැන මිදුණු යම් ඒ රහත් භික්ෂූහු වෙද්ද, ඔවුන් විසින් මේ පස් නීවරණයෝ ප්‍රහීණයහ. උදුන්මුල්හ. හිස්සුන් තල්ගසක් මෙන් කරනලදහ. නැවත නො හටගන්නා බවට පමුණුවන ලදහ. මතු නූපදනා ස්වභාව ඇතියහ. ඇවැත්නි මහානාම, යම්සේ සෙඛවිහාරය අනෙකෙක් ම වේ ද, තථාගතවිහාරය අනෙකෙක් ම වේ ද, ඒ මෙය මේ නයෙනුදු දතයුතු.

ඇවැත්නි මහානාම, එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානඞ්ගලනුවර ඉච්ඡානඞ්ගලවනලැහැබෙහි වැඩවසන සේක. ඇවැත්නි, එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, මම තෙමසක් එකලා ව වෙසෙන්නට කැමැත්තෙමි. පිණ්ඩපාතය රැගෙන එන එකකු හැර අන් කිසිවකු විසින් නො එළඹිය යුත්තෙම් වෙමි''යි. ඇවැත්නි, ''එසේ ය වහන්සැ'' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී පිණ්ඩපාතය රැගෙන එන එකකු හැර අන් කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නො එළඹිණි.

ඇවැත්නි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ තෙමස ඇවෑමෙන් විවෙකයෙන් නැඟීසිටි සේක් භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ ''ඇවැත්නි, මහණ ගොයුම්හු ඇතුළුවස කවර විහරණයෙකින් යුතු ව බහුල කොට වුසූ දැ''යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජන්ට ''ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ඇතුළුවස ආනාපානසතිසමාධියෙන් යුතු ව බහුල කොට විසූ සේකැ'' යි මෙසේ පවසන්නාහු ය. මහණෙනි, මෙහි මම සිහි ඇතියෙම් ආශ්වාස කෙරෙමි, සිහි ඇතියෙම් ප්‍රශ්වාස කෙරෙමි, දිගු කොට හෝ ආශ්වාස කරන්නෙම් දිගු කොට ආශ්වාස කෙරෙමි යි දනිමි, දිගු කොට හෝ ප්‍රශ්වාස කරන්නෙම් දිගු කොට ප්‍රශ්වාස කෙරෙමි යි දනිමි ... නිවන අනුව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි දනිමි. නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි දනිමි. මහණෙනි, මැනවින් කියන්නෙක් ඒ යමකට අරියවිහාරය යි දූ බ්‍රහ්මවිහාරය යි දූ තථාගතවිහාරය යි දූ කියන්නේ නම් මැනවින් කියන්නා ආනාපානසතිසමාධියට අරියවිහාරය යි දූ බ්‍රහ්මවිහාරය යි දූ තථාගතවිහාරය යි දූ කියන්නේ ය.

මහණෙනි, යම් ඒ ශෛක්‍ෂ්‍ය භික්ෂූහු නොපැමිණි රහත් බැව් ඇත්තාහු අනුත්තර නිවන පතමින් වෙසෙද්ද, ඔවුන් විසින් ආනාපානසතිසමාධිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ ආශ්‍රව ක්ෂය පිණිස පවතී. මහණෙනි, ක්ෂය කළ ආශ්‍රව ඇති, වැස නිම වූ බඹසර ඇති, කළ කටයුතු ඇති, බහා තැබූ බර ඇති, පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇති, ක්ෂය වූ භවසංයෝජන ඇති මැනවින් දැන මිදුණු යම් ඒ රහත් මහණහු වෙද්ද, ඔවුන් විසින් ආනාපානසතිසමාධිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ දිටුදැමියෙහි සුවවිහරණය පිණිසත් සිහිනුවණ පිණිසත් පවතී.

යං හි තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි, බ්‍රහ්මවිහාරො ඉතිපි, තථාගතවිහාරො ඉතිපි, ආනාපානසති-සමාධිං සම්මා වදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි, බ්‍රහ්මවිහාරො ඉතිපි, තථාගතවිහාරො ඉතිපීති. ඉමිනා ඛො එතං ආවුසො මහානාම, පරියායෙන වෙදිතබ්බං යථා අසෙක්ඛොව සෙඛො විහාරො, අසෙක්ඛො තථාගතවිහාරොති.

## 10. 2. 3

### ආනන්දසුත්තං

3761. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "අත්ථි නු ඛො භන්තෙ, එකො ධම්මො[1] භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති. සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තී''ති. "අත්ථි ඛො ආනන්ද, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති. චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති. සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තී''ති.

"කතමො පන භන්තෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති. සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තී''ති. ආනාපානසතිසමාධි ඛො ආනන්ද, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති. චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති. සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. කථං භාවිතො ච ආනන්ද, ආනාපානසතිසමාධි කථං බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති: ඉධානන්ද, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.

1. එකධම්මො - මජසං, සතා.

මහණෙනි, මැනවින් කියන්නෙක් ඒ සමකට අරියවිහාරය යි ද බ්‍රහ්මවිහාරය යි ද තථාගතවිහාරය යි ද කියන්නේ නම් මැනවින් කියන්නා ආනාපානසතිසමාධියට අරියවිහාරය යි ද බ්‍රහ්මවිහාරය යි ද තථාගතවිහාරය යි ද කියන්නේ යි. ඇවැත්නි මහානාම, යම්සේ සෙඛවිහාරය අනෙකෙක් ම වේ ද තථාගතවිහාරය අනෙකෙක් ම වේ ද මෙය මේ නයින් දතයුතු යි.

## 10. 2. 3

## ආනන්ද සූත්‍රය

3761. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, එක් දහමක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු දහම් කෙනකුන් පුරවා ද, සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහම් කෙනෙකුන් පුරවද්ද, සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහම් කෙනකුන් පුරවද්ද, එබඳු දහමෙක් ඇද්ද"යි. ආනන්ද, එක් දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු දහම් කෙනකුන් පුරවා ද, සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහම් කෙනකුන් පුරවද්ද, සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහම් කෙනකුන් පුරවද්ද, එබඳු දහමෙක් ඇත යි.

"වහන්ස, කවර එක් දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ (කවර) සිවු දහම් කෙනකුන් පුරවා ද, සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු (කවර) සත් දහම් කෙනකුන් පුරවත් ද, සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු කවර දෙ දහම් කෙනකුන් පුරවද්ද"යි. ආනන්ද, ආනාපානසතිසමාධි නම් එක් දහම වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු සීවටන් පුරවයි. සිවු සීවටන්හු වඩන ලදහු බහුල කරන ලදහු සත් බොජඞ පුරවත්. සත් බොජඞහු වඩන ලදහු බහුල කරන ලදහු විජ්ජාවිමුත්ති පුරවත්. ආනන්ද, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසතිසමාධිය සිවු සීවටන් පුරවා ද යත්: ආනන්ද, මෙසස්නෙහි මහණ අරනකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... තිවනා අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති -පෙ- සබ්බකායපටිසංවෙදී -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. කායෙ කායානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: කායඤ්ඤතරාහං ආනන්ද, එතං වදමි, යදිදං අස්සාසපස්සාසං. තස්මාතිහානන්ද, කායෙ කායානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති -පෙ- සුඛපටිසංවෙදී -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. වෙදනාසු වෙදනානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: වෙදනඤ්ඤතරාහං ආනන්ද, එතං වදමි යදිදං අස්සාසපස්සාසානං සාධුකං මනසිකාරං. තස්මාතිහානන්ද, වෙදනාසු වෙදනානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති -පෙ- අභිප්පමොදයං චිත්තං -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. චිත්තෙ චිත්තානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: නාහං ආනන්ද, මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපානසතිසමාධිභාවනං වදමි. තස්මාතිහානන්ද, චිත්තෙ චිත්තානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

ආනන්ද, යම් සමයෙක මහණ දිගු කොට හෝ ආශ්වාස කරනුයේ දිගු කොට ආශ්වාස කෙරෙමි යි දනී ද, දිගු කොට හෝ ප්‍රශ්වාස කරනුයේ දිගු කොට ප්‍රශ්වාස කෙරෙමි යි දනී ද ... සියලු ආශ්වාසප්‍රශ්වාසකය දන්නාසුලු ව ... කායසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, කායසංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද එසමයෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: ආනන්ද, යම් මේ ආශ්වාසප්‍රශ්වාස වේ ද, මෙය එක්තරා කයෙකැ යි මම කියමි. ආනන්ද, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

ආනන්ද, යම් සමයෙක මහණ ප්‍රීතිය දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද ... සුවය දන්නාසුලු ව ... චිත්තසංස්කාර දන්නාසුලු ව ... චිත්තසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, චිත්තසංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද එසමයෙහි මහණ වෙදනාවන්හි වෙදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව වෙදනාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: ආනන්ද, යම් මේ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ මැනවින් මෙනෙහි කිරීමෙක් වේ ද මෙය එක්තරා වෙදනාවෙකැ යි මම කියමි. ආනන්ද, එහෙයින් මෙසස්නෙහි මහණ එසමයෙහි වෙදනාවන්හි වෙදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව වෙදනාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

ආනන්ද, යම් සමයෙක මහණ සිත දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද ... සිත සතුටු කරවමින් ... සිත එකඟ කරමින් .... සිත මුදවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද, එසමයෙහි මහණ සිතෙහි සිත අනු ව දක්නා සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: ආනන්ද, මුළා සිහි ඇති මනාදැනුම් නැත්තහුට ආනාපානසති-සමාධිභාවනාවක් මම නො කියමි. ආනන්ද, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි සිත්හි සිත අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. ධම්මෙසු ධම්මානුපස්සී ආනන්ද, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. සො යං තං හොති අභිජ්ඣාදෙමනස්සානං පහානං තං පඤ්ඤාය දිස්වා දිස්වා සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. තස්මාතිහානන්ද, ධම්මෙසු ධම්මානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. එවං භාවිතො ඛො ආනන්ද, ආනාපානසතිසමාධි එවං බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති.

කථං භාවිතා ච ආනන්ද, චත්තාරො සතිපට්ඨානා කථං බහුලීකතා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති: යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු කායෙ කායානුපස්සී විහරති උපට්ඨිතා තස්ස[1] තස්මිං සමයෙ සති[2] හොති අසම්මුට්ඨා. යස්මිං සමයෙ ආනන්ද, භික්ඛුනො උපට්ඨිතා සති හොති අසම්මුට්ඨා, සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති පවිචරති පරිවීමංසමාපජ්ජති.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනාති. පවිචරති පරිවීමංසමාපජ්ජති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. තස්ස තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛුනො තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. විරියසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා.

1. උපට්ඨිතාස්ස - මජ්ඣං, ස්‍යා.
2. සමයෙ භික්ඛුනො සති - මජ්ඣං.

ආනන්ද, යම් සමයෙක මහණ අනිස අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද ... විරාගය අනුව දක්නාසුලු ව ... නිරොධය අනුව දක්නාසුලු ව ... නිවන අනුව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, ආනන්ද, එසමයෙහි මහණ දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. දැඩිලොබ හා දෙම්නස පිළිබඳ යම් ඒ ප්‍රහාණයෙක් වේ නම් හේ එය නුවණින් දැක දැක මැනවින් මැදහත් ව දක්නාසුලු වෙයි. ආනන්ද, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ආනන්ද, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද ආනාපානසතිසමාධිය සිවු සිවටන් පුරවයි.

ආනන්ද, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සිවු සිවටන්හු සත් බොජඟ පුරවද්ද යත්: ආනන්ද, යම් සමයෙක මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව වෙසේ ද එසමයෙහි ඔහුගේ සිහිය නුමුළා වූවා එළඹසිටියා වේ. ආනන්ද, යම් සමයෙක මහණහුගේ සිහිය නුමුළා වූවා එළඹ සිටියා වේ ද, එසමයෙහි මහණහු විසින් සතිසම්බොජ්ඣඞගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ සතිසම්බොජ්ඣඞගය වඩයි. එසමයෙහි මහණහුගේ සතිසම්බොජ්ඣඞගය වැඩීමෙන් පිරීමට යේ. හේ එසේ සිහි ඇති ව වෙසෙනුයේ ඒ දහම නුවණින් සොයයි පිරික්සයි විමසුමට පැමිණෙයි.

ආනන්ද, යම් සමයෙක මහණ එසේ සිහි ඇති ව වෙසෙනුයේ ඒ දහම නුවණින් සොයා ද පිරික්සා ද විමසුමට පැමිණේ ද, එසමයෙහි මහණහු විසින් ධම්මවිචයසම්බොජ්ඣඞගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ ධම්මවිචයසම්බොජ්ඣඞගය වඩයි. එසමයෙහි මහණහුගේ ධම්මවිචයසම්බොජ්ඣඞගය වැඩීමෙන් පිරීමට යේ. ඒ දහම නුවණින් සොයන පිරික්සන විමසුමට පැමිණෙන ඔහු විසින් ලීන නොවූ වැර අරඹන ලද්දේ වෙයි.

ආනන්ද, යම් සමයෙක ඒ දහම නුවණින් සොයන පිරික්සන විමසුමට පැමිණෙන මහණහු විසින් වැර අරඹන ලද්දේ ලීන නොවූයේ වේ ද, එසමයෙහි මහණහු විසින් විරියසම්බොජ්ඣඞගය අරඹන ලද්දේ වේ. එසමයෙහි මහණ විරියසම්බොජ්ඣඞගය වඩයි. එසමයෙහි මහණහුගේ විරියසම්බොජ්ඣඞගය වැඩීමෙන් පිරීමට යේ. පිරිපුන් වැර ඇත්තහුට නිරාමිස (පස්කම්සුවයෙන් තොර) ප්‍රීතිය උපදී.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛුනො ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා, පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පීතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. පීතිමනස්ස කායොපි පස්සම්භති. චිත්තම්පි පස්සම්භති.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛුනො පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛුනො පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති, සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සමාධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති, උපට්ඨිතා තස්ස තස්මිං සමයෙ සති හොති අසම්මුට්ඨා. යස්මිං සමයෙ ආනන්ද, භික්ඛුනො උපට්ඨිතා සති හොති අසම්මුට්ඨා, සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති -පෙ- සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති.

යස්මිං සමයෙ ආනන්ද, භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. එවං භාවිතා ඛො ආනන්ද, චත්තාරො සතිපට්ඨානා එවං බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති.

කථං භාවිතා ච ආනන්ද, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති: ඉධානන්ද, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො ආනන්ද, සත්තබොජ්ඣඞ්ගා එවං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්තීති.

ආනන්ද, යම් කලෙක පිරිපුන් වැර ඇති මහණහට නිරාමිස ප්‍රීතිය උපදී ද, එකල්හි මහණහු විසින් පීතිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එකල්හි මහණ පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි. එකල්හි මහණහුගේ පීතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ප්‍රීතසිත් ඇත්තහුගේ කයත් සන්හිඳේ. සිතත් සන්හිඳේ.

ආනන්ද, යම් සමයෙක ප්‍රීතසිත් ඇති මහණහුගේ කයත් සන්හිඳේ ද සිතත් සන්හිඳේ ද එසමයෙහි මහණහු විසින් පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. සන්හුන් කය ඇති සුව ඇත්තහුගේ සිත එකඟ වේ.

ආනන්ද, යම් සමයෙක සන්හුන් කය ඇති සුව ඇති මහණහුගේ සිත එකඟ වේ ද, එසමයෙහි මහණහු විසින් සමාධි-සම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ සමාධි-සම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. හේ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වෙයි.

ආනන්ද, යම් සමයෙක මහණ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වේ ද, එසමයෙහි මහණහු විසින් උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ.

ආනන්ද, යම් සමයෙක මහණ වෙදනායෙහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව වෙසේ ද, එසමයෙහි ඔහුගේ සිහිය එළඹ සිටියා නුමුළා වූවා වේ. ආනන්ද යම් සමයෙක මහණහුගේ සිහිය එළඹ සිටියා නුමුළා වූවා වේ ද, එසමයෙහි මහණහු විසින් සතිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ සතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ ... හෙතෙමේ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වෙයි.

ආනන්ද, යම් සමයෙක මහණ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වේ ද, එසමයෙහි මහණහු විසින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ-උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ආනන්ද, මෙසේ වඩන ලද මෙසේ පුනපුනා කරන ලද සිවු සිව්වටන්හු සත් බොජ්ඣඞ පුරවත්.

ආනන්ද, කෙසේ වඩන ලද කෙසේ පුනපුනා කරන ලද සත් බොජ්ඣඞු විජ්ජාවිමුත්ති පුරවද්ද යත්: ආනන්ද, මෙසස්නෙහි මහණ විවෙකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරොධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. ... විවෙකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරොධය ඇසුරු වූවක් නිවනට නැමෙන සුල්ලක් කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. ආනන්ද, මෙසේ වඩන ලද මෙසේ පුනපුනා කරන ලද සත් බොජ්ඣඞු විජ්ජාවිමුත්ති පුරවත් යි.

## 10. 2. 4

## දුතිය ආනන්දසුත්තං

3762. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච: අත්ථි නුඛො ආනන්ද, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති, සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තීති? භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- අත්ථානන්ද, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති. චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති. සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්ති.

කතමො ච ආනන්ද, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති. සත්ත ධම්මා භාවිතා බහුලීකතා. ද්වෙ ධම්මෙ පරිපූරෙන්ති: ආනාපානසතිසමාධි ආනන්ද, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. කථං භාවිතො චානන්ද, ආනාපානසතිසමාධි කථං බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති: ඉධානන්ද, භික්ඛු අරඤ්ඤගතො වා -පෙ- එවං භාවිතා ඛො ආනන්ද සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්තීති.

(යථා පුරිමසුත්තන්තො එවං විත්ථාරෙතබ්බො.)

## 10. 2. 5

## භික්ඛුසුත්තං

3763. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "අත්ථි නු ඛො භන්තෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති, සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තී"ති. "අත්ථි භික්ඛවෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති, සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තී"ති.

## 10. 2. 4

## දුතිය ආනන්ද සූත්‍රය

3762. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ආයුෂ්මත් **ආනන්ද තෙරණුවන්ට** භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: ආනන්ද, එක්දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු දහම් කෙනකුන් පුරවා ද, සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහම් කෙනකුන් පුරවද්ද, සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහම් කෙනකුන් පුරවද්ද, එබඳු දහමෙක් ඇද්ද යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... ආනන්ද එක්දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු දහම් කෙනකුන් පුරවා නම් සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහම් කෙනකුන් පුරවත් නම් සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහම් කෙනකුන් පුරවත් නම් එබඳු දහමෙක් ඇත.

ආනන්ද, කවර එක් දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු දහම් කෙනකුන් පුරවා ද, (කවර) සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහම් කෙනකුන් පුරවද් ද, (කවර) සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහම් කෙනකුන් පුරවද් ද යත්: ආනන්ද, ආනාපානසතිසමාධි වූ එක්දහම වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු සිවටන් පුරවයි. සිවු සිවටන්හු වඩන ලදහු බහුල කරන ලදහු සත් බොජඟ පුරවත්. සත් බොජඟහු වඩන ලදහු බහුල කරන ලදහු විජ්ජාවිමුත්ති පුරවත්. ආනන්ද, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසතිසමාධිය සිවු සිවටන් පුරවද්ද යත්: ආනන්ද, මෙහි මහණ අරනකට ගියේ හෝ ... ආනන්ද, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සත් බොජඟහු විජ්ජාවිමුත්ති පුරවත් යි.

(පළමු සුතුර මෙන් විතර කටයුතු.)

## 10. 2. 5

## භික්ඛු සූත්‍රය

3763. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "වහන්ස, එක් දහමෙක් වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු දහමක් පුරවා නම් සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහමක් පුරවත් නම් සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහමක් පුරවත් නම් එබඳු දහමෙක් ඇද්ද''යි. "මහණෙනි, එක් දහමෙක් වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු දහමක් පුරවා නම් සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සත් දහමක් පුරවත් නම් සත් දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු දෙ දහමක් පුරවත් නම් එබඳු දහමෙක් ඇතැ''**යි.**

කතමො භන්තෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති, සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තීති: ආනාපානසතිසමාධි ඛො භික්ඛවෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. කථං භාවිතො ච භික්ඛවෙ, ආනාපානසතිසමාධි කථං බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා -පෙ- එවං භාවිතා ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්තීති.

## 10. 2. 6

## දුතියභික්ඛුසුත්තං

**3764.** අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු -පෙ- එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: අත්ථි නු ඛො භික්ඛවෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති, සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්තීති. භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ- අත්ථි ඛො භික්ඛවෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති. සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්ති.

කතමො ච භික්ඛවෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො ධම්මෙ පරිපූරෙති, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සත්ත ධම්මෙ පරිපූරෙන්ති, සත්ත ධම්මා භාවිතා බහුලීකතා ද්වෙ ධම්මෙ පරිපූරෙන්ති: ආනාපානසතිසමාධි ඛො භික්ඛවෙ, එකො ධම්මො භාවිතො බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. කථං භාවිතො ච භික්ඛවෙ, ආනාපානසතිසමාධි කථං බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතොව අස්සසති, සතොව පස්සසති -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.

වහන්ස, කවර එක් දහමෙක් වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු දහමක් පුරවා ද? (කවර) සිවු දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු සත් දහමක් පුරවත් ද? (කවර) සත් දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු දෙ දහමක් පුරවද්ද යි. මහණෙනි, ආනාපානසතිසමාධි වූ එක්දහම වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු සීවටන් පුරවයි. සිවු සීවටන්හු වඩන ලද්හු බහුල කරන ලද්හු සත් බොජ්ඣගු පුරවත්. සත් බොජ්ඣගු වඩන ලද්හු බහුල කරන ලද්හු විජ්ජාවිමුත්ති පුරවත්. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද ආනාපානසතිසමාධි සිවු සීවටන් පුරවා ද යත්: මහණෙනි, මෙහි මහණ- අරනකට ගියේ හෝ ... මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සත් බොජ්ඣගු විජ්ජාවිමුත්ති පුරවත් යි.

## 10. 2. 6

## දුතිය භික්ඛු සූත්‍රය

3764. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: මහණෙනි, එක් දහමෙක් වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු දහමක් පුරවා නම් සිවු දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු සත් දහමක් පුරවත් නම් සත් දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු දෙදහමක් පුරවත් නම් එබඳු දහමෙක් ඇද්ද යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, එක් දහමෙක් වඩන ලදුයේ බහුල කරන ලදුයේ සිවු දහමක් පුරවා නම් සිවු දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු සත් දහමක් පුරවත් නම් සත් දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු දෙ දහමක් පුරවත් නම් එබඳු දහමෙක් ඇත.

මහණෙනි, කවර එක් දහමෙක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු දහමක් පුරවා ද, (කවර) සිවු දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු සත් දහමක් පුරවත් ද, (කවර) සත් දහම් කෙනෙක් වඩන ලද්හු බහුල කරන ලද්හු දෙ දහමක් පුරවද්ද යි. මහණෙනි, ආනාපානසතිසමාධි වූ එක් දහම වඩන ලද්දේ බහුල කරන ලද්දේ සිවු සීවටන් පුරවයි. සිවු සීවටන්හු වඩන ලද්හු බහුල කරන ලද්හු සත් බොජ්ඣග පුරවති. සත් බොජ්ඣග වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුත්ති පුරවයි. මහණෙනි, ආනාපානසතිසමාධි කෙසේ වඩන ලදුයේ කෙසේ බහුල කරන ලදුයේ සිවු සීවටන් පුරවා ද යත්: මහණෙනි, මෙහි මහණ අරනකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ පලක් බැඳ උඩුකය කෙළින් තබා සිහිය අභිමුඛ කොට එළවාගෙන හිඳගනී. හේ සිහි ඇතියේ ම ආශ්වාස කෙරෙයි. සිහි ඇතියේ ම ප්‍රශ්වාස කෙරෙයි ... නිවන අනුව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මෙයි. නිවන අනුව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙයි.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සං වා -පෙ- සබ්බකායපටිසංවෙදී -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. කායෙ කායානුපස්සී භික්ඛවෙ, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: කායඤ්ඤතරාහං භික්ඛවෙ, එතං වදමි යදිදං අස්සාසපස්සාසං. තස්මාතිහ භික්ඛවෙ, කායෙ කායානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති -පෙ- සුඛපටිසංවෙදී -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. වෙදනාසු වෙදනානුපස්සී භික්ඛවෙ, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: වෙදනාඤ්ඤතරාහං භික්ඛවෙ, එතං වදමි යදිදං අස්සාසපස්සාසානං සාධුකං මනසිකාරං. තස්මාතිහ භික්ඛවෙ, වෙදනාසු වෙදනානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති -පෙ- අභිප්පමොදයං චිත්තං -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. චිත්තෙ චිත්තානුපස්සී භික්ඛවෙ, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තං කිස්ස හෙතු: නාහං භික්ඛවෙ, මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපානසතිසමාධිභාවනං වදමි. තස්මාතිහ භික්ඛවෙ, චිත්තෙ චිත්තානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

මහණෙනි, යම් සමයෙක මහණ දිගු කොට හෝ ආශ්වාස කරනුයේ දිගු කොට ආශ්වාස කෙරෙමියි දනී ද, දිගු කොට හෝ ප්‍රශ්වාස කරනුයේ දිගු කොට ප්‍රශ්වාස කෙරෙමියි දනී ද, ලුහුඬු කොට හෝ ... සියලු ආශ්වාසප්‍රශ්වාස කය දන්නා සුලු ව ... කායසංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මේ ද, කායසංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, මහණෙනි, එසමයෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනාදැනුම් ඇතිව සිහි ඇති ව කාලෙච්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, යම් මේ ආශ්වාසප්‍රශ්වාස වේ ද, මෙය එක්තරා කයෙකැයි මම කියමි. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙච්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ.

මහණෙනි, යම් කලෙක මහණ ප්‍රීතිය දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද ... සුවය දන්නාසුලු ව ... චිත්තසංස්කාර දන්නාසුලු ව ... චිත්තසංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, චිත්තසංස්කාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, මහණෙනි, එසමයෙහි මහණ වෙදනාවන්හි වෙදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව විඳුම්ලෙච්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ යම් මේ මැනවින් මෙනෙහි කිරීමෙක් වේ ද, මෙය එක්තරා වෙදනාවකැ යි මම කියමි. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි වෙදනාවන්හි වෙදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව විඳුම්ලෙච්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි.

මහණෙනි, යම් සමයෙක මහණ සිත දන්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද ... සිත සතුටු කරවමින් ... සිත එකඟ කරමින් ... සිත මුදමින් ... ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද, සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ ද, මහණෙනි, එසමයෙහි මහණ සිත්හි සිත් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙච්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, මුළා සිහි ඇති මනා දැනුම් නැත්තහුට ආනාපානසතිසමාධි–භාවනාවක් මම නො කියමි. මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි සිත්හි සිත් අනු ව දක්නා සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙච්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. ධම්මෙසු ධම්මානුපස්සී භික්ඛවෙ, භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සො යං තං හොති අභිජ්ඣාදොමනස්සානං පහානං, තං පඤ්ඤාය දිස්වා සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. තස්මාතිහ භික්ඛවෙ, ධම්මෙසු ධම්මානුපස්සී භික්ඛු තස්මිං සමයෙ විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං භාවිතො ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධි එවං බහුලීකතො චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති.

කථං භාවිතා ච භික්ඛවෙ චත්තාරො සතිපට්ඨානා කථං බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති: යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති, උපට්ඨිතා තස්ස තස්මිං සමයෙ සති හොති අසම්මුට්ඨා. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො උපට්ඨිතා සති හොති අසම්මුට්ඨා, සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති පවිචරති පරිවීමංසමාපජ්ජති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති පවිචරති පරිවීමංසමාපජ්ජති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. තස්ස තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. විරියසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා. පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පීතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. පීතිමනස්ස කායො'පි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති.

මහණෙනි, යම් සමයෙක මහණ අනිත්‍යය අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමි යි හික්මේ ද ... විරාගය අනු ව දක්නාසුලු ව ... නිරොධය අනුව දක්නාසුලු ව ... නිවන අනු ව දක්නාසුලු ව ආශ්වාස කරන්නෙමියි හික්මේ ද, නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ ද, මහණෙනි, එසමයෙහි මහණ දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. හේ අභිජ්ඣා–දෙමනස්සයන්ගේ යම් ඒ ප්‍රහාණයෙක් වේ නම් එය නුවණින් දැක මැනවින් මැදහත් ව බලනසුලු වෙයි, මහණෙනි, එහෙයින් මෙහි ලා මහණ එසමයෙහි දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. මහණෙනි, ආනාපානසතිසමාධිය මෙසේ වඩන ලදුයේ මෙසේ පුනපුනා කරන ලදුයේ සිවු සිවටන් පුරවයි.

මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සිවු සිවටන්හු සත් බොජඟ පුරවත් ද යත්: මහණෙනි, යම් කලෙක මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව වෙසේ ද, එකල්හි මහණහුගේ සිහිය නුමුළා ව එළඹ සිටියා වෙයි. මහණෙනි, යම් කලෙක මහණහුගේ සිහිය නුමුළා ව එළඹ සිටියා වේ ද, එකල්හි මහණහු විසින් සතිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එකල්හි මහණ සතිසම්බොජ්ඣඞ්ගය වඩයි, එකල්හි මහණහුගේ සතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. හෙතෙමේ එසේ සිහි ඇති ව වෙසෙනුයේ ඒ දහම නුවණින් සොයයි, පිරික්සයි, විමසුමට පැමිණෙයි.

මහණෙනි, යම් සමයෙක මහණ එසේ සිහි ඇතිව වෙසෙනුයේ ඒ දහම නුවණින් සොයා ද, පිරික්සා ද, විමසුමට පැමිණේ ද, එසමයෙහි මහණහු විසින් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ඒ දහම නුවණින් සොයන පිරික්සන විමසුමට පැමිණෙන ඔහු විසින් වැර අරඹන ලද්දේ නො සැහවුනේ වෙයි.

මහණෙනි, යම් සමයෙක ඒ දහම නුවණින් සොයන පිරික්සන විමසුමට පැමිණෙන මහණහු විසින් වෙර අරඹන ලද්දේ නොසැහවුනේ වේ ද, එසමයෙහි මහණහු විසින් විරියසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වේ. එසමයෙහි මහණ විරියසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ විරියසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. පිරිපුන් වැර ඇත්තහුට නිරාමිස ප්‍රීතිය උපදී.

මහණෙනි, යම් සමයෙක පිරිපුන් වැර ඇති මහණහට නිරාමිස ප්‍රීතිය උපදී ද, එසමයෙහි මහණහු විසින් පීතිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ පීතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ප්‍රීතසිත් ඇත්තහුගේ කයත් සංසිඳෙයි. සිතත් සංසිඳෙයි.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පීතිමනස්ස කායො පි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති. සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සමාධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති. උපට්ඨිතා තස්ස තස්මිං සමයෙ සති හොති අසම්මුට්ඨා. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො උපට්ඨිතා සති හොති අසම්මුට්ඨා, සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති -පෙ- සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. එවං භාවිතා ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා එවං බහුලීකතා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති.

කථං භාවිතා ච භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්තීති.

මහණෙනි, යම් කලෙක ප්‍රීති සිත් ඇති මහණහුගේ කයත් සංසිඳේ ද සිතත් සංසිඳේ ද එසමයෙහි මහණහු විසින් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. සන්හුන් කය ඇති සුව ඇත්තහුගේ සිත එකඟ වේ.

මහණෙනි, යම් කලෙක සන්හුන් කය ඇති සුව ඇති මහණහුගේ සිත එකඟ වේ ද, එසමයෙහි මහණහු විසින් සමාධිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණතෙමේ සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. හෙතෙමේ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වෙයි.

මහණෙනි, යම් සමයෙක මහණ තෙමේ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වේ ද, එසමයෙහි මහණහු විසින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණතෙමේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ.

මහණෙනි, යම් කලෙක මහණ තෙමේ වෙදනාවන්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව වෙසේ ද, එසමයෙහි ඔහුගේ සිහිය නුමුළා ව එළඹ සිටියා වෙයි. මහණෙනි, යම් කලෙක මහණහුගේ සිහිය නුමුළා ව එළඹ සිටියා වේ ද, එසමයෙහි මහණහු විසින් සතිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ තෙමේ සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ සතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ ... හෙතෙමේ එසේ එකඟවූ සිත මැනවින් මැදහත් ව දක්නාසුලු වෙයි.

මහණෙනි, යම් සමයෙක මහණ තෙමේ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලනසුලු වේ ද, එසමයෙහි මහණහු විසින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය අරඹන ලද්දේ වෙයි. එසමයෙහි මහණ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. එසමයෙහි මහණහුගේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සිවු සිවටන්හු සත් බොජ්ඣඟ පුරවත්.

මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සත් බොජ්ඣඟු විජ්ජාවිමුත්ති පූරවත් ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමි කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. ... විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමි කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද බහුල කරන ලද සත් බොජ්ඣඟු විජ්ජාවිමුත්ති පූරවති යි.

## 10. 2. 7

### සංයොජනසුත්තං

**3765.** ආනාපානසතිසමාධි භික්ඛවෙ, භාවිතො බහුලීකතො සංයොජනප්පහානාය[1] සංවත්තති. කථං භාවිතො ච භික්ඛවෙ, ආනාපානසතිසමාධි කථං බහුලීකතො සංයොජනප්පහානාය සංවත්තති? ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතො ඛො භික්ඛවෙ, ආනාපානසතිසමාධි එවං බහුලීකතො සංයොජනප්පහානාය සංවත්තතීති.

## 10. 2. 8

### අනුසයසුත්තං

**3766.** ආනාපානසතිසමාධි භික්ඛවෙ -පෙ- අනුසයසමුග්ඝාතාය සංවත්තතීති.

## 10. 2. 9

### අද්ධානසුත්තං

**3767.** ආනාපානසතිසමාධි භික්ඛවෙ, -පෙ- අද්ධානපරිඤ්ඤාය සංවත්තතීති.

## 10. 2. 10

### ආසවක්ඛයසුත්තං

**3768.** ආනාපානසතිසමාධි භික්ඛවෙ, -පෙ- ආසවානං ඛයාය සංවත්තතීති.

(ඉමානි තීණි සුත්තානිපි යථා සංයොජනසුත්තං විත්ථාරෙතබ්බානි.)

### ආනන්දවග්ගො දුතියො.

**තත්‍රුද්දානං:**

ඉච්ඡානඞ්ගලං කඞ්ඛියාං ආනන්දෙන පරෙ දුවෙ
ද්වෙ භික්ඛු සංයොජනානුසයා අද්ධානමාසවක්ඛයොති.

### ආනාපානසංයුත්තං සමත්තං.

**තත්‍රවග්ගුද්දානං:**

එකධම්මො ආනන්දෙති ද්වෙව වග්ගා සුදෙසිතා
ආනාපානස්ස සංයුත්තෙ මුනිනා ධම්මසාමිනාති.

1. සංයොජනානං පහාණාය - සයා.

## 10. 2. 7.

### සංයොජන සූත්‍රය

3765. මහණෙනි, ආනාපානසතිසමාධිය වඩන ලද්දේ පුනපුනා කරන ලද්දේ සංයොජන ප්‍රහාණය පිණිස පවතී. මහණෙනි, ආනාපානසතිසමාධිය කෙසේ වඩන ලද්දේ කෙසේ බහුල කරන ලද්දේ සංයොජන ප්‍රහාණය පිණිස පවතී ද යත්: මහණෙනි, මෙහි මහණ අරණකට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස්ගෙයකට ගියේ හෝ ... නිවන අනු ව දක්නාසුලු ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. මහණෙනි, ආනාපානසතිසමාධිය මෙසේ වඩන ලද්දේ මෙසේ බහුල කරන ලද්දේ සංයොජන ප්‍රහාණය පිණිස පවතී යි.

## 10. 2. 8

### අනුසය සූත්‍රය

3766. මහණෙනි, ආනාපානසතිසමාධිය ... අනුසය නැසීම පිණිස පවතී යි.

## 10. 2. 9

### අද්ධාන සූත්‍රය

3767. මහණෙනි, ආනාපානසතිසමාධිය .. අදන් පිරිසිඳ දැනීම පිණිස පවතී යි.

## 10. 2. 10

### ආසවක්ඛය සූත්‍රය

3768. මහණෙනි, ආනාපානසතිසමාධිය ... ආශ්‍රවක්ෂය පිණිස පවතී යි.

(මේ තුන් සූතුර ද සංයොජන සූතුර මෙන් විතර කටයුතු.)

### දෙවැනි ආනන්ද වර්ග යි.

**එහි සූත්‍රනාමමාලාව :**

ඉච්ඡානඞ්ගල සඬ්ඛයා යී දෙසූතුරෙකි. ආනන්ද නමින් අනෙක් සූතුරු දෙකකි. භික්ඛු නමිනුදු සූතුරු දෙකෙකි. සංයොජන අනුසය අද්ධාන ආසවක්ඛය යී සිවු සූතුරෙකි යි මුළුල්ල දශයෙකි යි.

## ආනාපානසංයුත්තය නිමියේ ය.

**එහි වර්ග නාමාවලිය :**

ධම්සවාමී මුනින්ද්‍රයන් වහන්සේ විසින් ආනාපානසංයුත්තයෙහි එකධම්ම, ආනන්ද යි වර්ග දෙකෙක් ම මැනවින් දෙශනා කරන ලද යි.

# 11. සොතාපත්ති සංයුත්තං

## 1. වෙළුද්වාරවග්ගො

### 11. 1. 1

### රාජසුත්තං

3769. සාවත්ථියං:

කිඤ්චාපි භික්ඛවෙ, රාජා චක්කවත්ති[1] චතුන්නං දීපානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙත්වා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, දෙවානං තාවතිංසානං සහව්‍යතං. සො තත්ථ නන්දනවනෙ[2] අච්ඡරාසඞ්ඝපරිවුතො[3] දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති. සො චතූහි ධම්මෙහි අසමන්නාගතො. අථ ඛො සො අපරිමුත්තොව නිරයා, අපරිමුත්තො තිරච්ඡානයොනියා, අපරිමුත්තො පෙත්තිවිසයා, අපරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා. කිඤ්චාපි භික්ඛවෙ, අරියසාවකො පිණ්ඩියාලොපෙන යාපෙති, නන්තකානි[4] ධාරෙති. සො චතූහි ධම්මෙහි සමන්නාගතො. අථ ඛො සො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

කතමෙහි චතූහි? ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති ''ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ අවෙච්චප්පසාදෙනසමන්නාගතො හොති: ''ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එසභගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.'' අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි චතූහි ධම්මෙහි සමන්නාගතො හොති.

යො ච භික්ඛවෙ, චතුන්නං දීපානං පටිලාභො, යො චතුන්නං ධම්මානං පටිලාභො, චතුන්නං දීපානං පටිලාභො චතුන්නං ධම්මානං පටිලාභස්ස කලං නාග්ඝති සොළසිං.

---

1. චක්කවත්ති - සී 2, ස්‍යා.
2. නන්දනෙ වනෙ - මජ්සං, ස්‍යා.
3. අච්ඡරාසඞ්ඝාතපරිවුතො - සීමු.
4. නන්තකානි ච - මජ්සං.

# 11. සෝතාපත්ති සංයුත්තය

## 1. වේළුද්වාරවග්ගය

### 11. 1. 1.

### රාජ සූත්‍රය

3769. සැවැත්නුවර-

මහණෙනි, සක්විති රජ සිවුදිවයිනෙහි ඉසුරු බැවින් යුත් අධිපති බව ඇති රජය කරවා කාබුත් මරණින් මතු සුගති සගලොව තව්තිසා වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණේ ද, හෙතෙමේ එහි නඳුනුයනෙහි අසරසුමුයෙන් පිරිවරන ලදු ව දිව්‍යමය වූ පස්කම්ගුණෙන් යුතු ව සමන්විත ව ඉඳුරන් පිණවා ද එහෙත් හෙතෙමේ සිවු දහමින් නොයුතු ය. (එහෙයින්) හෙතෙමේ නිරයෙන් නො මිදුනේ ම ය. තිරිසන් යොනියෙන් නොමිදුනේ ම ය. ප්‍රෙතවිෂයෙන් නො මිදුනේ ම ය. අපායදුග්ගතිවිනිපාතයෙන් නො මිදුනේ ම ය. මහණෙනි, අරිසවුතෙමේ පිඩුසිඟීමෙන් යැපේ ද, කඩමලු දරා ද (එහෙත්) හෙතෙමේ සිව් දහමින් යුතු ය. එහෙයින් හෙතෙමේ නිරයෙන් මිදුනේ ය. තිරිසන් යොනියෙන් මිදුනේ ය. ප්‍රෙතවිෂයයෙන් මිදුණේ ය. අපායදුග්ගතිවිනිපාතයෙන් මිදුනේ ය.

කවර සිවු දහමින් ද යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමේ "මෙකරුණෙනු දු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් හ. සම්‍යක්සම්බුද්ධ හ. විද්‍යාචරණසම්පන්න හ. සුගත හ. ලොකවිදූ හ. අනුත්තරපුරුෂදම්‍ය සාරථී හ දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ හ. භගවත් හ"යි බුදුරජාණන් වහන්සේ. කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය. සාන්දෘෂ්ටික ය. අකාලික ය. එහිපස්සික ය. ඔපනයික ය. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දත යුතු ය"යි ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුතුවූයේ වෙයි. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ උජුපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ඤායපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සාමීචිපටිපන්න ය. යම් මේ පුරුෂයුග සතරෙක් වේද (එහි) පුරුෂ පුද්ගලයෝ අට දෙනෙකි. භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ ආහුනෙය්‍ය ය. පාහුනෙය්‍ය ය. දක්ඛිණෙය්‍ය ය. අඤ්ජලිකරණීය ය. ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර ය"යි සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වේ. අඛණ්ඩ අච්ඡිද්‍ර අසබල අකල්මාෂ භුජිෂ්‍ය විඥප්‍රශස්ත අපරාමෘෂ්ට සමාධිසංවර්තනික ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. මේ සිවුදහමින් යුතු වූයේ වෙයි.

මහණෙනි, යම් සිවුදිවයින් පිළිලැබුමෙක් වේ ද, යම් සිවුදහම් පිළිලැබුමෙකුත් වේ ද සිවුදිවයින් පිළිලැබුම සිවුදහම් පිළිලැබුමෙහි සොළොස් වැනි කලාවෙන් කලාවකුත් නො අගී යී.

## 11. 1. 2

## බ්‍රහ්මචරියොගධසුත්තං

3770. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. කතමෙහි චතූහි? ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා අරහං–පෙ–සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති ''ස්වාක්ඛාතො භගවතා ධම්මො –පෙ– පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො –පෙ– අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති. අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි –පෙ– සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

යෙසං සද්ධා ච සීලඤ්ච පසාදො ධම්මදස්සනං
තෙ වෙ කාලෙන පච්චෙන්ති[1] බ්‍රහ්මචරියොගධං සුඛන්ති.

## 11. 1. 3

## දීඝාවු උපාසක සුත්තං

3771. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ තෙන ඛො පන සමයෙන දීඝාවු උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො දීඝාවු උපාසකො පිතරං ජොතිකං[2] ගහපතිං ආමන්තෙසි: එහි ත්වං ගහපති, යෙන භගවා තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද ''දීඝාවු භන්තෙ, උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො සො භගවතො පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති;[3] 'සාධු කිර භන්තෙ, භගවා යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා''ති.

1. පප්පොන්ති – මජසං, සයා.
2. ජොතියං – සයා.
3. වදෙහි – මජසං, සයා.

## 11. 1. 2

## බ්‍රහමචරියොගධ සූත්‍රය

3770. මහණෙනි, සිවුදහමින් යුතු අරිසවුතෙමේ විවස ව නොවැටෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වේ. කවර සිවු දහමින් ද යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමෙ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු අර්හත් හ....දෙවිමිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ හ. භගවත් හ''යි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වෙයි. ''භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය...නුවණැත්තවුන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුතු ''යි. ධර්මය කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වෙයි. ''භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝතෙමේ සුප්‍රතිපන්නය. ...ලොකයාහට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර ය''යි නො කඩවූ...සමාධිය පිණිස පවත්නා වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුක්ත වූයේ වෙයි. මහණෙනි, මේ සිවු දහමින් යුතු වූ අරිසවු තෙමේ විවස ව නො වැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යළි මතු ද මෙය වදාළ සේක.

බුදුරජානන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවත් ආර්‍ය්‍යකාන්තශීලයත් සංඝයා කෙරෙහි පැහැදීමත් ධර්මයෙහි පැහැදීමත් යම් කෙනෙකුන්ට වෙත් නම් ඔහු බඹසරට ඇතුළත් (මතු තුන්මග හා යෙදුනු) සුවයට සුදුසු කල්හි එකාන්තයෙන් පැමිණෙති යි.

## 11. 1. 3

## දීඝාවුඋපාසක සූත්‍රය

3771 එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර සමීපයෙහි **කලන්දකනිවාප** නම් **වෙළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එසමයෙහි දීඝාවු උවසු තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. එකල්හි දීඝාවු උවසු තෙමේ පියා වන **ජොතික** ගැහැවිහු ඇමැතී ය. ගැහැවි එවු. තෙපි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙවු. එළඹ මා වදනින් භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳිවු. ''වහන්ස, දීඝාවු උපාසක හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. හෙතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳියි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාව නිසා දීඝාවු උවසුහුගේ නිවෙස්න වෙත එළඹෙන සේක්නම් මැනැවැ යි මෙසේ ත් කියා''යි.

එවං තාතාති ඛො ජොතිකො ගහපති, දීඝාවුස්ස උපාසකස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජොතිකො ගහපති භගවන්තං එතදවොච: "දීඝාවු භන්තෙ, උපාසකො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දති එවඤ්ච වදෙති: 'සාධු කිර භන්තෙ, භගවා යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති".

අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන දීඝාවුස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා දීඝාවුං උපාසකං එතදවොච: "කච්චි තෙ දීඝාවු ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති? නො අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො"ති? "න මෙ භන්තෙ, ඛමනීයං, න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො"ති.

තස්මාතිහ තෙ දීඝාවු, එවං සික්ඛිතබ්බං: "බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො භවිස්සාමි "ඉතිපි සො භගවා අරහං -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති". ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො භවිස්සාමි අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි, එවං හි තෙ දීඝාවු, සික්ඛිතබ්බන්ති. යානිමානි භන්තෙ, භගවතා චත්තාරි සොතාපත්තියඞ්ගානි දෙසිතානි, සංවිජ්ජන්ති තෙ ධම්මා මයි. අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. අහං හි භන්තෙ, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහීති.

තස්මාතිහ ත්වං දීඝාවු, ඉමෙසු චතූසු සොතාපත්තියඞ්ගෙසු පතිට්ඨාය ඡ විජ්ජාභාගියෙ ධම්මෙ උත්තරිං භාවෙය්‍යාසි ඉධ ත්වං දීඝාවු, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාහි, අනිච්චෙ දුක්ඛසඤ්ඤී දුක්ඛෙ අනත්තසඤ්ඤී පහානසඤ්ඤී විරාගසඤ්ඤී නිරොධසඤ්ඤීති. එවං හි තෙ දීඝාවු, සික්ඛිතබ්බන්ති. යෙ මෙ භන්තෙ, භගවතා ඡ විජ්ජාභාගියා ධම්මා දෙසිතා සංවිජ්ජන්ති තෙ ධම්මා මයි. අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. අහං හි භන්තෙ, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාමි. අනිච්චෙ දුක්ඛසඤ්ඤී දුක්ඛෙ අනත්තසඤ්ඤී පහානසඤ්ඤී විරාගසඤ්ඤී නිරොධසඤ්ඤී. අපි ච මෙ භන්තෙ, එවං හොති: "මා හෙවායං ජොතිකො ගහපති මමච්චයෙන විඝාතං ආපජ්ජී"ති. මා ත්වං තාත, දීඝාවු, එවං[1] මනසාකාසි. ඉඞ්ඝ, ත්වං තාත, දීඝාවු, යදෙව භගවා[2] ආහ, තදෙව ත්වං සාධුකං මනසිකරොහීති.

1. එතං - ස්‍යා
2. යදෙව තෙ භගවා - ස්‍යා

දරුව එසේ යි ජොතික ගැහැවි දීඝාවු උවසුහට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ජොතිය ගැහැවි භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: "වහන්ස, දීඝාවු උවසුහටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. මහතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳියි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාව නිසා දීඝාවු උවසුහුගේ නිවෙස්න වෙත එළඹෙන සේක් නම් මැනවැ''යි මෙසේත් කියා යි.

භාග්‍යවතුන් වහන්සේ මුවෙන් නො බැණ ඉවසා වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙර ව පා සිවුරු ගෙන දීඝාවු උවසුහුගේ නිවෙස්න වෙත එළඹී සේක. එළඹ පැන වූ අස්නෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ දීඝාවු උවසුහට මෙය වදාළ සේක. දීඝාවු කිම තොපට ඉවසිය හැකි ද, කිම යැපිය හැකි ද, කිම දුක් වෙදනාවෝ අඩු වෙද්ද, වැඩි නො වෙද්ද, මේ දුක් වෙදනාවන්ගේ අඩුවීම පැණේ ද, වැඩිවීමෙක් නො පැණේ දැයි? වහන්ස, මට නොඉවසිය හැකි ය. නො යැපිය හැකි ය. මාගේ දැඩි දුක් වෙදනාවෝ වැඩි වෙත්. අඩු නො වෙත්. ඔවුන්ගේ වැඩිවීම පැණේ. අඩුවීමෙක් නො පෙනේ''යි.

දීඝාවු, එහෙයින් මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු. "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු දු අර්හත් හ ..දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ හ. භගවත් හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වන්නෙමි. ධර්මයෙහි...සඞ්ඝයා කෙරෙහි...අඛණ්ඩ වූ... සමාධිසංවර්තනික වූ ආර්යකාන්තශීලයෙන් සමන්වාගත වන්නෙමි''යි දීඝාවු, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ සිවු සෝවන් අඞ්ග කෙනෙක් වදාරන ලද්දාහු ද ඒ දහම්හු මා කෙරෙහි ඇත. මමත් ඒ දහම් කෙරෙහි දක්නා ලැබෙන්නෙමි. වහන්ස, මම වනාහි "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙනු දු අර්හත් හ ... දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ හ. භගවත් හ යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් සමන්වාගතයෙමි ධර්මය කෙරෙහි සඞ්ඝයා කෙරෙහි...අඛණ්ඩ ... සමාධිසංවර්තනික වූ ආර්යකාන්ත ශීලයෙන් සමන්වාගතයෙමි''යි.

දීඝාවු, එහෙයින් මෙහි ලා තෙපි මේ සිවු සෝවන් අඟෙහි පිහිටා විද්‍යා කොටස් ඇති සදහම් මතු වඩන්නාහු. දීඝාවු මෙහි තෙපි සර්වසංස්කාරයන්හි අනිත්‍යානුදර්ශී ව අනිත්‍යයෙහි දුඃඛසංඥී ව දුඃඛයෙහි අනාත්මසංඥී ව ප්‍රහාණසංඥී ව විරාගසංඥී ව නිරොධ සංඥී ව වෙසෙවු. දීඝාවු තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ විද්‍යා කොටස් ඇති සදහම් කෙනෙක් වදාරන ලද්දාහු ද ඒ දහම්හු මා කෙරෙහි ඇත. මමත් ඒ දහම් කෙරෙහි දක්නා ලැබෙන්නෙමි. වහන්ස, මම වනාහි සියලු සංස්කාරයන්හි අනිත්‍යානුදර්ශී ව අනිත්‍යයෙහි දුඃඛසංඥී ව දුඃඛයෙහි අනාත්මසංඥී ව ප්‍රහාණසංඥී ව විරාගසංඥී ව නිරොධසංඥී ව වෙසෙමි. වහන්ස, වැලිදු මට මෙබඳු සිතෙක් වෙයි; "මේ ජොතික ගැහැවි මාගේ ඇවෑමෙන් දුකට නො පැමිණේවා. දරුව, දීඝාවු, තෙපි එසේ නහමක් මෙනෙහි කරවු. එම්බා දරුව, දීඝාවු තෙපි භාග්‍යවතුන් වහන්සේ යමක් ම වදාළ සේක් නම් එය ම තෙපි මැනවින් මෙනෙහි කරවු''යි.

අථ ඛො භගවා දීඝාවුං උපාසකං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො දීඝාවු උපාසකො අචිරපක්කන්තස්ස භගවතො කාලමකාසි. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "යො සො භන්තෙ, දීඝාවු නාම උපාසකො භගවතා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො. සො කාලකතො. තස්ස[1] කා ගති කො අභිසම්පරායො"ති? පණ්ඩිතො භික්ඛවෙ, දීඝාවු උපාසකො අහොසි. පච්චපාදි[2] ධම්මස්සානුධම්මං න ච මං ධම්මාධිකරණං[3] විහෙසෙසි. දීඝාවු භික්ඛවෙ, උපාසකො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති[4] තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකාති.

# 11. 1. 4

## සාරිපුත්තසුත්තං

3772. එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච ආනන්දො සාවත්ථියං විහරන්ති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: කතිනං නු ඛො ආවුසො සාරිපුත්ත ධම්මානං සමන්නාගමනහෙතු එවමයං පජා භගවතා බ්‍යාකතා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණාති.

චතුන්නං ඛො ආවුසො, ධම්මානං සමන්නාගමනහෙතු එවමයං පජා භගවතා ව්‍යාකතා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධි-පරායණාති. කතමෙසං චතුන්නං? ඉධාවුසො, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති. අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි''. ඉමෙසං ඛො ආවුසො, චතුන්නං ධම්මානං සමන්නාගමනහෙතු එවමයං පජා භගවතා ව්‍යාකතා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණාති.

1. ඔවාදිතො, තස්ස - සී 2.
2. පච්චවාදි - සයා.
3. න ච ධම්මාධිකරණ - සයා.
4. ඔපපාතිකො තත්ථ - මජසං, සයා.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ දීඝාවු උවසුහට මේ අවවාදයෙන් අවවාද කොට හුනස්නෙන් නැගිට වැඩි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩම කළ නොබෝ කලකින් දීඝාවු උවසුතෙමේ කලුරිය කෙළේ ය. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන් හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: ''වහන්ස, දීඝාවු නම් යම් ඒ උවසුවෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවු ඔවදනින් ඔවදන් දෙනු ලැබී ද, හෙතෙමේ කලුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කවරක් ද, පරලොව කවරෙක් දැ''යි. මහණෙනි, දීඝාවු උවසුතෙමේ පණ්ඩිතයෙක් වී ය. දහම්හි අනුදහමට පිළිපන්නේ ය දහම් හෙයින් මා නො ද වෙහෙසී ය. මහණෙනි, දීඝාවු උවසුතෙමේ පසඬු ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් එහි පිරිනිවෙනසුලු එලොවින් පෙරලා නොඑන ස්වභාව ඇති ඔපපාතිකයෙක් වේ යි.

## 11. 1. 4

## සාරිපුත්ත සූත්‍රය

3772. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝත් ආයුෂ්මත් අනඳතෙරණුවෝත් සැවතසමීපයෙහි අනේපිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ සවස්කල විවෙකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමඟ සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කතාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් අනඳ තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ: ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කෙතෙක් දහමින් යුතු වීම හෙතු කොට මෙසේ මේ ප්‍රජාව විවස ව නො වැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක් දැ''යි.

ඇවැත්නි, සිවුදහමකින් යුතුවීම හෙතු කොට ගෙන මෙසේ මේ ප්‍රජාව විවස ව නොවැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් යී භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. කවර සිවුදහමෙකින් ද යත්: ඇවැත්නි, මෙහි අරිසවු තෙමේ ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු දු ... දෙවිමිනිසුන්ට ශාස්තෘහ බුද්ධ හ භගවත් හ යි බුදුරජානන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්මයෙහි ... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධි සංවත්තනික වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. ඇවැත්නි, මේ සිවුදහමින් යුතු වීම හෙතු කොට ගෙන මෙසේ මේ ප්‍රජාව විවස ව නො වැටෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොවාන් යී භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලදැ යි.

## 11. 1. 5

## දුතියසාරිපුත්තසුත්තං

3773. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච: "සොතාපත්තියඞ්ගං සොතාපත්තියඞ්ගන්ති" හිදං සාරිපුත්ත, වුච්චති, කතමන්නුඛො සාරිපුත්ත, සොතාපත්තියඞ්ගන්ති? සප්පුරිසසංසෙවොහි භන්තෙ, සොතාපත්තියඞ්ගං, සද්ධම්මසවනං සොතාපත්තියඞ්ගං, යොනිසොමනසිකාරො සොතාපත්තියඞ්ගං, ධම්මානුධම්මපටිපත්ති සොතාපත්තියඞ්ගන්ති. සාධු සාධු සාරිපුත්ත, සප්පුරිසසංසෙවො හි සාරිපුත්ත, සොතාපත්තියඞ්ගං, සද්ධම්මසවනං සොතාපත්තියඞ්ගං, යොනිසොමනසිකාරො සොතාපත්තියඞ්ගං, ධම්මානුධම්මපටිපත්ති සොතාපත්තියඞ්ගං.

"සොතො සොතොති හිදං සාරිපුත්ත, වුච්චති. කතමො නුඛො සාරිපුත්ත, සොතොති? අයමෙව හි භන්තෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො සොතො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධීති. සාධු සාධු සාරිපුත්ත, අයමෙව හි සාරිපුත්ත අරියො අට්ඨඞ්ගිකො මග්ගො සොතො සෙය්‍යථීදං: "සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. සොතාපන්නො සොතාපන්නොති" හිදං සාරිපුත්ත, වුච්චති. කතමො නුඛො සාරිපුත්ත, සොතාපන්නොති? යො හි භන්තෙ, ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො, අයං වුච්චති සොතාපන්නො. ස්වායං[1] ආයස්මා එවං-නාමො එවං ගොත්තොති. සාධු සාධු සාරිපුත්ත, යො හි සාරිපුත්ත, ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො. අයං වුච්චති සොතාපන්නො සවායං ආයස්මා එවන්නාමො එවගොත්තොති.

## 11. 1. 6

## ථපතිසුත්තං

3774. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති: "නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතීති". තෙන ඛො පන සමයෙන ඉසිදත්තපුරාණා, ථපතයො: සාධුකෙ පටිවසන්ති කෙනචි දෙව කරණීයෙන, අස්සොසුං ඛො ඉසිදත්ත පුරාණා ථපතයො සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති, නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතීති

1. ස්වායං - මජසං.

## 11. 1. 5

## දුතිය සාරිපුත්ත සූත්‍රය

3773. එකල්හි ආයුෂ්මත් **සැරියුත් තෙරණුවෝ** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: ''සාරිපුත්ත, සෝවාන් අඟ සෝවාන් අඟයි මෙය කියනු ලැබේ. සාරිපුත්ත, සෝවාන් අඟ කවරේ ද''යි. වහන්ස, සත්පුරිස් සෙවුම සෝවාන් අඟෙකි. සදහම් ඇසුම සෝවාන් අඟෙකි. නුවණින් මෙනෙහි කිරීම සෝවාන් අඟෙකි. දහම් අනුදහම් පිළිවෙත සෝවාන් අඟෙකි''යි. සාරිපුත්ත, මැනවි, මැනවි. සාරිපුත්ත, සත්පුරිස් සෙවුම සෝවාන් අඟෙකි. සදහම් ඇසුම සෝවාන් අඟෙකි. නුවණින් මෙනෙහි කිරීම සෝවාන් අඟෙකි. දහම් අනුදහම් පිළිවෙත සෝවාන් අඟෙකි.

සාරිපුත්ත, සොතය සොත ය''යි මෙය කියනු ලැබේ. සාරිපුත්ත සොතය කවරේ දැ''යි. වහන්ස, මේ අරිඅටඟිමඟ ම සොත යයි. එනම්; සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. සාරිපුත්ත, මැනවි මැනවි. සාරිපුත්ත මේ අරිඅටඟිමඟ ම සොත ය යි. එනම් සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. සාරිපුත්ත සෝවාන් සෝවාන් යී මෙය කියනු ලැබේ. සාරිපුත්ත සෝවාන් කවරේ දැ යි. වහන්ස, යමෙක් මේ අරිඅටඟිමඟින් යුතු වූයේ වේ ද, මේ සෝවාන් යී කියනු ලැබේ. ඒ මේ ආයුෂ්මත් තෙමේ මෙබඳු නම් ඇත්තේ මෙබඳු ගොත් ඇත්තේ යි. සාරිපුත්ත, මැනවි මැනවි. සාරිපුත්ත, යමෙක් මේ අරිඅටඟිමඟින් යුතු වූයේ වේ ද, මේ සෝවාන් යී කියනු ලැබේ. ඒ මේ ආයුෂ්මත් තෙමේ මෙබඳු නම් ඇත්තේ මෙබඳු ගොත් ඇත්තේ යි.

## 11. 1. 6

## ථපති සූත්‍රය

3774. එසමයෙහි බොහෝ භික්ෂූහු ''නිමාසිවුරු ඇති (අනුසස් කාලය නිම වූ සිවුරු ඇති) භාග්‍යවතුන් වහන්සේ තෙමස ඇවෑමෙන් චාරිකා-වෙහි වඩනා සේකැ''යි භාග්‍යවතුන් වහන්සේගේ සිවුරුකම් කෙරෙත්. එසමයෙහි **ඉසිදත්ත පුරාණ** වඩුවෝ දෙදෙන කිසියම් කටයුත්තක් හෙතු කොට **සාධුක නුවර** වෙසෙත්. ඉසිදත්ත පුරාණ වඩුවෝ නිමා සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තෙමස් ඇවෑමෙන් චාරිකාවෙහි වඩනා සේකැයි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු කම් කෙරෙති යී ඇසූහ.

අථ ඛො ඉසිදත්තපුරාණා ථපතයො මග්ගෙ පුරිසං ඨපෙසුං: "යද ත්වං අම්භො පුරිස, පස්සෙය්‍යාසි භගවන්තං ආගච්ඡන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අථ ඛො අම්හාකං[1] ආරොචෙය්‍යාසී"ති. ද්වීහතීහං[2] ඨිතො ඛො සො පුරිසො අද්දස භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන යෙන ඉසිදත්තපුරාණා ථපතයො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ඉසිදත්තපුරාණෙ ථපතයො එතදවොච: "අයං සො භන්තෙ, භගවා ආගච්ඡති අරහං සම්මාසම්බුද්ධො යස්සදානි කාලං මඤ්ඤථා"ති".

අථ ඛො ඉසිදත්තපුරාණා ථපතයො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධිංසු. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙනඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ඉසිදත්තපුරාණා ථපතයො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො ඉසිදත්තපුරාණා ථපතයො භගවන්තං එතදවොචුං:

"යද මයං භන්තෙ, භගවන්තං සුණොම[3] සාවත්ථියා කොසලෙසු චාරිකං පක්කමිස්සතීති. හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං දූරෙ නො භගවා භවිස්සතීති". යද පන මයං භන්තෙ, භගවන්තං සුණොම සාවත්ථියා කොසලෙසු චාරිකං පක්කන්තොති, හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං "දූරෙ නො භගවා"ති".

යද මයං භන්තෙ, භගවන්තං සුණොම: "කොසලෙහි මල්ලෙසු[4] චාරිකං පක්කමිස්සතීති" හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං "දූරෙ නො භගවා භවිස්සතීති". යද පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "කොසලෙහි මල්ලෙසු චාරිකං පක්කන්තොති". 'හොති නො තස්මිං සමයෙ අනත්තමනතා: හොති දොමනස්සං "දූරෙ නො භගවා"ති".

යද පන මයං භන්තෙ, භගවන්තං සුණොම "මල්ලෙහි වජ්ජීසු[5] චාරිකං පක්කමිස්සතී"ති. හොති නො තස්මිං සමයෙ අනත්තමනතා. හොති දොමනස්සං: "දූරෙ නො භගවා භවිස්සතී"ති. යද පන මයං භන්තෙ, භගවන්තං සුණොම 'මල්ලෙහි වජ්ජීසු චාරිකං පක්කන්තොති". හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති. දොමනස්සං "දූරෙ නො භගවා"ති.

යද පන මයං භන්තෙ, භගවන්තං සුණොම "වජ්ජීහි කාසීසු[6] චාරිකං පක්කමිස්සතී"ති. හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං: "දූරෙ නො භගවා භවිස්සතී"ති. යද පන මයං භන්තෙ, භගවන්තං සුණොම "වජ්ජීහි කාසීසු චාරිකං පක්කන්තොති". හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං "දූරෙ නො භගවා"ති".

---

1. අථ අම්හාකං - මජසං, ස්‍යා.
2. ද්වීහං තීහං - මජසං, ස්‍යා.
3. සුණාම - ස්‍යා, මජසං.
4. මල්ලීං - ස්‍යා.
5. වජ්ජීං - ස්‍යා.
6. කාසිං - ස්‍යා

ඉක්බිති ඉසිදත්ත පුරාණ වඩුවෝ "එම්බල පුරුෂය යම් කලෙක තෙපි වඩනා අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දක්නහු නම් එකල්හි අපට සැල කරන්නහු"යි මඟ පුරුෂයකු තැබූහ. දෙතුන් දිනක් සිටි ඒ පුරුෂ තෙමේ වඩනා භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දිටී. දැක ඉසිදත්ත පුරාණ වඩුවන් වෙත එළඹියේ ය. එළඹ ඉසිදත්ත පුරාණ වඩුවන්ට මෙය සැලකෙළේ ය. "හිමියෙනි, ඒ මේ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක. යමකට දැන් කල් දන්නහු නම් මැනවැ"යි.

එකල්හි ඉසිදත්ත පුරාණ වඩුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ භාග්‍යවතුන් වහන්සේ පසු පස අනුගමන් කළහ. එකල භාග්‍යවතුන් වහන්සේ මඟින් ඉවත් ව එක්තරා රුක්මුලකට එළඹි සේක. එළඹ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. ඉසිදත්ත පුරාණ වඩුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස් ව හුන්හ. එකත් පස්ව හුන් ඉසිදත්ත පුරාණ වඩුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් **කොසොල් දනව්වෙහි** චාරිකාවට වඩනා සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නාහ"යි අපට නො සතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරින් කොසොල් දනව්වෙහි චාරිකාවට වැඩි සේ කැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වෙති"යි අපට නො සතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ **කොසොල් දනව්වෙන් මල්ලදනව්වෙහි** චාරිකාවට වඩනා සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නාහ"යි අපට නොසතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි "භාග්‍ය-වතුන් වහන්සේ කොසොල්දනව්වෙන් මල්ලදනව්වෙහි චාරිකාවට වැඩි සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වෙති"යි අපට නොසතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ **මල්ලදනව්වෙන් වැදෑදනව්වෙහි** චාරිකාවට වඩනා සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නාහ "යි අපට නො සතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ මල්ලදනව්වෙන් වැදෑදනව්වෙහි චාරිකාවට වැඩි සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වෙති"යි අපට නොසතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ **වැදෑදනව්වෙන් කසීදනව්වෙහි** චාරිකාවට වඩනා සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නා හ"යි අපට නොසතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි "භාග්‍යවතුන් වහන්සේ වැදෑදනව්වෙන් කසීදනව්වට චාරිකාවෙහි වැඩි සේකැ"යි අසමෝ නම් එසමයෙහි "භාග්‍යවතුන් වහන්සේ අපට දුර වෙති"යි අපට නොසතුටු බවෙක් වෙයි. දෙම්නසෙක් වෙයි.

යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "කාසීහි මගධෙසු[1] චාරිකං පක්කමිස්සතී"ති, හොති නො තස්මිං සමයෙ අනත්තමනතා, හොති දොමනස්සං: "දූරෙ නො භගවා භවිස්සතී"ති". යදාපන මයං භන්තෙ, භගවන්තං සුණොම "කාසීහි මගධෙසු චාරිකං පක්කන්තො"ති". හොති අනප්පිකා නො තස්මිං සමයෙ අනත්තමනතා හොති අනප්පකං දොමනස්සං: "දූරෙ නො භගවා"ති".

යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "මගධෙහි කාසීසු චාරිකං පක්කමිස්සතී"ති. හොති නො තස්මිං සමයෙ අත්තමනතා, හොති සොමනස්සං: ආසන්නො[2] නො භගවා භවිස්සතීති, යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "මගධෙහි කාසීසු චාරිකං පක්කන්තො"ති". හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං: 'ආසන්නො නො භගවා"ති".

යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "කාසීහි වජ්ජීසු චාරිකං පක්කමිස්සතී"ති". හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං: "ආසන්නො නො භගවා භවිස්සතී"ති". යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "කාසීහි වජ්ජීසු චාරිකං පක්කන්තො"ති". හොති නො තස්මිං සමයෙ අත්තමනතා: හොති සොමනස්සං: "ආසන්නො නො භගවා"ති".

යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "වජ්ජීහි මල්ලෙසු චාරිකං පක්කමිස්සතී"ති". හොති නො තස්මිං සමයෙ. අත්තමනතා, හොති සොමනස්සං: "ආසන්නො නො භගවා භවිස්සතී"ති". යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "වජ්ජීහි මල්ලෙසු චාරිකං පක්කන්තො"ති. හොති නො තස්මිං සමයෙ අත්තමනතා, හොති සොමනස්සං: "ආසන්නො නො භගවා"ති".

යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "මල්ලෙහි කොසලෙසු චාරිකං පක්කමිස්සතී"ති". හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං; "ආසන්නො නො භගවා භවිස්සතී"ති". යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "මල්ලෙහි කොසලෙසු චාරිකං පක්කන්තො"ති. හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං: "ආසන්නො නො භගවා"ති".

යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "කොසලෙහි සාවත්ථිං චාරිකං පක්කමිස්සතී"ති. හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං: "ආසන්නො නො භගවා භවිස්සතී"ති" යදා පන මයං භන්තෙ, භගවන්තං සුණොම: "සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"ති". හොති අනප්පිකා[3] නො තස්මිං සමයෙ අත්තමනතා, හොති අනප්පකං සොමනස්සං: ආසන්නො නො භගවා"ති".

1. මගධෙ - ස්‍යා.
2. ආසන්නො - සී 2.
3. අනප්පකා - සී.

වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ කසීදනව්වෙන් මගදදනව්වෙහි චාරිකාවට වඩනා සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නාහ''යි අපට නො සතුටු බවෙක් වෙයි. දොම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ කසීදනව්වෙන් මගදදනව්වෙහි චාරිකාවට වැඩි සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට දුර වෙති''යි අපට නොසතුටු බවෙක් වෙයි. දොම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ ''මගද දනව්වෙන් කසීදනව්වෙහි චාරිකාවට වඩනා සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වන්නා හ''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ මගදදනව්වෙන් කසීදනව්වෙහි චාරිකාවට වැඩි සේකැ''යි අසමෝ නම් එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වෙති''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ කසීදනව්වෙන් වැදෑදනව්වෙහි චාරිකාවට වඩනා සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වන්නාහ''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ කසීදනව්වෙන් වැදෑදනව්වෙහි චාරිකාවට වැඩි සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වෙති''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ වැදෑදනව්වෙන් මල්ලදනව්වෙහි චාරිකාවට වඩනා සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වන්නා හ''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ වැදෑදනව්වෙන් මල්ලදනව්වෙහි චාරිකාවට වැඩි සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වෙති''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ මල්ලදනව්වෙන් කොසොල්දනව්වෙහි චාරිකාවට වඩනා සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වන්නා හ''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ මල්ලදනව්වෙන් කොසොල්දනව්වෙහි චාරිකාවට වැඩි සේකැ''යි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වෙති''යි අපට සතුටු බවෙක් වෙයි. සොම්නසෙක් වෙයි.

වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ කොසොල්දනව්වෙන් සැවතට චාරිකාවෙහි වඩනා සේකැ යි අසමෝ නම් එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වන්නාහ''යි අපට සතුටු බවෙක් වෙයි, සොම්නසෙක් වෙයි. වහන්ස, යම් කලෙක අපි ''භාග්‍යවතුන් වහන්සේ **සැවත සමීපයෙහි අනේපිඩුසිටුහුගේ දෙව්රමෙහි** වැඩවසන සේකැයි අසමෝ නම් එසමයෙහි ''භාග්‍යවතුන් වහන්සේ අපට ළඟ වෙති''යි අපට නොමඳ සතුටු බවෙක් වෙයි. නොමඳ සොම්නසෙක් වෙයි.

''තස්මා තිහ ථපතයො සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො[1] පබ්බජ්ජා. අලඤ්ච පන වො ථපතයො අප්පමාදයාති''. අත්ථි ඛො නො භන්තෙ, එතම්හා සම්බාධා අඤ්ඤො සම්බාධො සම්බාධතරො චෙව සම්බාධසඞ්ඛාතතරො චාති, කතමො පන වො ථපතයො එතම්හා සම්බාධා අඤ්ඤො සම්බාධො සම්බාධතරො චෙව සම්බාධසඞ්ඛාතතරො චාති?

ඉධ මයං භන්තෙ, යදා රාජා පසෙනදි කොසලො උය්‍යානභූමිං නිය්‍යාතුකාමො හොති, යෙ තෙ රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස නාගා ඕපවය්හා[2] තෙ කප්පෙත්වා යා තා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පජාපතියො පියා මනාපා තා එකං පුරතො එකං පච්ඡතො නිසීදාපෙම. තාසං ඛො පන භන්තෙ, භගිනීනං එවරූපො ගන්ධො හොති; ''සෙය්‍යථාපි නාම ගන්ධකරණ්ඩකස්ස තාවදෙව විවරියමානස්ස යථා තං, රාජාරහෙන[3] ගන්ධෙන විභූසිතානං. තාසං ඛො පන භන්තෙ, භගිනීනං එවරූපො කායසම්ඵස්සො හොති, සෙය්‍යථාපි නාම තූලපිචුනො වා කප්පාසපිචුනො වා යථා තං රාජකඤ්ඤානං සුඛෙධිතානං[4]. තස්මිං ඛො පන භන්තෙ, සමයෙ නාගොපි රක්ඛිතබ්බො හොති, තාපි භගිනියො රක්ඛිතබ්බා හොන්ති, අත්තාපි රක්ඛිතබ්බො හොති. න ඛො පන මයං භන්තෙ, අභිජානාම, තාසු භගිනීසු පාපකං චිත්තං උප්පාදෙතා. අයං ඛො නො භන්තෙ, එතම්හා සම්බාධා අඤ්ඤො සම්බාධො සම්බාධතරො චෙව සම්බාධසඞ්ඛාතතරො චාති. තස්මාතිහ ථපතයො සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, අලඤ්ච පන වො ථපතයො අප්පමාදය.

චතූහි ඛො ථපතයො ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො, කතමෙහි චතූහි? ඉධ ථපතයො අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති'' -පෙ- ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. ඉමෙහි ඛො ථපතයො චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො.

තුම්හෙ හි ඛො[5] ථපතයො, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති''. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- යං ඛො පන කිඤ්චි කුලෙ දෙය්‍යධම්මං සබ්බං තං අප්පටිවිභත්තං සීලවන්තෙහි කල්‍යාණධම්මෙහි. තං කිං මඤ්ඤථ ථපතයො, කතිවිධා[6] තෙ කොසලෙසු මනුස්සා යෙ තුම්හාකං සමසමා යදිදං දානසංවිභාගෙති[7] ලාභා නො භන්තෙ, සුලද්ධං නො භන්තෙ, යෙසං නො භගවා එවං ජානාතීති[8].

1. අජ්ඣොකාසො - සී 2.
2. ඔපරුය්හා - ස්‍යා.
3. රාජකඤ්ඤානං - මජසං, ස්‍යා
4. සුඛෙධිතානං - ස්‍යා
5. තුම්හෙ ඛො - මජසං, ස්‍යා,
6. කතිවිසා - ස්‍යා.
7. දානසංභොගෙහීති - ස්‍යා.
8. පජානාතීති, මජසං - ස්‍යා.

වඩුවෙනි, ගිහිගෙය පළිබොධ සහිතය, කෙලෙස් රජස් නගින තැනෙකි. පැවිද්ද එළිමහනෙකි. වඩුවෙනි, එහෙයින් මෙහි ලා තොප විසින් නොපමා වීමට සුදුසු යි. වහන්ස, මේ සම්බාධයට වඩා අතිශයින් සම්බාධ වූ ද අතිශය සම්බාධ ය යි පවසන ලද්ද වූ ද අනෙක් සම්බාධයෙක් ඇතැ''යි. වඩුවෙනි, මේ සම්බාධයට වඩා අතිශයින් සම්බාධ වූ ද අතිශය සම්බාධ ය යි පවසන ලද්ද වූ ද තොපගේ අනෙක් සම්බාධය කවරේ දැයි.

වහන්ස, මෙහි අපි, යම් කලෙක **පසේනදි කොසොල් රජතෙමේ** උයන් බිමට නික්මෙනු කැමැත්තේ වේ ද (එකල්හි) පසේනදි කොසොල්-රජුගේ ඉසිලිමෙහි සමත් යම් ඒ ඇත්තු වෙත් නම් ඔවුන් සරසා පසේනදි කොසොල්රජුගේ පිය වූ මනාප වූ යම් ඒ මෙහෙසියෝ වෙත් නම් ඔවුන් එකක ඉදිරියෙන් ද එකක පස්සෙන් ද හිඳුවමු. වහන්ස, රජුට සුදුසු සුවඳින් සැරසුනු ඒ නැගණියන්ගේ මෙබඳු සුවඳෙක් වෙයි. එකෙණෙහි වැසුම් හරිනු ලබන සුවඳ කරඬුවෙක සුවඳ යම්සේ නම් එමෙනි. වහන්ස, සුවසේ වැඩුනු රජකුමරියන් වූ ඒ නැගණියන්ගේ මෙබඳු කාපහසෙක් වෙයි. හිඹුල්පුලුනෙහි හෝ කපුපුලුනෙහි හෝ පහස යම්සේ නම් එමෙනි. වහන්ස, එසමයෙහි ඇතා ද රැක්ක යුත්තේ වෙයි. ඒ නැගණියෝ ද රැක්කයුත්තාහු වෙති. තමා ද රැක්කයුත්තේ වෙයි. වහන්ස අපි, ඒ නැගණියන් කෙරෙහි ලාමක සිතක් ඉපැදවූ බවක් නො ම දනුම් හ. වහන්ස, මේ තෙල සම්බාධයට වඩා අතිශයින් සම්බාධ වූත් අතිශය සම්බාධය යි පවසන ලද්ද වූත් අනෙක් සම්බාධය යි. වඩුවෙනි, ගිහිගෙය පළිබොධ සහිත ය. කෙලෙස් රජස් නගින තැනෙකි. පැවිද්ද එළිමහනෙකි. වඩුවෙනි, එහෙයින් මෙහිලා තොප විසින් නොපමා වීමට සුදුසු යි.

වඩුවෙනි, සිවුදහමෙකින් යුත් අරිසවුතෙමේ විවස ව නොවැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වේ. කවර සිවුදහමකින් ද යත්: වඩුවෙනි, මෙහි අරිසවුතෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරු-ණෙනුදු...දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ හ, භගවත් හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්මයෙහි... සඞ්ඝයා කෙරෙහි...මුදන ලද ත්‍යාග ඇත්තේ (-ත්‍යාගශීලී ව, ආවවුන්ට දීම පිණිස) දෝනා ලද අත් ඇත්තේ ත්‍යාගයෙහි ඇලුනේ යදිනු ලැබීමට සුදුසු වූයේ දීමෙහිත් බෙද දීමෙහිත් ඇලුනේ පහ ව ගිය මසුරු මල ඇති සිතින් යුතු ව ගිහිගෙයි වෙසෙයි. වඩුවෙනි, මේ සිවුදහමින් යුත් අරිසවු-තෙමේ විවස ව නොවැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වේ.

වඩුවෙනි, තෙපි වනාහි ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු... දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ හ. භගවත් හ යි බුදුරජානන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගතය හ. ධර්මයෙහි...සඞ්ඝයා කෙරෙහි ...කුලයෙහි යම් කිසි දිය යුතු දෙයක් වේ නම් ඒ සියල්ල කලණදහම් ඇති සිල්වතුන් හා නොපිළිබෙදන ලද්දේ වෙයි. වඩුවෙනි, ඒ කිමැයි හඟිවු ද? දීමෙහිත් බෙද දීමෙහිත් ලා යම් කෙනෙක් තොපට සමසම වෙත් නම් කොසොල්දනව්වෙහි එබඳු මිනිස්සු කෙනෙක් වෙද්දැයි. වහන්ස, යම් බඳු අප ගැන භාග්‍යවතුන් වහන්සේ මෙසේ දනවදරන සේක් නම් වහන්ස ඒ අපට ලාභයෙකි. අපට මනාලැබුමෙකි යි.

## 11. 1. 7

## වෙළුද්වාරෙය්‍යසුත්තං

3775. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන වෙළුද්වාරං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො වෙළුද්වාරෙය්‍යකා[1] බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං වෙළුද්වාරං අනුප්පත්තො. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති: "ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

අථ ඛො වෙළුද්වාරෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු එකමන්තං නිසින්නා ඛො වෙළුද්වාරෙය්‍යකා[2] බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: මයං භො ගොතම, එවං කාමා එවඡන්දා එවං අධිප්පායා පුත්තසම්බාධසයනං[3] අජ්ඣාවසෙය්‍යාම. කාසිකචන්දනං පච්චනුභවෙය්‍යාම මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍යාම, ජාතරූපරජතං සාදියෙය්‍යාම. කායස්ස. භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජෙය්‍යාම. තෙසං නො භවං ගොතමො අම්හාකං එවංකාමානං එවඡන්දානං එවං අධිප්පායානං තථා ධම්මං දෙසෙතු. යථා මයං පුත්තසම්බාධසයනං[3] අජ්ඣාවසෙය්‍යාම, කාසිකචන්දනං පච්චනුභවෙය්‍යාම, මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍යාම ජාතරූපරජතං සාදියෙය්‍යාම, කායස්ස ච භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජෙය්‍යාමාති.

අත්තූපනායිකං වො ගහපතයො ධම්මපරියායං දෙසිස්සාමි. තං සුණාථ. සාධුකං මනසිකරොථ. භාසිස්සාමීති. එවං භොති ඛො වෙළුද්වාරෙය්‍යකා[4] බ්‍රාහ්මණගහපතිකා භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

1. ඛො තෙ වෙළුද්වාරෙය්‍යකා – මජසං.
2. ඛො තෙ වෙළුද්වාරෙය්‍යකා – මජසං, සයා.
3. පුත්තසම්බාධා සයනං ,, ,,
4. වෙළුද්වාරෙය්‍යකා ,, ,,

## 11. 1. 7

# වෙළුද්වාරෙය්‍යසූත්‍රය

එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි මහත් භික්සඟන සමඟ චාරිකාවෙහි හැසිරෙන සේක් **කොසොල් දනවූ වැස්සන්ගේ වෙළුද්වාර** නම් බමුණුගම වෙත පැමිණිසේක. වෙළුද්වාර වැසි බමුණුගැහැවියෝ ''ශාක්‍යකුලයෙන් පැවිදි වූ ගොයුම් ගොත් ඇති භවත් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ මහත් භික්සඟන සමග කොසොල් දනව්වෙහි චාරිකාවේ හැසිරෙන සේක් වෙළුද්වාර නුවරට පිළිවෙළින් පැමිණි සේක. ඒ භගවත් ගෞතමයන් ගේ මෙබඳු කළණ කිතු සදෙක් උස් ව පැන නැංගේය: ''ඒ භාග්‍යවත්හු මෙ කරුණෙනු ද අර්හත්හ, සම්‍යක් සම්බුද්ධ හ. විද්‍යාචරණසම්පන්න හ, සුගත හ, ලොකවිදූ හ, අනුත්තර-පුරිසදම්මසාරථී හ, දෙව්මිනිසුන්ට ශාස්තෲ හ. බුද්ධ හ. භගවත් හ''යි, ඔවුන් වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණබමුණන් සහිත මේ ලොව දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසන සේක. ඔවුන් වහන්සේ මුල කලණ වූ මැද කලණ වූ අවසන කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදෙක් පිරිපුන් පිරිසිදු බඹසර පවසන සේක. එබඳු රහතුන් ගේ දැක්ම යහපත් වේ''යි ඇසූහ.

ඉක්බිති වෙළුද්වාර වැසි බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස් ව හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ එකත් පස් ව හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි නම් ගොත් අස්වා එකත්පස් ව හුන්හ. ඇතැම් කෙනෙක් මුවින් නො බැණ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් වෙළුද්වාර වැසි බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. ''භවත් ගෞතමයෙනි, අපි දරුවන්ගෙන් හක වූයහන්හි වෙසෙන්නමෝ සිනිඳු සඳුන් ගල්වන්නමෝ මල්ගඳවිලවුන් දරන්නමෝ රන්රිදී ඉවසන්නමෝ කාබුන් මරණින් මතු සුගති සඟලොවට පැමිණෙන්නමෝ යි මෙබඳු කාම ඇත්තමෝ මෙබඳු ඡන්ද ඇත්තමෝ මෙබඳු අදහස් ඇත්තමෝ වම්හ. යම් සේ අපි දරුවන් ගෙන් හක වූ යහන්හි වසන්නමෝ සිහිල් සඳුන් ගල්වන්නමෝ මල්ගඳවිලෙවුන් දරන්නමෝ රන්රිදී ඉවසන්නමෝ කාබුන් මරණින් මතුත් සුගති සගලොවට පැමිණෙන්නමෝ නම් මෙබඳු කාම ඇති මෙබඳු ඡන්ද ඇති මෙබඳු අදහස් ඇති ඒ අපට භවත් ගෞතමයන් වහන්සේ එසේ දහම් දෙසන සේක්වා''යි.

ගැහැවියෙහි, තමා එළවා දැක්විම ඇති දහම්නය තොපට දෙශනා කරන්නෙමි. එය අසවු. මැනවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. භවත්නි, එසේ ය යි වෙළුද්වාරවැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක.

කතමො ච ගහපතයො අත්තූපනායිකො ධම්මපරියායො: ඉධ ගහපතයො අරියසාවකො ඉතිපටිසංචික්ඛති: "අහං ඛොස්මි ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො. යො ඛො මං ජීවිතුකාමං අමරිතුකාමං සුඛකාමං දුක්ඛපටික්කූලං ජීවිතා වොරොපෙය්‍ය, න මෙතං අස්ස පියං මනාපං අහඤ්චෙව ඛො පන පරං ජීවිතුකාමං අමරිතුකාමං. සුඛකාමං දුක්ඛපටික්කූලං ජිවිතා වොරොපෙය්‍යං පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො. පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයොජෙය්‍යන්ති,? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති. පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. පාණාතිපාතා වෙරමණියා ච වණ්ණං භාසති එවමස්සායං කායසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

පුනචපරං ගහපතයො, අරියසාවකො ඉතිපටිසඤ්චික්ඛති: "යො ඛො මෙ අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍ය, න මෙ තං අස්ස පියං මනාපං. අහඤ්චෙව ඛො පන පරස්ස අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍යං, පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, පරස්ස පෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරංතෙන සංයොජෙය්‍යන්ති''? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති. පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති. අදින්නාදානා වෙරමණියා ච වණ්ණං භාසති. එවමස්සායං කායසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

පුනචපරං ගහපතයො, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: "යො ඛො මෙ දාරෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය, න මෙ තං අස්ස පියං මනාපං අහඤ්චෙව ඛො පන පරස්ස දාරෙසු චාරිත්තං ආපජ්ජෙය්‍යං, පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, පරස්ස පෙසො ධම්මො අප්පියො අමනාපො යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරංතෙන සංයොජෙය්‍යන්ති''? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච වණ්ණං භාසති. එවමස්සායං කායසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

ගැහැවියෙනි, තමා එළවා දක්වීම ඇති දහම් තය කවරේ ද යත්: ගැහැවියෙනි, මෙහි අරීසවුතෙමේ මෙසේ නුවණින් සලකා බලයි. මම වනාහි ජීවත් වනු කැමැත්තෙම් නො මැරෙනු කැමැත්තෙම් සුව කැමැත්තෙම් දුකට පිළිකුල් කරන්නෙම් වෙමි. යමෙක් ජීවත් වනු කැමති නො මැරෙනු කැමති සුව කැමති දුකට පිළිකුල් කරන මා දිවියෙන් තොර කරන්නේ නම් එය මට ප්‍රිය මනාප නො වන්නේ ය. මම ද ජීවත් වනු කැමති නො මැරෙනු කැමති සුව කැමති දුකට පිළිකුල් කරණ මෙරමා දිවියෙන් තොර කරන්නෙම් නම් මෙරමාහට ද එය අප්‍රිය අමනාප වන්නේය. යම් මේ දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමාහට ද ඒ දහම අප්‍රිය අමනාප වේ. යම් මේ දහමෙක් මට අප්‍රිය අමනාප නම් කෙසේ මම මෙරමා ඒ දහම සමග යොදන්නෙම් දැ යි. හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් පණිවායෙන් වැළකුණේ වෙයි. මෙරමාත් පණිවායෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි. පණිවායෙන් වෙන් වීමෙහි ගුණත් කියයි. මෙසේ ඔහුගේ මේ කාය සංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වෙයි.

ගැහැවියෙනි, නැවත අනෙකක් ද කියමි; අරිසවු තෙමේ මෙසේ නුවණින් සලකා බලයි. යමෙක් මාගේ නුදුන් දෑ සොරසිතින් ගන්නේ නම් එය මට ප්‍රිය මනාප නො වන්නේ ය. මමත් මෙරමාගේ නුදුන් දෑ සොරසිතින් ගන්නෙම් නම් මෙරමාහට ද එය අප්‍රිය අමනාප වන්නේය. යම් මේ දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමාහට ද මේ දහම අප්‍රිය අමනාප වේ. යම් මේ දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් කෙසේ මම මෙරමා ඒ දහම සමග යොදන්නෙම් දැ යි. හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් අයිනාදනින් වැළකුනේ වේ. මෙරමාත් අයිනාදනින් වෙන් වීමෙහි සමාදන් කරවයි. අයිනාදනින් වෙන් වීමෙහි ගුණත් කියයි මෙසේ ඔහුගේ මේ කායසංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වේ.

ගැහැවියෙනි, නැවත අනෙකක් ද කියමි. අරිසවුතෙමේ මෙසේ නුවණින් සලකා බලයි: ''යමෙක් මාගේ අඹුවන් කෙරෙහි හැසිරීමට පැමිණෙන්නේ නම් මට එය ප්‍රිය මනාප නො වන්නේ ය. මමත් මෙරමාගේ අඹුවන් කෙරෙහි හැසිරීමට පැමිණෙන්නෙම් නම් මෙරමාහට ද එය අප්‍රිය අමනාප වන්නේ ය. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමාහට ද ඒ දහම අප්‍රිය අමනාප වේ. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් කෙසේ මම මෙරමා ඒ සමග යොදන්නෙම් දැයි. හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් කාමයෙහි මිසහසරින් වැළකුනේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරින් වෙන් වීමෙහි සමාදන් කරවයි. කාමයෙහි මිසහසරින් වෙන් වීමෙහි ගුණත් කියයි. මෙසේ ඔහුගේ මේ කායසංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වෙයි.

පුනචපරං ගහපතයො, අරියසාවකො ඉති පටිසංචික්ඛති: යො ඛො මෙ මුසාවාදෙන අත්ථං භඤ්ජෙය්‍ය, න මෙ තං අස්ස පියං මනාපං. අහං චෙව ඛො පන පරස්ස මුසාවාදෙන අත්ථං භඤ්ජෙය්‍යං පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයොජෙය්‍යන්ති? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති, පරඤ්ච මුසාවාදා වෙරමණියා සමාදපෙති. මුසාවාදා වෙරමණියා ච වණ්ණං භාසති. එවමස්සායං වචීසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

පුනචපරං ගහපතයො, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: "යො ඛො මං පිසුණාය වාචාය මිත්තෙහි භින්දෙය්‍ය, න මෙ තං අස්ස පියං මනාපං. අහං චෙව ඛො පන පරං පිසුණාය වාචාය මිත්තෙහි භින්දෙය්‍යං පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයොජෙය්‍යන්ති? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච පිසුණාය වාචාය පටිවිරතො හොති. පරඤ්ච පිසුණාය වාචාය වෙරමණියා සමාදපෙති. පිසුණාය වාචාය වෙරමණියා ච වණ්ණං භාසති. එවමස්සායං වචීසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

පුනචපරං ගහපතයො, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති, යො ඛො මං ඵරුසාය වාචාය සමුදාචරෙය්‍ය, න මෙ තං අස්ස පියං මනාපං. අහං චෙව ඛො පන පරං ඵරුසාය වාචාය සමුදාචරෙය්‍යං, පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො. පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයොජෙය්‍යාන්ති? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච ඵරුසාය වාචාය පටිවිරතො හොති. පරඤ්ච ඵරුසාය වාචාය වෙරමණියා සමාදපෙති. ඵරුසාය වාචාය වෙරමණියා ච වණ්ණං භාසති. එවමස්සායං වචීසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

පුනචපරං ගහපතයො, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: "යො ඛො මං සම්ඵප්පලාපභාසෙන[2] සමුදාචරෙය්‍ය. න මෙ තං අස්ස පියං මනාපං. අහඤ්චෙව ඛො පන පරං සම්ඵප්පලාපභාසෙන සමුදාචරෙය්‍යං, පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයොජෙය්‍යාන්ති"? සො ඉති පටිසඞ්ඛාය අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති, පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති. සම්ඵප්පලාපා වෙරමණියා ච වණ්ණං භාසති. එවමස්ස ස්සායං වචීසමාචාරො තිකොටිපරිසුද්ධො හොති.

---

1. මිත්තෙහි භෙදෙය්‍ය - සතා.
2. සම්ඵභාසෙන සම්ඵප්පලාපභාසෙන - මජ්ඣං.

ගැහැවියෙනි, නැවත අනෙකක් ද කියමි: "අරිසවුතෙමේ මෙසේ නුවණින් සලකා බලයි; යමෙක් මුසවායෙන් මාගේ අරුත් බිඳින්නේ නම් මට එය ප්‍රිය මනාප නො වන්නේ ය. මමත් මුසවායෙන් මෙරමාගේ අරුත් බිඳින්නෙම් නම් මෙරමාහට ද එය අප්‍රිය අමනාප වන්නේය. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමාහටත් ඒ දහම අප්‍රිය අමනාප වේ. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් කෙසේ මම මෙරමා ඒ සමග යොදන්නෙම් දැයි. හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් මුසවායෙන් වැළකුනේ වෙයි. මෙරමාත් මුසවායෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි. මුසවායෙන් වෙන් වීමෙහි ගුණත් කියයි. මෙසේ ඔහුගේ මේ වාක්සංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වේ.

ගැහැවියෙනි, නැවත අනෙකක් ද කියමි: "අරිසවුතෙමේ මෙසේ නුවණින් සලකා බලයි. යමෙක් පිසුණුවදනින් මා හා මිතුරන් බිඳුවන්නේ නම් මට එය ප්‍රිය මනාප නො වන්නේ ය. මමත් පිසුණු වදනින් මෙරමා හා මිතුරන් බිඳුවන්නෙම් නම් මෙරමාහට ද එය අප්‍රිය අමනාප වන්නේ ය. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමා හටත් ඒ දහම අප්‍රිය අමනාප වෙයි. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් කෙසේ මම මෙරමා ඒ සමග යොදන්නෙම්දැයි? හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් පිසුණුවදනින් වැළකුනේ වෙයි. මෙරමාත් පිසුණුවදනින් වෙන් වීමෙහි සමාදන් කරවයි. පිසුණු වදනින් වෙන් වීමෙහි ගුණත් කියයි. මෙසේ ඔහුගේ මේ වාක්සංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වේ.

ගැහැවියෙනි, නැවත අනෙකක් ද කියමි: "අරිසවුතෙමේ මෙසේ නුවණින් සලකා බලයි. යමෙක් රළු වදනින් මට බෙණෙන්නේ නම් මට එය ප්‍රිය මනාප නො වන්නේ ය. මමත් රළු වදනින් මෙරමාහට බණන්නෙම් නම් මෙරමාහටත් එය අප්‍රිය අමනාප වන්නේ ය. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමාහටත් ඒ දහම අප්‍රිය අමනාප වේ. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් කෙසේ මම මෙරමා ඒ සමග යොදන්නෙම් දැයි. හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් රළු වදනින් වැළකුනේ වේ. මෙරමාත් රළුවදනින් වෙන් වීමෙහි සමාදන් කරවයි. රළුවදනින් වෙන් වීමෙහි ගුණත් කියයි. මෙසේ ඔහුගේ මේ වාක්සංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වෙයි.

ගැහැවියෙනි, නැවත අනෙකක් ද කියමි. "අරිසවුතෙමේ මෙසේ නුවණින් සලකා බලයි. යමෙක් මට හිස්බසින් බෙණෙන්නේ නම් එය මට ප්‍රිය මනාප නො වන්නේ ය. මමත් මෙරමාහට හිස්බසින් බණන්-නෙම් නම් මෙරමාහටත් එය අප්‍රිය අමනාප වන්නේ ය. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් මෙරමාහටත් ඒ දහම අප්‍රිය අමනාප වේ. යම් දහමෙක් මට අප්‍රිය අමනාප වේ නම් කෙසේ මම මෙරමා ඒ සමග යොදන්-නෙම් දැයි. හෙතෙමේ මෙසේ නුවණින් සලකා තෙමේත් හිස්බසින් වැළ-කුනේ වෙයි, මෙරමාත් හිස්බසින් වෙන් වීමෙහි සමාදන් කරවයි. හිස් බසින් වෙන් වීමෙහි ගුණත් කියයි. මෙසේ ඔහුගේ මේ වාක්සංවරය තුන්කෙළවර පිරිසුදු වූයේ වෙයි.

සො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා අරහං -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති". ධම්මෙ -පෙ- සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති". අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි.

යතො ඛො ගහපතයො, අරියසාවකො ඉමෙහි සත්තහි ධම්මෙහි සමන්නාගතො හොති. ඉමෙහි චතූහි ආකඞ්ඛියෙහි ඨානෙහි. සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො. සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති".

එවං වුත්තෙ වෙළුද්වාරෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භො ගොතම -පෙ- එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙති".

## 11. 1. 8

### ගිඤ්ජකාවසථසුත්තං

3776. එකං සමයං භගවා ඤාතිකෙ විහරති ගිඤ්ජකාවසථෙ අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "සාළ්හො නාම භන්තෙ, භික්ඛු කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො? නන්දා නාම භන්තෙ, භික්ඛුනී කාලකතා. තස්සා කා ගති, කො අභිසම්පරායො? සුදත්තො නාම භන්තෙ, උපාසකො කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො. සුජාතා නාම භන්තෙ, උපාසිකා කාලකතා තස්සා කා ගති, කො අභිසම්පරායොති.

සාළ්හො ආනන්ද, භික්ඛු කාලකතො, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි[1]. නන්දා ආනන්ද, භික්ඛුනී කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනී අනාවත්තිධම්මා තස්මා ලොකා. සුදත්තො ආනන්ද, උපාසකො කාලකතො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සති. සුජාතා ආනන්ද, උපාසිකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා.

1. විහරති - සයා.

හෙතෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙනුදු අර්හත් හ ... දෙව්මිනිසුන්ට ශාස්තෘ හ, බුද්ධ හ, භගවත් හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. ධර්මයෙහි...''භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝතෙමේ සුප්‍රතිපන්න ය...ලොකයාට අනුත්තරපුණ්‍යක්ෂේත්‍රය''යි සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. අඛණ්ඩ වූ...සමාධිසංවර්තනික වූ ආර්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි.

ගැහැවියෙනි, අරිසවු තෙමේ යම් කලෙක මෙ සත් දහමින් යුතු වූයේ වේ ද කැමති වීය යුතු මේ සිවු කරුණෙන් යුතු වූයේ වේ ද හෙතෙමේ කැමතිවන්නේ මම ක්ෂය වූ නිරය ඇත්තෙම් ක්ෂය වූ තිරිසන් යෝනි ඇත්තෙම් ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්ෂය වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් වෙමි. විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වෙමි''යි තෙමේ ම තමා පවසන්නේ යි.

මෙසේ වදාළ කල්හි වේළුද්වාරෙය්‍යක බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: ''භවත් ගෞතමයන් වහන්ස, ඉතාමැනවි... මේ අපි භවත් ගොයුම්හුත් දහමත් බික්සඟනත් සරණ කොට යෙමු. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය අප උවසුන් කොට දරන සේක්වා''යි.

## 11. 1. 8

## ගිඤ්ජකාවසථ සූත්‍රය

3776. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **ඤාතගමෙක්හි උළුගෙහි** වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ: ''වහන්ස, **සාළ්හා** නම් මහණ කලුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද? වහන්ස, **නන්ද** නම් මෙහෙණ කලුරිය කළා ය. ඇගේ ගතිය කුමක් ද පරලොව කිමෙක් ද? වහන්ස, **සුදත්ත** නම් උවසු කලුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කුමක් ද පරලොව කිමෙක් ද? වහන්ස, **සුජාතා** නම් උවැසි කලුරිය කළා ය. ඇගේ ගතිය කුමක් ද පරලොව කිමෙක් දැයි.

ආනන්ද කලුරිය කළ සාළ්හා මහණ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ විසීය. ආනන්ද කලුරිය කළ නන්ද මෙහෙණ පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් ඕපපාතික වූවා එලොවින් පෙරලා නොඑන ස්වභාව ඇත්තී එහි ම පිරිනිවෙනසුලු වූවා ය. ආනන්ද, කලුරිය කළ සුදත්ත උවසු ත්‍රිවිධ සංයොජනයන් ක්ෂය කිරීමෙන් රාගදෙස මොහයන් තුනී වූ බැවින් සෙදගැමි වූයේ එක්වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නේ ය. ආනන්ද කලුරිය කළ සුජාතා උවැසි ත්‍රිවිධ සංයොජනයන් ක්ෂය කිරීමෙන් විවස ව නොහෙනසුලු වූවා නියත වූවා සම්බොධිය පිහිට කොට ඇත්තී සෝවාන් වූවා ය.



Free Distribution www.aathaapi.org

අනච්ඡරියං ඛො පනෙතං ආනන්ද, යං මනුස්සභූතො කාලං කරෙය්‍ය, තස්මිං තස්මිං චෙ මං කාලකතෙ උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡිස්සථ. විහෙසාහෙසා[1] ආනන්ද, අස්ස තථාගතස්ස. තස්මාතිහානන්ද, ධම්මාදාසං නාම ධම්මපරියායං දෙසිස්සාමි. යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: ''ඛීණනිරයොම්හි, ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො.

කතමො ච සො ආනන්ද, ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය ''ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො; ඉධානන්ද, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති'' ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අයං ඛො සො ආනන්ද, ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: ''ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති''.

## 11. 1. 9

## දුතිය ගිඤ්ජකාවසථසුත්තං

3777. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ''අසොකො නාම භන්තෙ, භික්ඛු කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො? අසොකා නාම භන්තෙ, භික්ඛුනී කාලකතා. තස්සා කා ගති, කො අභිසම්පරායො? අසොකො නාම භන්තෙ, උපාසකො කාලකතො තස්ස කා ගති, කො අභිසම්පරායො? අසොකා නාම භන්තෙ, උපාසිකා කාලකතා තස්සා කා ගති, කො අභිසම්පරායො? ති.

අසොකො ආනන්ද, භික්ඛු කාලකතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි -පෙ- අයං ඛො සො ආනන්ද, ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: ''ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි, අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො''ති.

(යථා පුරිමසුත්තං විත්ථාරෙතබ්බං.)

1. විහෙසාපෙසා - මජසං, විහෙසාවෙසා - සතා.

ආනන්ද, මිනිස් වූවෙක් කලුරිය කරන්නේ නම් ඒ ඒ මිනිසා කලුරිය කළ කල්හි ඉදින් මා කරා එළඹ මෙකරුණ පුළුවුස්නහු ය යන යමෙක් වේ ද මෙය පුන පුනා ඇසිරියෙකි. ආනන්ද, මෙය තථාගතයන්ට වෙහෙසක් ම වන්නේ ය. ආනන්ද, එහෙයින් මෙහි ලා යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමති වන්නේ ''මම ක්ෂය වූ නිරය ඇත්තෙම් ක්ෂය වූ තිරිසන් යොන් ඇත්තෙම් ක්ෂය වූ පෙත්තිවිසය ඇත්තෙම් ක්ෂය වූ අපාය දුග්ගති විනිපාත ඇත්තෙම් වෙමි. විවස ව නො ෙහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි''යි තෙමේ ම තමා පවසන්නේ නම් දහම් කැඩපත නම් වූ (එබඳු) දහම් නයක් දෙශනා කරන්නෙමි.

ආනන්ද, යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමති වන්නේ ''මම ක්ෂය වූ නිරය ඇත්තෙම් ක්ෂය වූ තිරිසන්යොන් ඇත්තෙම් ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්ෂය වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් වෙමි. විවස ව නො ෙහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි''යි තෙමේ ම තමා පවසන්නේ නම් දහම්කැඩපත නම් වූ ඒ දහම්නය කවරේ ද යි: ආනන්ද මෙහි අරිසවු ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙවිමිනිසුනට ශාස්තෘහ, බුද්ධයහ භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. ධර්මයෙහි... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. ආනන්ද යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමති වන්නේ ''මම ක්ෂය වූ නිරය ඇත්තෙම් ක්ෂය වූ තිරිසන් යොන් ඇත්තෙම් ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්ෂය වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් විවස ව නො ෙහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වෙමි''යි තෙමේ ම තමා පවසන්නේ නම් මේ ඒ දහම් කැඩපත නම් වූ දහම්නය යි.

## 11. 1. 9

## දුතිය ගිඤ්ජකාවසථ සූත්‍රය

3777. එකත්පසෙක හුන් ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, **අශොක** නම් මහණ කලුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද? වහන්ස, **අශොකා** නම් මෙහෙණ කලුරිය කළා ය. ඇගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද? වහන්ස, **අශොක** නම් උවසු කලුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද? වහන්ස, **අශොකා** නම් උවැසි කලුරිය කළා ය. ඇගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද යි?

ආනන්ද, කලුරිය කළ අශොක මහණ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චලසමාධියත් චලප්‍රඥාවත් දිට්ඨුදම්යෙහි ම තෙමේ වෙසෙසින් දන පසක් කොට එයට පැමිණ විසී ය...ආනන්ද යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමති වන්නේ ''මම ක්ෂය වූ නිරය ඇතියෙම් ක්ෂය වූ තිරිසන්යොන් ඇතියෙම් ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇතියෙම් ක්ෂය වූ අපාය දුර්ගතිවිනිපාත ඇතියෙම් වෙමි. විවස ව නොවැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි යි තෙමේ ම තමා පවසන්නේ නම් මේ ඒ දහම්කැඩපත නම් වූ දහම්නය යි.

(පළමුසුතුර මෙන් විතර කටයුතු)

## 11. 1. 10

### තතිය ගිඤ්ජකාවසථසුත්තං

3778. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: කකුධො[1] නාම භන්තෙ, ඤාතිකෙ උපාසකො කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො? කාලිඞ්ගො[2] නාම භන්තෙ, ඤාතිකෙ උපාසකො කාලකතො -පෙ- නිකටො[3] නාම භන්තෙ, ඤාතිකෙ උපාසකො -පෙ- කටිස්සභො නාම භන්තෙ -පෙ- තුට්ඨො නාම භන්තෙ -පෙ- සන්තුට්ඨො නාම භන්තෙ -පෙ- භද්දො නාම භන්තෙ -පෙ- සුභද්දො නාම භන්තෙ, ඤාතිකෙ උපාසකො කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො''ති?

කකුධො ආනන්ද, උපාසකො කාලකතො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. කාලිඞ්ගො ආනන්ද, උපාසකො කාලකතො -පෙ- නිකටො ආනන්ද -පෙ- කටිස්සභො ආනන්ද -පෙ- තුට්ඨො ආනන්ද -පෙ- සන්තුට්ඨො ආනන්ද -පෙ- භද්දො ආනන්ද -පෙ- සුභද්දො ආනන්ද, උපාසකො කාලකතො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

පරොපඤ්ඤාසා[4] ආනන්ද, ඤාතිකෙ උපාසකා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. සාධිකනවුති ආනන්ද, ඤාතිකෙ උපාසකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. ඡාතිරෙකානි ඛො ආනන්ද, පඤ්චසතානි, ඤාතිකෙ උපාසකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා.

අනච්ඡරියං ඛො පනෙතං ආනන්ද, යං මනුස්සභූතො කාලං කරෙය්‍ය, තස්මිං තස්මිං චෙ මං කාලකතෙ උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡිස්සථ. විහෙසාහෙසා ආනන්ද, අස්ස තථාගතස්ස. තස්මාතිහානන්ද, ධම්මාදාසං නාම ධම්මපරියායං දෙසිස්සාමි යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: ''ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො. සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො.

---

1. කක්කටො - මජ්ඣං, කකුධො - සයා.
2. කළිඞ්ගො - මජ්ඣං, සයා.
3. නිකතො - මජ්ඣං, දනිකටෙධො - සයා.
4. පරොපඤ්ඤාස - මජ්ඣං සයා.

## 11 1. 10

## තතිය ගිඤ්ජකාවසථ සූත්‍රය

3778 එකත්පස් ව හුන් ආයුෂ්මත් **ආනන්ද තෙරණුවෝ** භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: ''වහන්ස, **ඤාතගම්හි කකුධ** නම් උවසු කලුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද? වහන්ස, ඤාතගම්හි **කාලිඞ්ග** නම් උවසු කලුරිය කෙළේ ය. .වහන්ස, ඤාතගම්හි **නික්ඛ** නම් උවසු ... වහන්ස, **කටිස්සභ** නම් ... වහන්ස, **තුට්ඨ** නම්...වහන්ස, **සන්තුට්ඨ** නම් ... වහන්ස, **භද්ද** නම් ... වහන්ස ඤාතගම්හි **සුභද්ද** නම් උවසු කලුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කුමක් ද? පරලොව කිමෙක් ද යි?

ආනන්ද, කලුරිය කළ කකුධ උවසු පස් ඔරම්භාගියසංයොජනයන් ක්ෂය කිරීමෙන් ඕපපාතික වූයේ එලොවින් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ එහි පිරිනිවෙනසුලු වෙයි. ආනන්ද, කලුරිය කළ කාලිඞ්ග උවසු ... ආනන්ද, නික්ඛ...ආනන්ද, කටිස්සභ...ආනන්ද, තුට්ඨ.. ආනන්ද, සන්තුට්ඨ .. ආනන්ද, භද්ද .. ආනන්ද, කලුරිය කළ සුභද්ද උවසු පස් ඔරම්භාගිය සංයොජනයන්, ක්ෂය කිරීමෙන් ඕපපාතික වූයේ එලොවින් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ එහි පිරිනිවෙනසුලු වෙයි.

ආනන්ද, ඤාතගම්හි පනසකට වැඩි උවසුවෝ කලුරිය කළාහු පස් ඔරම්භාගියසංයොජනයන් ක්ෂය කිරීමෙන් ඕපපාතික වූවාහු එලොවින් පෙරලා නො එනසුලු වූවාහු එහි පිරිනිවෙන සුල්ලෝ වෙත්. ආනන්ද, ඤාතගම්හි අනූවකට වැඩි උවසුවෝ කලුරිය කළාහු ත්‍රිවිධසංයොජනයන් ක්ෂය කිරීමෙන් රාගදෙස මොහයන් තුනී වූ බැවින් සෙදගැමි වූවාහු එක් වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ. ආනන්ද, ඤාතගම්හි පන්සිය සදෙනෙක් උවසුවෝ කලුරිය කළාහු ත්‍රිවිධ සංයොජනයන් ක්ෂය කිරීමෙන් විවසව නො වැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වූහ.

ආනන්ද, මිනිස් වූවෙක් කලුරිය කරන්නේ නම් ඒ ඒ මිනිසා කලුරිය කළ කල්හි මා කරා එළඹ මෙකරුණ විචාරන්නාහු ය යන යමෙක් ඉදින් ඇද්ද මෙය පුන පුනා අසිරි යි. ආනන්ද, මෙය තථාගතයන්ට වෙහෙසක් ම වන්නේ ය. ආනන්ද, එහෙයින් මෙහි ලා යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමැති වන්නේ ''මම ක්ෂය වූ නිරය ඇත්තෙම් ක්ෂය වූ තිරිසන් යොන් ඇත්තෙම්, ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්ෂය වූ අපාය දුර්ගති විනිපාත ඇත්තෙම් වෙමි. විවසව නො වැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි''යි තෙමේ ම තමා පවසන්නේ නම් දහම් කැඩපත නම් වූ (එබඳු) දහම්නයක් දෙශනා කරන්නෙමි.

කතමො ච සො ආනන්ද, ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය -පෙ- නියතො සම්බොධිපරායණො: ඉධානන්ද අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අයං ඛො සො ආනන්ද, ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: ''ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො. සොතාපන්නො'හමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො''ති.

## වෙළුද්වාරවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

රාජා ඔගධ දීඝාවු සාරිපුත්තො පරෙ දුවෙ,
ථපතිං වෙළුද්වාරෙය්‍යො ගිඤ්ජකාවසථෙ තයොති.

ආනන්ද, යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමැති වන්නේ... නියත වූ සම්බොධිය පිහිට කොට ඇති (සෝවන්) වෙමි යි තෙමේ ම තමා පවසන්නේ නම් දහම් කැඩපත නම් වූ ඒ දහම්නය කවරේ ද යි? ආනන්ද මෙහි අරිසවු ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙනුදු...දෙවි මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. ධම්යෙහි...සඞ්සයා කෙරෙහි ... අඛණ්ඩ වූ...සමාධිසංවර්තනික වූ ආයඁකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. ආනන්ද, යම් දහම්නයෙකින් යුතු අරිසවු කැමැති වන්නේ ''මම ක්ෂය වූ නිරය ඇත්තෙම් ක්ෂය වූ තිරිසන්යොන් ඇත්තෙම් ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්ෂය වූ අපායදුර්ගති විනිපාත ඇත්තෙම් වෙමි. විවසව නොගෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි''යි තෙමේ ම තමා පවසන්නේ නම් මේ ඒ දහම් කැඩපත නම් වූ දහම්නය යි.

## පළමුවැනි වෙළුද්වාර වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

රාජ බ්‍රහ්මචරියොගධ දීඝාවු යි සූත්‍ර තුනෙකි. අනෙක් ශාරීපුත්‍ර සූත්‍ර දෙකෙකි. ථපති වෙළුද්වාරෙය්‍යක යි දෙකෙකි. ගිඤ්ජකාවසථ සූත්‍ර තුනෙකි යි මුළුල්ල දසයෙකි යි.

# 2. රාජකාරාම වග්ගො

## 11. 2. 1

### සහස්සසුත්තං

3779. එකං සමයං භගවා සාවත්ථියං විහරති රාජකාරාමෙ. අථ ඛො සහස්සං භික්ඛුනීසඞ්ඝො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො තා භික්ඛුනියො භගවා එතදවොච; චතූහි ඛො භික්ඛුනියො ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. කතමෙහි චතූහි: ඉධ භික්ඛුනියො අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති; "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛුනියො, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 11. 2. 2

### බ්‍රාහ්මණසුත්තං

3780. බ්‍රාහ්මණා භික්ඛවෙ, උදයගාමිනිං නාම පටිපදං පඤ්ඤපෙන්ති. තෙ සාවකං එවං සමාදපෙන්ති: "එහි ත්වං අම්භො පුරිස, කාලස්සෙව උට්ඨාය පාචීනමුඛො යාහි. සො ත්වං මා සොබ්භං පරිවජ්ජෙහි, මා පපාතං, මා ඛාණුං, මා කණ්ටකාධානං[1], මා චන්දනිකං; මා ඔලිගල්ලං. යත්ථ[2] පතෙය්‍යාසි,[3] තත්ථෙව මරණං ආගමෙය්‍යාසි.[4] එවං[5] ත්වං අම්භො පුරිස, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සසීති. තං ඛො පනෙතං භික්ඛවෙ, බ්‍රාහ්මණානං බාල ගමනමෙතං.[6] මූළ්හගමනමෙතං, න නිබ්බිදාය, න විරාගාය, න නිරොධාය, න උපසමාය, න අභිඤ්ඤාය, න සම්බොධාය, න නිබ්බානාය සංවත්තති.

අහඤ්ච ඛො භික්ඛවෙ, අරියස්ස විනයෙ උදයගාමිනිං පටිපදං පඤ්ඤපෙමි, යා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා ච සා භික්ඛවෙ, උදයගාමිනී පටිපදා, යා එකන්තනිබ්බිදාය -පෙ- නිබ්බානාය සංවත්තති? ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති, අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අයං ඛො සා භික්ඛවෙ, උදයගාමිනී පටිපදා, යා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතීති.

---

1. කණ්ටකධානං - මජසං, සතා.
2. යාති වා - සිමු, සි 2, යත්ථෙව - සතා.
3. පපතෙය්‍යාසි - මජසං, සතා.
4. ආගමෙය්‍යාසි - මජසං, සතා.
5. එහි - සි 2.
6. බාලානං ගමනමෙතං - සි 2.

# 2. රාජකාරාම වර්ගය

## 11. 2. 1

## සහස්ස සූත්‍රය

3779. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවත සමීපයෙහි රාජකාරාමයෙහි වැඩවසන සේක. එකල්හි දහසක් මෙහෙණසහන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි ඒ මෙහෙණනට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මෙහෙණනි, සිවුදහමකින් යුතු අරිසවු විවස ව නොගෙනසුළු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. කවර සිවුදහමකින යත්: මෙහෙණනි, මෙසස්නෙහි අරිසවු ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු.. දෙව් මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධයහ, හගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධම්යෙහි.. සඞසයා කෙරෙහි... අඛණ්ඩ වූ...සමාධිසංවර්තනික වූ ආයර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. මෙහෙණනි, මේ සිවුදහමින් යුතු අරිසවු විවස ව නොගෙන සුළු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ යි.

## 11. 2. 2

## බ්‍රාහ්මණ සූත්‍රය

3780. මහණෙනි, බමුණෝ උදයගාමිනී නම් පටිපදවක් පනවත්. ඔහු සව්වා මෙසේ සමාදන් කරවත්: ''එම්බා පුරුෂය, එව තෙපි කලින් ම නැගිට පෙරදිගට මුහුණ ලා යවු. ඒ තෙපි හෙබ නාහමක් දුරු කරවු. බැවුම නහමක් දුරු කරවු. කණුව නහමක් දුරු කරවු. කටුබිම නහමක් දුරු කරවු. අසුචිසොරොව්ව නහමක් දුරු කරවු. ගම්දෙර ගවරවළ නහමක් දුරු කරවු. යම් තැනෙක වැටෙන්නාහු නම් එහි ම මරණයට පැමිණෙන්නාහු එම්බා පුරුෂය, මෙසේ තෙපි කාබුන් මරණින් මතු සුගතිසගලොවට පැමිණෙන්නාහු''යි මහණෙනි, ඒ මෙය බමුණන්ගේ බාල ගමනෙකි. මෙය මෝඩ ගමනෙකි. මෙය නිර්වෙදය පිණිස නො පවතියි. විරාගය පිණිස නො පවතියි. නිරොධය පිණිස නො පවතියි. ව්‍යුපසමය පිණිස නො පවතියි. අභිඥානය පිණිස නො පවති යි සම්බොධිය පිණිස නො පවතියි. නිර්වාණය පිණිස නො පවතියි.

මහණෙනි, යම් පටිපදවක් එකාන්තනිර්වෙදය විරාගය නිරෝධය ව්‍යුපශමය අභිඥානය සම්බොධිය නිර්වාණය පිණිස පවතී නම් මමත් අරිසසුන්හි (එබඳු) උදයගාමිනී පටිපදවක් පනවමි. මහණෙනි, යම් පටිපදවක් එකාන්තනිර්වෙදය පිණිස...නිර්වාණය පිණිස පවතී නම් ඒ උදයගාමිනීපටිපදව කවර යත්: මහණෙනි, මෙහි අරිසවු මෙකරුණෙනුදු...''දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, හගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. ධම්යෙහි... සඞසයා කෙරෙහි...අඛණ්ඩ වූ...සමාධි සංවර්තනික වූ ආයර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. මහණෙනි, යම් පටිපදවක් එකාන්තනිර්වෙදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥානය සම්බොධිය නිර්වාණය පිණිස පවතී නම් මේ ඒ උදයගාමිනී පටිපදව යි.

## 11. 2. 3

### ආනන්දසුත්තං

3781. එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච ආනන්දො සාවත්ථියං විහරන්ති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං ආනන්දං එතදවොච: කතීනං ඛො ආවුසො ආනන්ද, ධම්මානං පහානා කතිනං ධම්මානං සමන්නාගමනහෙතු එවමයං පජා භගවතා බ්‍යාකතා "සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති?

චතුන්නං ඛො ආවුසො, ධම්මානං පහානා චතුන්නං ධම්මානං සමන්නාගමනහෙතු එවමයං පජා භගවතා බ්‍යාකතා: "සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති. කතමෙසං චතුන්නං: යථාරූපෙන ඛො ආවුසො බුද්ධෙ අප්පසාදෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපස්ස බුද්ධෙ අප්පසාදො[1] න හොති. යථාරූපෙන ච ඛො ආවුසො, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො සුතවා අරියසාවකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, තථාරූපස්ස බුද්ධෙ අවෙච්චප්පසාදො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති.

යථාරූපෙන ඛො ආවුසො, ධම්මෙ අප්පසාදෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තථාරූපස්ස ධම්මෙ අප්පසාදො[1] න හොති. යථාරූපෙන ච ඛො ආවුසො ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො සුතවා අරියසාවකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. තථාරූපස්ස ධම්මෙ අවෙච්චප්පසාදො හොති. "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති.

යථාරූපෙන ඛො ආවුසො, සඞ්ඝෙ අප්පසාදෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපස්ස සඞ්ඝෙ අප්පසාදො න හොති. යථාරූපෙන ච ඛො ආවුසො, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො සුතවා අරියසාවකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. තථාරූපස්ස සඞ්ඝෙ අවෙච්චප්පසාදො හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති.

1. අවෙච්චප්පසාදෙන - ස්‍යා.

# 11. 2. 3

## ආනන්ද සූත්‍රය

3781. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝත් ආයුෂ්මත් අනඳ තෙරණුවෝත් සැවත සමීපයෙහි අනේපිඬුසිටුහුගේ දෙවුරම්හි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කල විවෙකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් අනඳ තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක වැඩහුන්හ. එකත්පසෙක වැඩහුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට මෙය වදළහ: ඇවැත්නි, ආනන්දයෙනි, කෙතෙක් දහම් ප්‍රහාණයෙන් කෙතෙක් දහමින් යුතු වීම හෙතු කොට ගෙන මෙසේ මේ ප්‍රජාව ''විවස ව නොගෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවනැ''යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද දු යි?

ඇවැත්නි, සිවුදහමක් දුරුලීමෙන් සිවුදහමෙකින් යුතු වීම හෙතු කොට මෙසේ මේ ප්‍රජාව ''විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවනැ''යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්. කවර සිවුදහමෙකින යත්: ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි යම්බඳු නොපැහැදීමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුත් මරණින් මතු අපාය දුග්ගති විනිපාත නිරයට පැමිණේ නම් බුදුරජාණන් වහන්සේ කෙරෙහි එබඳු නොපැහැදීමෙක් ඔහුට නැත. ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි යම්බඳු ගුණ දන පැහැදීමෙකින් යුතු උගත් අරිසවු කාබුත් මරණින් මතු සුගති සගලොවට පැමිණේ නම් ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු දෙවිමිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි එබඳු ගුණ දන පැහැදීමෙක් ඔහුට ඇත.

ඇවැත්නි, දහම්හි යම් බඳු නොපැහැදීමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුත් මරණින් මතු අපායදුග්ගති විනිපාතනිරයට පැමිණේ නම් දහම්හි එබඳු නොපැහැදීමෙක් ඔහුට නැත. ඇවැත්නි, දහම්හි යම් බඳු ගුණ දන පැහැදීමෙකින් යුතු උගත් අරිසවු කාබුත් මරණින් මතු සුගති සගලොවට පැමිණේ නම් ''භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය ..නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දත යුතු ය''යි දහම්හි එබඳු ගුණ දන පැහැදීමෙක් ඔහුට ඇත.

ඇවැත්නි, සඟන කෙරෙහි යම් බඳු නොපැහැදීමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුත් මරණින් මතු අපායදුග්ගති විනිපාතනිරයට පැමිණේ නම් සඟන කෙරෙහි එබඳු නොපැහැදීමෙක් ඔහුට නැත. ඇවැත්නි, සඟන කෙරෙහි යම් බඳු ගුණ දන පැහැදීමෙකින් යුතු උගත් අරිසවු කාබුත් මරණින් මතු සුගතිසගලොවට පැමිණේ නම් ''භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සුපිළිපන් ය ... ලොවට අනුතුරු පින්කෙතැ යි සඟන කෙරෙහි එබඳු ගුණ දන පැහැදීමෙක් ඔහුට ඇත.

යථාරූපෙන ඛො ආවුසො, දුස්සීල්‍යෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති තථාරූපස්ස දුස්සීල්‍යං න හොති. යථාරූපෙහි ච ඛො ආවුසො, අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො සුතවා අරියසාවකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. තථාරූපානිස්ස අරියකන්තානි සීලානි හොන්ති "අඛණ්ඩානි -පෙ- සමාධිසංවත්තනිකානි." ඉමෙසං ඛො ආවුසො, චතුන්නං ධම්මානං පහානා ඉමෙසං චතුන්නං ධම්මානං සමන්නාගමනහෙතු එවමයං පජා භගවතා ව්‍යාකතා "සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති.

## 11. 2. 4

### දුග්ගතිසුත්තං

3782. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සබ්බදුග්ගතිභයං[1] සමතික්කන්තො හොති. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සබ්බදුග්ගතිභයං සමතික්කන්තො හොතීති.

## 11. 2. 5

### විනිපාතසුත්තං

3783. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සබ්බදුග්ගතිවිනිපාතභයං සමතික්කන්තො හොති. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සබ්බදුග්ගතිවිනිපාතභයං සමතික්කන්තො හොතීති.

## 11. 2. 6

### මිත්තාමච්චසුත්තං

3784. යෙ[2] හි භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ, යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චා[3] වා ඤාතී වා සාලොහිතා වා, තෙ වො භික්ඛවෙ, චතූසු සොතාපත්තියඞ්ගෙසු සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා. කතමෙසු චතූසු: බුද්ධෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා -පෙ- "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා -පෙ-

1. සබ්බදුග්ගතිවිනිපාතභයං - සී 2.
2. සෙකෙ - මජ්සං - සතා
3. මච්ච - සීමු

ඇවැත්නි, යම්බඳු දුසිල්බවෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුග්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු දුසිල් බවෙක් ඔහුට නැත. ඇවැත්නි, යම් බඳු ආර්‍ය්‍යකාන්තශීලයන්ගෙන් සමන්වාගත ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණේ නම් අඛණ්ඩ වූ ...සමාධිසංවර්තනික වූ එබඳුආර්‍ය්‍ය-කාන්තශීලයෝ ඔහුට වෙති ඇවැත්නි, මේ සිවුදහම් දුරුලීමෙන් මේ සිවුදහමින් යුතු වීම හෙතු කොට මෙසේ මේ ප්‍රජාව විවස ව නොහෙතසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද යි.

## 11. 2. 4

## දුග්ගති සූත්‍රය

3782. මහණෙනි, සිවුදහමෙකින් යුතු අරිසවු සියලු දුගතිබිය ඉක්ම වූයේ වෙයි. කවර සිවුදහමෙකින යත්: මහණෙනි, මෙහි අරිසවු-ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙව්මිනිසුන්ට ශාස්තෲහ. බුද්ධයහ. භගවත්හ යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්‍මයෙහි.. සඞසයා කෙරෙහි...අඛණ්ඩ වූ...සමාධිය පිණිස පවත්නා වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. මහණෙනි, මේ සිවුදහමින් යුතු අරිසවු සියලු දුගතිබිය ඉක්ම වූයේ වේ යි.

## 11. 2. 5

## විනිපාත සූත්‍රය

783. මහණෙනි, සිවුදහමෙකින් යුත් අරිසවු සියලු දුගති-විනිපාතබිය ඉක්ම වූයේ වෙයි. කවර සිවුදහමෙකින යත්: මහණෙනි, මෙහි අරිසවු ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු දෙව්මිනිසුන්ට ශාස්තෲහ. බුද්ධයහ. භාග්‍යවත්හ යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්‍මයෙහි ... සඞ්ඝයා කෙරෙහි... අඛණ්ඩ වූ ...සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. මහණෙනි, මේ සිවුදහමෙන් යුතු අරිසවු සියලු දුගති විනිපාතබිය ඉක්ම වූයේ වේ යි.

## 11. 2. 6

## මිත්තාමච්ච සූත්‍රය

3784. මහණෙනි, යම් කෙනකුන්ට අනුකම්පා කරන්නාහු නම්, මිතුරු වූ හෝ සගයහළු වූ හෝ නෑ වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනකුන් ඇහුම්කන් දියයුතු ය යි හඟනාහු නම් තොප විසින් ඔහු සිවු සෝවන් අඟෙහි සමාදන් කරවියයුතු ය. වැස්වියයුතු ය. පිහිටුවියයුතු ය. කවර සිවු සෝවන් අඟෙහි යත්: ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු .. දෙව්මිනිසුන්ට ශාස්තෲහ. බුද්ධහ. භගවත්යහ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පහැදීමෙහි සමාදන් කරවියයුතු ය..

"ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා -පෙ- සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. අරියකන්තෙසු සීලෙසු සමාදපෙතබ්බා -පෙ- අඛණ්ඩෙසු -පෙ- සමාධිසංවත්තනිකෙසු. යෙ[1] භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චා[2] වා ඤාතී වා සාලොහිතා වා තෙ වො භික්ඛවෙ, ඉමෙසු චතූසු සොතාපත්තියඞ්ගෙසු සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බාති.

## 11. 2. 7

## දුතිය මිත්තාමච්චසුත්තං

3785. යෙ හි භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා. තෙ වො භික්ඛවෙ, චතූසු සොතාපත්තියඞ්ගෙසු සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා. කතමෙසු චතූසු: බුද්ධෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා -පෙ- "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. සියා භික්ඛවෙ, චතුන්නං මහාභූතානං අඤ්ඤථත්තං පඨවීධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා. නත්වෙව බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතස්ස අරියසාවකස්ස සියා අඤ්ඤථත්තං. තත්‍රිදං අඤ්ඤථත්තං: "සො වත බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො අරියසාවකො නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජිස්සතී"ති නෙතං ඨානං විජ්ජති. ධම්මෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා -පෙ- සඞ්ඝෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා -පෙ- අරියකන්තෙසු සීලෙසු සමාදපෙතබ්බා -පෙ- අඛණ්ඩෙසු -පෙ- සමාධිසංවත්තනිකෙසු. සියා භික්ඛවෙ, චතුන්නං මහාභූතානං අඤ්ඤථත්තං: "පඨවීධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා." නත්වෙව අරියකන්තෙහි සීලෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස සියා අඤ්ඤථත්තං. තත්‍රිදං අඤ්ඤථත්තං; "සො වත අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො අරියසාවකො නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජිස්සතී"ති නෙතං ඨානං විජ්ජති. යෙ භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ, යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං, මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා. තෙ වො භික්ඛවෙ, ඉමෙසු චතූසු සොතාපත්තියඞ්ගෙසු සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා"ති.

---

1. යෙකෙ – මජසං, සයා.
2. මච්චා – සිමු.

''ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාත ය.. නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු ය''යි දහම්හි ගුණ දැන පැහැදීමෙහි සමාදන් කරවියයුතු ය...''භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝයා සුපිළිපන් ය... ලොවට අනුතුරු පින්කෙතැ''යි සඟන කෙරෙහි ගුණ දැන පැහැදීමෙහි සමාදන් කරවියයුතු ය...අඛණ්ඩ වූ...සමාධිය පිණිස පවත්නා වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙහි සමාදන් කරවියයුතු ය... මහණෙනි, යම් කෙනෙකුන්ට අනුකම්පා කරන්නාහු නම්, මිතුරු වූ හෝ සගයහළු වූ හෝ නෑ වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනකුන් ඇහුම්කන් දියයුතු ය යි හඟනාහු නම් මහණෙනි, තොප විසින් ඔහු මේ සිවු සෝවන් අඟෙහි සමාදන් කරවියයුතු ය, වැස්වියයුතු ය. පිහිටුවියයුතු ය යි.

## 11. 2. 7

## දුතිය මිත්තාමච්ච සූත්‍රය

3785. මහණෙනි, යම් කෙනකුන්ට අනුකම්පා කරන්නාහු නම් මිතුරු වූ හෝ සගයහළු වූ හෝ නෑ වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනකුන් ඇහුම්කන් දියයුතු ය යි හඟනාහු නම් මහණෙනි, තොප විසින් ඔහු සිවු සෝවන් අඟෙහි සමාදන් කරවියයුතුවහ. වැස්වියයුතුවහ. පිහිටුවියයුතුවහ. කවර සිවුසෝවන් අඟෙහි යත්: ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙවිමිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙහි සමාදන් කරවියයුතුය...මහණෙනි, පඨවිධාතුවෙත් ආපොධාතුවෙත් තෙජොධාතුවෙත් වායොධාතුවෙත් යන සිවුමහාභූතයන්ගේ වෙනස් බවෙක් වන්නේ ය. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු අරිසවුහුගේ වෙනස් බවෙක් නො ම වන්නේ ය. මේ එහි වෙනස් බව යි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු ඒ අරිසවු නිරයට හෝ තිරිසන් යොනට හෝ ප්‍රෙතවිෂයට හෝ පැමිණෙන්නේ ය යන මෙකරුණ එකන්තෙන් නැත. දහම්හි ගුණ දැන පැහැදීමෙහි සමාදන් කරවියයුතු ය...සඟන කෙරෙහි ගුණ දැන පැහැදීමෙහි සමාදන් කරවියයුතු ය...අඛණ්ඩ වූ...සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙහි සමාදන් කරවියයුතු ය...මහණෙනි, පඨවිධාතුවෙත් ආපොධාතුවෙත් තෙජො-ධාතුවෙත් වායොධාතුවෙත් යන සිවුමහාභූතයන්ගේ වෙනස් බවෙක් වන්නේ ය. ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත අරිසවුහුගේ වෙනස් බවෙක් නො ම වන්නේ ය. මේ එහි වෙනස් බවයි. ආර්‍ය්‍යකාන්ත-ශීලයෙන් සමන්වාගත ඒ ආර්‍ය්‍යශ්‍රාවක නිරයට හෝ තිරිසන්යොනට හෝ ප්‍රෙතවිෂයට හෝ පැමිණෙන්නේ ය යන මෙකරුණ එකන්තෙන් නැත. මහණෙනි, යම් කෙනකුන්ට අනුකම්පා කරන්නාහු නම් මිතුරු වූ හෝ සගයහළු වූ හෝ නෑ වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනකුන් ඇහුම්කන් දියයුතු ය යි හඟනාහු නම් මහණෙනි, තොප විසින් ඔහු මේ සිවුසෝවන් අඟෙහි සමාදන් කරවියයුතුවහ. වැස්වියයුතුවහ. පිහිටුවියයුතු හ යි.

## 11. 2. 8

## දෙවචාරිකසුත්තං

3786. එකං සමයං ආයස්මා මහාමොග්ගල්ලානො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. අථ ඛො සම්බහුලා තාවතිංසකායිකා දෙවතායො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා දෙවතා ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

සාධු ඛො ආවුසො, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො ආවුසො, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො ආවුසො, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො ආවුසො, අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති, අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

## 11. 2. 8

## දේවචාරික සූත්‍රය

3786. එක්සමයෙක ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ සැවත් නුවර අනේපිඩුසිටුහුගේ දෙව්රමෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ දිගු කළ අතක් හකුළුවන්නේ හෝ වේ නම් එසෙයින් ම ජේතවනයෙහි අතුරුදන් වූවෝ තවුතිසාදෙව්ලොව පහළ වූහ. එකල්හි තවුතිසාවැසි බොහෝ දෙවියෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස් ව සිටියහ. එකත්පස්ව සිටි ඒ දෙවියන්ට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ:

ඇවැත්නි, ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙවිමිනිසුන්ට ශාස්තෲහ. බුද්ධය හ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම යහපත් ම වේ. ඇවැත්නි, බුදුරජාණන්වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති. ඇවැත්නි, ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් දෙශනා කරන ලද්දේ ය...නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු ය''යි දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම යහපත් ම වේ. ඇවැත්නි, දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය... ලොකයාට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍රය'' යි සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම යහපත් ම වේ. ඇවැත්නි, සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති. ඇවැත්නි, අඛණ්ඩ වූ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම යහපත් ම වේ. ඇවැත්නි, ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු දෙවිමිනිසුන්ට ශාස්තෲහ. බුද්ධයහ. භගවත්හ යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතුවීම යහපත් ම වේ. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතුවීමහෙතු කොට මෙසේමෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, ධර්මයෙහි...සඞ්ඝයා කෙරෙහි... අඛණ්ඩ වූ...සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතුවීම යහපත් ම වේ. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.



Free Distribution www.aathaapi.org

## 11. 2. 9

## දුතිය දෙවචාරිකසුත්තං

3787. එකං සමයං ආයස්මා මහාමොග්ගල්ලානො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො -පෙ- දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. අථ ඛො සම්බහුලා තාවතිංසකායිකා දෙවතායො -පෙ- ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: "සාධු ඛො ආවුසො, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො ආවුසො, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි, අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

## 11. 2. 10

## තතිය දෙවචාරිකසුත්තං

3788. අථ ඛො භගවා සෙය්‍යථාපි නාම බලවා පුරිසො -පෙ- එවමෙවං[1] ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. අථ ඛො සම්බහුලා තාවතිංසකායිකා දෙවතායො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා දෙවතායො භගවා එතදවොච: සාධු ඛො ආවුසො, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සොතාපන්නා[2] අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා. සාධු ඛො ආවුසො, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො ආවුසො, එවමිධෙකච්චෙ සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණාති.

1. එවමෙව - මජසං, සයා.
2. එවමිධෙකච්චෙ සත්තා සොතාපන්නා - මජසං, සයා.

## 11. 2. 9

## දුතිය දෙවචාරික සූත්‍රය

3787. එක්සමයෙක ආයුෂ්මත් **මහමුගලන් තෙරණුවෝ** සැවත් නුවර **අනේපිඩුසිටුහුගේ දෙව්රම්හි** වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ යම්සේ බලවත් පුරුෂයෙක්...**තවුතිසා දෙව්ලොව** පහළ වූහ. එකල්හි බොහෝ වූ තව්තිසාවැසි දෙවියෝ... ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදළහ. ඇවැත්නි; ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම යහපත් ම වේ. ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණියහ. ඇවැත්නි, ධර්මයෙහි...සඞ්ඝයා කෙරෙහි...අඛණ්ඩ වූ...සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම යහපත් ම වේ. ඇවැත්නි, ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණියහ යි.

නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු දු...දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම යහපත් ම වේ. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණියහ. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, ධර්මයෙහි...සඞ්ඝයා කෙරෙහි...අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම යහපත් ම වේ. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණියහ යි.

## 11. 2. 10

## තතිය දෙවචාරික සූත්‍රය

3788. එකල්හි භාග්‍යවතුන් වහන්සේ යම්සේ බලවත් පුරුෂයෙක්... එසෙයින් ම **ජෙතවනයෙහි** අතුරුදන් වූ සේක් තවුතිසා දෙව්ලොව පහළ වූ සේක. එකල්හි බොහෝ වූ තවුතිසාවැසි දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව සිටියහ. එකත්පස් ව සිටි ඒ දෙවියන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: ඇවැත්නි, ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මනා ම වේ. ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම්හු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්හ. ඇවැත්නි, ධර්මයෙහි...සඞ්ඝයා කෙරෙහි... අඛණ්ඩ වූ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම මනා ම වේ. ඇවැත්නි, ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වීම හෙතු කොට මෙසේ මෙහි ඇතැම්හු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්හ යි.

සාධු ඛො මාරිස, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "ඉතිපි සො භගවා —පෙ— සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස, එවමයං පජා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා. සාධු ඛො මාරිස, ධම්මෙ —පෙ— සඞ්ඝෙ —පෙ— අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි —පෙ— සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස, එවමයං පජා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණාති.

## රාජකාරාමවග්ගො දුතියො.

**තත්‍රුද්දානං:**

සහස්සබ්‍රාහ්මණානන්දා දුග්ගති ච විනිපාතො,
මිත්තාමච්චා දුවෙ වුත්තා තයො ච දෙවචාරිකාති.

Free Distribution www.aathaapi.org

නිදුකාණෙනි වහන්ස, "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු... දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මනා ම වේ. නිදුකාණන් වහන්ස, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදී මෙන් යුතු වීම හෙතු කොට මෙසේ මේ ප්‍රජාව විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. නිදුකාණන් වහන්ස, ධර්මයෙහි.. සඞ්ඝයා කෙරෙහි.. අඛණ්ඩ වූ.. සමාධි සංවර්තනික වූ ආර්‍යයකාන්ත ශීලයෙන් යුතු වීම මනා ම වේ. නිදුකාණන් වහන්ස, ආර්‍යයකාන්තශීලයෙන් යුතු වීම හෙතු කොට මෙසේ මේ ප්‍රජාව විවස ව නො හෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ යි.

## දෙවෙනි රාජකාරාම වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

සහස්ස, බ්‍රාහ්මණ, ආනන්ද, දුග්ගති, විනිපාත යි පසෙක් ද මිත්තාමච්ච සූත්‍ර දෙකෙක් ද දෙවචාරික සූත්‍ර තුනෙක් ද කියන ලදහ (මුළුල්ල දශයෙකි).

# 3. සරකානි[1]වග්ගො

## 11. 3. 1

### මහානාමසුත්තං

3789. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉදං භන්තෙ, කපිලවත්ථු ඉද්ධඤ්චෙව ඵීතඤ්ච බාහුජඤ්ඤං[2] ආකිණ්ණමනුස්සං සම්බාධබ්‍යූහං[3]. සො ඛවාහං භන්තෙ, භගවන්තං පයිරුපාසිත්වා මනොභාවනීයං වා භික්ඛුං,[4] සායන්හසමයං කපිලවත්ථුං පවිසන්තො භන්තෙනපි* හත්ථිනා සමාගච්ඡාමි. භන්තෙනපි අස්සෙන සමාගච්ඡාමි. භන්තෙනපි රථෙන සමාගච්ඡාමි. භන්තෙනපි සකටෙන සමාගච්ඡාමි. භන්තෙනපි පුරිසෙන සමාගච්ඡාමි. තස්ස මය්හං භන්තෙ, තස්මිං සමයෙ මුස්සතෙව භගවන්තං ආරබ්භ සති. මුස්සති ධම්මං ආරබ්භ සති මුස්සති සඞ්ඝං ආරබ්භ සති. තස්ස මය්හං භන්තෙ, එවං හොති: "ඉමම්හි චාහං සමයෙ කාලං කරෙය්‍යං කා මමස්ස[5] ගති, කො අභිසම්පරායො"ති?

මා භායි මහානාම, මා භායි මහානාම අපාපකං තෙ මරණං භවිස්සති, අපාපිකා කාලකිරියා[6]. යස්ස කස්සචි මහානාම, දීඝරත්තං සද්ධාපරිභාවිතං චිත්තං, සීලපරිභාවිතං චිත්තං, සුතපරිභාවිතං චිත්තං, චාගපරිභාවිතං චිත්තං, පඤ්ඤාපරිභාවිතං චිත්තං, තස්ස යො හි ඛවායං කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදන-කුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො, තං ඉධෙව[7] කාකා වා ඛාදන්ති, ගිජ්ඣා වා ඛාදන්ති, කුලලා වා ඛාදන්ති, සුපානා[8] වා ඛාදන්ති, සිගාලා වා ඛාදන්ති, විවිධා වා පාණකජාතා ඛාදන්ති. යඤ්ච ඛ්වස්ස චිත්තං දීඝරත්තං සද්ධාපරිභාවිතං, සීලපරි-භාවිතං, සුතපරිභාවිතං, චාගපරිභාවිතං, පඤ්ඤාපරිභාවිතං, තං උද්ධංගාමී හොති විසෙසගාමී.

---

1. සරණානි – මජසං.
2. බහුජනං – සීමු, සී 2.
3. සම්බාධව්‍යූහං – සයා.
4. මනො භාවනීයෙ වා භික්ඛූ – මජසං, සයා.
5. කා මය්හං – මජසං, සයා,
6. කාලංකිරියා – මජසං.
7. ඉධෙව – සයා.
8. සුනඛා – මජසං, සයා.
* විහරන්තෙන – අට්ඨකථා.

# 3. සරකානි වර්ගය

## 11. 3. 1

## මහානාම සූත්‍රය

3789. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යදනව්වෙහි කිඹුල්වත්** නුවර සමීපයෙහි **නිග්‍රෝධාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි **මහානාම** ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ''මේ කිඹුල්වත්නුවර සමෘද්ධ ද (පළන් අබරණින්) පිණාගියේ ද බොහෝ දෙනාට හිත ද ගැවසුණු මිනිසුන් ඇත්තේ ද හැසුණු වීථි ඇත්තේ ද වෙයි. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ හෝ කුසල්සිත වඩන මහණ කෙනකුන් හෝ ඇසුරු කොට සවස්කල කිඹුල්වතට පිවිසෙනුයෙම් නොසන්හුන් ව හැසිරෙන ඇතකු සමගත් එක් වෙමි. නොසන්හුන් ව හැසිරෙන අසකු සමගත් එක් වෙමි. නොසන්හුන් ව හැසිරෙන රියක් සමගත් එක් වෙමි. නොසන්හුන් ව හැසිරෙන ගැළක් සමගත් එක් වෙමි. නොසන්හුන් ව හැසිරෙන පුරුෂයෙකු සමගත් එක් වෙමි. වහන්ස, එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ඇරබ පැවැති ඒ මාගේ සිහිය මුළා වේ මැ යි. දහම් ඇරබ පැවැති සිහිය මුළා වේ මැ යි. සඟන ඇරබ පැවැති සිහිය මුළා වේ මැ යි. වහන්ස, ඒ මට මෙබඳු සිතෙක් වෙයි: ''මෙසමයෙහි මම කලුරිය කරන්නෙම් නම් මා ගේ ගතිය කුමක් වන්නී ද, පරලොව කිමෙක් වන්නේ ද''යි?

මහානාම, නො බව, මහානාම නො බව. තොපගේ මරණය අලාමක වන්නේ ය, කාලක්‍රියාව අලාමක වන්නී ය. මහානාම, යම් කිසිවකුගේ සිත දිගුකලක් සැදැහැයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, සිත ශීලයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, සිත ශ්‍රුතයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, සිත ත්‍යාගයෙන් හාත්පසින් වඩනා ලද්දේ ,, සිත ප්‍රඥායෙන් හාත්පසින් වඩනා ලද්දේද, ඔහුගේ රූපවත් ශරීරයෙක් සතර මහාභූතයෙන් නිපන්නේ මවුපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් උපන්නේ යම් බතින් හා කොමුයෙන් වැඩුණේ නිරතුරු උලන පිරිමදින බිඳෙන වැනසෙන දහම් ඇත්තේ වේ ද එය මෙහි ම කවුඩෝ හෝ කති. ගිජුලිහිණියෝ හෝ කති. උකුස්සෝ හෝ කති. ශුනකයෝ හෝ කති. සිවල්ලු හෝ කති. නන්වැදෑරුම් ප්‍රාණීහු හෝ කති. ඔහුගේ යම් සිතෙක් වූ කලී දිගුකලක් මුළුල්ලෙහි සැදැහැයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, ශීලයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, ශ්‍රුතයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, ත්‍යාගයෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, ප්‍රඥායෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, එය උඩුහුරුව යනසුලු වෙයි. වෙසෙස් බැව් කරා යනසුලු වේ.

සෙය්‍යථාපි මහානාම, බලවා පුරිසො සප්පිකුම්භං වා තෙලකුම්භං වා ගම්භීරං උදකරහදං ඔගාහෙත්වා භින්දෙය්‍ය, තත්‍ර යාස්ස[1] සක්ඛරා වා කඨලා වා සා අධොගාමී අස්ස. යඤ්ච ඛ්වස්ස තත්‍ර සප්පි වා තෙලං වා තං උද්ධඞ්ගාමී අස්ස විසෙසගාමී. එවමෙව ඛො මහානාම, යස්ස කස්සචි දීඝරත්තං සද්ධාපරිභාවිතං චිත්තං සීල -පෙ- සුත -පෙ- චාග -පෙ- පඤ්ඤාපරිභාවිතං චිත්තං, තස්ස යො හි ඛ්වායං කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො, තං ඉධෙව කාකා වා ඛාදන්ති, ගිජ්ඣා වා ඛාදන්ති, කුලලා වා ඛාදන්ති, සුපානා වා ඛාදන්ති, සිගාලා වා ඛාදන්ති, විවිධා වා පාණකජාතා ඛාදන්ති. යඤ්ච ඛ්වස්ස චිත්තං සද්ධාපරිභාවිතං -පෙ- පඤ්ඤාපරිභාවිතං චිත්තං. තං උද්ධඞ්ගාමී හොති විසෙසගාමී. තුය්හං ඛො පන මහානාම, දීඝරත්තං සද්ධාපරිභාවිතං චිත්තං -පෙ- පඤ්ඤාපරිභාවිතං චිත්තං මා භායි මහානාම, මා භායි මහානාම, අපාපකං තෙ මරණං භවිස්සති. අපාපිකා කාලකිරියාති.

## 11. 3. 2

## දුතිය මහානාමසුත්තං

3790. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉදං[2] භන්තෙ, කපිලවත්ථු ඉද්ධඤ්චෙව ඵීතඤ්ච බාහුජඤ්ඤං ආකිණ්ණමනුස්සං සම්බාධබ්‍යූහං. සො ඛ්වාහං භන්තෙ, භගවන්තං වා පයිරුපාසිත්වා මනොභාවනීයෙ වා භික්ඛූ, සායන්හසමයං කපිලවත්ථුං පවිසන්තො භන්තෙනපි හත්ථිනා සමාගච්ඡාමි. භන්තෙනපි අස්සෙන සමාගච්ඡාමි. භන්තෙනපි රථෙන සමාගච්ඡාමි. භන්තෙනපි සකටෙන සමාගච්ඡාමි. භන්තෙනපි පුරිසෙන සමාගච්ඡාමි. තස්ස මය්හං භන්තෙ, තස්මිං සමයෙ මුස්සතෙව භගවන්තං ආරබ්භ සති, මුස්සති ධම්මං ආරබ්භ සති, මුස්සති සඞ්ඝං ආරබ්භ සති. තස්ස මය්හං භන්තෙ, එවං හොති: "ඉමම්හි චාහං සමයෙ කාලඞ්කරෙය්‍යං කා මමස්ස ගති, කො අභිසම්පරායො''ති?

1. යා අස්ස - මජසං, ස්‍යා.
2. ඉධ - සී 2.

මහානාම යම්සේ බලවත් පුරුෂයෙක් ගිතෙල් කළයක් හෝ තෙල් කළයක් හෝ ගැඹුරු දියවිලකට බස්වා බිඳින්නේ ද, එහි යම් කැට හෝ කැබලිති හෝ වන්නේ නම් එය යටට යනසුලු වන්නේ ය. එහි යම් ගිතෙල් හෝ තෙල් හෝ වන්නේ නම් එය උඩුහුරු ව යනසුලු වෙසෙස් ව යනසුලු වන්නේ ය. මහානාම එසෙයින් ම යම් කිසිවකුගේ සිත දිගු කලක් මුළුල්ලෙහි සැදැහැයෙන් හාත්පසින් වඩන ලද්දේ ද, සිත ශීලයෙන්... ශ්‍රැතයෙන්...ත්‍යාගයෙන්...ප්‍රඥායෙන් හාත්පසින් වඩන ලද්දේ ද ඔහුගේ යම් රූපවත් වූ, ශරීරයෙක් සතර මහාභූතයෙන් නිපන්නේ මවුපියන්ගේ ශුක්‍රශොණිතයෙන් උපන්නේ බතින් හා කොමුයෙන් වැඩුණේ නිරතුරු උලන පිරිමදින බිඳෙන වැනසෙන දහම් ඇත්තේ වේද,එය මෙහි ලා කවුඩෝ හෝ කති. ගිජුලිහිණියෝ හෝ කති. උකුස්සෝ හෝ කති. ශුනකයෝ හෝ කති. සිවල්ලු හෝ කති. නන්වැදෑරුම් ප්‍රාණීහු හෝ කති. ඔහුගේ යම් සිතෙක් දිගුකලක් මුළුල්ලෙහි සැදැහැයෙන් හාත්පසින් වඩන ලද ද...සිත නුවණින් හාත්පසින් වඩන ලද ද එය උඩුහුරු ව යනසුලු වෙසෙස් ව යනසුලු වෙයි. මහානාම, තොපගේ සිත දිගුකලක් මුළුල්ලෙහි සැදැහැයෙන් හාත්පසින් වඩනා ලද්දේ ය...සිත නුවණින් හාත්පසින් වඩනා ලද්දේ ය. මහානාම, නොබිව, මහානාම. නො බව, තොපගේ මරණ ය අලාමක වන්නේ, ය. කාලක්‍රියාව අලාමක වන්නී යි.

## 11. 3. 2

## ද්‍රුතිය මහානාම සූත්‍රය

3790. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යදනව්වෙහි කිඹුල්-වත් පුර නිග්‍රොධාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි **මහානාමශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ** ය...එකත්පස් ව හුන් මහා-නාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, මේ කිඹුල්වත්පුරය සමෘද්ධ ද (පලන් අබරණින්) පිණාගියේ ද, බොහෝ දෙනාට හිත ද, ගැවසුණු මිනිසුන් ඇත්තේ ද, හැසුණු වීථි ඇත්තේ ද වෙයි. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ හෝ කුසල්සිත වඩන මහණ කෙනකුන් හෝ ඇසුරු කොට සවස් කල කිඹුල් වත්ට පිවිසිනුයෙම් නොයන්හුන්ව හැඩිරෙන ඇතකු සමගත් එක් වෙමි. නොසන්සුන් ව හැසිරෙන අසකු සමගත් එක් වෙමි. නොසන් සුන් ව හැසිරෙන රියක් සමගත් එක් වෙමි. නොසන්හුන් ව හැසිරෙන ගැළක් සමගත් එක් වෙමි. නොසන්හුන් ව හැසිරෙන මිනිසකු සමගත් එක් වෙමි. වහන්ස, එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ඇරබ පැවැති ඒ මාගේ සිහිය මුළා වේ මැ යි. දහම් ඇරබ පැවැති සිහිය මුළා වේ මැ යි. සඟන ඇරබ පැවැති සිහිය මුළා වේ මැයි. වහන්ස, ඒ මට මෙබඳු සිතෙක් වෙයි: ''ඉදින් මෙසමයෙහි ''මම කලුරිය කරන්නෙම් නම් මාගේ ගතිය කුමක් වන්නී ද? පරලොව කිමෙක් වන්නේ දැ''යි?

මා භායි මහානාම මා භායි, මහානාම, අපාපකං තෙ මරණං භවිස්සති, අපාපිකා කාලකිරියා. චතූහි ඛො මහානාම, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කතමෙහි චතූහි: ඉධ මහානාම, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. සෙය්‍යථාපි මහානාම, රුක්ඛො පාචීනනින්නො පාචීනපොණො පාචීනපබ්භාරො, සො මූලෙ ඡින්නො කතමෙන පපතෙය්‍යාති[1]? යෙන භන්තෙ, නින්නො යෙන පොණො යෙන පබ්භාරොති. එවමෙව ඛො මහානාම, ඉමෙහි චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 11. 3. 3

## තතිය මහානාමසුත්තං

3791. එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ**. අථ ඛො **මහානාමො** සක්කො යෙන **ගොධා** සක්කො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ගොධං සක්කං එතදවොච: "කතිහි ත්වං ගොධෙ, ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාසි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණන්ති"? තීහි ඛ්වාහං මහානාම, ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණං. කතමෙහි තීහි: ඉධ මහානාම, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. ඉමෙහි ඛො'හං මහානාම, තීහි ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණං.

ත්වං පන මහානාම, කතිහි ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාසි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණන්ති? චතූහි ඛ්වාහං භො ගොධෙ, ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණං කතමෙහි චතූහි: ඉධ භො ගොධෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති"ති ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛ්වාහං ගොධෙ චතූහි ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි. අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණන්ති. ආගමෙහි ත්වං මහානාම, ආගමෙහි ත්වං මහානාම, භගවාව එතං ජානෙය්‍ය එතෙහි ධම්මෙහි සමන්නාගතං වා අසමන්නාගතං වාති. ආයාම ගොධෙ, යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යාම උපසඞ්කමිත්වා[2] භගවතො එතමත්ථං ආරොචෙස්සාමාති.

---

1. මූලෙ ඡින්නො - ස්‍යා, මූලච්ඡින්නො - මජසං. 2. උපසඞ්කමම - සීමු, සී. 2

මහානාම නො බව, මහානාම නො බව. තොපගේ මරණය අලාමක වන්නේ ය. කාලක්‍රියාව අලාමක වන්නී ය. මහානාම, සිවුදහමකින් යුතු අරිසවු තෙමේ නිවණට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. කවර සිවුදහමෙකින යත්: මහානාම මෙහි අරිසවු තෙමේ ''එ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම් කෙරෙහි.. සඟන කෙරෙහි...අඛණ්ඩ වූ...සමාධිය පිණිස පවත්නා වූ ආයඞීකාන්ත ශීලයෙන් යුතු වූයේ වෙයි. මහානාම, යම්සේ පෙරදිගට නැමුණ පෙරදිගට නැඹුරු වූ පෙරදිගට බර වූ රුකෙක් වේ ද, එය මුලින් සිඳින ලද්දේ කවර දිගකට වැටෙන්නේ ද යි? වහන්ස, නැමුණු දිගට නැඹුරු වූ දිගට බර වූ දිගට ය. මහානාම, එසෙයින් ම මේ සිවුදහමින් යුතු අරිසවු තෙමේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි.

## 11. 3. 3

## තතිය මහානාම සූත්‍රය

3791. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යදනව්වෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි **මහානාමශාක්‍යතෙමේ ගොධාශාක්‍යයන්** වෙත එළඹියේ ය. එළඹ ගොධාශාක්‍යයන්ට මෙය කී ය: ගොධාවෙනි, ''කෙපි විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුහුලා කෙතෙක් දහමින් යුතු ය''යි දනිවූ ද යි? මහානාමයෙනි, ''විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුහුලා තුන් දහමෙකින් යුතු ය''යි මම දනිමි. කවර තුනෙකින යත්: මහානාමයෙනි, ''මෙහි අරිසවු තෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු... දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම්හි...භාග්‍යවතුන් වහන්සේ ගේ සවුසඟන සුපිළිපන් ය ... ලොවට අනුතුරු පින්කෙතැ''යි සඟන කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මහානාමයෙනි, ''විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුහුලා මේ තුන්දහමින් යුතු ය''යි මම දනිමි.

මහානාමයෙනි, ''විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුහුලා කෙතෙක් දහමින් යුතු ය''යි තෙපි දනිවූ ද යි? භවත් ගොධාවෙනි, විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුහුලා සිවු දහමෙකින් යුතු යයි මම දනිමි. කවර සිවු දහමෙකින යත්: භවත් ගොධාවෙනි, මෙහි අරිසවු ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු දු... දෙව්මිනිසුන්ට, ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම්,කෙරෙහි ... සඟන කෙරෙහි ... අඛණ්ඩ වූ සමාධිසංවර්තනික වූ ආයඞීකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. ගොධාවෙනි, විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුහුලා මේ සිවු දහමින් යුතු ය යි මම දනිමි යි. මහානාමයෙනි, තෙපි ඉවසවු. මහානාමයෙනි, තෙපි ඉවසවූ. ''මේ දහමින් යුතු හෝ නොයුතු හෝ ''යි භාග්‍යවතුන් වහන්සේ ම මෙය දන්නා සේකැ''යි. ගොධාවෙනි, යමු, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙම්හ. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැල කරම්හ''යි.

අථ ඛො මහානාමො ච සක්කො ගොධා ච සක්කො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉධාහං භන්තෙ, යෙන ගොධා සක්කො තෙනුපසඞ්කමිං උපසඞ්කමිත්වා ගොධං සක්කං එතදවොචං: කතිහි ත්වං ගොධෙ, ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාසි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණන්ති? එවං වුත්තෙ භන්තෙ, ගොධා සක්කො මං එතදවොච:

තීහි ඛ්වාහං මහානාම, ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණං. කතමෙහි තීහි: ඉධ මහානාම, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. ඉමෙහි ඛ්වාහං මහානාම, තීහි ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණං. ත්වං පන මහානාම, කතිහි ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාසි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණන්ති? එවං වුත්තෙ'හං[1] භන්තෙ, ගොධං සක්කං එතදවොචං:

චතූහි ඛ්වාහං ගොධෙ, ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණං. කතමෙහි චතූහි: ඉධ ගොධෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛ්වාහං ගොධෙ, චතූහි ධම්මෙහි සමන්නාගතං සොතාපන්නං පුග්ගලං ආජානාමි අවිනිපාතධම්මං නියතං සම්බොධිපරායණන්ති. එවං වුත්තෙ භන්තෙ, ගොධා සක්කො මං එතදවොච:

ආගමෙහි ත්වං මහානාම, ආගමෙහි ත්වං මහානාම, භගවාව එතං ජානෙය්‍ය එතෙහි ධම්මෙහි සමන්නාගතං වා අසමන්නාගතං වාති. ඉධ භන්තෙ, කොචිදෙව ධම්මසමුප්පාදෙ[2] උප්පජ්ජෙය්‍ය එකතො අස්ස භගවා, එකතො භික්ඛුසඞ්ඝො ච. යෙනෙව භගවා තෙනෙවාහං අස්සං. එවං පසන්නං මං භන්තෙ, භගවා ධාරෙතු.

ඉධ භන්තෙ, කොචිදෙව ධම්මසමුප්පාදෙ[2] උප්පජ්ජෙය්‍ය එකතො අස්ස භගවා එකතො භික්ඛුසඞ්ඝො, එකතො භික්ඛුනීසඞ්ඝො ච, යෙනෙව භගවා තෙනෙවාහං අස්සං. එවං පසන්නං මං භන්තෙ, භගවා ධාරෙතු.

1. වුත්තාහං - මජසං, සයා.
2. ධම්මෙ සමුප්පාදෙ - මජසං.
3. භික්ඛුසඞ්ඝො භික්ඛුනීසඞ්ඝො ච - මජසං.

Free Distribution www.aathaapi.org

එකල්හි මහානාමශාක්‍ය තෙමේත් ගොධාශාක්‍ය තෙමේත් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, "මෙහි මම ගොධා ශාක්‍යයන් වෙත එළඹියෙමි. එළඹ ගොධාශාක්‍යයන්ට මෙය කීමි. ගොධාවෙනි; විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුඟුලා කෙතෙක් දහමින් යුතු ය"යි තෙපි දනිවු ද යි? වහන්ස එසේ කී කල්හි ගොධා ශාක්‍ය තෙමේ මට මෙය කීය:

"මහානාමයෙනි, විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුඟුලා තුන් දහමෙකින් යුතු යයි මම දනිමි. කවර තුන කින යත්: මහානාමයෙනි, මෙසස්නෙහි අරිසවු "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු .. දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ. භගවත්හ"යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම් කෙරෙහි .. භාග්‍යවතුන් වහන්සේ ගේ සවුසඟන සුපිළිපන් ය ... ලොවට අනුතුරු පින් කෙතැ"යි සඟන කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මහානාමයෙනි, විවස ව නො හෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුඟුලා මේ තුන් දහමින් යුතු ය"යි මම දනිමි. මහානාමයෙනි, තෙපි වනාහි "විවස ව නො හෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුඟුලා කෙතෙක් දහමින් යුතු යයි" දනිව් ද යි? වහන්ස, එසේ කී කල්හි ගොධා ශාක්‍යයන්ට මම මෙය කීමි;

ගොධාවෙනි, "විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුඟුලා සිවු දහමෙකින් යුතු ය"යි මම දනිමි. කවර සිවු දහමෙකින යත්: ගොධාවෙනි, "මෙහි අරිසවු තෙමේ ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු .. දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම් කෙරෙහි ... සඟන කෙරෙහි ... අඛණ්ඩ වූ.. සමාධි සංවර්තනික වූ ආර්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. ගොධාවෙනි, විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් පුඟුලා මේ සිවු දහමින් යුතු ය"යි මම දනිමි"යි. වහන්ස, එසේ කී කල්හි ගොධා ශාක්‍යයෝ මට මෙය කීහ:

මහානාමයෙනි, තෙපි ඉවසවු, මහානාමයෙනි, තෙපි ඉවසවු. "මේ දහමෙන් යුතු හෝ නොයුතු හෝ"යි මෙය භාග්‍යවතුන් වහන්සේ ම දැන වදරන සේක. වහන්ස, මෙහි කිසියම් කරුණෙක් උපදනේ ය. භාග්‍යවතුන් වහන්සේ එක්පසෙක වන සේක, බික්සඟන ද එක්පසෙක වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ යම් පසෙක වන සේක් නම් මමත් එහි ම වන්නෙමි. වහන්ස, මෙසේ පහන් වූ මා භාග්‍යවතුන් වහන්සේ දරන සේක්වා.

වහන්ස, මෙහි කිසියම් කරුණෙක් උපදනේ ය, භාග්‍යවතුන් වහන්සේ එක්පසෙක වන සේක. බික්සඟන එක්පසෙක ද මෙහෙණ සඟන එක් පසෙක ද වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ යම් පසෙක නම් මමත් එහි ම වන්නෙමි. වහන්ස, මෙසේ පහන් වූ මා භාග්‍යවතුන් වහන්සේ දරන සේක්වා.

ඉධ භන්තෙ, කොචිදෙව ධම්මසමුප්පාදෙ උප්පජ්ජෙය්‍ය. එකතො අස්ස භගවා, එකතො භික්ඛුසඞ්ඝො, එකතො භික්ඛුනීසඞ්ඝො, උපාසකා ච. යෙනෙව භගවා තෙනෙවාහං අස්සං, එවං පසන්නං මං භන්තෙ, භගවා ධාරෙතු.

ඉධ භන්තෙ, කොචිදෙව ධම්මසමුප්පාදෙ උප්පජ්ජෙය්‍ය. එකතො අස්ස භගවා, එකතො භික්ඛුසඞ්ඝො, එකතො භික්ඛුනීසඞ්ඝො, උපාසකා උපාසිකායො ච, යෙනෙව භගවා තෙනෙවාහං අස්සං එවං පසන්නං මං භන්තෙ, භගවා ධාරෙතු.

ඉධ භන්තෙ, කොචිදෙව ධම්මසමුප්පාදෙ උප්පජ්ජෙය්‍ය, එකතො අස්ස භගවා, එකතො භික්ඛුසඞ්ඝො, එකතො භික්ඛුනීසඞ්ඝො, උපාසකා උපාසිකායො සදෙවකො ච ලොකො[1] සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා. යෙනෙව භගවා තෙනෙවාහං අස්සං, එවං පසන්නං මං භන්තෙ, භගවා ධාරෙතූති.

එවංවාදී ත්වං ගොධ, මහානාමං සක්කං කිං වදෙසීති? එවංවාදහං භන්තෙ, මහානාමං සක්කං න කිඤ්චි වදමි අඤ්ඤත්‍ර කල්‍යාණා අඤ්ඤත්‍ර කුසලාති.

## 11. 3. 4

## සරකානිසුත්තං

3792. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන සරකානි[2] සක්කො කාලකතො හොති. සො භගවතා ව්‍යාකතො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති. තත්‍ර සුදං සම්බහුලා සක්කා සඞ්ගම්ම සමාගම්ම උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "අච්ඡරියං වත භො අබ්භුතං වත භො, එත්ථදානි කො න සොතාපන්නො භවිස්සති, යත්‍ර හි නාම සරකානි සක්කො කාලකතො, සො භගවතා ව්‍යාකතො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති. සරකානි සක්කො සික්ඛාදුබ්බල්‍යමාපාදි, මජ්ජපානං අපායී"ති.

1. සදෙවකො ලොකො - සිමු, සී 2.
2. සරණානි - මජසං.

වහන්ස, මෙහි කිසියම් කරුණෙක් උපදනේ ය. භාග්‍යවතුන් වහන්සේ එක්පසෙක වන සේක. භික්ෂුසඟන එක් පසෙක ද මෙහෙණ සඟනත් උවසුවෝත් එක්පසෙක ද වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ යම් පසෙක නම් මමත් එහි ම වන්නෙමි. වහන්ස, එසේ පහන් වූ මා භාග්‍යවතුන් වහන්සේ දරන සේක්වා.

වහන්ස, මෙහි කිසියම් කරුණෙක් උපදනේ ය. භාග්‍යවතුන් වහන්සේ එක්පසෙක වන සේක. භික්ෂුසඟන එක් පසෙක ද මෙහෙණ සඟනත් උවසුවෝත් උවැසියෝත් එක් පසෙක ද වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ යම් පසෙක නම් මමත් එහි ම වන්නෙමි. වහන්ස, මෙසේ පහන් වූ මා භාග්‍යවතුන් වහන්සේ දරන සේක්වා.

වහන්ස, මෙහි කිසියම් කරුණෙක් උපදනේ ය. භාග්‍යවතුන් වහන්සේ එක් පසෙක වන සේක. භික්ෂුසඟන එක්පසෙක ද මෙහෙණසඟනත් උවසුවෝත් උවැසියෝත් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයාත් මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාවත් එක්පසෙක ද වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ යම් පසෙක නම් මමත් එහි ම වන්නෙමි වහන්ස, මෙසේ පහන් වූ මා භාග්‍යවතුන් වහන්සේ දරන සේක්වා යි.

ගොධාවෙනි, මෙබඳු වාද ඇති තෙපි මහානාම ශාක්‍යයන්ට කුමක් කියවු දැයි ? වහන්ස, මෙබඳු වාද ඇති මම මහානාම ශාක්‍යයන්ට යහපත හැර කුශලය හැර කිසිවක් නො කියම් යි.

## 11. 3. 4

## සරකානි සූත්‍රය

3792. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යදනව්වෙහි කිඹුල්-වත්පුර නිග්‍රොධාරාමයෙහි** වැඩවසන සේක. එසමයෙහි **සරකානිශාක්‍ය-**තෙමේ කලුරිය කෙළේ වෙයි. හෙතෙමේ විවස ව නො හෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් ''යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ය. එහි බොහෝ ශාක්‍යයෝ එක් ව රැස් ව අවමන් කෙරෙත්, ගරහත්, දෙස් පහළ කෙරෙත්. පින්වත්නි, අසිරියි. පින්වත්නි, සුදුමයි. යම් සරකානි ශාක්‍යයෙක් කලුරිය කෙළේ ද, හෙතෙමේ විවසව නො හෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොවන් යි භාග්‍ය-වතුන් වහන්සේ විසින් පවසන ලද්දේ ය. මෙහි දැන් කවරෙක් සෝවන් නොවන්නේ ද, සරකානි ශාක්‍ය තෙමේ සිකපද රැකීමෙහි දුබලබවට පැමිණියේ ය. මත්පැන් පූයේ යි.

අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: “ඉධ භන්තෙ, සරකානි සක්කො කාලකතො. සො භගවතා ව්‍යාකතො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති තත්‍ර සුදං භන්තෙ, සම්බහුලා සක්කා සඞ්ගම්ම සමාගම්ම උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, එත්ථදානි කො න සොතාපන්නො භවිස්සති. යත්‍ර හි නාම සරකානි සක්කො කාලකතො, සො භගවතා ව්‍යාකතො “සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො”ති. සරකානි සක්කො සික්ඛාදුබ්බල්‍යමාපාදි, මජ්ජපානං අපායී”ති.

යො සො මහානාම, දීඝරත්තං උපාසකො බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො සො කථං විනිපාතං ගච්ඡෙය්‍ය. යං හි තං මහානාම, සම්මාවදමානො වදෙය්‍ය, දීඝරත්තං උපාසකො බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතොති සරකානිං සක්කං සම්මා වදමානො වදෙය්‍ය සරකානි මහානාම, සක්කො දීඝරත්තං උපාසකො බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො. සො කථං විනිපාතං ගච්ඡෙය්‍ය?

ඉධ මහානාම, එකච්චො පුග්ගලො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: “ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා”ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා”ති හාසුපඤ්ඤො[1] ජවනපඤ්ඤො විමුත්තියා ච සමන්නාගතො. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

ඉධ මහානාම, එකච්චො පුග්ගලො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: “ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා”ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා”ති. හාසුපඤ්ඤො ජවනපඤ්ඤො න ච විමුත්තියා සමන්නාගතො. සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති. තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා[2] ලොකා. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

---
1. හාසපඤ්ඤො – මජ්සං, ස්‍යා.
2. අස්මා ලොකා – ස්‍යා.

Free Distribution www.aathaapi.org

එකල්හි මහානාම ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් මහානාම ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, "මෙහි සරකානි ශාක්‍ය තෙමේ කලුරිය කෙළේ ය. හෙතෙමේ විවසව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොවන්"යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ය. වහන්ස, එහි බොහෝ ශාක්‍යයෝ එක් ව රැස් ව අවමන් කෙරෙත්. ගරහත්. දෙස් පහළ කෙරෙත්. පින්වත්නි, අසිරි යි. පින්වත්නි, පුදුම යි. යම් සරකානි ශාක්‍යයෙක් කලුරිය කෙළේ ද, හෙතෙමේ "විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොවන්"යි භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දේ ය. මෙහි දූන් කවරෙක් සොවන් නොවන්නේ ද, සරකානි ශාක්‍ය තෙමේ සිකපද රැකීමෙහි දුබලබවට පැමිණියේ ය. මත්පැන් පූයේ යි.

මහානාම, යම් ඒ උවසුවෙක් දිගුකලක් මුළුල්ලෙහි බුදුන් පිහිට කොට ගියේ දහම් පිහිට කොට ගියේ සඟන පිහිට කොට ගියේ නම් හෙතෙමේ කෙසේ නිරයට යන්නේ ද මහානාම, මැනවින් කියන්නෙක් "උවසු තෙමේ දිගුකලක් මුළුල්ලෙහි බුදුන් පිහිට කොට ගියේ දහම් පිහිට කොට ගියේ සඟන පිහිට කොට ගියේයි" ඒ යමෙකු ගෙන කියන්නේ නම් මැනවින් කියන්නා සරකානි ශාක්‍යයා ඇරැබ කියන්නේ ය. මහානාම, උවසු වූ සරකානි ශාක්‍ය තෙමේ දිගුකලක් මුළුල්ලෙහි බුදුන් පිහිට කොට ගියේ ය. දහම් පිහිට කොට ගියේ ය. සඟන පිහිට කොට ගියේ ය. හෙතෙමේ කෙසේ නම් නිරයට යන්නේ ද?.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක්: "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෲහ, බුද්ධයහ, භගවත්හ"යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම්හි ... ලොවට අනුතුරු පින්කෙතැ යි සඟන කෙරෙහි . හාසබහුල ප්‍රඥා ඇත්තේ ය. ජවනප්‍රඥා ඇත්තේ ය. විමුක්තියෙන් ද සමන්වාගත ය. හෙතෙමේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ. මහානාම, මේ පුඟුල් තෙමේත් නිරයෙන් මිදුණේ ය. තිරිසන්යොනින් මිදුණේ ය. ප්‍රෙතවිෂයයෙන් හාත්පසින් මිදුණේ ය. අපායදුර්ගති විනිපාතයෙන් මිදුණේ ය.

මහානාම මෙහි ඇතැම් පුඟුලෙක් "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු.. දෙවිමිනිසුනට ශාස්තෲහ, බුද්ධයහ, භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. "ධර්මය කෙරෙහි.. ලොකයාට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර ය"යි සඞ්ඝයා කෙරෙහි.. හාසබහුල ප්‍රඥා ඇත්තේ ය. ජවනප්‍රඥා ඇත්තේ ය. විමුක්තියෙන් නො ද සමන්වාගත ය. හෙතෙමේ පස් ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් එහි පිරිනිවෙනසුලු එලොවින් පෙරළා නොඑන ස්වභාව ඇති ඕපපාතිකයෙක් වෙයි. මහානාම මේ පුඟුල්තෙමේත් නිරයයෙන් මිදුණේ ය. තිරිසන් යොනින් මිදුණේ ය. ප්‍රෙතවිෂයයෙන් මිදුණේ ය. අපායදුර්ගති විනිපාතයෙන් මිදුණේ ය.



Free Distribution www.aathaapi.org

ඉධ පන මහානාම එකච්චො පුග්ගලො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: “ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා”ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො න ච විමුත්තියා සමන්නාගතො. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

ඉධ පන මහානාම එකච්චො පුග්ගලො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: “ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා”ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො න ච විමුත්තියා සමන්නාගතො. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

ඉධ මහානාම, එකච්චො පුග්ගලො න හෙව ඛො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. න ධම්මෙ -පෙ- න සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො, න ච විමුත්තියා සමන්නාගතො, අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති. අයම්පි ඛො මහානාම පුග්ගලො අගන්තා නිරයං, අගන්තා තිරච්ඡානයොනිං, අගන්තා පෙත්තිවිසයං, අගන්තා අපායදුග්ගතිවිනිපාතං.

ඉධ පන මහානාම, එකච්චො පුග්ගලො න හෙව ඛො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. න ධම්මෙ -පෙ- න සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො, න ච විමුත්තියා සමන්නාගතො, අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. තථාගතෙ චස්ස සද්ධාමත්තං හොති, පෙමමත්තං. අයම්පි ඛො මහානාම, පුග්ගලො අගන්තා නිරයං, අගන්තා තිරච්ඡානයොනිං, අගන්තා පෙත්තිවිසයං, අගන්තා අපායදුග්ගතිවිනිපාතං.

ඉමෙ චෙපි මහානාම, මහාසාලා සුභාසිතං දුබ්භාසිතං ආජානෙය්‍යුං, ඉමෙ චාහං මහාසාලෙ ව්‍යාකරෙය්‍යං: “සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා”ති. කිමඞ්ග පන සරකානිං සක්කං. සරකානි මහානාම, සක්කො මරණකාලෙ පන සික්ඛං[1] සමාදියීති.

1. මරණකාලෙ සික්ඛං - මජසං, සයා.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක්: ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ, භගවත්හ''යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම්හි ... සඟන කෙරෙහි ...හාසබහුලප්‍රඥා ඇත්තේ නො වේ. ජවනප්‍රඥා ඇත්තේ නො වේ. විමුක්තියෙන් යුක්ත වූයේ නො ද වෙයි. හෙ තුන් සංයොජනයක් ක්ෂය කිරීමෙන් රාගදෙසමොහයන් තුනී වූ බැවින් සෙදගැමි වෙයි. එක් වරක් ම මෙලොවට පැමිණ දුක් කෙළවර කෙරෙයි. මහානාම, මේ පුඟුල් තෙමේත් නිරයයෙන් මිදුණේ ය. තිරිසන්යොනින් මිදුණේ ය. ප්‍රෙතවිෂයයෙන් මිදුණේ ය. අපාය දුර්ගති විනිපාතයෙන් මිදුණේ ය.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක්: ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙව්මිනිසුනට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ''යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි. දහම්හි.. සඟන කෙරෙහි.. හාසප්‍රඥා ඇත්තේ නො වේ. ජවනප්‍රඥා ඇත්තේ නො වේ. විමුක්තියෙන් නො ද සමන්වාගත වේ. හෙ තෙවැදෑරුම් සංයොජනයන් ක්ෂය කිරීමෙන් ''විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. මහානාම, මේ පුඟුල් තෙමේ ද නිරයෙන් මිදුණේ ය. තිරිසන් යොනින් මිදුණේ ය. ප්‍රෙතවිෂයයෙන් මිදුණේ ය. අපාය දුර්ගති විනිපාතයෙන් මිදුණේ ය.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ නො ම වෙයි. දහම්හි...නොම වෙයි. සඟන කෙරෙහි නො ම වෙයි. හාෂ බහුල ප්‍රඥා ඇත්තේ නොම වේ. ජවනප්‍රඥා ඇත්තේ නො ම වේ. විමුක්තියෙන් නො ද සමන්වාගත ය. වැලිදු ඔහුට සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යන මේ දහම්හු වෙත්. තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද දහම්හු නුවණින් පමණ විසින් ම ඔහුගේ දැක්මට සුදුසු වෙත්. මහානාම, මේ පුඟුල් තෙමේ ත් නිරයට නො යන්නෙකි. තිරිසන්යොනට නොයන්නෙකි. ප්‍රෙතවිෂයට නොයන්නෙකි. අපාය දුර්ගති විනිපාතයට නො යන්නෙකි.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් නො ම සමන්වාගත වෙයි. දහම්හි... නො ම වෙයි. සඟන කෙරෙහි... නො ම වෙයි. හාස බහුල ප්‍රඥා ඇත්තේ නො ම වෙයි. ජවනප්‍රඥා ඇත්තේ නො ම වෙයි. විමුක්තියෙන් සමන්වාගත නො ම වෙයි. වැලිදු ඔහුට සද්ධින්ද්‍රිය...පඤ්ඤින්ද්‍රිය යන මේ දහම්හු වෙත්. තථාගතයන් කෙරෙහි ද සද්ධාමාත්‍රයෙක් ප්‍රෙමමාත්‍රයෙක් වෙයි. මහානාම මේ පුඟුල් තෙමේ ත් නිරයට නො යන්නෙකි. තිරිසන්යොනට නොයන්නෙකි. ප්‍රෙතවිෂයට නො යන්නෙකි. අපාය දුර්ගති විනිපාතයට නොයන්නෙකි.

මහානාම, ඉදින් මම විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොවන්හ යි මේ මහසල්රුක්නට පවසන්නෙම් නම් මේ මහසල්රුක්හු ද සුභාෂිත දුර්භාෂිත දැන ගන්නාහු ය. සරකානි ශාක්‍යයා ගැන කියනු ම කිම? මහානාම සරකානි ශාක්‍ය තෙමේ මැරෙන කල ත්‍රිවිධ ශික්ෂා පිරිපුන් කරනසුලු වී ය.

## 11. 3. 5

## දුතිය සරකානි සුත්තං

3793. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන සරකානි සක්කො කාලකතො හොති. සො භගවතා ව්‍යාකතො: "සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති. තත්‍ර සුදං සම්බහුලා සක්කා සඞ්ගම්ම සමාගම්ම උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අච්ඡරියං වත භො අබ්භුතං වත භො, එත්ථදානි කො න සොතාපන්නො භවිස්සති. යත්‍ර හි නාම සරකානි සක්කො කාලකතො සො භගවතා ව්‍යාකතො 'සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො'ති. සරකානි සක්කො සික්ඛාය අපරිපූරකාරි අහොසී"ති.

අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉධ භන්තෙ, සරකානි සක්කො කාලකතො. සො භගවතා ව්‍යාකතො: 'සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො'ති. තත්‍ර සුදං භන්තෙ සම්බහුලා සක්කා සඞ්ගම්ම සමාගම්ම උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, එත්ථ'දානි ඛො න සොතාපන්නො භවිස්සති. යත්‍ර හි නාම සරකානි සක්කො කාලකතො, සො භගවතා ව්‍යාකතො: 'සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො'ති, සරකානි සක්කො සික්ඛාය අපරිපූරිකාරී අහොසී"ති.

යො සො මහානාම, දීඝරත්තං උපාසකො බුද්ධං සරණං ගතො ධම්මං සරණං ගතො සඞ්ඝං සරණං ගතො, සො කථං විනිපාතං ගච්ඡෙය්‍ය. යං හි තං මහානාම, සම්මා වදමානො වදෙය්‍ය: "දීඝරත්තං උපාසකො බුද්ධං සරණං ගතො ධම්මං සරණං ගතො සඞ්ඝං සරණං ගතො"ති. සරකානිං සක්කං සම්මා වදමානො වදෙය්‍ය. සරකානි මහානාම, සක්කො දීඝරත්තං උපාසකො බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො, සො කථං විනිපාතං ගච්ඡෙය්‍ය.

ඉධ, මහානාම, එකච්චො පුග්ගලො බුද්ධෙ එකන්තිගතො[1] හොති අභිප්පසන්නො: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. "ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති හාසුපඤ්ඤො ජවනපඤ්ඤො විමුත්තියා ච සමන්නාගතො. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

1. එකන්තගතො - මජසං, සහා.

# 11. 3. 5

## දුතිය සරකානි සූත්‍රය

3793. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යදනව්වෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි** වැඩවසන සේක. එසමයෙහි **සරකානි ශාක්‍යතෙමේ** කලුරිය කෙළේ වෙයි. හෙතෙමේ "විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්"යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ය. එහි වූ කලී බොහෝ ශාක්‍යයෝ එක් රැස් ව අවමන් කෙරෙත්. ගරහත්, දෙස් පහළ කෙරෙත්. "භවත්නි, අසිරි යි. භවත්නි, පුදුම යි. 'යම් සරකානි නම් ශාක්‍යයෙක් කලුරිය කෙළේ ද, හෙතෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්'යි භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දේ ය. මෙහි දැන් කවරෙක් සෝවන් නොවන්නේ ද? සරකානි ශාක්‍ය තෙමේ ශික්ෂාව පිරිපුන් නොකරනසුලු වී"යි.

එකල්හි **මහානාම ශාක්‍යයෝ** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ... එකත්පස් ව හුන් මහානාම ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, මෙහි සරකානි ශාක්‍ය තෙමේ කලුරිය කෙළේ ය. 'හෙතෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්' යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ය. එහි වනාහි බොහෝ ශාක්‍යයෝ එක්ව රැස් ව අවමන් කෙරෙත්, ගරහත්, දෙස් පහළ කෙරෙත්. භවත්නි, අසිරි යි. භවත්නි, පුදුම යි. 'යම් සරකානි නම් ශාක්‍යයෙක් කලුරිය කෙළේ ද හෙතෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්'යි භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දේ ය. මෙහි දැන් කවරෙක් සෝවන් නො වන්නේ ද? සරකානි ශාක්‍ය තෙමේ ශික්ෂාව පිරිපුන් නොකරනසුලු වී"යි.

මහානාම, යම් ඒ උවසුවෙක් දිගුකලක් මුළුල්ලෙහි බුදුන් සරණ ගියේ දහම් සරණ ගියේ සඟුන් සරණ ගියේ වේ නම් හෙතෙමේ කෙසේ නිරයට යන්නේ ද? මහානාම, මැනවින් කියන්නෙක් "උවසු තෙමේ දිගුකලක් මුළුල්ලෙහි බුදුන් සරණ ගියේ දහම් සරණ ගියේ සඟුන් සරණ ගියේ"යි ඒ යමකු ඇරබ කියන්නේ නම් මැනවින් කියන්නා සරකානි ශාක්‍යයා ඇරබ කියන්නේ ය. මහානාම, උවසු වූ සරකානි ශාක්‍ය තෙමේ දිගුකලක් මුළුල්ලෙහි බුදුන් සරණ ගියේ ය. දහම් සරණ ගියේ ය. සඟුන් සරණ ගියේ ය. හෙතෙමේ කෙසේ නම් නිරයට යන්නේ ද?

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙව්මිනිසුන්ට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ"යි බුදුන් කෙරෙහි එකාන්ත බවට ගියේ (=නොසැලෙන සැදැහැ ඇත්තේ) බෙහෙවින් පහන් වූයේ වෙයි. "දහම් කෙරෙහි...ලොවට අනුතුරු පින්කෙතැයි සඟුන් කෙරෙහි...හාසබහුල ප්‍රඥා ඇත්තේ ජවන ප්‍රඥා ඇත්තේ විමුක්තියෙන් ද සමන්වාගත වූයේ වෙයි. හෙතෙමේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය දිට්ඨධම්මයෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ. මහානාම, මේ පුඟුල් තෙමේත් නිරයෙන් වෙසෙසින් මිදුණේ ය. තිරිසන්යොනියෙන් වෙසෙසින් මිදුණේ ය. ප්‍රෙතවිෂයෙන් වෙසෙසින් මිදුණේ ය. අපායදුර්ගතිවිනිපාතයෙන් වෙසෙසින් මිදුණේ ය.

ඉධ පන මහානාම, එකච්චො පුග්ගලො බුද්ධෙ එකන්තිගතො හොති අභිප්පසන්නො: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- හාසුපඤ්ඤො ජවනපඤ්ඤො න ච විමුත්තියා සමන්නාගතො. සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායී හොති. උපහච්ච පරිනිබ්බායී හොති. සසඞ්ඛාරපරිනිබ්බායී හොති. අසඞ්ඛාරපරිනිබ්බායී[1] හොති. උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා -පෙ- පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

ඉධ පන මහානාම, එකච්චො පුග්ගලො බුද්ධෙ එකන්තිගතො හොති අභිප්පසන්නො: ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. න හාසුපඤ්ඤො, න ජවනපඤ්ඤො, න ච විමුත්තියා සමන්නාගතො. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයම්පි ඛො මහානාම පුග්ගලො පරිමුත්තො නිරයා -පෙ- පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

ඉධ පන මහානාම, එකච්චො පුග්ගලො බුද්ධෙ එකන්තිගතො හොති අභිප්පසන්නො: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො, න ච විමුත්තියා සමන්නාගතො සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති. අයම්පි ඛො මහානාම, පුග්ගලො පරිමුත්තො නිරයා -පෙ- පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

ඉධ පන මහානාම, එකච්චො පුග්ගලො නහෙව ඛො බුද්ධෙ එකන්තිගතො හොති අභිප්පසන්නො, න ධම්මෙ -පෙ- න සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො න ච විමුත්තියා සමන්නාගතො. අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති. අයම්පි ඛො මහානාම, පුග්ගලො අගන්තා නිරයං, අගන්තා තිරච්ඡානයොනිං, අගන්තා පෙත්තිවිසයං, අගන්තා අපායදුග්ගතිවිනිපාතං.

ඉධ පන මහානාම, එකච්චො පුග්ගලො න හෙව ඛො බුද්ධෙ එකන්තිගතො හොති අභිප්පසන්නො. න ධම්මෙ -පෙ- න සඞ්ඝෙ -පෙ- න හාසුපඤ්ඤො න ජවනපඤ්ඤො, න ච විමුත්තියා සමන්නාගතො. අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. තථාගතෙ චස්ස සද්ධාමත්තං හොති පෙමමත්තං. අයම්පි ඛො මහානාම, පුග්ගලො අගන්තා නිරයං, අගන්තා තිරච්ඡානයොනිං, අගන්තා පෙත්තිවිසයං, අගන්තා අපායදුග්ගති විනිපාතං.

1. අසඞ්ඛාරපරිනිබ්බායී හොති සසඞ්ඛාරපරිනිබ්බායී - මජසං, සතා.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙවිමිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ''යි බුදුන් කෙරෙහි ඒකාන්ත බවට ගියේ බෙහෙවින් පහන් වූයේ වෙයි. දහම් කෙරෙහි... සඟුන් කෙරෙහි...හාසබහුල ප්‍රඥා ඇත්තේ ය. ජවනප්‍රඥා ඇත්තේ ය. විමුක්තියෙන් නො ද සමන්වාගත ය. හෙ පස් ඔරම්භාගියසංයොජනයන් ක්ෂය කිරීමෙන් අන්තරාපරිනිබ්බායී වේ. උපහච්ච පරිනිබ්බායී වේ. සසඞ්ඛාරපරිනිබ්බායී වේ. අසඞ්ඛාරපරිනිබ්බායී වේ. අකණිට්ඨගාමී උද්ධංසොත වේ. මහානාම, මේ පුඟුල් තෙමේත් නිරයෙන් මිදුණේ ය...අපායදුග්ගතිවිනිපාතයෙන් මිදුණේ ය.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙවිමිනිසුන්ට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ''යි බුදුන් කෙරෙහි ඒකාන්ත බවට ගියේ බෙහෙවින් පහන් වූයේ වෙයි. ධර්මය කෙරෙහි... ලොකයාට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර ය''යි සඞ්ඝයා කෙරෙහි...හාසුප්‍රඥා ඇත්තේ නො වෙයි. ජවනප්‍රඥා ඇත්තේ නො වෙයි. විමුක්තියෙන් නො ද සමන්වාගත ය. හෙ ත්‍රිවිධසංයොජනයන් ක්ෂය කිරීමෙන් රාගදෙසමොහයන් තුනී වූ බැවින් සෙදගැමි වෙයි. එක්වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මහානාම, මේ පුඟුල් තෙමේත් නිරයෙන් මිදුණේ ය...අපායදුග්ගතිවිනිපාතයෙන් මිදුණේ ය.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු...දෙවිමිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ''යි බුදුන් කෙරෙහි ඒකාන්ත බවට ගියේ වෙසෙසින් පහන් වූයේ වෙයි. ධර්මය කෙරෙහි... සඞ්ඝයා කෙරෙහි...හාසුප්‍රඥා ඇත්තේ නො වේ. ජවනප්‍රඥා ඇත්තේ නො වේ. විමුක්තියෙන් නො ද සමන්වාගත ය. හෙ ත්‍රිවිධසංයොජනයන් ක්ෂය කිරීමෙන් විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. මහානාම මේ පුඟුල් තෙමේත් නිරයෙන් මිදුණේ ය. ...අපායදුග්ගතිවිනිපාතයෙන් මිදුණේ ය.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් බුදුන් කෙරෙහි ඒකාන්තබවට ගියේ බෙහෙවින් පහන් වූයේ නො ම වෙයි. ධර්මය කෙරෙහි...නො ම වෙයි. සඞ්ඝයා කෙරෙහි...නො ම වෙයි. හාසුප්‍රඥා ඇත්තේ නො ම වෙයි. ජවනප්‍රඥා ඇත්තේ නො ම වෙයි විමුක්තියෙන් නො ද සමන්වාගත ය. වැලිදු ඔහුට සද්ධින්ද්‍රිය...පඤ්ඤින්ද්‍රිය යන මේ දහම්හු වෙත්. තථාගතයන් වහන්සේ විසින් වදරන ලද දහම්හු ද නුවණින් පමණ විසින් ම ඔහුගේ දැක්මට සුදුසු වෙත්. මහානාම, මේ පුඟුල් තෙමේ ත් නිරයට නොයන්නෙකි. තිරිසන් යොනට නො යන්නෙකි. ප්‍රෙතවිෂයට නොයන්නෙකි. අපාය දුර්ගති විනිපාතයට නො යන්නෙකි.

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් බුදුන් කෙරෙහි ඒකාන්ත බවට ගියේ වෙසෙසින් පහන් වූයේ නො ම වෙයි. ධර්මය කෙරෙහි ...නො ම වෙයි. සංඝයා කෙරෙහි...නො ම වෙයි. හාසබහුල ප්‍රඥා ඇත්තේ නො ම වෙයි. ජවනප්‍රඥා ඇත්තේ නො ම වෙයි. විමුක්තියෙන් නො ද සමන්වාගත ය. වැලිදු ඔහුට සද්ධින්ද්‍රිය...පඤ්ඤින්ද්‍රිය යන මේ දහම්හු වෙති. තථාගතයන් කෙරෙහි දු ඔහුට ශ්‍රද්ධාමාත්‍රයෙක් ප්‍රෙමමාත්‍රයෙක් වෙයි. මහානාම, මේ පුඟුල් තෙමේත් නිරයට නො යන්නෙකි. තිරිසන් යොනට නො යන්නෙකි. ප්‍රෙතවිෂයට නො යන්නෙකි. අපාය දුර්ගතිවිනිපාතයට නො යන්නෙකි.

සෙය්‍යථාපි මහානාම, දුක්ඛෙත්තං දුබ්භූමිං[1] අවිහතඛාණුකං, බීජානි චස්සු[2] ඛණ්ඩානි පූතීනි වාතාතපහතානි අසාරාදනි අසුඛසයිතානි, දෙවො ච න සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය අපි නු තානි බීජානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුන්ති? නො හෙතං භන්තෙ, එවමෙව ඛො මහානාම, ඉධ ධම්මො දුරක්ඛාතො හොති දුප්පවෙදිතො අනිය්‍යානිකො අනුපසමසංවත්තනිකො අසම්මාසම්බුද්ධප්පවෙදිතො ඉදමහං දුක්ඛෙත්තස්මිං වදාමි. තස්මිඤ්ච ධම්මෙ සාවකො විහරති ධම්මානුධම්මප්පටිපන්නො සාමීචිප්පටිපන්නො අනුධම්මචාරී ඉදමහං දුබ්බීජස්මිං වදාමි.

සෙය්‍යථාපි මහානාම, සුඛෙත්තං[3] සුභූමිං[4] සුවිහතඛාණුකං බීජානි-චස්සු අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි සාරාදනි සුඛසයිතානි, දෙවො ච සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අපි නු තානි බීජානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුන්ති? එවං භන්තෙ, එවමෙව ඛො මහානාම, ඉධ ධම්මො ස්වාක්ඛාතො හොති සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො. ඉදමහං සුඛෙත්තස්මිං වදාමි. තස්මිඤ්ච ධම්මෙ සාවකො විහරති ධම්මානුධම්මප්පටිපන්නො සාමීචිප්පටිපන්නො අනුධම්මචාරී. ඉදමහං සුබීජස්මිං වදාමි. කිමඞ්ග පන සරකානිං සක්කං, සරකානි මහානාම සක්කො මරණකාලෙ සික්ඛාය පරිපූරකාරී අහොසීති.

## 11. 3. 6

## අනාථපිණ්ඩික සුත්තං

3794. තෙන ඛො පන සමයෙන අනාථපිණ්ඩිකො ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: ''එහි ත්වං අම්භො පුරිස, යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්ද, ''අනාථපිණ්ඩිකො භන්තෙ, ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො, සො ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරිසා වන්දතී''ති. එවඤ්ච වදෙහි; ''සාධු කිර භන්තෙ, ආයස්මා සාරිපුත්තො යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා''ති.

එවං භන්තෙති ඛො සො පුරිසො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස පටිස්සුත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: ''අනාථපිණ්ඩිකො භන්තෙ, ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. සො ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති: ''සාධුකිර භන්තෙ, ආයස්මා සාරිපුත්තො යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා''ති. අධිවාසෙසි ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හීභාවෙන.

---

1. දුබ්භූමං - සී 2.
2. බීජානිචස්ස - සී 2.
3. සුඛෙත්තං - සයා.
4. සුභූමං - සී 2.
5. වසො - සයා.

මහානාම, යම්සේ නො සරු බිම් ඇති නො නට කණු ඇති විෂම කෙතෙක් වේ ද, බිඳුණු කුණු වූ අව්සුළඟින් නටුවා වූ හර නො ගත් මැනවින් නො තබන ලද බීජයෝ ත් වන්නාහු ද, වැස්සත් මැනවින් වැසිදහර නො පමුණුවන්නේ ද, (එසේ ඇති කල්හි) බීජයෝ වැඩීමට තිරබවට විපුලත්වයට පැමිණෙන්නාහු දැයි? වහන්ස, මෙය නො වේ ය. මහානාම, එසෙයින් ම මෙහි දහම නපුරු කොට පවසන ලද්දේ නපුරු කොට දෙසන ලද්දේ නිවනට නො පමුණුවන්නේ ක්ලෙශව්‍යුපශමය පිණිස නො පවත්නේ සර්වඥයන් නොදත්තවුන් විසින් පවසන ලද්දේ වේ නම් මෙය මම විෂම කෙතැ යි කියමි. ශ්‍රාවක තෙමේ ඒ ධර්මයෙහිත් ධර්මානුධර්මප්‍රතිපන්න ව සාමීචිප්‍රතිපන්න ව අනුධර්මචාරී ව වෙසේ නම් මෙය මම නපුරු බීජය යි කියමි.

මහානාම, යම්සේ මනා බිම් ඇති මැනවින් නසන ලද කණු ඇති මනා කෙතෙක් වේ ද, නො කඩ වූ නො කුණු වූ අව්සුළඟින් නො නට හර ගත් මැනවින් තබන ලද බීජයෝත් වන්නාහු ද, වැස්සත් මැනවින් වැසිදහර පමුණුවන්නේ ද, (එසේ ඇති කල්හි) ඒ බීජයෝ වැඩීමට තිරබවට විපුලත්වයට පැමිණෙන්නාහු දැ?යි වහන්ස, එසේ ය. මහානාම, එසෙයින් ම මෙහි ධර්මය මැනවින් පවසන ලද්දේ මැනවින් දෙසන ලද්දේ නිවනට පමුණුවන්නේ ක්ලෙශව්‍යුපශමය පිණිස පවත්නේ සර්වඥයන් දත්තවුන් විසින් පවසන ලද්දේ වේ ද මෙය මම මනා කෙතැ යි කියමි. ඒ ධර්මයෙහිත් ශ්‍රාවක තෙමේ ධර්මානුධර්මප්‍රතිපන්න ව සාමීචි ප්‍රතිපන්න ව අනුධර්මචාරී ව වෙසේ නම් මෙය මම මනා බීජය යි කියමි. සරකානි ශාක්‍යයා ගැන කියනු කිම? මහානාම, සරකානි ශාක්‍ය තෙමේ මැරෙන කල ශික්ෂාව පිරිපුන් කරනසුලු වී යි.

## 11. 3. 6

## අනාථපිණ්ඩික සූත්‍රය

3794. එසමයෙහි **අනේපිඬු ගැහැවි තෙමේ** හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩිසේ ගිලන් වූයේ වෙයි. එකල්හි අනේපිඬු ගැහැවි තෙමේ එක්තරා පුරුෂයකු ඇමතී ය: ''එම්බා පුරුෂය, එව. තෙපි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් වෙත එළඹෙවු. එළඹ ''වහන්ස, අනේපිඬු ගැහැවි තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩිසේ ගිලන් වූයේ වෙයි. හෙතෙමේ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ගේ පා හිසින් වඳී''යි මා වදනින් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ගේ පා හිසින් වඳිවු. මෙසේත් කියවු: වහන්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ අනුකම්පා නිසා අනේපිඬු ගැහැවිහුගේ නිවෙස්න වෙත එළඹෙන සේක්වා''යි.

එසේ ය හිමියනි, යි ඒ පුරුෂ තෙමේ අනේපිඬු ගැහැවිහට පිළිතුරු දී ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ට මෙය කී ය. ''වහන්ස, අනේපිඬු ගැහැවි හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩිසේ ගිලන් වූයේ වෙයි. හෙ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ගේ පා හිසින් වඳියි. මෙසේත් කියයි: ''වහන්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ අනුකම්පා නිසා අනේපිඬු ගැහැවිහුගේ නිවෙස්න වෙත එළඹෙන සේක්වා''යි. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ මුවෙන් නොබැණ ඉවසූහ.

අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ආයස්මතා ආනන්දෙන, පච්ඡාසමණෙන යෙන අනාථ-පිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො ආයස්මා සාරිපුත්තො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: කච්චි තෙ ගහපති, ඛමනීයං කච්චි යාපනීයං කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති? න මෙ භන්තෙ, ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො''ති.

යථාරූපෙන ච ඛො ගහපති, බුද්ධෙ අප්පසාදෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ බුද්ධෙ අප්පසාදො නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, බුද්ධෙ අවෙච්චප්පසාදො: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. තඤ්ච පන තෙ බුද්ධෙ අවෙච්චප්පසාදං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං[1].

යථාරූපෙන ඛො ගහපති, ධම්මෙ අප්පසාදෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ ධම්මෙ අප්පසාදො නත්ථි අත්ථි ච ඛො තෙ ගහපති, ධම්මෙ අවෙච්චප්පසාදො: ''ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති. තඤ්ච පන තෙ ධම්මෙ අවෙච්චප්පසාදං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං[1].

යථාරූපෙන ඛො ගහපති, සඞ්ඝෙ අප්පසාදෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ සඞ්ඝෙ අප්පසාදො නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සඞ්ඝෙ අවෙච්චප්පසාදො: ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති. තඤ්ච පන තෙ සඞ්ඝෙ අවෙච්චප්පසාදං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං[1].

යථාරූපෙන ඛො ගහපති, දුස්සීල්‍යෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපං තෙ දුස්සීල්‍යං නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, අරියකන්තානි සීලානි අඛණ්ඩානි -පෙ- සමාධිසංවත්තනිකානි. තානි ච පන තෙ අරියකන්තානි සීලානි අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපාය ඛො ගහපති, මිච්ඡාදිට්ඨියා සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපා තෙ මිච්ඡාදිට්ඨි නත්ථි අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාදිට්ඨි. තඤ්ච පන තෙ සම්මාදිට්ඨිං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

1. පටිප්පස්සම්භෙය්‍ය - සීමු, මජසං.

එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන ආයුෂ්මත් ආනන්ද පසු මහණහු සමග අනේපිඩු ගැහැවිහුගේ නිවෙස්න වෙත එළඹියහ. එළඹ පැන වූ අස්නෙහි වැඩහුන්හ. වැඩහිඳ ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ අනේපිඩු ගැහැවිහට මෙය වදළහ: ''ගැහැවි, කිම තොපට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම දුක් වෙදනාවෝ අඩු වෙද්ද? වැඩි නො වෙද්ද? ඔවුන්ගේ අඩුවීම පැනේ ද? වැඩිවීමෙක් නො පෙනේ ද යි? වහන්ස, මට නොඉවසිය හැකි ය. නො යැපිය හැකි ය. මාගේ දැඩි දුක්වෙදනාවෝ වැඩි වෙත්, අඩු නො වෙත්. ඔවුන්ගේ වැඩි වීම පෙනේ, අඩු වීමෙක් නො පෙනේ යි.

ගැහැවිය, බුදුරජාණන් වහන්සේ කෙරෙහි යම් බඳු නොපැහැදීමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගතිවිනිපාත නිරයට පැමිණේ නම් බුදුරජාණන් වහන්සේ කෙරෙහි එබඳු නොපැහැදීමෙක් තොපට නැත. ගැහැවිය,''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු... දෙව්මිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙක් තොපට ඇත් ම ය. බුදුරජාණන් වහන්සේ කෙරෙහි වූ ඒ ගුණ දැන පැහැදීම ද තමා කෙරෙහි ලා දක්නා වූ තොපගේ වෙදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහු ය.

ගැහැවි, දහම්හි යම් බඳු නොපැහැදීමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගතිවිනිපාතනිරයට පැමිණේ නම් දහම්හි එබඳු නොපැහැදීමෙක් තොපට නැත. ගැහැවි, ''භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය...නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු ය''යි දහම්හි ගුණ දැන පැහැදීමෙක් තොපට ඇත් ම ය. දහම්හි වූ ඒ ගුණ දැන පැහැදීම ද තමා කෙරෙහි ලා දක්නා වූ තොපගේ වෙදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, සඟුන් කෙරෙහි යම්බඳු නොපැහැදීමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගති විනිපාත නිරයට පැමිණේ නම් සඟුන් කෙරෙහි එබඳු නොපැහැදීමෙක් තොපට නැත. ගැහැවි, ''භාග්‍යවතුන් වහන්සේගේ සවුසඟහු තෙමේ සුපිළිපන්හ... ලොවට අනුතුරු පින්කෙත''යි සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙක් තොපට ඇත් ම ය. සඟුන් කෙරෙහි වූ ඒ ගුණ දැන පැහැදීම ද තමා කෙරෙහි දක්නා වූ තොපගේ වෙදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු දුසිල්කමෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගතිවිනිපාතනිරයට පැමිණේ නම් එබඳු දුසිල් බවෙක් තොපට නැත. ගැහැවි නොකැඩුණු.. සමාධිය පිණිස පවත්නා වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෝ තොපට ඇත් ම ය. ඒ ආර්‍ය්‍යකාන්තශීලයන් තමන් කෙරෙහි ලා දක්නා වූ තොපගේ වෙදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාදෘෂ්ටියෙකින් යුතු නුගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යා දෘෂ්ටියක් තොපට නැත. ගැහැවි සම්‍යග්දෘෂ්ටිය ද තොපට ඇත් ම ය. ඒ සම්‍යග් දෘෂ්ටිය තමන් කෙරෙහි ලා දක්නා වූ තොපගේ වෙදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

යථාරූපෙන ඛො ගහපති, මිච්ඡාසඞ්කප්පෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ මිච්ඡාසඞ්කප්පො නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාසඞ්කප්පො. තඤ්ච පන තෙ සම්මාසඞ්කප්පං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපාය ඛො ගහපති, මිච්ඡාවාචාය සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තථාරූපා තෙ මිච්ඡාවාචා නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාවාචා තඤ්ච පන තෙ සම්මාවාචං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපෙන ඛො ගහපති, මිච්ඡාකම්මන්තෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ මිච්ඡාකම්මන්තො නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාකම්මන්තො. තඤ්ච පන තෙ සම්මාකම්මන්තං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපෙන ඛො ගහපති, මිච්ඡා ආජීවෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ මිච්ඡාආජීවො නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මා ආජීවො. තඤ්ච පන තෙ සම්මාආජීවං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපෙන ඛො ගහපති, මිච්ඡාවායාමෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපො තෙ මිච්ඡාවායාමො නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාවායාමො. තඤ්ච පන තෙ සම්මාවායාමං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපාය ඛො ගහපති, මිච්ඡාසතියා සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපා තෙ මිච්ඡාසති නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාසති. තඤ්ච පන තෙ සම්මාසතිං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

යථාරූපෙන ඛො ගහපති, මිච්ඡාසමාධිනා සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති තථාරූපො තෙ මිච්ඡාසමාධි නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති සම්මාසමාධි. තඤ්ච පන තෙ සම්මාසමාධිං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යුං.

ගැහැවි, යම්බඳු මිථ්‍යා සංකල්පයෙකින් යුතු නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යාසංකල්පයෙක් තොපට නැත. ගැහැවි සම්‍යක්සංකල්පය තොපට ඇත් ම ය. ඒ සම්‍යක්සංකල්පය ද තමා කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නා හ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාවචනයෙකින් යුත් නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගති විනිපාත නිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යාවචනයෙක් තොපට නැත. ගැහැවි, සම්‍යක්වචනය තොපට ඇත් ම ය. ඒ සම්‍යග්වචනය ද තමන් කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාකර්මාන්තයකින් යුත් නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගතිවිනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යාකර්මාන්තයෙක් තොපට නැත. ගැහැවි, සම්‍යක්කර්මාන්තය තොපට ඇත් ම ය. ඒ සම්‍යක්කර්මාන්තය ද තමන් කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යා ආජීවයෙකින් යුත් නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපාය දුර්ගතිවිනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යා ආජීවයෙක් තොපට නැත. ගැහැවි, සම්‍යග්ආජීවය තොපට ඇත් ම ය. ඒ සම්‍යගාජීවය ද තමන් කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාව්‍යායාමයෙකින් යුත් නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යාව්‍යායාමයෙක් තොපට නැත. ගැහැවි, සම්‍යග්ව්‍යායාමය තොපට ඇත් ම ය. ඒ සම්‍යග්ව්‍යායාමය ද තමන් කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාස්මෘතියකින් යුත් නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යාස්මෘතියක් තොපට නැත ගැහැවි, සම්‍යක්ස්මෘතිය තොපට ඇත් ම ය. ඒ සම්‍යක්ස්මෘතිය ද තමන් කෙරෙහි ලා දක්නා තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාසමාධියෙකින් යුත් නූගත් පුහුදුන්තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගතිවිනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යා සමාධියෙක් තොපට නැත. ගැහැවි සම්‍යක්සමාධිය තොපට ඇත් ම ය. ඒ සම්‍යක්සමාධිය ද තමන් කෙරෙහි ලා දක්නා තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

යථාරූපෙන ඛො ගහපති, මිච්ඡාඤාණෙන සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපං තෙ මිච්ඡාඤාණං නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාඤාණං. තඤ්ච පන තෙ සම්මාඤාණං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍ය.

යථාරූපාය ඛො ගහපති, මිච්ඡාවිමුත්තියා සමන්නාගතො අස්සුතවා පුථුජ්ජනො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තථාරූපා තෙ මිච්ඡාවිමුත්ති නත්ථි. අත්ථි ච ඛො තෙ ගහපති, සම්මාවිමුත්ති. තඤ්ච පන තෙ සම්මාවිමුත්තිං අත්තනි සමනුපස්සතො ඨානසො වෙදනා පටිප්පස්සම්භෙය්‍යාති.

අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස ඨානසො වෙදනා පටිප්පස්සම්භිංසු.[1] අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති ආයස්මන්තං සාරිපුත්තං ආයස්මන්තඤ්ච ආනන්දං සකෙනෙව ථාලිපාකෙන පරිවිසි. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති, ආයස්මන්තං සාරිපුත්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං ආයස්මා සාරිපුත්තො ඉමාහි ගාථාහි අනුමොදි:

"යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

සඞ්ඝෙ පසාදො යස්සත්ථි උජුභූතඤ්ච දස්සනං,
අදළිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධානසාසනන්ති".

අථ ඛො ආයස්මා සාරිපුත්තො අනාථපිණ්ඩිකං ගහපතිං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච: "හන්ද කුතො නු ත්වං ආනන්ද, ආගච්ඡසි දිවාදිවස්සා"ති. ආයස්මතා භන්තෙ, සාරිපුත්තෙන අනාථපිණ්ඩිකො ගහපති ඉමිනා ච ඉමිනා ච ඔවාදෙන ඔවදිතොති. පණ්ඩිතො ආනන්ද, සාරිපුත්තො මහාපඤ්ඤො ආනන්ද, සාරිපුත්තො, යත්‍ර හි නාම චත්තාරි සොතාපත්තියඞ්ගානි දසහි ආකාරෙහි[2] විභජිස්සතීති.

---

1. පටිප්පස්සම්භි – සයා.
2. දසහාකාරෙහි – සයා, මජ්සං.

ගැහැවි, යම්බඳු මිථ්‍යාඥානයෙකින් යුත් නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යාඥානයෙක් තොපට නැත. ගැහැවි, සම්‍යග්ඥානය තොපට ඇත් ම ය. ඒ සම්‍යග්ඥානයත් තමා කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ.

ගැහැවි, යම්බඳු මිථ්‍යාවිමුක්තියකින් යුතු නූගත් පුහුදුන් තෙමේ කාබුන් මරණින් මතු අපායදුර්ගති විනිපාතනිරයට පැමිණේ නම් එබඳු මිථ්‍යා විමුක්තියක් තොපට නැත. ගැහැවි සම්‍යග් විමුක්තිය තොපට ඇත් ම ය. ඒ සම්‍යග් විමුක්තියත් තමා කෙරෙහි ලා දක්නා වූ තොපගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හිඳෙන්නාහ යි.

ඉක්බිති අනේපිඩු ගැහැවිහුගේ වේදනාවෝ ඇසිල්ලෙකින් සන්හුන්හ. එකල්හි අනේපිඩු ගැහැවි තෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් ද ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් ද සියබත්තලියෙන් ම වැළඳ වී ය. ඉක්බිති අනේපිඩු ගැහැවි තෙමේ වළඳා නිමවූ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එක්කරා පහත් අසුනක් ගෙන එකත් පස් ව හුන්නේ ය. එකත් පස්ව හුන් අනේපිඩු ගැහැවිහට ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ මේ ගාථාවලින් අනුමෝදනා කළහ.

යමකුට තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව අචල ව මැනවින් පිහිටියා ද යමකුගේ යහපත් වූ ශීලය ආර්යකාන්ත වූයේ පසස්නා ලද්දේ ද,

යමකුට සඞ්ඝයා කෙරෙහි පැහැදීම ඇත් ද, ඥානදර්ශනයත් ඍජු වූයේ වේ ද, ඔහු නො දිළින්දෙකැ යි (බුද්ධාදි උතුමෝ) කියති. ඔහුගේ ජීවිතය හිස් නො වේ.

එහෙයින් ප්‍රාඥ තෙමේ බුදුවරයන්ගේ ශාසනය සිහි කරන්නේ ශ්‍රද්ධාවත් ශීලයත් පැහැදීමත් ධර්මය දැකීමත් අනුයොග වශයෙන් පිරියිදු කරන්නේ යි.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අනේපිඩු ගැහැවිහට මේ ගාථාවලින් අනුමෝදනා කොට හුනස්නෙන් නැඟී වැඩියහ. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස් ව හුන්හ. එකත් පස් ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "එම්බා ආනන්ද, තෙපි මේ මහදවල් කොහි සිට එවු ද?" යි. වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් අනේපිඩු ගැහැවි තෙමේ මේ අවවාද-යෙන් ද මේ අවවාදයෙන් ද අවවාද කරන ලද්දේ යි. ආනන්ද, යම් සැරියුත් කෙනෙක් සිවුසෝවත් අඟ දස අයුරෙකින් බෙදූහු නම් ඒ සැරියුත් පණ්ඩිතයෙකි. ආනන්ද, සැරියුත් මහපැනැත්තෙකි යි.

## 11. 3. 7

## දුතිය අනාථපිණ්ඩික සුත්තං

3795. තෙන ඛො පන සමයෙන අනාථපිණ්ඩිකො ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං අම්භො පුරිස, යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්ද -පෙ- තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. අධිවාසෙසි ඛො ආයස්මා ආනන්දො තුණ්හීභාවෙන.

අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො ආයස්මා ආනන්දො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: ''කච්චි තෙ ගහපති ඛමනීයං කච්චි යාපනීයං කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො''ති? න මෙ භන්තෙ, ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

චතූහි ඛො ගහපති, ධම්මෙහි සමන්නාගතස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස හොති උත්තාසො[1] හොති ඡම්භිතත්තං, හොති සම්පරායිකං මරණභයං. කතමෙහි චතූහි? ඉධ ගහපති, අස්සුතවා පුථුජ්ජනො බුද්ධෙ අප්පසාදෙන සමන්නාගතො හොති. තඤ්ච පනස්ස බුද්ධෙ අප්පසාදං අත්තනි සමනුපස්සතො හොති උත්තාසො, හොති ඡම්භිතත්තං, හොති සම්පරායිකං මරණභයං.

පුනච'පරං ගහපති, අස්සුතවා පුථුජ්ජනො ධම්මෙ අප්පසාදෙන සමන්නාගතො හොති. තඤ්ච පනස්ස ධම්මෙ අප්පසාදං අත්තනි සමනුපස්සතො හොති උත්තාසො, හොති ඡම්භිතත්තං, හොති සම්පරායිකං මරණභයං.

පුනච'පරං ගහපති, අස්සුතවා පුථුජ්ජනො සඞ්ඝෙ අප්පසාදෙන සමන්නාගතො හොති. තඤ්ච පනස්ස සඞ්ඝෙ අප්පසාදං අත්තනි සමනුපස්සතො හොති උත්තාසො, හොති ඡම්භිතත්තං, හොති සම්පරායිකං මරණභයං.

පුනච'පරං ගහපති, අස්සුතවා පුථුජ්ජනො දුස්සීල්‍යෙන සමන්නාගතො හොති. තඤ්ච පනස්ස දුස්සීල්‍යං අත්තනි සමනුපස්සතො හොති උත්තාසො, හොති ඡම්භිතත්තං, හොති සම්පරායිකං මරණභයං. ඉමෙහි ඛො ගහපති, චතූහි ධම්මෙහි සමන්නාගතස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස හොති උත්තාසො, හොති ඡම්භිතත්තං, හොති සම්පරායිකං මරණභයං.

1. උත්ත්‍රාසො - ස්‍යා.

# 11. 3. 7
## දුතිය අනාථපිණ්ඩික සූත්‍රය

3795. එසමයෙහි **අනේපිඬු ගැහැවි** තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩිසේ ගිලන් වූයේ වේ. එකල්හි අනේපිඬු ගැහැවි එක්තරා පුරුෂයකු ඇමතී යː "එම්බා පුරුෂය, එව තෙපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹෙවු. එළඹ මා වදනින් ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගේ පා හිසින් වඳිවු ... අනුකම්පා පිණිස එහි එළඹෙන සේක්වා" යි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මුවින් නො බැණ ඉවසූහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන අනේපිඬුගැහැවිහුගේ නිවෙස්න වෙත එළඹියහ. එළඹ පැනවූ අස්නෙහි වැඩහුන්හ. වැඩහිඳ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අනේපිඬු ගැහැවිහට මෙය වදළහ. ගැහැවි, කිම තොපට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම දුක් වෙදනාවෝ අඩු වෙද්ද? වැඩි නො වෙද්ද? ඔවුන්ගේ අඩු වීම පැනේ ද? වැඩි වීමෙක් නො පෙනේ ද යි? වහන්ස, මට නොඉවසිය හැකි ය. නො යැපිය හැකි ය, මාගේ දැඩි දුක් වෙදනාවෝ වැඩි වෙත්, අඩු නො වෙත්. ඔවුන්ගේ වැඩි වීම පැනේ. අඩුවීමෙක් නො පැනේ යි.

ගැහැවිය, සිවුදහමෙකින් යුතු නුගත් පුහුදුන්හට තැතිගැන්මෙක් වෙයි. බියෙන් සැලීමෙක් වෙයි. පරලොවට හෙතු වූ මරණ බියෙක් වෙයි. කවර සිවුදහමෙකින් ද යත්ː ගැහැවි, මෙහි නුගත් පුහුදුන් තෙමේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි නො පැහැදීමෙන් යුතු වූයේ වෙයි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි වූ ඒ නො-පැහැදීමත් තමා කෙරෙහි ලා දක්නා වූ ඔහුට තැතිගැන්මෙක් වෙයි. බියෙන් සැලීමෙක් වෙයි. පරලොවට හෙතු වූ මරණ බියෙක් වෙයි.

ගැහැවි, නැවත අනෙකක් ද කියමිː නුගත් පුහුදුන් තෙමේ දහම්හි නොපැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම්හි වූ ඒ නො පැහැදීමත් තමා කෙරෙහි ලා දක්නා ඔහුට තැතිගැන්මෙක් වෙයි. බියෙන් සැලීමෙක් වෙයි. පරලොවට හෙතු වූ මරණ බියෙක් වෙයි.

ගැහැවි, නැවත අනෙකක් ද කියමිː නුගත් පුහුදුන් තෙමේ සඟුන් කෙරෙහි නොපැහැදීමෙන් යුතු වූයේ වෙයි. සඟුන් කෙරෙහි වූ ඒ නොපැහැදීමත් තමා කෙරෙහි ලා දක්නා ඔහුට තැතිගැන්මෙක් වෙයි. බියෙන් සැලීමෙක් වෙයි පරලොවට හෙතු වූ මරණබියෙක් වෙයි.

ගැහැවි, නැවත අනෙකක් ද කියමිː නුගත් පුහුදුන් තෙමේ දුසිල් බැවින් යුතු වූයේ වෙයි. ඒ දුසිල් බවත්, තමා කෙරෙහි ලා දක්නා ඔහුට තැතිගැන්මෙක් වෙයි. බියෙන් සැලීමෙක් වෙයි. පරලොවට හෙතු වූ මරණබියෙක් වෙයි ගැහැවි, මේ සිවුදහමින් යුතු නුගත් පුහුදුන්හට තැතිගැන්මෙක් වෙයි. බියෙන් සැලීමෙක් වෙයි. පරලොවට හෙතු වූ මරණබියෙක් වෙයි.



Free Distribution www.aathaapi.org

චතූහි ඛො ගහපති, ධම්මෙහි සමන්නාගතස්ස සුතවතො අරියසාවකස්ස න හොති උත්තාසො, න හොති ඡම්භිතත්තං, න හොති සම්පරායිකං මරණභයං. කතමෙහි චතූහි? ඉධ ගහපති, සුතවා අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. තං ඛො පනස්ස බුද්ධෙ අවෙච්චප්පසාදං අත්තනි සමනුපස්සතො න හොති උත්තාසො, න හොති ඡම්භිතත්තං, න හොති සම්පරායිකං මරණභයං.

පුනච'පරං ගහපති, සුතවා අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. තානි ච පනස්ස අරියකන්තානි සීලානි අත්තනි සමනුපස්සතො න හොති උත්තාසො. න හොති ඡම්භිතත්තං, න හොති සම්පරායිකං මරණභයං. ඉමෙහි ඛො ගහපති, චතූහි ධම්මෙහි සමන්නාගතස්ස සුතවතො අරියසාවකස්ස න හොති උත්තාසො, න හොති ඡම්භිතත්තං, න හොති සම්පරායිකං මරණභයන්ති.

නාහං භන්තෙ, ආනන්ද, භායාමි. ක්‍යාහං භායිස්සාමි[1]. අහං හි භන්තෙ බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- යානිමානි[2] භන්තෙ, භගවතා ගිහීසාමීචිකානි සික්ඛාපදානි පඤ්ඤත්තානි[3], නාහං තෙසං කිඤ්චි අත්තනි ඛණ්ඩං සමනුපස්සාමීති, ලාභා තෙ ගහපති, සුලද්ධං තෙ ගහපති, සොතාපත්තිඵලං ගහපති, ව්‍යාකතන්ති.

## 11. 3. 8

## තතිය අනාථපිණ්ඩිකසුත්තං

3796. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච: යතො ච ඛො ගහපති, අරියසාවකස්ස පඤ්ච භයානි වෙරානි වූපසන්තානි[4] හොන්ති, චතූහි ච සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, අරියො චස්ස ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො. සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො, සොතාපන්නො'හමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති. කතමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති:

1. ක්‍යාහං භායිස්සාමි – ස්‍යා.
2. යානි ඊමානි – මජසං, ස්‍යා.
3. දෙසිතානි – මජසං, ස්‍යා.
4. වූපසන්තානි ච – මජසං, ස්‍යා.

ගැහැවි, සිවුදහමෙකින් යුතු උගත් අරිසවුහට තැතිගැන්මෙක් නො වේ. බියෙන් සැලීමෙක් නො වේ. පරලොවට හෙතු වූ මරණබියෙක් නො වේ. කවර සිවුදහමෙකින යත්: ගැහැවි, මෙහි උගත් අරිසවු තෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු ද ... දෙවිමිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ'' යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි වූ ඒ ගුණ දන පැහැදීමක් තමා කෙරෙහි ලා දක්නා ඔහුට තැතිගැන්මෙක් නො වේ. බියෙන් සැලීමෙක් නො වේ. පරලොවට හෙතු වූ මරණබියෙක් නො වේ.

ගැහැවි, නැවත අනෙකක් ද කියමි: උගත් අරිසවු තෙමේ දහම් කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්‍යකාන්ත ශීලයෙන් යුතු වූයේ වෙයි. ඒ ආර්‍යකාන්ත සිලුත් තමා කෙරෙහි ලා දක්නා ඔහුට තැතිගැන්මෙක් නො වේ. බියෙන් සැලීමෙක් නො වේ. පරලොවට හෙතු වූ මරණබියෙක් නො වේ. ගැහැවි, මේ සිවු දහමින් යුතු උගත් අරිසවුහට තැතිගැන්මෙක් නො වේ. බියෙන් සැලීමෙක් නො වේ. පරලොවට හෙතු වූ මරණබියෙක් නො වේ.

වහන්ස, ආනන්‍දයෙනි, මම නො බමි. මම කුමකට බානෙම් ද? වහන්ස, මම වූ කලි ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු ද ... දෙවිමිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ'' යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගතයෙමි. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ගිහියන්ට සුදුසු වූ යම් මේ සිකපද කෙනෙක් පනවන ලද්ද හු ද, ඔවුනතර කඩ වූ කිසිවක් තමා කෙරෙහි නො දකිමි යි. ගැහැවි, තොපට ලාභයෙකි. ගැහැවි, තොපට මනාලැබුමෙකි. ගැහැවි, තොප විසින් සෝවන් පෙල පවසන ලද්ද යි.

## 11. 3. 8

## තතිය අනාථපිණ්ඩික සූත්‍රය

3796. එකල්හි අනේපිඩු ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් අනේ පිඩුගැහැවිහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: ගැහැවි, යම් කලෙක අරිසවුහුගේ පස්බිය වෙර සන්හුන්නාහු වෙද්ද, සිවු සෝවන් අඟිනුත් යුතු වූයේ වේ ද, අරි නයත් ඔහු විසින් නුවණින් මනාකොට දක්නා ලද්දේ මැනවින් පිළිවිදුනා ලද්දේ වේ ද, හෙතෙමේ කැමති වන්නේ ''ක්‍ෂය වූ නිරය ඇත්තෙම් ක්‍ෂය වූ තිරිසන් යොන් ඇත්තෙම් ක්‍ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම ක්‍ෂය වූ අපායදුර්ගතිවිනිපාත ඇත්තෙම් වෙමි. මම විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි'' යි තෙමේ ම තමා පවසන්නේ ය. කවර පස් බිය වෙර සන්හුන්නාහු ද යත්:

යං ගහපති, පාණාතිපාතී පාණාතිපාතපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදියති, පාණාතිපාතා පටිවිරතස්ස එතං භයං[1] වෙරං වූපසන්තං හොති. යං ගහපති, අදින්නාදායී අදින්නාදානපච්චයා -පෙ- යං ගහපති කාමෙසුමිච්ඡාචාරී කාමෙසුමිච්ඡාචාරපච්චයා -පෙ- යං ගහපති, මුසාවාදී මුසාවාදපච්චයා -පෙ- යං ගහපති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී සුරාමෙරයමජ්ජපමාදට්ඨානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදියති. සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතස්ස එතං භයං වෙරං වූපසන්තං හොති. ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති.

කතමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති: ඉධ ගහපති, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: “ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා”ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති.

කතමො චස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො? ඉධ ගහපති, අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසිකරොති: “ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉති ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති; යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී”ති. අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො.

1. එවං තං භයං - මජසං, ස්‍යා.

ගැහැවි පණිවා කරනසුල්ලෙක් පණිවාපසයෙන් දිටුදැමියෙහිත් යම් බියක් වෙරක් රැස් කෙරේ ද, පරලොවත් යම් බියක් වෙරක් රැස් කෙරේ ද, සිත පිළිබඳ වූත් දුකක් දොම්නසක් විඳී ද, පණිවායෙන් වැළකුණහුට මේ බයවෙර සන්හුන්නේ වේ. ගැහැවි, නුදුන් දෑ ගන්නාසුල්ලෙක් අයිනාදන් පසයෙන් යම්... ගැහැවි, කාමයෙහි මිසහසර ඇත්තෙක් කාමයෙහි මිසහසරපසයෙන් යම් ... ගැහැවි, මුසා බණන්නෙක් මුසවාපසයෙන් යම් ... ගැහැවි පමාවට කරුණු වූ රහමෙර මත්පැන් බොනසුල්ලෙක් පමාවට කරණු වූ රහමෙර මත්පැන් පසයෙන් දිටුදැමියෙහිත් යම් බියක් වෙරක් රැස් කෙරේ ද, පරලොවත් යම් බියක් වෙරක් රැස් කෙරේ ද, සිත පිළිබඳ වූත් දුකක් දොම්නසක් විඳී ද, පමාට කරුණු වූ රහමෙර මත්පැන් පානයෙන් වැළකුණහුට මේ බය වෙර සන්හුන්නේ වේ. මේ පස් බිය වෙර සන්හුන්නේ වේ.

කවර සිවු සෝවන් අඟින් යුතු වූයේ ද යත්: ගැහැවි, මෙහි අරිසවු තෙමේ. ''ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙනු දු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ බුද්ධ යහ භගවත්හ ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආයර්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. මේ සිවුසෝවන් අඟින් යුතු වූයේ වෙයි.

කවර අරිනයෙක් ඔහු විසින් නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනවින් පිළිවිදුනා ලද්දේ වේ ද යත්: ගැහැවි, මෙහි අරිසවු තෙමේ ''අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයෙන්, විඥානය වේ. විඥානප්‍රත්‍යයෙන් නාමරූප වේ. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වේ. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ. ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාවෝ වෙති. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදන වේ. උපාදනප්‍රත්‍යයෙන් භවය වේ. භවප්‍රත්‍යයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ ශොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ. අවිද්‍යාවේ ම නිරවශෙෂවිරාගනිරොධයෙන් සංස්කාරනිරොධය වේ. සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වේ ... සොකපරිදෙවදුක්ඛදෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. ''මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ ''යි යම් මේ පිළිසමුප්පාදනමෙක් වේ නම් ''මෙසේ මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපදීමෙන් මෙය උපදී. මෙසේ මෙය නැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ ''යි පිළිසමුපා ම මැනවින් නුවණින් මෙනෙහි කෙරෙයි. මේ අරිනය ඔහු විසින් නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනවින් පිළිවිදුනා ලද්දේ වෙයි.

යතො ඛො ගහපති, අරියසාවකස්ස ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති, ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති. අයමස්ස[1] අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො. සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති.

## 11. 3. 9

### භික්ඛුසුත්තං

3797. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. -පෙ- එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති, ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති. අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො. සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපායාදුග්ගතිවිනිපාතො, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති.

## 11. 3. 10

### නන්දකසුත්තං

3798. එකං සමයං භගවා වෙසාලියං විහරති **මහාවනෙ කූටාගාරසාලායං**. අථ ඛො **නන්දකො** ලිච්ඡවිමහාමත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො නන්දකං ලිච්ඡවිමහාමත්තං භගවා එතදවොච: චතූහි ඛො නන්දක, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. කතමෙහි චතූහි: ඉධ නන්දක, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො නන්දක, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො.

1. අයඤ්චස්ස - මජ්ඣං, ස්‍යා.

ගැහැවි, යම් කලෙක අරිසවුහුගේ මේ පස්බිය වෙර සන්හුන්නාහු වෙද්ද, මේ සිවුසෝවන් අඟින් යුතු වූයේ වේ ද මේ අරිනය ඔහු විසින් නුවණින් මනා කොට දක්නා ලද්දේ මැනවින් පිළිවිදුනා ලද්දේ වේ ද, හෙතෙමේ කැමති වන්නේ "ක්‍ෂය වූ නිරය ඇත්තෙම් ක්‍ෂය වූ තිරිසන් යොන් ඇත්තෙම් ක්‍ෂය වූ ප්‍රෙතවිෂය ඇත්තෙම් ක්‍ෂය වූ අපායදුර්ගතිවිනිපාත ඇත්තෙම් වෙමි: "මම විවස ව නොහෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි" යි තෙමේ ම තමා පවසන්නේ යි.

## 11. 3. 9

## භික්ඛු සූත්‍ර

3797. එකල්හි බොහෝ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්‍ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ මේ පස්බිය වෙර සන්හුන්නාහු වෙද්ද, මේ සිවුසෝවන් අඟින් යුතු වූයේ වේ ද, මේ අරිනය ඔහු විසින් නුවණින් මනා කොට දක්නා ලදදේ මැනවින් පිළිවිදුනා ලද්දේ වේ ද, හෙතෙමේ කැමති වනුයේ "ක්‍ෂය වූ නිරය ඇතියෙමි ක්‍ෂය වූ තිරිසන් යොන් ඇතියෙමි ක්‍ෂය වූ ප්‍රෙතවිෂය ඇතියෙමි ක්‍ෂය වූ අපායදුර්ගතිවිනිපාත ඇතියෙමි වෙමි. මම විවස ව නො හෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙමි" යි තෙමේ ම තමා පවසන්නේ යි.

## 11. 3. 10

## නන්‍දක සූත්‍රය

3798. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර මහවෙනෙහි කුළුගේහල්හි වැඩ වසනසේක. එකල්හි නන්‍දක නම් ලිච්ඡවි මහාමාත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් නන්‍දක නම් ලිච්ඡවි මහාමාත්‍රයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. නන්‍දක, සිවු දහමෙකින් යුතු අරිසවු තෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. කවර සිවු දහමෙකින යත්: නන්‍දක, මෙහි අරිසවු තෙමේ "භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව් මිනිසුන්ට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ" යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. නන්‍දක, මේ සිවුදහමින් යුතු අරිසවු තෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ.

ඉමෙහි ච පන නන්දක, චතූහි ධම්මෙහි සමන්නාගතො අරිය-සාවකො ආයුනා සංයුත්තො හොති දිබ්බෙනපි මානුසෙනපි. වණ්ණෙන -පෙ- සුඛෙන -පෙ- යසෙන -පෙ- ආධිපතෙය්‍යෙන සංයුත්තො හොති දිබ්බෙනපි මානුසෙනපි. තං ඛො පනාහං නන්දක, නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි. අපි ච යදෙව මයා සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමීති. එවං වුත්තෙ අඤ්ඤතරො පුරිසො නන්දකං ලිච්ඡවිමහාමත්තං එතදවොච: “නහානකාලො[1] භන්තෙ”ති. “අලන්දානි භණෙ, එතෙන බාහිරෙන නහානෙන. අලමිදං අජ්ඣත්තං නහානං. භවිස්සති යදිදං භගවති පසාදෙ”ති.

## සරකානිවග්ගො තතියො.

**තස්සුද්දානං :**

මහානාමා තයො වුත්තා සරකානෙනපරෙ දුවෙ,
තයො 'නාථපිණ්ඩිකෙන භික්ඛු ච නන්දකො දසාති.

1. න්හානකාලො - ස්‍යා

නන්‍දක, මේ සිවු දහමින් යුතු අරිසවු තෙමේ දෙව්මුවා වූත් මිනිස්මුවා වූත් ආයුෂයෙන් යුතු වූයේ වෙයි. වර්ණයෙන් ... සුවයෙන් ... යසසින් ... දෙව්මුවා වූත් මිනිස්මුවා වූත් අධිපති බැවින් යුතු වූයේ වෙයි. නන්‍දක, මම එය අන් මහණකුගෙන් හෝ බමුණකුගෙන් හෝ අසා නො කියමි. වැලිදු යමක් මවිසින් තමා ම දන්නා ලද්දේ තමා ම දක්නා ලද්දේ තමා ම අවබොධ කරන ලද්දේ නම් එය ම මම කියමි යි. මෙසේ වදළ කල්හි එක්තරා පුරුෂයෙක් නන්‍දක නම් ලිච්ඡවී මහාමාත්‍යයන්ට හිමියනි, "නහන කලැ"යි මෙය කී ය. "කොල, දූත් මේ බාහිර නෑමෙන් කම් නැත. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි යම් ඒ පැහැදීමෙක් වේ නම් මේ ඇතුළත නෑම පමණ වන්නේ" යි.

## තෙවෙනි සරකානිවර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

මහානාම නමින් තුනෙක් ද, සරකානි නමින් අනෙක් දෙකෙක් ද, අනාථපිණ්ඩික නමින් තුනෙක් ද, භික්ඛු නන්‍දක යී දෙකෙක් ද යි දශසූත්‍ර කෙනෙක් කියන ලද්හ.

# 4. පුඤ්ඤාභිසන්ද වග්ගො

## 11. 4. 1

### අභිසන්දසුත්තං

**3799. සාවත්ථියං:**

චත්තාරො'මෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. අයං පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති. අයං දුතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති. අයං තතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ''අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි''. අයං චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරාති.

## 11. 4. 2

### දුතියාභිසන්දසුත්තං

3800. චත්තාරොමෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. අයං පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො, පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. අයං චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරාති.

# 4. පුඤ්ඤාභිසන්ද වර්ගය

## 11. 4. 1

### අභිසන්ද සූත්‍රය

**3799. සැවැත්නුවර:**

මහණෙනි, සැපයට ප්‍රත්‍යය වූ මේ පුණ්‍යනදීහු කුශලනදීහු සතරෙකි. කවර සතරෙක යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. මේ සැපයට ප්‍රත්‍යය වූ පළමුවන පුණ්‍යනදී ය, කුශලනදී ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවු-තෙමේ "ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාත ය ... විඥයන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු ය"යි ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. මේ සැපයට ප්‍රත්‍යය වූ දෙවන පුණ්‍යනදී ය, කුශලනදී ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: "අරිසවු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝයා සුප්‍රතිපන්න ය ... ලොකයාට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර ය"යි සඞ්ඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. මේ සැපයට ප්‍රත්‍යය වූ තෙවන පුණ්‍යනදී ය, කුශලනදී ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවු තෙමේ "අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි." මේ සැපයට ප්‍රත්‍යය වූ සිවුවන පුණ්‍යනදී ය, කුශලනදී ය. මහණෙනි, මේ සතර සැපයට ප්‍රත්‍යය වූ පුණ්‍යනදීහු කුශලනදීහු යි.

## 11. 4. 2

### දුතියාභිසන්ද සූත්‍රය

3800. මහණෙනි, සැපයට ප්‍රත්‍යය වූ මේ පුණ්‍යනදීහු කුශල-නදීහු සතරෙකි. කවර සතරෙක යත්: මහණෙනි, මෙහි අරිසවු-තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ"යි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. මේ සැපයට ප්‍රත්‍යය වූ පළමුවන පුණ්‍යනදී ය, කුශලනදී ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවු තෙමේ ධර්මය කෙරෙහි .. සඞ්ඝයා කෙරෙහි ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවු තෙමේ මුදන ලද ත්‍යාග ඇත්තේ (ත්‍යාගශීලී වූයේ) (ආවවුන්ට දීම පිණිස) දෝනා ලද අත් ඇත්තේ ත්‍යාගයෙහි ඇලුණේ යදිනු ලැබීමට සුදුසු වූයේ දීමෙහිත් බෙදා දීමෙහිත් ඇලුණේ පහ ව ගිය මසුරුමල ඇති සිතින් යුතු ව ගිහිගෙයි වෙසේ. මේ සැපයට ප්‍රත්‍යය වූ සිවුවන පුණ්‍යනදී ය, කුශලනදී ය. මහණෙනි, මේ සතර සැපයට ප්‍රත්‍යය වූ පුණ්‍යනදීහු කුශලනදීහු යි.

## 11. 4. 3

## තතියාභිසන්දසුත්තං

3801. චත්තාරො'මෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. අයං පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති, උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. අයං චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරාති.

## 11. 4. 4

## දෙවපදසුත්තං

3802. චත්තාරිමානි භික්ඛවෙ, දෙවානං දෙවපදානි අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය. කතමානි චත්තාරි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං පඨමං දෙවානං දෙවපදං අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය.

පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. ඉදං දුතියං දෙවානං දෙවපදං අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය.

පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. ඉදං තතියං දෙවානං දෙවපදං අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය.

පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි ඉදං චතුත්ථං දෙවානං දෙවපදං අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි දෙවානං දෙවපදානි අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනායාති.

## 11. 4. 3

## තතියාභිසන්ද සූත්‍රය

3801. මහණෙනි, සැපයට ප්‍රත්‍යය වූ මේ පුණ්‍යාඝගඩා කුශලඝගඩා සතරෙකි. කවර සතරෙක යත්: මහණෙනි, මෙහි අරිසවූ තෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ බුඬයහ භගවත්හ''යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. මේ සැපයට ප්‍රත්‍යය වූ පළමුවන පින්ගඟ ය, කුසල්ගඟ ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවූ තෙමේ ධර්‍මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවූ තෙමේ නුවණැත්තේ වෙයි. උදයව්‍යය පිරිසිඳ දැනීමට සමත් වූ ආර්‍ය්‍ය වූ නිර්වෙදයට හිත වූ මැනවින් දුක් ගෙවීමට පමුණුවන ප්‍රඥායෙන් සමන්වාගත වෙයි. මේ සැපයට ප්‍රත්‍යය් වූ සිවුවන පින්ගඟ ය, කුසල්ගඟ ය. මහණෙනි, මේ සතර සැපයට ප්‍රත්‍යය වූ පුණ්‍යාගඩාවෝ කුශලගඩාවෝ යි.

## 11. 4. 4

## දෙවපද සූත්‍රය

3802. මහණෙනි, නො පිරිසිදු සතුන් පිරිසිදු කරනු පිණිස නොබබළන සතුන් බබළවනු පිණිස මේ දෙවියන්ගේ දෙව්පිය සතරෙකි. කවර සතරෙක යත්: මහණෙනි, මෙහි අරිසවූ තෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ බුඬයහ භගවත්හ''යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මේ නොපිරිසිදු සතුන් පිරිසිදු කරනු පිණිස නොබබළන සතුන් බබළවනු පිණිස වූ දෙවියන්ගේ පළමුවන දෙව්පිය ය.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවූ තෙමේ ''ධර්‍මය භාග්‍යවතුන් වහන්සේ විසින් මනා කොට වදරන ලද්දේ ය ... නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දත යුත්තේ''යි දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මේ නොපිරිසිදු සතුන් පිරිසිදු කරනු පිණිස නොබබළන සතුන් බබළවනු පිණිස වූ දෙවියන්ගේ දෙවන දෙව්පිය ය.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවූ තෙමේ ''භාග්‍යවතුන් වහන්සේගේ සවුසඟහු සුපිළිපන්හ ... ලොවට අනුතුරු පින්කෙතැ''යි සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මේ නොපිරිසිදු සතුන් පිරිසිදු කරනු පිණිස නොබබළන සතුන් බබළවනු පිණිස වූ දෙවියන්ගේ තෙවන දෙව්පිය ය.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවූ තෙමේ අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. මේ නොපිරිසිදු සතුන් පිරිසිදු කරනු පිණිස නොබබළන සතුන් බබළවනු පිණිස වූ දෙවියන්ගේ සිවුවන දෙව්පිය ය. මහණෙනි, මේ සතර නොවිසුදු සතුන්ගේ විසිදු පිණිස නොදිලෙන සතුන් දුල්වනු පිණිස වූ දෙවියන්ගේ දෙව්පිය යි.

## 11. 4. 5

## දුතිය දෙවපදසුත්තං

3803. චත්තාරි'මානි භික්ඛවෙ, දෙවානං දෙවපදානි අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය. කතමානි චත්තාරි? ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. සො ඉති පටිසඤ්චික්ඛති: "කින්නු ඛො දෙවානං දෙවපදන්ති". සො එවං පජානාති: "අබ්‍යාපජ්ඣපරමෙ ඛ්වාහං එතරහි දෙවෙ සුණාමි. න ඛො පනාහං කඤ්චි බ්‍යාබාධෙමි තසං වා ථාවරං වා. අද්ධාහං දෙවපදධම්මසමන්නාගතො විහරාමී"ති. ඉදං පඨමං දෙවානං දෙවපදං අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය.

පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. සො ඉති පටිසඤ්චික්ඛති: "කින්නු ඛො දෙවානං දෙවපදන්ති". සො එවං පජානාති: "අබ්‍යාපජ්ඣපරමෙ ඛ්වාහං එතරහි දෙවෙ, සුණාමි න ඛො පනාහං කඤ්චි බ්‍යාබාධෙමි තසං වා ථාවරං වා. අද්ධාහං දෙවපදධම්මසමන්නාගතො විහරාමී"ති. ඉදං චතුත්ථං දෙවානං දෙවපදං අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනාය. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි දෙවානං දෙවපදානි අවිසුද්ධානං සත්තානං විසුද්ධියා අපරියොදතානං සත්තානං පරියොදපනායාති.

## 11. 4. 6

## සභාගතසුත්තං

3804. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතං අත්තමනා දෙවා සභාගතා[1] කථෙන්ති. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. යා තා දෙවතා බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා ඉතො චුතා තත්‍රුපපන්නා, තාසං එවං හොති: "යථාරූපෙන ඛො මයං බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා තතො චුතා ඉධූපපන්නා. අරියසාවකොපි තථාරූපෙන බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො එහීති දෙවානං සන්තිකෙ"ති"

1. සභාගතං - මජසං.

## 11. 4. 5

## දුතිය දෙවපද සූත්‍රය

3803. මහණෙනි, අවිසුද්ධ සත්වයන්ගේ විසුද්ධි පිණිස නොදිලෙන සත්වයන්ගේ දිලුම පිණිස මේ දෙවියන්ගේ දෙව්පිය සතරෙකි. කවර සතරෙක යත්; මහණෙනි, මෙහි අරිසවු තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ"යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. හෙතෙමේ "දෙවියන්ගේ දෙව්පිය කිමෙක් දැ"යි? මෙසේ නුවණින් සලකා බලයි. හෙතෙමේ මෙසේ දැන ගනී: "මම දැන් දෙවියන් නිදුක්බව පරම කොට ඇත්තවුනැ යි අසමි. මම තැති ගන්නා වූ හෝ නොතැති ගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි. එකාන්තයෙන් මම දෙව්පිය දහමින් යුතු වූයෙම් වෙසෙමි" යි. අවිසුද්ධ සත්වයන්ගේ විසුද්ධි පිණිස නොදිලෙන සත්වයන්ගේ දිලුම පිණිස මේ දෙවියන්ගේ පළමුවන දෙව්පිය ය.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: "අරිසවු තෙමේ දහම් කෙරෙහි ... සඟුන් කෙරෙහි ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: "අරිසවු තෙමේ අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. හෙතෙමේ දෙවියන්ගේ දෙව්පිය කිමෙක් දැ"යි මෙසේ නුවණින් සලකා බලයි. හෙතෙමේ මෙසේ දැනගනී. "මම දැන් දෙවියන් නිදුක්බව පරම කොට ඇත්තවුනැ යි අසමි. මම තැතිගන්නා වූ හෝ නොතැති ගන්නා වූ හෝ කිසිවකු නො ම පෙළමි. එකාන්තයෙන් මම දෙව්පිය දහමින් යුතු වූයෙම් වෙසෙමි"යි. අවිසුද්ධ සත්වයන්ගේ විසුද්ධි පිණිස නොදිලෙන සත්වයන්ගේ දිලුම පිණිස වූ මේ දෙවියන්ගේ සිවුවන දෙව්පිය ය. මහණෙනි, මේ සතර අවිසුද්ධ සත්වයන්ගේ විසුද්ධි පිණිස නොදිලෙන සත්වයන්ගේ දිලුම පිණිස වූ දෙවියන්ගේ දෙව්පිය යි.

## 11. 4. 6

## සභාගත සූත්‍රය

3804. මහණෙනි, සිවුදහමෙකින් යුතු වූවහු (ඇරබ) සතුටු සිත් ඇති දෙවියෝ සභාවට පැමිණියාහු කියත්. (කථා කෙරෙත්) කවර සිවු දහමෙකින යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙවිමිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භගවත්හ"යි බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. යම් ඒ දෙව් කෙනෙක් බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වූවාහු මෙයින් ච්‍යුත ව එහි පැමිණියාහු නම් ඔවුනට මෙබඳු සිතෙක් වෙයි: "අපි බුදුරජාණන් වහන්සේ කෙරෙහි යම්බඳු අචල ප්‍රසාදයෙකින් සමන්වාගත වූවමෝ එයින් ච්‍යුත ව මෙහි පැමිණියමෝ නම් අරිසවු තෙමේත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි එබඳු අචල-ප්‍රසාදයෙකින් සමන්වාගත දෙවියන් සමීපයට පැමිණෙන්නේ ය"යි.

පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. යා තා දෙවතා අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා ඉතො චුතා තත්‍රූපපන්නා. තාසං එවං හොති "යථාරූපෙහි ඛො මයං අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා තතො චුතා ඉධූපපන්නා, අරියසාවකොපි තථාරූපෙහි අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො එත්ථ දෙවානං සන්තිකෙ"ති ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතං අත්තමනා දෙවා සභාගතං කථෙන්තීති.

## 11. 4. 7

### මහානාමසුත්තං

3805. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "කිත්තාවතා නු ඛො භන්තෙ, උපාසකො හොතී"ති? යතො ඛො මහානාම, බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති, එත්තාවතා ඛො මහානාම, උපාසකො හොතීති.

කිත්තාවතා නු ඛො භන්තෙ, උපාසකො සීලසම්පන්නො හොතීති? යතො ඛො මහානාම උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. එත්තාවතා ඛො මහානාම, උපාසකො සීලසම්පන්නො හොතීති.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො සද්ධාසම්පන්නො හොතීති? ඉධ මහානාම, උපාසකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. එත්තාවතා ඛො මහානාම, උපාසකො සද්ධාසම්පන්නො හොතීති.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: ''අරිසවු තෙමේ දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: ''ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. යම් ඒ දෙව් කෙනෙක් ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වූවාහු මෙයින් ච්‍යුත ව එහි පැමිණියාහු නම් ඔවුනට මෙබඳු සිතෙක් වෙයි. ''අපි යම් බඳු ආර්‍ය්‍යකාන්තශීලයෙකින් සමන්වාගත වූවමෝ එයින් ච්‍යුත ව මෙහි පැමිණියමෝ නම් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේත් එබඳු ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත ය. දෙවියන් සමීපයට පැමිණෙන්නේ ය''යි. මහණෙනි, මෙ සිවුදහමින් යුතු වූවහු (ඇරබ) සතුටු සිත් ඇති දෙවියෝ සභාවට පැමිණියාහු කියති යි.

## 11. 4. 7

### මහානාම සූත්‍රය

3805. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යදනව්වෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි **මහානාම** ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත් පසෙක හුන් මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, කෙතෙකින් උපාසක වේ ද''යි? මහානාම, යම් කලෙක බුදුන් පිහිට කොට ගියේ වේ ද, දහම පිහිට කොට ගියේ වේ ද, සඟුන් පිහිට කොට ගියේ වේ ද, මහානාම, මෙතෙකින් උපාසක වේ යි.

වහන්ස, උවසු තෙමේ කෙතෙකින් සිල්සපන් වේ ද?යි. ''මහානාම, යම් කලෙක උවසු තෙමේ පණිවායෙන් වැළකුණේ වේ ද අයිනාදනින් වැළකුණේ වේ ද, කාමයෙහි මිසහසරින් වැළකුණේ වේ ද, මුසවායෙන් වැළකුණේ වේ ද, *පමාවට කරුණු වූ රහමෙර මත්පැනින් වැළකුණේ වේ ද, මහානාම, උවසු තෙමේ මෙතෙකින් සිල්සපන් වේ''යි.

වහන්ස, උවසුතෙමේ කෙතෙකින් සැදැසපන් වේ ද?යි. මහානාම, මෙහි උවසු තෙමේ සැදැහැ ඇත්තේ වේ ද, ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙනුදු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තර පුරුෂදම්‍ය-සාරථිහ, දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ''යි තථාගතයන්ගේ බුදුබව සඳහා ද, මහානාම, උවසු තෙමේ මෙතෙකින් සැදැසපන් වේ යි.

---

*. දීඝනිකායවණ්ණනා 689, සං. යු. අට්ඨකථා 3 231.



Free Distribution www.aathaapi.org

කිත්තාවතා පන භන්තෙ, උපාසකො චාගසම්පන්නො හොතීති? ඉධ පන මහානාම, උපාසකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. එත්තාවතා ඛො මහානාම, උපාසකො චාගසම්පන්නො හොතීති.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො පඤ්ඤාසම්පන්නො හොතීති? ඉධ මහානාම උපාසකො පඤ්ඤවා හොති, උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. එත්තාවතා ඛො මහානාම, උපාසකො පඤ්ඤාසම්පන්නො හොතීති.

## 11. 4. 8

### වස්සසුත්තං

3806. සෙය්‍යථාපි භික්ඛවෙ, උපරිපබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තං උදකං යථානින්නං පවත්තමානං පබ්බතකන්දරපදරසාඛා පරිපූරෙන්ති. පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුසුබ්භෙ පරිපූරෙන්ති. කුසුබ්භා පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති. මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති. කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති. මහානදියො පරිපූරා මහාසමුද්දං සාගරං පරිපූරෙන්ති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස යො ච බුද්ධෙ අවෙච්චප්පසාදො, යො ච ධම්මෙ අවෙච්චප්පසාදො, යො ච සඞ්ඝෙ අවෙච්චප්පසාදො යානි ච අරියකන්තානි සීලානි, ඉමෙ ධම්මා සන්දමානා පාරං ගන්ත්වා ආසවානං ඛයාය සංවත්තන්තීති.

## 11. 4. 9

### කාලිගොධාසුත්තං

3807. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කාලිගොධාය සාකියානියා නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො කාලිගොධා සාකියානී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කාලිගොධං සාකියානිං භගවා එතදවොච:

1. සංසන්දමානා – සී.

වහන්ස, උවසුතෙමේ කෙසේ කෙතෙකින් ත්‍යාග සම්පන්න වේ ද? යි. මහානාම, මෙහි උවසු තෙමේ මුදනලද ත්‍යාග ඇත්තේ දෝනා ලද අත් ඇත්තේ ත්‍යාගයෙහි ඇලුණේ ඉල්ලනු ලැබීමට සුදුසු වූයේ දීමෙහිත් බෙද දීමෙහිත් ඇලුණේ පහව ගිය මසුරු මල ඇති සිතින් යුතු ව ගිහිගෙහි වෙසේ ද, මහානාම, උවසු තෙමේ මෙතෙකින් ත්‍යාගසම්පන්න වේ යි.

වහන්ස, උවසුතෙමේ කෙතෙකින් ප්‍රඥාසම්පන්න වේ ද? යි. මහානාම, මෙහි උවසුතෙමේ පැනැත්තේ වේ ද, උදයව්‍යයය පිරිසිඳ දනීමට සමත් වූ ආර්‍ය්‍ය වූ නිරොධයට හිත වූ මැනවින් දුක් ගෙවීමට කරුණු වූ ප්‍රඥායෙන් සමන්වාගත වේ ද, මහානාම, උවසුතෙමේ මෙතෙකින් ප්‍රඥා සම්පන්න වේ යි.

## 11. 4. 8

### වස්ස සූත්‍රය

3806. මහණෙනි, යම්සේ පවුමතුයෙහි මහත්පොද ඇති වැස්ස වස්නා කල ඒ දිය පහත් බිම් අනුව පවත්නේ පවුකඳුරැලි ඇළ දෙළ පුරවා ද, පවුකඳුරැලි ඇළදෙළ පිරුණාහු කුඩා හෙප් පුරවද් ද, කුඩා හෙප් පිරුණාහු මහහෙප් පුරවද් ද, මහහෙප් පිරුණාහු කුඩා ගඞ්ගා පුරවද් ද, කුඩා ගඞ්ගා පිරුණාහු මහාගඞ්ගා පුරවද් ද, මහාගඞ්ගා පිරුණාහු මහමුහුදුසයුර පුරවද් ද, මහණෙනි, එසෙයින් ම අරිසවුහට බුදුන් කෙරෙහිත් යම් ගුණ දත පැහැදීමෙක් වේ ද, දහම්හි ගුණ දත පැහැදීමෙක් වේ ද, සඟුන් කෙරෙහිත් යම් ගුණ දත පැහැදීමෙක් වේ ද, යම් ආර්‍ය්‍යකාන්ත ශීලයෝත් වෙද්ද, මේ දහම්හු ගලන්නාහු පරතෙරට ගොස් ආසුවක්‍ෂය පිණිස පවතිත් යි.

## 11. 4. 9

### කාලිගොධා සූත්‍රය

3807. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යදනව්වෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙන කාලිගොධා නම් ශාක්‍යදුවගේ නිවෙස්න වෙත එළඹී සේක. එළඹ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. එකල්හි කාලිගොධා සැහැදුව භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නා ය. එකත්පස් ව හුන් කාලිගොධා සැහැදුවට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක.

චතූහි ඛො ගොධෙ, ධම්මෙහි සමන්නාගතා අරියසාවිකා සොතාපන්නා හොති අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා. කතමෙහි චතූහි: ඉධ ගොධෙ අරියසාවිකා බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, මුත්තචාගා පයතපාණී වොස්සග්ගරතා යාචයොගා දානසංවිභාගරතා. ඉමෙහි ඛො ගොධෙ, චතූහි ධම්මෙහි සමන්නාගතා අරියසාවිකා සොතාපන්නා හොති අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණාති.

යානිමානි භන්තෙ, භගවතා චත්තාරි සොතාපත්තියඞ්ගානි, දෙසිතානි. සංවිජ්ජන්තෙ තෙ ධම්මා මයි. අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. අහං හි භන්තෙ, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- යං ඛො පන කිඤ්චි කුලෙ දෙය්‍යධම්මං සබ්බං තං අප්පටිවිභත්තං සීලවන්තෙහි කල්‍යාණධම්මෙහීති. ලාභා තෙ ගොධෙ, සුලද්ධං තෙ ගොධෙ, සොතාපත්තිඵලං තයා[1] ගොධෙ, ව්‍යාකතන්ති.

## 11. 4. 10

## නන්දියසුත්තං

3808. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො නන්දියො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො නන්දියො සක්කො භගවන්තං එතදවොච: "යස්සෙව නු ඛො භන්තෙ, අරියසාවකස්ස චත්තාරි සොතාපත්තියඞ්ගානි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං නත්ථි, සො එව[2] නු ඛො භන්තෙ, අරියසාවකො පමාදවිහාරී"ති?

යස්ස ඛො නන්දිය, චත්තාරි සොතාපත්තියඞ්ගානි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං නත්ථි; තමහං බාහිරො පුථුජ්ජනපක්ඛෙ ඨිතොති වදමි. අපි ච නන්දිය, යථා අරියසාවකො පමාදවිහාරී චෙව හොති අප්පමාදවිහාරී ච. තං සුණාහි. කථඤ්ච නන්දිය, අරියසාවකො පමාදවිහාරී හොති: ඉධ නන්දිය, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. සො තෙන බුද්ධෙ අවෙච්චප්පසාදෙන සන්තුට්ඨො න උත්තරිං වායමති දිවා පවිවෙකාය රත්තිං පටිසල්ලානාය. තස්ස එවං පමත්තස්ස විහරතො පාමුජ්ජං න හොති, පාමුජ්ජෙ අසති පීති න හොති, පීතියා අසති පස්සද්ධි න හොති, පස්සද්ධියා අසති දුක්ඛං විහරති. දුක්ඛිනො චිත්තං න සමාධියති. අසමාහිතෙ චිත්තෙ ධම්මා න පාතුභවන්ති. ධම්මානං අපාතුභාවා පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති.

1. තෙ – සතා.
2. සොව – සතා.

ගොධාවෙනි, සිව්දහමකින් යුත් ආර්‍ය්‍යශ්‍රාවිකා තොමෝ විවස ව නො හෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වූවා වේ. කවර සිව්දහමකින යත්: ගොධාවෙනි,. මෙහි අරිසවි-තොමෝ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ'' යි. බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූවා වෙයි. දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... මුදන ලද ත්‍යාග ඇත්තී දෝනා ලද අත් ඇත්හී ත්‍යාගයෙහි ඇලුණු ඉල්ලනු ලැබීමට සුදුසු වූවා දීමෙහිත් බෙද දීමෙහිත් ඇලුණු පහව ගිය මසුරුමල ඇති සිතින් යුතු ව ගිහිගෙයි වෙසේ. ගොධාවෙනි, මේ සිව්දහමින් යුතු අරිසැවි තොමෝ විවස ව නො හෙන සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වූවා වේ යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ සිවු සෝවන් අඟ ඇති කෙනෙක් වදරන ලද්දහු ද, ඒ දහම්හු මා කෙරෙහි ඇත. මමත් ඒ දහම්හි දක්නා ලැබෙමි. වහන්ස, මම ''ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූවා වෙමි. දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... කුලයෙහි යම්කිසි දියයුතු දෑයෙක් වේ නම් ඒ සියල්ල කලණ දහම් ඇති සිල්වතුන් හා නො බෙදන ලද්දේ වේ යි. ගොධාවෙනි, තොපට ලාභයෙකි. තොපට මනා ලැබුමෙකි. ගොධාවෙනි, තොප විසින් සෝවන්පෙල පවසන ලදයි.

## 11. 4. 10

## නන්දිය සූත්‍රය

3808. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යදනවුවෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි නන්දිය ශාක්‍යතෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස් ව හුන් නන්දිය ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල-කෙළේ ය: වහන්ස, ''යම් ම අරිසව්වකුහට සිවු සෝවන්අඟ සියල්ලෙන් සියල්ල මුළුල්ලෙන් සියල්ල නැද්ද වහන්ස, ඒ අරිසවුතෙමේ ම පමාවිහරණ ඇත්තේ ද''යි?

නන්දිය, ''යමකුට සිවු සෝවන් අඟ සියල්ලෙන් සියල්ල මුළුල්ලෙන් සියල්ල නැද්ද, ඔහු බාහිර වූ පුහුදුන්පසෙහි සිටියෙකැ''යි මම කියමි. නන්දිය, වැලිදු අරිසවුතෙමේ යම්සේ පමාවිහරණ ඇත්තේත් නො පමා විහරණ ඇත්තේත් වේ නම් එය අස. නන්දිය, අරිසවුතෙමේ කෙසේ නම් පමා විහරණ ඇත්තේ වේ ද යත්: නන්දිය, මෙහි අරිසවුතෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්-මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. හෙතෙමේ බුදුන් කෙරෙහි වූ ඒ අචලප්‍රසාදයෙන් සතුටු වූයේ දහවල් තුන් විවේකසුව පිණිසත් රෑ සමවත්සුව පිණිසත් මතු වැයම් නො කෙරෙයි. මෙසේ පමා ව වෙසෙන ඔහුට පාමුජ්ජ (තරුණප්‍රීති)ය නො වේ. පාමුජ්ජය නැති කල්හි ප්‍රීතිය නො වේ. ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය නො වේ. පස්සද්ධිය නැති කල්හි දුකසේ වෙසේ. දුක් ඇත්තහුගේ සිත එකඟ නො වේ. සිත එකඟ නොවූ කල්හි සමථවිපස්සනා දහම් පහළ නො වේ. දහම් පහළ නොවීමෙන් ''පමාවිහරණ ඇත්තේ ය'' යි ම ගිණුමට යේ.

පුනච'පරං නන්දිය, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. සො තෙහි අරියකන්තෙහි සීලෙහි සන්තුට්ඨො න උත්තරිං වායමති දිවා පවිවෙකාය රත්තිං පටිසල්ලානාය. තස්ස එවං පමත්තස්ස විහරතො පාමුජ්ජං න හොති. පාමුජ්ජෙ අසති පීති න හොති. පීතියා අසති පස්සද්ධි න හොති. පස්සද්ධියා අසති දුක්ඛං විහරති. දුක්ඛිනො චිත්තං න සමාධියති. අසමාහිතෙ චිත්තෙ ධම්මා න පාතුභවන්ති. ධම්මානං අපාතුභාවා පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති. එවං ඛො නන්දිය, අරියසාවකො පමාදවිහාරී හොති.

කථඤ්ච නන්දිය, අරියසාවකො අප්පමාදවිහාරී හොති: ඉධ නන්දිය, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. සො තෙන බුද්ධෙ අවෙච්චප්පසාදෙන අසන්තුට්ඨො උත්තරිං වායමති දිවා පවිවෙකාය රත්තිං පටිසල්ලානාය, තස්ස එවං අප්පමත්තස්ස විහරතො පාමුජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො චිත්තං සමාධියති. සමාහිතෙ චිත්තෙ ධම්මා පාතුභවන්ති. ධම්මානං පාතුභාවා අප්පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති.

පුනච'පරං නන්දිය, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. සො තෙහි අරියකන්තෙහි සීලෙහි අසන්තුට්ඨො උත්තරිං වායමති දිවා පවිවෙකාය රත්තිං පටිසල්ලානාය. තස්ස එවං අප්පමත්තස්ස විහරතො පාමුජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො චිත්තං සමාධියති. සමාහිතෙ චිත්තෙ ධම්මා පාතුභවන්ති. ධම්මානං පාතුභාවා අප්පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති. එවං ඛො නන්දිය, අරියසාවකො අප්පමාදවිහාරී හොතීති.

## පුඤ්ඤාභිසන්දවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

අභිසන්ද තයො වුත්තා දුවෙ දෙවපදනි ච,
සභාගතං මහානාමො වස්සං කාළි ච නන්දියාති.

---

1. රත්තියා - සයා, අට්ඨකථා.

නන්දිය, නැවත අනෙකක් ද කියමි: "අරියසවුතෙමේ දහමෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවත්තනික වූ ආයර්‍යකාන්ත-ශීලයෙන් යුතු වූයේ වෙයි. හෙතෙමේ ඒ ආයර්‍යකාන්තශීලයෙන් සතුටු වූයේ දහවල් තුන්විවේක සුව පිණිසත් රෑ සමවත්සුව පිණිසත් මතු වැයම් නො කෙරෙයි. මෙසේ පමා ව වෙසෙන ඔහුට පාමුජ්ජය නො වේ. පාමුජ්ජය නැති කල්හි ප්‍රීතිය නො වේ. ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය නො වේ. පස්සද්ධිය නැති කල්හි දුකසේ වෙසේ. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවේ. සිත එකඟ නො වූ කල්හි සමථවිපස්සනා දහම් පහළ නො වේ. දහම් පහළ නොවීමෙන් "පමාවිහරණ ඇත්තේ ය"යි ම ගිණුමට යේ. නන්දිය, මෙසේ අරියසවුතෙමේ පමාවිහරණ ඇත්තේ වේ.

නන්දිය, අරියසවුතෙමේ කෙසේ නම් නො පමාවිහරණ ඇත්තේ වේ ද යත්: නන්දිය මෙහි අරියසවුතෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. හෙතෙමේ බුදුන් කෙරෙහි වූ ඒ අචලප්‍රසාදයෙන් සතුටු නොවූයේ දහවල් තුන්විවේක සුව පිණිසත් රෑ සමවත්සුව පිණිසත් මතු වැයම් කෙරෙයි. මෙසේ නො පමා ව වෙසෙන ඔහුට ප්‍රමුදිතභාවය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතසිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. සිත එකඟ වූ කල්හි සමථවිපස්සනාදහම් පහළ වේ. දහම් පහළවීමෙන් "නොපමාවිහරණ ඇත්තේ ය"යි ම ගිණුමට යේ.

නන්දිය, නැවත අනිකක් ද කියමි. අරියසවුතෙමේ දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවත්තනික වූ ආයර්‍යකාන්ත-ශීලයෙන් සතුටු නො වූයේ දහවල් තුන් විවේකසුව පිණිසත් රෑ සමවත්සුව පිණිසත් මතු වැයම් කෙරෙයි. මෙසේ නො පමාව වෙසෙන ඔහුට ප්‍රමුදිතභාවය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතසිත් ඇත්තහුගේ කය සන්හිඳේ. සන්හුන් කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වේ. සිත එකඟ වූ කල්හි සමථවිපස්සනා දහම් පහළ වේ. දහම් පහළ වීමෙන් නො පමා විහරණ ඇත්තේ යයි ම ගිණුමට යේ. නන්දිය, මෙසේ අරියසවුතෙමේ නො පමා විහරණ ඇත්තේ වේ යි.

## සිවුවැනි පුඤ්ඤාභිසන්ද වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

අභිසන්දසුතුරු තුනෙක් ද, දෙවපදසුතුරු දෙකෙක් ද, සභාගත, මහානාම, වස්ස, කාලිගොධා, නන්දිය යි පසෙක් ද යි දස සුතුරු කෙනෙක් කියන ලදහ යි.

# 5. සගාථ පුඤ්ඤාභිසන්දවග්ගො

## 11. 5. 1

### අසඞ්ඛෙය්‍ය[1] සුත්තං

3809. චත්තාරො'මෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. අයං පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච'පරං භික්ඛවෙ, අරියසාවකො අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අයං චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා.

ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගණෙතුං.[2] "එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො"ති. අථ ඛො "අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධො"ත්වෙව සඞ්ඛං ගච්ඡති. සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දෙ න සුකරං උදකස්ස පමාණං ගණෙතුං "එත්තකානි උදකාළ්හකානීති වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසහස්සානීති වා." අථ ඛො "අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාඋදකක්ඛන්ධො"ත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ, ඉමෙහි චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගණෙතුං, "එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො"ති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්වෙව සඞ්ඛං[3] ගච්ඡතී"ති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

මහොදධිං අපරිමිතං මහාසරං,
බහුභෙරවං රතනගණානමාලයං
නජ්ජො යථා නරගණසඞ්ඝසෙවිතා,
පුථූ සවන්ති උපයන්ති සාගරං.

එවං නරං අන්නදපානවත්ථදං[4]
සෙය්‍යානිසජ්ජත්ථරණස්ස[5] දායකං,
පුඤ්ඤස්ස ධාරා උපයන්ති පණ්ඩිතං
නජ්ජො යථා වාරිවහාව සාගරන්ති[6].

---

1. අභිසන්ද- මජසං.
2. ගනෙතුං - සී 2.
3. සඞ්ඛ්‍යං - මජසං, සඞ්ඛාහං - සී 2.
4. අන්නපානවත්ථදදං - ස්‍යා, මජසං.
5. සෙය්‍යානි පච්චත්ථරණස්ස - මජසං, ස්‍යා.
6. නරගණසඞ්ඝසෙවිතා - සී 2, ස්‍යා.

# 5. සගාථ පුඤ්ඤාභිසන්ද වර්ගය

## 11. 5. 1

## අසඞ්ඛෙය්‍ය සූත්‍රය

3809. මහණෙනි, සැපයට ප්‍රත්‍යය වූ මේ පුණ්‍යගඞ්ගා කුසලගඞ්ගා සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි අරියවූ තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධ ය හ. භගවත් හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. මේ සුවයට ප්‍රත්‍යය වූ පළමුවන පින්ගඟ ය. කුසල්ගඟ ය. මහණෙනි, නැවත අනිකක් ද කියමි: අරියවූතෙමේ දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... මහණෙනි, නැවත අනිකක් ද කියමි: අරියවූතෙමේ අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍යකාන්ත-ශීලයෙන් සමන්වාගත වෙයි. මේ සුවයට ප්‍රත්‍යය වූ සිවුවන පින්ගඟ ය. කුසල්ගඟ ය. මහණෙනි, මේ සතර සුවයට ප්‍රත්‍යය වූ පුණ්‍යගඞ්ගාවෝ කුසලගඞ්ගාවෝ ය.

මහණෙනි, මේ සිවු පුණ්‍යගඞ්ගාවන් ගෙන් කුසලගඞ්ගාවන් ගෙන් යුතු වූ අරිසවූහට සුවයට ප්‍රත්‍යය වූ මෙතෙක් පින්ගඟෙකැ කුසල්ගඟෙකැ යි පිනෙහි පමණ ගණන්නට සුකර නො වේ. වැලි ගණන් නො කළ හැකි, පමණ නො කළ හැකි, මහපින් කඳෙකැයි ම ගිණුමට යේ. මහණෙනි, යම් සේ මහමුහුදෙහි දිය ලාස් මෙතෙකැයි හෝ දිය ලාස් මෙතෙක් සියයකැයි හෝ දිය ලාස් මෙතෙක් දහසෙකැයි හෝ දිය ලාස් මෙතෙක් සියදහසෙකැයි හෝ දියෙහි පමණ ගණන්නට සුකර නො වේ ද, වැලි ගණන් නො කළ හැකි, පමණ නො කළ හැකි, මහදියකඳෙකැයි ම ගිණුමට යේ ද, මහණෙනි, එසෙයින් ම මේ සිවු පුණ්‍යගඞ්ගාවන්ගෙන් කුශලගඞ්ගාවන්ගෙන් යුතු වූ අරිසවූහට සුවයට ප්‍රත්‍යය වූ මෙතෙක් පින්ගඟෙකැයි කුසල්ගඟෙකැයි පිනෙහි පමණ ගණන්නට සුකර නො වේ. වැලි ගණන් නොකළ හැකි පමණ නොකළ හැකි මහපින් කඳෙකැයි ම ගිණුමට යේ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක ... ශාස්තෘන් වහන්සේ මෙය ද වදළ සේක.

මිනිස් සමූහයා විසින් සෙවුනා ලද ගලාබස්නා බොහෝ වූ නදීහු මහත්දියකඳ දරන, පමණ නොකළ හැකි, මහත් ගඞ්ගාවන්ගේ එක්වීම ඇති, බෙහෙවින් බිහිසුණු වූ, රුවන්සමූහයට උත්පත්තිස්ථාන වූ සයුරට යම්සේ පැමිණෙද් ද,

එසෙයින් ආහාරපානවස්ත්‍ර දනය කරන සෙනසුන් අතුරුණු දෙන නුවණැති මිනිසා කරා දිය උසුලන නදීන් සයුර කරා පැමිණෙනු මෙන් පින්දහර පැමිණේ යි.

## 11. 5. 2

## දුතිය අසඞ්ඛෙය්‍යසුත්තං

3810. චත්තාරො මෙ භික්ඛවෙ පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. අයං පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච පරං භික්ඛවෙ, අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. අයං චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා.

ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගණෙතුං. ''එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො''ති. අථ ඛො ''අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධො''ත්වෙව සඞ්ඛං ගච්ඡති. සෙය්‍යථාපි භික්ඛවෙ යත්ථිමා මහානදියො සංසන්දන්ති, සමෙන්ති. සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. තත්ථ න සුකරං උදකස්ස පමාණං ගණෙතුං, ''එත්තකානි උදකාළ්හකානීති වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසහස්සානීති වා එත්තකානි උදකාළ්හකසතසහස්සානීති වා''. අථ ඛො ''අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහා උදකක්ඛන්ධො''ත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ, ඉමෙහි චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගණෙතුං: ''එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො'' ති. අථ ඛො ''අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධො''ත්වෙව සඞ්ඛං ගච්ඡති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

මහොදධිං අපරිමිතං මහාසරං
බහුභෙරවං රතනගණානමාලයං,
නජ්ජො යථා නරගණසඞ්ඝසෙවිතා
පුථූ සවන්ති උපයන්ති සාගරං.

එවං නරං අන්නදපානවත්ථදං
සෙය්‍යානිසජ්ජත්ථරණස්ස දයකං,
පුඤ්ඤස්ස ධාරා උපයන්ති පණ්ඩිතං
නජ්ජො යථා වාරිවහාව සාගරන්ති.

Free Distribution www.aathaapi.org

## 11. 5. 2

## දුතිය අසඞ්ඛෙය්‍ය සූත්‍රය

3810. මහණෙනි, සුවයට ප්‍රත්‍යය වූ මේ පුණ්‍යගඞ්ගා කුශලගඞ්ගා සතරෙකි. කවර සතරෙක යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමේ ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මේ සුවයට ප්‍රත්‍යය වූ පළමුවන පින්ගඟ ය. කුසල්ගඟ ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවු තෙමේ දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි. අරිසවුතෙමේ මුදන ලද ත්‍යාග ඇතියේ දෙන්නා ලද අත් ඇතියේ දීමෙහි ඇලුණේ යදිනු ලැබීමට සුදුසු වූයේ දීමෙහිත් බෙදා දීමෙහිත් ඇලුණේ පහව ගිය මසුරුමල ඇති සිතින් යුතු ව ගිහිගෙයි වෙසේ. මේ සුවයට ප්‍රත්‍යය වූ සිවුවන පින්ගඟ ය. කුසල්ගඟ ය. මහණෙනි, මේ සතර සුවයට ප්‍රත්‍යය වූ පුණ්‍යගඞ්ගාවෝ කුශලගඞ්ගාවෝ ය.

මහණෙනි, මේ සිවු පින්ගඟින් කුසල්ගඟින් යුතු වූ අරිසවුහට සුවයට ප්‍රත්‍යය වූ මෙතෙක් පින්ගඟෙක. කුසල්ගඟෙකැයි පිනෙහි පමණ ගණන්නට සුකර නො වේ. වැලි ගණන් නො කළ හැකි පමණ නො කළ හැකි මහපින් කඳෙකැයි ම ගිණුමට යේ. මහණෙනි, යම්සේ මේ මහානදීහු, එනම්: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී යන පස්මහනදීහු යම් තැනෙක එකතුවෙද්ද, ගැළපෙද්ද, එහි දිය ලාස් මෙතෙකැ යි හෝ දිය ලාස් මෙතෙක් සියයකැ යි හෝ දිය ලාස් මෙතෙක් දහසකැ යි හෝ දිය ලාස් මෙතෙක් සියදහසෙකැ යි හෝ දියෙහි පමණ ගණන්නට සුකර නො වේ ද, වැලි ගණන් නො කළ හැකි පමණ නො කළ හැකි. මහදිය කඳෙකැයි ම ගිණුමට යේ ද, මහණෙනි, එසෙයින් ම මේ සිවු පින්ගඟින් කුසල්ගඟින් යුතු වූ අරිසවුහට ''සුවයට පසය වූ මෙතෙක් පින්ගඟෙක. කුසල්ගඟෙකැ''යි පිනෙහි පමණ ගණන්නට සුකර නො වේ. වැලි ගණන් නො කළ හැකි පමණ නො කළ හැකි මහපින්කඳෙකැයි ම ගිණුමට යේ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක ... ශාස්තෲන් වහන්සේ මෙ ද වදාළ සේක.

මිනිස් සමූහයා විසින් සෙවුනා ලද ගලාබස්නා බොහෝ වූ ගඞ්ගාවෝ මහත් දියකඳ දරන පමණ නො කළැකි මහත් නදීන්ගේ එක්වීම ඇති, බෙහෙවින් බිහිසුණු වූ, රුවන් සමූහයට උත්පත්තිස්ථාන වූ සයුර කරා යම්සේ පැමිණෙත් ද,

එසෙයින් ආහාරපානවස්ත්‍ර දනය කරන, සෙනසුන් අතුරුණු දෙන නුවණැති මිනිසා කරා දිය උසුලන ගඞ්ගාවන් සයුර කරා පැමිණෙනු මෙන් පින්දහර පැමිණේ යි.

## 11. 5. 3

### තතිය අසඞ්ඛෙය්‍යසුත්තං

3811. චත්තාරොමෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. අයං පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. පුනච පරං භික්ඛවෙ, අරියසාවකො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- පුනච පරං භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති, උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො හොති අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. අයං චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගණෙතුං ''එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො''ති. අථ ඛො ''අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධො''ත්වෙව සඞ්ඛං ගච්ඡතීති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

යො පුඤ්ඤකාමො කුසලෙ පතිට්ඨිතො
භාවෙති මග්ගං අමතස්ස පත්තියා,
සො ධම්මසාරාධිගමො ඛයෙ රතො
න වෙධති මච්චුරාජා ගමිස්සතීති.[1]

## 11. 5. 4

### අඩ්ඪ[2]සුත්තං

3812. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ''අඩ්ඪො මහද්ධනො මහාභොගො''ති[3] වුච්චති. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ''අඩ්ඪො මහද්ධනො මහාභොගො''ති වුච්චතීති.

---

1. මච්චුරාජාගමනස්මින්ති - මජ්ඣං, සයා.
2. මහද්ධනොති - මජ්ඣං.
3. මහාභොගො මහායසොති - සයා.

## 11. 5. 3

## තතිය අභිසන්ද සූත්‍රය

3811. මහණෙනි, සුවයට ප්‍රත්‍යය වූ මේ පුණ්‍යනදීහු කුශලනදීහු සතරෙකි. කවර සතරෙක යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. මේ සුවයට පසය වූ පළමුවන පින්ගඟ ය. කුසල්ගඟ ය. මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවුතෙමේ දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අරිසවුතෙමේ නුවණැතියේ වෙයි. උදයව්‍යයය පිරිසිඳ දැනුමට පමුණුවන සුලු ආර්‍ය වූ නිර්වේදයට හිත වූ මැනවින් දුක් ගෙවීමට පමුණුවන ප්‍රඥායෙන් සමන්වාගත වෙයි. මේ සුවයට පසය වූ සිවුවන පින්ගඟ ය, කුසල්ගඟ ය. මහණෙනි, මොහු සුවයට පසය වූ සිවු පින්ගඟහු ය. කුසල්ගඟහු ය. මහණෙනි, මේ සිවු පින්ගඟින් කුසල්ගඟින් යුතු වූ අරිසවුහට සුවයට පසය වූ මෙතෙක් පින්ගඟෙක. කුසල්ගඟෙකැයි පිනෙහි පමණ ගණන්නට සුකර නො වේ. වැලි ගණන් නො කළ හැකි, පමණ නො කළ හැකි මහපින් කඳෙකැයි ම ගිණුමට යේ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ... ශාස්තෘන් වහන්සේ මෙ ද වදාළ සේක.

පින් කැමැති මහකුසල්හි පිහිටි යමෙක් නිවනට පැමිණෙනු පිණිස රහත්මඟ වඩා ද, පිළිලද අරිපෙළ දහම්හර ඇති හෙතෙමේ කෙලෙස් ක්ෂය කිරීමෙහි ඇලුණේ මරරජ පැමිණෙන්නේ යි නො සැලේ යි.

## 11. 5. 4

## අඩ්ඪ සූත්‍රය

3812. මහණෙනි, සිවු දහමින් යුතු අරිසවු තෙමේ "ආඪ්‍යය, මහත් ධන ඇත්තේ ය. මහත් භොග ඇත්තේ"යි කියනු ලැබේ. කවර සිවු දහමකින යත්: මහණෙනි; මෙහි අරිසවු තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. මහණෙනි, මේ සිවුදහමින් යුතු අරිසවු තෙමේ "ආඪ්‍යය, මහත් ධන ඇත්තේ ය. මහත් භොග ඇත්තේ"යි කියනු ලැබේ යි.

## 11. 5. 5

## දුතිය අඩ්ඪසුත්තං

3813. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ''අඩ්ඪො මහද්ධනො මහාභොගො මහායසො''ති වුච්චති. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ''අඩ්ඪො මහද්ධනො මහාභොගො මහායසො''ති වුච්චතීති.

## 11. 5. 6

## සුද්ධකසුත්තං

3814. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 11. 5. 7

## නන්දියසුත්තං

3815. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො නන්දියො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නං ඛො නන්දියං සක්කං භගවා එතදවොච, චතූහි ඛො නන්දිය, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. කතමෙහි චතූහි: ඉධ නන්දිය, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධි සංවත්තනිකෙහි. ඉමෙහි ඛො නන්දිය, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 11. 5. 5

### දුතිය අඪ්‍ය සූත්‍රය

3113. මහණෙනි, සිවු දහමෙකින් යුත් අරිසවු "ආඪ්‍ය ය. මහත් ධන ඇත්තේ ය. මහත් භොග ඇත්තේ ය. මහත් යශස් ඇත්තේ"යි කියනු ලැබේ. කවර සිවු දහමෙකින යත්: මහණෙනි, මෙසස්නෙහි අරිසවු "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුදුයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි .. අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. මහණෙනි, මේ සිවු දහමින් සමන්වාගත ආර්‍ය්‍ය-ශ්‍රාවක තෙමේ "ආඪ්‍ය ය. මහද්ධන ඇත්තේ ය. මහත්භොග ඇත්තේ ය. මහත්යශස් ඇත්තේ"යි කියනු ලැබේ යි.

## 11. 5. 6

### සුද්ධක සූත්‍රය

3814. මහණෙනි, මේ සිවු දහමෙකින් යුත් අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. කවර සිවු දහමෙකින යත්: මහණෙනි, මෙහි අරිසවු "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම් කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. මහණෙනි, මේ සිවු දහමින් යුතු අරිසවු "විවස ව නොහෙන-සුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන්"යි කියනු ලැබේ යි.

## 11. 5. 7

### නන්දිය සූත්‍රය

3815. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි නන්දිය ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස් ව හුන් නන්දිය ශාක්‍යහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: නන්දිය, සිවු දහමෙකින් යුතු අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. කවර සිවු දහමෙකින යත්: නන්දිය, මෙසස්නෙහි අරිසවු "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. නන්දිය, මේ සිවු දහමින් යුතු අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ යි.

## 11. 5. 8

### භද්දියසුත්තං

3816. එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ.** අථ ඛො **භද්දියො** සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නං ඛො භද්දියං සක්කං භගවා එතදවොච: චතූහි ඛො භද්දිය, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. කතමෙහි චතූහි: ඉධ භද්දිය, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භද්දිය, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 11. 5. 9

### මහානාමසුත්තං

3817. එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ.** අථ ඛො **මහානාමො** සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො මහානාමං සක්කං භගවා එතදවොච: "චතූහි ඛො මහානාම, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. කතමෙහි චතූහි: ඉධ මහානාම අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො මහානාම, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 11. 5. 10

### අඞ්ගසුත්තං

3818. චත්තාරිමානි භික්ඛවෙ, සොතාපත්තියඞ්ගානි. කතමානි චත්තාරි: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි සොතාපත්තිය-ඞ්ගානීති.

**සගාථපුඤ්ඤාභිසන්දවග්ගො පඤ්චමො.**

**තත්‍රුද්දානං:**

අසඞ්ඛෙය්‍යා තයො වුත්තා අඩ්ඪෙන අපරෙ දුවෙ,
සුද්ධකං නන්දියං භද්දියං මහානාමඞ්ගෙහි තෙ දසාති.

## 11. 5. 8

## භද්දිය සූත්‍රය

3816. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි** වැඩවසන සේක. ඉක්බිති **භද්දිය** ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පසෙක හුන් භද්දිය ශාක්‍යයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: භද්දිය, සිවු දහමෙකින් යුත් අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. කවර සිවු දහමෙකින යත්: භද්දිය, මෙහි අරිසවු "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තික වූ ආර්යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. භද්දිය, මේ සිවු දහමින් යුතු අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ යි.

## 11. 5. 9

## මහානාම සූත්‍රය

3817. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යදනව්වෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි **මහානාම** ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස් ව හුන් මහානාම ශාක්‍යහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: මහානාම, සිවු දහමකින් යුතු අරිසවු තෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වෙයි. කවර සතරකින යත්: මහානාම, මෙහි අරිසවු තෙමේ "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් යුතු වෙයි. දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තික වූ ආර්යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. මහානාම, මේ සිවු දහමින් යුතු අරිසවු තෙමේ විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ යි.

## 11. 5. 10

## අඞ්ග සූත්‍රය

3818. මහණෙනි, මේ සෝවන් අඟ සතරෙකි. කවර සතරෙක යත්: සත්පුරුෂසෙවනය සද්ධර්මශ්‍රවණය යොනිසොමනස්කාරය ධර්මානුධර්මප්‍රතිපත්ති යි. මහණෙනි, මොහු සිවු සෝවන් අඟයි.

**පස්වැනි සගාථ පුඤ්ඤාභිසන්ද වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

අසඞ්ඛ්‍යාසූත්‍ර තුනෙක් ද, අඩ්ඪ නමින් අනෙක් දෙකෙක් ද කියන ලද්දහ, සුද්ධක නන්දිය භද්දිය මහානාම අඞ්ග යන පසින් ඔහු දසයෙක් වේ යි.



Free Distribution www.aathaapi.org

# 6. සප්පඤ්ඤවග්ගො

## 11. 6. 1

### සගාථකසුත්තං

3819. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. "ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො"ති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

සඞ්ඝෙ පසාදෙ යස්සත්ථි උජුභූතඤ්ච දස්සනං,
අදළිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධානසාසනන්ති.

## 11. 6. 2

### වස්සංවුත්ථ සුත්තං

3820. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාවත්ථියං වස්සං වුත්ථො කපිලවත්ථුං අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො කාපිලවත්ථවා සක්කා[1] අඤ්ඤතරො කිර භික්ඛු සාවත්ථියං වස්සං වුත්ථො කපිලවත්ථුං අනුප්පත්තොති. අථ ඛො කාපිලවත්ථවා සක්කා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො කාපිලවත්ථවා සක්කා තං භික්ඛුං එතදවොචුං:

කච්චි භන්තෙ, භගවා අරොගො ච[2] බලවා චාති? භගවා ආවුසො අරොගො ච[3] බලවා චාති. කච්චි පන භන්තෙ, සාරිපුත්තමොග්ගල්ලානා අරොගා ච බලවන්තො චාති? සාරිපුත්තමොග්ගල්ලානාපි ඛො ආවුසො, අරොගා ච බලවන්තො චාති. කච්චි පන භන්තෙ, භික්ඛුසඞ්ඝො අරොගො ච බලවා චාති? භික්ඛුසඞ්ඝොපි ඛො ආවුසො අරොගො ච බලවා චාති. අත්ථි පන භන්තෙ, කිඤ්චි ඉමිනා අන්තරවස්සෙන භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතන්ති? සම්මුඛා මෙතං ආවුසො, භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං:

---

1. සක්‍යා - මජසං, ස්‍යා.
2. චෙව - මජසං, ස්‍යා.
3. අරොගො චාවුසො භගවා - මජසං, අරොගො චෙවාවුසො භගවා - ස්‍යා.

Free Distribution www.aathaapi.org

# 6. සප්පඤ්ඤවර්ගය

## 11. 6. 1

### සගාථක සූත්‍රය

3819. මහණෙනි, සිවු දහමෙකින් යුත් අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ. කවර සිවු දහමෙකින යත්: මහණෙනි, මෙසස්නෙහි අරිසවු ''ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධය හ. භගවත්හ''යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම කෙරෙහි ... සඟුන් කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් යුතු වූයේ වෙයි. මහණෙනි, මේ සිවු දහමින් යුතු අරිසවු විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වේ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක ... ශාස්තෘන් වහන්සේ මෙ ද වදාළ සේක.

යමකුට තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව අචල ව මැනැවින් පිහිටියා ද, යමකුගේ යහපත් වූ ශීලයත් ආර්‍ය්‍යකාන්ත වූයේ පසස්නා ලද්දේ ද,

යමකුට සඞ්ඝයා කෙරෙහි පැහැදීම ඇද්ද, ඥානදර්ශනයත් ඍජු වූයේ වේ ද ඔහු නො දිළින්දෙකැ යි (බුද්ධාදි උතුමෝ) කියති. ඔහුගේ ජීවිතය නොසිස් වේ.

එහෙයින් ප්‍රාඥ තෙමේ බුදුවරයන්ගේ ශාසනය සිහිකරනුයේ ශ්‍රද්ධාවත් ශීලයත් පැහැදීමත් දහම දැකීමත් අනුයොගවශයෙන් පිරිසිදු කරන්නේ යි.

## 11. 6· 2

### වස්සංවුත්ථ සූත්‍රය

3820. එසමයෙහි එක්තරා මහණෙක් සැවැත්නුවර වස් එළඹියේ කිසියම් කටයුත්තක් පිණිස කිඹුල්වතට පැමිණියේ වෙයි. කිඹුල්වත්පුරවැසි ශාක්‍යයෝ ''සැවැත්නුවර වස් එළැඹි එක්තරා මහණෙක් කිඹුල්වතට පැමිණියේ ය''යි ඇසූහ. ඉක්බිති කිඹුල්වත්පුරවැසි ශාක්‍යයෝ ඒ මහණහු වෙත එළඹියහ. එළඹ ඒ මහණහු වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් කිඹුල්වත්පුරවැසි ශාක්‍යයෝ ඒ මහණහුට මෙය කීහ:

වහන්ස, ''කිම භාග්‍යවතුන් වහන්සේ නීරෝගත් බලවතුත් වනසේක් දැ''යි? ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ නීරොග ද බලවද්ද වන සේකැ යි. වහන්ස, ''කිම සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ නීරොගත් බලවතුත් වෙද්දැ''යි? ඇවැත්නි, සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේත් නීරොග ද බලවද් ද වෙති යි. වහන්ස, ''කිම භික්ෂුසඝන නීරොගත් බලවතුත් වේ දැ''යි? ඇවැත්නි, භික්ෂුසඝනත් නීරොග ද බලවද්ද වේ යි. වහන්ස, ''මේ ඇතුළුවස භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි අසන ලද ඉදිරියෙහි පිළිගන්නා ලද කිසිවක් ඇද්දැ''යි? ඇවැත්නි මා විසින් මෙය භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි අසන ලද, ඉදිරියෙහි පිළිගන්නා ලදී (කිමෙක් ද යත්:)

''අප්පකා තෙ භික්ඛවෙ, භික්ඛූ යෙ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. අථ ඛො එතෙව බහුතරා භික්ඛූ යෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා''ති.

අපරම්පි ඛො මෙ ආවුසො භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං: ''අප්පකා තෙ භික්ඛවෙ, භික්ඛූ යෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. අථ ඛො එතෙව බහුතරා භික්ඛූ යෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති''ති.

අපරම්පි ඛො මෙ ආවුසො භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං: අප්පකා තෙ භික්ඛවෙ, භික්ඛූ යෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති, අථ ඛො එතෙව බහුතරා භික්ඛූ යෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනා''ති.

## 11. 6. 3

## ධම්මදින්නසුත්තං

3821. එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ මිගදායෙ**. අථ ඛො ධම්මදින්නො උපාසකො පඤ්චහි උපාසකසතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ධම්මදින්නො උපාසකො භගවන්තං එතදවොච: ඔවදතු නො භන්තෙ, භගවා, අනුසාසතු නො භන්තෙ, භගවා යං අම්හාකං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. තස්මාතිහ වො ධම්මදින්න, එවං සික්ඛිතබ්බං, ''යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතා[1]පටිසංයුත්තා තෙ කාලෙන කාලං උපසම්පජ්ජ විහරිස්සාමා''ති එවං හි වො ධම්මදින්න, සික්ඛිතබ්බන්ති.

1. සුඤ්ඤත - මජ්ඣපං, ස්‍යා.

"මහණෙනි, යම් මහණ කෙනෙක් ආස්‍රවක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චිත්ත විමුක්තිය, ප්‍රඥා විමුක්තිය මෙලොව දීම තෙමේ විශේෂඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසෙත් නම් ඔහු අල්පයහ. වැලි යම් මහණ කෙනෙක් පස් ඔරම්භාගියසංයෝජනයන් ක්ෂය කිරීමෙන් ඖපපාතික වූවෝ එහි පිරිනිවෙනසුලු වූවාහු එලොවින් පෙරළා නො එන ස්වභාව ඇත්තෝ වෙත් නම් ඔහු ම ඉතා බොහෝහ"යි.

ඇවැත්නි, මා විසින් අනෙකකුදු භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි අසන ලද, ඉදිරියෙහි පිළිගන්නා ලදී. (එනම්): මහණෙනි, යම් මහණ කෙනෙක් පස් ඔරම්භාගියසංයෝජනයන් ක්ෂය කිරීමෙන් ඖපපාතික ව එහි පිරිනිවෙනසුලු වූවාහු එලොවින් පෙරළා නොඑනසුලු වෙත් නම් ඔහු අල්පයහ. වැලි යම් මහණ කෙනෙක් ත්‍රිවිධසංයෝජනයන් ක්ෂය කිරීමෙන් රාග-ද්වේෂමෝහයන් තුනී වූ බැවින් සෙදගැමි වූවාහු එක්වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නාහු නම් මොහු ම ඉතා බොහෝහ''යි.

ඇවැත්නි, මා විසින් අනෙකකුදු භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි අසන ලද. ඉදිරියෙහි පිළිගන්නා ලදි (කිමෙක යත්): ''මහණෙනි, යම් මහණ කෙනෙක් ත්‍රිවිධසංයෝජනයන් ක්ෂය කිරීමෙන් රාගද්වේෂමෝහයන් තුනී වූ බැවින් සෙදගැමි වූවාහු එක්වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නාහු නම් ඔහු අල්පය හ. වැලි යම් මහණ කෙනෙක් ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන් විවස ව නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් වූවාහු නම් මොහු ම ඉතා බොහෝහ යි.

## 11. 6. 3

## ධම්මදින්න සූත්‍රය

3821. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **බරණැස සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි **ධම්මදින්න** උවසු තෙමේ පන්සියයක් උවසුන් සමග භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ධම්මදින්න උවසු තෙමේ භාග්‍යවතුන් වහන්-සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, යම්සේ අපට දිගුකලක් මුළුල්ලෙහි හිතසුව පිණිස වන්නේ නම් භාග්‍යවතුන් වහන්සේ අපට එසේ අවවාද කරන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපට අනුශාසනා කරන සේක්වා''යි. ධම්මදින්න, එසේ නම් මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු: තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද ගැඹුරු වූ, ගැඹුරු අරුත් ඇති ලොවුතුරු වූ සත් ශූන්‍යතාවන් දක්වන්නා වූ යම් ඒ සූත්‍රාන්තයෝ වෙත් නම් කලින් කල ඔවුන් පිළිලැබ වෙසෙන්නෙමු''යි මෙසේ තොප විසින් හික්මිය යුතු යි.

න ඛො නෙතං භන්තෙ, සුකරං අම්හෙහි පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තෙහි කාසිකචන්දනං පච්චනුභොන්තෙහි මාලාගන්ධවිලෙපනං ධාරයන්තෙහි ජාතරූපරජතං සාදියන්තෙහි යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතාපටිසංයුත්තා තෙ කාලෙන කාලං උපසම්පජ්ජ විහරිතුං. තෙසං නො භන්තෙ, භගවා අම්හාකං පඤ්චසු සික්ඛාපදෙසු ඨිතානං උත්තරිං ධම්මං දෙසෙතූති. තස්මාතිහ වො ධම්මදින්න, එවං සික්ඛිතබ්බං: බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා භවිස්සාම ‘‘ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා’’ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා භවිස්සාම ‘‘අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහී’’ති. එවං හි වො ධම්මදින්න, සික්ඛිතබ්බන්ති.

යානිමානි භන්තෙ, භගවතා චත්තාරි සොතාපත්තියඞ්ගානි දෙසිතානි, සංවිජ්ජන්ති තෙ ධම්මා අම්හෙසු, මයඤ්ච භන්තෙ, තෙසු[1] ධම්මෙසු සන්දිස්සාම. මයං හි භන්තෙ බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා ‘‘ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා’’ති. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහීති. ලාභා වො ධම්මදින්න, සුලද්ධං වො ධම්මදින්න, සොතාපත්තිඵලං ධම්මදින්න, ව්‍යාකතන්ති.[2]

## 11. 6. 4

## ගිලානසුත්තං

3822. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති: ‘‘නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී’’ති. අස්සොසි ඛො මහානාමො සක්කො සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති: නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී’’ති. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: සුතං මෙතං[3] භන්තෙ, සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති ‘‘නිට්ඨිතචීවරො භගවා, තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී’’ති න ඛො නෙතං[4] භන්තෙ, භගවතො සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහිතං ‘‘සප්පඤ්ඤෙන උපාසකෙන සප්පඤ්ඤො උපාසකො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො ඔවදිතබ්බො’’ති.

1. මයඤ්ච තෙසු - මජසං, ස්‍යා.
2. ධම්මදින්නා තුම්හෙහි ව්‍යාකතන්ති - මජසං, ස්‍යා.
3. සුතමෙතං - මජසං.
4. පනෙතං - මජසං, කෙ එතං - සී 1, 2.

වහන්ස, දරුවන්ගෙන් පළිබොධ ඇති යහන්හි වෙසෙන සිනිඳුසඳුන් ගල්වන මල්ගඳ විලෙවුන් දරන රන්රිදී ඉවසන අප විසින් තථාගතයන් වහන්සේ විසින් වදරන ලද ගැඹුරු වූ ගැඹුරු අරුත් ඇති ලොවුතුරු වූ ශූන්‍යතාප්‍රතිසංයුක්ත වූ යම් ඒ සූත්‍රාන්තයෝ වෙත් නම් කලින් කල ඔවුන් පිළිලැබ මේ විසුම සුකර නො වේ. වහන්ස, පස් සිකපෙදෙහි සිටි ඒ අපට මතු දහමක් දෙශනා කරන සේක්වා යි. ධම්මදින්න, එසේ නම් මෙහි ලා තොප විසින් මෙසේ හික්මියයුතු: "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අවලප්‍රසාදයෙන් සමන්වාගත වන්නෙමු. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්යකාන්තශීලයෙන් සමන්වාගත වන්නෙමු"යි ධම්මදින්න, මෙසේ තොප විසින් හික්මියයුතු යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම මේ සිවු සෝවන් අඟක් වදරන ලද ද ඒ දහම් අප කෙරෙහි ඇත. වහන්ස, අපිත් ඒ දහම් කෙරෙහි දක්නා ලබමු. වහන්ස, අපි "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ"යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අවල-ප්‍රසාදයෙන් සමන්වාගතයම්හ. ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි ... අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්යකාන්තශීලයෙන් සමන්-වාගතයම්හ"යි. ධම්මදින්න, තොපට ලාභයෙකි. ධම්මදින්න, තොපට මනා ලැබුමෙකි. ධම්මදින්න, සෝවන්පල පවසන ලද යි.

## 11. 6. 4

## ගිලාන සූත්‍රය

3822. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි බොහෝ භික්ෂූහු "නිමවූ සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තෙමස ඇවෑමෙන් චාරිකාවට වඩනා සේකැ"යි භාග්‍යවතුන් වහන්සේගේ සිවුරුකම් කෙරෙති. "නිමවූ සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තෙමස ඇවෑමෙන් චාරිකාවට වඩනා සේකැ"යි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සිවුරුකම් කෙරෙති"යි මහානාම ශාක්‍යයෝ ඇසූහ. එකල්හි මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "වහන්ස, නිමවූ සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තෙමස ඇවෑමෙන් චාරිකාවට වඩනා සේකැ"යි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සිවුරුකම් කෙරෙති"යි මෙය මා විසින් අසන ලදි. "වහන්ස, (පැනැති) සෝවන් උවසුහු විසින් හටගත් ආබාධ ඇති දුකට පැමිණි දැඩිසේ ගිලන් වූ පැනැති උවසු තෙමේ අවවාද කටයුත්තේ ය"යි මෙය භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි නො ම අසන ලදි. ඉදිරියෙහි නො ම පිළිගන්නා ලදී යි.

සප්පඤ්ඤෙන මහානාම, උපාසකෙන සප්පඤ්ඤො උපාසකො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො චතූහි අස්සාසනීයෙහි ධම්මෙහි අස්සාසෙතබ්බො. අස්සසතායස්මා, අත්ථායස්මතො බුද්ධෙ අවෙච්චප්පසාදො ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. අස්සසතායස්මා, අත්ථායස්මතො ධම්මෙ අවෙච්චප්පසාදො ''ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති. අස්සසතායස්මා අත්ථායස්මතො සඞ්ඝෙ අවෙච්චප්පසාදො ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති. අස්සසතායස්මා අත්ථායස්මතො අරියකන්තානි සීලානි අඛණ්ඩානි -පෙ- සමාධිසංවත්තනිකානීති.

සප්පඤ්ඤෙන මහානාම, උපාසකෙන සප්පඤ්ඤො උපාසකො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. ඉමෙහි චතූහි අස්සාසනීයෙහි[1] ධම්මෙහි අස්සාසෙත්වා එවමස්ස වචනීයො. ''අත්ථායස්මතො මාතාපිතූසු අපෙක්ඛා''ති. සො චෙ එවං වදෙය්‍ය: ''අත්ථි මෙ මාතාපිතූසු අපෙක්ඛා''ති. සො එවමස්ස වචනීයො. ''ආයස්මා[2] ඛො මාරිසො මරණධම්මො, සචෙපායස්මා මාතාපිතූසු අපෙක්ඛං කරිස්සති මරිස්සතෙව, නො චෙපායස්මා මාතාපිතූසු අපෙක්ඛං කරිස්සති මරිස්සතෙව. ස්වායස්මතො මාතාපිතූසු අපෙක්ඛා[3] තං පජහා''ති. සො චෙ එවං වදෙය්‍ය: ''යා මෙ මාතාපිතූසු අපෙක්ඛා සා පහීනා''ති සො එවමස්ස වචනීයො: ''අත්ථි පනායස්මතො පුත්තදාරෙසු අපෙක්ඛා''ති? සො චෙ එවං වදෙය්‍ය: ''අත්ථි මෙ පුත්තදාරෙසු අපෙක්ඛා''ති. සො එවමස්ස වචනීයො: ''ආයස්මා ඛො මාරිසො මරණධම්මො, සචෙපායස්මා පුත්තදාරෙසු අපෙක්ඛං කරිස්සති මරිස්සතෙව, නො චෙපායස්මා පුත්තදාරෙසු අපෙක්ඛං කරිස්සති මරිස්සතෙව. ස්වායස්මතො පුත්තදාරෙසු අපෙක්ඛා තං පජහා''ති.

සො චෙ එවං වදෙය්‍ය: ''යා මෙ පුත්තදාරෙසු අපෙක්ඛා සා පහීනා''ති. සො එවමස්ස වචනීයො: ''අත්ථි පනායස්මතො මානුසකෙසු පඤ්චසු කාමගුණෙසු අපෙක්ඛා''ති? සො චෙ එවං වදෙය්‍ය: ''අත්ථි මෙ මානුසකෙසු පඤ්චසු කාමගුණෙසු අපෙක්ඛා''ති. සො එවමස්ස වචනීයො: ''මානුසකෙහි[4] ඛො ආවුසො, කාමෙහි[5] දිබ්බා කාමා අභික්කන්තතරා ච පණීතතරා ච. සාධායස්මා මානුසකෙහි කාමෙහි චිත්තං වුට්ඨාපෙත්වා චාතුම්මහාරාජිකෙසු දෙවෙසු චිත්තං අධිමොචෙහී''ති.

1. අස්සාසනියෙහි - සී 1, 2, සයා.
2. ආයස්මාපි - මජු, සී 2.
3. සාධායස්මා යා තෙ මාතාපිතූසු අපෙක්ඛා - මජසං, සයා.
4. මානුසකෙසු - සී 1, 2.
5. කාමෙසු - සී 1, 2.

මහානාම, පැනැති උවසුහු විසින් හටගත් ආබාධ ඇති දුකට පැමිණි දැඩිසේ ගිලන් වූ පැනැති උවසු තෙමේ අස්වැසිලි කර සිවූ දහමෙකින් අස්වැසියයුතු. ආයුෂ්මත් තෙමේ අස්වැසේවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු දෙව්මිනිසුනට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අවලප්‍රසාදය ආයුෂ්මත්හට ඇත. ආයුෂ්මත් තෙමේ අස්වැසේවා. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය ... නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු ය''යි, ධර්මය කෙරෙහි අවලප්‍රසාදය ආයුෂ්මත්හට ඇත. ආයුෂ්මත් තෙමේ අස්වැසේවා. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය ... ලෝකයාහට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර ය''යි, සඞ්ඝයා කෙරෙහි අවලප්‍රසාදය ආයුෂ්මත්හට ඇත. ආයුෂ්මත් තෙමේ අස්වැසේවා. අඛණ්ඩ වූ ... සමාධිසංවර්තනික වූ ආර්‍ය්‍යකාන්තසිල් ආයුෂ්මත්හට ඇත.

මහානාම පැනැති උවසුහු විසින් හටගත් ආබාධ ඇති දුකට පැමිණි දැඩිසේ ගිලන් වූ පැනැති උවසු තෙමේ අස්වැසිලි කර මේ සිවු දහමින් අස්වසා "ආයුෂ්මත්හට මවුපියන් කෙරෙහි අපේක්ෂා-වක් ඇද්ද''යි මෙසේ කිවයුතු වන්නේ ය. ඉදින් හෙතෙමේ "මට මවුපියන් කෙරෙහි අපේක්ෂා ඇතැ''යි මෙසේ කියන්නේ නම් හේ මෙසේ කියයුතු වන්නේ ය. "ආයුෂ්මත් තෙමේ මරණය පිළිබඳ ය. මැරෙණ සවභාව ඇත්තේ ය. ඉදින් ආයුෂ්මත් තෙමේ මවුපියන් කෙරෙහි අපේක්ෂාව කරන්නේ නමුදු මැරෙන්නේ ම ය. ඉදින් ආයුෂ්මත් තෙමේ මවුපියන් කෙරෙහි අපේක්ෂාව නො කරන්නේ නමුදු මැරෙන්නේ ම ය. ඉදින් ආයුෂ්මත්හට මවුපියන් කෙරෙහි අපේක්ෂා ඇත්නම් එය හරුව''යි. හෙ ඉදින් "මවුපියන් කෙරෙහි මට යම් අපේක්ෂාවක් වූ නම් එය ප්‍රහීණ ය''යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ආයුෂ්මත්හට අඹුදරුවන් කෙරෙහි අපේක්ෂාව ඇද්ද''යි මෙසේ කියයුතු වන්නේ ය. ඉදින් හෙතෙමේ "මට අඹුදරුවන් කෙරෙහි අපේක්ෂා ඇතැ''යි මෙසේ කියන්නේ නම් හෙ මෙසේ කියයුතු වන්නේ ය. "ආයුෂ්මත් තෙමේ මරණය පිළිබඳ ය. මැරෙණ සවභාව ඇත්තේ ය. ඉදින් ආයුෂ්මත් තෙමේ අඹුදරුවන් කෙරෙහි අපේක්ෂා කරන්නේ ද, මැරෙන්නේ ම ය. ඉදින් ආයුෂ්මත් තෙමේ අඹුදරුවන් කෙරෙහි අපේක්ෂාව නො කරන්නේ ද, මැරෙන්නේ ම ය. ඉදින් ආයුෂ්මත්හට අඹුදරුවන් කෙරෙහි අපේක්ෂා ඇත් නම් එය හරුව''යි.

ඉදින් හෙතෙමේ "මට අඹුදරුවන් කෙරෙහි යම් අපේක්ෂාවක් වූ නම් එය ප්‍රහීණ ය''යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ආයුෂ්මත්හට මිනිසුන් පිළිබඳ පස්කම්ගුණෙහි අපේක්ෂාවක් ඇද්ද''යි මෙසේ කියයුතු වන්නේ ය. ඉදින් හෙතෙමේ "මට මිනිසුන් පිළිබඳ පස්කම්ගුණෙහි අපේක්ෂාවක් ඇතැ''යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ මෙසේ කියයුතු වන්නේ ය: "ඇවැත්නි, මිනිසුන් පිළිබඳ කාමයන්ට වඩා දෙවියන් පිළිබඳ කාමයෝ ඉතා සිත්කලු ද ඉතා පිණි ද වෙති. ආයුෂ්මත් තෙමේ මිනිසුන් පිළිබඳ කාමයන්ගෙන් සිත නඟා සිවුමහරජයෙහි දෙවියන් කෙරෙහි සිත නබව''යි.

සො චෙ එවං වදෙය්‍ය: "මානුසකෙහි කාමෙහි මෙ චිත්තං වුට්ඨිතං චාතුම්මහාරාජිකෙසු දෙවෙසු චිත්තං අධිමොචිතන්ති". සො එවමස්ස වචනීයො: "චාතුම්මහාරාජිකෙහි ඛො ආවුසො දෙවෙහි තාවතිංසා දෙවා අභික්කන්තතරා ච පණීතතරා ච, සාධායස්මා චාතුම්මහාරාජිකෙහි දෙවෙහි චිත්තං වුට්ඨාපෙත්වා තාවතිංසෙසු දෙවෙසු චිත්තං අධිමොචෙහී"ති.

සො චෙ එවං වදෙය්‍ය: "චාතුම්මහාරාජිකෙහි මෙ දෙවෙහි චිත්තං වුට්ඨිතං, තාවතිංසෙසු දෙවෙසු චිත්තං අධිමොචිතන්ති". සො එවමස්ස වචනීයො: "තාවතිංසෙහි ඛො ආවුසො, දෙවෙහි යාමා දෙවා අභික්කන්තතරා ච පණීතතරා ච. සාධායස්මා තාවතිංසෙහි දෙවෙහි චිත්තං වුට්ඨාපෙත්වා යාමෙසු දෙවෙසු චිත්තං අධිමොචෙහී"ති.

සො චෙ එවං වදෙය්‍ය: "තාවතිංසෙහි ඛො දෙවෙහි මෙ චිත්තං වුට්ඨිතං, යාමෙසු දෙවෙසු චිත්තං අධිමොචිතන්ති". සො එවමස්ස වචනීයො: "යාමෙහි ඛො ආවුසො, දෙවෙහි තුසිතා දෙවා අභික්කන්තතරා ච පණීතතරා ච. සාධායස්මා යාමෙහි දෙවෙහි චිත්තං වුට්ඨාපෙත්වා තුසිතෙසු දෙවෙසු චිත්තං අධිමොචෙහී"ති.

සො චෙ එවං වදෙය්‍ය: "යාමෙහි දෙවෙහි මෙ චිත්තං වුට්ඨිතං, තුසිතෙසු දෙවෙසු චිත්තං අධිමොචිතන්ති". සො එවමස්ස වචනීයො: "තුසිතෙහි ඛො ආවුසො, දෙවෙහි නිම්මාණරතී දෙවා අභික්කන්තතරා ච පණීතතරා ච. සාධායස්මා තුසිතෙහි දෙවෙහි චිත්තං වුට්ඨාපෙත්වා නිම්මාණරතීසු දෙවෙසු චිත්තං අධිමොචෙහී"ති.

සො චෙ එවං වදෙය්‍ය: "තුසිතෙහි දෙවෙහි මෙ චිත්තං වුට්ඨිතං, නිම්මාණරතීසු දෙවෙසු චිත්තං අධිමොචිතන්ති". සො එවමස්ස වචනීයො: "නිම්මාණරතීහි ඛො ආවුසො, දෙවෙහි පරනිම්මිතවසවත්තී දෙවා අභික්කන්තතරා ච පණීතතරා ච, සාධායස්මා නිම්මාණරතීහි දෙවෙහි චිත්තං වුට්ඨාපෙත්වා පරනිම්මිතවසවත්තීසු දෙවෙසු චිත්තං අධිමොචෙහී"ති.

සො චෙ එවං වදෙය්‍ය: "නිම්මාණරතීහි දෙවෙහි මෙ චිත්තං වුට්ඨිතං, පරනිම්මිතවසවත්තීසු දෙවෙසු චිත්තං අධිමොචිතන්ති". සො එවමස්ස වචනීයො: "පරනිම්මිතවසවත්තීහි ඛො ආවුසො, දෙවෙහි බ්‍රහ්මලොකො අභික්කන්තතරො ච පණීතතරො ච. සාධායස්මා පරනිම්මිතවසවත්තීහි දෙවෙහි චිත්තං වුට්ඨාපෙත්වා බ්‍රහ්මලොකෙ චිත්තං අධිමොචෙහී"ති.

ඉදින් හෙතෙමේ "මිනිසුන් පිළිබඳ කාමයන්ගෙන් මාගේ සිත නැඟිණි. සිවුමහරජයෙහි දෙවියන් කෙරෙහි සිත තබන ලද්"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ඇවැත්නි සිවුමහරජයෙහි දෙවියන්ට වඩා තවුතිසාවැසි දෙවියෝ ඉතා සිත්කලු ද ඉතා පිණි ද වෙති. ආයුෂ්මත් තෙමේ සිවුමහරජයෙහි දෙවියන්ගෙන් සිත නඟා තවුතිසාවැසි දෙවියන් කෙරෙහි සිත තබව"යි මෙසේ කියයුතු වන්නේ ය.

ඉදින් හෙතෙමේ "සිවුමහරජයෙහි දෙවියන්ගෙන් මාගේ සිත නැඟිණි. තවුතිසාවැසි දෙවියන් කෙරෙහි සිත තබන ලද්"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ඇවැත්නි, තවුතිසාවැසි දෙවියන්ට වඩා යාමදෙවියෝ ඉතා සිත්කලු ද ඉතා පිණි ද වෙති. ආයුෂ්මත්-තෙමේ තවුතිසාවැසි දෙවියන්ගෙන් සිත් නඟා යාමදෙවියන් කෙරෙහි සිත තබව"යි මෙසේ කියයුතු වන්නේ ය.

ඉදින් හෙතෙමේ තවුතිසාවැසි දෙවියන්ගෙන් මාගේ සිත නැඟිණි. යාමදෙවියන් කෙරෙහි සිත තබන ලද්"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ඇවැත්නි, යාමදෙවියන්ට වඩා තුසිතදෙවියෝ ඉතා සිත්කලු ද ඉතා පිණි ද වෙති. ආයුෂ්මත් තෙමේ යාමදෙවියන් ගෙන් සිත නඟා තුසිතදෙවියන් කෙරෙහි සිත තබව"යි මෙසේ කියයුතු වන්නේ ය.

ඉදින් හෙතෙමේ "යාමදෙවියන් ගෙන් මාගේ සිත නැඟිණි. තුසිතදෙවියන් කෙරෙහි සිත තබන ලද්"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ඇවැත්නි, තුසිතදෙවියන්ට වඩා නිම්මාණරතී දෙවියෝ ඉතා සිත්කලු ද ඉතා පිණි ද වෙති. ආයුෂ්මත් තෙමේ තුසිතදෙවියන් ගෙන් සිත නඟා නිම්මාණරතී දෙවියන් කෙරෙහි සිත තබව"යි මෙසේ කියයුතු වන්නේ ය.

ඉදින් හෙතෙමේ "තුසිතදෙවියන් ගෙන් මාගේ සිත නැඟිණි. නිම්මාණරතී දෙවියන් කෙරෙහි සිත තබන ලද්"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ඇවැත්නි, නිම්මාණරතීදෙවියන්ට වඩා පරනිර්මිත වසවර්තිදෙවියෝ ඉතා සිත්කලු ද ඉතා පිණි ද වෙති. ආයුෂ්මත් තෙමේ නිර්මාණරතීදෙවියන් ගෙන් සිත නඟා පරනිර්මිතවසවර්තිදෙවියන් කෙරෙහි සිත තබව"යි මෙසේ කියයුතු වන්නේ ය.

ඉදින් හෙතෙමේ "නිර්මාණරතී දෙවියන් ගෙන් මාගේ සිත නැඟිණි. පරනිර්මිතවසවර්තිදෙවියන් කෙරෙහි සිත තබන ලද්"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ "ඇවැත්නි, පරනිර්මිතවසවර්තී දෙවියන්ට වඩා බඹලොව ඉතා සිත්කලු ද ඉතා පිණි ද වේ. ආයුෂ්මත් තෙමේ පරනිර්මිතවසවර්තීදෙවියන් ගෙන් සිත නඟා බඹලොව කෙරෙහි සිත තබව" යි මෙසේ කියයුතු වන්නේ ය.

සො චෙ එවං වදෙය්‍ය: පරනිම්මිතවසවත්තීහි ඛො දෙවෙහි මෙ චිත්තං වුට්ඨිතං, බ්‍රහ්මලොකෙ චිත්තං අධිමොචිතන්ති''. සො එවමස්ස වචනීයො: ''බ්‍රහ්මලොකො'පි ඛො ආවුසො, අනිච්චො අද්ධුවො සක්කායපරියාපන්නො, සාධායස්මා බ්‍රහ්මලොකා චිත්තං වුට්ඨාපෙත්වා සක්කායනිරොධෙ චිත්තං උපසංහරා''ති.[1]

සො චෙ එවං වදෙය්‍ය: ''බ්‍රහ්මලොකා මෙ චිත්තං වුට්ඨිතං සක්කායනිරොධෙ චිත්තං උපසංහතන්ති''[2] එවං විමුත්තචිත්තස්ස ඛො මහානාම උපාසකස්ස වස්සසතවිමුත්තචිත්තෙන[3] භික්ඛුනා න කිඤ්චි නානාකරණං වදාමි යදිදං විමුත්තියා විමුත්තින්ති.[4]

## 11. 6. 5

## ඵලසුත්තං

3823. චත්තාරො මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා සොතාපත්ති ඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සොතාපත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්තීති.

## 11. 6. 6

## දුතිය ඵලසුත්තං

3824. චත්තාරො මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා සකදාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සකදාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්තීති.

## 11. 6. 7

## තතිය ඵලසුත්තං

3825. චත්තාරොමෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා අනාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා අනාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්තීති.

---

1. උපසංහරාහීති - මජසං.
2. උපසංහරාමීති - මජසං.
3. ආසවා විමුත්තචිත්තෙන - මජසං.
4. විමුත්තානන්ති - මජසං.

ඉදින් හෙතෙමේ "පරනිර්මිතවශවර්තීදෙවියන් ගෙන් මාගේ සිත නැඟිණි. බඹලොව කෙරෙහි සිත තබන ලද"යි මෙසේ කියන්නේ නම් හෙතෙමේ ඇවැත්නි, බඹලොව ද අනිස ය. නො තිර ය. සත්කායයට ඇතුළත් ය. ආයුෂ්මත් තෙමේ බඹලොවින් සිත නඟා සත්කායනිරොධය කෙරෙහි සිත එළවා තබව"යි මෙසේ කියයුතු වන්නේ ය.

ඉදින් හෙතෙමේ "බඹලොවින් මාගේ සිත නැඟිණි. සත්කාය-නිරොධයෙහි සිත එළවා තබන ලද"යි මෙසේ කියන්නේ නම් "මහානාම, මෙසේ මිදුණු සිත් ඇති උවසුහුගේ සියවසක් මුළුල්ලෙහි මිදුණු සිත් ඇති මහණහු සමග විමුක්තිය ඇරබ විමුක්තියෙහි කිසි වෙනසක් නො කියමි"යි.

## 11. 6. 5

## ඵල සූත්‍රය

3823. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සොවන්පල පසක් කිරීම පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසොමනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති"යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු සොවන්පල පසක් කිරීම පිණිස පවතිත් යි.

## 11. 6. 6

## දුතියඵල සූත්‍රය

3824. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සෙදගැමිපල පසක් කිරීම පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසොමනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති"යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු සෙදගැමිපල පසක් කිරීම පිණිස පවතිත් යි.

## 11. 6. 7

## තතියඵල සූත්‍රය

3825. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු අනගැමිපල පසක් කිරීම පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසොමනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති"යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු අනගැමිපල පසක් කිරීම පිණිස පවතිත් යි.

## 11. 6. 8

### චතුත්ථඵලසුත්තං

3826. චත්තාරොමෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා අරහත්තඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිස-සංසෙවො සද්ධම්ම වනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා අරහත්ත-ඵලසච්ඡිකිරියාය සංවත්තන්තීති.

## 11. 6. 9

### පටිලාභසුත්තං

3827. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති.

## 11. 6. 10

### වුඩ්ඪිසුත්තං

3828. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාවුඩ්ඪියා සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාවුඩ්ඪියා සංවත්තන්තීති,

## 11. 6. 11

### වෙපුල්ලසුත්තං

3829. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්තීති.

**සප්පඤ්ඤවග්ගො ඡට්ඨො.**

තත්‍රුද්දානං :

සගාථකං වස්සවුත්ථං ධම්මදින්නං ගිලානකං,
චතුප්ඵලා පටිලාභො වුඩ්ඪි වෙපුල්ලනාමිකොති.

## 11. 6. 8

## චතුක්ඵල සූත්‍රය

3826. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු රහත්පල පසක් කිරීම පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසොමනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති" යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු රහත්පල පසක් කිරීම පිණිස පවතිත් යි.

## 11. 6. 9

## පටිලාභ සූත්‍රය

3827. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු නුවණ පිළිලැබුම පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසො මනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති"යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු නුවණ පිළිලැබුම පිණිස පවතිත් යි.

## 11. 6. 10

## වුඩ්ඪී සූත්‍රය

3828. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු නුවණ වැඩුම පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසො මනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති"යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු නුවණ වැඩුම පිණිස පවතිත් යි.

## 11. 6. 11

## වෙපුල්ල සූත්‍රය

3829. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු නුවණ විපුලබව පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසෙවන සද්ධර්මශ්‍රවණ යොනිසො මනස්කාර ධර්මානුධර්මප්‍රතිපත්ති"යි මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු නුවණ විපුලබව පිණිස පවතිත් යි.

**සවැනි සප්පඤ්ඤවර්ග යි.**

**එහි සූත්‍රනාමමාලාව:**

සගාථක, වස්සංවුත්ථ, ධම්මදින්න, ගිලානක යි සතරෙකි. පලසුතුරු ද සතරෙකි, පටිලාභ වුඩ්ඪී වෙපුල්ල නම් තුනෙකැ යි මුළුල්ල එකොළොසෙකි.

# 7. මහාපඤ්ඤවග්ගො

## 11. 7. 1

### මහාපඤ්ඤසුත්තං

3830. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා මහාපඤ්ඤතාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා මහාපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 2

### පුථුපඤ්ඤසුත්තං

3831. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- පුථුපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 3

### විපුලපඤ්ඤසුත්තං

3832. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- විපුලපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 4

### ගම්භීරපඤ්ඤසුත්තං

3833. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 5

### අසාමන්තපඤ්ඤසුත්තං

3834. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- අසාමන්ත[1]පඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 6

### භූරිපඤ්ඤසුත්තං

3835. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- භූරිපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 7

### පඤ්ඤාබාහුල්ලසුත්තං

3836. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්තීති.

---

1. අප්පමත්ත - මජ්ඣං, සයා. අසමත්ත - සී 1, 2.

# 7. මහාපඤ්ඤ වර්ගය

## 11. 7. 1

## මහාපඤ්ඤ සූත්‍රය

3830. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු මහපැනැති බව පිණිස පවතිත්. කවර සිවු දහම් කෙනෙක යත්: "සත්පුරුෂසේවන සද්ධර්මශ්‍රවණ යොනිසො මනස්කාර ධර්මානුධර්ම ප්‍රතිපත්ති"යි මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු මහපැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 2

## පුථුපඤ්ඤ සූත්‍රය

3831. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... ලොවුතුරු පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 3

## විපුලපඤ්ඤ සූත්‍රය

3832. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... විපුලපැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 4

## ගම්භීරපඤ්ඤ සූත්‍රය

3833. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... ගැඹුරුපැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 5

## අසාමන්තපඤ්ඤ සූත්‍රය

3834. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් .. අසාමන්ත (නො සමීප) පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 6

## භූරිපඤ්ඤ සූත්‍රය

3835. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... බොහෝ පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 7

## පඤ්ඤාබාහුල්ල සූත්‍රය

3836. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... පැන බහුලබව පිණිස පවතිත් යි.



Free Distribution www.aathaapi.org

## 11. 7. 8

### සීසපඤ්ඤසුත්තං

3837. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- සීසපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 9

### ලහුපඤ්ඤසුත්තං

3838. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- ලහුපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 10

### හාසුපඤ්ඤසුත්තං

3839. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- හාසු[1]පඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 11

### ජවනපඤ්ඤසුත්තං

3840. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- ජවනපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 12

### තික්ඛපඤ්ඤසුත්තං

3841. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා -පෙ- තික්ඛපඤ්ඤතාය සංවත්තන්තීති.

## 11. 7. 13

### නිබ්බෙධිකපඤ්ඤසුත්තං

3842. චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො සද්ධම්මසවනං යොනිසොමනසිකාරො ධම්මානුධම්මපටිපත්ති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තීති.

**මහාපඤ්ඤවග්ගො සත්තමො.**

තත්‍රුද්දානං:

මහාපුථුවිපුලගම්භීරං අසාමන්තභූරිබාහුලං,
සීඝලහුහාසුජවන තික්ඛනිබ්බෙධිකාය චාති.

**සොතාපත්තිසංයුත්තං සමත්තං.**

තත්‍ර වග්ගුද්දානං:

වෙළුද්වාර රාජකාරාමා සරකානි පුඤ්ඤාභිසන්ද
සගාථපුඤ්ඤාභිසන්දෙ සප්පඤ්ඤ මහාපඤ්ඤ චාති.

---

1. හාස - මජසං, සතා.

## 11. 7. 8

### සීඝපඤ්ඤ සූත්‍රය

3837. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... වහා වැටැහෙන පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 9

### ලහුපඤ්ඤ සූත්‍රය

3838. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... යුහුපැනැතිබව පිණිස පවතිත් යි.

## 11. 7. 10

### හාසුපඤ්ඤ සූත්‍රය

3839. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් .. හාසබහුල පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 11

### ජවනපඤ්ඤ සූත්‍රය

3840. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... දිවෙන පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 12

### තික්ඛපඤ්ඤ සූත්‍රය

3841. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් ... තියුණු පැනැති බව පිණිස පවතිත් යි.

## 11. 7. 13

### නිබ්බෙධිකපඤ්ඤ සූත්‍රය

3842. මහණෙනි, මේ සිවු දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිබ්බෙධික පඤ්ඤ (කෙලෙස් පළන පැනැති බව) පිණිස පවතිත්. කවර සිවු දහමෙක යත්: ''සත්පුරුෂසෙවන, සද්ධර්මශ්‍රවණ, යොනිසො මනසිකාර, ධර්මානුධර්මප්‍රතිපත්ති''යි. මහණෙනි, මේ සිවු දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිර්වෙධික පැනැති බව පිණිස පවතිත් යි.

### සත්වැනි මහාපඤ්ඤවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය :**

මහාපඤ්ඤ පුථුපඤ්ඤ විපුලපඤ්ඤ ගම්භීරපඤ්ඤ අසාමන්තපඤ්ඤ භූරිපඤ්ඤ පඤ්ඤබාහුල්ල සීඝපඤ්ඤ ලහුපඤ්ඤ හාසුපඤ්ඤ ජවනපඤ්ඤ තික්ඛපඤ්ඤ නිබ්බෙධිකපඤ්ඤ යි තෙළෙස් සූතුරු කෙනෙකි.

## සොතාපත්ති සංයුත්තය නිමියේ යි.

**එහි වර්ගනාමාවලිය :**

වෙළුද්වාර, රාජකාරාම, සරකානි, පුඤ්ඤාභිසන්ද, සගාථ පුඤ්ඤාභිසන්ද, සප්පඤ්ඤ, මහාපඤ්ඤ යි (සොතාපත්තිසංයුත්තයෙහි වර්ග සතෙකි යි).

# 12. සච්චසංයුත්තං

## 1. සමාධිවග්ගො

### 12. 1. 1

### සමාධිසුත්තං

3843. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. –පෙ– සමාධිං භික්ඛවෙ, භාවෙථ. සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති: ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති. සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති.

තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො, අයං දුක්ඛසමුදයොති යොගො කරණීයො, අයං දුක්ඛනිරොධොති යොගො කරණීයො, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යොගො කරණීයොති.

### 12. 1. 2

### පටිසල්ලානසුත්තං

3844. පටිසල්ලානෙ භික්ඛවෙ, යොගමාපජ්ජථ, පටිසල්ලීනො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති: ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති. පටිසල්ලානෙ භික්ඛවෙ, යොගමාපජ්ජථ, පටිසල්ලීනො[1] භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යොගො කරණීයොති.

### 12. 1. 3

### කුලපුත්තසුත්තං

3845. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිංසු, සබ්බෙ තෙ චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිස්සන්ති, සබ්බෙ තෙ චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජන්ති, සබ්බෙ තෙ චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය.

1. පටිසල්ලානො – සීමු.

# 12. සච්ච සංයුත්තය

## 1. සමාධි වර්ගය

### 12. 1. 1

### සමාධි සූත්‍රය

3843. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවත සමීපයෙහි අනේපිඩුසිටුහුගේ දෙව්රම්හි වැඩවසන සේක ... මහණෙනි, සමාධිය වඩවූ. මහණෙනි, එකඟ සිත් ඇති මහණ තෙමේ තතුසේ දනියි. කුමක් තතුසේ දනී ද යත්: "මේ දුකැ"යි තතුසේ දනියි. "මේ දුක්හටගැනුමැ"යි තතුසේ දනියි. "මේ දුක් වැළැක්මැ"යි තතුසේ දනියි. "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ දනියි. මහණෙනි, සමාධිය වඩවූ. මහණෙනි, එකඟ සිත් ඇති මහණ තෙමේ තතුසේ දනී.

මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි (දැන) වීර්‍ය්‍යය කටයුතු. "මේ දුක් හටගැනුමැ"යි වීර්‍ය්‍යය කටයුතු. "මේ දුක් වැළැක්මැ"යි වීර්‍ය්‍යය කටයුතු. "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වීර්‍ය්‍යය කටයුතු යි.

### 12. 1. 2

### පටිසල්ලාන සූත්‍රය

3844. මහණෙනි, විවෙකයෙහි යෙදීමට පැමිණෙවු. මහණෙනි, විවෙකයෙන් යුත් මහණ තෙමේ තතුසේ දනී. කුමක් තතුසේ දනී ද යත්: "මේ දුකැ"යි තතුසේ දනී ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ දනී. මහණෙනි, විවෙකයෙහි යෙදීමට පැමිණෙවු. මහණෙනි, විවෙකයෙන් යුත් මහණ තෙමේ තතුසේ දනී. මහණෙනි, එහෙයින් එහි ලා "මේ දුකැ"යි වීර්‍ය්‍යය කටයුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වීර්‍ය්‍යය කටයුතු යි.

### 12. 1. 3

### කුලපුත්ත සූත්‍රය

3845. මහණෙනි, ඉකුත් කල යම් කිසි කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූහු ද, ඒ සියල්ලෝ සිවු අරිසස් තතුසේ අවබොධ කරනු පිණිස ය. මහණෙනි, මතු කල යම් කිසි කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නාහු ද ඒ සියල්ලෝ සිවු අරිසස් තතුසේ අවබොධ කරනු පිණිස ය. මහණෙනි, දැන් යම් කිසි කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙද්ද ද, ඒ සියල්ලෝ සිවු අරිසස් තතුසේ අවබොධ කරනු පිණිස ය.

කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස, දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධගාමිනියා පටිපදය[1] අරියසච්චස්ස. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිංසු -පෙ- පබ්බජිස්සන්ති -පෙ- පබ්බජන්ති, සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො, -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 1. 4

## දුතිය කුලපුත්තසුත්තං

3846. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිතා යථාභූතං අභිසමෙසුං, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසමෙසුං. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිතා යථාභූතං අභිසමෙස්සන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසමෙස්සන්ති. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිතා යථාභූතං අභිසමෙන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසමෙන්ති. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං කුලපුත්තා සම්මා අගාරස්මා අනගාරියං පබ්බජිතා යථාභූතං අභිසමෙසුං -පෙ- අභිසමෙස්සන්ති -පෙ- අභිසමෙන්ති, සබ්බෙ තෙ ඉමානි චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසමෙන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 1. 5

## සමණබ්‍රාහ්මණසුත්තං

3847. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුජ්ඣිංසු, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣිංසු. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුජ්ඣිස්සන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣිස්සන්ති. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුජ්ඣන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣන්ති. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුජ්ඣිංසු -පෙ- අභිසම්බුජ්ඣිස්සන්ති -පෙ- අභිසම්බුජ්ඣන්ති, සබ්බෙ තෙ ඉමානි චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣන්ති. තස්මාතිහ භික්ඛවෙ ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

---

1. ගාමිනීපටිපදය - සයා.

කවර සිවු අරිසස් ද යත්: දුඃඛාය්‍ය්‍ර්සත්‍ය ය දුඃඛසමුදයාය්‍ය්‍ර්සත්‍ය ය දුඃඛනිරොධාය්‍ය්‍ර්සත්‍ය ය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය්‍ය්‍ර්සත්‍ය යි. මහණෙනි, ඉකුත් කල යම් කිසි කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූහු ද ... පැවිදි වන්නාහු ද ... පැවිදි වෙද්ද, ඒ සියල්ලෝ මේ සිවු අරිසස් ම තතුසේ අවබොධ කරනු පිණිස ය. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි ව්‍යායාම කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි ව්‍යායාම කටයුතු යි.

## 12. 1. 4

## දුතියකුලපුත්ත සූත්‍රය

3846. මහණෙනි, ඉකුත් කල යම් කිසි කුලපුත්‍ර කෙනෙක් මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු තතුසේ අවබොධ කළාහු ද, ඒ සියල්ලෝ සිවු අරිසස් තතුසේ අවබොධ කළාහු ය. මහණෙනි, මතු කල යම් කිසි කුලපුත්‍ර කෙනෙක් මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු තතුසේ අවබොධ කරන්නාහු ද, ඒ සියල්ලෝ සිවු අරිසස් තතුසේ අවබොධ කරන්නාහු ය. මහණෙනි, මෙකල යම් කිසි කුලපුත්‍ර කෙනෙක් මැනවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු තතුසේ අවබොධ කෙරෙද් ද, ඒ සියල්ලෝ සිවු අරිසස් තතුසේ අවබොධ කෙරෙත්. කවර සිවු අරිසස් ද යත්: දුඃඛාය්‍ය්‍ර්සත්‍ය ය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය්‍ය්‍ර්සත්‍ය යි. මහණෙනි, ඉකුත් කල යම් කිසි කුලපුත්‍ර කෙනෙක් මැනැවින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු තතු සේ අවබොධ කළාහු ද ... අවබොධ කරන්නාහු ද ... අවබොධ කෙරෙද් ද, ඒ සියල්ලෝ මේ චතුරාය්‍ය්‍ර්සත්‍යය තතුසේ අවබොධ කෙරෙත්. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි ව්‍යායාම කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි ව්‍යායාම කටයුතු යි.

## 12. 1. 5

## සමණබ්‍රාහ්මණ සූත්‍රය

3847. මහණෙනි, ඉකුත් කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ අවබොධ කළාහු ද, ඒ සියල්ලෝ චතුරාය්‍ය්‍ර්සත්‍යය තතුසේ අවබොධ කළාහු ය. මහණෙනි, මතු කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ අවබොධ කරන්නාහු ද, ඒ සියල්ලෝ චතුරාය්‍ය්‍ර්සත්‍යය තතුසේ අවබොධ කරන්නාහු ය. මහණෙනි, මෙකල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ අවබොධ කෙරෙද් ද, ඒ සියල්ලෝ චතුරාය්‍ය්‍ර්සත්‍යය තතුසේ අවබොධ කෙරෙත්. කවර චතුරාය්‍ය්‍ර්සත්‍ය කෙනෙක් ද යත්: දුඃඛාය්‍ය්‍ර්සත්‍ය ය .. දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය්‍ය්‍ර්සත්‍ය යි. මහණෙනි, ඉකුත් කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ අවබොධ කළාහු ද, ... අවබොධ කරන්නාහු ද, ... අවබොධ කෙරෙත් ද, ඒ සියල්ලෝ මේ චතුරාය්‍ය්‍ර්සත්‍යය තතුසේ අවබොධ කෙරෙත්. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ ''දුක්ඛ''යි ව්‍යායාම කටයුතු ... මේ ''දුක්ඛනිරොධගාමිනී පටිපද''යි ව්‍යායාම කටයුතු යි.

## 12. 1. 6

## දුතිය සමණබ්‍රාහ්මණසුත්තං

3848. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුද්ධං පකාසෙසුං, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුද්ධං පකාසෙසුං. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුද්ධං පකාසෙස්සන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුද්ධං පකාසෙස්සන්ති. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුද්ධං පකාසෙන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුද්ධං පකාසෙන්ති. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යථාභූතං අභිසම්බුද්ධං පකාසෙසුං -පෙ- පකාසෙස්සන්ති -පෙ- පකාසෙන්ති, සබ්බෙ තෙ ඉමානි චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුද්ධං පකාසෙන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 1. 7

## විතක්කසුත්තං

3849. මා භික්ඛවෙ, පාපකෙ අකුසලෙ විතක්කෙ විතක්කෙය්‍යාථ. සෙය්‍යථීදං: කාමවිතක්කං ව්‍යාපාදවිතක්කං විහිංසාවිතක්කං. තං කිස්ස හෙතු, නෙතෙ භික්ඛවෙ, විතක්කා අත්ථසංහිතා නාදිබ්‍රහ්මචරියකා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. විතක්කෙන්තා[1] ච ඛො තුම්හෙ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති විතක්කෙය්‍යාථ -පෙ- අයං දුක්ඛ-නිරොධගාමිනී පටිපදාති විතක්කෙය්‍යාථ. තං කිස්ස හෙතු, එතෙ භික්ඛවෙ, විතක්කා අත්ථසංහිතා එතෙ ආදිබ්‍රහ්මචරියකා. එතෙ නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

1. විතක්කන්තා ස්‍යා. විතක්කෙන්තා - සී 1, 2,

## 12. 1. 6

## දුතිය සමණබ්‍රාහ්මණ සූත්‍රය

3848. මහණෙනි, ඉකුත් කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ (මම්) අවබොධ කෙළෙමැ යි (තමන්) පැවසූහු ද, ඒ සියල්ලෝ චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කෙළෙමැ යි පැවසූහ. මහණෙනි, මතු කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ අවබොධ කෙළෙමැ යි පවසන්-නාහු ද, ඒ සියල්ලෝ චතුරාර්‍ය්‍යසත්‍යය තතුසේ අවබොධ කෙළෙමැ යි පවසන්නාහු ය. මහණෙනි, මෙකල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතු සේ අවබොධ කෙළෙමැ යි තමන් පවසත් ද, ඒ සියල්ලෝ චතුරාර්‍ය්‍යසත්‍යය තතුසේ අභිසම්බුද්ධය යි පවසත්. කවර චතුරාර්‍ය්‍යසත්‍යයක් ද යත්: දුඃඛාර්‍ය්‍යසත්‍ය ය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදර්‍ය්‍යසත්‍ය යි. මහණෙනි, ඉකුත් කල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ තතුසේ අවබොධ කෙළෙමැ යි පැවසූහු ද ... පවසන්නාහු ද ... පවසත් ද, ඒ සියල්ලෝ මේ චතුරාර්‍ය්‍යසත්‍යය තතුසේ අවබොධ කෙළෙමැ යි පවසත්. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ ''දුක්ඛ''යි වීර්‍ය්‍ය කටයුතු ... මේ ''දුක්ඛනිරොධගාමිනී පටිපද''යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 1. 7

## විතක්ක සූත්‍රය

3849. මහණෙනි, ලාමක වූ අකුශල විතර්කයන් නහමක් විතර්කණය කරවූ. එනම්: කාමවිතර්ක ය, ව්‍යාපාදවිතර්ක ය, විහිංසා විතර්ක යි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ විතර්කයෝ වැඩ සහිත නො වෙත්. මගබඹසරට මුල් වූවෝ නො වෙත්. නිර්වෙදය පිණිස නො පවතිත්. විරාගය පිණිස නො පවතිත්. නිරොධය පිණිස නො පවතිත්. ව්‍යුපශමය පිණිස නො පවතිත්. අභිඥානය පිණිස නො පවතිත්. සම්බොධිය පිණිස නො පවතිත්. නිර්වාණය පිණිස නො පවතිත්. මහණෙනි, තෙපි විතර්කණය කරන්නාහු නම් ''මේ දුක්ඛ''යි විතර්කණය කරවූ ... ''මේ දුක්ඛ-නිරොධගාමිනී පටිපද''යි විතර්කණය කරවූ. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ විතර්කයෝ වැඩ සහිතයහ. මොහු මගබඹසරට මුල් ය. මොහු නිර්වෙදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥානය සම්බොධිය නිර්වාණය පිණිස පවතිත්. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි වීර්‍ය්‍ය කටයුතු ... මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 1. 8

### චින්තාසුත්තං

3850. මා භික්ඛවෙ, පාපකං අකුසලං චිත්තං චින්තෙය්‍යාථ[1]. "සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා. තං කිස්ස හෙතු: නෙසා භික්ඛවෙ, චින්තා අත්ථසංහිතා, නාදිබ්‍රහ්මචරියකා, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. චින්තෙන්තා ච ඛො තුම්හෙ භික්ඛවෙ ඉදං දුක්ඛන්ති චින්තෙය්‍යාථ -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති චින්තෙය්‍යාථ. තං කිස්ස හෙතු, එසා භික්ඛවෙ, චින්තා අත්ථසංහිතා, එසා ආදිබ්‍රහ්මචරියකා, එසා නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 1. 9

### විග්ගාහිකකථාසුත්තං

3851. මා භික්ඛවෙ, විග්ගාහිකකථං කථෙය්‍යාථ:[2] "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි, කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො පුරෙ වචනීයං පච්ඡා අවච, පච්ඡා වචනීයං පුරෙ අවච, සහිතං මෙ, අසහිතං තෙ, ආචිණ්ණං තෙ විපරාවත්තං, ආරොපිතො තෙ වාදෙ, චර වාදප්පමොක්ඛාය[3], නිග්ගහිතොසි, නිබ්බෙඨෙහි සචෙ පහොසීති. තං කිස්ස හෙතු: නෙසා භික්ඛවෙ කථා අත්ථසංහිතා නාදිබ්‍රහ්මචරියකා. න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. කථෙන්තා ච ඛො තුම්හෙ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති කථෙය්‍යාථ -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති කථෙය්‍යාථ. තං කිස්ස හෙතු, එසා භික්ඛවෙ. කථා අත්ථසංහිතා, එසා ආදිබ්‍රහ්මචරියකා, එසා නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

---

1. චින්තයෙය්‍යාථ - මජසං,
2. කථෙය්‍යාථ - මජසං
3. පරවාදප්පමොක්ඛාය - ස්‍යා, 1. පිටු

## 12. 1. 8

## චින්තා සූත්‍රය

3850. මහණෙනි, "ලොකය ශාශ්වතයැ''යි හෝ "ලොකය අශාශ්වතයැ''යි හෝ ''ලොකය අන්තවතැ''යි හෝ "ලොකය අනන්තවතැ''යි හෝ "එය ජීවය එය ශරීරය'' යි හෝ "ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ''යි හෝ "සත්ත්වයා මරණින් මතු වේ''යි හෝ "සත්ත්වයා මරණින් මතු නො වේ"යි හෝ සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ"යි හෝ "සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ''යි ලාමක අකුසල් සිතක් නො සිතවු. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සිතිවිල්ල වැඩ සහිත නො වේ, මහබඹසරට මුල් නො වේ, නිර්වෙදය පිණිස නො පවතී. විරාගය පිණිස නො පවතී. නිරොධය පිණිස නො පවතී. ව්‍යුපශමය පිණිස නො පවතී. අභිඥානය පිණිස නො පවතී. සම්බොධිය පිණිස නො පවතී. නිර්වාණය පිණිස නො පවතී. මහණෙනි, තෙපි සිතන්නාහු නම් "මේ දුක්ඛ''යි සිතවු ... මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි සිතවු. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සිතිවිල්ල වැඩ සහිත ය. මෙය මහබඹසරට මුල් ය. මෙය නිර්වෙදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥානය සම්බොධිය නිර්වාණය පිණිස පවතී. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුක්ඛ''යි වීර්යය කටයුතු ... "මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි වීර්යය කටයුතු යි.

## 12. 1. 9

## විග්ගාහිකකථා සූත්‍රය

3851. මහණෙනි, ''තෙපි මේ සස්න නො දනිවු, මම මේ සස්න දනිමි. කිම තෙපි මේ සස්න දනිවු ද, තෙපි වරදවා පිළිපන්නාහු වවු. මම මැනවින් පිළිපන්නෙම් වෙමි. පළමු කිය යුත්ත පසු ව කීහු, පසු ව කිව යුත්ත පළමු කීහු. මාගේ වචනය කරුණු සහිත ය. තොපගේ වචනය කරුණු රහිත ය. තොප විසින් දිගුකලක් මුළුල්ලෙහි පුරුදු කරන ලද්ද පෙරළී සිටියේ ය. තොපට දෙස් නගන ලද. දෙසින් මිදීම පිණිස හැසිරෙවු. නිගා කරන ලද්දහු යැ, ඉදින් සමත් වවු නම් නිදහස් වවු''යි විරුද්ධවාදී කථා නො කියවු. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ කථා වැඩ සහිත නො වේ. මහබඹසරට මුල් නො වේ. නිර්වෙදය පිණිස නො පවතී. විරාගය පිණිස නො පවතී. නිරොධය පිණිස නො පවතී. ව්‍යුපශමය පිණිස නො පවතී. අභිඥානය පිණිස නො පවතී. සම්බොධිය පිණිස නො පවතී. නිර්වාණය පිණිස නො පවතී. මහණෙනි, තෙපි කියන්නාහු නම් ''මේ දුක්ඛ''යි කියවු ... ''මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි කියවු. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ කථා වැඩ සහිත ය. මෙය මහබඹසරට මුල් ය. මෙය නිර්වෙදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥානය සම්බොධිය නිර්වාණය පිණිස පවතී. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි වීර්යය කටයුතු. ...''මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි වීර්යය කටයුතු යි.

## 12. 1. 10

## තිරච්ඡාන කථාසුත්තං

3852. මා භික්ඛවෙ, අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙථ: සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං[1] විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා. තං කිස්ස හෙතු: නෙසා භික්ඛවෙ, කථා අත්ථසංහිතා. නාදිබ්‍රහ්මචරියකා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. කථෙන්තා ච ඛො තුම්හෙ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති" කථෙය්‍යාථ. "අයං දුක්ඛසමුදයොති" කථෙය්‍යාථ, "අයං දුක්ඛනිරොධොති" කථෙය්‍යාථ, "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති" කථෙය්‍යාථ, තං කිස්ස හෙතු: එසා භික්ඛවෙ කථා අත්ථසංහිතා එසා ආදිබ්‍රහ්මචරියකා. එසා නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති" යොගො කරණීයො. "අයං දුක්ඛසමුදයොති" යොගො කරණීයො. "අයං දුක්ඛනිරොධොති" යොගො කරණීයො. "අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති" යොගො කරණීයොති.

### සමාධිවග්ගො පඨමො.

**තස්සුද්දානං:**

සමාධිපටිසල්ලානා කුලපුත්තා පරෙ දුවෙ
සමණබ්‍රාහ්මණා දෙව විතක්කා චින්තා විග්ගාහිකා කථාති.

---
1. සුරාකථං - සාම., මු 1,2,

## 12. 1. 10

## තිරච්ඡානකථා සූත්‍රය

3852. මහණෙනි, නන්වැදෑරුම් තිරිසන් කථා නො කියවු. එනම් "රජුන් පිළිබඳ කථා, සොරුන් පිළිබඳ කථා, මහාමාත්‍රයන් පිළිබඳ කථා, සේනාවන් පිළිබඳ කථා, බිය පිළිබඳ කථා, යුද පිළිබඳ කථා, අහර පිළිබඳ කථා, පානවර්ග පිළිබඳ කථා, වස්ත්‍ර පිළිබඳ කථා, සෙනසුන් පිළිබඳ කථා, මල්දම් පිළිබඳ කථා, ගඳ පිළිබඳ කථා, නෑයන් පිළිබඳ කථා, වාහන පිළිබඳ කථා, ගම් පිළිබඳ කථා, නියම්ගම් පිළිබඳ කථා, නගර පිළිබඳ කථා, දනවු පිළිබඳ කථා, ස්ත්‍රීන් පිළිබඳ කථා, පුරුෂයන් පිළිබඳ කථා, සූරයන් පිළිබඳ කථා, වීථි පිළිබඳ කථා, දියතොට පිළිබඳ කථා, (කුම්භදාසීන් පිළිබඳ කථා) ඉකුත් නෑයන් පිළිබඳ කථා, නානාස්වභාව ඇති කථා, ලෝකනිර්මාණය පිළිබඳ කථා, සමුද්‍ර හටගැනීම පිළිබඳ කථා (ශාශ්වත උච්ඡේද ආදී) භවාභව කථා හෝ"යි. එ කවර හෙයින යත්: මහණෙනි, මේ කථා වැඩ සහිත නො වේ. මහබඹසරට මුල නො වේ. නිර්වේදය පිණිස නො පවතී. විරාගය පිණිස නො පවතී නිරෝධය පිණිස නො පවතී. ව්‍යුපශමය පිණිස නො පවතී. අභිඥානය පිණිස නො පවතී. සම්බෝධිය පිණිස නො පවතී. නිර්වාණය පිණිස නො පවතී. මහණෙනි, තෙපි කියන්නාහු නම් "මේ දුක්ඛ"යි කියවු. "මේ දුක්ඛසමුදය"යි කියවු. "මේ දුක්ඛනිරොධ"යි කියවු. "මේ දුක්ඛනිරොධගාමිනී පටිපද"යි කියවු. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ කථා වැඩ සහිත ය. මෙය මහබඹසරට මුල් ය. මෙය නිර්වේදය විරාගය නිරෝධය ව්‍යුපශමය අභිඥානය සම්බෝධිය නිර්වාණය පිණිස පවතී. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුක්ඛ"යි වීර්‍ය්‍යය කටයුතු. "මේ දුක්ඛ සමුදය"යි වීර්‍ය්‍යය කටයුතු. "මේ දුක්ඛනිරොධ"යි වීර්‍ය්‍යය කටයුතු. "මේ දුක්ඛනිරොධගාමිනී පටිපද"යි වීර්‍ය්‍යය කටයුතු යි.

### පළමුවැනි සමාධිවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

සමාධි, පටිසල්ලාන යි දෙසුතුරෙකි. අනෙක් කුලපුත්ත සුතුරු දෙකෙකි. සමණබ්‍රාහ්මණ සුතුරු ද දෙකෙකි. විතක්ක, චින්තා, විග්ගාහිකකථා, තිරච්ඡානකථා යි සිවු සුතුරෙකි යි මුළුල්ල දශයෙකි යි.

# 2. ධම්මචක්කප්පවත්තනවග්ගො

## 12. 2. 1

## ධම්මචක්කප්පවත්තන සුත්තං

3853. එවං මෙ සුතං, එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි: "ද්වෙ මෙ භික්ඛවෙ, අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා[1]. යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, යො චායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො, එතෙ තෙ[2] භික්ඛවෙ, උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො සා භික්ඛවෙ, මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: "ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා''. ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛසමුදයො[3] අරියසච්චං: "යායං තණ්හා පොනොභවිකා නන්දිරාග-සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා''. ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධො[4] අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො. ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

---

1. නසෙවිතබ්බා කතමෙ ද්වෙ - මජසං, සයා
2. එතෙ ඛො - මජසං,
3. සමුදයං - මජසං, සීමු.
4. නිරොධං - මජසං, සීමු.

# 2. ධම්මචක්කප්පවත්තන වර්ගය

## 12. 2. 1

## ධම්මචක්කප්පවත්තන සූත්‍රය

3853. මා විසින් මෙසේ අසන ලද: එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **බරණැස සමීපයෙහි මිගදාය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් ඇමතූ සේක. මහණෙනි, ලාමක වූ ගැමි දහමක් වූ පුහුදුනන් විසින් සෙවුණු ආර්‍යයන් සතු නොවූ අවැඩ ඇසුරු කළ කාමවස්තූන් කෙරෙහි යම් මේ ක්ලෙශකාමයෙහි පුනපුනා යෙදීමෙකුත් වේ ද, දුක් වූ ආර්‍යයන් සතු නූවූ අවැඩ ඇසුරු කළ යම් මේ සිරුර පෙළීමෙහි පුනපුනා යෙදීමෙකුත් වේ ද, පැවිද්දහු විසින් මේ අන්ත දෙක (දෙකොටස) නො සෙවියයුතු. මහණෙනි, තථාගතයන් විසින් ඒ මේ අන්ත දෙකට නො පැමිණ පැනැස ඇති කරන නුවණැස ඇති කරන මැදුම් පිළිවෙත අවබොධ කරන ලද්දේ කෙලෙස් සන්හිඳුවීම පිණිස වෙසෙස් දැනුම පිණිස සිවුසස් දැනුම පිණිස නිවන් පිණිස පවතී. මහණෙනි, තථාගතයන් විසින් අවබොධ කරන ලද පැනැස ඇති කරන නුවණැස ඇති කරන ඒ කවර නම් මැදුම් පිළිවෙතෙක් කෙලෙස් සන්හිඳුවීම පිණිස වෙසෙස් දැනුම පිණිස සිවුසස් දැනුම පිණිස නිවන් පිණිස පවතී ද යත්: "මේ අරිඅටඟි මඟ මැ"යි. එනම්: "සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මා-කම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි"යි. මහණෙනි, පැනැස කරන නුවණැස කරන ඒ මේ මැදුම් පිළිවෙත තථාගතයන් විසින් අවබොධ කරන ලද්දේ කෙලෙස් සන්හිඳුවීම පිණිස වෙසෙස් දැනුම පිණිස සිවුසස් දැනුම පිණිස නිවන් පිණිස පවතී.

මහණෙනි, මේ වූකලි දුඃඛාර්‍යසත්‍ය යයි: "ඉපදීමත් දුක් ය. ජරාවත් දුක් ය. ව්‍යාධියත් දුක් ය. මරණයත් දුක් ය. අප්‍රියයන් හා එක්වීමත් දුක් ය. ප්‍රියයන්ගෙන් වෙන්වීමත් දුක් ය. කැමැති දෑ නො ලැබීමත් දුක් ය. සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝ දුක්ඛ"යි. මහණෙනි, මේ වූකලි දුඃඛසමුදයාර්‍යසත්‍ය යි: පුනර්භවය ඇති කරන නන්දිරාගය සහගිය ඒ ඒ භවයන්හි ඇල්ම ඇති කරන යම් තෘෂ්ණාවක් වේ ද, එනම්: කාමතණ්හා (කාමවස්තූන් කෙරෙහි පවත්නා තෘෂ්ණාව) භවතණ්හා (ශාශ්වතදෘෂ්ටි සහගත තෘෂ්ණාව) විභවතණ්හා (උච්ඡෙද දෘෂ්ටි සහගත තෘෂ්ණාව) යි. මහණෙනි, මේ වූකලි දුඃඛනිරොධාර්‍යසත්‍ය යි: ඒ තෘෂ්ණාවේ ම යම් නිරවශෙෂයෙන් නො ඇලීම් සඞ්ඛ්‍යාත නිරොධයෙක් දුරලීමෙක් අත්හැරීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද, (එයයි.) මහණෙනි, මේ වූ කලි දුක්ඛනිරොධ-ගාමිනීප්‍රතිපදාර්‍යසත්‍ය යි. මේ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ම ය. එනම්: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි.

''ඉදං දුක්ඛං අරියසච්චන්ති'' මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

''ඉදං දුක්ඛසමුදයො අරියසච්චන්ති'' මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහීනන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

''ඉදං දුක්ඛනිරොධො අරියසච්චන්ති'' මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකතන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

''ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති'' මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවිතන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි. ආලොකො උදපාදි.

යාවකීවඤ්ච මෙ භික්ඛවෙ, ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි, නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො[1] පච්චඤ්ඤාසිං. යතො ච ඛො මෙ භික්ඛවෙ, ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවොති. ඉදමවොච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

1. අභිසම්බුද්ධොති - මජසං.

මහණෙනි, මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය. නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය පිරිසිඳ දතයුතු (ඉක්මැ වියැ යුතු) ය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළවිය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය පිරිසිඳ දන්නා ලද්‍ද යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය.

මහණෙනි, මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය. නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය ප්‍රහාණය කළ යුතු යයි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය ප්‍රහීණයැ යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය.

මහණෙනි, මේ දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය. නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය පසක් කළයුතුය යි. පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය පසක් කරන ලද්‍ද යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය.

මහණෙනි, මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය. නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය වැඩිය යුතු ය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය ... එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය වඩන ලද්‍ද යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය. නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය.

මහණෙනි, යම්තාක් මට මේ සිවු අරියසස්හි මෙසේ තුන් පිරිවටක් ඇති දෙළොස් අයුරක් ඇති ඥානසඞ්ඛ්‍යාත දර්ශනය තතුසේ වෙසෙසින් විසුදු නො වී ද, මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි අනුත්තර සම්‍යක්සම්බොධිය අවබොධ කෙළෙමැ යි නො ම පිළින කෙළෙමි. මහණෙනි, යම් කලෙක මට මේ සිවු අරියසස්හි මෙසේ තුන් පිරිවටක් ඇති දෙළොස් අයුරක් ඇති ඥානසඞ්ඛ්‍යාත දර්ශනය තතුසේ වෙසෙසින් විසුදු වී ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි අනුත්තර සම්‍යක්සම්බොධිය අවබොධ කෙළෙමැ යි පිළින කෙළෙමි. මට ඥානදර්ශනයත් පහළ විය. මාගේ අර්හත්ඵල සමාධිය අකොප්‍ය ය, (නො සැලේ.) මේ කෙළවර ඉපැද්ම ය, දැන් පුනර්භවයෙක් නැතැ යි මෙය භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. සතුටු සිත් ඇති පස්වග භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව පිළිගත්හ යි.

T-18

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති". පවත්තිතෙ ච පන භගවතා[1] ධම්මචක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං: "එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති". භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං: "එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං[2] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති". චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- යාමා දෙවා -පෙ- තුසිතා දෙවා -පෙ- නිම්මාණරතී දෙවා -පෙ- පරනිම්මිතවසවත්තී[3] දෙවා -පෙ- බ්‍රහ්මකායිකා දෙවා සද්දමනුස්සාවෙසුං: "එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති".

ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි. අයඤ්ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පි සම්පකම්පි සම්පවෙධි. අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුරහොසි: අතික්කම්ම[4] දෙවානං දෙවානුභාවන්ති. අථ ඛො භගවා උදානං[5] උදානෙසි: "අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො, අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤොති". ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤොත්වෙව[6] නාමං අහොසීති.

## 12. 2. 2

## තථාගත සුත්තං

3854. ඉදං දුක්ඛං අරියසච්චන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ -පෙ- පරිඤ්ඤාතන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

---

1. ච භගවතා - සත්‍යා.
2. අප්පටිවත්තියං - මජසං, සත්‍යා
3. වසවත්තිනො - සීමු.
4. අතික්කමෙව - සත්‍යා.
5. ඉදං උදානං - මජසං.
6. අඤ්ඤාසිකොණ්ඩඤ්ඤොත්වෙව - මජසං.

මේ වෙය්‍යාකරණය වදරනු ලබන කල්හි "යම් කිසිවෙක් හටගන්නාසුලු නම් ඒ සියල්ල නැසෙනසුල්ලැ"යි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤහට පහවූ කෙලෙස්රජස් ඇති පහව ගිය කෙලෙස්මල ඇති දහම්ඇස (පළමු මගනැණ) පහළ විය. භාග්‍යවතුන් වහන්සේ විසින් දම්සක් පැවැත්වූ කල්හි මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොව කිසිවකු විසින් හෝ (තමන් වහන්සේ හා සමාන ලෙස) නො පැවැත්විය හැකි මේ අනුත්තර දම්සක භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදය නම් ඉසිපතනාරාමයේ දී පවත්වන ලදැ"යි බූමාටු දෙවියෝ ප්‍රීති ශබ්ද ඇස්වූහ. (සාධුකාර දුන්හ.) මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොව කිසිවකු විසින් හෝ සමාන ලෙස නො පැවැත්විය හැකි මේ අනුතුරු දම්සක භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදය නම් ඉසිපතනාරාමයේ දී පවත්වන ලදැ යි බූමාටු දෙවියන්ගේ (සාධුකාර) ශබ්දය අසා සිවුමහරජවැසි දෙවියෝ සාධුකාර දුන්හ ... සිවුමහරජවැසි දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා තව්තිසා වැසි දෙවියෝ සාධුකාර දුන්හ ... යාම දෙවියෝ ..., තුසිත දෙවියෝ ... නිර්මාණරතී දෙවියෝ ... පරනිර්මිතවශවර්ති දෙවියෝ ... මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොව කිසිවකු විසින් හෝ සමාන ලෙස නො පැවැත්විය හැකි මේ අනුතුරු දම්සක භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදය නම් ඉසිපතනාරාමයේ දී පවත්වන ලදැ"යි ... බ්‍රහ්මකායික දෙවියෝ සාධුකාර දුන්හ"යි.

මෙසේ එකෙණෙහි ඒ මොහොතෙහි බඹලොව තෙක් (සාධුකාර) ශබ්දය උස්ව පැන නැංගේ ය. මේ දශසහස්‍රී ලොකධාතුවත් සැලුණේ ය. මහත්සේ සැලුණේ ය. දැඩිසේ වෙවුළී ය. දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා සිටි අප්‍රමාණ උදාර ආලෝකයෙක් ද ලොව පහළ විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "භවත් කොණ්ඩඤ්ඤ එකාන්තයෙන් (චතුස්සත්‍යය) දැන ගත්තේ ය. භවත් කොණ්ඩඤ්ඤ එකාන්තයෙන් දැන ගත්තේ ය යි උදන් ඇනූ සේක. මෙසේ ආයුෂ්මත් කොණ්ඩඤ්ඤහට "අඤ්ඤාකොණ්ඩඤ්ඤ"යි ම මේ නමෙක් වී යි.

## 12. 2. 2

## තථාගත සූත්‍රය

3854. මහණෙනි, මේ දුක්ඛාර්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය, නැණ පහළ විය, පැන පහළ විය, විදු පහළ විය, එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛාර්‍යසත්‍යය පිරිසිඳ දත යුතු ය යි තථාගතයන්ට පෙර ... මහණෙනි, ... පිරිසිඳ දන්නා ලදැ යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය ... එළිය පහළ විය.

ඉදං දුක්ඛසමුදයො අරියසච්චන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ -පෙ- පහීනන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

ඉදං දුක්ඛනිරොධො අරියසච්චන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ -පෙ- සච්ඡිකතන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ -පෙ- භාවිතන්ති භික්ඛවෙ, තථාගතානං පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදීති.

## 12. 2. 3

## ඛන්ධ සුත්තං

3855. චත්තාරිමානි භික්ඛවෙ, අරියසච්චානි. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං, දුක්ඛසමුදයො අරියසච්චං දුක්ඛනිරොධො අරියසච්චං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං. කතමෙ පඤ්ච: සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො[1] වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං: යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛනිරොධො අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො. ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛනිරොධො අරියසච්චං.

1. වචනීයං, සෙය්‍යථීදං රූපූපාදානක්ඛන්ධො - මජ්සං.
වචනීයං, කතමෙ පඤ්ච? රූපූපාදානක්ඛන්ධො - සහා.

මහණෙනි, මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය, නැණ පහළ විය, පැන පහළ විය, විදු පහළ විය, එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය ප්‍රහාණය කළයුතු ය යි තථාගතයන්ට පෙර ... මහණෙනි, ... ප්‍රහාණය කරන ලද යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය ... එළිය පහළ විය.

මහණෙනි, මේ දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය, නැණ පහළ විය, පැන පහළ විය, විදු පහළ විය, එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය පසක් කළයුතු ය යි තථාගතයන්ට පෙර ... මහණෙනි, ... පසක් කරන ලද යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය, නැණ පහළ විය, පැන පහළ විය, විදු පහළ විය, එළිය පහළ විය.

මහණෙනි, මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය, නැණ පහළ විය, පැන පහළ විය, විදු පහළ විය, එළිය පහළ විය. මහණෙනි, ඒ මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය වැඩියයුතු ය යි තථාගතයන්ට පෙර ... මහණෙනි, ... වඩන ලද යි පෙර නො ඇසූවිරූ දහම්හි තථාගතයන්ට ඇස පහළ විය, නැණ පහළ විය, පැන පහළ විය, විදු පහළ විය, එළිය පහළ වී ය යි.

## 12. 2. 3

## ඛන්ධ සූත්‍රය

3855. මහණෙනි, මේ ආර්‍ය්‍ය සත්‍ය සතරෙකි. කවර සතරෙක යත්: දුක්ඛාර්‍ය්‍යසත්‍ය ය, දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍ය ය, දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍ය ය, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යි. මහණෙනි, දුක්ඛාර්‍ය්‍යසත්‍යය කවර යත්: පස් උපාදානස්කන්ධයෝ ය යි එයට කියයුතු. කවර පසෙක යත්: එනම්: ''රූපොපාදනස්කන්ධ ය, වෙදනොපාදනස්කන්ධ ය, සංඥෙපාදනස්කන්ධ ය, සංස්කාරොපාදනස්කන්ධ ය, විඥනොපාදනස්කන්ධ ය'' යි. මහණෙනි, මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය යි කියනු ලැබේ.

මහණෙනි, දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය කවර යත්: පුනර්භවය ඇති කරන නන්දිරාගය සහගිය ඒ ඒ භවයෙහි ඇල්ම ඇති කරන යම් මේ තෘෂ්ණාවක් වේ ද, එනම්: කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා යි. මහණෙනි, මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය යි කියනු ලැබේ.

මහණෙනි, දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය කවර යත්: ඒ තෘෂ්ණාවේ ම යම් නිරවශෙෂ විරාග නිරොධයෙක් දුරලීමෙක් අත්හැරීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද, මහණෙනි, මේ දුක්ඛනිරොධාර්‍ය්‍ය-සත්‍යය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි අරියසච්චානි. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 2. 4

### ආයතනසුත්තං

3856. චත්තාරිමානි භික්ඛවෙ, අරියසච්චානි, කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: ඡ අජ්ඣත්තිකානි ආයතනානීතිස්ස වචනීයං. කතමානි ඡ: චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං මනායතනං. ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං: යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛනිරොධො අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛනිරොධො අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි අරියසච්චානි. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 2. 5

### ධාරණසුත්තං

3857. ධාරෙථ නො තුම්හෙ භික්ඛවෙ, "මයා චත්තාරි අරියසච්චානි දෙසිතානී"ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: අහං ඛො භන්තෙ, ධාරෙමි. "භගවතා චත්තාරි අරියසච්චානි දෙසිතානී"ති. යථාකථං පන ත්වං භික්ඛු ධාරෙසි "මයා චත්තාරි අරියසච්චානි දෙසිතානී"ති. දුක්ඛං ඛ්වාහං භන්තෙ, භගවතා

මහණෙනි, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය කවර යත්: මේ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය මැ යි. එනම්: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යි. මහණෙනි, මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය යි කියනු ලැබෙ. මහණෙනි, මොහු චතුරාර්‍යසත්‍යයෝ යි. මහණෙනි, එහෙයින් මෙහිලා මේ දුකැ යි වීර්‍ය කටයුතු ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි වීර්‍ය කටයුතු යි.

## 12. 2. 4

## ආයතන සූත්‍රය

3856. මහණෙනි, මේ ආර්‍යසත්‍ය සතරෙකි. කවර සතරෙක යත්: ''දුක්ඛාර්‍යසත්‍යය ... දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍ය ය''යි. මහණෙනි, දුක්ඛාර්‍යසත්‍යය කවර යත්: ආධ්‍යාත්මික ෂඩායතනයෝ යයි එයට කියයුතු. කවර ෂඩායතනයෝ යැ යත්: ''චක්ඛායතන ශ්‍රොත්‍රායතන ඝ්‍රාණායතන ජිව්හායතන කායායතන මනායතන''යි. මහණෙනි, මේ දුක්ඛාර්‍යසත්‍යය යි කියනු ලැබෙ.

මහණෙනි, දුක්ඛසමුදයාර්‍යසත්‍යය කවර යත්: පුනර්භවය ඇති කරන නන්දිරාගය සහගිය ඒ ඒ භවයෙහි ඇලුම් ඇති කරන යම් මේ තෘෂ්ණාවක් වේ ද, එනම්: ''කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා'' යි. මහණෙනි, මේ දුක්ඛසමුදයාර්‍යසත්‍යය යි කියනු ලැබෙ.

මහණෙනි, දුක්ඛනිරොධාර්‍යසත්‍යය කවර යත්: ඒ තෘෂ්ණාවේම යම් නිරවශෙෂවිරාගනිරොධයෙක් දුරලීමෙක් අත්හැරීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද, මහණෙනි, මේ දුක්ඛනිරොධාර්‍ය සත්‍යය යි කියනු ලැබෙ.

මහණෙනි, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය කවර යත්: මේ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය මැ යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යය යි කියනු ලැබෙ. මහණෙනි, මොහු චතුරාර්‍යසත්‍යයෝ යි. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ දුකැ යි වීර්‍ය කටයුතු ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි වීර්‍ය කටයුතු යි.

## 12. 2. 5

## ධාරණ සූත්‍රය

3857. මහණෙනි, මා විසින් සිවු අරිසස් දෙසන ලද යි තෙපි දරවූ දූ යි මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සිවු අරිසස් දෙසන ලදැ යි දරමි''යි. ''මහණ, ඒ කෙසේ නම් තෙපි මා විසින් සිවු අරිසස් දෙසන ලද යි දරවූ දූ''යි ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින්

පඨමං අරියසච්චං දෙසිතං ධාරෙමි. දුක්ඛසමුදයො ඛ්වාහං භන්තෙ, භගවතා දුතියං අරියසච්චං දෙසිතං ධාරෙමි. දුක්ඛනිරොධො ඛ්වාහං භන්තෙ, භගවතා තතියං අරියසච්චං දෙසිතං ධාරෙමි. දුක්ඛනිරොධගාමිනී පටිපදා ඛ්වාහං භන්තෙ භගවතා චතුත්ථං අරියසච්චං දෙසිතං ධාරෙමි. එවං ඛ්වාහං භන්තෙ ධාරෙමි භගවතා චත්තාරි අරියසච්චානි දෙසිතානීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, ධාරෙසි මයා චත්තාරි අරියසච්චානි දෙසිතානි. දුක්ඛං ඛො භික්ඛු මයා පඨමං අරියසච්චං දෙසිතං, තථා නං ධාරෙහි. දුක්ඛසමුදයො ඛො භික්ඛු මයා දුතියං අරියසච්චං දෙසිතං, තථා නං ධාරෙහි. දුක්ඛනිරොධො ඛො භික්ඛු මයා තතියං අරියසච්චං දෙසිතං තථා නං ධාරෙහි. දුක්ඛනිරොධගාමිනී පටිපදා ඛො භික්ඛු මයා චතුත්ථං අරියසච්චං දෙසිතං තථා නං ධාරෙහි. එවං ඛො භික්ඛු, ධාරෙහි මයා චත්තාරි අරියසච්චානි දෙසිතානි. තස්මාතිහ භික්ඛු ඉදං "දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- අයං "දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

## 12. 2. 6

## දුතියධාරණසුත්තං

3858. ධාරෙථ නො තුම්හෙ භික්ඛවෙ, "මයා චත්තාරි අරියසච්චානි දෙසිතානී"ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "අහං ඛො භන්තෙ, ධාරෙමි භගවතා චත්තාරි අරියසච්චානි දෙසිතානී"ති. "යථාකථං පන ත්වං භික්ඛු ධාරෙසි මයා චත්තාරි අරියසච්චානි දෙසිතානී"ති? දුක්ඛං ඛො'හං භන්තෙ, "භගවතා පඨමං අරිසච්චං දෙසිතං" ධාරෙමි. යො හි කොචි භන්තෙ, සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: "නෙතං දුක්ඛං පඨමං අරියසච්චං සමණෙන[1] ගොතමෙන දෙසිතං, අහමෙතං දුක්ඛං පඨමං අරියසච්චං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛං පඨමං අරියසච්චං පඤ්ඤපෙස්සාමී"ති නෙතං ඨානං විජ්ජති.

දුක්ඛසමුදයං ඛො'හං භන්තෙ, භගවතා දුතියං අරියසච්චං දෙසිතං ධාරෙමි. යො හි කොචි භන්තෙ, සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: "නෙතං දුක්ඛසමුදයො අරියසච්චං සමණෙන ගොතමෙන දෙසිතං, අහමෙතං දුක්ඛසමුදයං දුතියං අරියසච්චං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛසමුදයං දුතියං අරියසච්චං පඤ්ඤපෙස්සාමී"ති නෙතං ඨානං විජ්ජති.

දුක්ඛනිරොධං ඛො'හං භන්තෙ, භගවතා තතියං අරියසච්චං දෙසිතං ධාරෙමි. යො හි කොචි භන්තෙ, සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: "නෙතං දුක්ඛනිරොධො තතියං අරියසච්චං සමණෙන ගොතමෙන දෙසිතං, අහමෙතං දුක්ඛනිරොධං තතියං අරියසච්චං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛනිරොධං තතියං අරියසච්චං පඤ්ඤපෙස්සාමී"ති නෙතං ඨානං විජ්ජති.

1. අරියසච්චං යං සමණෙන - මජසං, ස්‍යා.

දුක්ඛාර්‍ය්‍යසත්‍යය පළමුවනු කොට දෙසන ලදූ''යි දරමි. ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය දෙවනු කොට දෙසන ලදූ''යි දරමි. ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය තෙවනු කොට දෙසන ලදූ''යි දරමි. ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය සිවුවනු කොට දෙශනා කරන ලදූ''යි දරමි. ''වහන්ස, මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් සිවු අරිසස් දෙසන ලදූයි දරමි''යි.

මහණ, මැනවි, මැනවි, මහණ, තෙපි මා විසින් සිවු අරිසස් දෙසන ලදූ යි දරවූ මහණ, මා විසින් දුක්ඛාර්‍ය්‍යසත්‍යය පළමුවනු කොට දෙසන ලදී. එය එසේ දරවූ. මහණ, මා විසින් දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය දෙවනු කොට දෙසන ලදී. එය එසේ දරවූ. මහණ, මා විසින් දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය තෙවනු කොට දෙසන ලදී. එය එසේ දරවූ. මහණ, මා විසින් දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය සිවුවනු කොට දෙසන ලදී. එය එසේ දරවූ. මහණ මෙසේ මා විසින් සිවු අරිසස් දෙසන ලදූ යි දරවූ. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ දුක්ඛ යි වීර්‍ය්‍ය කටයුතු ... මේ දුක්ඛනිරොධගාමිනී පටිපද යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 2. 6
## ද්විතිය ධාරණ සූත්‍රය

3858. මහණෙනි, තෙපි මා විසින් සිවු අරිසස් දෙසන ලදූ යි දරවූ දෑ යි මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සිවු අරිසස් දෙසන ලදූ''යි දරමි යි. ''මහණ, ඒ කෙසේ නම් තෙපි මා විසින් සිවු අරිසස් දෙසන ලදූ යි දරවූ දෑ''යි. වහන්ස, ''මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛාර්‍ය්‍යසත්‍යය පළමුවනු කොට දෙසන ලදූ'' යි දරමි. වහන්ස, යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ ''මහණගොයුම්හු විසින් දෙශනා කරන ලද මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය පළමුවනු නො වේ. මම මේ පළමුවන දුක්ඛාර්‍ය්‍යසත්‍යය පිළිකෙව් කොට අනෙක් දුක්ඛාර්‍ය්‍යසත්‍යයක් පළමුවනු කොට පනවන්නෙමි''යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය දෙවනු කොට දෙශනා කරන ලදූ යි දරමි. වහන්ස, යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ ''මහණගොයුම්හු විසින් දෙශනා කරන ලද මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය දෙවනු නො වේ. මම මේ දෙවන දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය පිළිකෙව් කොට අනෙක් දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යයක් දෙවනු කොට පනවන්නෙමි''යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය තෙවනු කොට දෙශනා කරන ලදූ යි දරමි. වහන්ස, යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ ''මහණගොයුම්හු විසින් දෙශනා කරන ලද මේ දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍ය තෙවනු නො වේ. මම මේ තෙවන දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය පිළිකෙව් කොට අනෙක් දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යයක් තෙවනු කොට පනවන්නෙමි''යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත.

දුක්ඛනිරොධගාමිනිං පටිපදං ඛො'හං භන්තෙ භගවතා චතුත්ථං අරියසච්චං දෙසිතං ධාරෙමි. යො හි කොචි භන්තෙ, සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: ''නෙතං දුක්ඛනිරොධගාමිනීපටිපදා චතුත්ථං අරියසච්චං සමණෙන ගොතමෙන දෙසිතං. අහමෙතං දුක්ඛ-නිරොධගාමිනිං පටිපදං චතුත්ථං අරියසච්චං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛනිරොධගාමිනිං පටිපදං චතුත්ථං අරියසච්චං පඤ්ඤපෙස්සාමී''ති නෙතං ඨානං විජ්ජති. එවං ඛො'හං භන්තෙ, ධාරෙමි භගවතා චත්තාරි අරියසච්චානි දෙසිතානීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, ධාරෙසි. මයා චත්තාරි අරියසච්චානි දෙසිතානි. දුක්ඛං ඛො භික්ඛු මයා පඨමං අරියසච්චං දෙසිතං. තථා නං ධාරෙහි. යො හි කොචි භික්ඛු සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: ''නෙතං දුක්ඛං පඨමං අරියසච්චං සමණෙන ගොතමෙන දෙසිතං. අහමෙතං දුක්ඛං පඨමං අරියසච්චං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛං පඨමං අරියසච්චං පඤ්ඤ-පෙස්සාමී''ති නෙතං ඨානං විජ්ජති -පෙ-

දුක්ඛනිරොධගාමිනී පටිපදා ඛො භික්ඛු මයා චතුත්ථං අරියසච්චං දෙසිතං. තථා නං ධාරෙහි. යො හි කොචි භික්ඛු සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: ''නෙතං දුක්ඛනිරොධගාමිනී පටිපදා චතුත්ථං අරියසච්චං සමණෙන ගොතමෙන දෙසිතං. අහමෙතං දුක්ඛ-නිරොධගාමිනිං පටිපදං චතුත්ථං අරියසච්චං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛනිරොධගාමිනිං පටිපදං චතුත්ථං අරියසච්චං පඤ්ඤපෙස්සාමී''ති නෙතං ඨානං විජ්ජති. එවං ඛො ත්වං භික්ඛු ධාරෙහි මයා චත්තාරි අරියසච්චානි දෙසිතානි. තස්මාතිහ භික්ඛු, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 2. 7

## අවිජ්ජාසුත්තං

3859. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''අවිජ්ජා අවිජ්ජාති'' භන්තෙ, වුච්චති, කතමා නු ඛො භන්තෙ, අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති? යං ඛො භික්ඛු, දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛසමුදයෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං අයං වුච්චති භික්ඛු, අවිජ්ජා, එත්තාවතා ච අවිජ්ජාගතො හොති. තස්මාතිහ භික්ඛු, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය සිවුවනු කොට දෙශනා කරන ලදැයි දරමි. වහන්ස, යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ මහණගොයුම්හු විසින් දෙශනා කරන ලද මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය සිවුවනු නො වේ. මම මේ සිවුවන දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය පිළිකෙව් කොට අනෙක් දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යයක් සිවුවනු කොට පනවන්නෙමි''යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත. වහන්ස, මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් සිවු අරිසස් දෙසන ලදැ යි දරමි යි.

මහණ, මැනවි මැනවි. මහණ, තෙපි මා විසින් සිවු අරිසස් දෙසන ලදැයි දරනු මැනවි. මහණ, මා විසින් දුක්ඛආර්‍ය්‍යසත්‍යය පළමුවනු කොට දෙසන ලදී. එය එසේ දරවු. මහණ, යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ මහණගොයුම්හු විසින් දෙශනා කරන ලද මේ දුක්ඛආර්‍ය්‍යසත්‍යය පළමුවනු නො වේ. මම මේ පළමුවන දුක්ඛආර්‍ය්‍යසත්‍යය පිළිකෙව් කොට අනික් දුක්ඛආර්‍ය්‍යසත්‍යයක් පළමුවනු කොට පනවන්නෙමි''යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත ...

මහණ, මා විසින් දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය සිවුවනු කොට දෙශනා කරන ලදී. එය එසේ දරවු. මහණ, යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ මහණගොයුම්හු විසින් දෙශනා කරන ලද මේ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය සිවුවනු නො වේ. මම මේ සිවුවන දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය පිළිකෙව් කොට අනෙක් දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යයක් සිවුවනු කොට පනවන්නෙමි''යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත. මහණ, මෙසේ තෙපි මා විසින් සිවු අරිසස් දෙසන ලදැයි දරවු. මහණ, එහෙයින් මෙහිලා ''මේ දුක්ඛ''යි වීර්‍ය්‍ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනී පටිපදා''යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 2. 7

## අවිජ්ජා සූත්‍රය

3859. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, අවිද්‍යා අවිද්‍යා''යි කියනු ලැබේ. වහන්ස, අවිද්‍යා නම් කවර යැ? කෙතෙකින් අවිද්‍යාගතත් වේ දැ''යි. මහණ, යම් දුකෙහි නො දන්මෙක් දුක් හටගැන්මෙහි නො දන්මෙක් දුක් වැළැක්මෙහි නො දන්මෙක් දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතෙහි නො දන්මෙක් වේ ද, මහණ, මේ අවිද්‍යා යි කියනු ලැබේ. මෙතෙකින් අවිද්‍යාගතත් වේ. මහණ, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි වීර්‍ය්‍ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදා''යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 2. 8

### විජ්ජාසුත්තං

3860. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''විජ්ජා විජ්ජා''ති භන්තෙ, වුච්චති කතමා නු ඛො භන්තෙ, විජ්ජා, කිත්තාවතා ච විජ්ජාගතො හොතීති? යං ඛො භික්ඛු, දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං. අයං වුච්චති භික්ඛු විජ්ජා. එත්තාවතා ච විජ්ජාගතො හොති. තස්මාතිහ භික්ඛු, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 2. 9

### සඞ්කාසනසුත්තං

3861. ඉදං දුක්ඛං අරියසච්චන්ති භික්ඛවෙ, මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා වණ්ණා, අපරිමාණා ව්‍යඤ්ජනා, අපරිමාණා සඞ්කාසනා. ඉතිපිදං දුක්ඛං අරියසච්චන්ති. ඉදං දුක්ඛසමුදයො අරියසච්චන්ති භික්ඛවෙ, මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා වණ්ණා, අපරිමාණා ව්‍යඤ්ජනා, අපරිමාණා සඞ්කාසනා. ඉතිපිදං දුක්ඛසමුදයො අරියසච්චන්ති. ඉදං දුක්ඛනිරොධො අරියසච්චන්ති භික්ඛවෙ, මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා වණ්ණා, අපරිමාණා ව්‍යඤ්ජනා, අපරිමාණා සඞ්කාසනා. ඉතිපිදං දුක්ඛනිරොධො අරියසච්චන්ති. ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති භික්ඛවෙ, මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා වණ්ණා, අපරිමාණා ව්‍යඤ්ජනා, අපරිමාණා සඞ්කාසනා. ඉතිපිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 2. 10

### තථසුත්තං

3862. චත්තාරිමානි භික්ඛවෙ, තථානි අවිතථානි අනඤ්ඤථානි. කතමානි චත්තාරි: ඉදං දුක්ඛන්ති භික්ඛවෙ, තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං. අයං දුක්ඛසමුදයොති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං. අයං දුක්ඛනිරොධොති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි තථානි අවිතථානි අනඤ්ඤථානි. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො. අයං දුක්ඛසමුදයොති යොගො කරණීයො, අයං දුක්ඛනිරොධොති යොගො කරණීයො. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

### ධම්මචක්කප්පවත්තනවග්ගො දුතියො.

**තස්සුද්දානං:**

තථාගතෙන ද්වෙ වුත්තා ඛන්ධා ආයතනානි ච,
ධාරණා ච ද්වෙ අවිජ්ජා විජ්ජා සඞ්කාසනා තථාති.

## 12. 2. 8
## විජ්ජා සූත්‍රය

3860. එකල එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, විද්‍යා විද්‍යා''යි කියනු ලැබේ. වහන්ස, විද්‍යා නම් කවර යැ? කෙතෙකින් විද්‍යාගතත් වේ දැයි? මහණ, යම් දුකෙහි දැනීමෙක්, දුක් හටගැන්මෙහි දැනීමෙක්, දුක් වැළැක්මෙහි දැනීමෙක්, දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතෙහි දැනීමෙක්, වේ ද, මහණ මේ 'විද්‍යා'යි කියනු ලැබේ. මෙතෙකින් විද්‍යාගතත් වෙයි. මහණ, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි වීයර්‍ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි වීයර්‍ය කටයුතු යි.

## 12. 2. 9
## සඞ්කාසන සූත්‍රය

3861. මහණෙනි, ''මේ දුක්ඛායර්‍යසත්‍යය''යි මා විසින් පනවන ලදී. එහි අකුරු නො පමණි, ව්‍යඤ්ජන නො පමණි, බෙදුම් නො පමණි, මෙසේත් මේ දුක්ඛායර්‍යසත්‍යයයි. මහණෙනි, ''මේ දුක්ඛසමුදයායර්‍යසත්‍යය යි'' මා විසින් පනවන ලදී. එහි අකුරු නො පමණි, ව්‍යඤ්ජන නො පමණි, බෙදුම් නො පමණි, මෙසේත් මේ දුක්ඛසමුදයායර්‍යසත්‍යය යි. මහණෙනි, ''මේ දුක්ඛනිරොධායර්‍යසත්‍යය''යි මා විසින් පනවන ලදී. එහි අකුරු නො පමණි, ව්‍යඤ්ජන නො පමණි, බෙදුම් නො පමණි, මෙසේත් මෙය දුක්ඛනිරොධායර්‍යසත්‍යය යි. මහණෙනි, ''මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදායර්‍යසත්‍යය'' යි මා විසින් පනවන ලදී. එහි අකුරු නො පමණි, ව්‍යඤ්ජන නො පමණි, බෙදුම් නො පමණි, මෙසේත් මෙය දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදායර්‍යසත්‍යය යි. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි වීයර්‍ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනීපටිපද''යි වීයර්‍ය කටයුතු යි.

## 12. 2. 10
## තථ සූත්‍රය

3862. මහණෙනි, මේ සතරෙක් සත්‍ය ය. නො වෙනස් වන සුලු ය, අන්පරිදි නොවන සුලු ය. කවර සතරෙක යත්: මහණෙනි, ''මේ දුකැ''යි මෙය සත්‍ය ය. මෙය නො වෙනස් වනසුලු ය, මෙය අන්පරිදි නොවනසුලු ය, ''මේ දුක්හෙතු''යි මෙය සත්‍ය ය. මෙය නො වෙනස් වනසුලු ය, මෙය අන්පරිදි නො වනසුලු ය, ''මේ දුක් නැවැත්මැ''යි මෙය සත්‍ය ය. මෙය නො වෙනස් වනසුලු ය, මෙය අන්පරිදි නොවනසුලු ය, ''මේ දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතැ''යි මෙය සත්‍ය ය. මෙය නො වෙනස් වනසුලු ය, මෙය අන්පරිදි නො වනසුලු ය, මහණෙනි, මේ සතර සත්‍ය ය. නො වෙනස් වනසුලු ය, අන්පරිදි නො වනසුලු ය, මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුකැ''යි වීයර්‍ය කටයුතු. ''මේ දුක්හෙතු ය''යි වීයර්‍ය කටයුතු. ''මේ දුක් නැවැත්මැ''යි වීයර්‍ය කටයුතු. ''මේ දුක් නැවැත්මට පමුනුවන පිළිවෙතැ''යි වීයර්‍ය කටයුතු යි.

**දෙවැනි ධම්මචක්කප්පවත්තන වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

(ධම්මචක්කප්පවත්තන තථාගත යි) තථාගතනමින් දෙකෙක් කියන ලදී. ඛන්ධ ආයතනනමින් ද දෙකෙකි. ධාරණ සූත්‍ර ද දෙකෙකි. අවිජ්ජා, විජ්ජා, සඞ්කාසන, තථ යී සතරෙකි. මුළුල්ල දශයෙකි යි.

# කොටිගාමවග්ගො

## 12. 3. 1

## කොටිගාමසුත්තං

3863. එවං මෙ සුතං එකං සමයං භගවා වජ්ජීසු විහරති කොටිගාමෙ.[1] තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: චතුන්නං භික්ඛවෙ, අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස භික්ඛවෙ, අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

තයිදං භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, දුක්ඛසමුදයො අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. දුක්ඛනිරොධො අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. උච්ඡින්නා භවතණ්හා. ඛීණා භවනෙත්ති. නත්‍ථිදානි පුනබ්භවොති. ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

චතුන්නං අරියසච්චානං යථාභූතං අදස්සනා,
සංසරං[2] දීඝමද්ධානං තාසු තාස්වෙව ජාතිසු.

තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා,
උච්ඡින්නං මූලං දුක්ඛස්ස නත්‍ථිදානි පුනබ්භවොති.

## 12. 3. 2

## දුතියකොටිගාමසුත්තං

3864. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති. අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානන්ති. අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානන්ති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානන්ති. න මෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං පජානන්ති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානන්ති. තෙ ඛො මෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති ඉදමවොච භගවා -පෙ- එතදවොච සත්ථා:

1. කොලිගාමෙ - සී 2.
2. සංසිතං - මජ්ඣං, සංසරිතං - ස්‍යා, සංසතං - සී 1.

# කොටිගාම වර්ගය

## 12. 3. 1

## කොටිගාම සූත්‍රය

3863. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ වැදෑ දනව්වෙහි කෙළගම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, සිවු අරීසස් නොදැනුමෙන් නො පිළිවිදුමෙන් මා විසිනුදු තොප විසිනුදු මෙසේ මේ දිගුකල් මුළුල්ලෙහි දිවිණි සැරිසැරිණි. නොහොත් මාගේත් තොපගේත් දිවුම සැරිසැරුම විය. කවර සතරක යත්: මහණෙනි, දුක්ඛාර්‍ය්‍යසත්‍යය නොදැන්මෙන් නො පිළිවිදුමෙන් මෙසේ මේ දිගුකල් මුළුල්ලෙහි මා විසිනුදු තොප විසිනුදු දිවිණි, සැරිසැරිණි. දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය නොදැනුමෙන් නොපිළිවිදුමෙන් මෙසේ මේ දිගුකල් මුළුල්ලෙහි මා විසිනුදු තොප විසිනුදු දිවිණි, සැරිසැරිණි. දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය නොදැන්මෙන් නොපිළිවිදුමෙන් මෙසේ මේ දිගුකල් මුළුල්ලෙහි මා විසිනුදු තොප විසිනුදු දිවිණි, සැරිසැරිණි. දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය නොදැනුමෙන් නොපිළිවිදුමෙන් මෙසේ මේ දිගුකල් මුළුල්ලෙහි මා විසිනුදු තොප විසිනුදු දිවිණි, සැරිසැරිණි.

මහණෙනි, ඒ මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය දන්නා ලදී, පිළිවිදුනා ලදී. දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය දන්නා ලදී, පිළිවිදුනා ලදී. දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය දන්නා ලදී, පිළිවිදුනා ලදී. දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය දන්නා ලදී, පිළිවිදුනා ලදී. භවතෘෂ්ණාව සිඳින ලදු, බවරුහැන (තෘෂ්ණා)ගෙවිණ. දැන් පුනර්භවයෙක් නැතැ යි මෙය භාග්‍යවතුන් වහන්සේ වදළ සේක ... ශාස්තෲන් වහන්සේ මෙ ද වදළ සේක:

'සිවු අරීසස් තතුසේ නොදැක්මෙන් දිගුකලක් මුළුල්ලෙහි ඒ ඒ ජාතීන්හි සැරිසරමින් ම ඒ මොහු (සිවුසස්) දක්නා ලද හ. බවරුහැන නසන ලදි. දුකෙහි මුල් සිඳින ලදී. දැන් පුනර්භවයෙක් නැතැ'යි.

## 12. 3. 2

## දුතිය කොටිගාම සූත්‍රය

3864. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ 'මේ දුකැ'යි තතුසේ නො දනිද්ද, 'මේ දුක් හටගැන්මැ'යි තතුසේ නො දනිද්ද, 'මේ දුක් වැළැක්මැ'යි තතුසේ නො දනිද්ද, 'මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ'යි තතුසේ නො දනිද්ද, මහණෙනි, ඒ මේ මහණහු හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණහු ය යි සම්මත නො වෙති. බමුණන් කෙරෙහිත් බමුණෝ ය යි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු මහණකමෙහි අරුත හෝ බමුණුකමෙහි අරුත හෝ දිටුදැම්යෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ නො ද වෙසෙත්. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ 'මේ දුකැ'යි තතු සේ දනිද්ද ... 'මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දනිද්ද, මහණෙනි, ඒ මේ මහණහු හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණහු ය යි සම්මතයහ. බමුණන් කෙරෙහිත් බමුණෝ ය යි සම්මතයහ. ඒ ආයුෂ්මත්හු මහණකමෙහි අරුතත් බමුණුකමෙහි අරුතත් දිටුදැම්යෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි. මෙය භාග්‍යවතුන් වහන්සේ වදළ සේක ... ශාස්තෲන් වහන්සේ මෙ ද වදළ සේක:

යෙ දුක්ඛං නප්පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං,
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති.

තඤ්ච මග්ගං න ජානන්ති දුක්ඛූපසමගාමිනං,
චෙතොවිමුත්ති හීනා තෙ අථො පඤ්ඤාවිමුත්තියා.

අභබ්බා තෙ අන්තකිරියාය තෙ වෙ ජාතිජරූපගා,
යෙ ච දුක්ඛං පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං.

යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති,
තඤ්ච මග්ගං පජානන්ති දුක්ඛූපසමගාමිනං.

චෙතොවිමුත්තිසම්පන්නා අථො පඤ්ඤාවිමුත්තියා,
භබ්බා තෙ අන්තකිරියාය න තෙ ජාතිජරූපගාති.

## 12. 3. 3

## අභිසම්බුද්ධසුත්තං

3865. සාවත්ථියං:

චත්තාරිමානි භික්ඛවෙ, අරියසච්චානි. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි අරියසච්චානි. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසම්බුද්ධත්තා තථාගතො අරහං සම්මාසම්බුද්ධොති වුච්චති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යොගො කරණීයොති.

## 12. 3. 4

## අරහන්තසුත්තං

3866. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා යථාභූතං අභිසම්බුජ්ඣිංසු, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣිංසු. යෙ හි[1] කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා යථාභූතං අභිසම්බුජ්ඣිස්සන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣිස්සන්ති. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි අරහන්තො සම්මාසම්බුද්ධා යථාභූතං අභිසම්බුජ්ඣන්ති, සබ්බෙ තෙ චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣන්ති. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයො අරියසච්චං දුක්ඛනිරොධො අරියසච්චං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා යථාභූතං අභිසම්බුජ්ඣිංසු -පෙ- අභිසම්බුජ්ඣිස්සන්ති -පෙ- සබ්බෙ තෙ ඉමානි චත්තාරි අරියසච්චානි යථාභූතං අභිසම්බුජ්ඣන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

1. යෙපිහි - ස්‍යා.

''යම් කෙනෙක් දුකත් යළි දුක්හි හටගැන්මත් යම් තැනෙක සියලු අයුරින් දුක නිරවශෙෂ ව නිරුද්ධ වේ නම් එයත් නො දනිද්ද,

දුක් සන්සිඳුමට පමුණුවන ඒ මඟත් නො දනිද් ද, ඔහු ඵලසමාධියෙන් තොර වූවහ. යළි ඵලප්‍රඥායෙන් ද තොර වූවහ.

ඔහු දුක් කෙළවර කිරීමට නුසුදුස්සහ. ඔහු ඒකාන්තයෙන් ජාතිජරාවන්ට පැමිණියහ. යම් කෙනෙක් දුකත් යළි දුක් හට-ගැන්මත් දනිද්ද,

යම් තැනෙක සියලු අයුරින් දුක නිරවශෙෂයෙන් නිරුද්ධ වේ නම් එයත් දුක් සන්හිඳුමට පමුණුවන ඒ මඟත් දනිද්ද,

ඵලසමාධියෙන් යුතු වූ යළි ඵලප්‍රඥායෙන් ද සමන්වාගත වූ ඔහු දුක් කෙළවර කිරීමට සුදුස්සහ. ඔහු ජාතිජරාවන්ට පැමිණියාහු නො වෙති යි.

## 12. 3. 3

## අභිසම්බුද්ධ සූත්‍රය

**3865. සැවැත්නුවර :**

මහණෙනි, ආර්‍ය්‍යසත්‍ය සතරෙකි. කවර සතරෙක යත්: ''දුක්ඛාර්‍ය්‍යසත්‍යය ... දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය'' යි. මහණෙනි, මොහු චතුරාර්‍ය්‍යසත්‍යයෝ යි. මහණෙනි, මේ චතුරාර්‍ය්‍යසත්‍යයන් තතු සේ වෙසෙසින් අවබොධ කළ බැවින් තථාගතයෝ ''අර්හත් සම්‍යක්සම්බුද්ධයහ'' යී කියනු ලැබෙති. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යී විර්‍ය්‍ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනීපටිපදා''යී විර්‍ය්‍ය කටයුතු යි.

## 12. 3. 4

## අරහන්ත සූත්‍රය

3866. මහණෙනි, ඉකුත් කල යම් කිසි අර්හත් සම්මාසම්බුද්ධවරයෝ තතු සේ අවබොධ කළාහු ද, ඒ සියල්ලෝ සිවු අරියසස් තතු සේ අවබොධ කළාහ. මහණෙනි, මතු කල යම් කිසි අර්හත් සම්මාසම්බුද්ධවරයෝ තතු සේ අවබොධ කරන්නාහු ද ඒ සියල්ලෝ සිවු අරිසස් තතු සේ අවබොධ කරන්නාහ. මහණෙනි, මෙකල යම් කිසි අර්හත් සම්මා සම්බුද්ධවරයෝ තතු සේ අවබොධ කෙරෙද්ද, ඒ සියල්ලෝ සිවු අරිසස් තතු සේ අවබොධ කෙරෙත්. කවර සිවු අරිසස් ද යත්: දුක්ඛාර්‍ය්‍යසත්‍ය ය, දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍ය ය, දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍ය ය, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යි. මහණෙනි, ඉකුත් කල යම් කිසි අර්හත් සම්මා සම්බුද්ධවරයෝ තතු සේ අවබොධ කළාහු ද ... අවබොධ කරන්නාහු ද ... අවබොධ කෙරෙද්ද, ඒ සියල්ලෝ මේ සිවු අරිසස් තතු සේ අවබොධ කෙරෙත්. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යී විර්‍ය්‍ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනී පටිපදා''යී විර්‍ය්‍ය කටයුතු යි.

T-19

## 12. 3. 5

### ආසවක්ඛයසුත්තං

3867. ජානතො අහං භික්ඛවෙ, පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො නො අපස්සතො[1]. කිඤ්ච භික්ඛවෙ, ජානතො කිං පස්සතො[2] ආසවානං ඛයො හොති: ඉදං දුක්ඛන්ති භික්ඛවෙ, ජානතො පස්සතො ආසවානං ඛයො හොති –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති ජානතො පස්සතො ආසවානං ඛයො හොති. එවං ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 3. 6

### මිත්තසුත්තං

3868. යෙ හි කෙචි භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චාවා ඤාතී වා සාලොහිතා වා, තෙ වො භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස –පෙ– දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස. යෙ හි කෙචි භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ, යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා. තෙ වො භික්ඛවෙ, ඉමෙසං චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 3. 7

### තථසුත්තං

3869. චත්තාරිමානි භික්ඛවෙ, අරියසච්චානි. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං –පෙ– දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි අරියසච්චානි තථානි අවිතථානි අනඤ්ඤථානි, තස්මා අරියසච්චානීති වුච්චන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 3. 8

### ලොකසුත්තං

3870. චත්තාරිමානි භික්ඛවෙ, අරියසච්චානි. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං –පෙ– දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං සදෙවකෙ භික්ඛවෙ, ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අරියො, තස්මා අරියසච්චානීති වුච්චන්ති. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

---

1. අජානතො අපස්සතො – මජ්සං,ස්‍යා.
2. ජානතො පස්සතො – මජ්සං, සී 1, 2.

## 12. 3. 5
## ආසවක්ඛය සූත්‍රය

3867. මහණෙනි, මම දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවක්‍ෂය කියමි. නො දන්නහුගේ නො කියමි. නො දක්නහුගේ නො කියමි. මහණෙනි, කුමක් දන්නහුගේ කුමක් දක්නහුගේ ආශ්‍රවක්‍ෂය වේ ද යත්: මහණෙනි, මේ දුකැ යි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවක්‍ෂය වේ ... "මේ දුක් වැළැක්මට පමුණු වන පිළිවෙතැ"යි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවක්‍ෂය වේ. මහණෙනි, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ ආශ්‍රවක්‍ෂය වේ. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වියඈ කටයුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වියඈ කටයුතු යි.

## 12. 3. 6
## මිත්ත සූත්‍රය

3868. මහණෙනි, යම් කිසි කෙනකුන්ට අනුකම්පා කරන්නහු නම් මිතුරු වූ හෝ සගයහළු වූ හෝ නෑ වූ හෝ සාලේ නෑ වූ හෝ යම් කෙනකුන් ඇහුම්කන් දියයුතු ය යි හඟනාහු නම් මහණෙනි, ඔහු තොප විසින් සිවු අරියස් අවබොධ කිරීම පිණිස සමාදන් කරවිය යුතු ය. වැස්වියයුතු ය. පිහිටුවියයුතු ය. කවර සිවු අරිසස් ද යත්: දුක්ඛාරියඈසත්‍ය ය ... දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාරියඈ-සත්‍ය යි. මහණෙනි, යම් කිසි කෙනකුන්ට අනුකම්පා කරන්නහු නම් මිතුරු වූ හෝ සගයහළු වූ හෝ නෑ වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනකුන් ඇහුම්කන් දියයුතු ය යි හඟනාහු නම් මහණෙනි, ඔහු තොප විසින් මේ සිවු අරියස් අවබොධ කිරීම පිණිස සමාදන් කරවියයුතු ය, වැස්වියයුතු ය, පිහිටුවිය යුතුය. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වියඈයකටයුතු ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ" යි වියඈය කටයුතු යි.

## 12. 3. 7
## තථ සූත්‍රය

3869. මහණෙනි, මෙ ආයඈසත්‍ය සතරෙකි. කවර සතරෙැ යත්: "දුක්ඛායඈසත්‍ය ය ... දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදයඈසත්‍ය ය" යි. මහණෙනි, මේ ආයඈසත්‍ය සතර තථ්‍ය ය, නො වෙනස්වනසුලු ය, අන් පරිදි නො වනසුලු ය. එහෙයින් ආයඈසත්‍ය යි කියනු ලැබෙත්. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ දුකැ" යි වියඈ කටයුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ" යි වියඈ කටයුතු යි.

## 12. 3. 8
## ලොක සූත්‍රය

3870. මහණෙනි, මේ අරිසස් සතරෙකි. කවර සතරෙක යත්. "දුක්ඛායඈසත්‍ය ය ... දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදයඈසත්‍ය ය"යි. මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි තථාගතයෝ ආයඈයහ. එහෙයින් ආයඈසත්‍ය යි කියනු ලැබෙත්. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වියඈ කටයුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වියඈ කටයුතු යි.

## 12. 3. 9

## පරිඤ්ඤෙය්‍යසුත්තං

3871. චත්තාරිමානි භික්ඛවෙ, අරියසච්චානි. කතමානි චත්තාරි: දුක්ඛං අරියසච්චං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං, ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි අරියසච්චානි. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං අත්ථි අරියසච්චං පරිඤ්ඤෙය්‍යං, අත්ථි අරියසච්චං පහාතබ්බං, අත්ථි අරියසච්චං සච්ඡිකාතබ්බං, අත්ථි අරියසච්චං භාවෙතබ්බං. කතමඤ්ච භික්ඛවෙ, අරියසච්චං පරිඤ්ඤෙය්‍යං: දුක්ඛං භික්ඛවෙ, අරියසච්චං පරිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බං, දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බං, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බං. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 3. 10

## ගවම්පතිසුත්තං

3872. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ චෙතීසු[1] විහරන්ති සහජාතියං[2]. තෙන ඛො පන සමයෙන සම්බහුලානං ථෙරානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාලෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "යො නු ඛො ආවුසො දුක්ඛං පස්සති දුක්ඛසමුදයම්පි සො පස්සති දුක්ඛනිරොධම්පි පස්සති දුක්ඛනිරොධගාමිනිං පටිපදම්පි පස්සතී"ති.

එවං වුත්තෙ ආයස්මා ගවම්පති ථෙරො භික්ඛූ එතදවොච: "සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං". "යො භික්ඛවෙ, දුක්ඛං පස්සති දුක්ඛසමුදයම්පි සො පස්සති දුක්ඛනිරොධම්පි පස්සති දුක්ඛනිරොධගාමිනිං පටිපදම්පි පස්සති. යො දුක්ඛසමුදයං පස්සති, දුක්ඛම්පි සො පස්සති දුක්ඛනිරොධම්පි පස්සති දුක්ඛනිරොධගාමිනිං පටිපදම්පි පස්සති. යො දුක්ඛනිරොධං පස්සති, දුක්ඛම්පි සො පස්සති දුක්ඛසමුදයම්පි පස්සති දුක්ඛනිරොධගාමිනිං පටිපදම්පි පස්සති. යො දුක්ඛනිරොධගාමිනිං පටිපදං පස්සති, දුක්ඛම්පි සො පස්සති දුක්ඛසමුදයම්පි පස්සති දුක්ඛනිරොධම්පි පස්සතී"ති.

### කොටිගාමවග්ගො තතියො.

තත්‍රුද්දානං:

ද්වෙ කොටිගාමාභිසම්බුද්ධො අරහං ආසවක්ඛයං
මිත්තං තථා ච ලොකො ච පරිඤ්ඤෙය්‍යං ගවම්පතීති.

1. චෙතියෙසු – ස්‍යා. චෙතෙසු – මජ්සං.
2. සහජානියෙ – ස්‍යා. සහඤ්ජනිකෙ – මජ්සං. සහජාතායං – සී 1.

## 12. 3. 9

### පරිච්ඡෙදයා සූත්‍රය

3871. මහණෙනි, මේ ආර්‍යසත්‍ය සතරෙකි. කවර සතරෙක යත්: "දුක්ඛාර්‍යසත්‍ය ය ... දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍ය" යි. මහණෙනි, මොහු චතුරාර්‍යසත්‍යයෝ යි. මහණෙනි, මේ චතුරාර්‍යසත්‍යයන් අතුරෙන් පිරිසිඳ දතයුතු ආර්‍යසත්‍යයෙක් ඇත. ප්‍රහාණ කළයුතු ආර්‍යසත්‍යයෙක් ඇත. සාක්ෂාත් කටයුතු ආර්‍යසත්‍යයෙක් ඇත. වැඩියයුතු ආර්‍යසත්‍යයෙක් ඇත. මහණෙනි, පිරිසිඳ දත යුතු ආර්‍යසත්‍යය කවරෙ යත්: මහණෙනි, දුක්ඛාර්‍යසත්‍යය පිරිසිඳ දතයුතු ය. දුක්ඛසමුදයාර්‍යසත්‍යය ප්‍රහාණ කළ යුතු ය. දුක්ඛනිරොධාර්‍යසත්‍යය සාක්ෂාත් කටයුතු ය. දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය වැඩියයුතු ය. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වීර්‍ය කටයුතු ... "මේ දුක් වැළකීමට පමුණුවන පිළිවෙතැ"යි වීර්‍ය කටයුතු යි.

## 12. 3. 10

### ගවම්පති සූත්‍රය

3872. එක්කලෙක බොහෝ ස්ථවිර භික්ෂූහු චෙති දනව්වෙහි සහජාතිභූමියෙහි වෙසෙත්. එකල පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණු මණ්ඩලමාලයෙහි රැස් ව හුන් ස්ථවිර භික්ෂූන් අතර මේ අතුරු කථාව උපන: "ඇවැත්නි, යමෙක් දුක්ඛය දකී ද, හෙතෙම දුක්ඛ-සමුදයත් දකී. දුක්ඛනිරොධයත් දකී. දුක්ඛනිරොධගාමිනීපටිපදවත් දකී" යි

මෙසේ කී කල්හි ඇවැත් ගවම්පති තෙරණුවෝ මහණුන්හට මෙය කීහ: "ඇවැත්නි, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙහි අසන ලදී, හමුවෙහි පිළිගන්නා ලදී." "මහණෙනි, යමෙක් දුක දකී ද, හේ දුක්හෙතුවත් දකී. දුක් නැවැත්මත් දකී. දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතත් දකී. යමෙක් දුක්හෙතුව දකී ද, හේ දුකත් දකී. දුක් නැවැත්මත් දකී. දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතත් දකී. යමෙක් දුක් නැවැත්ම දකී ද, හේ දුකත් දකී. දුක් හෙතුවත් දකී. දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතත් දකී. යමෙක් දුක් නැවැත්මට පමුණුවන පිළිවෙත දකී ද, හේ දුකත් දකී. දුක්හෙතුවත් දකී. දුක් නැවැත්මත් දකී" යි.

### තෙවෙනි කොටිගාමවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

කොටිගාම සූත්‍ර දෙකෙකි. අභිසම්බුද්ධ, අරහන්ත, ආසවක්ඛය, මිත්ත යී සතරෙකි. තව ද තථ ලොක පරිච්ඡෙදයා ගවම්පති යී සතරෙක් ද යි මුළුල්ල දශයෙකි යි.

# 4. සිංසපාවනවග්ගො

## 12. 4. 1

## සිංසපාසුත්තං

3873. එකං සමයං භගවා කොසම්බියං විහරති සිංසපාවනෙ[1]. අථ ඛො භගවා පරිත්තානි සිංසපාපණ්ණානි පාණිනා ගහෙත්වා භික්ඛූ ආමන්තෙසි: "තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං යානි[2] වා මයා පරිත්තානි සිංසපාපණ්ණානි පාණිනා ගහිතානි යානි උපරි සිංසපායෙ"ති[3]? අප්පමත්තකානි භන්තෙ, භගවතා පරිත්තානි සිංසපාපණ්ණානි පාණිනා ගහිතානි, අථ ඛො එතානෙව බහුතරානි යදිදං උපරි සිංසපායන්ති[3] එවමෙව ඛො භික්ඛවෙ, එතදෙව බහුතරං යං වො මයා අභිඤ්ඤාය අනක්ඛාතං. අප්පමත්තකං අක්ඛාතං. කස්මා චෙතං භික්ඛවෙ, මයා අනක්ඛාතං? න හෙතං භික්ඛවෙ, අත්ථසංහිතං නාදිබ්‍රහ්මචරියකං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය නාභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, තස්මා තං මයා අනක්ඛාතං.

කිඤ්ච භික්ඛවෙ, මයා අක්ඛාතං: ඉදං දුක්ඛන්ති භික්ඛවෙ, මයා අක්ඛාතං, අයං දුක්ඛසමුදයොති මයා අක්ඛාතං, "අයං දුක්ඛනිරොධො"ති මයා අක්ඛාතං, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති මයා අක්ඛාතං. කස්මා චෙතං භික්ඛවෙ මයා අක්ඛාතං? එතං හි භික්ඛවෙ, අත්ථසංහිතං, එතං ආදිබ්‍රහ්මචරියකං, එතං නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, තස්මා තං මයා අක්ඛාතං. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති" යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

## 12. 4. 2

## ඛදිරසුත්තං

3874. යො භික්ඛවෙ, එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච, දුක්ඛසමුදයං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච, දුක්ඛනිරොධං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච, දුක්ඛනිරොධගාමිනී-පටිපදං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමීති" නෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ, යො එවං වදෙය්‍ය: "අහං ඛදිරපත්තානං[4] වා සලලපත්තානං[5] වා ආමලකපත්තානං වා පුටං[6] කරිත්වා උදකං වා තාලපත්තං[7] වා හරිස්සාමී"ති[8], නෙතං ඨානං විජ්ජති. එවමෙව ඛො භික්ඛවෙ, යො එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච -පෙ- දුක්ඛනිරොධගාමිනිපටිපදං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමී"ති. නෙතං ඨානං විජ්ජති.

---

1. සීසපාවනෙ - මජ්ඣං, සයා.
2. යදිදං - මජ්ඣං, සයා.
3. සිංසපාවනෙ - මජ්ඣං, අට්ඨකථා.
4. අයං දරිපත්තානං - සී 1, 2.
5. පලාසපත්තානං - සී 1, 2, සරල පත්තානං - මජ්ඣං.
6. කුටං - සීමු, කුටිං - සී. 1,2.
7. තාලපත්තං - සබ්බත්ථ.
8. ආසාරිස්සාමීති - මජ්ඣං

# 4. සිංසපාවන වර්ගය

## 12. 4. 1

## සිංසපා සූත්‍රය

3873. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර සම්පයෙහි ඇටවෙරිය වෙනෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඇටවෙරිය පත් මදක් අතින් ගෙන භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, ඒ කිමැයි හඟිවූ ද? මා විසින් යම් ඇටවෙරිය පත් මදක් අතින් ගන්නා ලදද, ඇටවෙරිය රුක් මතුයෙහි යම් පතුත් වේ ද, (මෙයින්) කිමෙක් ඉතා වැඩි ද යි? වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අතින් ගන්නා ලද මඳ ඇටවෙරියපත් ඉතා මඳ ය. යලි ඇටවෙරිය රුක්මතුයෙහි යම් මේ පත් වේ නම් ඕහු ම ඉතා බොහෝහ''යි මහණෙනි, එසෙයින් ම මා විසින් යමක් වෙසෙයින් දැන නොකියන ලද නම් මෙය ම ඉතා බොහෝ ය. කියන ලද්ද ඉතා මඳ ය. මහණෙනි, කුමක් හෙයින් මා විසින් මෙය නො කියන ලද ද යත්: මහණෙනි, මෙය වැඩ සහිත නො වේ. මහබඹසරට මුල් වූයේ නො වේ. නිර්වේදය පිණිස නො පවතී. විරාගය පිණිස නො පවතී. නිරොධය පිණිස නො පවතී. ව්‍යුපශමය පිණිස නො පවතී. අභිඥානය පිණිස නො පවතී. සම්බොධිය පිණිස නො පවතී. නිර්වාණය පිණිස නො පවතී. එහෙයින් මා විසින් එය නො කියන ලදී.

මහණෙනි, කිමෙක් මා විසින් කියන ලද ද යත්: මහණෙනි, මේ දුකැ යි මා විසින් කියන ලදී. මේ දුක් හටගැනුමැ යි මා විසින් කියන ලදී. මේ දුක් වැළැක්මැ යි මා විසින් කියන ලදී. මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි මා විසින් කියන ලදී. මහණෙනි, කුමක් හෙයින් මා විසින් මේ කියන ලද ද යත්: මහණෙනි, මෙය වැඩ සහිත ය. මෙය මහ බඹසරට මුල් ය. මෙය නිර්වේදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥානය සම්බොධිය නිර්වාණය පිණිස පවතී. එහෙයින් එය මා විසින් කියන ලදී. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ දුකැ යි වීර්‍ය්‍ය කටයුතු ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 4. 2

## ඛදිර සූත්‍රය

3874. මහණෙනි, යමෙක් ''මම දුඃඛාර්‍ය්‍යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි'' යි මෙසේ කියන්නේ ය යන මෙ කරුණ නැත. මහණෙනි, යම්සේ යමෙක් ''මම කිහිරිපතින් හෝ හොරපතින් හෝ ඇඹුල්පතින් හෝ ගොටුවක් කොට දිය හෝ තල්පතක් හෝ ගෙන යන්නෙමි'' යි මෙසේ කියන්නේ ය යන මේ කරුණ නැත් ද, මහණෙනි, එසෙයින් ම යමෙක් ''මම දුඃඛාර්‍ය්‍යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි'' යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත.

යො ච ඛො භික්ඛවෙ, එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච -පෙ- දුක්ඛනිරොධගාමිනිපටිපදං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමී''ති. ඨානමෙතං විජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ, යො එවං වදෙය්‍ය "අහං පදුමපත්තානං වා පලාසපත්තානං වා මාලුවාපත්තානං වා පුටං[1] කරිත්වා උදකං වා තාලපත්තං[2] වා හරිස්සාමී''ති.[3] ඨානමෙතං විජ්ජති, එවමෙව ඛො භික්ඛවෙ, යො එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමී''ති ඨානමෙතං විජ්ජති. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති'' යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යොගො කරණීයො''ති.

## 12. 4. 3

### දණ්ඩසුත්තං

3875. සෙය්‍යථාපි භික්ඛවෙ, දණ්ඩො උපරි වෙහාසං ඛිත්තො සකිම්පි මූලෙන නිපතති, සකිම්පි මජ්ඣෙන නිපතති, සකිම්පි අග්ගෙන නිපතති. එවමෙව ඛො භික්ඛවෙ, අවිජ්ජානීවරණා සත්තා තණ්හාසංයොජනා සන්ධාවන්තා සංසරන්තා සකිම්පි අස්මා ලොකා පරං ලොකං ගච්ඡන්ති, සකිම්පි පරස්මා ලොකා ඉමං ලොකං ආගච්ඡන්ති. තං කිස්ස හෙතු? අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති'' යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදනි'' යොගො කරණීයොති.

## 12. 4. 4

### චෙලසුත්තං

3876. ආදිත්තෙ භික්ඛවෙ, චෙලෙ වා සීසෙ වා කිමස්ස කරණීයන්ති? ආදිත්තෙ ච පන භන්තෙ, චෙලෙ වා සීසෙ වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයන්ති. ආදිත්තං භික්ඛවෙ, චෙලං වා සීසං වා අජ්ඣුපෙක්ඛිත්වා[4] අමනසිකරිත්වා අනභිසමෙතානං චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනිපටිපදය අරියසච්චස්ස, තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති'' යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී-පටිපද''ති යොගො කරණීයොති.

---

1. කූටං - සිමු, කූටිං - සී 1, 2.
2. තාලපත්තං - සබ්බත්ථ.
3. ආහාරිස්සාමීති - මජසං.
4. අනජ්ඣුපෙක්ඛිත්වා - සිමු, සී 1,2.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යමෙකුත් "මම දුඃඛාර්‍යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි" යි මෙසේ කියන්නේ-ය යන මෙ කරුණ ඇත. මහණෙනි, යම්සේ යමෙක් "මම පියුම්පතින් හෝ කැලපතින් හෝ මාලුවාපතින් හෝ ගොටුවක් කොට දිය හෝ තල්පතක් හෝ ගෙන යන්නෙමි" යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ ඇත් ද, මහණෙනි එසෙයින්ම යමෙක් "මම දුඃඛාර්‍යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි" යි මෙසේ කියන්නේ ය යන මෙ-කරුණ ඇත. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ" යි වීර්‍ය කටයුතු ... "මේ දුක් ගෙවීමට පමුණුවන පිළිවෙතැ" යි වීර්‍ය කටයුතු යි.

## 12. 4. 3

## දණ්ඩ සූත්‍රය

3875. මහණෙනි, යම්සේ දණ්ඩෙක් අහසෙහි දමන ලද්දේ වරෙකත් මුලින් වැටේ ද, වරෙකත් මැදින් වැටේ ද, වරෙකත් අගින් වැටේ ද, මහණෙනි, එසෙයින් ම අවිද්‍යාව නීවරණ කොට ඇති තෘෂ්ණාව සංයොජන කොට ඇති සත්ත්වයෝ දිවෙන්නාහු සැරිසරන්නාහු වරෙකත් මෙලොවින් පරලොවට යෙත්. වරෙකත් පරලොවින් මෙලොවට එත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, චතුරාර්‍ය-සත්‍ය නුදුටු බැවිනි. කවර චතුරාර්‍යසත්‍යයෙක යත්: "දුඃඛාර්‍ය-සත්‍ය ය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍ය යි" මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුක්ඛ" යි වීර්‍ය කටයුතු. "මේ දුක්ඛනිරොධගාමිනී පටිපද" යි වීර්‍ය කටයුතු යි.

## 12. 4. 4

## චෙල සූත්‍රය

3876. මහණෙනි, "වස්ත්‍රය හෝ හිස හෝ ඇවිලගත් කල්හි ඔහු විසින් කිමෙක් කටයුතු ද?" යි වහන්ස, වස්ත්‍රය හෝ හිස හෝ ඇවිලගත් කල්හි ඒ වස්ත්‍රය ම හෝ හිස ම හෝ නිවීම පිණිස අධිමාත්‍රඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් අධික උත්සාහයත් තෘප්ති රහිත බවත් සිහියත් මනා දැනුමත් කටයුතු යි. මහණෙනි, ඇවිලගත් වස්ත්‍රය හෝ හිස හෝ නොසලකා නො මෙනෙහි කොට අවබොධ නො කළ චතුරාර්‍යසත්‍යය තතුසේ අවබොධ කරනු පිණිස අධිමාත්‍රඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් අධික උත්සාහයත් තෘප්ති රහිත බවත් සිහියත් මනා දැනුමත් කටයුතු. කවර චතුරාර්‍යසත්‍යයක යත්: දුඃඛාර්‍යසත්‍ය ය ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය-සත්‍ය යි. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුඃඛ" යි වීර්‍ය කටයුතු ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද" යි වීර්‍ය-කටයුතු යි.

## 12. 4. 5

### සත්තිසතසුත්තං

3877. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො වස්සසතායුකො වස්සසතජීවී තමෙනං එවං වදෙය්‍යුං[1] "එහම්භො[2] පුරිස පුබ්බණ්හසමයං තං සත්තිසතෙන හනිස්සන්ති, මජ්ඣන්හිකං සමයං සත්තිසතෙන[3] හනිස්සන්ති, සායන්හසමයං සත්තිසතෙන හනිස්සන්ති, සො ඛො ත්වං අම්භො පුරිස, දිවසෙ දිවසෙ තීහි තීහි සත්තිසතෙහි හඤ්ඤමානො වස්සසතායුකො වස්සසතජීවී වස්සසතස්ස අච්චයෙන අනභිසමෙතානි චත්තාරි අරියසච්චානි අභිසමෙස්සසීති[4]. අත්ථවසිකෙන භික්ඛවෙ, කුලපුත්තෙන අලං උපගන්තුං. තං කිස්ස හෙතු: අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො, පුබ්බා කොටි න පඤ්ඤායති සත්තිප්පහාරානං අසිප්පහාරානං[5] එවඤ්චෙ තං භික්ඛවෙ, අස්ස. න ඛො පනාහං භික්ඛවෙ, සහදුක්ඛෙන සහදොමනස්සෙන චතුන්නං අරියසච්චානං අභිසමයං වදාමි. අපි චාහං භික්ඛවෙ, සහ[6]සුඛෙන සහ[6]සොමනස්සෙන චතුන්නං අරියසච්චානං අභිසමයං වදාමි. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනිපටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති" යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

## 12. 4. 6

### පාණසුත්තං

3878. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො යං ඉමස්මිං ජම්බුදීපෙ තිණකට්ඨසාඛාපලාසං තච්ඡෙත්වා එකජ්ඣං සංහරෙය්‍ය, එකජ්ඣං සංහරිත්වා සූලං කරෙය්‍ය, සූලං කත්වා යෙ මහාසමුද්දෙ මහන්තකා පාණා තෙ මහන්තකෙසු සූලෙසු ආවුණෙය්‍ය[7], යෙ මහාසමුද්දෙ මජ්ඣිමකා පාණා තෙ මජ්ඣිමකෙසු සූලෙසු ආවුණෙය්‍ය, යෙ මහාසමුද්දෙ සුඛුමකා පාණා තෙ සුඛුමකෙසු සූලෙසු ආවුණෙය්‍ය.[7] අපරියාදින්නා ච භික්ඛවෙ, මහාසමුද්දෙ ඔළාරිකා පාණා අස්සු. අථ ඉමස්මිං ජම්බුදීපෙ තිණකට්ඨසාඛාපලාසං පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. අතො[8] බහුතරා ඛො භික්ඛවෙ, මහාසමුද්දෙ සුඛුමකා පාණා, යෙ න සුකරා සූලෙසු ආවුණිතුං. තං කිස්ස හෙතු: සුඛුමත්තා භික්ඛවෙ, අත්තභාවස්ස. එවං මහා ඛො භික්ඛවෙ, අපායො. එවං මහන්තස්මා ඛො භික්ඛවෙ, අපායම්හා පරිමුත්තො දිට්ඨිසම්පන්නො පුග්ගලො යො "ඉදං දුක්ඛන්ති" යථාභූතං පජානාති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති" යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

1. වදෙය්‍ය - මජසං, ස්‍යා.
2. එවම්භො - සී 1, 2.
3. සත්තිසතෙහි - සීමු, සී 1, 2.
4. අභිසමෙස්සතීති - මජසං, සී 1, 2.
5. අසිප්පහාරානං උසුප්පහාරානං ඵරසුප්පහාරානං - ස්‍යා.
6. සහාව - මජසං, ස්‍යා.
7. ආවිණෙය්‍ය - සී 1, 2.
8. ඉතො - මජසං, තතො - සී 1.

## 12. 4. 5

## සත්තිසත සූත්‍රය

3877. මහණෙනි, යම්සේ වස් සියයක් ආයු ඇති වස් සියයක් ජීවත්වනසුලු පුරුෂයෙක් වේ ද, තෙල මොහුට මෙසේ කියන්නාහු ය: "එම්බා පුරුෂය, එව. පෙරවරු තා සැත් සියයෙකින් පෙළන්නාහ. මද්දහන සැත් සියයෙකින් පෙළන්නාහ. පස්වරු සැත් සියයෙකින් පෙළන්නාහ. එම්බා පුරුෂය, ඒ තෝ දවස් පතා තුන් තුන් සැත් සියයෙන් පෙළනු ලබන්නේ වස් සියයක් ආයු ඇත්තේ වස් සියයක් ජීවත්වනසුලු වූයේ වස් සියය ඇවෑමෙන් අවබොධ නො කළ චතුරාර්‍යසත්‍යය අවබොධ කරන්නෙහි" යි. මහණෙනි, අනුසස් දක්නා කුලපුත්‍ර විසින් එළඹෙන්නට සුදුසු යි. ඒ කවර හෙයින යත්: "මහණෙනි, මෙසසර නොදත් අග්මුල් ඇත්තේ ය. සැත්පහර කඩුපහර පිළිබඳ පෙරපසු කෙළවරෙක් නො පෙනේ. මහණෙනි, මෙය මෙසේත් වන්නේ ය: "මහණෙනි, මම සදුක් ව සදොම්නස් ව සිවුඅරිසස් අවබොධයක් නො ම කියමි. මහණෙනි, වැලිදු මම සුව සහිත ව සොම්නස් සහිත ව සිවුඅරිසස් අවබොධ කිරීම කියමි. කවර සිවුසස් ද යත්: "දුඃඛාර්‍යසත්‍ය ය ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍ය" යි. මහණෙනි, එහෙයින් මෙහිලා "මේ දුක්ඛ" යි වීර්‍ය කටයුතු... "මේ දුක්ඛනිරොධගාමිනීපටිපදාරියසච්ච" යි වීර්‍ය කටයුතු යි.

## 12. 4. 6

## පාණ සූත්‍රය

3878. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මේ දඹදිව තණ දැව අතුපත් සැස එක් කොට රැස් කරන්නේ ය. එක් කොට රැස් කර හුල් කරන්නේ ය. හුල් කොට මහමුහුදෙහි යම් ප්‍රාණීහු වෙත් නම් ඔවුන් මහත් හුල්හි අමුණන්නේ ය. මහමුහුදෙහි යම් මැදුම් පමණ ප්‍රාණීහු වෙත් නම් ඔවුන් මැදුම් පමණ හුල්හි අමුණන්නේ ය. මහමුහුදෙහි යම් සියුම් ප්‍රාණීහු වෙත් නම් ඔවුන් සියුම් හුල්හි අමුණන්නේ ය යන යමෙක් වේ ද, මහණෙනි, (එහිලා) මහමුහුදෙහි ඖදරික ප්‍රාණීහු නො ගන්නා ලද්දෝ වන්නාහ. වැලි මේ දඹදිව තණ දැව අතුපත් ක්ෂයවීමට අවසන් වීමට යන්නේ ය. යම් කෙනෙක් හුල්හි අමුණන්නට සුකර නො වෙත් නම් මහමුහුදෙහි එබඳු සියුම් ප්‍රාණීහු එයට වඩා ඉතා බොහෝ වෙත්. ඒ කවර හෙයින යත්: "මහණෙනි, අත්බැව සියුම් බැවිනි." මහණෙනි, අපාය මෙසේ මහත් ය. මහණෙනි, මෙසේ මහත් අපායෙන් යමෙක් "මේ දුකැ" යි තතුසේ දනී නම් ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ" යි තතුසේ දනී නම් එබඳු දිටුසපත් පුඟුල් තෙමේ මිදුණේ ය. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුඃඛ" යි වීර්‍ය කටයුතු ... "මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපද" යි වීර්‍ය කටයුතු යි.

## 12. 4. 7

## සූරියූපමසුත්තං

3879. සුරියස්ස[1] භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං සම්මාදිට්ඨි. සම්මාදිට්ඨිකස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං ‘‘ඉදං දුක්ඛන්ති යථාභූතං පජානිස්සති –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානිස්සති’’. තස්මාතිහ භික්ඛවෙ, ‘‘ඉදං දුක්ඛ’’න්ති යොගො කරණීයො –පෙ– ‘‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’’ති යොගො කරණීයොති.

## 12. 4. 8

## දුතිය සූරියූපමසුත්තං

3880. යාවකීවඤ්ච මෙ භික්ඛවෙ, චන්දිමසූරියා ලොකෙ නුප්පජ්ජන්ති, නෙව තාව මහතො ආලොකස්ස පාතුභාවො හොති මහතො ඔභාසස්ස. අන්ධන්තමං[2] තදා හොති අන්ධකාරතිමිසා. නෙව තාව රත්තින්දිවා පඤ්ඤායන්ති. න මාසද්ධමාසා පඤ්ඤායන්ති. න උතුසංවච්ඡරා පඤ්ඤායන්ති. යතො ච ඛො භික්ඛවෙ චන්දිමසූරියා ලොකෙ උප්පජ්ජන්ති, අථ මහතො ආලොකස්ස පාතුභාවො හොති, මහතො ඔභාසස්ස. නෙව[3] අන්ධන්තමං තදා හොති, න අන්ධකාරතිමිසා. අථ රත්තින්දිවා පඤ්ඤායන්ති. මාසද්ධමාසා පඤ්ඤායන්ති. උතුසංවච්ඡරා පඤ්ඤායන්ති.

එවමෙව ඛො භික්ඛවෙ, යාවකීවඤ්ච තථාගතො ලොකෙ නුප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො, නෙව තාව මහතො ආලොකස්ස පාතුභාවො හොති මහතො ඔභාසස්ස. අන්ධන්තමං තදා හොති. අන්ධකාරතිමිසා. නෙව තාව චතුන්නං අරියසච්චානං ආචික්ඛනා හොති දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. යතො ච ඛො භික්ඛවෙ, තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො. අථ මහතො ආලොකස්ස පාතුභාවො හොති මහතො ඔභාසස්ස. නෙව අන්ධන්තමං තදා හොති. න අන්ධකාරතිමිසා. අථ චතුන්නං අරියසච්චානං ආචික්ඛනා හොති දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස –පෙ– දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ ‘‘ඉදං දුක්ඛ’’න්ති යොගො කරණීයො –පෙ– ‘‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’’ති යොගො කරණීයොති.

---

1. සූරියස්ස – මජසං.
2. අන්ධතමං – මජසං, සයා.
3. න – සීමු, සී. 1,2.

## 12. 4. 7

## සුරියූපම සූත්‍රය

3879. මහණෙනි, යම් මේ අරුණෝදයයෙක් වේ නම් උදා වන හිරුට මෙය පෙරටු ය. මෙය පෙර නිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් මේ සම්දිට්ඨියෙක් වේ නම් මහණහට සිවුඅරිසස් තතුසේ නුවණින් පිළිවිදිනු පිණිස මෙය පෙරටු ය, මෙය පෙර නිමිත්ත ය. මහණෙනි සම්දිටු ගත් මහණහු විසින් "මේ දුකැ"යි තතුසේ දැනගන්නේ ය ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ" යි තතුසේ දැනගන්නේ ය" යන මෙය කැමති විය යුතු යි. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුඃඛ" යී වීයඕ කටයුතු ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද" යී වීයඕ කටයුතු යි.

## 12. 4. 8

## දුතිය සුරියූපම සූත්‍රය

3880. මහණෙනි, යම් තාක් මේ සඳහිරුහු ලොව නූපදිද්ද, ඒ තාක් මහත් එළිය මහත් බැබළීම පහළවීමෙක් නො ම වේ. එකල්හි ගනඳුර, බලවත් කළුවර වෙයි. ඒ තාක් රෑදවල් නො ම පෙනේ. මස් අඩමස් නො ම පෙනේ. සෘතුසංවත්සර නො ම පෙනේ. මහණෙනි, යම් කලෙක සඳහිරුහු ලොව උපදිද්ද එකල්හි මහත් එළිය මහත් බැබළීම පහළවීම වේ. එකල්හි ගනඳුර නො ම වේ. බලවත් කළුවර නො ම වේ. එකල්හි රෑදවල් පෙනේ. මස් අඩමස් පෙනේ. සෘතුසංවත්සර පෙනේ.

මහණෙනි, එසෙයින් ම අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයෝ යම් තාක් ලොව නූපදීත් ද, ඒ තාක් මහත් එළිය මහත් බැබළීම පහළවීමෙක් නො වේ. එකල්හි ගනඳුර, බලවත් කළුවර වේ. ඒ තාක් චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කිරීමෙක් දෙශනා කිරීමෙක් පැනවීමෙක් පිහිටුවීමෙක් විවර කිරීමෙක් බෙදීමෙක් උඩුහුරු කිරීමෙක් නො ම වේ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයෝ යම් කලෙක ලොව උපදිත් ද, එකල මහත් එළිය මහත් බැබළීම පහළවීම වේ. එකල ගනඳුර නොම වේ. බලවත් කළුවර නො ම වේ. එකල චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කිරීම දෙශනා කිරීම පැනවීම පිහිටුවීම විවර කිරීම බෙදීම උඩුහුරු කිරීම වේ. කවර චතුරාර්‍ය්‍යසත්‍යය යත්: දුඃඛාර්‍ය්‍ය සත්‍ය ය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යි. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුඃඛ" යි වීයඕ කටයුතු ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද" යී වීයඕ කටයුතු යි.

## 12. 4. 9

## ඉන්දඛීලසුත්තං

3881. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ''ඉදං දුක්ඛ''න්ති යථාභූතං නප්පජානන්ති -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යථාභූතං නප්පජානන්ති. තෙ අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා මුඛං ඔලොකෙන්ති[1] ''අයං නූන භවං ජානං ජානාති පස්සං පස්සතී''ති. සෙය්‍යථාපි භික්ඛවෙ, තූලපිචු වා කප්පාසපිචු වා ලහුකො වාතුපාදානො සමෙ භූමිභාගෙ නික්ඛිත්තො, තමෙනං පුරත්ථිමො වාතො පච්ඡිමෙන සංහරෙය්‍ය, පච්ඡිමො වාතො පුරත්ථිමෙන සංහරෙය්‍ය, උත්තරො වාතො දක්ඛිණෙන සංහරෙය්‍ය, දක්ඛිණො වාතො උත්තරෙන සංහරෙය්‍ය. තං කිස්ස හෙතු: ලහුකත්තා භික්ඛවෙ, කප්පාසපිචුනො. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි[2] සමණා වා බ්‍රාහ්මණා වා ''ඉදං දුක්ඛ''න්ති යථාභූතං නප්පජානන්ති -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යථාභූතං නප්පජානන්ති. තෙ අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා මුඛං ඔලොකෙන්ති ''අයං නූන භවං ජානං ජානාති පස්සං පස්සතී''ති, තං කිස්ස හෙතු? අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ''ඉදං දුක්ඛ''න්ති යථාභූතං පජානන්ති -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යථාභූතං පජානන්ති, තෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා මුඛං ඔලොකෙන්ති ''අයං නූන භවං ජානං ජානාති පස්සං පස්සතී''ති. සෙය්‍යථාපි භික්ඛවෙ, අයොඛීලො වා ඉන්දඛීලො වා ගම්භීරනෙමො සුනිඛාතො අචලො අසම්පකම්පී. පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි, නෙව නං සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පචාලෙය්‍ය. පච්ඡිමාය චෙපි දිසාය -පෙ- උත්තරාය චෙපි දිසාය -පෙ- දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි, නෙව නං සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පචාලෙය්‍ය. තං කිස්ස හෙතු? ගම්භීරත්තා භික්ඛවෙ, නෙමස්ස, සුනිඛාතත්තා ඉන්දඛීලස්ස. එවමෙව ඛො භික්ඛවෙ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ''ඉදං දුක්ඛ''න්ති යථාභූතං පජානන්ති -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යථාභූතං පජානන්ති. තෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා මුඛං ඔලොකෙන්ති ''අයං නූන භවං ජානං ජානාති පස්සං පස්සතී''ති. තං කිස්ස හෙතු? සුදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, ''ඉදං දුක්ඛ''න්ති යොගො කරණීයො -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යොගො කරණීයොති.

---

1. උල්ලොකෙන්ති - මජසං, සී 1, 2.
2. යෙ හි කෙචි - සයා.

# 12. 4. 9

## ඉන්දඛීල සූත්‍රය

3881. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ" යි තතුසේ නො දනිද්ද ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ" යි තතුසේ නො දනිද්ද, ඔහු "මේ භවත් තෙමේ ඒකාන්තයෙන් දන්නේ දනී, දක්නේ දකී" යි අන් මහණකුගේ හෝ බමුණකුගේ හෝ අදහස බලත්. මහණෙනි, යම්සේ සැහැල්ලු වූ වාගන්නා කිඹුල්පුලුන හෝ කපුපුලුන හෝ සම බිමක තබන ලද්දේ වේ ද, ඒ මෙය පෙරදිගින් හමන වාතය පැළදිගට ගෙනයන්නේ ය. පැළදිගින් හමන වාතය පෙරදිගට ගෙනයන්නේ ය. උතුරුදිගින් හමන වාතය දකුණුදිගට ගෙනයන්නේ ය. දකුණුදිගින් හමන වාතය උතුරුදිගට ගෙනයන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, කපුපුලුන සැහැල්ලු බැවිනි. මහණෙනි, එසෙයින් ම යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ" යි තතුසේ නො දනිද්ද ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ නො දනිද්ද, ඔහු "මේ භවත් තෙමේ ඒකාන්තයෙන් දන්නේ දනී, දක්නේ දකී"යි අන්මහණකුගේ හෝ බමුණකුගේ හෝ අදහස බලත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිවුඅරිසස් නුදුටු බැවිනි.

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ දුකැ යි තතුසේ දනිද්ද ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි තතුසේ දනිද්ද, ඔහු "මේ භවත් තෙමේ ඒකාන්තයෙන් දන්නේ දනී. දක්නේ දකී" යි අන් මහණකුගේ හෝ බමුණකුගේ හෝ අදහස නො බලත්. මහණෙනි, යම්සේ ගැඹුරු බිමට පිවිසි නිමාව ඇති මැනවින් සිටුවන ලද නිසල වූ නො සැලෙනසුලු යහුලෙක් හෝ හිම් කණුවෙක් හෝ වේ ද, ඉදිනුදු පෙරදිගින් බලවත් කුණාටුවෙක් එන්නේ නම් එය නො ම සල්වන්නේ ය. වෙවුලුවන්නේ ය. ඉදිනුදු පැළ දිගින් ... ඉදිනුදු උතුරු දිගින් ... ඉදිනුදු දකුණුදිගින් බලවත් කුණාටුවෙක් එන්නේ නම් එය නො ම සල්වන්නේ ය. වෙසෙසින් නො ම සල්වන්නේය. නො ම වෙවුලුවන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මුල ගැඹුරු බැවිනි, හිම්කණුව මැනවින් සිටුවන ලද බැවිනි. මහණෙනි, එසෙයින් ම යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ"යි තතුසේ දනිද්ද, ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ දනිද්ද, ඔහු "මේ භවත් තෙමේ ඒකාන්තයෙන් දන්නේ දනී. දක්නේ දකී" යි අන් මහණකුගේ හෝ බමුණකුගේ හෝ අදහස නො බලත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිවුඅරිසස් මැනවින් දුටු බැවිනි. කවර සිවුඅරිසස් ද යත්: "දුඃඛාර්‍ය්‍යසත්‍ය ය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍ය යි". මහණෙනි, එහෙයින් මෙහි ලා මේ දුඃඛ යි වීර්‍ය්‍ය කටයුතු ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද" යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 4. 10

### වාදසුත්තං

3882. යො හි කොචි භික්ඛවෙ, භික්ඛු "ඉදං දුක්ඛ"න්ති යථාභූතං පජානාති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපද"ති යථාභූතං පජානාති. පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය සමණො වා බ්‍රාහ්මණො වා වාදත්ථිකො වාදගවෙසී වාදමස්ස ආරොපෙස්සාමීති. "තං වත සහධම්මෙන සඞ්කම්පෙස්සති වා සම්පකම්පෙස්සති වා සම්පචාලෙස්සති වා"ති නෙතං ඨානං විජ්ජති. පච්ඡිමාය චෙපි දිසාය -පෙ- උත්තරාය චෙපි දිසාය -පෙ- දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය සමණො වා බ්‍රාහ්මණො වා වාදත්ථිකො වාදගවෙසී වාදමස්ස ආරොපෙස්සාමීති, "තං වත සහධම්මෙන සඞ්කම්පෙස්සති වා සම්පකම්පෙස්සති වා සම්පචාලෙස්සති වා"ති නෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ, සිලා යූපො සොළස කුක්කුකො තස්ස අස්සු අට්ඨ කුක්කු හෙට්ඨානෙමඞ්ගමා අට්ඨ කුක්කු උපරිනෙමස්ස. පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි නෙව තං සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පචාලෙය්‍ය. පච්ඡිමාය චෙපි දිසාය -පෙ- උත්තරාය චෙපි දිසාය -පෙ- දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි නෙව තං සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පචාලෙය්‍ය. තං කිස්ස හෙතු? ගම්භීරත්තා භික්ඛවෙ, නෙමස්ස, සුනිඛාතත්තා සිලායූපස්ස.

එවමෙව ඛො භික්ඛවෙ, යො හි කොචි භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති, පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය සමණො වා බ්‍රාහ්මණො වා වාදත්ථිකො වාදගවෙසී වාදමස්ස ආරොපෙස්සාමීති. තං වත සහධම්මෙන සංකම්පෙස්සති වා සම්පකම්පෙස්සති වා සම්පචාලෙස්සති වාති නෙතං ඨානං විජ්ජති. පච්ඡිමාය චෙපි දිසාය -පෙ- උත්තරාය චෙපි දිසාය -පෙ- දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය සමණො වා බ්‍රාහ්මණො වා වාදත්ථිකො වාදගවෙසී වාදමස්ස ආරොපෙස්සාමීති. තං වත සහධම්මෙන සංකම්පෙස්සති වා සම්පකම්පෙස්සති වා සම්පචාලෙස්සති වාති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු? සුදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපද"ති යොගො කරණීයොති.

**සිංසපාවනවග්ගො චතුත්ථො.**

තත්‍රුද්දානං:

සිංසපා ඛදිරො දණ්ඩො චෙලො සත්තිසතෙන ච,
පාණො ද්වෙ සුරියූපමා ඉන්දඛීලො වාදෙන චාති.

## 12. 4. 10

## වාද සූත්‍රය

3882. මහණෙනි, යම් කිසි මහණෙක් ''මේ දුකැ''යි තතුසේ දනී ද ... ''මේ දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතැ''යි තතුසේ දනී ද ඉදිනුදු දෙස් කැමති දොස් සොයනසුලු මහණෙක් හෝ බමුණෙක් හෝ ''මොහුට දොස් නගන්නෙමි''යි පෙරදිගින් එන්නේ නම් කරුණු සහිත ව එකාන්තයෙන් ''ඔහු සල්වන්නේ යී හෝ මැනවින් සල්වන්නේ යී හෝ වෙවුළුවන්නේ යී හෝ'' ''මෙ කරුණ නැත. ඉදිනුදු පැළදිගින් ... ඉදිනුදු උතුරුදිගින් ... ඉදනුදු දොස් කැමති දොස් සොයන මහණෙක් හෝ බමුණෙක් හෝ ''මොහුට දොස් නගන්නෙමි''යි දකුණුදිගින් එන්නේ නම් කරුණු සහිතව එකාන්තයෙන් ''ඔහු සල්වන්නේ යී හෝ වෙසෙසින් සල්වන්නේ යී හෝ වෙවුළුවන්නේ යී හෝ'' යි මෙ කරුණ නැත. මහණෙනි, යම්සේ සොළොස්හත් ගල්ටැඹෙක් වේ ද එහි අටහතෙක් වළ යටට ගියේ ය. අටහතෙක් වළ මතුයෙහි සිටියේ ය. ඉදිනුදු පෙරදිගින් බලවත් කුණාටුවෙක් එන්නේ නම් එය නො ම සල්වන්නේ ය. වෙසෙසින් නො ම සල්වන්නේ ය. නො ම වෙවුළුවන්නේ ය. ඉදිනුදු පැළදිගින් ... ඉදිනුදු උතුරුදිගින් ... ඉදිනුදු දකුණුදිගින් දැඩි සුළඟෙක් එන්නේ නම් එය නො ම සල්වන්නේ ය. නො ම වෙසෙසින් සල්වන්නේ ය නො ම වෙවුළුවන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මුල ගැඹුරු බැවිනි ගල්ටැඹ මැනවින් සිටුවන ලද බැවිනි.

මහණෙනි, එසෙයින් ම යම් කිසි මහණෙක් ''මේ දුකැ''යි තතුසේ දනී ද ... ''මේ දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතැ''යි තතුසේ දනී ද, ඉදිනුදු දෙස් කැමති දෙස් සොයන මහණෙක් හෝ බමුණෙක් හෝ ''මොහුට දෙස් නගන්නෙමි'' යි පෙරදිගින් එන්නේ නම් කරුණු සහිත ව එකාන්තයෙන් ''ඔහු සල්වන්නේ යී හෝ වෙසෙසින් සල්වන්නේ යී හෝ වෙවුළුවන්නේ යී හෝ'' යී මෙකරුණ නැත. ඉදිනුදු පැළදිගින් ... ඉදිනුදු උතුරුදිගින් ... ඉදිනුදු දෙස් කැමති දෙස් සොයන මහණෙක් හෝ බමුණෙක් හෝ ''මොහුට දෙස් නගන්නෙමි''යි දකුණු දිගින් එන්නේ නම් කරුණු සහිත ව එකාන්තයෙන් ''ඔහු සල්වන්නේ යී හෝ වෙසෙසින් සල්වන්නේ යී හෝ වෙවුළුවන්නේ යී හෝ''යි මෙකරුණ නැත. ඒ කවර හෙයින යත්: මහණෙනි, චතුරාර්‍ය්‍ය-සත්‍ය ය මැනවින් දුටුබැවිනි. කවර චතුරාර්‍ය්‍යසත්‍ය යත්: ''දුඃඛාර්‍ය්‍ය-සත්‍ය ය... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යි''. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුඃඛ'' යි වීර්‍ය්‍ය කටයුතු ... ''මේ දුඃඛනිරොධ-ගාමිනී පටිපදා''යි වීර්‍ය්‍ය කටයුතු යි.

## සිවුවැනි සිංසපාවනවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

සිංසපා ඛදිර දණ්ඩ, චෙල, සත්තිසත පාණ යී සයෙක් ද සුරියොපම සූතුරු දෙකෙක් ද ඉන්ද්‍රඛීල වාද යී දෙකෙක් ද යී මුළුල්ල දශයෙකි යි.



Free Distribution www.aathaapi.org

# 5. පපාත වග්ගො

## 12. 5. 1

### චින්තාසුත්තං

3883. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. භූතපුබ්බං භික්ඛවෙ, අඤ්ඤතරො පුරිසො රාජගහා නික්ඛමිත්වා ලොකචින්තං චින්තෙස්සාමීති යෙන සුමාගවා[1] පොක්ඛරණී තෙනුපසංකමි. උපසංකමිත්වා සුමාගවාය පොක්ඛරණියා තීරෙ නිසීදි. ලොකචින්තං චින්තෙන්තො. අද්දසා ඛො භික්ඛවෙ, සො පුරිසො සුමාගවාය පොක්ඛරණියා චතුරඞ්ගිනිං[2] සෙනං භිසමුළාලං පවිසන්තිං. දිස්වානස්ස එතදහොසි. උම්මත්තො'ස්මි නාමාහං. විචෙතොස්මි නාමාහං. යං ලොකෙ නත්ථි තං මයා දිට්ඨන්ති.

අථ ඛො භික්ඛවෙ, සො පුරිසො රාජගහං[3] පවිසිත්වා මහාජනකායස්ස ආරොචෙසි. උම්මත්තො'ස්මි නාමාහං භන්තෙ, විචෙතොස්මි නාමාහං භන්තෙ. යං ලොකෙ නත්ථි තං මයා දිට්ඨන්ති. යථා කථම්පන ත්වං අම්භො පුරිස උම්මත්තො කථං විචෙතො කිඤ්ච ලොකෙ නත්ථි යං තයා දිට්ඨන්ති. ඉධාහං භන්තෙ රාජගහා නික්ඛමිත්වා ලොකචින්තං චින්තෙස්සාමීති යෙන සුමාගවා පොක්ඛරණී තෙනුපසංකමිං. උපසංකමිත්වා සුමාගවාය පොක්ඛණියා තීරෙ නිසීදිං ලොකචින්තං චින්තෙන්තො. අද්දසං ඛ්වාහං භන්තෙ සුමාගවාය පොක්ඛරණියා චතුරඞ්ගිනිං සෙනං භිසමුළාලං පවිසන්තිං. එවං ඛ්වාහං භන්තෙ උම්මත්තො. එවං විචෙතො. ඉදඤ්ච ලොකෙ නත්ථි යං මයා දිට්ඨන්ති. තග්ඝ ත්වං අම්භො පුරිස උම්මත්තො, තග්ඝ විචෙතො. ඉදඤ්ච ලොකෙ නත්ථි යං තයා දිට්ඨන්ති. තං ඛො පන භික්ඛවෙ සො පුරිසො භූතං යෙව අද්දස, නො අභූතං.

භූතපුබ්බං භික්ඛවෙ, දෙවාසුරසඞ්ගාමො සමූපබ්බූළ්හො අහොසි. තස්මිං ඛො පන භික්ඛවෙ, සඞ්ගාමෙ දෙවා ජිනිංසු. අසුරා පරාජිනිංසු. පරාජිතා ච ඛො භික්ඛවෙ, අසුරා භීතා භිසමුළාලෙන අසුරපුරං පවිසිංසු. දෙවානං යෙව මොහයමානා[4] තස්මාතිහ භික්ඛවෙ, මා ලොකචින්තං චින්තෙථ සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා. තං කිස්ස හෙතු: නෙසා භික්ඛවෙ, චින්තා අත්ථසංහිතා, නාදිබ්‍රහ්මචරියිකා, න නිබ්බිදාය, න විරාගාය, න නිරොධාය, න උපසමාය, න අභිඤ්ඤාය, න සම්බොධාය, න නිබ්බානාය සංවත්තති.

---

1. සුමාගධා – මජ්ඣං, සයා.
2. පොක්ඛරණියා තීරෙ චතුරඞ්ගිනිං – මජ්ඣං, සයා.
3. නගරං – මජ්ඣං, සයා.
4. මොහයමානා – සී 1, 2.

# 5. පපාත වර්ගය

## 12. 5. 1

## චින්තා සූත්‍රය

3883. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර සමීපයෙහි කලන්‍දකනිවාප** නම් **වෙළුවනාරාමයෙහි** වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, පෙර වූවක් කියමි. එක්තරා පුරුෂයෙක් රජගහනුවරින් නික්ම ලෝ සිතිවිලි සිතන්නෙමි"යි **සුමාගධා** නම් පොකුණ වෙත එළඹියේ ය. එළඹ ලෝසිතිවිලි සිතමින් සුමාගධා පොකුණු තෙර හුන්නේ ය. මහණෙනි, ඒ පුරිස් තෙමේ සුමාගධා පොකුණෙහි නෙළුඹුදලි තුළට පිවිසෙන සිවුරඟ සෙනඟක් දුටුයේ ය. දැක ඔහුට මෙබඳු සිතෙක් විය: "ලොව යමක් නැත් නම් එය මවිසින් දක්නා ලදී, මම නම් උමතුවෙක්මි, මම නම් පහවූ සිතිවිලි ඇත්තෙක්මි"යි.

මහණෙනි, එකල්හි ඒ පුරිස් තෙමේ රජගහනුවරට පිවිස: හිමියනි, ලොව යමක් නැත් නම් එය මවිසින් දක්නා ලදී. මම නම් උමතුවෙක්මි. හිමියනි, මම නම් පහ වූ සිතිවිලි ඇත්තෙක්මි"යි මහදනමුළුවට සැලකෙළේ ය. එම්බා පුරුෂය ඒ කෙසේ නම් තෝ උමතුවෙක් වෙහි ද? කෙසේ පහ වූ සිතිවිලි ඇත්තෙක් වෙහි ද? ලොව නැති කිමෙක් තා විසින් දක්නා ලද දැ යි? හිමියනි, "මෙහි මම රජගහනුවරින් නික්ම "ලෝසිතිවිලි සිතන්නෙමි"යි "සුමාගධා" පොකුණ වෙත එළඹියෙමි. එළඹ "සුමාගධා" පොකුණු තෙර ලෝසිතිවිලි සිතමින් හුන්නෙමි. හිමියනි, මම සුමාගධා පොකුණෙහි නෙළුඹුදලි තුළට පිවිසෙන සිවුරඟ සෙනඟ දිටිමි. හිමියනි, මෙසේ මම උමතුවෙක්මි. මෙසේ පහ ව ගිය සිතිවිලි ඇත්තෙක්මි ලොව නැති මෙ ද මා විසින් දක්නා ලදැ"යි, එම්බා පුරුෂය, තෝ ඒකාන්තයෙන් උමතුවෙකි, ඒකාන්තයෙන් පහ ව ගිය සිතිවිලි ඇත්තෙකි. ලොව නැති මෙ ද තා විසින් දක්නා ලදැ යි. මහණෙනි, ඒ පුරිස් තෙමේ ඒ වූවක් ම දිටී. නුවූවෙක් නො වේ.

මහණෙනි, පෙර වූවක් කියමි: දෙවියන් හා අසුරයන් අතර යුද්ධයෙක් එළඹ සිටියේ විය. මහණෙනි, ඒ යුද්ධයෙහි දී දෙවියෝ දිනූහ. අසුරයෝ පැරදුණහ. මහණෙනි, පැරදුණු අසුරයෝ බියපත් වූවාහු දෙවියන්ගේ සිත් මුළා කරවමින් ම නෙළුඹුදලියෙන් අසුර පුරයට පිවිසියහ. මහණෙනි, එහෙයින් මෙහි ලා "ලොකය ශාශ්වත ය"යි හෝ "ලොකය අශාශ්වත ය"යි හෝ "ලොකය අනන්‍තවත් ය"යි හෝ "ලොකය අනන්‍තවත් ය"යි හෝ "එය ජීවය එය ශරීරය"යි හෝ "ජීවය අනෙකක ශරීරය අනෙකකැ"යි හෝ "සත්ත්වයා මරණින් මතු වේ"යි හෝ "සත්ත්වයා මරණින් මතු නො වේ යි හෝ "සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ"යි හෝ "සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ "යි. ලෝ සිතිවිලි නහමක් සිතවූ. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සිතිවිලි වැඩ සහිත නො වේ. මගබඹසරට මුල් නො වේ. නිර්වේදය පිණිස නො පවතී. විරාගය පිණිස නො පවතී නිරොධය පිණිස නො පවතී ව්‍යුපශමය පිණිස නො පවතී අභිඥානය පිණිස නො පවතී සම්බොධිය පිණිස නො පවතී නිර්වාණය පිණිස නො පවතී.

චින්තෙන්තා ච ඛො තුම්හෙ භික්ඛවෙ, ‘‘ඉදං දුක්ඛ’’න්ති චින්තෙය්‍යාථ, ‘‘අයං දුක්ඛසමුදයො’’ති චින්තෙය්‍යාථ, ‘‘අයං දුක්ඛනිරොධො’’ති චින්තෙය්‍යාථ, ‘‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’’ති චින්තෙය්‍යාථ. තං කිස්ස හෙතු: එසා භික්ඛවෙ, චින්තා අත්ථසංහිතා, එසා ආදිබ්‍රහ්මචරියිකා, එසා නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මාතිහ භික්ඛවෙ, ‘‘ඉදං දුක්ඛ’’න්ති යොගො කරණීයො -පෙ- ‘‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’’ති යොගො කරණීයොති.

## 12. 5. 2

### පපාතසුත්තං

3884. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ‘‘ආයාම භික්ඛවෙ, යෙන පටිභානකූටො තෙනුපසඞ්කමිස්සාම දිවා විහාරායා’’ති. ‘එවම්භන්තෙ’ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන පටිභානකූටො තෙනුපසඞ්කමි. අද්දසා ඛො අඤ්ඤතරො භික්ඛු පටිභානකූටෙ මහන්තං පපාතං. දිස්වාන භගවන්තං එතදවොච: ‘‘මහා වතායං භන්තෙ, පපාතො, සුමහා වතායං භන්තෙ, පපාතො, අත්ථි නු ඛො භන්තෙ, ඉමම්හා පපාතා අඤ්ඤො පපාතො මහන්තතරො ච භයානකතරො[1] චා’’ති? ‘‘අත්ථි ඛො භික්ඛු, ඉමම්හා පපාතා අඤ්ඤො පපාතො මහන්තතරො ච භයානකතරො චා’’ති. කතමො පන භන්තෙ[2], ඉමම්හා පපාතා අඤ්ඤො පපාතො මහන්තතරො ච භයානකතරො චාති?

යෙ හි කෙචි භික්ඛු සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති. අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානන්ති. අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානන්ති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති. ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති. මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති. ජරාසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොති. මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති.

1. සුභයානකො - මජසං.
2. කතමො පන භික්ඛවෙ - සී 1, 2.

මහණෙනි, තෙපි සිතන්නාහු නම් "මේ දුකැ"යි සිතවූ. "මේ දුක් හටගැනුමැ"යි සිතවූ. "මේ දුක් වැළැක්මැ"යි සිතවූ. "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ" යි සිතවූ. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සිතිවිල්ල වැඩදයක ය. මේ මගබඹසරට මුල් ය. මෙය නිර්වෙදය විරාගය නිරොධය ව්‍යුපශමය අභිඥාය සම්බොධිය නිර්වාණය පිණිස පවතී. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වියඞ කට යුතු "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වියඞ කටයුතු යි.

## 12. 5. 2

## පපාත සූත්‍රය

3884. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ගිජ්ඣකූළපව්වෙහි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක: මහණෙනි, "යමු දිවාවිහරණය පිණිස පටිභානකූටය වෙත එළඹෙන්නෙමු"යි. 'එසේ ය වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග පිළිබහන්කුළ වෙත එළඹිසේක. එක්තරා මහණෙක් පිළිබහන්කුළෙහි මහත් ප්‍රපාතයක් දිටී. දැක භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය: "වහන්ස, මේ ප්‍රපාතය එකාන්තයෙන් මහති. වහන්ස, මේ ප්‍රපාතය එකාන්තයෙන් ඉතා මහති. වහන්ස, මේ ප්‍රපාතයට වඩා ඉතා මහත් වූ ද ඉතා බිහිසුනු වූ ද අනෙක් ප්‍රපාතයෙක් ඇද්දෝ"යි "මහණ, මේ ප්‍රපාතයට වඩා ඉතා මහත් වූ ද ඉතා බිහිසුනු වූ ද අනෙක් ප්‍රපාතයෙක් ඇතැ"යි. වහන්ස, මේ ප්‍රපාතයට වඩා ඉතා මහත් වූ ද ඉතා බිහිසුනු වූ ද අනෙක් ප්‍රපාතය කවරේ දැ යි.

මහණ, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ"යි තතුසේ නො දනිද් ද, "මේ දුක් හට ගැනුමැ"යි තතුසේ නො දනිද් ද, "මේ දුක් වැළැක්මැ" යි තතුසේ නො දනිද් ද, "මේ දුක් වැළක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ නො දනිද් ද, ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත්. ජරාව පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත්. මරණය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත්. සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත්. ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු ජරාව පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු මරණය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද, රැස් කෙරෙත්. ජරාව පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කෙරෙත්. මරණය පිණිස පවත්නා සංස්කාරයන් ද, රැස් කෙරෙත්. සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කෙරෙත්.

තෙ ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා ජරාසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා ජාතිපපාතම්පි පපතන්ති ජරාපපාතම්පි පපතන්ති මරණපපාතම්පි පපතන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපපාතම්පි[1] පපතන්ති. තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

යෙ ච ඛො කෙචි භික්ඛූ සමණා වා බ්‍රාහ්මණා වා ‘‘ඉදං දුක්ඛ’’න්ති යථාභූතං පජානන්ති -පෙ- ‘‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’’ති යථාභූතං පජානන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති.[2] ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති. මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති. ජරාසංවත්තනිකෙපි[3] සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති. මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති.

තෙ ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා ජරාසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාස සංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා ජාතිපපාතම්පි න පපතන්ති. ජරාපපාතම්පි න පපතන්ති. මරණපපාතම්පි න පපතන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපපාතම්පි න පපතන්ති. තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි. තස්මාතිහ භික්ඛු ‘‘ඉදං දුක්ඛ’’න්ති යොගො කරණීයො -පෙ- ‘‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’’ති යොගො කරණීයොති.

1. දොමනස්සුපායාසසංවත්තනියපපාතම්පි - සිමු, සී 2.
2. න අභිරමන්ති - ස්‍යා.
3. න අභිසඞ්ඛරොන්ති - ස්‍යා

ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කොට ජරාව පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කොට මරණය පිණිස පවත්නා සංස්කාරයන්ද රැස් කොට සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන් ද, රැස් කොට ජාති ප්‍රපාතයට ද වැටෙත්. ජරාප්‍රපාතයට ද වැටෙත්. මරණප්‍රපාතයට ද වැටෙත්. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසප්‍රපාතයට ද වැටෙත්. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දොමනස්සයෙන් උපායාසයෙන් නො මිදෙත්. දුකින් නො මිදෙති යි කියමි.

මහණ, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ "යි තතුසේ දනිද්ද ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ දනිද් ද ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලෙත්. ජරාව පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලෙත්. මරණය පිණිස පවත්නා සංස්කාර–යන්හි නො ඇලෙත්. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලෙත්. ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලුණාහු ජරාව පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලුණාහු මරණය පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලුණාහු සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලුණාහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කෙරෙත්. ජරාව පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කෙරෙත්. මරණය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කෙරෙත්. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාර-යන් ද රැස් නො කෙරෙත්.

ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කොට ජරාව පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කොට මරණය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කොට සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් නො කොට ජාතිප්‍රපාතයට ද නො වැටෙත්. ජරාප්‍රපාතයට ද නො වැටෙත්. මරණප්‍රපාතයට ද නො වැටෙත්. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස ප්‍රපාතයට ද නො වැටෙත්. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දොමනස්සයෙන් උපායාසයෙන් මිදෙත්. (සියලු) දුකින් මිදෙති යි කියමි. මහණෙනි, එහෙයින් මෙහි ලා මේ 'දුක්ඛ"යි වීයඣ කටයුතු ... "මේ දුක්ඛනිරොධගාමිනීපටිපද"යි වීයඣ කටයුතු යි.

## 12. 5. 3

## පරිළාහසුත්තං

3885. අත්ථි භික්ඛවෙ, මහාපරිළාහො නාම නිරයො තත්ථ යං කිඤ්චි චක්ඛුනා රූපං පස්සති, අනිට්ඨරූපංයෙව[1] පස්සති, නො ඉට්ඨරූපං. අකන්තරූපංයෙව පස්සති, නො කන්තරූපං. අමනාපරූපංයෙව පස්සති, නො මනාපරූපං. යං කිඤ්චි සොතෙන සද්දං සුණාති -පෙ- ඝානෙන ගන්ධං ඝායති -පෙ- ජිව්හාය රසං සායති -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසති -පෙ- යං කිඤ්චි මනසා ධම්මං විජානාති අනිට්ඨරූපංයෙව විජානාති. නො ඉට්ඨරූපං. අකන්තරූපංයෙව විජානාති, නො කන්තරූපං. අමනාපරූපංයෙව විජානාති, නො මනාපරූපන්ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "මහා වත සො භන්තෙ, පරිළාහො සුමහා වත සො භන්තෙ, පරිළාහො. අත්ථි නු ඛො භන්තෙ, එතම්හා පරිළාහා අඤ්ඤො පරිළාහො මහන්තතරො ච භයානකතරො චා"ති? අත්ථි ඛො භික්ඛු එතම්හා පරිළාහා අඤ්ඤො පරිළාහො මහන්තතරො ච භයානකතරො චාති. කතමො පන භන්තෙ, එතම්හා පරිළාහා අඤ්ඤො පරිළාහො මහන්තතරො ච භයානකතරො චාති?

යෙ හි කෙචි භික්ඛු, සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං නප්පජානන්ති, තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති. තෙ ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා ජාතිපරිළාහෙන[2]පි පරිඩය්හන්ති. ජරාපරිළාහෙනපි පරිඩය්හන්ති, මරණපරිළාහෙනපි පරිඩය්හන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපරිළාහෙනපි පරිඩය්හන්ති. තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

යෙ ච ඛො කෙචි භික්ඛු සමණා වා බ්‍රාහ්මණා වා "ඉදං දුක්ඛ"න්ති යථාභූතං පජානන්ති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානන්ති, තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති -පෙ- අනභිරතා -පෙ- නාභිසඞ්ඛරොන්ති -පෙ- අනභිසඞ්ඛරිත්වා ජාතිපරිළාහෙනපි න පරිඩය්හන්ති, ජරාපරිළාහෙනපි න පරිඩය්හන්ති, මරණපරිළාහෙනපි න පරිඩය්හන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපරිළාහෙනපි න පරිඩය්හන්ති. තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි. තස්මාතිහ භික්ඛු "ඉදං දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

---

1. රූපඤ්ඤෙව - මජ්ඣං, සයා.
2. ජාතිපටිඩාහෙන - සීමු, මජ්ඣං.

## 12. 5. 3

## පරිළාහ සූත්‍රය

3885. මහණෙනි, මහාපරිළාහ නම් නිරයෙක් ඇත. එහි යම් කිසි රුවක් ඇසින් දකී නම් අනිටු රුවක් ම දකී. ඉටු රුවක් නො දකී. නො කැමති රුවක් ම දකී. කැමති රුවක් නො දකී. නො මනා රුවක් ම දකී. මනාරුවක් නො දකී. කනින් යම් කිසි සදක් අසා නම් ... නැහැයෙන් ගඳක් ගනී නම් ... දිවින් රසක් විඳී නම් ... කයින් පහසක් පුසී නම් ... සිතින් යම් කිසි දහමක් දනී නම් අනිටු රුවක් ම දනී. ඉටුරුවක් නො දනී. නො කැමති රුවක් ම දනී. කැමති රුවක් නො දනී. නො මනාරුවක් ම දනී. මනාරුවක් නො දනීයි. මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: "වහන්ස, ඒ පරිළාහ නිරය ඒකාන්තයෙන් මහති. වහන්ස, ඒ පරිළාහ නිරය ඒකාන්තයෙන් ඉතා මහති. වහන්ස, මේ පරිළාහයට වඩා ඉතා මහත් වූ ද ඉතා බිහිසුනු වූ ද අනෙක් පරිළාහයෙක් ඇද්දෝ"යි? මහණ, මේ පරිළාහයට වඩා ඉතා මහත් වූ ද ඉතා බිහිසුනු වූ ද අනෙක් පරිළාහයෙක් ඇතැ යි. වහන්ස, මේ පරිළාහයට වඩා ඉතා මහත් වූ ද ඉතා බිහිසුනු වූ ද අන් පරිළාහය කවරේ දැයි?

මහණ, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ"යි තතුසේ නො දනිද්ද ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ නො දනිද්ද, ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත් .. සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත්. ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු ... සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කෙරෙත් ... සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කෙරෙත්. ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කොට ... සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කොට ජාතිපරිදාහයෙනු දු මුළුමනින් දැවෙත්. ජරාපරිදාහයෙනු දු මුළුමනින් දැවෙත්. මරණපරිදාහයෙනු දු මුළුමනින් දැවෙත්. සොකපරිදෙවදුක්ඛදෙමනස්ස උපායාසපරිදාහයෙනු දු මුළුමනින් දැවෙත්. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් නො මිදෙත්. දුකින් නො මිදෙති යි කියමි.

මහණ, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ"යි තතුසේ දනිද් ද ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ දනිද් ද, ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලෙත් ... නො ඇලුණාහු ... රැස් නො කෙරෙත් ... රැස් නො කොට ජාතිපරිදාහයෙනුදු හාත්පසින් නො දැවෙත්. ජරාපරිදාහයෙනු දු හාත්පසින් නො දැවෙත්. මරණපරිදාහයෙනු දු හාත්පසින් නො දැවෙත්. සොකපරිදෙවදුක්ඛදෙමනස්සඋපායාසපරිදාහයෙනු දු හාත්පසින් නො දැවෙත්. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මිදෙත්. සියලු දුකින් මිදෙති යි කියමි. මහණ, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වීර්ය කටයුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වීර්ය කටයුතු යි.

## 12. 5. 4

## කූටාගාරසුත්තං

3886. යො හි[1] භික්ඛවෙ, එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච දුක්ඛසමුදයං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච දුක්ඛනිරොධං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච දුක්ඛනිරොධගාමිනිං පටිපදං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමී'ති නෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ, යො එවං වදෙය්‍ය: "අහං කූටාගාරස්ස හෙට්ඨිමං ඝරං අකරිත්වා උපරිමං ඝරං ආරොපෙස්සාමී"ති නෙතං ඨානං විජ්ජති. එවමෙව ඛො භික්ඛවෙ, යො එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං යථාභූතං අනභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමී"ති නෙතං ඨානං විජ්ජති.

යො ච ඛො භික්ඛවෙ, එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමී"ති. ඨානමෙතං විජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ, යො එවං වදෙය්‍ය "අහං කූටාගාරස්ස හෙට්ඨිමං ඝරං, කරිත්වා උපරිමං ඝරං ආරොපෙස්සාමී"ති ඨානමෙතං විජ්ජති. එවමෙව ඛො භික්ඛවෙ, යො එවං වදෙය්‍ය: "අහං දුක්ඛං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං යථාභූතං අභිසමෙච්ච සම්මා දුක්ඛස්සන්තං කරිස්සාමීති ඨානමෙතං විජ්ජති. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනිපටිපදා"ති යොගො කරණීයොති.

## 12. 5. 5

## වාලසුත්තං

3887. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං[2] පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො ආයස්මා ආනන්දො සම්බහුලෙ ලිච්ඡවිකුමාරකෙ සන්ථාගාරෙ උපාසනං කරොන්තෙ දූරතොව සුඛුමෙන තාලච්ඡිග්ගලෙන අසනං අතිපාතෙන්තෙ පොඞ්ඛානුපොඞ්ඛං[3] අවිරාධිතං, දිස්වාන'ස්ස එතදහොසි: "සික්ඛිතා වතිමෙ ලිච්ඡවිකුමාරකා සුසික්ඛිතා වතිමෙ ලිච්ඡවිකුමාරකා. යත්‍ර හි නාම දූරතොව සුඛුමෙන තාලච්ඡිග්ගලෙන අසනං අතිපාතෙස්සන්ති පොඞ්ඛානුපොඞ්ඛං අවිරාධිතන්ති."

---

1. යො ච ඛො - මජසං, සතා.
2. වෙසාලියං - සී 1, සතා.
3. පොඞ්ඛානුපොඞ්ඛං - සතා.

## 12. 5. 4

## කූටාගාර සූත්‍රය

3886. මහණෙනි, යමෙක් "මම දුඃඛාර්යසත්‍යය තතුසේ නුවණින් නො පිළිවිද දුඃඛසමුදයාර්යසත්‍යය තතුසේ නුවණින් නො පිළිවිද දුඃඛනිරොධාර්යසත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදර්යසත්‍යය තතුසේ නුවණින් නො පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි"යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත. මහණෙනි, යම්සේ යමෙක් "මම කුළුගෙයක යටභාගය නො කොට මතුභාගය නගන්නෙමි"යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැද්ද, මහණෙනි, එසෙයින් ම යමෙක් මම දුඃඛාර්යසත්‍යය තතුසේ නුවණින් නො පිළිවිද ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදර්ය සත්‍යය තතු සේ නුවණින් නො පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි"යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ නැත.

මහණෙනි, යමෙක් "මම දුඃඛාර්යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදර්යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි"යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ ඇත. මහණෙනි, යම්සේ යමෙක් "මම කුළු-ගෙයක යටගෙය කොට මතුගෙය නගන්නෙමි"යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ ඇද්ද, මහණෙනි, එසෙයින් ම යමෙක් "මම දුඃඛාර්යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදර්යසත්‍යය තතුසේ නුවණින් පිළිවිද මැනවින් දුක් කෙළවර කරන්නෙමි"යි මෙසේ කියන්නේ ය යන මෙකරුණ ඇත. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වීර්ය කට යුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වීර්ය කටයුතු යි.

## 12. 5. 5

## වාල සූත්‍රය

3887. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** මහ-වෙනෙහි **කුළුගේහල්හි** වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් **අනඳතෙරණුවෝ** පෙරවරු හැඳ පෙර ව පාසිවුරු ගෙන විසල්පුරට පිඬු පිණිස පිවිසියහ. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ සිජ්හලෙහි විදීමට පුහුණුවන සියුම් කෙසිසිදුරෙන් හීපගලියෙන් පගලිය නො වළහා දුරින් ම ඊතලය ඉක්මවන බොහෝ ලිච්ඡවිකුමරුන් දුටහ. දැක උන්වහන්සේට මෙබඳු සිතෙක් විය. "යම් කෙනෙක් දුරින් ම සියුම් කෙසිසිදුරෙන් හීපගලියෙන් පගලිය නො වළහා හීතලය ඉක්මවන්නාහු නම් ඒ මේ ලිච්ඡවිකුමරුවෝ එකාන්තයෙන් හික්මුණහ. ඒ මේ ලිච්ඡවිකුමරුවෝ එකාන්තයෙන් මැනවින් හික්මුණහ"යි.

අථ ඛො ආයස්මා ආනන්දො වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි, -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "ඉධාහං භන්තෙ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසිං. අද්දසං ඛ්වාහං භන්තෙ, සම්බහුලෙ ලිච්ඡවිකුමාරකෙ සන්ථාගාරෙ උපාසනං කරොන්තෙ. දූරතොව සුඛුමෙන තාලච්ඡිග්ගලෙන අසනං අතිපාතෙන්තෙ පොඞ්ඛානුපොඞ්ඛං අවිරාධිතං. දිස්වාන මෙ එතදහොසි, සික්ඛිතා වතිමෙ ලිච්ඡවිකුමාරකා. සුසික්ඛිතා වතිමෙ ලිච්ඡවිකුමාරකා. යත්‍ර හි නාම දූරතො ච සුඛුමෙන තාලච්ඡිග්ගලෙන අසනං අතිපාතෙස්සන්ති පොඞ්ඛානුපොඞ්ඛං අවිරාධිතන්ති".

තං කිං මඤ්ඤසි ආනන්ද, කතමං නු ඛො දුක්කරතරං වා දුරභිසම්භවතරං වා, යො ච දූරතොව සුඛුමෙන තාලච්ඡිග්ගලෙන අසනං අතිපාතෙය්‍ය පොඞ්ඛානුපොඞ්ඛං අවිරාධිතං. යො වා සතධා[1] භින්නස්ස වාළස්ස කොටියා කොටිං පටිවිජ්ඣෙය්‍යාති? එතදෙව භන්තෙ, දුක්කරතරං චෙව දුරභිසම්භවතරං ච යො වා සතධා භින්නස්ස වාළස්ස කොටියා කොටිං පටිවිජ්ඣෙය්‍යාති. අථ ඛො තෙ ආනන්ද[2] දුප්පටිවිජ්ඣතරං පටිවිජ්ඣන්ති යෙ[3] "ඉදං දුක්ඛ"න්ති යථාභූතං පටිවිජ්ඣන්ති[4] -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති, යථාභූතං පටිවිජ්ඣන්ති. තස්මාතිහ ආනන්ද, "ඉදං දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛ-නිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

## 12. 5. 6

## අන්ධකාරසුත්තං

3888. අත්ථි භික්ඛවෙ, ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරකා[5] අන්ධකාරතිමිසා. යත්ථාපිමෙසං චන්දිමසූරියානං එවංමහිද්ධිකානං එවංමහානුභාවානං ආභා[6] නානුභොන්ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "මහා වත සො භන්තෙ, අන්ධකාරො. සුමහා වත සො භන්තෙ, අන්ධකාරො. අත්ථි නු ඛො භන්තෙ, එතම්හා අන්ධකාරා අඤ්ඤො අන්ධකාරො මහන්තතරො ච භයානකතරො චා"ති? අත්ථි ඛො භික්ඛු, එතම්හා අන්ධකාරා අඤ්ඤො අන්ධකාරො මහන්ත-තරො ච භයානකතරො චාති. කතමො පන භන්තෙ, එතම්හා අන්ධකාරා අඤ්ඤො අන්ධකාරො මහන්තතරො ච භයානකතරො චාති?

1. සත්තධා - මජ්සං, සතා, අට්ඨකථා.
2. අථ ඛො ආනන්ද - මජ්සං.
3. යෙ - සතා, සී 1, 2.
4. පටිවිජ්ඣති - සතා, සී 1, 2.
5. අන්ධකාරා - මජ්සං, සතා.
6. ආභාය - මජ්සං, සතා.

ඉක්බිති ඇවැත් අනඳ තෙරණුවෝ විසල්පුර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස්ව හුන් ඇවැත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, මෙහි මම පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන විසල්පුරට පිඩු පිණිස පිවිසියෙමි. වහන්ස, මම සිජ්හලෙහි විදීම පුහුණුවන සියුම් කෙසිසිදුරෙන් පගලියෙන් පගලිය නො වළහා දුරින් ම ඊතලය ඉක්මවන බොහෝ ලිච්ඡවිකුමරුන් දිටිමි. දැක මට මෙබඳු සිතෙක් විය: යම් කෙනෙක් සියුම් කෙසිසිදුරෙන් පගලියෙන් පගලිය නො වළහා දුරින් ම ඊතලය ඉක්මවන්නාහු නම් ඒ මේ ලිච්ඡවිකුමරුවෝ ඒකාන්තයෙන් හික්මුණහ. ඒ මේ ලිච්ඡවිකුමරුවෝ ඒකාන්තයෙන් මැනවින් හික්මුණහ"යි.

ආනන්‍ද, ඒ කිමැ යි හඟිවු ද? යමෙක් සියුම් කෙසිසිදුරෙන් පගලියෙන් පගලිය නො වළහා දුරින් ම ඊතලය ඉක්මවන්නේ ද, යමෙකුත් සියක්වර පැළු අස්ලොමහි කෙළවරින් කෙළවරට විදුනේ ද, මෙයින් කිමෙක් ඉතා දුෂ්කර හෝ ඉතා දුලබ හෝ ද යි? වහන්ස, යමෙක් සියක්වර පැළු අස්ලොමහි කෙළවරින් කෙළවරට විදුනේ නම් මෙය ම ඉතා දුෂ්කර ද ඉතා දුලබ ද වේ යි. ආනන්‍ද, වැලි යම් කෙනෙක් 'මේ දුකැ'යි තතුසේ පිළිවිදිද් ද, ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ පිළිවිදිද් ද, ඔහු පිළිවිදුමට ඉතා දුෂ්කර වූවක් පිළිවිදිත්. ආනන්‍ද, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වීර්ය කටයුතු ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි වීර්ය කටයුතු යි.

## 12. 5. 6

## අන්ධකාර සූත්‍රය

3888. මහණෙනි, මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනාගේත් ආලොකය යම් තැනක නො ලබත් නම් ලොව අතර පවත්නා හිස් වූ ආවරණ රහිත වූ අඳුරු කරන එබඳු ගන අඳුරෙක් ඇතැ යි. මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "වහන්ස, ඒ අඳුර ඒකාන්තයෙන් මහති. වහන්ස, ඒ අඳුර ඒකාන්තයෙන් ඉතා මහති. වහන්ස, මේ අඳුරට වඩා ඉතා මහත් වූත් ඉතා බිහිසුණු වූත් අන් අඳුරෙක් ඇද්ද?"යි මහණ, මේ අඳුරට වඩා ඉතා මහත් වූත් ඉතා බිහිසුණු වූත් අන් අඳුරෙක් ඇතැ යි. වහන්ස, මේ අඳුරට වඩා ඉතා මහත් වූත් ඉතා බිහිසුණු වූත් අන් අඳුර කවරේ ද?යි

යෙ හි කෙචි භික්ඛූ, සමණා වා බ්‍රාහ්මණා වා "ඉදං දුක්ඛ"න්ති යථාභූතං නප්පජානන්ති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං නප්පජානන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති. තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති -පෙ- සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති. තෙ ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා -පෙ- සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා ජාතන්ධකාරම්පි පපතන්ති. ජරන්ධකාරම්පි පපතන්ති. මරණන්ධකාරම්පි පපතන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසන්ධකාරම්පි පපතන්ති. තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

යෙ ච ඛො කෙචි භික්ඛූ, සමණා වා බ්‍රාහ්මණා වා "ඉදං දුක්ඛ"න්ති යථාභූතං පජානන්ති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානන්ති, තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති -පෙ- අනභිරතා -පෙ- නාභිසඞ්ඛරොන්ති -පෙ- අනභි-සඞ්ඛරිත්වා ජාතන්ධකාරම්පි න පපතන්ති. ජරන්ධකාරම්පි න පපතන්ති, මරණන්ධකාරම්පි න පපතන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසන්ධ-කාරම්පි න පපතන්ති. තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි. තස්මාතිහ භික්ඛූ "ඉදං දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා"ති යොගො කරණීයොති.

## 12. 5. 7

## ඡිග්ගලසුත්තං

3889. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහාසමුද්දෙ එකච්ඡිග්ගලං යුගං[1] පක්ඛිපෙය්‍ය. තත්‍රස්ස[2] කාණො කච්ඡපො. සො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං සකිං උම්මුජ්ජෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො කාණො කච්ඡපො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං සකිං උම්මුජ්ජන්තො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍යාති[3]? යදි නූන භන්තෙ, කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙනාති. ඛිප්පතරං ඛො සො භික්ඛවෙ, කාණො කච්ඡපො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං සකිං උම්මුජ්ජන්තො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍ය, නත්වෙවාහං භික්ඛවෙ, සකිං විනිපාතගතෙන[4] බාලෙන මනුස්සත්තං වදාමි. තං කිස්ස හෙතු: න හෙත්ථ භික්ඛවෙ, අත්ථි ධම්මචරියා පුඤ්ඤකිරියා. අඤ්ඤමඤ්ඤඛාදිකා එත්ථ භික්ඛවෙ, වත්තති දුබ්බලඛාදිකා. තං කිස්ස හෙතු; අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

---

1. එකංජිගලයුගං - සී 1.
2. තත්‍රාපිස්ස - මජ්සං, ස්‍යා.
3. පවිසිස්සාති - සීමු, සී 1, 2.
4. විනිපාතං ගතෙන - සී 1, 2.

මහණෙ, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ"යි තතුසේ නො දනිද්ද ... "මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ නො දනිද් ද, ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත් .. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයන් පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලෙත්. ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු ... සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයන් පිණිස පවත්නා සංස්කාරයන්හි ඇලුණාහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කෙරෙත් ... සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයන් පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කෙරෙත්. ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කොට ... සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයන් පිණිස පවත්නා සංස්කාරයන් ද රැස් කොට ජාති අඳුරට ද වැටෙත්. ජරා අඳුරට ද වැටෙත්. මරණ අඳුරට ද වැටෙත්. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස අඳුරට ද වැටෙත්. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දොමනස්ස-යෙන් උපායාසයෙන් නො මිදෙත්. සියලු දුකින් නො මිදෙති යි කියමි.

මහණෙ, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ "මේ දුකැ"යි තතුසේ දනිද් ද ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ"යි තතුසේ දනිද් ද, ඔහු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්හි නො ඇලෙත් ... නො ඇලුණාහු ... රැස් නො කෙරෙත් ... රැස් නො කොට ජාති අඳුරට ද නො වැටෙත්. ජරා අඳුරට ද නො වැටෙත්. මරණ අඳුරට ද නො වැටෙත්. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස අඳුරට ද නො වැටෙත්. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දොමනස්සයෙන් උපායාසයෙන් මිදෙත්. සියලු දුකින් මිදෙති යි කියමි. මහණ, එහෙයින් මෙහි ලා "මේ දුකැ"යි වීර්ය කටයුතු... "මේ දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතැ"යි වීර්ය කටයුතු යි.

## 12. 5. 7

## ඡිග්ගල සූත්‍රය

3889. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මහමුහුදෙහි එක් සිදුරක් ඇති වියදණ්ඩක් බහා ලන්නේ ද එහි කණකැස්බෙක් වන්නේ ය. හේ සියවසක් සියවසක්හුගේ ඇවෑමෙන් වරෙක වරෙක මතු වන්නේ ය. මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද? ඒ කණකැස්බා සියවසක් සියවසක්හුගේ ඇවෑමෙන් වරෙක වරෙක මතු වන්නේ තෙල එක්සිදුරු වියදඬුයෙහි ගෙල පිවිස්වන්නේ දැ යි? වහන්ස, දිගුකලෙක ඇවෑමෙන් කිසි කවර දවසෙක විය හැකි යි. මහණෙනි, ඒ කණකැස්බා සියවසක් සියවසක්හුගේ ඇවෑමෙන් වරෙක වරෙක මතු වන්නේ තෙල එක්සිදුරු වියදඬුයෙහි ඉතා වහා ගෙල පිවිස්වන්නේ ය. මහණෙනි, වරක් අපායට ගිය බාලයා විසින් මිනිසත්බව සුලබ ය යි මම නො ම කියමි. ඒ කවර හෙයින යත්; මහණෙනි, මෙහි දහම්හි හැසිරීමෙක් පින් කිරීමෙක් නො ම ඇත. මහණෙනි, මෙහි ඔවුනොවුන් කෑමෙක් දුබුලන් කෑමෙක් පවතී. ඒ කවර හෙයින යත්: මහණෙනි, චතුරාර්යසත්‍යය නුදුටු බැවිනි. කවර චතුරාර්යසත්‍යයෙක යත්: "දුඃඛාර්යසත්‍ය ය ... දුඃඛනිරොධ-ගාමිනීප්‍රතිපදර්යසත්‍ය යි. මහණෙනි, එහෙයින් මෙහි ලා "මේ දුක්ඛ"යි වීර්ය කටයුතු ... "මේ දුක්ඛනිරොධගාමිනීපටිපද"යි වීර්ය කටයුතු යි.

## 12. 5. 8

## දුතිය ඡිග්ගලසුත්තං

3890. සෙය්‍යථාපි භික්ඛවෙ, අයං මහාපඨවී එකොදිකා අස්ස. තත්‍ර පුරිසො එකච්ඡිග්ගලං යුගං පක්ඛිපෙය්‍ය. තමෙනං පුරත්ථිමො වාතො පච්ඡිමෙන සංහරෙය්‍ය, පච්ඡිමො වාතො පුරත්ථිමෙන සංහරෙය්‍ය, උත්තරො වාතො දක්ඛිණෙන සංහරෙය්‍ය, දක්ඛිණො වාතො උත්තරෙන සංහරෙය්‍ය. තත්‍රස්ස කාණො කච්ඡපො. සො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං සකිං උම්මුජ්ජෙය්‍ය. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො කාණො කච්ඡපො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං සකිං උම්මුජ්ජන්තො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍යාති? අධිච්චමිදං භන්තෙ, යං සො කාණො කච්ඡපො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං සකිං උම්මුජ්ජන්තො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍යාති. එවං අධිච්චමිදං භික්ඛවෙ, යං මනුස්සත්තං ලභති, එවං අධිච්චමිදං භික්ඛවෙ, යං තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො, එවං අධිච්චමිදං භික්ඛවෙ, යං තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පති. තයිදං භික්ඛවෙ, මනුස්සත්තං ලද්ධං, තථාගතො ච ලොකෙ උප්පන්නො අරහං සම්මාසම්බුද්ධො, තථාගතප්පවෙදිතො ච ධම්මවිනයො ලොකෙ දිප්පති. තස්මාතිහ භික්ඛවෙ, ''ඉදං දුක්ඛ''න්ති යොගො කරණීයො -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපද''ති යොගො කරණීයොති.

## 12. 5. 9

## සිනෙරුසුත්තං

3891. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො සිනෙරුස්ස පබ්බතරාජස්ස සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිපෙය්‍ය. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං යා වා[1] සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා. සිනෙරු[2] වා පබ්බතරාජාති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං සිනෙරුපබ්බතරාජා. අප්පමත්තිකා සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා. සඞ්ඛම්පි න උපෙන්ති උපනිධිම්පි න උපෙන්ති. කලභාගම්පි න උපෙන්ති. සිනෙරුං පබ්බතරාජං උපනිධාය සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තාති.

1. යා ච - සයා.
2. උපනික්ඛිත්තා යො ච සිනෙරු - මජසං.

## 12. 5. 8

## දුතියඡිග්ගල සූත්‍රය

3890. මහණෙනි, යම්සේ මේ මහපොළොව එක ම ජලාසයෙක් වන්නේ ද, පුරුෂයෙක් එක්සිදුරු වියදණ්ඩක් එහි බහා ලන්නේ ය. ඒ මෙය පෙරදිගින් හමන වාතය පැළදිගට පමුණුවන්නේ ය. පැළදිගින් හමන වාතය පෙරදිගට පමුණුවන්නේ ය. උතුරුදිගින් හමන වාතය දකුණුදිගට පමුණුවන්නේ ය. දකුණුදිගින් හමන වාතය උතුරුදිගට පමුණුවන්නේ ය. එහි කණකැස්බෙක් වන්නේ ය. හේ සියවසක් සියවසක්හුගේ ඇවෑමෙන් එක් එක්වර මතුවන්නේ ය. මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? ඒ කණකැස්බා සියවසක් සියවසක්හුගේ ඇවෑමෙන් එක් එක්වර මතුවන්නේ තෙල එක්සිදුරු වියදඬුවෙහි ගෙල පිවිසවන්නේ දැ යි? වහන්ස, ඒ කණකැස්බා සියවසක් සියවසක්හුගේ ඇවෑමෙන් එක් එක්වර මතුවන්නේ තෙල එක්සිදුරු වියදණ්ඩෙහි ගෙල පිවිසවන්නේ ය යන යමෙක් වේ නම් මෙය කිසි දවසක සිදුවන්නෙකි. මහණෙනි, එමෙන් ම මිනිසත් බව ලබයි යන යමෙක් වේ නම් මෙය දිගුකලක් ඉක්ම යැමෙන් සිදුවන්නෙකි. මහණෙනි, එමෙන් ම අර්හත්සම්‍යක්සම්බුද්ධ වූ තථාගත තෙමේ ලොව උපදී යන යමෙක් වේ නම් මෙ ද දිගු කලක් ගත වීමෙන් සිදු වන්නෙකි. මහණෙනි, එමෙන් ම තථාගතයන් විසින් පවසන ලද සසුන ලොව බබලයි යන යමෙක් වේ නම් මෙ ද දිගු කලක් ගතවීමෙන් සිදු වන්නෙකි. මහණෙනි, ඔහු විසින් මේ මිනිසත්බව ලදි. අර්හත්සම්‍යක්-සම්බුද්ධ වූ තථාගත තෙමේත් ලොව උපන. තථාගතයන් විසින් පවසන ලද සසුනත් ලොව බබලයි. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුක්ඛ''යි වීර්ය කටයුතු ... ''මේ දුක්ඛනිරොධගාමිනිපටිපද''යි වීර්ය කටයුතු යි.

## 12. 5. 9

## සිනෙරු සූත්‍රය

3891. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මුං පමණ වූ ගල්කැට සතක් සිනේරු පවුරජු ළඟ බහා තබන්නේ ද, මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කිමෙක් ඉතා බොහෝ ද? ළඟ තබන ලද මුං පමණ යම් පහණ සකුරු හෝ සිනේරු පවුරජු හෝ දැ යි. වහන්ස, යම් මේ සිනේරුපවුරජෙක් වේ නම් මෙය ම ඉතා බොහෝ ය. ළඟ තබන ලද මුං පමණ වූ සත් පහණ සකුරු ඉතා මඳ ය. සිනේරුපවුරජු හා සැසඳීමෙහි දී මුං පමණ වූ සත් පහණ සකුරු ගණනට ද නො පැමිණේ. සැසැඳීම් පමණකට දු නො පැමිණේ. (සියයෙන් දහසින් සියදහසින්) කලාවකට දු නො පැමිණේ.



Free Distribution www.aathaapi.org

එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තකං අවසිට්ඨං, සඞ්ඛම්පි න උපෙති උපනිධිම්පි න උපෙති කලභාගම්පි න උපෙති පුරිමං දුක්ඛක්ඛන්ධං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය යදිදං සත්තක්ඛත්තුපරමතා. යො "ඉදං දුක්ඛ"න්ති යථාභූතං පජානාති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

## 12. 5. 10

## දුතිය සිනෙරුසුත්තං

3892. සෙය්‍යථාපි භික්ඛවෙ, සිනෙරුපබ්බතරාජා පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්වා සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරාති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යං වා සිනෙරුස්ස පබ්බතරාජස්ස පරික්ඛීණං පරියාදින්නං යා වා සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨාති? එතදෙව භන්තෙ, බහුතරං සිනෙරුස්ස පබ්බතරාජස්ස යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තිකා සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨා, සඞ්ඛම්පි න උපෙන්ති, උපනිධිම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්ති. සිනෙරුස්ස පබ්බතරාජස්ස පරික්ඛීණං පරියාදින්නං උපනිධාය සත්ත මුග්ගමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තකං අවසිට්ඨං. සඞ්ඛම්පි න උපෙති උපනිධිම්පි න උපෙති කලභාගම්පි න උපෙති පුරිමං දුක්ඛක්ඛන්ධං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය යදිදං සත්තක්ඛත්තුපරමතා. යො "ඉදං දුක්ඛන්ති" යථාභූතං පජානාති -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛ"න්ති යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

**පපාතවග්ගො පඤ්චමො.**

තස්සුද්දානං:

චින්තා පපාතො පරිළාහො කූටං වාලෙන්ධකාරො ච.
ඡිග්ගලා ච දුවෙ වුත්තා සිනෙරු අපරෙ දුවෙති.

මහණෙනි, එසෙයින් ම චතුස්සත්‍යාවබොධය කළ දිටුසපන් අරිසවු-පුඟුල්හු විසින් මේ දුකෙක් ක්‍ෂය කරන ලද්දේ ගෙවන ලද්දේ වේ නම් මෙය ම ඉතා බොහෝ ය. ඉතිරි වූ දුක ඉතා මඳ ය. යමෙක් මේ දුකැ යි තතුසේ දනී ද ... මේ දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතැ යි තතුසේ දනී ද, යන යම් මේ සත්තක්ඛත්තුපරමතාවක් (සත්වරක් ඉපදීම පරම කොට ඇති බවෙක්) වේ නම් මෙය ක්‍ෂය කළ ගෙවුණු පළමු දුක්කඳ හා සැසැඳීමෙහි දී ගණනකට නො පැමිණේ. සැසැඳීමකට ද නො පැමිණේ. කලභාගයකට ද නො පැමිණේ යි. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුකැ''යි වීර්ය කටයුතු ... ''මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි වීර්ය කටයුතු යි.

## 12. 5. 10

## දුතියසිනෙරු සූත්‍රය

3892. මහණෙනි, යම්සේ සිනෙරුපව්රජ මුං පමණ වූ පහණ සකුරු සතක් තබා ක්‍ෂයවීමට ගෙවීමට යන්නේ ද, මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කිමෙක් ඉතා වැඩි ද? සිනෙරුපව්රජුගේ ක්‍ෂය වූ ගෙවුණු යමෙක් වේ නම් එය හෝ ඉතිරි වූ මුං පමණ වූ පහණ සකුරු සතෙක් වේ නම් එය හෝ දෑ යි? වහන්ස, සිනෙරුපව්රජුගේ යම් මේ ක්‍ෂය වූවෙක් ගෙවුණෙක් වේ නම් මෙය ම ඉතා බොහෝ ය. ඉතිරි වූ මුං පමණ වූ පහණසකුරු සත ඉතා මඳ ය. සිනෙරු-පව්රජුගේ ක්‍ෂය වූ ගෙවුණු කොටස හා සැසැඳීමෙහි දී ඉතිරි වූ මුං පමණ වූ පහණ සකුරු සත ගිණුමට ද නො පැමිණේ. සැසැඳීමට ද නො පැමිණේ. කලභාගයකට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම චතුස්සත්‍යාවබොධය කළ දිටුසපන් අරිසවු පුඟුල්හුගේ ක්‍ෂය වූ ගෙවුණු යම් මේ දුකෙක් වේ නම් මෙය ම ඉතා බොහෝ ය. ඉතිරි වූ දුක ඉතා මඳ ය. ක්‍ෂය වූ ගෙවුණු පළමු දුක්කඳ හා සැසැඳීමෙහි දී යමෙක් ''මේ දුකැ''යි තතුසේ දනී ද ... ''මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි තතුසේ දනී ද යන යම් මේ සත්තක්ඛත්තුපරමතාවක් වේ නම් මෙය ගිණුමට ද නො පැමිණේ. සැසඳුමකට ද නො පැමිණේ. කලභාගයකට ද නො පැමිණේ. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුකැ''යි වීර්ය කටයුතු ... ''මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි වීර්ය කටයුතු යි.

**පපාතවර්ගය පස්වැනි යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

චින්තා, පපාත, පරිළාහ, කූට, වාද, අන්ධකාර යී සයෙක් ද ඡිග්ගලසූතුරු දෙකෙක් ද අනෙක් සූතුරු දෙකෙක් ද කියන ලද හ යි.

# 6. අභිසමයවග්ගො

## 12. 6. 1

### නඛසිඛාසුත්තං

3893. අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි: තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං යො වා'යං මයා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, අයං වා මහාපඨවීති? එතදෙව භන්තෙ, බහුතරං. යදිදං මහාපඨවී, අප්පමත්තකොයං භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, සඞ්ඛම්පි න උපෙති උපනිධිම්පි න උපෙති කලභාගම්පි න උපෙති මහාපඨවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතොති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං -පෙ- යො ''ඉදං දුක්ඛන්ති'' යථාභූතං පජානාති -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යථාභූතං පජානාති. තස්මාතිහ භික්ඛවෙ, ''ඉදං දුක්ඛන්ති'' යොගො කරණීයො -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යොගො කරණීයොති.

## 12. 6. 2

### පොක්ඛරණීසුත්තං

3894. සෙය්‍යථාපි භික්ඛවෙ, පොක්ඛරණී පඤ්ඤාස යොජනානි ආයාමෙන, පඤ්ඤාස යොජනානි විත්ථාරෙන, පඤ්ඤාස යොජනානි උබ්බෙධෙන, පුණ්ණා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා. තතො පුරිසො කුසග්ගෙන උදකං උද්ධරෙය්‍ය, තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යං වා කුසග්ගෙන උදකං උබ්භතං යං වා පොක්ඛරණියා උදකන්ති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං පොක්ඛරණියා උදකං. අප්පමත්තකං කුසග්ගෙන උදකං උබ්භතං, සඞ්ඛම්පි න උපෙති උපනිධිම්පි න උපෙති කලභාගම්පි න උපෙති පොක්ඛරණියා උදකං උපනිධාය කුසග්ගෙන උදකං උබ්භතන්ති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

## 12. 6. 3

### සම්භෙජ්ජසුත්තං

3895. සෙය්‍යථාපි භික්ඛවෙ, යත්ථිමා මහානදියො සංසන්දන්ති සමෙන්ති. සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. තතො පුරිසො ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උද්ධරෙය්‍ය, තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි යං වා සම්භෙජ්ජං උදකන්ති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං සම්භෙජ්ජං උදකං, අප්පමත්තකානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි සඞ්ඛම්පි න උපෙන්ති, උපනිධිම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්ති. සම්භෙජ්ජං උදකං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානීති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

# 6. අභිසමය වර්ගය

## 12. 6. 1

## නඛසිඛා සූත්‍රය

3893. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නියසිළෙහි පස් බිඳක් නඟා භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද? කිමෙක් ඉතා බොහෝ ද? මවිසින් නියසිළෙහි නගන ලද යම් මේ පස්බිඳෙක් වේ නම් එය හෝ මේ මහපොළොව හෝ දැ යි? වහන්ස, යම් මේ මහපොළොව වේ නම් මෙය ම ඉතා බොහෝ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි නගන ලද මේ පස්බිඳ ඉතා මඳ ය. මහපොළොව හා සැසඳීමෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් නියළෙහි නගන ලද පස්බිඳ ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට දු නො පැමිණේ. කලභාගයකට දු නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම චතුස්සත්‍යාවබොධය කළ දිටුසපන් අරිසවු-පුඟුල්හුගේ ... මේ දුක ම ඉතා බොහෝ ය. යමෙක් “මේ දුකැ” යි තතුසේ දනී ද ... “මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ” යි තතුසේ දනී ද ... මහණෙනි, එහෙයින් මෙහි ලා “මේ දුකැ” යි වීර්ය කටයුතු... “මේ දුක් නැවැත්මට පමුණුවන පිළිවෙතැ” යි වීර්ය කටයුතු යි.

## 12. 6. 2

## පොක්ඛරණී සූත්‍රය

3894. මහණෙනි, යම්සේ අයමින් පනස්යොදුන් වූ විතරින් පනස්යොදුන් වූ ගැඹරින් පනස්යොදුන් වූ මුවවිට සම කොට දියෙන් පිරුණු කවුඩන් විසින් පිය හැකි පොකුණෙක් වේ ද, පුරුෂයෙක් කුසතණඅගින් එයින් දිය නගන්නේ ය. මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද? කිමෙක් ඉතා බොහෝ ද? කුසතණඅගින් යම් දියෙක් නගන ලද නම් එය හෝ පොකුණෙහි වූ දිය හෝ දැ යි? වහන්ස, පොකුණෙහි වූ යම් මේ දියෙක් වේ නම් මෙය ම ඉතා බෙහෙවි. කුසතණඅගින් නගන ලද දිය ඉතා මඳ ය. පොකුණෙහි වූ දිය හා සැසඳීමෙහි දී කුසතණඅගින් නගන ලද දිය ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට ද නො පැමිණේ. කලභාගයට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම අරිසවුහුගේ ... වීර්ය කටයුතු යි.

## 12. 6. 3

## සම්භෙජ්ජ සූත්‍රය

3895. මහණෙනි, යම්සේ මේ මහානදීහු එනම්: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී නදීහු යම් තැනෙක එක් වැ ගලාබසිත් ද එක්වෙද්ද, පුරුෂයෙක් එයින් දෙතුන් දියබිඳක් නඟන්නේ ය. මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද? කිමෙක් ඉතා බොහෝ ද? නගන ලද යම් දෙතුන් දියබිඳුහු වෙත් නම් ඔහු හෝ යම් මුසුදියෙක් වේ නම් එය හෝ දැ යි? වහන්ස, යම් මේ (සෙසුනදීන් හා) මුසුදියෙක් වේ නම් මෙය ම ඉතා බෙහෙවි. නගන ලද දෙතුන් දියබිඳුහු ඉතා මඳයැ. මුසුදිය හා සැසඳීමෙහි දී නගන ලද දෙතුන් දියබිඳුහු ගිණුමට ද නො පැමිණෙත්. සැසඳුමට ද නො පැමිණෙත්. කලභාගයට ද නො පැමිණෙත්. මහණෙනි, එසෙයින් ම අරිසවුහුගේ ... වීර්ය කටයුතු යි.

## 12. 6. 4

## දුතිය සම්භෙජ්ජසුත්තං

3896. සෙය්‍යථාපි භික්ඛවෙ, යත්‍ථිමා මහානදියො සංසන්දන්ති සමෙන්ති. සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. තං උදකං පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්‍වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං. යං වා සම්භෙජ්ජං උදකං පරික්ඛීණං පරියාදින්නං. යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති? එතදෙව භන්තෙ, බහුතරං සම්භෙජ්ජං උදකං යදිදං පරික්ඛීණං පරියාදින්නං, අප්පමත්තකානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානි, සඞ්ඛම්පි න උපෙන්ති උපනිධිම්පි න උපෙන්ති කලභාගම්පි න උපෙන්ති සම්භෙජ්ජං උදකං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

## 12. 6. 5

## පථවිසුත්තං

3897. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහාපථවියා සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිපෙය්‍ය. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං. යා වා සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිත්තා, අයං වා මහාපථවීති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාපථවී, අප්පමත්තිකා සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිත්තා, සඞ්ඛම්පි න උපෙන්ති උපනිධිම්පි න උපෙන්ති කලභාගම්පි න උපෙන්ති මහාපථවිං උපනිධාය සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා උපනික්ඛිත්තානි. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

## 12. 6. 6

## දුතිය පථවිසුත්තං

3898. සෙය්‍යථාපි භික්ඛවෙ, මහාපථවී පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්‍වා සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යං වා මහාපථවියා පරික්ඛීණං පරියාදින්නං යා වා සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා අවසිට්ඨාති? එතදෙව භන්තෙ, බහුතරං මහාපථවියා යදිදං පරික්ඛීණං පරියාදින්නං අප්පමත්තිකා සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා අවසිට්ඨා, සඞ්ඛම්පි න උපෙන්ති උපනිධිම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්ති මහාපථවියා පරික්ඛීණං පරියාදින්නං උපනිධාය සත්ත කොලට්ඨිමත්තියො ගුළිකා අවසිට්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

## 12. 6. 4

## ද්‍රුතිය සම්භෙජ්ජ සූත්‍රය

3896. මහණෙනි, යම්සේ මේ මහානදීහු එනම්: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී නදීහු යම් තැනෙක එක් වැ ගලාබයිත් ද, එක් වෙද් ද, දෙතුන් දියබිඳක් තබා ඒ දිය ක්‍ෂය වීමට සිඳීමට යන්නේ නම්. මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කිමෙක් ඉබොහෝ ද? ක්‍ෂය වූ සිඳුණු යම් මුසු දියෙක් වේ නම් එය හෝ ඉතිරි වූ යම් දෙතුන් දියබිඳුහු වෙත් නම් ඔහු හෝ ද යි? වහන්ස, ක්‍ෂය වූ සිඳුණු යම් මේ මුසුදියෙක් වේ නම් මෙය ම ඉබොහෝ ය. ඉතිරි වූ දෙතුන් දියබිඳුහු ඉමඳහ. ක්‍ෂය වූ සිඳුණු මුසුදිය හා සැසඳීමෙහි දී ඉතිරි වූ දෙතුන් දියබිඳුහු ගිණුමට ද නො පැමිණෙත්. සැසඳුමට ද නො පැමිණෙත්. කලභාගයට ද නො පැමිණෙත්. මහණෙනි, එසෙයින් ම අරිසවුහුගේ ... වීයත් කටයුතු යි.

## 12. 6. 5

## පඨවි සූත්‍රය

3897. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මහපොළොවෙහි ඩෙබරඇට පමණ වූ ගුලි සතක් බහා තබන්නේ නම් මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කිමෙක් ඉබොහෝ ද? ඩෙබරඇට පමණ වූ බහා තබන ලද යම් සත්ගුළියෙක් වේ නම් එය හෝ මේ මහපොළොව හෝ ද යි? වහන්ස, යම් මේ මහපොළොව වේ ද, මෙය ම ඉබොහෝ යි. බහා තබන ලද ඩෙබරඇට පමණ වූ සත්ගුළිය ඉතා මඳ ය. මහපොළොව හා සැසැඳීමෙහි දී ඩෙබරඇට පමණ වූ බහා තබන ලද සත්ගුළිය ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට ද නො පැමිණේ. කලභාගයට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම අරිසවුහුගේ ... වීයත් කටයුතු යි.

## 12. 6. 6

## ද්‍රුතිය පඨවි සූත්‍රය

3898. මහණෙනි, යම්සේ මහපොළොව ඩෙබර ඇට පමණ වූ සත්ගුළියක් තබා ක්‍ෂය වීමට ගෙවීමට යන්නේ ද, මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කිමෙක් ඉබොහෝ ද? මහපොළොවෙහි ක්‍ෂය වූ ගෙවුණු යමෙක් වේ නම් එය හෝ ඉතිරි වූ ඩෙබරඇට පමණ වූ යම් සත්ගුළියෙක් වේ නම් එය හෝ ද යි? වහන්ස, මහපොළොවෙහි යම් මේ ක්‍ෂය වූවෙක් ගෙවුණෙක් වේ නම් මෙය ම ඉබෙහෙවි. ඉතිරි වූ ඩෙබරඇට පමණ වූ සත්ගුළිය ඉතා මඳ ය. මහපොළොවෙහි ක්‍ෂය වූ ගෙවුණු කොටස හා සැසඳීමෙහි දී ඉතිරි වූ ඩෙබරඇට පමණ වූ සත්ගුළිය ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට ද නො පැමිණේ. කලභාගයට ද නො පැමිණේ. මහණෙනි, එමෙන් ම අරිසවුහුගේ ... වීයත් කටයුතු යි.

## 12. 6. 7

### සමුද්දසුත්තං

3899. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහාසමුද්දතො[1] ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උද්ධරෙය්‍ය. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි, යං වා සමුද්දෙ උදකන්ති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාසමුද්දෙ උදකං, අප්පමත්තකානි, ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානි, සඞ්ඛම්පි න උපෙන්ති උපනිධිම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්ති. මහාසමුද්දෙ උදකං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි උබ්භතානීති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති:

## 12. 6. 8

### දුතිය සමුද්දසුත්තං

3900. සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො[2] පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යං වා මහාසමුද්දෙ උදකං පරික්ඛීණං පරියාදින්නං, යානි වා ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති? එතදෙව භන්තෙ, බහුතරං මහාසමුද්දෙ උදකං යදිදං පරික්ඛීණං[3] පරියාදින්නං, අප්පමත්තකානි ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානි. සඞ්ඛම්පි න උපෙන්ති, උපනිධිම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්ති මහාසමුද්දෙ උදකං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය ද්වෙ වා තීණි වා උදකඵුසිතානි අවසිට්ඨානීති. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

## 12. 6. 9

### පබ්බතූපමසුත්තං

3901. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො හිමවතො පබ්බතරාජස්ස සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිපෙය්‍ය. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යා වා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා හිමවා වා පබ්බතරාජාති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං හිමවා පබ්බතරාජා අප්පමත්තිකා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තා. සඞ්ඛම්පි න උපෙන්ති උපනිධිම්පි න උපෙන්ති කලභාගම්පි න උපෙන්ති හිමවන්තං පබ්බතරාජානං උපනිධාය. සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා උපනික්ඛිත්තානි. එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- යොගො කරණීයොති.

1. මහාසමුද්දෙ - සයා, සී 1, 2.
2. මහාසමුද්දෙ උදකං - මජසං.
3. උදකං පරික්ඛීණං - සයා.

## 12. 6. 7

## සමුද්‍ර සූත්‍රය

3899. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මහමුහුදෙන් දෙතුන් දියබිඳක් නගන්නේ ද, මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද? කිමෙක් ඉබොහෝ ද? නගන ලද, යම් දෙතුන් දියබිඳුහු වෙත් නම් ඔහු හෝ මුහුදෙහි යම් දියෙක් වේ නම් එය හෝ ද යි? වහන්ස, මහමුහුදෙහි යම් දියෙක් වේ නම් මෙය ම ඉබෙහෙවි. නගන ලද දෙතුන් දියබිඳු ඉතා මඳ ය. මහමුහුදෙහි දිය හා සැසැඳීමෙහි දී නගන ලද දෙතුන් දියබිඳු ඉතා මඳය, මහමුහුදෙහි දිය හා සැසැඳීමෙහි දී නගන ලද දෙ තුන් දියබිඳු ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට ද නො පැමිණේ. කලභාගයට ද නො පැමිණේ. මහණෙනි, එපරිද්දෙන් ම අරිසවුහුගේ ... වියයුතු කටයුතු යි.

## 12. 6. 8

## දුතියසමුද්‍ර සූත්‍රය

3900. මහණෙනි, යම්සේ මහමුහුද දෙතුන් දියබිඳක් තබා ක්‍ෂය වීමට ගෙවීමට යන්නේ ද, මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? කිමෙක් ඉබොහෝ ද? මහමුහුදෙහි ක්‍ෂය වූ සිඳුණු යම් දියෙක් වේ නම් එය හෝ ඉතිරි වූ දෙතුන් දියබිඳෙක් වේ නම් එය හෝ ද යි? වහන්ස, මහමුහුදෙහි ක්‍ෂය වූ සිඳුණු යම් මේ දියෙක් වේ නම් මෙය ම ඉබෙහෙවි. ඉතිරි වූ දෙතුන් දියබිඳු ඉතා මඳ ය. මහමුහුදෙහි ක්‍ෂය වූ සිඳුණු දිය හා සැසඳීමෙහි දී ඉතිරි වූ දෙතුන් දියබිඳු ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට ද නො පැමිණේ. කලභාගයට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම අරිසවුහුගේ ... වියයුතු කටයුතු යි.

## 12. 6. 9

## පබ්බතූපම සූත්‍රය

3901. මහණෙනි, යම්සේ පුරුෂයෙක් හිමවත් පවුරජහුගේ අබ පමණ වූ පහණසකුරු සතක් බහා තබන්නේ ද, මහණෙනි, ඒ කිමැ''යි හඟිවු ද? කිමෙක් ඉබොහෝ ද? බහා තබන ලද අබ පමණ වූ යම් පහණසකුරු සතෙක් වේ නම් එය හෝ හිමවත් පවුරජ හෝ ද යි? වහන්ස, යම් මේ හිමවත් පවුරජෙක් වේ නම් හේ ම ඉබෙහෙවි. බහා තබන ලද අබ පමණ වූ පහණසකුරු සත ඉතා මඳ ය. හිමවත් පවුරජු හා සැසැඳීමෙහි දී බහා තබන ලද අබ පමණ වූ පහණසකුරු සත ගිණුමට ද නො පැමිණේ. සැසැඳුමට ද නො පැමිණේ. කලභාගයට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම අරිසවුහුගේ ... වියයුතු කටයුතු යි.

## 12. 6. 10

## දුතිය පබ්බතූපමසුත්තං

3902. සෙය්‍යථාපි භික්ඛවෙ, හිමවා පබ්බතරාජා පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය ඨපෙත්වා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යං වා හිමවතො පබ්බතරාජස්ස පරික්ඛීණං පරියාදින්නං, යා වා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨාති? එතදෙව භන්තෙ, බහුතරං හිමවතො පබ්බතරාජස්ස යදිදං පරික්ඛීණං පරියාදින්නං. අප්පමත්තිකා සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨා. සඞ්ඛම්පි න උපෙන්ති, උපනිධිම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්ති හිමවතො පබ්බතරාජස්ස පරික්ඛීණං පරියාදින්නං උපනිධාය සත්ත සාසපමත්තියො පාසාණසක්ඛරා අවසිට්ඨාති.

එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකස්ස දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස අභිසමෙතාවිනො එතදෙව බහුතරං දුක්ඛං යදිදං පරික්ඛීණං පරියාදින්නං අප්පමත්තකං අවසිට්ඨං. සඞ්ඛම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති, කලභාගම්පි න උපෙති පුරිමං දුක්ඛක්ඛන්ධං පරික්ඛීණං පරියාදින්නං උපනිධාය යදිදං සත්තක්ඛත්තු[1]පරමතා. යො ''ඉදං දුක්ඛ''න්ති යථාභූතං පජානාති. ''අයං දුක්ඛසමුදයො''ති යථාභූතං පජානාති. ''අයං දුක්ඛනිරොධො''ති යථාභූතං පජානාති. ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යථාභූතං පජානාති. තස්මාතිහ භික්ඛවෙ, ''ඉදං දුක්ඛ''න්ති යොගො කරණීයො -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යොගො කරණීයොති.

## අභිසමයවග්ගො ඡට්ඨො.

**තස්සුද්දානං:**

නඛසිඛා පොක්ඛරණී ච සම්භෙජ්ජා අපරෙ දුවෙ,
පථවී ද්වෙ සමුද්දා ද්වෙ දුවෙ ච පබ්බතූපමාති.

1. සත්තක්ඛත්තුං පරමතා - සීමු, ස්‍යා.

## 12. 6. 10

## දුතියපබ්බතූපම සූත්‍රය

3902. මහණෙනි, යම්සේ හිමවත් පවුරජ අබ පමණ වූ පහණසකුරු (ගල්කැට) සතක් තබා ක්‍ෂය වීමට ගෙවීමට යන්නේ ද, මහණෙනි, ''ඒ කිමැ''යි හඟිවුද? කිමෙක් ඉබොහෝ ද? හිමවත් පවුරජුගේ යම් ක්‍ෂය වූවෙක් ගෙවුණෙක් වේ නම් එය හෝ ඉතිරි වූ අබ පමණ වූ යම් පහණසකුරු සතෙක් වේ නම් එය හෝ දැයි.? වහන්ස, හිමවත් පවුරජුගේ යම් මේ ක්‍ෂය වූවෙක් ගෙවුණෙක් වේ නම් මෙය ම ඉතා බෙහෙවි. අබ පමණ වූ ඉතිරි වූ සත්පහණසකුරු ඉතා මඳ ය. හිමවත් පවුරජුගේ ක්‍ෂය වූ ගෙවුණු කොටස හා සැසඳීමෙහි දී අබ පමණ වූ ඉතිරි සත්පහණසකුරු ගිණුමටත් නො පැමිණේ. සැසඳුමටත් නො පැමිණේ. කලභාගයටත් නො පැමිණේ යි.

මහණෙනි, එසෙයින් ම සිවුසස් පිළිවිදි දිටුසපන් අරිසවු දුහුල්හුගේ ක්‍ෂය වූ ගෙවුණු යම් මේ දුකෙක් වේ නම් මෙය ම ඉතා බෙහෙවි. ඉතිරි වූ දුක මඳ ය. යමෙක් ''මේ දුකැ''යි තතුසේ දනී ද, ''මේ දුක් හටගැනුමැ''යි තතුසේ දනී ද, ''මේ දුක් වැළැක්මැ''යි තතුසේ දනී ද. ''මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි තතුසේ දනී ද යන යම් මේ සත්‍යාභිසමයකාරකත්වයක් වේ ද, එය ක්‍ෂය වූ ගෙවුණු පළමු දුක්කඳ හා සැසඳීමෙහි දී ගිණුමටත් නො පැමිණේ. සැසඳුමටත් නො පැමිණේ. කලභාගයටත් නො පැමිණේ. මහණෙනි, එහෙයින් මෙහිලා ''මේ දුකැ''යි වියරු කටයුතු ... ''මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි වියරු කටයුතු යි.

## සවැනි අභිසමයවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

නඛසිඛා, පොක්ඛරණී යි දෙකෙක් ද අනෙක් සම්භේජ්ජ සුතුරු දෙකෙක් ද පඨවි සුතුරුදෙකෙක් ද සමුද්දසුතුරු දෙකෙක් ද පබ්බතූපම සුතුරු දෙකෙක් දැයි මුළුල්ල දසයෙකි යි.

# 7. ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො

## 12. 7. 1

### අඤ්ඤත්‍රසුත්තං

3903. අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි: ''තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං. යො වා'යං මයා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, අයං වා මහාපඨවී''ති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාපඨවී, අප්පමත්තකො,යං භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, සඞ්ඛම්පි න උපෙති. උපනිධිම්පි න උපෙති, කලභාගම්පි න උපෙති මහාපඨවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතොති. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අඤ්ඤත්‍ර මනුස්සෙහි[1] පච්චාජායන්ති. තං කිස්ස හෙතු? අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනියාපටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති යොගො කරණීයො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 7. 2

### පච්චන්තසුත්තං

3904. අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි: ''තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යො වා'යං මයා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, අයං වා මහාපඨවී''ති? එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාපඨවී, අප්පමත්තකොයං භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො. සඞ්ඛම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති, කලභාගම්පි න උපෙති මහාපඨවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතොති. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා[2] තෙ සත්තා යෙ මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පච්චන්තිමෙසු ජනපදෙසු පච්චාජායන්ති අවිඤ්ඤාතාරෙසු මිලක්ඛෙසු -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යොගො කරණීයොති.

## 12. 7. 3

### පඤ්ඤාසුත්තං

3905. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ අරියෙන පන පඤ්ඤාචක්ඛුනා[3] සමන්නාගතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අවිජ්ජාගතා සම්මූළ්හා -පෙ- ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යොගො කරණීයොති.

1. මනුස්සෙසු - සීමු.
2. අප්පමත්තකා - මජ්ඣං, සයා.
3. ඤාණචක්ඛුනා - අට්ඨකථා.

# 7. ආමකධඤ්ඤපෙය්‍යාල වර්ගය

## 12. 7. 1

## අඤ්ඤත්‍ර සූත්‍රය

3903. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නියසිළෙහි පස් බිඳක් නගා භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, ඒ කිමැයි හඟිවූ ද? කිමෙක් ඉතා බොහෝ ද? මා විසින් නියසිළෙහි යම් පස්බිඳෙක් නගන ලද නම් එය හෝ මේ මහපොළොව හෝ ද යි. වහන්ස, යම් මේ මහපොළොව වේ නම් මෙය ම ඉබෙහෙවි. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි නගන ලද මේ පස්බිඳ ඉතා මඳ ය. මහපොළොව හා සැසඳීමෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් නිය සිළෙහි නගන ලද පස්බිඳ ගිණුමටත් නො පැමිණේ. සැසඳීමටත් නො පැමිණේ. කලභාගයටත් නො පැමිණේ යි. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු අල්පය. වැලි යම් සත්ව කෙනෙක් මිනිසුන් කෙරෙන් අන් තන්හි උපදිත් නම් ඔහු ම ඉබොහෝහ. ඒ කවර හෙයින යත්: චතුරාර්‍ය්‍යසත්‍යය නො දුටු බැවිනි. කවර චතුරාර්‍ය්‍යසත්‍යයක යත්: ''දුඃඛාර්‍ය්‍යසත්‍යය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය''යි. මහණෙනි, එහෙයින් මෙහිලා ''මේ දුක්ඛ''යි වීර්‍ය්‍ය කට යුතු....''මේ දුක්ඛනිරොධගාමිනී පටිපද''යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 7. 2

## පච්චන්ත සූත්‍රය

3904. එකල්හි භග්‍යවතුන් වහන්සේ නියසිළෙහි පස්බිඳක් නගා භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, ඒ කිමැයි හඟිවූ ද? කිමෙක් ඉබොහෝ ද? මවිසින් නියසිළෙහි යම් මේ පස්බිඳෙක් නගන ලද නම් එය හෝ මේ මහපොළොව හෝ දයි. වහන්ස, යම් මේ මහපොළොවක් වේ නම් මෙය ම ඉබෙහෙවි. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි නගන ලද මේ පස්බිඳ ඉතා මඳය. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි නගන ලද පස්බිඳ මහපොළොව හා සැසඳීමෙහි දී ගිණුමට ද නො පැමිණේ. සැසඳුමට ද නො පැමිණේ. කලාවෙන් කලාවට ද නො පැමිණේ. මහණෙනි, එසෙයින් ම මධ්‍යමජනපදයන්හි යම් සත්ව කෙනෙක් උපදිත් නම් ඒ සත්වයෝ මඳයහ. වැලි යම් සත්ව කෙනෙක් අප්‍රසිද්ධ වූ අශිෂ්ට වූ පැසුළු දනව්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 7. 3

## පඤ්ඤා සූත්‍රය

3905. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් ආර්‍ය්‍ය වූ ලොව් ලොවුතුරු නුවණැසින් සමන්වාගත වෙත් නම් ඒ සත්වයෝ මඳය හ, වැලි යම් කෙනෙක් අවිද්‍යායෙන් යුතු වූවාහු මුළා වූවෝ වෙද්ද මේ සත්වයෝ ම ඉබොහෝහ ... මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ යි වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 7. 4

### සුරාමෙරයසුත්තං

3906. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ සුරාමෙරයමජ්ජපමාදට්ඨානා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 7. 5

### ඔදකජසුත්තං

3907. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ථලජා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ඔදකජා -පෙ- යොගො කරණීයොති.

## 12. 7. 6

### මත්තෙය්‍යසුත්තං

3908. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මත්තෙය්‍යා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අමත්තෙය්‍යා -පෙ- යොගො කරණීයොති.

## 12. 7. 7

### පෙත්තෙය්‍යසුත්තං

3909. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තෙය්‍යා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අපෙත්තෙය්‍යා -පෙ- යොගො කරණීයොති.

## 12. 7. 8

### සාමඤ්ඤසුත්තං

3910. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ සාමඤ්ඤා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අසාමඤ්ඤා -පෙ- යොගො කරණීයොති.

## 12. 7. 4

### සුරාමෙරය සූත්‍රය

3906. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් ප්‍රමාදයට කරුණු වූ රහමෙරමත්පැනින් වැළකුණාහු නම් ඒ සත්ත්වයෝ මඳයහ. වැලි යම් සත්ත්ව කෙනෙක් ප්‍රමාදයට කරුණු වූ රහමෙර මත්පැනින් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වියයුතු කටයුතු යි.

## 12. 7. 5

### ඕදකජ සූත්‍රය

3907. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් ගොඩබිම උපදනාහු ද ඒ සත්ත්වයෝ මඳයහ. වැලි යම් සත්ත්ව කෙනෙක් දියෙහි උපදනෝ ද මේ සත්ත්වයෝ ම ඉබොහෝහ ... වියයුතු කටයුතු යි.

## 12. 7. 6

### මත්තෙය්‍ය සූත්‍රය

3908. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් මවට හිත වූවෝ ද, ඔහු මඳයහ. වැලි යම් සත්ත්ව කෙනෙක් මවට හිත නුවූවෝ ද මොහු ම ඉබොහෝහ ... වියයුතු කටයුතු යි.

## 12. 7. 7

### පෙත්තෙය්‍ය සූත්‍රය

3909. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් පියාට හිත වූවෝ ද ඔහු මඳයහ. වැලි යම් සත්ත්ව කෙනෙක් පියාට හිත නුවූවෝ ද මොහු ම ඉබොහෝහ ... වියයුතු කටයුතු යි.

## 12. 7. 8

### සාමඤ්ඤ සූත්‍රය

3910. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් මහණුන්ට හිත වූවෝ නම් ඔහු මඳයහ. වැලි යම් සත්ත්ව කෙනෙක් මහණුන්ට හිත නුවූවෝ නම් මොහු ම ඉබොහෝහ ... වියයුතු කටයුතු යි.

## 12. 7. 9

### බ්‍රහ්මඤ්ඤසුත්තං

3911. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ බ්‍රහ්මඤ්ඤා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අබ්‍රහ්මඤ්ඤා -පෙ- යොගො කරණීයොති.

## 12. 7. 10

### අපචායීසුත්තං

3912. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ කුලෙජෙට්ඨාපචායිනො. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අකුලෙජෙට්ඨාපචායිනො -පෙ- යොගො කරණීයොති.

**ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො සත්තමො.**

තත්‍රුද්දානං :

අඤ්ඤත්‍ර පච්චන්තං පඤ්ඤා ච සුරාමෙරයොදකජා,
මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤං බ්‍රහ්මඤ්ඤඤ්ඤාපචායීති.

## 12. 7. 9

## බ්‍රහ්මඤ්ඤ සූත්‍රය

3911. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් බමුණන්ට හිත වූවෝ ද ඒ සත්වයෝ මඳයහ. වැලි යම් කෙනෙක් බමුණන්ට හිත නුවූවෝ ද මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීයත්න කටයුතු යි.

## 12. 7. 10

## අපචායී සූත්‍රය

3912. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් කුලදෙටුවන් පුදන්නෝ නම් ඔහු මඳයහ. වැලි යම් සත්ව කෙනෙක් කුලදෙටුවන් නොපුදන්නෝ නම් මොහු ම ඉබොහෝහ ... වීයත්න කටයුතු යි.

### සත්වැනි ආමකධඤ්ඤපෙය්‍යාල වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

අඤ්ඤත්‍ර පච්චන්ත පඤ්ඤා සුරාමෙරය ඕදකජ සූත්‍රද මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤ බ්‍රහ්මඤ්ඤ අපචායී සූත්‍රද යි දසයෙකි යි.



Free Distribution www.aathaapi.org

# 8. දුතිය ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො

## 12. 8. 1

### පාණාතිපාතසුත්තං

3913. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පාණාතිපාතා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පාණාතිපාතා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 2

### අදින්නාදානසුත්තං

3914. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ අදින්නාදානා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අදින්නාදානා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 3

### කාමෙසුමිච්ඡාචාරසුත්තං

3915. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ කාමෙසුමිච්ඡාචාරා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ කාමෙසුමිච්ඡාචාරා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 4

### මුසාවාදසුත්තං

3916. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මුසාවාද පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මුසාවාද අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 5

### පිසුණවාචාසුත්තං

3917. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පිසුනාය වාචාය[1] පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පිසුනාය වාචාය අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 6

### ඵරුසවාචාසුත්තං

3918. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ඵරුසාය වාචාය[2] පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ඵරුසාය වාචාය අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

---

1. පිසුණවාචාය - සී. මු.
2. ඵරුසවාචාය - සී. මු.

# 8. දුතිය ආමකධඤ්ඤපෙය්‍යාල වර්ගය

## 12. 8. 1

### පාණාතිපාත සූත්‍රය

3913. මහණෙනි, එසෙයින්ම යම් සත්වකෙනෙක් පණිවායෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැලි යම් සත්වකෙනෙක් පණිවායෙන් නොවැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඎ කටයුතුයි.

## 12. 8. 2

### අදින්නාදන සූත්‍රය

3914. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් අයිනාදනින් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැලි යම් සත්වකෙනෙක් අයිනාදනින් නො වැළකුණාහු නම් මොහුම ඉබොහෝහ ... වීයඎ කටයුතු යි.

## 12. 8. 3

### කාමෙසුමිච්ඡාචාර සූත්‍රය

3915. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් කාමයෙහි මිසහසරින් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැලි යම් සත්ව කෙනෙක් කාමයෙහි මිසහසරින් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඎ කටයුතු යි.

## 12. 8. 4

### මුසාවාද සූත්‍රය

3916. මහණෙනි, එසෙයින්ම යම් සත්ව කෙනෙක් මුසවායෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැලි යම් සත්ව කෙනෙක් මුසවායෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඎ කට- යුතු යි.

## 12. 8. 5

### පිසුණවාචා සූත්‍රය

3917. මහණෙනි, එසෙයින් ම යම් සතවකෙනෙක් පිසුණුබසින් වැළකුණාහු නම් ඒ සත්වයෝ මඳයහ. වැලි යම් සතවකෙනෙක් පිසුණු බසින් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීයඎ කටයුතු යි.

## 12. 8. 6

### ඵරුසවාචා සූත්‍රය

3918. මහණෙනි, එසෙයින් ම යම් සතවකෙනෙක් රළුබසින් වැළකුණාහු නම් ඒ සත්වයෝ මඳයහ. යළි යම් සත්වකෙනෙක් රළුබසින් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීයඎ කට- යුතු යි.

## 12. 8. 7

## සම්ඵප්පලාපසුත්තං

3919. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ සම්ඵප්පලාපා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ සම්ඵප්පලාපා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 8

## බීජගාමසුත්තං

3920. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ බීජගාමභූතගාමසමාරම්භා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 9

## විකාලභොජනසුත්තං

3921. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ විකාලභොජනා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ විකාලභොජනා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 8. 10

## විලෙපනසුත්තං

3922. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

**දුතිය ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො අට්ඨමො.**

**තත්‍රුද්දානං :**

පාණං අදින්නං කාමෙසු මුසාපෙසුඤ්ඤඵරුසා,
සම්ඵප්පලාපං බීජඤ්ච විකාලො ච විලෙපනන්ති.

## 12. 8. 7

### සම්ඵප්පලාප සූත්‍රය

3919. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් හිස්බසින් වැළකුණාහු නම් ඔහු මදයහ. වැලි යම් සත්ව කෙනෙක් හිස්බසින් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කට යුතු යි.

## 12. 8. 8

### බීජගාම සූත්‍රය

3920. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් ගස්තුරුලිය කලකුරුවීමෙන් වැළකුණාහු නම් ඔහු මදයහ. වැලි යම් සත්ව කෙනෙක් ගස්තුරුලිය කලකුරුවීමෙන් නොවැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 8. 9

### විකාලභොජන සූත්‍රය

3921. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් විකල් බොජුනෙන් වැළකුණාහු නම් ඔහු මදයහ. වැලි යම් සත්ව කෙනෙක් විකල් බොජුනෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ. ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 8. 10

### විලෙපන සූත්‍රය

3922. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් මල්ගඳ විලෙවුන් දැරුමට අඩු තැන් පිරවුමට සැරසුමට හෙතු වූ කරුණින් වැළකුණාහු නම් ඔහු මදයහ. වැලි යම් සත්වකෙනෙක් මල්ගඳ විලෙවුන් දැරුමට අඩුතැන් පිරවුමට සැරසුමට හෙතු වූ කරුණින් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කට යුතු යි.

**අටවැනි දුතිය ආමකධඤ්ඤපෙය්‍යාල වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

පාණාතිපාත, අදින්නාදාන, කාමෙසුමිච්ඡාචාර, මුසාවාද, පිසුණාවාචා ඵරුසාවාචා, සම්ඵප්පලාප, බීජගාම, විකාලභොජන, විලෙපන යි සූත්‍ර දසයෙකි යි.

# 9. තතිය ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො

## 12. 9. 1

### නච්චගීතසුත්තං

3923. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නච්චගීතවාදිතවිසූකදස්සනා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 9. 2

### උච්චාසයනසුත්තං

3924. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ උච්චාසයනමහාසයනා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ උච්චාසයනමහාසයනා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 9. 3

### ජාතරූපසුත්තං

3925. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ජාතරූපරජතපටිග්ගහණා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 9. 4

### ආමකධඤ්ඤසුත්තං

3926. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ආමකධඤ්ඤපටිග්ගහණා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 9. 5

### ආමකමංසසුත්තං

3927. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ආමකමංසපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ආමකමංසපටිග්ගහණා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති

# 9. නතිය ආමකධඤ්ඤ පෙය්‍යාල වර්ගය

## 12. 9. 1

## නච්චගීත සූත්‍රය

3923. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් නැටුමෙන් ගැයුමෙන් වැයුමෙන් විසූළු දස්සෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැලි යම් සත්වකෙනෙක් නැටුමෙන් ගැයුමෙන් වැයුමෙන් විසූළු දස්සෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයා කටයුතු යි.

## 12. 9. 2

## උච්චාසයන සූත්‍රය

3924. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් උසසුන් මහ අස්නෙන් වැළකුණාහු නම් ඒ සත්වයෝ මඳයහ. වැලි යම් සත්වකෙනෙක් උසසුන් මහ අස්නෙන් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීයා කටයුතු යි.

## 12. 9. 3

## ජාතරූප සූත්‍රය

3925. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් රන්රිදී මසුකහවණු පිළිගැනුමෙන් වැළකුණාහු නම් ඒ සත්වයෝ මඳයහ. වැළි යම් සත්ව කෙනෙක් රන්රිදී මසුකහවණු පිළිගැනුමෙන් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීයා කටයුතු යි.

## 12. 9. 4

## ආමකධඤ්ඤ සූත්‍රය

3926. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් අමුධාන්‍ය පිළිගැනුමෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැළි යම් සත්ව කෙනෙක් අමුධාන්‍ය පිළිගැනුමෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයා කටයුතු යි.

## 12. 9. 5

## ආමකමංස සූත්‍රය

3927. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් අමුමස් පිළිගැන්මෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැළි යම් සත්ව කෙනෙක් අමුමස් පිළිගැන්මෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයා කටයුතු යි.

## 12. 9. 6

### කුමාරිකසුත්තං

3928. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ඉත්ථිකුමාරිකපටිග්ගහණා අප්පටිවිරතා –පෙ– යොගො කරණීයොති.

## 12. 9. 7

### දසිදසසුත්තං

3929. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දසිදසපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දසිදසපටිග්ගහණා අප්පටිවිරතා –පෙ– යොගො කරණීයොති.

## 12. 9. 8

### අජෙළකසුත්තං

3930. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ අජෙළකපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අජෙළකපටිග්ගහණා අප්පටිවිරතා –පෙ– යොගො කරණීයොති.

## 12. 9. 9

### කුක්කුටසූකරසුත්තං

3931. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ කුක්කුටසූකරපටිග්ගහණා අප්පටිවිරතා –පෙ– යොගො කරණීයොති.

## 12. 9. 10

### වළවාසුත්තං

3932. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ හත්ථිගවාස්සවළවාපටිග්ගහණා අප්පටිවිරතා –පෙ– යොගො කරණීයොති.

**තතිය ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො නවමො.**

**තත්‍රුද්දානං :**

නච්චුච්චාසයනරජතා ධඤ්ඤං මංසං කුමාරිකං,
දසිදසාජෙළකා ච කුක්කුටවළවෙහි වාති

1. ඉත්ථිකුමාරි - සී 1, 2.

## 12. 9. 6

## කුමාරික සූත්‍රය

3928. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් (විවාහක) ඉතිරි (අවිවාහක) කුමරියන් පිළිගැනුමෙන් වැළකුණාහු නම් ඔහු මදයහ. වැලි යම සත්ව කෙනෙක් ඉතිරිකුමරියන් පිළිගැනුමෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීය්‍ය කට යුතු යි.

## 12. 9. 7

## දසිදස සූත්‍රය

3929. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් දසිදසුන් පිළිගැනුමෙන් වැළකුණාහු නම් ඔහු මදයහ. වැලි යම් සත්ව කෙනෙක් දසිදසුන් පිළිගැනුමෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීය්‍ය කටයුතු යි.

## 12. 9. 8

## අජෙළක සූත්‍රය

3930. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් එළුතිරෙළුන් පිළිගැන්මෙන් වැළකුණාහු නම් ඒ සත්වයෝ මදයහ. යළි යම් කෙනෙක් එළුතිරෙළුන් පිළිගැන්මෙන් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීය්‍ය කටයුතු යි.

## 12. 9. 9

## කුක්කුට සූකර සූත්‍රය

3931. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළකුණාහු නම් ඒ සත්වයෝ මදයහ. යළි යම් කෙනෙක් කුකුළන් හා හූරන් පිළිගැන්මෙන් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීය්‍ය කටයුතු යි.

## 12. 9. 10

## වළවා සූත්‍රය

3932. මහණෙනි, එසෙයින් ම යම් කෙනෙක් ඇතුන් ගෙරින් අසුන් වෙළඹුන් පිළිගැන්මෙන් වැළකුණාහු නම් ඒ සත්වයෝ මදයහ. වැලි යම් කෙනෙක් ඇතුන් ගෙරින් අසුන් වෙළඹුන් පිළිගැන්මෙන් නො වැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීය්‍ය කටයුතු යි.

**නවවැනි තතිය ආමකධඤ්ඤ පෙය්‍යාල වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

නච්චගීත, උච්චාසයන, ජාතරූප, ආමකධඤ්ඤ, ආමකමංස කුමාරික, දසිදස, අජෙළක යන සූත්‍ර අට හා කුක්කුට සූකර වළවා සූත්‍ර දෙක යි සූත්‍ර දශයෙකි.

# 10. චතුත්ථ ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො

## 12. 10. 1

### ඛෙත්තවත්ථුසුත්තං

3933. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ඛෙත්තවත්ථුපටිග්ගහණා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 10. 2

### කයවික්කයසුත්තං

3934. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ කයවික්කයා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ කයවික්කයා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 10. 3

### දූතෙය්‍යසුත්තං

3935. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දූතෙය්‍යපහිණ[1]ගමනානුයොගා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දූතෙය්‍යපහිණගමනානුයොගා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 10. 4–6

### තුලාකූටාදිසුත්තානි

3936–3938. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තුලාකූට-කංසකූට-මානකූටා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තුලාකූට-කංසකූට-මානකූටා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

## 12. 10. 7–9

### උක්කොටනාදිසුත්තානි

3939–3941. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ උක්කොටන-වඤ්චන-නිකතිසාචියොගා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ උක්කොටන-වඤ්චන-නිකතිසාචියොගා අප්පටිවිරතා -පෙ- යොගො කරණීයොති.

1. පහෙණ - අට්ඨකථා.

# 10. චතුත්ථ ආමකධඤ්ඤපෙය්‍යාල වර්ගය

## 12. 10. 1

### ඛෙත්තවත්ථු සූත්‍රය

3933. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් කෙත්වතු පිළිගැන්මෙන් වැළකුණාහු නම් ඒ සත්වයෝ මඳයහ. යළි යම් සත්වකෙනෙක් කෙත්වතු පිළිගැන්මෙන් නොවැළකුණාහු නම් මේ සත්වයෝ ම ඉබොහෝහ ... වීයඃ කටයුතු යි.

## 12. 10. 2

### කයවික්කය සූත්‍රය

3934. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් මිල දී ගැනුමෙන් විකුණුමෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැළි යම් සත්වකෙනෙක් මිල දී ගැනුමෙන් විකුණුමෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඃ කටයුතු යි.

## 12. 10. 3

### දූතෙය්‍ය සූත්‍රය

3935. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් ගිහියන්ගේ පණිවුඩපනත්මෙහෙවර කිරීමෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. යළි යම් සත්වකෙනෙක් ගිහියන්ගේ පණිවුඩපනත් මෙහෙවර කිරීමෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඃ කටයුතු යි.

## 12. 10. 4 – 6

### තුලාකූටාදි සූත්‍රය

3936 – 3938. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් කුළුතුලා – කුළුලොහො – කුළුමිනුමින් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැළි යම් සත්වකෙනෙක් කුළුතුලා – කුළුලොහො කුළුමිනුමින් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඃ කටයුතු යි.

## 12. 10. 7 - 9

### උක්කොටනාදි සූත්‍ර

3939. – 3941. මහණෙනි, එසෙයින් ම යම් සත්වකෙනෙක් ලස් ගැනුම් මුළා කිරිම් රැවටීම් සඞ්ඛ්‍යාත වඤ්චනික ක්‍රියායෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැළි යම් සත්වකෙනෙක් ලස් ගැනුම් මුළා කිරිම් රැවටීම් සඞ්ඛ්‍යාත වඤ්චනික ක්‍රියායෙන් නො වැළකුණාහු නම් මොහු ම ඉබොහෝහ ... වීයඃ කටයුතු යි.

## 12. 10. 10-15

## ඡේදනාදිසුත්තානි

3942-3947. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ ඡේදන-වධ-බන්ධන-විපරාමොස-ආලොප-සහසාකාරා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ ඡේදන-වධ-බන්ධන-විපරාමොස-ආලොප-සහසාකාරා අප්පටිවිරතා. තං කිස්ස හෙතු; අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස, දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධගාමිනියාපටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, ''ඉදං දුක්ඛ''න්ති යොගො කරණීයො. ''අයං දුක්ඛසමුදයො''ති යොගො කරණීයො. ''අයං දුක්ඛනිරොධො''ති යොගො කරණීයො. ''අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා''ති යොගො කරණීයොති.

### චතුත්ථ ආමකධඤ්ඤපෙය්‍යාලවග්ගො දසමො.

තස්සුද්දානං:

ඛෙත්තං කයං දූතෙය්‍යඤ්ච තුලාකූටං කංසකූටං,
මානකූටං උක්කොටනං වඤ්චනනිකති, ඡේදනා,
වධබන්ධනං විපරාමොසාලොපසාහසානීති.

Free Distribution www.aathaapi.org

## 12. 10. 10–15

## ඡේදනාදි සූත්‍ර

3942 – 3947. මහණෙනි, එසෙයින්ම යම් සත්ව කෙනෙක් සිඳුම් මැරුම් බැඳුම් පැහැර ගැනුම් ගම්පැහැරුම් අබිබවා ගැනුම් ක්‍රියායෙන් වැළකුණාහු නම් ඔහු මඳයහ. වැළි යම් සත්ව කෙනෙක් සිඳුම් මැරුම් බැඳුම් පැහැර ගැනුම් ගම්පැහැරුම් අබිබවා ගැනුම් ක්‍රියායෙන් නො වැළකුණාහු නම් මොහුම ඉබොහෝහ. ඒ කවර හෙයින යත්: මහණෙනි, චතුරාය්‍ර්‍යසත්‍යය නුදුටු බැවිනි. කවර චතුරාය්‍ර්‍යසත්‍යයක යත්: දුඃඛාය්‍ර්‍යසත්‍යය, දුඃඛසමුදයාය්‍ර්‍යසත්‍යය, දුඃඛ-නිරොධාය්‍ර්‍යසත්‍යය, දුඃඛනිරොධගාමිනි ප්‍රතිපදය්‍ර්‍යසත්‍යය යි. මහණෙනි, එහෙයින් මෙහිලා ''මේ දුක්ඛ''යි වීය්‍ර්‍ය කටයුතු. ''මේ දුක්ඛසමුදය''යි වීය්‍ර්‍ය කටයුතු. ''මේ දුක්ඛනිරොධ''යි වීය්‍ර්‍ය කටයුතු. ''මේ දුක්ඛනිරොධගාමිනි පටිපද''යි වීය්‍ර්‍ය කටයුතු යි.

### දශවැනි චතුත්ථ ආමකධඤ්ඤ පෙය්‍යාල වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

> බෙත්තවත්ථු, කයවික්කය, දූතෙය්‍ය, තුලාකූට, කංසකූට, මානකූට, උක්කොටන, වඤ්චන, නිකති, ඡේදන, වධ, බන්ධන, විපරාමොස ආලොප සාහස යි පසළොස් සූතුරු කෙනෙකි යි.

# 11. පඤ්චගතිපෙය්‍යාලවග්ගො

## 12. 11. 1

## මනුස්සචුතිසුත්තං

3948. අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි: "තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො බහුතරං, යො වායං මයා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො, අයං වා මහාපථවී"ති. "එතදෙව භන්තෙ, බහුතරං යදිදං මහාපථවී. අප්පමත්තකොයං භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො. සඞ්ඛම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති, කලභාගම්පි න උපෙති, මහාපථවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො"ති. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සා[1] චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා නිරයෙ පච්චාජායන්ති. තං කිස්ස හෙතු? අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදාය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ, "ඉදං දුක්ඛන්ති" යොගො කරණීයො -පෙ- "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යොගො කරණීයොති.

## 12. 11. 2

## දුතියමනුස්සචුතිසුත්තං

3949. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා මනුස්සෙසු පච්චාජායන්ති, අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති. තං කිස්ස හෙතු -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 3

## තතියමනුස්සචුතිසුත්තං

3950. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 4

## චතුත්ථමනුස්සචුතිසුත්තං

3951. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

---

1. මනුස්සෙසු - සයා

# 11. පඤ්චගති පෙය්‍යාල වර්ගය

## 12. 11. 1

## මනුස්සචුති සූත්‍රය

3948. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නියසිළෙහි පස්බිඳක් නඟා භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද කිමෙක් ඉබොහෝ ද මවිසින් යම මේ පස්බිඳෙක් නියසිළෙහි නඟන ලද නම් එය හෝ මේ මහපොළොව හෝ දැ''යි? ''වහන්ස, යම මේ මහපොළොව වේ නම් මෙය ම ඉබෙහෙවි. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි නඟන ලද මේ පස්බිඳ ඉතාමඳ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් නියසිළෙහි නඟන ලද පස්බිඳ මහපොළොව හා සැසඳීමෙහි දී ගිණුමට ද නො පැමිණේ. සැසඳුමටද නො පැමිණේ. කලාවෙන් කලාවට ද නො පැමිණේ''. මහණෙනි, එසෙයින් ම යම කෙනෙක් මිනිසුන් කෙරෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඒ සත්වයෝ මඳයහ. වැළි යම කෙනෙක් මිනිසුන් කෙරෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් නම මේ සත්වයෝ ම ඉබොහෝහ. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිවු අරිසස් නුදුටු බැවිනි, කවර සිවු අරිසස් ද යත්: දුඃඛාර්‍ය්‍යසත්‍යය ... දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය-සත්‍යය යි. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුකැ''යි වීර්‍ය්‍ය කට යුතු ... ''මෙ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි වීර්‍ය්‍ය කට යුතු යි.

## 12. 11. 2

## දෙවන මනුස්‍සචුති සූත්‍රය

3949. මහණෙනි, එසෙයින් ම යම සත්‍වකෙනෙක් මිනිසුන් කෙරෙන් ච්‍යුතවූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම ඔහු මඳයහ. වැළි යම සත්‍වකෙනෙක් මිනිසුන් කෙරෙන් ච්‍යුතවූවාහු තිරිසන්යොන්හි උපදිත් නම මොහු ම ඉබොහෝහ. ඒ කවර හෙයින යත් ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 3

## තෙවන මනුස්‍සචුති සූත්‍රය

3950. මහණෙනි, එසෙයින් ම යම සත්‍වකෙනෙක් මිනිසුන් කෙරෙන් ච්‍යුතවූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම ඒ සත්‍වයෝ මඳයහ. වැළි යම සත්‍වකෙනෙක් මිනිසුන් කෙරෙන් ච්‍යුතවූවාහු ප්‍රෙතවිෂයෙහි උපදිත් නම මේ සත්‍වයෝ ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 4

## සිවුවන මනුස්‍සචුති සූත්‍රය

3951. මහණෙනි, එසෙයින් ම යම සත්‍වකෙනෙක් මිනිස් ලොවින් ච්‍යුතවූවාහු දෙවියන් කෙරෙහි උපදිත් නම ඔහු මඳයහ. වැළි යම සත්‍වකෙනෙක් මිනිස්ලොවින් ච්‍යුතවූවාහු නිරයෙහි උපදිත් නම මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 5

### පඤ්චමමනුස්සචුතිසුත්තං

3952. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 6

### ඡට්ඨමනුස්සචුතිසුත්තං

3953. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 7

### දෙවචුතිසුත්තං

3954. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දෙවා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 8

### දුතියදෙවචුතිසුත්තං

3955. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දෙවා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 9

### තතියදෙවචුතිසුත්තං

3956. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දෙවා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 10

### චතුත්ථදෙවචුතිසුත්තං

3957. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දෙවා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 5

## පස්වන මනුස්සචුති සූත්‍රය

3952. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්වකෙනෙක් මිනිස්ලොවින් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් නම් ඔහු මඳහ. වැළි යම් සත්ත්ව කෙනෙක් මිනිස් ලොවින් ච්‍යුතවූවාහු තිරිසන් යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 6

## සවන මනුස්සචුති සූත්‍රය

3953. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් මිනිස්ලොවින් ච්‍යුත වූවාහු දෙව්ලොව උපදිත් නම් ඔහු මඳහ. වැළි යම් සත්ත්ව කෙනෙක් මිනිස්ලොවින් ච්‍යුත වූවාහු ප්‍රෙතවිෂයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ වෙත් ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 7

## දෙවචුති සූත්‍රය

3954. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙව්ලොවින් ච්‍යුත ව දෙව්ලොව උපදිත් නම් ඔහු මඳහ. වැළි යම් සත්ත්ව කෙනෙක් දෙව්ලොවින් ච්‍යුත ව නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ වෙත් ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 8

## දෙවන දෙවචුති සූත්‍රය

3955. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙව්ලොවින් ච්‍යුත ව දෙව්ලොව උපදිත් නම් ඔහු මඳහ. වැළි යම් සත්ත්වකෙනෙක් දෙව්ලොවින් ච්‍යුතව තිරිසන් යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 9

## තෙවන දෙවචුති සූත්‍රය

3956. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දිව්‍යවිෂයයෙන් ච්‍යුත ව දිව්‍යවිෂයයෙහි උපදිත් නම් ඔහු මඳහ. යළි යම් සත්ත්ව-කෙනෙක් දිව්‍යවිෂයයෙන් ච්‍යුත ව ප්‍රෙතවිෂයයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 10

## සිවුවන දෙවචුති සූත්‍රය

3957. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත ව මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මඳහ. වැළි යම් සත්ත්වකෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත ව නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.



Free Distribution www.aathaapi.org

## 12. 11. 11

### පඤ්චමදෙවචුතිසුත්තං

3958. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දෙවා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 12

### ඡට්ඨදෙවචුතිසුත්තං

3959. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ දෙවා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 13

### නිරයචුතිසුත්තං

3960. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නිරයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 14

### දුතියනිරයචුතිසුත්තං

3961. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නිරයා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 15

### තතියනිරයචුතිසුත්තං

3962. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නිරයා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 16

### චතුත්ථනිරයචුතිසුත්තං

3963. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නිරයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 11

## පස්වන දෙවචුති සූත්‍රය

3958. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙව්ලොවින් ච්‍යුත ව මිනිස්ලොව උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්ව කෙනෙක් දෙව්ලොවින් ච්‍යුත ව තිරිසන් යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයර්‍ය කටයුතු යි.

## 12. 11. 12

## සවන දෙවචුති සූත්‍රය

3959. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙහි ච්‍යුත වූවාහු ප්‍රෙතවිෂයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයර්‍ය කටයුතු යි.

## 12. 11. 13

## නිරයචුති සූත්‍රය

3960. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව මිනිස්ලොව උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයර්‍ය කටයුතු යි.

## 12. 11. 14

## දෙවන නිරයචුති සූත්‍රය

3961. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්ව-කෙනෙක් නිරයෙන් ච්‍යුතව තිරිසන් යොන්හි උපදිත් නම මොහු ම ඉබොහෝහ ... වීයර්‍ය කටයුතු යි.

## 12. 11. 15

## තෙවන නිරයචුති සූත්‍රය

3962. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්ව-කෙනෙක් නිරයෙන් ච්‍යුතව ප්‍රෙතවිෂයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයර්‍ය කටයුතු යි.

## 12. 11. 16

## සිවුවන නිරයචුති සූත්‍රය

3963. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් නිරයෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයර්‍ය කටයුතු යි.

## 12. 11. 17

## පඤ්චමනිරයචුතිසුත්තං

3964. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නිරයා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 18

## ඡට්ඨනිරයචුතිසුත්තං

3965. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ නිරයා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 19

## තිරච්ඡානචුතිසුත්තං

3966. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා නිරයෙ පච්චාජායන්ති. -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 20

## දුතියතිරච්ඡානචුතිසුත්තං

3967. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 21

## තතියතිරච්ඡානචුතිසුත්තං

3968. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 22

## චතුත්ථතිරච්ඡානචුතිසුත්තං

3969. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 17
## පස්වන නිරයචුති සූත්‍රය

3964. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව තිරිසන් යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 18
## සවන නිරයචුති සූත්‍රය

3965. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත ව දෙව්ලොව උපදිත් නම් ඒ සත්ත්‍වයෝ මදහ. වැළි යම් කෙනෙක් නිරයෙන් ච්‍යුතව ප්‍රෙතවිෂයෙහි උපදිත් නම් මේ සත්ත්‍වයෝ ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 19
## තිරච්ඡානචුති සූත්‍රය

3966. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඒ සත්ත්‍වයෝ මදහ. වැළි යම් කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් නම් මේ සත්ත්‍වයෝ ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 20
## දෙවන තිරච්ඡානචුති සූත්‍රය

3967. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඒ සත්ත්‍වයෝ මදහ. වැළි යම් කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව තිරිසන් යොන්හි උපදිත් නම් මේ සත්ත්‍වයෝ ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 21
## තෙවන තිරච්ඡානචුති සූත්‍රය

3968. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව මිනිස්ලොව උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව ප්‍රෙතවිෂයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 22
## සිවුවන තිරච්ඡානචුති සූත්‍රය

3969. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව දෙව්ලොව උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 23

### පඤ්චමතිරච්ඡානචුතිසුත්තං

3970. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා දෙවෙසු පච්චාජායන්ති, අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 24

### ඡට්ඨතිරච්ඡානචුතිසුත්තං

3971. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 25

### පෙත්තිචුතිසුත්තං

3972. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පෙත්තිවිසයා චුතා නිරයෙ පච්චාජායන්ති. -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 26

### දුතියපෙත්තිචුතිසුත්තං

3973. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පෙත්තිවිසයා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 27

### තතියපෙත්තිචුතිසුත්තං

3974. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පෙත්තිවිසයා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති. -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 28

### චතුත්ථපෙත්තිචුතිසුත්තං

3975. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පෙත්තිවිසයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 23

## පස්වන තිරච්ඡානචුති සූත්‍රය

3970. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත ව දෙව්ලොව උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ව කෙනෙක් තිරිසන් යොනිහ් ච්‍යුත ව තිරිසන්යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 24

## සවන තිරච්ඡානචුති සූත්‍රය

3971. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත වූවාහු දෙවියන් අතර උපදිත් නම් ඔහු මදහ. යළි යම් සත්ව කෙනෙක් තිරිසන් යොනින් ච්‍යුත වූවාහු ප්‍රෙතයන් අතර උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 25

## පෙත්තිචුති සූත්‍රය

3972. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් ප්‍රෙත-විෂයයෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ව කෙනෙක් ප්‍රෙතවිෂයයෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 26

## දෙවන පෙත්තිචුති සූත්‍රය

3973. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් ප්‍රෙත-විෂයයෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ව කෙනෙක් ප්‍රෙතවිෂයයෙන් ච්‍යුත වූවාහු තිරිසන් යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කට-යුතු යි.

## 12. 11. 27

## තෙවන පෙත්තිචුති සූත්‍රය

3974. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් ප්‍රෙත-විෂයයෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ව කෙනෙක් ප්‍රෙතවිෂයයෙන් ච්‍යුත වූවාහු ප්‍රෙතවිෂයයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 28

## සිවුවන පෙත්තිචුති සූත්‍රය

3975. මහණෙනි, එසෙයින් ම යම් සත්ව කෙනෙක් ප්‍රෙත-විෂයයෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් නම් ඔහු මදහ. වැළි යම් සත්ව කෙනෙක් ප්‍රෙතවිෂයයෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීයඞ් කටයුතු යි.

## 12. 11. 29

## පඤ්චමපෙත්තිචුතිසුත්තං

3976. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පෙත්තිවිසයා චුතා තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- යොගො කරණීයොති.

## 12. 11. 30

## ඡට්ඨපෙත්තිචුතිසුත්තං

3977. එවමෙව ඛො භික්ඛවෙ, අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ පෙත්තිවිසයා චුතා පෙත්තිවිසයෙ පච්චාජායන්ති. තං කිස්ස හෙතු: අදිට්ඨත්තා භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස, දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධගාමිනියා පටිපදය අරියසච්චස්ස. තස්මාතිහ භික්ඛවෙ. "ඉදං දුක්ඛන්ති" යොගො කරණීයො. "අයං දුක්ඛසමුදයො"ති යොගො කරණීයො. "අයං දුක්ඛනිරොධො"ති යොගො කරණීයො. "අයං දුක්ඛනිරොධගාමිනී පටිපද"ති යොගො කරණීයොති. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

### පඤ්චගතිවග්ගො එකාදසමො.

තත්‍රුද්දානං:

භවන්ති ඡ සුත්තන්තා චුතිනාමෙන දස්සිතා'
මනුස්සදෙවනිරය තිරච්ඡානපෙත්තිතො තී ති.

### සච්චසංයුත්තං සමත්තං.

### නිට්ඨිතො මහාවග්ගො.

තත්‍රසංයුත්තුද්දානං:

මග්ගං බොජ්ඣඞ්ගං සති ච ඉන්ද්‍රියං සම්මප්පධානං
බලඤ්ච ඉද්ධනුරුද්ධං ඣානං ච ආනාපානෙන,
සොතාපත්ති ච සච්චන්ති සංයුත්තානි ද්වාදසාති.

තත්‍රවග්ගුද්දානං:

සමාධි ච ධම්මචක්කප්පවත්තනො කොටිගාමො
සිංසපාවන පපාතා ඡළඩාභිසමයොති
චත්තාරො චාමකධඤ්ඤ පෙය්‍යාලනාමකාපි ච
පඤ්චගති පෙය්‍යාලෙන එකාදස භවන්ති භීති.

### සංයුත්තනිකායො නිට්ඨිතො.

## 12. 11. 29

### පස්වන පෙත්තිචුති සූත්‍රය

3976. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් ප්‍රෙත-විෂයයෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් නම් ඔහු මඳහ. වැලි යම් සත්ත්ව කෙනෙක් ප්‍රෙත විෂයයෙන් ච්‍යුත වූවාහු තිරිසන් යොන්හි උපදිත් නම් මොහු ම ඉබොහෝහ ... වීර්‍ය්‍ය කටයුතු යි.

## 12. 11. 30

### සවන පෙත්තිචුති සූත්‍රය

3977. මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් ප්‍රෙත-විෂයයෙන් ච්‍යුත ව දෙව්ලොව උපදිත් නම් ඔහු මඳහ. වැලි යම් සත්ත්ව කෙනෙක් ප්‍රෙතවිෂයයෙන් ච්‍යුත ව ප්‍රෙතවිෂයයෙහි උපදිත් නම් මොහු ම ඉබොහෝහ. ඒ කවර හෙයින යත්: මහණෙනි, චතුරාර්‍ය්‍යසත්‍යය නුදුටු බැවිනි. කවර චතුරාර්‍ය්‍යසත්‍ය කෙනෙක යත්: දුක්ඛාර්‍ය්‍යසත්‍ය ය දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍ය ය දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍ය ය දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යි. මහණෙනි, එහෙයින් මෙහි ලා ''මේ දුකැ''යි වීර්‍ය්‍ය කටයුතු. ''මේ දුක හටගැනුමැ''යි වීර්‍ය්‍ය කටයුතු. ''මේ දුක් වැළැක්මැ''යි වීර්‍ය්‍ය කටයුතු. ''මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැ''යි වීර්‍ය්‍ය කටයුතු යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව පිළිගත්හ යි.

### එකොළොස්වැනි පඤ්චගතිවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

මනුස්සචුති, දෙවචුති, නිරයචුති, තිරච්ඡානචුති, පෙත්තිචුති වශයෙන් චුති නමින් දක්වන ලද ෂට්සූත්‍රාන්ත කෙනෙක් වෙති යි.

### සච්චසංයුත්තය සමාප්ත යි.

### මහාවග්ගය නිමියේ යි.

**එහි සංයුක්තනාමාවලිය:**

මග්ග, බොජ්ඣඞ්ග, සති, ඉන්ද්‍රිය, සම්මප්පධාන, බල, ඉද්ධිපාද, අනුරුද්ධ, ඣාන, ආනාපාන, සොතාපත්ති, සච්ච යි සංයුක්ත දොළසෙක් වේ යි.

**එහි වර්ගනාමාවලිය:**

සමාධි, ධම්මචක්කපවත්තන, කොටිගාම, සිංසපාවන, පපාත, අභිසමය යි සයෙක් ම වේ. (ආමකධඤ්ඤපෙයාාල, දුතිය ආමකධඤ්ඤපෙයාාල, තතිය ආමකධඤ්ඤපෙයාාල, චතුත්ථ ආමකධඤ්ඤපෙයාාල යි.) ආමකධඤ්ඤපෙයාාල යන නම් ඇත්තා වූ වර්ග සතරෙකි. (ඒ සියල්ල) පඤ්චගති පෙයාාලවර්ගය සමග (සච්චසංයුක්තයෙහි වර්ග) එකොළොසෙක් වේ මැ යි.

### සංයුත්තනිකාය නිමියේ යි.

# සංයුත්තනිකාය – පඤ්චම භාග – දුතිය ඛණ්ඩ

## ගාථාදිපාදනුක්කමණිකා


| | |
|---|---|
| | පිට්ඨඞ්කා |
| අභබ්බා තෙ අන්තකිරියාය | 288 |
| එවං නරං අන්නදපානවත්ථදං | 232, 234 |
| චතුන්නං අරියසච්චානං | 286 |
| චෙතොවිමුත්ති සම්පන්නා | 288 |
| තඤ්ච මග්ගං න ජානන්ති | 288 |
| තස්මා සද්ධඤ්ච සීලඤ්ච | 206, 242 |
| තානි එතානි දිට්ඨානි | 286 |
| තුලමතුලඤ්ච සම්භවං | 16 |
| මහොදධිං අපරිමිතං මහාසරං | 232, 234 |
| යත්ථ ච සබ්බසො දුක්ඛං | 288 |
| යථා පුරෙ තථා පච්ඡා | 18, 22, 24, 28, 38, 46, 56 |
| යස්ස සද්ධා තථාගතෙ | 206,242 |
| යෙ දුක්ඛං නප්පජානන්ති | 288 |
| යෙසං සද්ධා ච සීලඤ්ච | 140 |
| යො පුඤ්ඤකාමො කුසලෙ පතිට්ඨිතො | 236 |
| සඞ්ඝෙ පසාදො යස්සත්ථි | 206, 242 |

# සඤ්ඤානාමානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අචිරවතී | 324 |
| අඤ්ඤාකොණ්ඩඤ්ඤ | 274 |
| අනාථපිණ්ඩික | 210 |
| අනුරුද්ධ | 62, 66,68, 70, 72, 74, 76, 78 |
| අන්ධවන | 76 |
| අම්බපාලිවන | 74 |
| අරිට්ඨ | 96 |
| අසොක | 162 |
| ආනන්ද | 10, 12, 30, 46, 52, 104, 108, 118, 126, 144, 162, 164, 166, 170 |

**ඉ**

| | |
|---|---|
| ඉච්ඡානඞ්ගල | 112 |
| ඉසිදත්තපුරාණ | 146 |
| ඉසිපතන (මිගදය) | 244, 270. |

**උ**

| | |
|---|---|
| උදයගාමිනී | 168 |
| උදෙනක | 12 |
| උන්නාභ | 30 |

**ක**

| | |
|---|---|
| කකුධ | 164 |
| කටිස්සභ | 164 |
| කණ්ටකීවන | 70 |
| කපිලවත්ථු | 114, 182, 184, 186, 190, 224, 226, 228, 238, 240, 242, 246 |
| කලන්දකනිවාප | 306 |
| කාලිඞ්ග | 164 |
| කාපිලවත්ථව | 242 |
| කාසි | 148 |
| කාළිගොධා | 226 |
| කිම්බිල | 106 |
| කූටාගාරසාලා | 314 |
| කොටිගාම | 286 |
| කොසම්බි | 30, 294 |
| කොසල | 148, 154 |

| ග | පිට්ඨඞ්කා |
|---|---|
| ගඞ්ගා | 58, 84, 324, 326 |
| ගවම්පති (ථෙර) | 292 |
| ගිජ්ඣකූට | 308 |
| ගිඤ්ජකාවසථ | 160 |
| ගොතම | 116, 154 |
| ගොතමක | 12 |
| ගොධා | 186 |

**ඝො**

| | |
|---|---|
| ඝොසිතාරාම | 30 |

**ච**

| | |
|---|---|
| චාපාල (චෙතිය) | 10, 12, 16 |
| චෙතී (ජනපද) | 292 |

**ජ**

| | |
|---|---|
| ජෙතවනෙ | 62, 66, 72, 78, 144, 150, 176, 178, 260 |
| ජොතික | 140 |

**ඤ**

| | |
|---|---|
| ඤාතික | 160, 164 |

**ත**

| | |
|---|---|
| තාවතිංස | 138, 176 |
| තුට්ඨ | 164 |

**ද**

| | |
|---|---|
| දීඝාවු | 140 |

**ධ**

| | |
|---|---|
| ධම්මදින්න | 244 |

**න**

| | |
|---|---|
| නන්දක | 214 |
| නන්දනවන | 138 |
| නන්ද | 160 |
| නන්දිය | 228, 238 |
| නිකට | 164 |
| නිග්‍රොධාරම | 114, 182, 184, 186, 190, 224, 226, 228, 238, 240, 246 |

ප පිට්ඨඞ්කා

පටිභානකූට (පබ්බත) 308
පරිබ්බාජක 112
පුබ්බාරාම 26

බ

බහුපුත්ත 12
බාරාණසී 244, 270

භ

භද්දිය 240

ම

මගධ 150
මල්ල 148
මහාකප්පින 96
මහානාම 104, 114, 182, 184, 186, 192, 224, 240, 246
මහාපරිළාහ (නිරය) 312
මහාවන 10, 314
මහාමොග්ගල්ලාන 176, 178
මහී (ගඞ්ගා) 324, 326
මාර 12
මොග්ගල්ලාන 54, 62, 66, 70

ය

යමුනා 324' 326

ර

රාජකාරාම 168
රාජගහ 140, 306, 308

ල

ලෝමසවංගීස 114

ව පිට්ඨඞ්කා

වජ්ජී 148, 286
වෙසාලි 10, 12, 74, 104, 214, 314
වේළුද්වාර 154
වේළුවන 106, 140, 306

ස

සක්ක 114, 184, 186, 190, 224, 226, 228, 238, 240, 246
සක්කා 242
සක්කො 246
සත්තම්බ 12
සඤ්ඤකූටඨ 164
සරකානි 190
සරභූ (ගඞ්ගා) 324, 326
සලලාගාර 72
සහජාති 292
සාකෙත 70
සාධුක 146
සාරන්දද 12
සාරිපුත්ත 70, 74, 144, 146, 170
සාවත්ථි 26, 62, 66, 68, 72, 76, 144, 148, 170, 168, 178, 242, 260
සාළ්හ 169
සුජාතා 160
සුතනුතීර 68
සුදත්ත 160
සුනන්ද 164
සුමාගධා (පොක්ඛරණී) 306

හ

හිමවන්තො 328
හිමවා 330


Free Distribution www.aathaapi.org

# විසෙසපදානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අකණිට්ඨගාමී | 94 |
| අකසිරලාභී | 98 |
| අකාලමෙඝො | 106 |
| අකිච්ඡලාභී | 98 |
| අක්ඛාතං | 294 |
| අඛණ්ඩානි | 246 |
| අජෙළකපටිග්ගහණා | 344 |
| අජ්ඣත්තං නහානං | 216 |
| අජ්ඣත්තං සඞ්ඛිත්තං | 40 |
| අඤ්ඤමඤ්ඤඛාදිකා | 318 |
| අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං | 266 |
| අඤ්ඤාය | 104 |
| අට්ටීයමානා | 104 |
| අතිලීනං චිත්තං | 40 |
| අතිලීනා වීමංසා | 42 |
| අතිලීනො | 40 |
| අතීතමද්ධානං | 262, 264 |
| අත්තකිලමථානුයොගො | 270 |
| අත්තසම්භවං | 16 |
| අත්තූපනායිකං | 154 |
| අත්ථසංහිතා | 264, 266, 268 |
| අදින්නාදානා වෙරමණියා | 156 |
| අදින්නාදායී | 272 |
| අධිච්චිම්දං | 320 |
| අධිමොචිතං | 250, 252 |
| අනක්ඛාතං | 294 |
| අනඤ්ඤථානි | 284 |
| අනජ්ඣොසිතානි | 102 |
| අනනුබොධා | 286 |
| අනනුස්සුතෙසු | 274, 276 |
| අනන්තවා ලොකො | 266 |
| අනමතග්ගා | 298 |
| අනාගතමද්ධානං | 262, 264 |
| අනාවත්තිධම්මා | 164 |
| අනාසවං | 8 |
| අනිච්චානුපස්සී | 90 |
| අනුට්ඨිතා | 12 |
| අනුධම්මචාරිනො | 14 |
| අනුප්පන්නසද්ධො | 30, 76, 114, 116 |
| අනුවිසටං | 40 |
| අනෙකධාතුනානාධාතුලොකං | 80 |
| අන්තරවස්සෙන | 242 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අන්තරාපරිනිබ්බායී | 50, 94 |
| අන්තවා ලොකො | 266 |
| අන්ධකාරතිමිසො | 300 |
| අන්ධන්තමං | 300 |
| අපරියොනද්ධන | 18 |
| අප්පකසිරෙනෙව | 48 |
| අප්පටිවානී | 296 |
| අප්පටිවෙධා | 286 |
| අප්පත්තමානසො | 116 |
| අප්පමාදවිහාරී | 230 |
| අභික්කන්තතරා | 248 |
| අභිජ්ඣාදොමනස්සං | 62 |
| අභිඤ්ඤා අනක්ඛාතං | 294 |
| අභිඤ්ඤාය | 264 |
| අභිද | 16 |
| අභිප්පමොදයං | 120 |
| අභිසමයාය | 260, 262 |
| අභිසමෙතාවිනො | 322, 324 |
| අභිසම්පරායො | 160, 162, 164, 182 |
| අභිහට්ඨුං | 74 |
| අමච්චා | 170 |
| අයොගුළො | 48 |
| අරඤ්ඤගතො | 108 |
| අරහං | 8 |
| අරියකන්තෙහි | 138, 160, 178, 210, 220, 224 |
| අරියවිහාරො | 112, 116 |
| අරියසච්චානි | 262, 264, 290 |
| අරියසාවකා | 170 |
| අරියසාවකො | 140, 156, 162, 186 212, 214, 222, 228 232 234, 238 |
| අරියසාවිකා | 228 |
| අරියස්ස විනයෙ | 168 |
| අරියා | 4 |
| අරියො ඤායො | 212, 214 |
| අරියො මග්ගො | 2 62, 66 |
| අරුණග්ගං | 300 |
| අවිජ්ජා | 282 |
| අවිඤ්ඤාතාරෙසු | 332 |
| අවිතථානි | 284, 290 |

අ — පිට්ඨඞ්කා

අවිනිපාතධම්මො 140, 152, 168, 162, 170, 226
අවිරාධිතං 314, 316
අවෙච්චප්පසාදෙන 160, 218, 220, 246
අසඞ්ඛාරපරිනිබ්බායී 50, 94
අසජ්ජමානො 20
අසනං 314, 316
අසම්මුට්ඨා 122
අසල්ලීනං 132
අසස්සතො ලොකො 266
අසහිතං තෙ 266
අසාමන්තපඤ්ඤත්තාය 256
අසුභකථං 104
අසෙඛෙන 70
අස්සාස පස්සාසං 108, 120, 130
අස්සාසනියෙහි 248

ආ

ආකාසානඤ්චායතනං 102
ආකිඤ්චඤ්ඤායතනං 102
ආචිණ්ණං තෙ විපරාවත්තං 266
ආතාපී 62, 66, 70, 74
ආදිබ්‍රහ්මචරියකා 264, 266, 268
ආනාපානසති 90, 92, 94,
ආනාපානසතිසමාධි 98, 106, 112, 116 118, 126, 128, 136
ආසා 316
ආමකධඤ්ඤපටිග්ගහණා 342
ආයුසඞ්ඛාරං 16
ආලොප 348
ආසවෙහි 98

ඉ

ඉඤ්ජිතත්තං 96, 98
ඉතිභවාභවකථං 268
ඉත්ථීකුමාරකපටිග්ගහණා 344
ඉද්ධං 16
ඉද්ධාභිසඞ්ඛාරං 26
ඉද්ධි 26, 52, 54
ඉද්ධිපාදභාවනා 36, 52, 54
ඉද්ධිපාදභාවනාගාමිනීපද 36, 52, 54
ඉද්ධිපාද 2, 4, 8, 12, 22, 36, 38, 48, 50, 60

ඉ — පිට්ඨඞ්කා

ඉද්ධිප්පදෙසං 6
ඉද්ධිවිධං 20, 24, 28, 34, 48, 78
ඉන්දඛීලො 302
ඉන්ද්‍රියපරොපරියත්තං 82

උ

උක්කොටන 346
උජුභූතකං 242
උතුසංවච්ඡරා 300
උත්තාසො 210
උදකඵුසිතානි 324, 326, 328
උදයගාමිනිං 168
උදයගාමිනී පටිපද 168
උදයත්ථගාමිනියා 220
උද්ධච්චසහගතො 38
උද්ධම්භාගියානි 60, 88
උද්ධංසොතො 50
උන්නළා 26
උපට්ඨානසාලා 106
උපනිධිං 322, 324
උපරිමං සරං 314
උපසමාය 264
උපසංහතං 252
උස්සොළ්හි 296
උපහච්චපරිනිබ්බායී 50, 94
උපාදිසෙසෙ 50, 94
උපාසකො 224
උපාසනං 316
උපෙක්ඛකො 64, 100
උබ්බෙධෙන 324
ඌහතං 106

එ

එකච්ඡිග්ගලං යුගං 318, 320
එකොදිකා 320
එකොදිභාවං 100
එසනා 60, 86

ඔ

ඔඝ 60, 88
ඔපපාතිකා 160, 244
ඔපපාතිකො 144, 164, 192
ඔපවය්හා 152
ඔපානිභ 46
ඔරම්භාගියානං 94, 144, 160, 164

Free Distribution www.aathaapi.org

| ඔ | පිට්ඨඞ්කා |
|---|---|
| ඔළාරිකො නිමිත්තො | 12 |
| ඔලිගල්ලං | 168 |
| ඔහිතභාවො | 76 |
| ඔහිතභාරා | 114 |

**ක**

| | |
|---|---|
| කණ්ටකාධානං | 168 |
| කතකරණීයො | 76 |
| කදලි | 318 |
| කපාලං | 74 |
| කප්පං | 12 |
| කප්පාවසෙසං | 12 |
| කප්පාසපිචු | 48, 302 |
| කයවික්කයා | 346 |
| කරහචි | 318 |
| කලං | 138 |
| කලභාගං | 322 |
| කවචං | 16 |
| කංසකූට | 346 |
| කාකපෙය්‍යා | 324 |
| කාණකච්ඡපො | 318, 320 |
| කාමච්ඡන්දො | 96 |
| කාමවිතක්කං | 264 |
| කාමසුඛල්ලිකානුයොගො | 270 |
| කාමෙසුමිච්ඡාචාරී | 212 |
| කාමෙසුමිච්ඡාචාරා | 156 |
| කායසඞ්ඛාරං | 90, 120, 130 |
| කායසමාචාරො | 156 |
| කායානුපස්සී | 130 |
| කාසාවා | 74 |
| කාසිකචන්දනං | 246 |
| කුක්කු | 304 |
| කුක්කුට සූකරපටිග්ගහණා | 344 |
| කුද්දාලපිටකං | 72 |
| කුඨාදියො | 226 |
| කුම්භට්ඨානකථං | 268 |
| කුලෙජෙට්ඨාපචායිනො | 336 |
| කුසලාභිසන්ද | 218, 220, 232 234, 236 |
| කුසසුඛා | 226 |
| කූටාගාර | 314 |
| කොලට්ඨිමත්තායො | 326 |

**ඛ**

| | |
|---|---|
| ඛදිරපත්ත | 294 |
| ඛීණාසවා | 112, 114, 116 |

| ඛ | පිට්ඨඞ්කා |
|---|---|
| ඛීණාසවො | 30, 76 |
| ඛෙත්තවත්ථුපටිග්ගහණා | 346 |

**ග**

| | |
|---|---|
| ගම්භීරනෙමො | 26, 302 |
| ගම්භීරපඤ්ඤත්තාය | 256 |
| ගිම්හානං පච්ඡිමෙ මාසෙ | 106 |
| ගිහීසාමිකානි | 210 |
| ගුළිකා | 326 |
| ගෙහසිතා | 100 |
| ඝරාවාසො | 152 |

**ච**

| | |
|---|---|
| චක්කවත්ති | 138 |
| චක්ඛුං | 10 |
| චන්දනිකං | 168 |
| චන්දිමසුරියා | 300 |
| චාතුම්මහාපථෙ | 110 |
| චාතුම්මහාභූතිකෙන | 46 |
| චාතුම්මහාභූතිකො | 182 |
| චිත්තපටිසංවෙදී | 130 |
| චිත්තසඞ්ඛාරං | 90, 120, 130 |
| චිත්තසඞ්ඛාරපටිසංවෙදී | 108 |
| චිත්තසමාධි | 2, 4, 6, 8, 10, 18, 22, 26, 48, 30, 32, 34 |
| චිත්තානුපස්සී | 110 |
| චෙතොවිමුත්තිං | 8, 22, 24, 28, 36, 48, 56, 82, 160, 162, 192 |

**ඡ**

| | |
|---|---|
| ඡන්දං | 24 |
| ඡන්දසමාධි | 2, 4, 6, 8, 10, 18, 22, 24, 30, 32, 34, 48 |
| ඡම්භිතත්තං | 210 |

**ජ**

| | |
|---|---|
| ජවනපඤ්ඤතා | 258 |
| ජවනපඤ්ඤො | 192 |
| ජරන්ධකාරං | 318 |
| ජරාපපාතං | 310 |
| ජාතන්ධකාරං | 318 |
| ජාතරූපරජතපටිග්ගහණා | 342 |
| ජාතිපපාතං | 310 |

ජා පිට්ඨඞ්කා

ජානතො 290
ජිගුච්ඡමානා 104
ජීවිතපරියන්තිකං 102
ජීවිතපරියාදනා 102

ඣ

ඣානා 84

ඤ

ඤාණං 10

ඨ

ඨානසො 80, 106

ත

තගර 306
තජ්ජා 30
තත්‍රාපරිනිබ්බායී 164
තථාගතප්පවෙදිතො ධම්මවිනයො 320
තථාගතවිහාරො 112, 114, 116
තථාගතො 8
තථානි 284, 290
තසං 222
තං ජීවං තං සරීරං 266
තාලච්ඡිග්ගල 314, 316
තාලාවත්ථුකතා 114
තාවතිංස 178
තිකොටිපරිසුද්ධා 156
තික්ඛපඤ්ඤතා 258
තිණකට්ඨසාඛාපලාසං 298
තිරච්ඡානකථං 268
තිරච්ඡානයොනියා චුතා 356, 358
තුලං 16
තුලාකූට 346
තූලපිචු 48, 302

ථ

ථපතයො 146
ථලජා 334
ථාවරං 222
ථිනමිද්ධසහගතො 38
ථුල්ලඵුසිතකෙ 226

ද පිට්ඨඞ්කා

දසසහස්සිලොකධාතු 274
දානසංවිභාගරතො 152, 218
දාරෙසු චාරිත්තං 156
දාසිදාසපටිග්ගහණා 344
දිට්ඨධම්මිකං 212
දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා 50, 94
දිබ්බාය සොතධාතුයා 78
දිබ්බෙ 20
දීඝරත්තං 74
දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං 270
දුක්ඛනිරොධො අරියසච්චං 270
දුක්ඛසමුදයො අරියසච්චං 270
දුක්ඛං අරියසච්චං 270
දුබ්බලබාදිකා 318
දුරභිසම්භවතරං 316
දූතෙය්‍යපහිණගමනානුයොගො 346
දෙය්‍යධම්මං 152
දෙවදුන්දුභියො 16
දෙවපදානි 220, 222
දෙවා චුතා 352, 354
දෙවාසුරසඞ්ගාමො 306

ධ

ධම්මදස්සනං 140, 242
ධම්මවිනයං 266
ධම්මසමුප්පාදෙ 138
ධම්මස්සානුධම්මං 144
ධම්මාදාසං 164
ධම්මාදාසො 162
ධම්මාධිකරණං 144
ධම්මානුධම්මපටිපත්ති 144, 240, 258
ධම්මානුධම්මපටිපන්නා 14
ධම්මානුපස්සී 110

න

නඛසිඛො 324
නච්චගීතවාදිතවිසූකදස්සනා 342
න හොති තථාගතො පරම්මරණා 266
නානත්තකථං 268
නානත්තසඤ්ඤිනං 102

| න | පිටඞ්කා |
|---|---|
| නානාධිමුත්තිකං | 80 |
| නාසසුධ | 104 |
| නිකතිසාචියොග | 346 |
| නිකාමලාභී | 98 |
| නිට්ඨිතචීවරො | 146 |
| නිබ්බානනින්නො | 186 |
| නිබ්බානපොණො | 84 |
| නිබ්බිදය | 264 |
| නිබ්බෙධගාමිනියා | 220 |
| නිබ්බෙධිකපඤ්ඤතා | 258 |
| නියතො | 214 |
| නිය්‍යානිකා | 4 |
| නිරයා චුතා | 354, 356 |
| නිරාමිසා | 122, 132 |
| නිරොධනිස්සිතං | 92, 124 |
| නිරොධානුපස්සී | 90, 122 |
| නිවාතං | 26 |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතනං | 102 |
| නෙව හොති න න හොති තථාගතො පරම්මරණා | 266 |

| ප | |
|---|---|
| පක්ඛිසකුණො | 20, 34, 78 |
| පච්චක්ඛාය | 280 |
| පච්ඡා පුරෙ සඤ්ඤී | 38, 42 |
| පඤ්ච නීවරණා | 114 |
| පඤ්චුපාදානක්ඛන්ධා | 276 |
| පඤ්ඤා | 10 |
| පඤ්ඤාබාහුල්ලාය | 256 |
| පඤ්ඤාවිමුත්තිං | 8, 22, 24, 28, 36, 48, 56, 82, 160, 162, 192 |
| පඤ්ඤාවුඩ්ඪියා | 254 |
| පඤ්ඤාසම්පන්නො | 226 |
| පටිගච්ච | 50, 94 |
| පටිසසඤ්ඤ | 96, 102 |
| පටිච්චසමුප්පාදං | 212 |
| පටිනිස්සග්ගානුපස්සී | 90, 96, 116, 118, 122 |
| පටිප්පස්සද්ධො | 30 |
| පටිසල්ලානා | 74, 104, 116, 144, 260 |
| පටිසල්ලීන | 66, 260 |
| පඨමජ්ඣානං | 100 |
| පණීතං ධම්මං | 68 |
| පත්තයොගක්ඛෙමා | 14 |

| ප | පිටඞ්කා |
|---|---|
| පදර | 226 |
| පධාන සඞ්ඛාරා | 24 |
| පපාතො (පටිභානකූට) | 308 |
| පමාදවිහාරී | 228 |
| පයතපාණී | 152, 218 |
| පරප්පවාදං | 14 |
| පරික්ඛීණං | 322 |
| පරිමිතා | 12 |
| පරිඤ්ඤාතං | 274 |
| පරිඤ්ඤෙය්‍යානං | 274, 292 |
| පරිබ්බාජකා | 116 |
| පරියාදනං | 298 |
| පරියාදින්නං | 322 |
| පරියායං | 104 |
| පරියුට්ඨිතචිත්තො | 14 |
| පරියොදපනාය | 220 |
| පරියොදතො | 74 |
| පරොපඤ්ඤාසා | 164 |
| පසෙනදි කොසල | 152 |
| පස්සම්භයං | 90 |
| පහාතබ්බං | 292 |
| පාකතින්ද්‍රියා | 26 |
| පාණාතිපාතා වෙරමණියා | 156 |
| පාචීනපොණො | 72, 186 |
| පාණාතිපාතී | 212 |
| පාදඞ්ගුට්ඨෙන | 28 |
| පාමුජ්ජං | 228 |
| පාරං | 2 |
| පාසාණසක්ඛරා | 320, 322 |
| පීතිපටිසංවෙදී | 108 |
| පුඤ්ඤාභිසන්ද | 218, 220, 232, 234, 236 |
| පුටං | 294, 296 |
| පුත්තසම්බාධසයනං | 154, 246 |
| පුථුපඤ්ඤතාය | 256 |
| පුථුභූතං | 16 |
| පුබ්බපෙතකථං | 268 |
| පුබ්බෙනිවාසං | 20, 82 |
| පෙත්තිවිසයා චුතා | 358, 360 |
| පෙත්තෙය්‍යා | 334 |
| පොඞ්ඛානුපොඞ්ඛං | 314, 316 |
| පොථුජ්ජනිකො | 270 |
| ඵන්දිතත්තං | 96 |
| පීතං | 16 |

| බ | පිට්ඨඞ්කා |
|---|---|
| බලකරණීයා | 58, 86 |
| බාලගමනං | 168 |
| බාහුජඤ්ඤං | 116, 82, 184 |
| බීජගාමභූතගාමසමාරම්භා | 340 |
| බොධිං | 224 |
| බොධිසත්තස්ස | 18 |
| බොධිසත්තො | 98 |
| බ්‍රහ්මඤ්ඤා | 336 |
| බ්‍රහ්මචරියං | 16, 30, 154 |
| බ්‍රහ්මචරියොගධං | 140 |
| බ්‍රහ්මලොකා | 78 |
| බ්‍රහ්මවිහාරො | 112, 116 |

| භ | |
|---|---|
| භගවංමූලකා | 28, 52, 54, 126, 128 |
| භණෙ | 216 |
| භවනෙත්ති | 286 |
| භවසඞ්ඛාරං | 16 |
| භාවනාපාරිපූරිං | 122 |
| භාවිතත්තං | 292 |
| භිසමුළාලං | 306 |
| භුජිස්සෙහි | 138 |
| භුසාවාතවුට්ඨි | 302 |
| භූරිපඤ්ඤතාය | 256 |

| ම | |
|---|---|
| මජ්ඣිමං ධම්මං | 68 |
| මජ්ඣිමා පටිපද | 270 |
| මණ්ඩලමාලං | 292 |
| මත්තෙය්‍යතා | 334 |
| මනුස්සා චුතා | 350, 352 |
| මනොභාවනීයං | 182, 184 |
| මනොමයෙන කායෙන | 46 |
| මරණන්ධකාරං | 318 |
| මරණපපාතං | 310 |
| මහග්ගතං | 20 |
| මහප්ඵලො | 98 |
| මහානිසංසො | 98 |
| මහාපඤ්ඤතාය | 256 |
| මහාපංසුපුඤ්ජා | 110 |
| මහාභිඤ්ඤතං | 68, 78 |
| මහාසරං | 232 |
| මහොදධිං | 232 |
| මානකූට | 346 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මාලුවාපත්ත | 296 |
| මාරිස | 178, 248 |
| මාසද්ධමාස | 300 |
| මිලක්ඛෙසු | 332 |
| මුඛරා | 26 |
| මුණ්ඩා | 74 |
| මුත්තචාගො | 152, 218, 228 |
| මුනි | 16 |
| මුසාවාද වෙරමණී | 158 |
| මුසාවාදී | 212 |
| මූළ්හගමනං | 168 |

| ය | |
|---|---|
| යත්‍රහි නාම | 316 |
| යථාකම්මූපගෙ | 22 |
| යථාදිවා කථා රත්තිං | 40 |
| යාවයොගො | 152, 218 |
| යාවජීවඤ්ච | 300 |
| යොගක්ඛෙමං | 112, 114, 116 |
| යොගො කරණීයො | 260, 262 264, 350, 352, 354, 356, 358, 360 |
| යොනිසො මනසිකාරො | 146, 240, 258 |

| ර | |
|---|---|
| රජාපථො | 152 |
| රජොජල්ලං | 106 |
| රූපසඤ්ඤිනං | 102 |

| ල | |
|---|---|
| ලහුපඤ්ඤතා | 258 |
| ලිච්ඡවිකුමාරකා | 314 |
| ලොකක්ඛායිකං | 268 |
| ලොකචින්තා | 306 |
| ලොකන්තරිකා අසා | 316 |

| ව | |
|---|---|
| වචීසමාචාරො | 158 |
| වඤ්චන | 346 |
| වත්ථුකතා | 12 |
| වයධම්මානුපස්සී | 62 |
| වස්සසත විමුත්තචිත්තෙන | 252 |
| වස්සාවාසං | 116 |
| වාතුපාදනො | 48, 302 |
| වාදගවෙසී | 304 |

ව — පිට්ඨඞ්කා

වාදක්ඛීකො 304
වාදප්පමොක්ඛාය 266
විකිණ්ණවාචා 26
වික්ඛිත්තං 20
විග්ගාහිකකථං 266
විඝාතං 142
විඝාතස්ස 72
විජ්ජා 10, 284
විජ්ජාභාගියා ධම්මා 142
විජ්ජාවිමුත්තිං 118, 126
විඤ්ඤාණඤ්චායතනං 102
විනිපාතගතෙන 318
විපරාමොසං 348
විපුලපඤ්ඤතාය 252
විබ්භන්තචිත්තො 26
විමුත්තං 20, 80
විමොචයං 120
වියත්තා 12
විරාගනිස්සිතං 92, 124
විරාගාය 264
විරාගානුපස්සී 90, 120
විරියසමාධි 2, 4, 6, 8, 10, 18, 22, 24, 48, 30, 32, 34
විවට්ටකප්පෙ 20
විවෙකනිස්සිතං 92, 124
විවෙකපොණං 74
විසිඛාකථං 268
විහාරෙන 74, 76
විහිංසා විතක්කං 268
වීතරාගං 40
වීමංසාසමාධි 2, 4, 6, 8, 10, 18, 26, 30, 32, 34, 48
වුසිතවා 76
වෙදනානුපස්සී 108
වෙරං 212
වොදානං 82
වොස්සග්ගපරිණාමිං 92, 124
වොස්සග්ගරතො 152, 218
ව්‍යාපාදවිතක්කං 264

ස

ස උත්තරං 20
ස උද්දෙසං 20
සකදාගාමිනො 164
සකදාගාමී 160

ස — පිට්ඨඞ්කා

සකං ආචරියකං 14
සක්ක 182
සක්කායනිරොධො 152
සක්කායපරියාපන්නා 252
සඞ්ඝාසනා 184
සඞ්ඛිත්තං 20
සච්ඡිකාතබ්බං 292
සඤ්ඤාවෙදයිතනිරොධං 102
සතිපට්ඨානා 62, 66, 70, 72, 132
සතිසම්බොජ්ඣඞ්ගං 92
සත්තක්ඛත්තුපරමතා 322
සත්තඵලා 50, 94
සත්තබොජ්ඣඞ්ගා 124, 126, 132
සත්තසතෙන 298
සත්ථාහාරකං 104
සද්ධම්මසවනං 146, 240, 258
සද්ධාපරිභාවිතං 182
සද්ධාසම්පන්නො 224
සන්තකං 30
සන්ථාගාර 314
සප්පටිහාරියං 14
සප්පුරිසසංසෙවො 146, 240, 252, 258
සබ්බකායපටිසංවෙදී 108
සබ්බත්ථගාමිනිං 80
සබ්‍රහ්මචාරයො 26
සමඤ්ඤා 46
සමතිත්තිකා 324
සමාදහං චිත්තං 90, 110
සමාහිතං 20
සමුදයධම්මානුපස්සී 62
සමුද්දක්ඛායිකං 268
සම්පජානො 62, 66, 70, 108
සම්පසාදනං 100
සම්පරායිකං 210, 212
සම්බාධබ්‍යූහං 182, 184
සම්බාධො 152
සම්බොධා 18, 46
සම්බොධිපරායනො 140, 144 160, 152, 162, 178, 214, 226
සම්භෙජ්ජං 324, 326
සම්මාදුක්ඛක්ඛයගාමී 66
සම්මාසම්බුද්ධො 8
සම්මොදනීයං කථං 68, 70, 74
සරසඞ්කප්පා 10
සල්ලපත්ත 294

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සවන්තී | 232 |
| සස්සතො ලොකො | 266 |
| සහධම්මෙන | 14, 304 |
| සහසාකාර | 348 |
| සහිතං මෙ | 266 |
| සංධාවිතං | 286 |
| සංවට්ටකප්පෙ | 20 |
| සංසරිතං | 286 |
| සඞ්ඛාරපරිනිබ්බායී | 50, 94 |
| සාකාරං | 20 |
| සාචියොග | 346 |
| සාමඤ්ඤ | 334 |
| සාමීචිපටිපන්නා | 14 |
| සාරණීයං | 68, 70, 74 |
| සාලොහිතා | 290 |
| සික්ඛං පච්චක්ඛාය | 74 |
| සිඞ්ඝාටකබලාසං | 190 |
| සිනෙරුපබ්බතරාජා | 320 |
| සිලායූපො | 304 |
| සීසපණ්ණිතා | 258 |
| සීලසම්පන්නො | 224 |
| සුඛපටිසංවෙදී | 108, 130 |
| සුඛුමෙසු සූලෙසු | 298 |
| සුබෙධිතානං | 152 |
| සුගතො | 12 |
| සුඤ්ඤතාපටිසඤ්ඤුත්තො | 244, 246 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සුපානා | 182 |
| සුරාමෙරයමජ්ජපමාදට්ඨායී | 212 |
| සුසමාරද්ධා | 12 |
| සූරකථං | 268 |
| සූලං | 298 |
| සෙඛෙන | 70 |
| සෙඛො විහාරො | 114 |
| සොතාපත්තියඞ්ග | 146 228, 174 212 |
| සොතාපන්න | 140, 146, 160, 180, 190, 214, 228, 238 |
| සොතො | 146 |
| සොබ්භං | 160 |

හ

| හ | |
|---|---|
| හත්ථිගවාස්සවළවාපටිග්ගහණා | 314 |
| හම්මියා | 74 |
| හරායමානා | 104 |
| හාසුපඤ්ඤතා | 258 |
| හාසුපඤ්ඤ | 192 |
| හීනං ධම්මං | 69 |
| හීනාය | 74 |
| හෙට්ඨිමංසුරං | 314 |
| හොති ච න ච හොති තථාගතො පරම්මරණා | 266 |
| හොති තථාගතො පරම්මරණා | 266 |